බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා: 38

සූත්‍රාන්ත පිටකයෙහි

33 වන ග්‍රන්ථය

# බුද්ධවංස පාලි
# චරියාපිටක පාලි

## ඛුද්දක නිකාය
## 16,17 ග්‍රන්ථ

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

විසින් සකස් කරනලදුව

බු: ව: 2550

ක්‍රි: ව: 2006

Buddha Jayanti Tripitaka Series, Volume 38

The Thirty-third Book in the
**Suttanta-Pitaka**
**Khuddaka-Nikāya (16)(17)**

**33**

# BUDDHA-VAMSA-PĀLI
# &
# CHARIYĀ-PITAKA-PĀLI

With the Sinhala translation
by
**The Editing Committee**

නමෙක්ස්ස භගවතෙසබ්බධම්මෙ අප්පටිහතඤාණචා ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත් ස ධම්මිස්සරස්ස ධම්මරාජ ස ධම්ම සාමිස්ස තථාගතස්ස සබ්බ ඤ්ඤුනෙ සම්මාස බුද්ධස්ස !!!

භාග්‍ය වූ සිය ධර්මය හි නොපැකි ඥානචාර සහි වූ දසබලධාරී වූ චතුර්වෛශාරද විශාර වූ සිය සත්ව න් උත්ත වූ ධර්මය ඊශ්වර වූ ධර්මරා වූ ධර්ම වාමී වූ තථාගත වූ සර්ව වූ සම්ම සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂ ක් සක්වලයන්හි සිය ආර්යයෙ ද සිය සත්පු යෙද මාගේ නමස්කාරය පිළිගනි !!!

**බුද්ධජ ති තිපි ග්‍රන්ථමාලා**
**පරිගණ ගත කර නොමිළෙ බෙදාහැරීමෙ**
**මහා ධර්ම දානමය පුණ්‍යක**

**"අපාරුත තේස අමතස්ස ද් ාරා**
**යේ සෝතවන්තෙපමු චන් සද්ධං"**

"කන් ඇත්ත හු සැදැහැ මු ත්ව
ඔවුන අමා දොරටු විවෘ කරන ලදී"

අප භාග්‍ය අර්හ සම්ම සම්බුදුර න් වහන්සේ ගේ පථම අනුසාසන මෙහි ලා සි කිරීම තිපි ශ්‍රී සද්ධර්මය පරිශීල කරන්න වූ පින්වතුන්ගේ අභිව ද්ධිය පිණිස ම වන බව අපගේ හැඟී ය.

සැම කල් ඥාන සම්ප්‍රයුක්ත ව කිය කරන්න වූ සිය සම් ා සම්බුදුරජ වහන්සේ ශ්‍රීගේ පලමු අනුශාසන , බුද්ධ රත්න කෙරෙහි ගෞරව කරන්න වූ බුදුරජා වහන්සේ ගේ සම්ම සම්බුදු බෝධි අදහන්න වූ කවර නම් පු ලයෙකු නොසලකා හිදිත් ද ? චතු වෛශාරදත් සහිත වූ දශ බල සහි වූ අනාවරණ ඥාන සහිත වූ සවඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පේවා නිව අවබෝධකර ගැනී පිණිස ධම්මානු ම පතිපදා ආරම් කරන පුද්ගල තු 'සද්ධ ' නම් වූ ගුණ අත්‍යාව ය යන් අවධාරනය කරන සෝක

මෙම තිපි ශ්‍රී සද්ධර් සැක නොකළයු ය. සැක කරමි හදාරන ලෞකි ශිල්ප ශාස්ත පවා පරිපූර්ණ ව නොහෙි බව සි ඇති බැලීමෙ නුව ඇත්තා ට දැක ගත හැකි ය. පු ෂයා ශේ‍රෂ්ඨ බවට පමු වන්න වූ සද්ධා ධනය සහි ව ("සද්ධීධ චිත් පුරි ස සෙට්ඨ ") මෙම ධර් රත්න පරිශීල කරන්නාහ සද්ධා අංගයෙන් ලැබි යු සියල්ල ලැබෙනු නොඅනුමා ය. එසෙමේ සි යෙන් ලැබි යු කොඹස ද වීර්යය ලැබි යු කොටස සමාධියෙ ලැබි යු කොටස ප්‍රඥාවෙන් ලැබි යු කොටස ලැබෙන පරි සද්ධ , සති, විරිය, සමාධි සහ පඤා යන පංච ධර්මය තමා තු ඇති කර ගෙන මහත් වූ ගෞරවයසහිත ව ධර්මා බෝධයපිණිස ම යොමු වූ දැඩි අධි ඨානයෙන් මෙම ධර් පු තක පරිශීල කළ යු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර් ශවනයෙන් මග ඵල ලැබුවෙ ම අධි ය. විමුක්තිය ලබන්න වූ කම වේදය පහක් වි ්තර කරන්න වූ අංගුත් පංචක නිපාතයෙ ‘විමුත්තා ’ සූ යෙහි නිව ලබන කම වේ සතරක් ම ධම් දේශණාම සහ ධම් සවනමය පුණ කර් ඇසුරින් සි වන බව පැහැදි කර ඇත. පස්වැනි කම වේද භාවනාමය පුණ කර්ම පගු කිරීෙ සාර්ථ වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතය වහන්ෙ ගේ අනුශාසන පිළිපදි වූ අප්‍රමාදී ව ධම්මානු ම පතිපදා වඩන්න වූ සිය සත්න , තෛකාලි වූ සිය දුකින් මි ලබන්න වූ අජර වූ අමර වූ අමා මහ නිව අවබෝධි පිණිස මෙම මහඟු පුණ කර්ම උපනිශ වේව !

ආර්යය වහන්ෙ ශ්‍රී පහළවීමෙ සිරි බැබලේව !

බුද්ධ ශාසනය දියු චිර ්ථිතික වේව !

ලෙෝත්න සෙත් වේව !

**"අමතං දදෙවේ සෙභෙහන්තෝ, යෙධම්ම මනු ාසති"**

( *යමෙක් ධර්මානුශාස කරන්නේ ද, හෙණ්මෘතය දෙන්ෙ ය* )

මෙම ධර් දානමය පුණ කර්ම

මෙෝතිමිර විධ්වංස කරන්න වූ ලොවඑතුම් ආලෝක්‍ය වූ මහා කාරුණික වූ

සම්මාස බුදුරජාණන් වහන්ෙ ගේ සවඥතා ඥානයට ද මහා කරු ා ගුණය ද

පූජෝපහාරය ම වේව !!!

කෙළලක්ෂ ක් සක්වලයන්හි සිය ආර්යයෙ ද සිය සත්පු යෙදේ

අපගේ පුණ කර්ම අනුමෙෝද වෙත්ව !!!

ශාසනාභිව ද් කාමී,

සමින්ද රණසි හ.

2009.06.28

සුත්තන්තපිටකෙ

ඛුද්දකනිකායො

# බුද්ධවංසපාළි

# චරියාපිටකපාළි

සූත්‍රාන්තපිටකයෙහි

ඛුද්දකනිකාය

# බුද්ධවංශ පාලි

හා

# චරියාපිටක පාලි

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති, නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 25 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:25 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන

# CONTENTS


සංස්කාරක නිවේදනය ... ... ... ix

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය... ... ... xi

සංඥාපනය ... ... ... ... xiii

සංකේත නිරූපණය ... ... ... xxi

ශුද්ධාශුද්ධ දර්ශනය ... ... ... xxiii

පාළි හෝඩිය ... ... ... ... xxvii

බුද්ධවංස විෂයසූචි ... ... ... xxix

චරියාපිටක විෂයසූචි ... ... ... xxi

බුද්ධවංස– පෙළ හා පරිවර්තනය ... ... 2– 247

චරියාපිටක– පෙළ හා පරිවර්තනය ... ... 250– 327

බුද්ධවංස– ගාථාදිපාදසූචි ... ... ... 329– 340

බුද්ධවංස– සඤ්ඤානාමානුක්කමනිකා ... ... 341– 344

චරියාපිටක– ගාථාදිපාද සූචි ... ... ... 345– 349

චරියාපිටක– සඤ්ඤානාමානුක්කමනිකා ... ... 351– 352

විසෙස පදනුක්කමනිකා ... ... ... 353– 358

## සංස්කාරක නිවේදනය

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි අටතිස් (38) වන ග්‍රන්ථය වූයේ බුද්ධවංශපාළි හා චරියාපිටකපාළි යන පොත් දෙක යැ. ඛුද්දක නිකායාන්තර්ගත ග්‍රන්ථයන් කෙරෙහි අවසාන ග්‍රන්ථද්වය වශයෙන් සලකන මේ දෙපොත ප්‍රමාණයෙන් කුඩා වූ හෙයින් මුද්‍රණයෙහි දී එක් මැ ග්‍රන්ථභාගයක් ලෙස මුද්‍රණය කැරවීම මැනැවැයි ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයේ සම්මතය විය. එහෙයින් මෙය බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි අටතිස් වැන්න ලෙස සලකනු ලැබේ.

ත්‍රිපිටක ග්‍රන්ථ සිංහලභාෂායෙන් පරිවර්තන කොට තැබීම අපේක්ෂා කළ ලඞ්කා බෞද්ධමණ්ඩලයේ ආරාධනය පරිදි 'බුද්ධවංසපාළිය' අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයේ මහාචාර්ය්‍යවරයකු වන බලපිටියේ රාජකීය පණ්ඩිත විසුද්ධාලෝක නායකස්ථවිරයන් වහන්සේ විසින් ද, "චරියාපිටකපාළිය" බෙන්තර පණ්ඩිතරත්න පරිවෙණාධිපති ව සිටි බෙන්තර ශ්‍රී මඞ්ගලාභිධාන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ද මහත් පරිශ්‍රමයෙකින් විවිධ පිටපත් හා සංස්කරණ බොහෝ ගණනක පාඨ සංසන්දන කොට සිංහල පරිවර්තනය ද සපයා බෞද්ධමණ්ඩලයට ඉදිරිපත් කොට තිබිණ.

මේ දෙපොතෙහි සිංහල පරිවර්තනය බෞද්ධමණ්ඩලයේ සැලැස්ම අනුව සම්පාදනය නොවූ බව පෙනීගිය හෙයින් උත්තරීතර සංස්කාරක මණ්ඩලය විසින් එය නැවත පරිවර්තන කිරීමට සම්මත විය. එහෙයින් යථෝක්ත මහතෙරවරුන්ගේ ශොධිතපාඨ ඇසුරු කොට ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයෙහි නියුක්ත වූ රාජකීය පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ හා අප ද විසින් මේ සිංහල පරිවර්තනය සම්පාදනය කරන ලද වෙයි. මුද්‍රණ අවස්ථාවට පැමිණ වර්තමාන ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ මහතෙරවරුන්ගේ සාහාය්‍යය හෙතු කොටගෙන ශොධන සංස්කරණ කාර්ය්‍යයන් මැනැවින් කළ හැකි විය.

තවද කරහම්පිටිගොඩ සුමනසාර පණ්ඩිත ස්ථවිරයන් විසින් බුද්ධවංස-පාළිය හා එහි අටුවාව ද අලළා ලියන ලද විචාර පූර්වක සංඥාපනය බුද්ධවංස-කථාව ඉගෙනගනු රිසියනට බොහෝ සෙයින් එලදයක වනු ඇත. බුද්ධවංසපාළිය පශ්චාත්කාලීන කෘතියකැයි කියන අසංයත වූ විචාරකයනුදු හික්මවාලන්නට මේ සංඥාපනයෙන් යත්න දරා තිබේ. චරියාපිටක සංඥාපන කරනලද්දේ අප විසිනි.

ත්‍රිපිටක මුද්‍රණ කටයුතු ඉක්මනින් නිමහම් කරවාලීම සඳහා අග්‍රාමාත්‍යවර **සිරිමාවෝ බණ්ඩාරනායක** උත්තමාව නිරතුරු දක්වන ආගමික හැඟීමෙන් යුක්ත වූ අනුග්‍රහය ද, වර්තමාන සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තැන් පත්, **ටී. බී. තෙන්නකෝන්** මැතිතුමාණන් අන් හැම කාර්යයකට වඩා මේ සඳහා දක්වන ඉමහත් උද්‍යොගය ද, සංස්කෘතික නිලධාරි පින්වතුන්ගේ සහයොගය මෙන් ම සහකාර සංස්කෘතික අධ්‍යක්‍ෂ **සෝමපාල ජයවර්ධන** මහතාණන් සවකීය විවේකය ද නිසරු කොට මේ සඳහා දක්වන ක්‍රියාශීලී භාවය ද අතිශයයින් පිහිටවන බව කියම්හ.

දෙහිවල **තිසර** මුද්‍රණාලයාධිපතිතුමා හා එම කාර්යමණ්ඩලය ත්‍රිපිටක මුද්‍රණය සඳහා දක්වන උනන්දුව මෙන් ම ත්‍රිපිටක කාර්යාලය පිහිටි කොළඹ මහානායක වාරිකාරාමයේ භාරකාර **ඒ. ඇම්. ආර්. සමරසිංහ** මහතාගෙන් ත්‍රිපිටක මණ්ඩලයට දවරයෙහි ලැබෙන සහයොගය ද අනුස්මරණීය වේ.

අතිපරිශුද්ධ පර්යාප්ති ධර්මය ව්‍යාප්ත කරවාලීමෙහි යත්න දරන හැම සුධීහු ධර්මදානමය කුශලබලයෙන් සුබභාගී වෙත්වා'යි ආශංසනය කරම්හ.

මේවගට, ශාසනොදයකාරී

**ලබුගම ලඞ්කානන්ද ස්ථවිර**
ත්‍රිපිටක මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක,

15 පෙබරවාරි $\frac{2520}{1977}$
මොල්ලිගොඩ
ප්‍රවචනොදය පිරිවෙන්හි දී යැ.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක:**

අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහා ස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි (භික්ෂු විශ්වවිද්‍යාලයෙහි) අධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණ ලංකාවෙහි ප්‍රධාන සංඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ, ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය, ත්‍රිපිටක වාගීශ්වර, රාජකීය පණ්ඩිත ලබුගම ශ්‍රී ලංකානන්ද-කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝසභාවෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක:**

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ සිරි පඤ්ඤාලෝක – ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසංඝසභාවෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වෙඩරුවේ සිරි අනෝමදස්සී බටහිර දිශාවෙහි ප්‍රධාන සංඝනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ – මාකඩවර විහාරාධිපති රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන්වහන්සේ.

කොළඹ, තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, කරදන පඤ්ඤාලංකාර නායක ස්ථවිරයන් වහන්සේ.

**ලේඛකාධිකාරී:**

කොළඹ, බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල – කොළඹ පළාතේ ප්‍රධානසංඝනායක ස්ථවිරයන් වහන්සේ.

## සංඥාපනය

### බුද්ධවංසය

අප තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේ කලියුගවර්ෂයෙන් දෙදහස් පන්සිය තෙළෙස් (2513) වැන්නෙහි වෙසහමස පුරපසළොස්වක් පොහෝදින දඹදිව මධ්‍යදෙශයෙහි නිල්දලාහෝතෙර ගයාවෙහි ඇසතු-බෝරුක්මුල්හි කුසතණඇතිරියෙහි වැඩහිඳ සවාසනා සකලක්ලෙශයන් ප්‍රහීණ කොට චතුසත්‍යාධිගමයෙන් සම්‍යක්සම්බෝධියට පැමිණ සත්සති ගෙවා සහම්පතී මහබඹහු විසින් ආරාධිත වැ ඇසළමස පුරපසළොස්වක් පොහෝද බරණැස ඉසිපතන නම් මිගදයෙහි දී 'අඤ්ඤාකොණ්ඩඤ්ඤ' ආදි පස්වග මහණුනට දම්සක් පවත්වා නිකිම්නියැ අවවිසේනී දවස් අනාත්මලක්ෂණ සූත්‍රදෙශනායෙන් ඔබ හැම අර්හත්වයෙහි පිහිටුවා 'එහිභික්ෂු' පැවිදි දී සසුන් පිහිටුවා, විමුක්තිය සොයා තමන් වහන්සේ කරා පැමිණි බරණැස් සිටුදරු 'යස' කුලපුත්‍රයා හා ඔබගේ යහළු සිවුපනස් දෙනා රහත්පෙලෙහි සිටුවා 'එහිභික්ෂු' පැවිදි දී ඉසිපතන මුවළැව්හි පළමු වස් වැස පවරා හිල්මසැ අවපැළවිය දවස් සැටදෙනා වහන්සේ ධර්මප්‍රචාරයෙහි යවා තමන් වහන්සේ උරුවෙල්දනව් වැඩ තෙමසක් වැඩහිඳ දුරුතු පුරපසළොස්වක් දවස් උරුවෙලකාශ්‍යප ප්‍රමුඛ දහසක් ජටිලයන් 'ආදිත්තපරියාය සූත්‍රදෙශනායෙන්' අර්හත්ත්වයට පමුණුවා 'එහිභික්ෂු' පැවිදි දී නවම්මස අවපැළවිය දවස් එහැම පිරිවරා පළමු බිම්සර රජුට දුන් ප්‍රතිඥා පිණිස රජගහනුවර වැඩ සසුන්හි පහන් වැ සෝවන්පෙලෙහි පිහිටි බිම්සර මහරජහු විසින් කරවා පුදකරනලද වෙළුවන මහවෙහෙරෙහි දෙමසක් වාස කොට පියාණන් සුදෙවුන් මහරජුන් එවූ දූතපිරිසෙහි නායක කාළුදායී තෙරණුවන් මැදිම්නියැ පුරපසළොස්වක් දවස් කළ ආරාධනායෙන් විසිදහසක් මහණගණා පිරිවර කොටගෙන බක් අවපැළවිය දවස් රජගහනුවරින් පිටත් වැ දෙමසක් මුළුල්ලේ සැටයොදුන් මග ගෙවා වෙසක් පුරපසළොස්වක් දවස් කිඹුල්-වත්පුරයට පිවිස ඥාතිසමාගමයෙහි රුවන්සක්මනැ යමාමහපෙළහර පෑ අවස්ථායෙහි දම්සෙනෙවි සැරියුත් මහරහත්තෙරණුවන්ගේ ඇරැයුමින් බුද්ධවංශදෙශනා කළහ.

චතුරාසඞ්ඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි ඒ ඒ අවස්ථායෙහි සම්‍යක්-සම්බෝධි සමධිගම කළ දීපඞ්කර තථාගතයන් වහන්සේ පටන් කොට අප ගෞතම තථාගතයන් වහන්සේ තාක් පස්විසි බුදු කෙනකුන් වහන්සේගේ ප්‍රවේණි විස්තාරකථාව 'බුද්ධවංස' නම් වෙයි. බුද්ධවංස

දෙශනා වූකලි සැදැහැතියනට ප්‍රීතිප්‍රාමොද්‍යය දනවන, ශොකශල්‍යය උදුරාලන, දිව්‍යමානුෂාදී සර්වසම්පත් ලාභයට කරුණු වූ දෙශනායෙකි. ජාත්‍යාදි මද නිර්මදනය කරන්නා වූ අනුගතයන් සංසාරබන්ධනයෙන් මුදලන්නා වූ හැම දුක් ක්ෂය කරන්නා වූ මාර්ගයෙකි. ශ්‍රාවකයන්ගේ සිත් බුදුබැව්හි නතු කරන්නා වූ උතුම් දහමෙකි. අසා පරණ නොවන අසත් අසත් මැ සැදැහැබැති වඩවන පුනපුනා ඇසීමට ලොල් කරවන රමණීය ධර්මකථායෙකි. එහෙයින් මැ ධර්මව්‍යාඛ්‍යාන කළ ආචාර්යවරු සැකෙවින් හෝ බුද්ධවංසය ද දක්වාලූහ. ජාතකට්ඨකථා නිදානයෙහි ලා බුද්ධවංසය සපුරා දක්වනලද්දේ යැ. මයූරපාදපිරිවෙන්හිමි 'බුද්ධපුත්‍ර' තෙරණුවෝ පූජාවලියෙහි ද 'ධර්මසෙන' තෙරණුවෝ සද්ධර්මරත්නාවලියෙහි ද දෙවරක්ඛිත ජයබාහු ධර්මකීර්ති තෙරණුවෝ සද්ධර්මාලඞ්කාරයෙහි ද ධම්මදින්නාචරිය විමලකිත්ති තෙරණුවෝ සද්ධර්මරත්නාකරයෙහි ද බුද්ධවංසය ඇරැපූහ. සීලවංස ධම්මකිත්ති මාහිමියෝ සූවිසිවිවරණය ගෙන පාළිපද්‍යනිබන්ධයක් කළහ.

අප බුදුන් අතීතයෙහි 'සුමෙධ' නම් තවුසක් වැ දිවකුරු බුදුන් හමුයෙහි බුදුබව පිණිස නියතවිවරණ ලබාගෙන සාරාසැකිකප්සුවහසක් මුළුල්ලෙහි සූවිසි බුදු කෙනකුන්ගෙන් විවරණ ලබමින් සමතිස්පැරුම් පුරා සම්බොධියට පැමිණි අයුරු බුද්ධවංසයෙහි දක්වනලද්දේ යැ. මෙහි පරිච්ඡෙද පසෙකි: රතනචඞ්කමන කණ්ඩ යැ, සුමෙධකථා යැ, බුද්ධවංස යැ, බුද්ධපකිණ්ණක කණ්ඩ යැ, ධාතුභාජනීයකථා යැ යන පස යි.

රතනචඞ්කමන කණ්ඩ යැ බුද්ධවංසදෙසනායෙහි නිදානකථාව යැ. සුමෙධකථායෙන් බුද්ධවංසය ආරම්භ වෙයි. දිවකුරු බුදුන් හමුයෙහි අප මහබෝසතාණන් වහන්සේ බුදුබවට නියතවිවරණ ලද අයුරු එහි විස්තර වෙයි. ඉක්බිති සූවිසි බුදුන්ගේ ප්‍රවෙණිකථාවත් ඒ ඒ බුදුන් හමුයෙහි බෝසතුන් විවරණ ලද අයුරුත් අවසන්හි අප ගෞතම බුදුන්ගේ වංසකථාවත් දැක්වෙන පරිච්ඡෙදය 'බුද්ධවංස' නමින් වෙසෙසා හැඳින්වෙයි. එහි ලා එක් එක් බුදුන්ගේ ප්‍රවෙණිකථාව වෙන වෙන මැ දක්වනලදි. එහැම වංසකථා මැ ආකෘතියෙන් එක් බඳු වෙයි. ඒ ඒ බුදුන්ගේ උපන් කල්ප යැ නාම යැ ගොත්‍ර යැ ජාති යැ නගර යැ පිතෘ යැ මාතෘ යැ බොධි යැ දම්සක්පැවැත්ම යැ දහම්සමය යැ ශ්‍රාවකසන්නිපාත යැ අග්‍රශ්‍රාවක යැ උපස්ථායක යැ අග්‍රශ්‍රාවිකා යැ පරිවාරභික්ෂු යැ රශ්මි යැ ශරීරප්‍රමාණ යැ බොධිසත්තාධිකාර යැ විවරණ යැ ප්‍රධන්වීර්‍ය යැ ආයුෂ යැ පරිනිර්වාණ යැ යන දෙවිසි කරුණු ප්‍රකාශ කරන ලද්දේ යි. මෙ කරුණු දක්වන ලද්දේ බුදුවරුන්ගේ මනුෂ්‍යභාවය ප්‍රකට කරනු

සඳහා යැ. ඉදින් ජාතනගරය මවුපිය ආදීහු නො දක්වනලද්දහු වී නම් මොහුට උපන් තැනෙක් පියෙක් මවක් නො පැනෙයි. මෙතෙම දිව්‍ය-බ්‍රහ්මශක්‍රමාරයක්ෂාදීන් කෙරෙහි අන්‍යතරයෙකැයි සිතමි. දෙවියනට ද මෙබඳු ආශ්වර්‍ය්‍ය නො වූ පෙළහර ඇතැයි සිතන්නාහු බුද්ධවචනය ඇසියයුතු කොට නො සිතන්නාහ, එයින් අභිසමය නො වෙයි. අභිසමය නැතිවත් මැ බුද්ධොත්පාදය නිරර්ථක වන්නේ යැ. ශාසනය අනෛර්‍ය්‍යාණික වන්නේ යි.

"යස්ස යදි නෙව ජාතනගරං න පිතා, න මාතා පඤ්ඤායෙය්‍ය, ඉමස්ස පන නෙව ජාතනගරං, න පිතා න මාතා පඤ්ඤායති, දෙවො වා සක්කො වා යක්ඛො වා මාරො වා බ්‍රහ්මා වා එස මඤ්ඤෙ දෙවානම්පි ඊදිසං පටිහාරියං අනච්ඡරියන්ති මඤ්ඤමානා න සොතබ්බං මඤ්ඤෙය්‍යුං තතො අභිසමයො න භවෙය්‍ය, අසති අභිසමයෙ නිරත්ථකො බුද්ධුප්පාදෙ භවෙය්‍ය, අනිය්‍යාණිකං සාසනං, තස්මා සබ්බබුද්ධානං ජාතනගරාදිකො පරිච්ඡෙදෙ දස්සෙතබ්බො"* යනු බුද්ධවංස අට්ඨකථා යි.

බුද්ධපකිණ්ණක කණ්ඩයෙහි ගාථා අටළොස සඞ්ගීතිකාරක මහථෙර-රුන් විසින් තබනලද නිගමනගාථා යි. ධාතුභාජනීයකථා ගාථා තෙළෙ-සෙකින් සමන්විත වෙයි. බුදුරදුන් පිරිනිවීමෙන් පසු උන් වහන්සේගේ ශාරීරධාතු හා පාරිභොගිකධාතු ලොකයෙහි ව්‍යාප්ත වූ සැටි එහි දක්වන ලද්දේ යැ. ධාතුභාජනීයකථා ගැන කිසි සඳහනෙක් බුද්ධවංස අටුවායෙහි නැත. මේ පරිච්ඡේදය ප්‍රථමසඞ්ගීතියෙන් පසු කලෙක බුද්ධවංසයෙහි සඞ්ගෘහීත බව "පාණිනං අනුකම්පාය ආහු පොරාණිකා තද" යන පරිච්ඡේදාවසාන සඳහනින් පෙනෙයි. 'පොරාණ' 'පොරාණික' ශබ්ද අට්ඨකථායෙහි හෙළටුවා ඇදුරන් සඳහා යොදනලද්දේ යැ."පොරාණාති අට්ඨකථාචරියා"[1] යනු සාරත්ථදීපනී විනයටීකා යි, එයින් හෙළටුවා ඇදුරන් ගන්නේ යැ. එයින් බුද්ධවංසධාතුභාජනීයකථාව හෙළටුවා ඇදුරන් විසින් සඞ්ගෘහීත යැ යි සිතියහැක්ක. දීඝනිකාය 'මහාපරිනිබ්බාන' සූත්‍රයෙහි ද ශාරීරධාතූන් බෙදූ අයුරු සඳහන් වෙයි. එය බුද්ධවංසධාතුභාජනීයකථා හා සැසැඳෙයි. මහාපරිනිබ්බාන සූත්‍රයෙහි ගද්‍යයෙන් කියූ දය බුද්ධවංසයෙහි පද්‍යයට නැඟී ඇත.

---

* බුද්ධවංසය ඉංග්‍රීසි භාෂාවට නැඟූ අයි. බී. හෝනර් මැතිනිය මේ වාක්‍යකණ්ඩය වරදවාගෙන දෙවියන් සැක උපදවන හෙයින් ජාතනගරාදිය සඳහන් කරන ලද යි බුද්ධවංස හැඳින්වීමෙහි දක්වා ඇත. B. V. - PTS xii P. G.

1. සාරත්ථදීපනී-මජසං, 202 පිටුව

''චත්තාලීස සමා දන්තා'' යන ගාථාව දෙතන්හි මැ නො වෙනස් වැ සිටී. මහාපරිනිබ්බාන සූත්‍රයෙහි සඳහන් නැති පාරිභොගික ධාතු පිහිටි තැන් ද බුද්ධවංස ධාතුභාජනීය කථායෙහි දක්නා ලැබේ. බුදුරදුන්ගේ පාත්‍රය, සැරයටිය, සිවුර, හඳනය, පසතුරුණ, ධබරාව, කාබහන, දිය සළුව, ඌර්ණරොම ධාතුව, කසාවත, (බෝසතුන්ගේ) හිස්වෙළුම, නිසීදනය, ඇතිරිය, අරණිය (ගිනිගානාදණ්ඩ) පෙරහන කරකැත්ත, හිදිගුළාව, හා සෙසු පිරිකර පිහිටි තැන් වෙන වෙන දක්වන ලද්දේ යි.

බුදුවරු කරුණු අටෙකින් අසමාන වෙති: ආයුෂ යැ ශරීර ප්‍රමාණ යැ කුල යැ ප්‍රධන්වියඞ් කළ කාලපරිච්ඡෙද යැ රශ්මි යැ අභිනිෂ්ක්‍රමණ යාන යැ බොධිවෘක්ෂ යැ පයඞ්කප්‍රමාණ යැ යන අට යි.

හැම බුදුවරුන් පිළිබඳ කරුණු සතරක් නො වෙනස් වැ පවතියි. සියලු බුදුවරුන්ගේ බොධිපයඞ්කය එක් මැ තන්හි වෙයි. දම්සක් පැවැත්ම ඉසිපතන මිගදයෙහි යැ, දෙවොරොහණය සංකස්ස නගරද්වාරයෙහි යැ, ජෙතවනයෙහි ගන්ධකුටිය එක් මැ තන්හි වේ.

හැම බුදු කෙනකුන්ට මැ සාධාරණ ධර්මතා සමතිසෙකි:

1. පශ්චිමභවික බොධිසත්ත්වයන් සිහිනුවණින් යුතු වැ මවුකුසින් බිහිවීම
2. මවුකුස පලක් බැඳ පිටත බලාසිටීම,
3. බෝසත් මවු සිටිපියෙහි සිට බෝසතුන් බිහිකිරීම,
4. අරනෙහි දී මවුකුසින් බිහිවීම,
5. උපන් කෙණෙහි උතුරුදිගට සත් පියවරක් ගොස් සීහනාද කිරීම,
6. සතර පෙරනිමිති දැකැ පුත්කුමරු උපන්ද මහබිනික්මන,
7. පැවිදි වැ යටත් පිරිසෙයින් සත්දිනක් හෝ ප්‍රධන්වියඞ් කිරීම,
8. බුදු වන දවස් කිරිපිඩු වැළඳීම,
9. තණ ඇතිරියෙහි වැඩහිඳ සර්වඥතාඥනාධිගමය,
10. බුද්ධත්වය සඳහා ආනාපානසති කමටහන් වැඩීම,
11. මරුන් බිඳැලීම,
12. බොධිපයඞ්කයෙහි දී මැ ත්‍රිවිද්‍යාදි ගුණ ප්‍රතිලාභය,
13. සත්සති ගෙවීම,
14. මහබඹහුගේ අයදමින් දහම් දෙසීම,
15. ඉසිපතන මිගදයෙහි දී මැ දම්සක් පැවැත්වීම,
16. නවම් පුරපසළොස්වක්හි මැ ප්‍රථම ප්‍රාතිමොක්ෂ දෙශනාව,
17. දෙව්රම් වෙහෙර තන්හි මැ නිබද්ධවාසය,
18. සැවැත්පුරදෙර යමාමහපෙළහර දක්වීම,

19. තව්තිසායෙහි අභිධර්මදෙශනාව,
20. සකස්පුරදෙරට දෙව්ලොවින් බැසීම,
21. නිරතුරු ඵලසමාපත්තියට සමවැදීම,
22. ධ්‍යාන දෙක්හි වෛනෙයජනයා බැලීම,
23. කරුණක් නැඟි කල්හි මැ ශික්ෂා පැනැවීම
24. අත්ථොත්පත්ති නිමිති කොට ජාතකදෙශනාව,
25. ඥාතිසමාගමෙහි බුද්ධවංස දෙශනාව,
26. ආගන්තුක භික්ෂූන් හා පිළිසඳර කිරීම,
27. ආරාධනායෙන් වස් වැස, දයකයන් නො පිළිවිස නො යෑම,
28. දවස්පතා පඤ්චබුද්ධකෘත්‍යය නොකඩ කොට කිරීම,
29. පරිනිර්වාණ දිනයෙහි මාංසරසභොජනය,
30. සූවිසි කෙළසුවහස් සමවත් සම්වැද පිරිනිවීම, යන මෙ කරුණු යි.

'අනුරුද්ධ' තෙරණුවන් ද උපාලි තෙරණුවන් ද යන මේ දෙදෙන බුදුරජුන් කිඹුල්වත් පුරයට පිවිසි කල්හි රැස්වූ ඥාතිසමාගමයෙහි දී පැවිදි වූවන් සෙයින් බුද්ධවංසයෙහි පෙනෙයි. මෙය ඛන්ධකපාළිය හා ද අට්ඨකථා හා ද නො සැසැඳෙයි, විමසාගන්නැ'යි අට්ඨකථාචාර්‍ය බුද්ධදත්ත තෙරණුවෝ කියති.

බුද්ධවංශයෙහි උත්තරා යැ නන්දමාතෘ යැයි උපාසිකාවෝ දෙදෙනෙකි. ඔහු දෙදෙන අග්‍රඋපස්ථායිකා ද වෙති. අඞ්ගුත්තර එතදග්ගපාළියෙහි නන්දමාතෘ උත්තරා එක් මැ උපාසිකාවකි. ඕ ඵහි ධ්‍යායී උපාසිකාවන් අතුරෙහි අග්‍ර වූ යැ.

බුද්ධවංශයෙහි, 'චිත්ත' ගෘහපති හා 'හත්ථාළවක' හා මෙ දෙදෙන අග්‍රඋපස්ථායක වෙති. අඞ්ගුත්තර එතදග්ගපාළියෙහි 'චිත්ත' ගෘහපති ධර්මකථික උපාසකයන් අතුරෙහි අග්‍ර වෙයි. 'හත්ථාළවක' සතර සඞ්ග්‍රහවස්තුයෙන් ජනසඞ්ග්‍රහ කරන උපාසකයන් අතුරෙහි අග්‍ර වේ.

දීඝභාණකයෝ බුද්ධවංස, චරියාපිටක, අපදාන යන මේ ග්‍රන්ථ ඛුද්දකනිකායෙන් බැහැර කෙරෙති. මජ්ඣිමභාණකයෝ එ තුන ද ඛුද්දකනිකායෙහි අන්තර්ගත යැයි කියති.* මජ්ඣිමභාණක වූවාහු සැරියුත් මහරහතුන් වහන්සේගේ අතැවැසි පරපුරෙහි වූ තෙරවරු වෙති. 'බුද්ධවංස' 'චරියාපිටක' දෙශනා සැරියුත් තෙරණුවන්ගේ ආරාධනයෙන්

* බුද්ධවංස අට්ඨකථා – හෙවිතු 44 පිටුව.

කරනලද වෙයි. මේ දෙශනා වාචනාමාර්ගයෙහි පවත්වා ගෙන ආවාහු ද සැරියුත් තෙරණුවන්ගේ අතැවැසි පරපුරෙහි තෙරවරු යැ. සැරියුත් තෙරණුවන් පටන් කොට භද්දජි යැ තිස්ස යැ කොසියපුත්ත යැ සිග්ගව යැ මොග්ගලිපුත්ත යැ සුදත්ත යැ ධම්මික යැ දසක යැ සොණක යැ රෙවත යැ යන ඇදුරු පරපුර විසින් තෘතියසඞ්ගීති කාලය දක්වා ද ඉන්පසු උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර විසින් ද පවත්වා ගෙනඑන ලද්දේ යැ. "තෙසංයෙව සිස්සානුසිස්සෙහි එවං තාව ආචරියපරම්පරාය යාවජ්ජකාලා ආභතො'ති වෙදිතබ්බා" යන අටුවා සඳහනින් පෙනෙනුයේ අට්ඨකථා-කාලය තෙක් ආචාර්‍ය්‍යපරම්පරාව අඛණ්ඩ වැ පැවැති බව යි. බුද්ධවංසය ඉංග්‍රීසියට නගා එංගලන්තයේ පාළිපොත් (PTS) මුද්‍රණයෙහි පළ කරවූ අයි. බී. හෝනර් මැතිනිය එයට විමර්ශනාත්මක පෙරවදනක් සපයමින් කරුණු සහිත වැ එහි පෞරාණිකත්වය තරකොට ඇත.

**කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිර**

## චරියාපිටක:

බුද්දකනිකාය (කුදුගත්සඟිය) ට අයත් පසළොස් ග්‍රන්ථයන් කෙරෙහි අවසාන ග්‍රන්ථය 'චරියාපිටක පාළි' යයි. කවර අරුතෙකින් 'චරියාපිටක' නම් වී යැ යත්: අතීත ජාතීන්හි තථාගත වූ ශාස්තෘන් වහන්සේගේ ඒ ඒ චරියාවන්හි අනුභාව මහත්වය ප්‍රකාශ කරන පර්‍ය්‍යාප්ති දෙශනාව නුයි 'චරියාපිටක' නම් විය. ඒ එසේ මැ ය: මෙහි 'පිටක' ශබ්දය පර්‍ය්‍යාප්තිය-දෙශනා පාළිය යන අර්ථ ඇත්තේ යැ, "මා පිටකසම්පදානෙන" යනාදි තැන්හි මෙනි. නොහොත් මේ පර්‍ය්‍යාප්තිය හෙවත් දෙශනාව පූර්වජාතීන්හි දී භාග්‍යවතුන් වහන්සේගේ බොධිසත්ව චර්‍ය්‍යාව ප්‍රකාශ කිරීමට පාත්‍ර වී නුයි හෝ 'චරියා පිටක' නම් විය. "අථ පුරිසො, ආගච්ඡෙය්‍ය, කුද්දලපිටකං ආදය" යනාදියෙහි මෙනි.

තෙල චරියාපිටකපාළිය විනයසුත්තාභිධම්ම යන තුන්පිටකයෙහි සූත්‍රාන්තපිටකයෙහි බැස ගෙන සිටී. එහි දු දීඝාගමාදි පඤ්ච ආගමයන් කෙරෙහි ඛුද්දකාගම සඞ්ඛ්‍යාත කුදුගත් සඟියෙහි ඇතුළු වේ. සුත්තගෙය්‍යාදි නව වැදෑරුම් ශාසනාඞ්ගයන් අතුරෙහි ගාථාඞ්ගයෙහි ලා ගැණෙයි. සුවාසූ දහසක් ධර්මස්කන්ධයන් කෙරෙහි කතිපය ස්කන්ධ කෙනෙකි. චරියා පිටකය වර්ගවශයෙන් 'අකිත්තිවග්ග, හත්ථිනාග වග්ග, යුධඤ්ජයවග්ග' යී වර්ග

---

* සුමඞ්ගල විලාසිනී – නිදානකථා

තුනෙක සංගෘහීත යි. බෝසත් සිරිත් වශයෙන් අකිත්ති වර්ගයෙහි චරියා දසයෙක් ද, හත්ථිනාග වර්ගයෙහි දසයෙක් ද යුධඤ්ජය වර්ගයෙහි පසළොසෙක් දැයි පන්තිස් චරියා කෙනෙක් වෙත්.

බුද්ධවංස සංඥපනයෙහි කී පරිදි සැරියුත් මහරහතුන් වහන්සේගේ අයදමින් බුද්ධවංස දේශනාව කළ කල්හි ශ්‍රාවකපාරමීඥානයෙහි සිට බුදුගුණ මෙනෙහි කළ දම්සෙනෙවි මහ තෙරණුවෝ ඒ අභිනීහාර සමෘද්ධිය සඳහා කවර කවර ජාතියෙක කිසෙයින් පාරමී ධර්මයන් පිරූසේක් දැයි පුළුවුත්හ. එසඳ බුදුහු ඒ රුවන්සක්මනෙහි මැ වැඩහිඳ ඒ සා දීර්ඝකාලයෙහි අනන්ත-ජාතීන්හි පැවැති බොධිචර්‍ය්‍යාව තබා මේ මහාභද්‍රකල්පයෙහි දානාදි පාරමිතාවන්ගේ පරමොත්කර්ෂයට පැමිණි අකීර්ති පණ්ඩිත චරියාදි පන්තිස් ජාති දක්වමින් චරියාපිටක නම් වූ බුද්ධාපදාන ධර්මපරියාය වදාළ-සේක. ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙක් දෙවාති දෙවයන් වහන්සේ රුවන්-සක්මනින් බැස නිග්‍රොධාරාමයෙහි පනවනලද බුද්ධාසනවරයෙහි වැඩහිඳ දෙසූ සේකැයි කියත්.

සම්මා සම්බොධිඥාන සාධක වූ පාරමිතාවන් පිළිබඳ ප්‍රකීර්ණකකථායෙහි පාරමීනම් කවර යත්: තණ්හා මාන දිට්ඨීන් විසින් අනුපහත වූ කරුණා උපාය කෞශල්‍යඥාන දෙකින් පරිගෘහීත වූ දානාදි ගුණයෝ පාරමී නම් වෙති.

එබඳු දානශීලාදි ගුණ ඇතියෙන් මහබෝසත්හු 'පරම' යයි කියනු ලැබෙති, ඒ පරමයන්ගේ ක්‍රියාව හෝ පරමයන්ගේ භාවය යනාදි අරුතින් 'පාරමී' යයි කියනු ලැබේ.

පාරමිතා කෙතෙක යත්: දාන- සීල- නෙක්ඛම්ම- පඤ්ඤා- විරිය- ඛන්ති- සච්ච- අධිට්ඨාන- මෙත්තා- උපෙක්ඛා යයි පාරමී දසයෙකි.

අවිශෙෂයෙන් සියලු මැ පාරමිතාවෝ අන්‍යයනට අනුග්‍රහ කිරීම ලක්ෂණ කොට ඇතියහ, අන්‍යයනට උපකාර කිරීම පාරමිතාවන්ගේ කෘත්‍යය වෙයි. හිතෛෂී භාවය හෝ බුද්ධත්වය වැටහීම කොට ඇත්තාහ. මහාකරුණාව හෝ කරුණා- උපාය කෞශල්‍යඥානය ආසන්න කාරණ කොට ඇත්තාහු වෙත්.

අභිනීහාරය පාරමිතාවනට ප්‍රත්‍යය වෙයි. අභිනීහාර සමෘද්ධිය සඳහා 'මිනිසත්බව, මනුෂ්‍යත්වයෙහිදු සිට පුරුෂභාව සංඛ්‍යාත ලිංගසම්පත්තිය, උපනිශ්‍රය සංඛ්‍යාත හෙතුසම්පත්තිය, ජීවමාන ශාස්තෲවරයකු හමුවීම, පැවිදිබව, අභිඥාදි ගුණසම්පත්තිය, බුදුනට ජීවිතපරිත්‍යාගයෙන් කරන අධික සත්කාරය කත්තුකම්‍යතා කුසලච්ඡන්දය, යන අෂ්ටධර්මයන්ගේ සමවධානයෙන් අභිනීහාරය සිදු වේ.

තෘෂ්ණාදි කෙලෙසුන් විසින් සිත කිලිටිවීම පාරමිතාවනට සංකිලෙස වෙයි. තෘෂ්ණාදීන් අනුපහතභාවය පාරමිතාවනට වොදන යි. එසේම සියලු මැ සංකිලෙසයෝ සියලු මැ අකුශලධර්මයෝ අවිශෙෂයෙන් පාරමිතාවනට ප්‍රතිපක්ෂයෝ යි. ඉතා සැකෙවින් දනසීලාදි ධර්මයන් සකසා සම්පාදනය කිරීම පාරමිතාවන්ගේ ප්‍රතිපත්ති වෙයි.

යළි විභාග වශයෙන් දසපාරමිතා යැ, දසඋපපාරමිතා යැ, දසපරමත්‍ථපාරමිතා යැ යි සමතිස් පාරමිතා කෙනෙක් වෙති. එහි දනසීලාදි ගුණයන් සඳහා බාහිර වස්තුපරිත්‍යාගය පාරමිතා නම, ශාරීරාවයව පරිත්‍යාගය උපපාරමිතා නම, ජීවිතපරිත්‍යාගය පරමත්‍ථපාරමිතා නම් වේ.

තවද එකී සමතිස් පාරමිතාවෝ දනාදි දසපාරමිතායෙහි සංග්‍රහ වෙති. ඒ දසය ද දන, ශීල, ඛන්ති, විරිය, ඣාන, පඤ්ඤ යන මොවුන්ගේ වශයෙන් සවැදෑරුම් වෙයි.

සම්‍යක් සම්බොධිය උදෙසා දනාදි පුණ්‍යසම්භාරය අනවශෙෂ කොට කිරීම ය, ආදර බහුමානයෙන් සකසා කිරීම ය, නිරතුරු යෙදීමෙන් සතතක්‍රියාව ය යන මේ පාරමිතා සම්පාදනයෙහි උපාය වේ.

පාරමිතා සම්පූර්ණවීම සඳහා යටත්පිරිසෙයින් සාරාසංඛ්‍යකල්පලක්ෂයක් ද, මධ්‍යම වශයෙන් අටාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ද, උපරිම පරිච්ඡෙදයෙන් සොළොස් අසංඛ්‍ය කල්පලක්ෂයක් ද, කාල පරිච්ඡෙදය වෙයි. මේ භෙදය ප්‍රඥ ශ්‍රද්ධා වීර්‍ය්‍ය අධික බෝසතුන්ගේ වශයෙනි. කළ අභිනීහාර ඇති බෝසත්නට සොළොස් අනුසස් කෙනෙක් දක්වනලද වෙති. තවද සම්‍යක් සම්බුද්ධභාවය දෙතිස් මහාපුරුෂලක්ෂණ අසූ අනු ව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා කෙතුමාලාලඞ්කෘත රූපකායසම්පත්තිය දසබල චතුර්වෛසාරද්‍ය ෂඩ් අසාධාරණඥනාදි ධර්මකායසම්පත්තිය බුදුකෙනකුනුදු විසින් කියා නො නිම වියැහැකි ගුණසම්පත් පාරමිතාඵල යි.

මෙසේ බුද්ධත්‍වය සඳහා පැරුම්දම් පිරූ අයුරු වදළ චරියාපිටක දෙශනාව සැදූහැති සත්පුරුෂයනට නිවන් අවසන් කොට ඇති ලොවී-ලොවුතුරු සුව එළවන ධර්මපරියායයෙකි. මෙහි දක්වූ චරියා පිළිබඳ විස්තරකථා ජාතක දෙශනායෙන් දතයුත්තේ යි.

**ලබුගම ලඞ්කානන්‍ද ස්ථවිර.**

15 පෙබරවාරි $\frac{2520}{1977}$
ප්‍රවචනෝදය පිරිවෙන,
මොල්ලිගොඩ – වාද්දුව.

## සංකෙත නිරූපණය

| | |
|---|---|
| සීමු. | සිංහලාක්ෂර මුද්‍රිත බුද්ධවංසය, චරියාපිටක පාළි |
| මඡසං. | බුරුම රට ඡට්ඨසඞ්ගායනා මුද්‍රිත ග්‍රන්‍ථ |
| ස්‍යා. | ස්‍යාම (තායි) අක්ෂර මුද්‍රිත ග්‍රන්‍ථ |
| නා. | නාගරාක්ෂර මුද්‍රිත ග්‍රන්‍ථ |
| PTS. | Pali Text Society Buddhavanse - Chariyapitaka |
| මවි. | මධුරත්‍ථවිලාසිනී - බුද්ධවංසට්ඨකථා |
| ප. | පරමත්‍ථදීපනී - චරියාපිටකට්ඨකථා |
| පු. | අට්ඨකථාගත පුරාණපාඨාන්‍තර |
| මනුප. | මහනුවර පත්තිරුප්පුවට අයත් පුස්කොළ පොත් |

## බුද්ධවංස පාළි

# ශුද්ධා’ශුද්ධ දර්ශනය

| පිටුව | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 4 | 20 | සබ්බ ්රතනානිම්මිතං | සබ්බරතනනිම්මිතං |
| 14 | 5 | දිබ්බකබුනං | දිබ්බවකබූනං |
| 28 | 13 | දිෙසා දසං | දිසොදිසං |
| 31 | 24 | අනසුව | අනාසුව |
| 36 | 13 | ජිගච්ඡා | ජිඝච්ඡා |
| 39 | 4 | පැනුණහ | පැනුණාහ |
| 40 | 3 | විතතං | විතථං |
| 50 අධොලිපි 1 | | හඟථ | හායථ |
| 62 | 22 | උක්කුට්ඨිසද්ද | උක්කුට්ඨිසද්දං |
| 63 | 10 | දෙවින් | දෙවියන් |
| 73 | 11 | අධිෂ්ඨන' | අධිෂ්ඨාන |
| 75 | 19 | සම්ම සම්බුදුහු | සම්මා සම්බුදුහු |
| 107 | 14 | අතුරුදහන් වූහ | අතුරුදහන් විය |
| 114 | 10 | බුද්ධඤාණො ච | බුද්ධඤාණෙ ච |
| 118 | 19 | ප සා | පදසා |
| ,, | 20 | පධන | පධාන |
| 121 | 23 | අතුරුදහන් වූහ | අතුරුදහන් විය |
| 134 | 18 | පුනබ්බ සුමිතෙත | පුනබ්බසුමිත්තා |
| 142 | 12 | අධිට්ඨාහිං | අධිට්ඨහිං |
| 144 | 18 | ඔපතෙනහි | ඔපම්මෙහි |
| 161 | 28 | සුනන්ද නම් | සුනන්ද නැමු |
| 162 | 4 | විවිතොලි | විවිතොලි |
| 163 | 9 | ශ ස්තෘන් | ශාස්තෘන් |
| 174 | 19 | බ්‍රහ්මෙ වො ච | බ්‍රහ්මදෙවො ච |
| ,, | 21 | ඵුස්සා'වෙ වා ච | ඵුස්සා චෙව |
| 180 | 18 | විරජ්ජිස්ස ම | විරජ්ජිස්සාම |
| 183 | 9 | ඵුස්ධ | ඵුස්ස |
| 187 | 4 | සභ මැද | සභ මැද |

| පිටුව | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 191 | 1 | පුනබ්බසුමිස්ස යැ | පුනබ්බසූමිත්ත යැ |
| 223 | 11 | බු හු ද | බුදුහු ද |
| 224 | 3 | සඤ්ජඩ්ඪිතං | සඤ්ඡඩ්ඪිතං |
| 232 | 4 | සාවකො | සසාවකො |
| ,, | 9 | සෙත්‍යාරාමම්හි | සෙතව්‍යාරාමම්හි |
| 238 | 6 | ජපපභා | ජප්පභා |
| 245 | 13 | පිහිටියාහ | පිහිටියේ යැ |

## චරියාපිටක පාළි

# ශුද්ධා'ශුද්ධ දර්ශනය

| පිටුව | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 251 | 2 | සම්‍යක් සම්මා සම්බුද්ධ | සම්‍යක් සම්බුද්ධ |
| 254 | 15 | ජාතකො | ඡාතකො |
| 255 | 18 | සියලු ශරීරය ද | සිය ශරීරය ද |
| 260 | 4 | චාවෙය්‍ය | යාචෙය්‍ය |
| 264 | 1 | වචනකාලො | චවනකාලො |
| ,, | 19 | සාහවං | සභාවං |
| 266 | 14 | පබෙබාජෙසුං | පබ්බාජෙසුං |
| 268 | 15 | ස සසන්ති | පස්සන්ති |
| 270 | 4 | පබ්බත | පබ්බතං |
| 274 | 3 | මකෙකටා ච | මක්කටො ච |
| ,, | 7 | දිස්වාන පූරිතං | දිස්වා න පූරිතං |
| ,, | 16 | තිණ දතවෙ | තිණං දතවෙ |
| 276 අධොලිපි | 9 | යජසං | මජසං |
| 278 | 5 | පරිබා'යසො | පරිබාය'සො |
| 279 | 15 | දූක | දූන |
| 282 | 6 | චිත්තානුවත්තෙනෙතා | චිත්තානුවත්තනෙනා |
| ,, | 8 | ජාරිකං | ඡාරිකං |
| 288 | 22 | රුරුරාජ චරියං | රුරුමිගරාජ චරියං |
| 293 | 18 | අලීනසත්තු | අලීනසත්ත |
| 296 | 1 | සපාගරත්තං | සසාගරත්තං |
| 310 | 11 | සත්ත හං | සත්තාහං |
| 318 | 14 | තිරියා | කිරියං |
| 323 | 18 | බූරණැස් | බරණැස් |
| 324 | 1 | ජවට්ඨිකං | ඡවට්ඨිකං |
| ,, | 3 | අප ර | අපරෙ |
| 326 | 1 | සමෙබ ධි | සමෙබාධි |
| ,, | 2 | සච්චච චානුරක්ඛිය | සච්චවාචානුරක්ඛිය |

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ e | ඔ o |

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | ං ṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

### CONJUCT - CONSONANTS

| | | | |
|---|---|---|---|
| කක kka | ඤඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| කඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ ,mba |
| ක්‍ය kya | ඤ්ච n̄ca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, n̄cha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, n̄ja | ද්ව, dva | ම්භ mbha |
| ඛ්‍ය khya | ඤ්ඣ n̄jha | ධ්ව dhva | ය්ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ගග gga | ට්ඨ, ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ගඝ ggha | ඩ්ඩ dda | න්ද nda | ල්‍ය lya |
| ඞක ṅka | ඩ්ඪ ddha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර grâ | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඤ්ඛ ñkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඤ්ග ñga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ṇda | ප්ඵ ppha | ස්ව sva |
| චච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| චඡ ccha | ත්ථ ttha | බ්භ bbha | හ්ව hva |
| ජජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජඣ jjha | | ම්ප mpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු u | ූ ū | ෙ e | ො o |

## බුද්ධවංස - විසයසූචි


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | රතන චඞ්කමන කණ්ඩො | | | ... | ... | 2 – 19 |
| | සුමෙධ කථා | | | ... | ... | 20 – 53 |
| 1 | දීපඞ්කර බුද්ධවංසො | | | ... | ... | 54 – 59 |
| 2 | කොණ්ඩඤ්ඤ බුද්ධවංසො | | | ... | ... | 60 – 67 |
| 3 | මඞ්ගල | ,, | ,, | ... | ... | 68 – 75 |
| 4 | සුමන | ,, | ,, | ... | ... | 76 – 83 |
| 5 | රෙවත | ,, | ,, | ... | ... | 84 – 91 |
| 6 | සොභිත | ,, | ,, | ... | ... | 92 – 99 |
| 7 | අනොමදස්සී | ,, | ,, | ... | ... | 100 – 107 |
| 8 | පදුම | ,, | ,, | ... | ... | 108 – 113 |
| 9 | නාරද | ,, | ,, | ... | ... | 114 – 121 |
| 10 | පදුමුත්තර | ,, | ,, | ... | ... | 122 – 129 |
| 11 | සුමෙධ | ,, | ,, | ... | ... | 130 – 137 |
| 12 | සුජාත | ,, | ,, | ... | ... | 138 – 145 |
| 13 | පියදස්සී | ,, | ,, | ... | ... | 146 – 151 |
| 14 | අත්ථදස්සී | ,, | ,, | ... | ... | 152 – 157 |
| 15 | ධම්මදස්සී | ,, | ,, | ... | ... | 158 – 163 |
| 16 | සිද්ධත්ථ | ,, | ,, | ... | ... | 164 – 169 |
| 17 | තිස්ස | ,, | ,, | ... | ... | 170 – 177 |
| 18 | ඵුස්ස | ,, | ,, | ... | ... | 178 – 183 |
| 19 | විපස්සී | ,, | ,, | ... | ... | 184 – 191 |
| 20 | සිඛී | ,, | ,, | ... | ... | 192 – 199 |
| 21 | වෙස්සභූ | ,, | ,, | ... | ... | 200 – 207 |
| 22 | කකුසන්ධ | ,, | ,, | ... | ... | 208 – 215 |
| 23 | කොණාගමන | ,, | ,, | ... | ... | 216 – 223 |
| 24 | කස්සප | ,, | ,, | ... | ... | 224 – 233 |
| 25 | ගොතම | ,, | ,, | ... | ... | 234 – 239 |
| | බුද්ධපකිණ්ණක කණ්ඩො | | | ... | ... | 240 – 243 |
| | ධාතුභාජනීය කථා | | | ... | ... | 244 – 247 |

## චරියාපිටක - විසයසූචි


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | දාන පාරමිතා | | | 250 | - 277 |
| 1 | අකිත්ති චරියං | ... | ... | 250 | - 253 |
| 2 | සඞ්ඛ චරියං | ... | ... | 252 | - 253 |
| 3 | කුරුධම්ම චරියං | ... | ... | 254 | - |
| 4 | මහාසුදස්සන චරියං | ... | ... | 254 | - 257 |
| 5 | මහාගොවින්ද චරියං | ... | ... | 256 | - 257 |
| 6 | නිමිරාජ චරියං | ... | ... | 258 | - 259 |
| 7 | චන්දකුමාර චරියං | ... | ... | 258 | - 259 |
| 8 | සිවිරාජ චරියං | ... | ... | 260 | - 263 |
| 9 | වෙස්සන්තර චරියං | ... | ... | 262 | - 273 |
| 10 | සසපණ්ඩිත චරියං | ... | ... | 274 | - 277 |

අකිත්තිවග්ගො පඨමො

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. | සීල පාරමිතා | | | 278 | - 297 |
| 1 | මාතුපොසක චරියං | ... | ... | 278 | - 279 |
| 2 | භූරිදත්ත ,, | ... | ... | 280 | - 281 |
| 3 | චම්පෙය්‍යනාග ,, | ... | ... | 282 | - 283 |
| 4 | චූලබොධි ,, | ... | ... | 282 | - 285 |
| 5 | මහිසරාජ ,, | ... | ... | 284 | - 287 |
| 6 | රුරුමිගරාජ ,, | ... | ... | 286 | - 289 |
| 7 | මාතඞ්ග ,, | ... | ... | 290 | - 291 |
| 8 | ධම්මදෙවපුත්ත ,, | ... | ... | 290 | - 293 |
| 9 | අලීනසත්ත ,, | ... | ... | 292 | - 295 |
| 10 | සඞ්ඛපාල ,, | ... | ... | 294 | - 297 |

හත්ථිනාගවග්ගො දුතියො

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. | නෙක්ඛම්ම පාරමිතා | | | 298 | - 307 |
| 1 | යුධඤ්ජය චරියං | ... | ... | 298 | - 299 |
| 2 | සොමනස්ස ,, | ... | ... | 298 | - 303 |
| 3 | අයොඝර ,, | ... | ... | 302 | - 305 |
| 4 | භිස ,, | ... | ... | 304 | - 305 |
| 5 | සොණපණ්ඩිත ,, | ... | ... | 306 | - 307 |

| | | | |
|---|---|---|---|
| **4.** | **අධිට්ඨානපාරමිතා** | | **308 – 311** |
| 6 | තෙමිය පණ්ඩිත චරියං | ... ... | 308 – 311 |
| **5.** | **සච්චපාරමිතා** | | **312 – 313** |
| 7 | කපිරාජ චරියං | ... ... | 312 – 321 |
| 8 | සච්චපණ්ඩිත ,, | ... ... | 312 – 313 |
| 9 | වට්ටපොතක ,, | ... ... | 312 – 315 |
| 10 | මච්ඡරාජ ,, | ... ... | 314 – 317 |
| 11 | කණ්හදීපායන ,, | ... ... | 316 – 319 |
| 12 | සුතසොම ,, | ... ... | 320 – 321 |
| **6.** | **මෙත්තා පාරමිතා** | | **322 – 323** |
| 13 | සුවණ්ණසාම චරියං | ... ... | 322 – 323 |
| 14 | එකරාජ ,, | ... ... | 322 – 323 |
| **7.** | **උපෙක්ඛා පාරමිතා** | | **324 – 325** |
| 15 | මහාලොමහංස චරියං | ... ... | 324 – 325 |
| | උද්දානං | ... ... | 324 – 327 |

# සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

# බුද්ධවංසපාළි

# සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

# බුද්ධවංසපාළි

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස**

## රතනචඞ්කමනකණ්ඩො

1. බ්‍රහ්මා ච ලොකාධිපතී සහම්පති[1]
කතඤ්ජලී අනධිවරං අයාචථ
සන්තීධ සත්තා අප්පරජක්ඛජාතිකා[2]
දෙසෙහි ධම්මං අනුකම්පිමං පජං.

2. සම්පන්නවිජ්ජාචරණස්ස තාදිනො
ජුතින්ධරස්සන්තිමදෙහධාරිනො
තථාගතස්සප්පටිපුග්ගලස්ස
උප්පජ්ජි කාරුඤ්ඤතා සබ්බසත්තෙ.

3. න හෙතෙ ජානන්ති සදෙවමානුසා
බුද්ධො අයං කීදිසකො නරුත්තමො
ඉද්ධිබලං පඤ්ඤාබලඤ්ච කීදිසං
බුද්ධබලං ලොකහිතස්ස කීදිසං.

4. න හෙතෙ ජානන්ති සදෙවමානුසා
බුද්ධො අයං ඊදිසකො නරුත්තමො
ඉද්ධිබලං පඤ්ඤාබලඤ්ච ඊදිසං[3]
බුද්ධබලං ලොකහිතස්ස ඊදිසං[3]

5. හන්දාහං දස්සයිස්සාමි – බුද්ධබලං අනුත්තරං[4]
චඞ්කමං මාපයිස්සාමි – නභෙ රතනමණ්ඩිතං[5]

---

1. සහම්පතී, මජසං, සීමු, මව්
2. සක්ඛාපරජක්ඛජාතිකා - මජසං, මව්
3. එදිසං - මජසං, මව්
4. බුද්ධබලමනුත්තරං–මජසං, මව්.
5. සබ්බරතනමණ්ඩිතං - මව්

## සූත්‍රාන්තපිටකයේ ඛුද්දකනිකායෙහි

# බුද්ධවංශපාළිය

### ඒ භාග්‍යවත් වූ අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!

## රතනචඞ්ක්‍රමණ කාණ්ඩය

1. සත්ත්වලෝකයට අධිපති වූ සහම්පති නම් බ්‍රහ්ම තෙමේ මුදුනෙහි කළ ඇඳිලිපුට ඇති ව – ‘මෙ සත්ලොවැ නුවණැස්හි අල්ප වූ කෙලෙස්-රජස් ඇති සත්ත්වයෝ ඇත්තාහ. ඔවුනට සිව්සස්දහම් දෙසනු මැනවැ මේ සත්ත්වප්‍රජාවට අනුකම්පා කළ මැනවැ’ යි අනුත්තර වූ සර්වඥයන් වහන්සේට ආයාචනා කෙළේ ය.

2. පරිපූර්ණ වූ අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්ම ඇති (ඉෂ්ටානිෂ්ටාදියෙහි) තාදී වූ ශරීරකාන්ති හෝ ප්‍රඥාප්‍රදීප ධරන්නා වූ පශ්චිම-ශරීරධාරී වූ අප්‍රතිපුද්ගල වූ තථාගතයන් වහන්සේට සියලු සත්ත්ව නිකායෙහි කරුණාව උපන.

3. තෙල (මාගේ ඥාති ආදී) සදෙවමනුෂ්‍යයෝ ‘නරෝත්තම වූ මේ සර්වඥයන් වහන්සේ කෙබඳු වූවාහු ද, ලොවට හිත වූ සර්වඥයන්ගේ ඍද්ධිබලයත් ප්‍රඥාබලයත් කෙබඳු වී ද, බුද්ධබලය කෙබඳු වී ද’ යි යම් හෙයෙකින් නො දනිත් ද.

4. තෙල දෙවියන් සහිත මනුෂ්‍යයෝ ‘නරෝත්තම වූ මේ සර්වඥයෝ මෙ බඳු වූවාහු යැ, ලොවට හිත වූ සර්වඥයන්ගේ ඍද්ධිබලයත් ප්‍රඥාබලයත් මෙ බඳු වීය. බුද්ධබලය මෙ බඳු වී’ යයි යම් හෙයෙකින් නො දන්නාහු ද,

5. එහෙයින් මම අනුත්තර වූ බුද්ධානුභාවය දක්වමි. අහස්හි මුක්තාමණි ආදි රත්නයෙන් අලඞ්කෘත වූ චඞ්ක්‍රමණයක් මවාලමි. (සිතූ සේක එකල්හි)

6. භුම්මා මහාරාජිකා තාවතිංසා
යාමා ච දෙවා තුසිතා ච නිම්මිතා
පරනිම්මිතා යෙපි ච බ්‍රහ්මකායිකා
ආනන්දිතා විපුලමකංසු ඝොසං.

7. ඔභාසිතා ච පථවී සදෙවකා
පුථූ ච ලොකන්තරිකා අසංවුතා
තමො ච තිබ්බො විහතො තදා අහු
දිස්වාන අච්ඡෙරකං පාටිහීරං.

8. සදෙවගන්ධබ්බමනුස්සරක්ඛසෙ
ආභා උළාරා විපුලා අජායථ
ඉමස්මිං ලොකෙ පරස්මිංචොභයස්මිං[1]
අධො'පි උද්ධං තිරියඤ්ච විත්ථතං.

9. සත්තුත්තමො අනධිවරො විනායකො
සත්ථා අහූ දෙවමනුස්සපූජිතො
මහානුභාවො සතපුඤ්ඤලක්ඛණො
දස්සෙසි අච්ඡෙරකං පාටිහීරං.

10. සො යාචිතො දෙවවරෙන චක්ඛුමා
අත්ථං සමෙක්ඛිත්වා තදා නරුත්තමො
චඞ්කමං තත්ථ[2] මාපයි ලොකනායකො
සුනිට්ඨිතං සබ්බරතනනිම්මිතං.

11. ඉද්ධී ච ආදෙසනානුසාසනී
තිපාටිහීරෙ භගවා වසී අහු
චඞ්කමං මාපයි ලොකනායකො
සුනිට්ඨිතං සබ්බරතනනිම්මිතං.

12. දසසහස්සී ලොකධාතුයා සිනෙරුපබ්බතුත්තමෙ
ථම්භෙ'ව දස්සෙසි පටිපාටියා චඞ්කමෙ රතනාමයෙ

13. දසසහස්සී අතික්කම්ම චඞ්කමං මාපයී ජිනො
සබ්බසොවණ්ණමයා[3] පස්සෙ චඞ්කමෙ රතනාමයෙ

1. පරස්මිංචොභයෙ-මචි, චූභයෙ-සයා
2. තත්ථ ඉති-මජසං නත්ථි
3. සබ්බසොණ්ණමයා-මජසං

6. (ප්‍රාසාද පර්වත වන වෘක්ෂාදියෙහි සිටි) භූමාටු දෙවියෝ ද සිවුමහරජයෙහි දෙවියෝ ද තව්තිසායෙහි දෙවියෝ ද යාම දෙවියෝ ද තුෂිත දෙවියෝ ද නිර්මාණරතී නම් දෙව්ලොවැ දෙවියෝ ද පරනිර්මිත-වශවර්ති නම් දෙවියෝ ද සොළොස් බඹතල වැසි දෙවියෝ ද සතුටු සිත් ඇත්තාහු මහත් වූ ඔල්වරසන් නැඟූහ.

(බුදුහු ඔදතකිසුණුසමවත් සමවැද දසදහසක් සක්වළ ආලොක වේව'යි ඉටූහ. එකෙණෙහි)

7. දෙවලොක සහිත වූ පෘථිවිය ද අසංවෘත වූ බොහෝ ලොකාන්තරිකයෝ ද අවභාෂිත වූහ. එකල්හි ඝනාන්ධකාරය ද නැසුණේ වී. ඒ අසිරිමත් පෙළහර දුක දෙවමනුෂ්‍යයෝ සතුටු වූහ.

8. දෙව ගඳඹ මිනිස් රකුස් යන මොවුන් සහිත මේ මිනිස් ලොව ද අන් දෙව්ලෝ ද යන උභයලොකයෙහි ද යට (අවීචිය ආදි නරකයන්හි) ද උඩ (අජටාකාශයෙහි) ද සරස (දසදහසක් සක්වළ) ද පැතිර පැවති මහත් වූ අප්‍රමාණ වූ ආලොකයෙක් උපන.

9. ශීලාදිගුණයෙන් සියලු සත්ත්‍වයන් කෙරෙහි උතුම් වූ තමන් වහන්සේට වඩා උසස් කෙනෙක් නැති. සත්ත්‍වයන් හික්මවන්නා වූ ශාස්තෘන් වහන්සේ දෙවිමිනිසුන් විසින් පුදනලද වූහ. මහත් අනුභාව ඇති සියපින්ලකුණෙන් යුත් සර්වඥයන් වහන්සේ ආශ්චර්‍ය්‍ය වූ පෙළහරක් දක්වූ සේක.

10. එකල්හි (පෙළහර අවසන්හි) මිනිසුන් අතර උතුම් වූ පසැස් ඇති ලෝනාහිමි වූ ඒ බුදුරජහු සහම්පති නම් මහබඹහු විසින් අයදනා ලද්දහු දෙවිමිනිසුනට වන වැඩ සලකා එහි මනාව නිමියා වූ සියලු රුවනින් නිමවනලද සක්මනක් මැවූහ.

11. බුදුහු ඍද්ධි - ආදෙශනා - අනුශාසනී යන තුන් පෙළහරෙහි (පස් අයුරෙකින්) වශී වූහ. ලොකනායක වූ බුදුහු මනාව නිමියා වූ සව්රුවන්-මුවා සක්මනක් මැවූහ.

12. දසදහසක් සක්වළෙහි උතුම් වූ මහාමෙරුපර්වතයන් රුවන් සක්මන්හි ටැඹ සෙයින් පිළිවෙළින් දක්වූහ.

13. පස්මරුන් දිනූ බුදුහු දසදහසක් සක්වළ ඉක්මවා සක්මන මැවූහ. රුවන්මුවා සක්මන්හි දෙපස සර්වසුවර්ණමයභූමි විය.'

14. තුලාසඞ්ඝාටානුවග්ගා සොවණ්ණඵලකත්ථතා
වෙදිකා සබ්බසොවණ්ණා[1] දුභතො පස්සෙසු නිම්මිතා

15. මණිමුත්තා වාලුකාකිණ්ණා[2] නිම්මිතා රතනාමයා
ඔභාසෙති දිසා සබ්බා සතරංසී'ව උග්ගතො.

16. තස්මිං චඞ්කමනෙ ධීරො ද්වත්තිංසවරලක්ඛණො
විරොචමානො සම්බුද්ධො චඞ්කමෙ චඞ්කමී ජිනො.

17. දිබ්බං මන්දාරවං පුප්ඵං පදුමං පාරිච්ඡත්තකං[3]
චඞ්කමනෙ ඔකිරන්ති සබ්බෙ දෙවා සමාගතා.

18. පස්සන්ති තං දෙවසඞ්ඝා දසසහස්සී පමොදිතා
නමස්සමානා නිපතන්ති තුට්ඨහට්ඨා පමොදිතා.

19. තාවතිංසා ච යාමා ච තුසිතා චා'පි දෙවතා
නිම්මානරතිනො දෙවා යෙ දෙවා වසවත්තිනො
උදග්ගචිත්තා සුමනා පස්සන්ති ලොකනායකං.

20. සදෙවගන්ධබ්බමනුස්සරක්ඛසා
නාගා සුපණ්ණා අථවා'පි රක්ඛසා
පස්සන්ති තං ලොකහිතානුකම්පකං
නභෙ'ව අච්චුග්ගතචන්දමණ්ඩලං.

21. ආභස්සරා සුභකිණ්ණා
වෙහප්ඵලා අකනිට්ඨා ච දෙවතා
සුසුද්ධ සුක්කවත්ථවසනා[4]
තිට්ඨන්ති පඤ්ජලීකතා.

22. මුඤ්චන්ති පුප්ඵං පන[5] පඤ්චවණ්ණිකං
මන්දාරවං චන්දනචුණ්ණමිස්සිතං
භමෙන්ති චෙලානි ච අම්බරෙ තදා
අහො ජිනො ලොකහිතානුකම්පකො.

23. තුවං සත්ථා ච කෙතු ච ධජො යූපො ච පාණිනං
පරායනො පතිට්ඨා[6] ච දීපො ච දිපදුත්තමො[7]

---

1. සබ්බා සොවණ්ණ–සීමු
2. වාලිකාකිණ්ණා–මජසං, මචි
3. පාරිජත්තකං–මජසං
4. සුසුද්ධසුක්කවසනා–සු
5. පුප්ඵානි වා–සු
6. පතිට්ඨො–සීමු
7. ද්විපදුත්තමො–මජසං, සීමු

14. යටකී මහමෙර ටැඹ මත ඊට අනුරූප වූ තුලාහඹුළු මතුයෙහි රන්පෝරු අතුරනලදැයැ. දෙපසැ මවනලද වෙදිකාව සර්වස්වර්ණමය වී.

15. මිණිමුතුවැල්ලෙන් ගැවැසුණු මවනලද රුවන්මුවා සක්මන උදහිරු මෙන් සියලු දික් හොබවයි.

16. ධීර වූ දෙතිස්මහපුරිස්ලකුණින් යුත් පස්මරුන් දිනූ සම්බුදුහු ඒ සක්මන්හි බබළමින් සක්මන් කළහ.

17. එහි රැස් වූ සියලු දෙවියෝ දෙව්ලොවැ හටගත් මදාරාමල් ද පියුම් ද පරසතුමල් ද සක්මනෙහි විසුරුවති.

18. දසදහසක් සක්වළ දෙවසමූහයෝ සතුටු සිත් ඇත්තාහු උන් වහන්සේ දක්නාහ. සතුටු වූවාහු තුටුපහටු වූවාහු වඳිමින් රැස් වෙති.

19. තව්තිසාවෙහි දෙවියෝ ද යාමයෙහි දෙවියෝ ද තවත් තුෂිතයෙහි දෙවියෝ ද නිර්මාණරතියෙහි දෙවියෝ ද පරනිර්මිතවසවර්ති දෙවියෝ ද ඔදවැඩිසිත් ඇත්තාහු සතුටු වූවාහු ලොකනායකයන් බලති.

20. දෙව් ගඳඹ මිනිස් යක් යන මොවුන් සහිත නා ගුරුළු යන මොහු ද තවත් රකුසෝ ද සත්ලොවට හිතානුකම්පා ඇති උන් වහන්සේ අහස්හි උද වූ සඳ සෙයින් දකිති.

21. ආභස්සර බඹහු ද සුභකිණ්ණ බඹහු ද වෙහප්ඵල බඹහු ද අකනිට්ඨා බඹහු ද ඉතා පිරිසුදු සුදුවත් හැඳ පෙරෙවියාහු මුදුනෙහි ඇඳිලි බැඳ සිටිත්.

22. තවද ආශ්චර්‍ය්‍යයෙකි, ජිනරාජයන් වහන්සේ සත්ලොවට හිතානුකම්පා ඇතියෙකැ'යි (ඒ පෙළහර දක්වන කල්හි) සඳුන්සුණු මිසු පස්පැ දිස්නා මදාරාමල් ද විසුරුවති. අහස්හි දිවසළු ද බමවත්.

23. නුඹ වහන්සේ ලෝසත්නට ශාස්තෘ වූවහ. කෙහෙළි වැන්නහ. ධ්වජයක් වැන්නහ. යාගස්තම්භයක් වැන්නහ. පිළිසරණයහ. ප්‍රතිෂ්ඨා වූවහ. ප්‍රදීපයක් වැන්නහ. දෙපා ඇතියනට උතුම් වූවහ' යි.

24. දසසහස්සිලොකධාතුයා දෙවතායො මහිද්ධිකා
පරිවාරෙත්වා නමස්සන්ති තුට්ඨහට්ඨා පමොදිතා.

25. දෙවතා දෙවකඤ්ඤා ච පසන්නා තුට්ඨමානසා
පඤ්චවණ්ණිකපුප්ඵෙහි පූජයන්ති නරාසභං.

26. පස්සන්ති තං දෙවසඞ්ඝා පසන්නා තුට්ඨමානසා
පඤ්චවණ්ණිකපුප්ඵෙහි පූජයන්ති නරාසභං.

27. අහො අච්ඡරියං ලොකෙ අබ්භුතං ලොමහංසනං
න මෙදිසං භූතපුබ්බං අච්ඡෙරං ලොමහංසනං.

28. සකං සකං හි[1] භවනෙ නිසීදිත්වාන දෙවතා
හසන්ති තා[2] මහාහසිතං දිස්වානච්ඡෙරකං නභෙ.

29. ආකාසට්ඨා ච භුම්මට්ඨා තිණපන්ථනිවාසිනො[3]
කතඤ්ජලී නමස්සන්ති තුට්ඨහට්ඨා පමොදිතා.

30. යෙ'පි දීඝායුකා නාගා පුඤ්ඤවන්තො මහිද්ධිකා
පමොදිතා නමස්සන්ති පූජයන්ති නරුත්තමං.

31. සඞ්ගීතියො පවත්තෙන්ති අම්බරෙ අනිලඤ්ජසෙ
චම්මනද්ධානි වාදෙන්ති දිස්වානච්ඡෙරකං නභෙ.

32. සඞ්ඛා ච පණවා චෙව අථො දෙණ්ඩිමා[4] බහූ
අන්තලික්ඛස්මිං වජ්ජෙන්ති[5] දිස්වානච්ඡෙරකං නභෙ.

33. අබ්භුතො වත නො අජ්ජ උප්පජ්ජි ලොමහංසනො
ධුවං අත්ථසිද්ධිං[6] ලභාම ඛණො නො පටිපාදිතො.

34. බුද්ධො'ති තෙසං සුත්වාන පීති උප්පජ්ජි තාවදෙ
බුද්ධො බුද්ධො'ති කථයන්තා තිට්ඨන්ති පඤ්ජලී කතා.

35. හිංකාරං සාධුකාරඤ්ච[7] උක්කුට්ඨිං සම්පසාදනං[8]
පජා ච විවිධා ගගනෙ වත්තෙන්ති[9] පඤ්ජලීකතා.

---

1. සකසකම්හි-මජසං. සකං සකම්හි-සීමු. මව්.
2. හසන්ති-සීමු
3. තිණපිට්ඨනිවාසනො-සීමු
4. ඩිණ්ඩිමා-මජසං
5. වජ්ජන්ති-මජසං
6. ධුවමත්ථසිද්ධිං-මජසං
7. හිඞ්කාරා, සාධුකාරා ච-මජසං
8. උක්කුට්ඨිසම්පහංසනං-මජසං
9. පටාකා විවිධා ගගනෙ වත්තන්ති-පු

24. දසදහස්ලෝධාහි මහත් සෘද්ධි ඇති දෙවියෝ තුටුපහටු වූවාහු ප්‍රමුදිත වූවාහු පිරිවරා සිට නමස්කාර කෙරෙති.

25. දෙවියෝ ද දෙවඟනෝ ද ප්‍රසන්න වූවාහු සතුටුසිත් ඇත්තාහු පස්වනක් මලින් නරශ්‍රෙෂ්ඨ වූ බුදුන් පුදති.

26. දිව්‍යසමූහයෝ ප්‍රසන්න වූවාහු සතුටුසිත් ඇත්තාහු ඒ නරශ්‍රෙෂ්ඨ වූ බුදුන් දකිති. පස්වනක් මලින් පූජා කෙරෙත්.

27. අහෝ! ලොකයෙහි ආශ්චර්‍ය්‍ය නියා යැ අද්භූත නියා යැ ලොමුදහනසුලු යැ. මා විසින් මෙබඳු ලොමුදහන ආශ්චර්‍ය්‍ය වූ අද්භූතයෙක් නුදුටුවිරූ යයි.

28. දෙවියෝ තමන් තමන්ගේ විමන්හි හිඳ අහස්හි ආශ්චර්‍ය්‍ය (පෙළහර) දැක මහසිනායෙන් සෙති.

29. අහස්විමන්වැසි වූ ද බූමාටුවිමන්වැසි වූ ද තල්ආදි තණරුක්-මුදුන්වැසි වූ ද මංවැසි වූ ද දෙවියෝ සතුටු වූවාහු තුටුපහටු වූවාහු බඳැදිලි වැ නමස්කාර කෙරෙත්.

30. බොහෝ ආයුෂ ඇති පින්වත් වූ මහත් සෘද්ධි ඇති යම් නාග කෙනෙක් වෙත් නම් (ඔහු ද) සතුටුසිත් ඇත්තාහු නරොත්තම බුදුරදුන් වඳිත් පුදත්.

31. (දෙවියෝ) අහස්හි ආශ්චර්‍ය්‍ය (පෙළහර) දැක පවන්මඟැ-අහස්හි දෙව්නළඟී පවත්වති, දිවබෙර වයත්.

32. (දෙවියෝ) අහස්හි ආශ්චර්‍ය්‍ය දැක සක් ද පණාබෙර ද යළි බොහෝ මිහිඟුබෙර ද අහස්හි වාදනය කෙරෙත්.

33. එකාන්තයෙන් අද අද්භූත වූ ලොමහඝියෙක් උපන්නේ නො! අවශ්‍යයෙන් අර්ථසිද්ධිය ලබම්හ. අප විසින් බුද්ධොත්පාද ක්ෂණය ලබන ලද.

34. 'බුද්ධ' යන වදන් අසා එකෙණෙහි ඒ දෙවියනට (පස්වණක්) ප්‍රීති උපන. ඔහු 'බුදුහ බුදුහ' යි කියමින් මුදුනෙහි ඇඳිලි බැඳ සිටිති.

35. දෙවාදි විවිධ ප්‍රජාවෝ අහස්හි බඳැදිලි වැ සිට හිංකාර නාදය ද සාධුකාර නාදය ද ඔල්වරහඬ ද ප්‍රසන්නාකාරය ද පවත්වති.

36. ගායන්ති සෙළෙන්ති ච වාදයන්ති ච
භුජානි පොථෙන්ති[1] ච නච්චයන්ති ච
මුඤ්චන්ති පුප්ඵං පන පඤ්චවණ්ණිකං
මන්දාරවං චන්දනචුණ්ණමිස්සිතං.

37. යථා තුය්හං මහාවීර පාදෙසු චක්කලක්ඛණං
ධජවජිරපතාකා[2] වඩ්ඪමානඞ්කුසාචිතං

38. රූපෙ සීලසමාධිම්හි පඤ්ඤාය ච අසාදිසො
විමුත්තියා අසමසමො ධම්මචක්කප්පවත්තනෙ

39. දසනාගබලං කායෙ තුය්හං පාකතිකං බලං
ඉද්ධිබලෙන අසමො ධම්මචක්කප්පවත්තනෙ.

40. එවං සබ්බගුණොපෙතං සබ්බඞ්ගසමුපාගතං
මහාමුනිං කාරුණිකං ලොකනාථං නමස්සථ.

41. අභිවාදනං ථොමනඤ්ච වන්දනඤ්ච පසංසනං
නමස්සනඤ්ච පූජඤ්ච සබ්බං අරහසී තුවං.

42. යෙ කෙචි ලොකෙ වන්දනෙය්‍යා
වන්දනං අරහන්ති යෙ
සබ්බසෙට්ඨො මහාවීර
සදිසො තෙ න විජ්ජති.

43. සාරිපුත්තො මහාපඤ්ඤො සමාධිජ්ඣානකොවිදො
ගිජ්ඣකූටෙ ඨිතොයෙව පස්සති ලොකනායකං.

44. සුඵුල්ලං සාලරාජං ව[3] චන්දංව ගගනෙ යථා
මජ්ඣන්තිකෙ'ව[4] සූරියං ඔලොකෙති නරාසභං

45. ජලන්තං දීපරුක්ඛං'ව තරුණසූරියං'ව[5] උග්ගතං
බ්‍යාමප්පභානුරඤ්ජිතං ධීරං පස්සති නායකං.

46. පඤ්චන්නං භික්ඛුසතානං කතකිච්චාන තාදිනං
ඛීණාසවානං විමලානං ඛණෙන සන්නිපාතයි.

---

1. පොඨෙන්ති–මජසං
2. පටාකා–මජසං
3. සුඵුල්ලසාලරාජංව–මචි.
4. මජ්ඣන්හිකෙව–මජසං
5. සූරියං'ව–මජසං

36. බුදුගුණ ගයති සිරුසන් පවත්වති වාදනය කෙරෙති, අපොළති, නටවති, (තුමූත් නටති) යළි පස්වණක් මල් වගුරුවති, සඳුන් සුණු මුසු වූ මදාරා මල් ද වගුරුවත්.

37. මහාවීරයන් වහන්ස, යම්සේ නුඹ වහන්සේ ගේ පා සඟළෙහි සර්වාකාරයෙන් පරිපූර්ණ වූ චක්‍රලක්ෂණ බබළා ද එසේයින් ධ්වජ-යෙන් වජ්‍රයෙන් පතාකායෙන් වර්ධමානයෙන් හා අඞ්කුශයෙන් ද (ඒ චක්‍ර ලක්ෂණය අලඞ්කෘත වී.)

38. රූපකාය සම්පත්තියෙහි ද ශීලයෙහි ද සමාධියෙහි ද ලොකොත්තරප්‍රඥයෙහි ද අනුපම වූවහ ඵලවිමුක්තියෙහි ද දම්සක් පැවැතුම්හි ද අසම වූ අතීත බුදුවරයන් හා සම වූවහ.

39. සදන්කුලයෙහි වූ දස ඇත් කෙනකුන් ගේ බලය නුඹ වහන්සේ ගේ කයෙහි පියවි බලය වෙයි. (විකුර්වණාදි) සෘද්ධිබලයෙන් අසමසමයහ. දම්සක් පැවැතුම්හි දෙශනාඥනයෙහි ද අසමයහ.

40. මෙසෙයින් සියලු ලොවි ලොවුතුරා ගුණයෙන් යුක්ත වූ සියලු ගුණාංගයෙන් සමුපෙත වූ මහාමුනි වූ කාරුණික වූ ලොක සවාමීන් නමස්කාර කරවු.

41. අභිවාදනයට ද (නො හමුයෙහි කරන) සතුතියට ද ප්‍රණාමයට ද (හමුයෙහි කරන) ප්‍රශංසාවට ද ඇඳිලි බැඳීමට ද (මල්ගඳ විලෙවුන් ආදියෙන්) පිදීමට ද යන සියලු සත්කාර විශෙෂයට නුඹ වහන්සේ නිසි වූවහ.

42. මහාවීරයන් වහන්ස, ලොවැ යම් කෙනෙක් වන්‍දනීය වූවාහු ද යම් කෙනෙක් වන්‍දනාවට නිසි වූවාහු ද නුඹ වහන්සේ ඒ සියල්ලන් කෙරෙහි ශ්‍රෙෂ්ඨ වූවහු යැ. නුඹ වහන්සේට සම වූයෙක් නැති.

43. මහාප්‍රාඥ වූ විතතසමාධියෙහි හා ප්‍රථමධ්‍යානාදියෙහි නිපුණ වූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ගිජුකුළු පව්වෙහි සිටියාහු මැ (රුවන් සක්මන්හි සක්මන් කරන) ලොකනායක වූ සර්වඥයන් වහන්සේ දුටුවාහ.

44. නරශ්‍රෙෂ්ඨ වූ සර්වඥයන් වහන්සේ සුපිපි සල්රුකක් මෙන් ද, අහසෙහි (තරු පිරිවරන ලද) පුන්සඳු සෙයින් ද, බබලන මධ්‍යාහ්න සූර්‍ය්‍යා සෙයින් ද දුටුවාහ.

45. දිලියෙන ව්‍යාමප්‍රභායෙන් හාත්පසින් රැඳුණු ධීර වූ ලොක-නායකයන් වහන්සේ (නැඟූ පහන් ඇති) දිලියෙන පහන් රුකක් සෙයින් ද උදයට පැමිණි ළහිරු මඬලක් සෙයින් ද දුටුවාහ.

46. සිව්සස්හි සිව්මඟින් කොට නිමැ වූ කිස ඇති ලාභාලාභාදි-යෙහි තාදී වූ මහනැණින් ක්ෂය කළ ආස්‍රව ඇති විගත වූ රාගාදි මල ඇති පන්සියක් භික්ෂූන් ඇසිල්ලෙකින් රැස් කරවූහ.

47. ලොකප්පසාදනං[1] නාම පාටිහීරං නිදස්සයි
අම්හෙ'පි තත්ථ ගමිස්සාම[2] වන්දිස්සාම මයං ජිනං.

48. එථ සබ්බෙ සමාගන්ත්වා පුච්ඡිස්සාම මයං ජිනං
කඞ්ඛං විනොදයිස්සාම පස්සිත්වා ලොකනායකං

49. සාධූති තෙ පටිස්සුත්වා නිපකා සංවුතින්ද්‍රියා
පත්තචීවරමාදාය තරමානා උපාගමුං[3]

50. ඛීණාසවෙහි විමලෙහි දන්තෙහි උත්තමෙ දමෙ
සාරිපුත්තො මහාපඤ්ඤො ඉද්ධියා උපසඞ්කමි.

51. තෙහි භික්ඛූහි පරිවුතො සාරිපුත්තො මහාගණී.
ජලන්තො දෙවො ගගනෙ'ව[4] ඉද්ධියා උපසඞ්කමි.

52. උක්කාසිතඤ්ච ඛිපිතං[5] අජ්ඣුපෙක්ඛිත්ව[6] සුබ්බතා
සගාරවා සප්පතිස්සා සම්බුද්ධං උපසඞ්කමුං.

53. උපසඞ්කමිත්වා පස්සන්ති සයම්භුං ලොකනායකං
නභෙ අච්චුග්ගතං ධීරං චන්දං'ව ගගනෙ යථා.

54. ජලන්තං දීපරුක්ඛං'ව විජ්ජුං'ව[7] ගගනෙ යථා
මජ්ඣන්තිකෙ'ව සූරියං පස්සන්ති ලොකනායකං.

55. පඤ්චභික්ඛුසතා සබ්බෙ පස්සන්ති ලොකනායකං
රහදමිව විප්පසන්නං සලිලං සුඵුල්ල පදුමං යථා[8]

56. අඤ්ජලිං පග්ගහෙත්වාන තුට්ඨහට්ඨා[9] පමොදිතා
නමස්සමානා නිපතන්ති සත්ථුනො චක්කලක්ඛණෙ.

57. සාරිපුත්තො මහාපඤ්ඤො කොරණ්ඩසමසාදිසො
සමාධිජ්ඣානකුසලො වන්දති[10] ලොකනායකං.

---

1. ලොකප්පසාදකං-පු
2. ගන්ත්වාන-මජසං
3. මුපාගමුං-මවි.
4. ලළන්තො, දෙවො'ව ගගනෙ-මජසං
5. ඛිපිතඤ්ච-ස්‍යා
6. අජ්ඣුපෙක්ඛිය-මජසං
7. විජ්ජුව-සීමු
8. සුඵුල්ලං පදුමං යථා-මජසං, සීමු, පු.
9. හට්ඨතුට්ඨා-මවි.
10. වන්දතෙ-මජසං

47. බුදුහු ලොකවිවරණ නම් වූ ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වූහ. ඇපිදු එහි යම්හ. ඇපි ජිතපඤ්චමාර වූ සර්‍වඥයන් වහන්සේ වඳිම්හ.

48. එනු මැන ඇපි හැමදෙනමෝ රැස් වැ සිට ජිතපඤ්චමාර වූ බුදුරදුන් විචාරම්හ. ලොකනායකයන් වහන්සේ දැක කාඞ්ක්ෂා දුරු කරම්හ.

49. නිපකප්‍රඥ ඇති සංවර කළ ඉඳුරන් ඇති ඒ භික්ෂූහු මැනැවැ යි පිළිවදන් දී පාසිවුරු ගෙන යුහු වැ තෙරුන් කරා එළඹියාහු යැ.

50. උත්තම දම සඞ්ඛ්‍යාත අර්හත්‍වය නිමිති කොට කයින් හා සිතින් හා දමුණු විගතමල වූ ඒ ක්ෂීණාසුවයන් සමග මහාප්‍රාඥ වූ සැරියුත් මහතෙරණුවෝ සෘද්ධියෙන් බුදුන් වෙත එළඹියහ.

51. මහත් වූ ගණ ඇති ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂූන් විසින් පිරිවරන ලද්දහු අහස්හි දිළියෙන දෙවියකු සෙයින් සෘද්ධියෙන් බුදුරදුන් කරා එළඹියහ.

52. ඒ භික්ෂූහු උකැසිහඬ ද කිවිසිහඬ ද නො කොට සුවිමල ධුතගුණ ඇත්තාහු බුද්ධ ගෞරවයෙන් සගෞරව වුවාහු නිවවෘත්ති ඇත්තාහු සම්මාසම්බුදුන් කරා එළඹියාහ.

53. එළැඹ ගුවන්තෙලෙහි උදයට පැමිණි චන්ද්‍රයා සෙයින් ස්වයම්භූ වූ ලොකනායක වූ අහස්හි පැන නැඟී සිටි ධීර වූ සර්‍වඥයන් වහන්සේ දක්නාහ.

54. දිළියෙන පහන්රුකක් සෙයින් ද ගුවන්තෙලෙහි විදුලිය සෙයින් ද මධ්‍යාහ්නයෙහි සූර්‍ය්‍යයා සෙයින් ද ලොකනාථයන් වහන්සේ දුටුවාහ.

55. සියලු පන්සියක් භික්ෂූහු පහන්දිය ඇති සුපිපි පියුම් ඇති විලක් සෙයින් ලොකනායකයන් වහන්සේ දුටුවාහ.

56. (සැරියුත් තෙරුන් ප්‍රමුඛ ඒ භික්ෂූහු) මුදුනෙහි ඇඳිලි බැඳගෙන තුටුපහටු වූවාහු ප්‍රමුදිත වූවාහු නමස්කාර කෙරෙමින් ශාස්තෘන් වහන්සේ ගේ චක්‍රලක්ෂණ ඇති පාද සමීපයෙහි වැඳ වැටුණාහ.

57. මහනුවණැති වූ කටුකරඬු මල් සුදුසු පැහැ ඇති වූ චිත්තසමාධි-යෙහි හා ප්‍රථමධ්‍යානාදියෙහි ඡෙක වූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ලොකනායක වූ සර්‍වඥයන් වහන්සේ වැන්දහ.

58. ගජ්ජිතා[1] කාලමෙඝො'ව නීලුප්පලසමසාදිසො
ඉද්ධිබලෙන[2] අසමො මොග්ගල්ලානො මහිද්ධිකො.

59. මහාකස්සපො'පි ච ථෙරො උත්තත්තකනකසන්නිභො
ධුතගුණෙ අග්ගනික්ඛිත්තො ථොමිතො සත්ථුවණ්ණිතො.

60. දිබ්බචක්ඛූනං යො අග්ගො අනුරුද්ධො මහාගණී
ඤාතිසෙට්ඨො භගවතො අවිදූරෙ'ව තිට්ඨති.

61. ආපත්තිඅනාපත්තියා සතෙකිච්ඡාය[3] කොවිදො
විනයෙ අග්ගනික්ඛිත්තො උපාලි සත්ථුවණ්ණිතො.

62. සුඛුමනිපුණත්ථපටිවිද්ධො කථිකානං පවරො ගණී
ඉසි මන්තානියා පුත්තො පුණ්ණො නාමා'ති විස්සුතො.

63. එතෙසං චිත්තමඤ්ඤාය ඔපම්මකුසලො මුනි
කඞ්ඛච්ඡෙදො මහාවීරො කථෙසි අත්තනො ගුණං.

64. චත්තාරො තෙ අසඞ්ඛෙය්‍යා කොටි යෙසං න ඤායති
සත්තකායො ච ආකාසො චක්කවාළා ච නන්තකා
බුද්ධඤාණං අප්පමෙය්‍යං න සක්කා එතෙ විජානිතුං.

65. කිං එතං අච්ඡරියං ලොකෙ යං මෙ ඉද්ධිවිකුබ්බනං
අඤ්ඤෙ බහූ අච්ඡරියා අබ්භුතා ලොමහංසනා.

66. යද'හං තුසිතෙ කායෙ සන්තුසිතො නාමහං තදා
දසසහස්සී සමාගම්ම යාචන්ති පඤ්ජලී මමං.

67. කාලො'යං තෙ[4] මහාවීර උප්පජ්ජ මාතුකුච්ඡියං
සදෙවකං තාරයන්තො බුජ්ඣස්සු අමතං පදං.

1. ගජ්ජිතො–සීමු
2. ඉද්ධිවිසයෙ–මවි.
3. සතිකිච්ඡාය–පු
4. කාලො ඛො තෙ – මජසං, කාලො දෙව – සීමු, කාලො තෙ – පු.

58. ගර්ජනා කරන කාළමෙඝයක් බඳු වූ නීලොත්පල සදෘශ ප්‍රභා ඇති සෘද්ධිබලයෙන් අසම වූ මහත් සෘද්ධි ඇති මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ සර්වඥයන් වහන්සේ වැන්දහ.

59. රත්රන් බඳු සිවිපැහැ ඇති, ධුතගුණයෙහි අගතැන්හි තබන ලද, ශාස්තෘන් වහන්සේ විසින් ස්තුති කරන ලද වර්ණනා කරන ලද මහසුප් මහතෙරුණුවෝ ද සර්වඥයන් වහන්සේ වැන්දහ.

60. යම් කෙනෙක් දිවැස් ඇතියන් අතුරින් අග්‍ර වූ නම් භාග්‍යවතුන් වහන්සේගේ ඥාතිශ්‍රෙෂ්ඨ වූ නම් ඒ මහත් ගුණ ඇති අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ නුදුරෙහි මැ සිටියාහ.

61. ප්‍රතිකර්ම සහිත වූ ද රහිත වූ ද, ආපත්තිඅනාපත්තියෙහි ඡෙක වූ, විනයෙහි අගතැන්හි තබන ලද, ශාස්තෘන් විසින් වර්ණනා කරන ලද උපාලි තෙරණුවෝ (නුදුරෙහි මැ සිටියාහ.)

62. ප්‍රතිවෙධ කළ සූක්ෂ්ම වූ නිපුණ වූ අර්ථ ඇති, ධර්ම කථිකයන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ වූ ගුණ ඇති සෘෂි වූ, මන්තානි නම් බැමිණියගේ පුත්‍ර වූ ‘පුණ්ණ’ නමැයි ප්‍රසිද්ධ වූ තෙරණුවෝ ද (නුදුරෙහි සිටියාහ.)

63. මොවුන්ගේ සිත් දැන උපමායෙහි දක්ෂ වූ සැක සිඳුනා වූ මහත් වීර්‍ය්‍ය ඇති සර්වඥයන් වහන්සේ තමන් වහන්සේගේ ගුණ ප්‍රකාශ කළහ.

64. යම් කෙනකුන්ගේ අන්තය නො පැනේ නම් මොහු සතර දෙන සඞ්ඛ්‍යානයට (ගණනට) නො හැකි වෙති: සත්ත්ව සමූහය ද ආකාශය ද චක්‍රවාටයෝ ද අනන්තයෝ යැ බුද්ධඥානය ප්‍රමාණ කළ නො හැක්කේ යැ. මොහු දැනගන්නට නො හැක්කාහ.

65. මාගේ සෘද්ධි විකුර්වණය යන යමෙක් ඇද්ද තෙල ලොවැ කවර නම් ආශ්චර්‍ය්‍යයෙක් ද? අද්භූත වූ ලොමුදහ ගන්වන අනර්ඝ වූ අශ්චර්‍ය්‍යයෝ බොහෝ වෙති.

66. යම් කලෙකැ මම තුෂිත දිව්‍යනිකායයෙහි සන්තුෂිත නම් දෙවි වූයෙම් ද එකල්හි දසදහසක් සක්වළැ දෙවියෝ රැස් වැ මා කරා පැමිණ බඳිලි වැ අයදින්:

67. මහාවීරයාණෙනි, මේ මුඹට බුදුවන්නට කලි. මව්කුසැ පිළිසිඳගනු මැනැවැ. දෙවියන් සහිත ලොකය තරණය කෙරෙමින් අමෘතපදය අවබොධ කළ මැනැවැ’ යි.

68. තුසිතා කායා චවිත්වාන යදා ඔක්කමී[1] කුච්ඡියං
දසසහස්සිලොකධාතු කම්පිත්ථ ධරණී තදා.

69. යදා'හං මාතුකුච්ඡිතො සම්පජානො'ව නික්ඛමිං
සාධුකාරං පවත්තෙන්ති[2] දසසහස්සී පකම්පථ[3].

70. ඔක්කන්ති[4] මෙ සමො නත්ථි ජාතිතො අභිනික්ඛමෙ
සම්බොධියං අහං සෙට්ඨො ධම්මචක්කප්පවත්තනෙ.

71. අහො අච්ඡරියං ලොකෙ බුද්ධානං ගුණමහන්තතා
දසසහස්සිලොකධාතු ඡප්පකාරං පකම්පථ
ඔභාසො ච මහා ආසි අච්ඡෙරං ලොමහංසනං.

72. භගවා ච තම්හි සමයෙ ලොකජෙට්ඨො නරාසභො
සදෙවකං දස්සයන්තො ඉද්ධියා චඞ්කමී ජිනො.

73. චඞ්කමෙ චඞ්කමන්තො'ව කථෙසි ලොකනායකො
අන්තරා න නිවත්තෙති චතුහත්ථෙ චඞ්කමෙ යථා[5].

74. සාරිපුත්තො මහාපඤ්ඤො සමාධිජ්ඣානකොවිදො
පඤ්ඤාය පාරමීප්පත්තො[6] පුච්ඡති ලොකනායකං.

75. කීදිසො තෙ මහාවීර අභිනීහාරො නරාසභ
කම්හි කාලෙ තයා ධීර පත්ථිතා බොධිමුත්තමා.

76. දානං සීලං ච නෙක්ඛම්මං පඤ්ඤාවීරියං ච කීදිසං
ඛන්තිසච්චමධිට්ඨානං මෙත්තුපෙක්ඛා ච කීදිසා.

---

1. ඔක්කමි-සීමු.
2. පවත්තන්ති-මජසං.
3. පකම්පිත්ථ-මවි.
4. ඔක්කන්තිං-මජසං
5. තදා-සීමු.
6. පාරප්පත්තො'පි, සීමු.

68. යම් කලෙක තුෂිත දිව්‍යනිකායෙන් ච්‍යුත වැ මව් කුසැ පිවිසියෙම් ද එකල්හි දශසහශ්‍රීලෙ කධාතු ධරණිය කම්පා විය.

69. යම් කලෙක මම සිහි ඇති වැ මැ මව්කුසින් නික්මියෙම් ද එකල්හි දශසහශ්‍රීලොකධාතුව සාධුකාර පවත්වමින් කම්පා විය.

70. ගර්භාවක්‍රාන්තියෙහි ද මව්කුසින් බිහිවීමෙහි ද මා හා සමයෙක් නැති. සම්බොධියෙහි දම්සක්පැවැත්මෙහි මම් ශ්‍රෙෂ්ඨයෙමි.

71. ලොවැ බුදුවරයන්ගේ ගුණමහත් බව අහො ආශ්චර්‍ය්‍ය යැ. දසදහසක් සක්වළැ මහපොළොව ෂඩ්ප්‍රකාරයෙකින් සැලුණේ යැ මහත් වූ අවභාසයෙක් ද ආශ්චර්‍ය්‍යයෙක් ද ලොමහර්ෂයෙක් ද විය.

72. එසමයෙහි ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ ජිතපඤ්චමාර වූ භාග්‍යවතුන් වහන්සේ ද දෙවියන් සහිත ලොකයාට පෙළහර දක්වමින් සෘද්ධියෙන් සක්මන් කළහ.

73. ලොකනායක වූ ශාස්තෲන් වහන්සේ සක්මන්හි සක්මන් කරන්නාහු මැ (මිහිරි දහම් කථා) වදළහ. (පැළ–පැදුන් සක්වළ මුවවිට හිම් කොට ඇති සක්මන්හි) සතර රියන් සක්මනෙක්හි සෙයින් අතුරෙහි නො නවත්නාහ.

74. මහාප්‍රාඥ වූ චිත්තසමාධියෙහි හා ප්‍රථමධ්‍යානාදියෙහි ජෙක වූ ශ්‍රාවකපාරමිඥානයෙහි පාරයට පැමිණි ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ලොකනායක වූ භාග්‍යවතුන් පුළුවුස්ති:

75. මහාවීරයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, මුඹ වහන්සේ ගේ අභිනීහාරය කිබඳු යැ? ධීරයන් වහන්ස, මුඹ වහන්සේ විසින් කවර කලෙකැ උත්තම බොධිය ප්‍රාර්ථනා කරන ලද ද?

76. (මුඹ වහන්සේ ගේ) දානය ද ශීලය ද නෛෂ්ක්‍රම්‍යය ද ප්‍රඥාව ද වීර්‍ය්‍ය ද කිබඳු යැ? ක්ෂාන්තිය ද සත්‍යය ද අධිෂ්ඨානය ද මෛත්‍රිය ද උපෙක්ෂාව ද කිබඳු යැ?

77. දසපාරමී තයා ධීර කීදිසා[1] ලොකනායක
කථං උපපාරමී පුණ්ණා පරමත්ථපාරමී කථං.

78. තස්ස පුට්ඨො වියාකාසි[2] කරවීකමධුරං ගිරො[3]
නිබ්බාපයන්තො හදයං හාසයන්තො සදෙවකං.

79. අතීතබුද්ධානං ජිනානං දෙසිතං
නිකීළිතං[4] බුද්ධපරම්පරාගතං
පුබ්බෙනිවාසානුගතාය බුද්ධියා
පකාසයී ලොකහිතං සදෙවකෙ.

80. පීතිපාමොජ්ජජනනං සොකසල්ලවිනොදනං
සබ්බසම්පත්තිපටිලාභං චිත්තීකත්වා සුණොථ[5] මෙ

81. මදනිම්මදනං සොකනුදං සංසාරපරිමොචනං[6]
සබ්බදුක්ඛක්ඛයං මග්ගං සක්කච්චං පටිපජ්ජථා'ති.

**රතනචඞ්කමනකණ්ඩො නිට්ඨිතො.**

---

1. කීදිසී – මජසං
2. ව්‍යාකාසි – සීමු
3. කරවීකමධුරගිරො – මජසං
4. නිකීලිතං (මජසං)
5. සුනාථ – මජසං,
6. සංසාරමොචනං – සීමු
සංසාරසමතික්කමං – පු

77. ධීර වූ ලොකනායකයන් වහන්ස, මුඹ වහන්සේ විසින් කෙබඳු දසපාරමී පුරන ලද ද? කෙසේ දස උපපාරමී පුරන ලද ද? කෙසේ දස පරමත්ථපාරමී පුරන ලද ද? යි.

78. ඒ සැරියුත් තෙරුන් විසින් පුළුවුස්නා ලද කුරවිකෙවිල්ලනට බඳු මිහිරි වදන් ඇති සර්වඥයන් වහන්සේ (කෙලෙසින් තැවුණුවුන්ගේ) ළය නිවමින් සදෙවක ලොකයා තුටු කෙරෙමින් ප්‍රකාශ කළාහු යැ.

79. ජිතපඤ්චමාර වූ අතීත බුදුවරයන් විසින් දෙශිත වූ උන්-වහන්සේගේ චරිතය වූ සම්බුදු පරපුරෙන් පැවැත ආවා වූ ලොවට හිත වූ බුද්ධවංශය පෙරවිසූ කඳපිළිවෙළ දන්නා නුවණින් දෙවියන් සහිත ලොකයාට ප්‍රකාශ කළ සේක.

80. ප්‍රීතිප්‍රමොද්‍යය උපදනා වූ ශොකශල්‍යය දුරු කරන්නා වූ සර්වසම්පත් ලාභයට කරුණු වූ මා කියන බුද්ධවංශ දෙශනාව සිත්හි ලා අසවු.

81. ජාත්‍යාදි මද නිර්මදනය කරන්නා වූ ශොකය දුරු කරන්නා වූ සංසාරබන්ධනයෙන් මුදලන්නා වූ ජාත්‍යාදි හැම දුක් ක්ෂය කරන්නා වූ මාර්ගය වූ බුද්ධවංශදෙශනාව සකසා අසවු.

නොහොත් ප්‍රීතිප්‍රමොද්‍ය උපදනා ශොකශල්‍ය දුරු කරන, සියලු සම්පත් ප්‍රතිලාභයට කරුණු වූ බුද්ධවංශදෙශනාව අසා.

මද නිර්මදනය කරන ශොකය දුරලන සසර බැඳුමින් මුදලන සියලු දුක් ක්ෂය කරන බුද්ධභාව සඞ්ඛ්‍යාත මාර්ගයට බසිවු'' යයි.

**රතනචඞ්ක්‍රමණ කාණ්ඩය නිමි.**

# සුමෙධ කථා

1. කප්පෙ ච සතසහස්සෙ ච චතුරො ච අසඞ්ඛියෙ
අමරං නාම නගරං දස්සනෙය්‍යං මනොරමං.

2. දසහි සද්දෙහි අවිවිත්තං අන්නපානසමායුතං
හත්ථිසද්දං අස්සසද්දං භෙරිසඞ්ඛරථානි ච[1]
ඛාදථ පිවථ චෙව අන්නපානෙන ඝොසිතං.

3. නගරං සබ්බඞ්ගසම්පන්නං සබ්බකම්මමුපාගතං
සත්තරතනසම්පන්නං නානාජනසමාකුලං
සමිද්ධං දෙවනගරංව ආවාසං පුඤ්ඤකම්මිනං.

4. නගරෙ අමරවතියා සුමෙධො නාම බ්‍රාහ්මණො
අනෙකකොටිනිචයො පහූතධනධඤ්ඤවා.

5. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදන පාරගු
ලක්ඛණෙ ඉතිහාසෙ ච සධම්මෙ පාරමිං ගතො.

6. රහොගතො නිසීදිත්වා එවං චින්තෙසහං තදා
දුක්ඛො පුනබ්භවො නාම සරීරස්ස ච භෙදනං
(සම්මොහමරණං දුක්ඛං ජරාය අභිමද්දනං.)*

7. ජාතිධම්මො ජරාධම්මො ව්‍යාධිධම්මො ච'හං සදා
අජරං අමරං ඛෙමං පරියෙසිස්සාමි නිබ්බුතිං.

8. යන්නූනිමං පූතිකායං නානාකුණපපූරිතං
ඡඩ්ඩයිත්වාන ගච්ඡෙය්‍යං අනපෙඛො[2] අනත්ථිකො.

9. අත්ථි හෙහිති සො මග්ගො න සො සක්කා න හෙතුයෙ
පරියෙසිස්සාමි තං මග්ගං භවතො පරිමුත්තියා.

10. යථා'පි දුක්ඛෙ විජ්ජන්තෙ සුඛං නාම'පි විජ්ජති
එවං භවෙ විජ්ජමානෙ විභවො'පි ඉච්ඡිතබ්බකො.

---

1. භෙරිසඞ්ඛරථාන ච–අසා
* ගාථාද්ධමිදං, සම්මොහවිනොදනියා, අට්ඨකථාය, දිස්සතෙ.
2. අනපෙක්ඛා–මජසං

## සුමෙධ කථා

1. සාරාසැකි කප්සුවහස් මතුයෙහි දකුම්කලු මනහර වූ අමර නම් නුවරෙක් වී.

2. ආහාරපානයෙන් යුක්ත වූ ඇතුන්ගේ කුඤ්චනාදය අසුන්ගේ හේසාරවය බෙර සක් රිය හඬින් ද (වීණා ගීත සම්මතාල ශබ්දයෙන් ද) කව පොව ආදි වූ ආහාරපාන පිළිබඳ ශබ්දයෙන් ඝොෂා කරන ලද දස වැදෑරුම් ශබ්දයෙන් නො වෙන් වූ,

3. සියලු නගරාඞ්ගයෙන් සම්පූර්ණ වූ සියලු කර්මාන්තයෙන් යුක්ත වූ සත්රුවනින් සමෘද්ධ වූ නානා ජනයා විසින් ගැවැසිගත් එනුවර සමෘද්ධ වූ (ආලකමන්ද) දෙව්නුවර සෙයින් පින්කම් කළ ජනයන්ට ආවාස වී.

4–5. ඒ අමරවතී නගරයෙහි රැස්කළ නොයෙක් කෙළ ගණන් බොහෝ ධන ධාන්‍ය ඇති වෙද හදරන්නා වූ වෙද මන්ත්‍ර ධරන්නා වූ ත්‍රිවෙදයාගේ පරතෙරට ගිය ලක්ෂණ ශාස්ත්‍රයෙහි ද ඉතිහාසයෙහි ද ස්වකීය බ්‍රාහ්මණධර්මයෙහි ද පරතෙරට ගිය සුමෙධ නම් බ්‍රාහ්මණයෙක් වී.

6. එකල්හි සුමෙධපණ්ඩිත නම් වූ මම් එකලා වැ හිඳ මෙසේ සිතීමි: පුනර්භවය නම් දුකෙකි, ශරීරභෙදන සඞ්ඛ්‍යාත මරණය ද දුකෙකි.

7. ඒ සුමෙධපණ්ඩිත සමයෙහි මම ඉපදීම ස්වභාව කොට ඇත්තෙම් ජරාව ස්වභාව කොට ඇත්තෙම් ව්‍යාධිය ස්වභාව කොට ඇත්තෙම් වෙමි. එහෙයින් ජරා රහිත වූ මරණ රහිත වූ නිර්භය වූ නිර්වාණය සොයන්නෙමි.

8. නානා කුණපයෙන් පිරුණු මේ කුණු කය හැර දමා නිරාලය වූයෙම් අර්ථී නො වූයෙම් යන්නෙම් නම් යෙහෙකැ යි.

9. (යම මාර්ගයෙකින් නිවනට යෙම් ද) ඒ මඟ අවශ්‍යයෙන් ඇත, වන්නේ යැ, ඒ මඟ හේතු නො වන්නට නො හැකි වෙයි, භවයෙන් මිදීම පිණිස ඒ මඟ සොයන්නෙමි.

10. යම්සේ දුක ඇති කල්හි සුවයෙකුදු ඇද්ද එසෙයින් භවය ඇති කල්හි විභවයෙකුදු කැමැති වියයුතු යැ.

11. යථා'පි උණ්හෙ විජ්ජන්තෙ අපරං විජ්ජති සීතලං
එවං තිවිධග්ගි විජ්ජන්තෙ නිබ්බානං ඉච්ඡිතබ්බකං.

12. යථා'පි පාපෙ විජ්ජන්තෙ කල්‍යාණමපි විජ්ජති
එවමෙව ජාති විජ්ජන්තෙ අජාතිපිච්ඡිතබ්බකා[1]

13. යථා ගූථගතො පුරිසො තළාකං දිස්වාන පූරිතං
න ගවෙසති තං තළාකං න දොසො තළාකස්ස සො.

14. එවං කිලෙසමලධොවං[2] විජ්ජන්තෙ අමතන්තළෙ
න ගවෙසති තං තළාකං න දොසො අමතන්තළෙ.

15. යථා අරීහි පරිරුද්ධො විජ්ජන්තෙ ගමනම්පථෙ[3]
න පලායති සො පුරිසො න දොසො අඤ්ජසස්ස සො.

16. එවං කිලෙසපරිරුද්ධො විජ්ජමානෙ සිවෙ පථෙ
න ගවෙසති තං මග්ගං න දොසො සිවමඤ්ජසෙ.

17. යථ'පි බ්‍යාධිතො පුරිසො විජ්ජමානෙ තිකිච්ඡකෙ
න තිකිච්ඡාපෙති තං ව්‍යාධිං න සො දොසො තිකිච්ඡකෙ.

18. එවං කිලෙසව්‍යාධීහි දුක්ඛිතො පරිපීළිතො[4]
න ගවෙසති තං ආචරියං න සො දොසො[5] විනායකෙ.

19. යථා'පි කුණපං පුරිසො කණ්ඨෙ බද්ධං ජිගුච්ඡිය
මොචයිත්වාන ගච්ඡෙය්‍ය සුඛී සෙරී සයං වසී.

20. තථෙ'විමං පූතිකායං නානා කුණපසඤ්චයං[6]
ඡඩ්ඩයිත්වාන[7] ගච්ඡෙය්‍යං අනපෙක්ඛො[8] අනත්ථිකො.

21. යථා උච්චාරට්ඨානම්හි[9] කරීසං නරනාරියො
ඡඩ්ඩයිත්වාන[7] ගච්ඡන්ති අනපෙක්ඛා අනත්ථිකා.

---

1. අජාතිපිවජ්ජිතබ්බකං - සීමු
2. කිලෙසමලධොවෙ - ධ. අ. සීමු, කිලෙසමලධොව - මජසං
3. ගමනෙ පථෙ - සීමු, අසා
4. පතිපීළිතො - මචි.
5. න දොසො සො - සීමු, මජසං.
6. නානා කුණපපූරිතං – පු.
7. ඡඩ්ඩයිත්වා – සීමු.
8. අනපෙක්ඛා – සීමු, මජසං, අසා.
9. උස්සාසට්ඨානම්හි – පු

11. යම්සේ උෂ්ණය ඇති කල්හි අන්‍ය ශීතලයෙකුදු ඇද්ද එසෙයින් (රාගාදි) තුන් ගිනි ඇති කල්හි නිවනෙක් කැමැති වියයුතු යැ.

12. යම්සේ පාපය ඇති කල්හි කුශලයෙකුදු ඇද්ද, එසෙයින් ජාතිය ඇති කල්හි නො ඉපැද්මකුදු කැමැති වියයුතු යැ.

13. යම්සේ මල වැකුණු මිනිසෙක් දිය පිරුණු තඩාගයක් දැක ඒ තඩාගය නො සොයා ද ඒ තඩාගයාගේ දොෂයෙක් නො වේ.

14. එසෙයින් කෙලෙස්මල දෙවීමෙහි පොහොසත් අමාවිල ඇති කල්හි ඒ අමාවිල නො සොයා නම් අමෘත සඞ්ඛ්‍යාත තඩාගයාගේ දොසෙක් නො වේ.

15. යම්සේ සතුරන් විසින් අවුරන ලදුයෙක් ගමනට නිසි මඟ ඇති කල්හි ඒ පුරුෂ තෙමේ නො පලායේ නම් ඒ මාර්ගයාගේ දොසෙක් නො වේ.

16. එසෙයින් කෙලෙසුන් විසින් හාත්පසින් අවුරන ලදුයේ නිවන් මඟ ඇති කල්හි ඒ මඟ නො සොයා නම් ඒ නිර්වාණමාර්ගයාගේ දොසෙක් නො වේ.

17. යම්සේ හටගත් ව්‍යාධි ඇති මිනිසෙක් පිළියම් කරන වෙදකු ඇති කල්හි ඒ ව්‍යාධියට පිළියම් නො කරවා නම් ඒ වෛද්‍යයාගේ දොසෙක් නො වේ.

18. එසෙයින් ක්ලෙශ නමැති ව්‍යාධීන් විසින් දුකට පැමිණියේ හාත්පසින් පෙලෙන ලදුයේ ඒ මෝක්ෂාචාර්‍ය්‍යයා නො සොයා නම් ඒ විනෙතෘ වූ ආචාර්‍ය්‍යයාගේ දොසෙක් නො වේ.

19. යම්සේ මිනිසෙක් ගෙලෙහි බඳ කුණපය ජුගුප්සා කොට හැර-පියා සුඛිත වූයේ ස්වෛරී වූයේ ස්වයංවශී වූයේ නික්ම යේ ද,

20. එසෙයින් ම අනෙකවිධ කුණපයන් රැස් වූ මේ කුණුකය හැරපියා අපෙක්ෂා රහිතයෙම් අනර්ථී වූයෙම් යන්නෙමි.

21. යම්සේ ස්ත්‍රීපුරුෂයෝ ඔවස් කිළියෙහි කරීස (මල) ය අපෙක්ෂා රහිත වූවාහු අනර්ථික වූවාහු හැරපියා යෙද්ද,

22. එවමෙවා'හං ඉමං කායං නානා කුණපපූරිතං
ඡඩ්ඩයිත්වාන ගච්ඡිස්සං වච්චං කත්වා යථා කුටිං.

23. යථා'පි ජජ්ජරං නාවං පලුග්ගං උදකගාහිනිං[1]
සාමී ඡඩ්ඩෙත්වා[2] ගච්ඡන්ති අනපෙක්ඛා අනත්ථිකා.

24. එවමෙවාහං ඉමං කායං නවච්ඡිද්දං ධුවස්සවං
ඡඩ්ඩයිත්වාන ගච්ඡිස්සං ජිණ්ණනාවං'ව සාමිකා.

25. යථා'පි පුරිසො චොරෙහි ගච්ඡන්තො භණ්ඩමාදිය
භණ්ඩච්ඡෙදභයං දිස්වා ඡඩ්ඩයිත්වාන ගච්ඡති.

26. එවමෙවමයං කායො මහාචොරසමො විය
පහායිමං ගමිස්සාමි කුසලච්ඡෙදනා භයා.

27. එවා'හං චින්තයිත්වාන නෙකකොටිසතං ධනං
නාථානාථානං දත්වාන හිමවන්තමුපාගමිං.

28. හිමවන්තස්ස අවිදූරෙ[3] ධම්මකො නාම පබ්බතො
අස්සමො සුකතො මය්හං පණ්ණසාලා සුමාපිතා.

29. චඞ්කමං තත්ථ මාපෙසිං පඤ්චදොසවිවජ්ජිතං
අට්ඨගුණසමූපෙතං අභිඤ්ඤාබලමාහරිං.

30. සාටකං පජහිං තත්ථ නවදොසමුපාගතං
වාකචීරං නිවාසෙසිං ද්වාදසගුණමුපාගතං[4]

31. අට්ඨදොසසමාකිණ්ණං පජහිං පණ්ණසාලකං
උපාගමිං රුක්ඛමූලං ගුණෙදසහුපාගතං[5].

32. වාපිතං රොපිතං ධඤ්ඤං පජහිං නිරවසෙසතො
අනෙකගුණසම්පන්නං පවත්තඵලමාදියිං.

33. තත්ථ පධානං[6] පදහිං නිසජ්ජට්ඨානචඞ්කමෙ
අබ්භන්තරම්හි සත්තාහෙ අභිඤ්ඤාබලමපාපුණිං[7]

---

1. පලුග්ගං උදගාහිනිං -- මජසං, පලුග්ගං උදකවාහිනිං - සී.
2. ඡඩ්ඩෙත්වා – මජසං, මචි.
3. හිමවන්තස්සාවිදූරෙ – මජසං.
4. ද්වාදසගුණුපාගතං - සීමු.
5. ගුණෙ දසමුපගතං - සීමු, ගුණෙහි දසහුපාගතං - අසං.
6. තත්ථපපධානං - මජසං.
7. අභිඤ්ඤා බලපාපුණිං—මජසං

22. එසෙයින් මම නන් වැදෑරුම් කුණපයෙන් පිරුණු මේ කය (ස්ත්‍රීපුරුෂයන්) සිරුරුකිස කොට (හැරපියා) යන කුටිය සෙයින් හැරපියා යන්නෙමි.

23. යම්සේ නැව්හිමියෝ දුදුරු වූ දිය වැහෙන බිඳුණු නැව අපේක්ෂා රහිත වූවාහු අනර්ථි වූවාහු හැරපියා යෙද්ද,

24. එසෙයින් මම නව සිදුරු ඇති නිරතුරු මල වැගිරෙන මේ කය නැව්හිමියන් දිරාගිය නැවක් මෙන් හැරපියා යන්නෙමි.

25. යම්සේ මිනිසෙක් රත්නාදි භාණ්ඩ ගෙන සොරුන් සමග යනුයේ භාණ්ඩ අසිඳ ගැනීමෙන් වන බිය දැක හැරපියා යෙත් ද,

26. එසෙයින් මැ මේ කය මහසොරකු වැන්න. කුසල්දහම් වොලොගන්නා බියෙන් මේ කය හැරපියා යන්නෙමි.

27. මම් මෙසේ සිතා නොයෙක් කෙළගණන් ධනය නාථානාථයනට දී හිමවත කරා එළැඹියෙමි.

28. හිමවතට නුදුරු තැන ධම්මක නම් පර්වතයෙක් වෙයි. (එහි) මට අසපුයෙක් මොනොවට මවන ලද. පන්සලෙකුදු මොනොවට මවන ලදි.

29. ඒ අසපුයෙහි පස්වැදෑරුම් (සක්මන්) දෙසින් තොර වූ සක්මනක් මැවී. නොහොත් පඤ්චනීවරණ දෙෂයෙන් තොර වූ (පරිශුද්ධතාදි) අෂ්ට ගුණයෙන් යුක්ත වූ අභිඥාබලය ලැබීමි.

30. එහි දි නව දෙසෙකින් හුක්ත වූ (ඇඳි) සළුව හැරපීමි. දෙළොස් අනුසසෙකින් යුක්ත වූ වැහැරි සිවුරු හැන්දෙමි.

31. අටදෙසෙකින් ගැවැසිගත් පන්සල හැරපීමි. දසගුණයෙකින් යුක්ත වූ රුක්මුලට එළැඹියෙමි.

32. වපුට නිපන් රොපණය කොට නිපන් ධාන්‍යය නිරවශෙෂයෙන් හළිමි. නොයෙක් ගුණයෙන් යුක්ත වූ, තුවටුයෙන් ගිලිහී වැටුණු එල වැළඳීමි.

33. ඒ අසපුයෙහි හිඳීම් සිටීම් සක්මනින් ප්‍රධන්– වීර්යය කෙළෙමි. සතියක් ඇතුළත අභිඥබලයට පැමිණියෙමි.

34. එවං මෙ සිද්ධිපත්තස්ස වසීභූතස්ස සාසනෙ
දීපඞ්කරො නාම ජිනො උප්පජ්ජි ලොකනායකො.

35. උප්පජ්ජන්තෙ ච ජායන්තෙ බුජ්ඣන්තෙ ධම්මදෙසනෙ
චතුරො නිමිත්තෙ නාද්දසං ඣානරතිසමප්පිතො.

36. පච්චන්තදෙසවිසයෙ නිමන්තෙත්වා තථාගතං
තස්ස ආගමනං මග්ගං සොධෙන්ති තුට්ඨමානසා.

37. අහං තෙන සමයෙන නික්ඛමිත්වා සකස්සමා
ධුනන්තො වාකචීරානි ගච්ඡාමි අම්බරෙ තදා.

38. වෙදජාතං ජනං දිස්වා තුට්ඨහට්ඨං පමොදිතං
ඔරොහිත්වාන ගගනා මානුසෙ පුච්ඡිං තාවදෙ.

39. තුට්ඨහට්ඨො පමුදිතො, “වෙදජාතො මහාජනො
කස්ස සොධීයති මග්ගො අඤ්ජසං වටුමායනං.

40. තෙ මෙ පුට්ඨා බ්‍යාකරිංසු[1] බුද්ධො ලොකෙ අනුත්තරො
දීපඞ්කරො නාම ජිනො උප්පජ්ජි ලොකනායකො.
තස්ස සොධීයතෙ මග්ගො[2] අඤ්ජසං වටුමායනං.

41. බුද්ධො’ති මම සුත්වාන පීති උප්පජ්ජි තාවදෙ
‘බුද්ධො බුද්ධො’ති කථයන්තො සොමනස්සං පවෙදයිං

42. තත්ථ ඨත්වා විචින්තෙසිං තුට්ඨො සංවිග්ගමානසො
ඉධ බීජානි රොපිස්සං ඛණො වෙ මා උපච්චගා.

43. යදි බුද්ධස්ස සොධෙථ එකොකාසං දදාථ මෙ
අහම්පි සොධයිස්සාමි අඤ්ජසං වටුමායනං.

44. අදංසු තෙ මමොකාසං සොධෙතුං අඤ්ජසං තදා
‘බුද්ධො බුද්ධො’ති චින්තෙන්තො මග්ගං සොධෙමහං තදා.

1. වියාකාසුං - සීමු, වියාකංසුං - මජසං.
2. සොධියති පථො - පු., සොධියති මග්ගො - සීමු, මජසං.

34. මෙසෙයින් තාපසශාසනයෙහි වශී වූ මා අභිඥා සිද්ධියට පැමිණි කල්හි ලොකනායක වූ දීපඞ්කර නම් ජිනපඤ්චමාරයන් වහන්සේ උපන්සේක.

35. (ඔබ) පිළිසිඳගන්නා කල්හි ද මව්කුසින් නික්මෙන කල්හි ද බුදු වන කල්හි ද දම්සක් පවත්වන කල්හි ද (මම්) ධ්‍යානරතියෙහි ඇලුනෙම් සතර තැන්හි දෙතිස් පෙරනිමිති නො දිටිමි.

36. පසල් දනව්යෙහි ජනයෝ තථාගතයන් පවරා තුටුසිත් ඇත්තාහු ඔබ වඩනා මඟ ශුද්ධ කෙරෙති.

37. එකල්හි මම් සිය අසපුයෙන් නික්ම එෑවස් වැහැරි සලමින් අහස්හි යෙමි.

38. හටගත් සොම්නස් ඇති තුටුපහටු වූ ප්‍රමුදිත වූ ජනයා දැක එකෙණෙහි අහසින් බැස මිනිසුන් විචාළෙමි.

39. තුටුපහටු වූ ප්‍රමුදිත වූ හටගත් සොම්නස් ඇති මහාජන තෙමේ (මාර්ගය ශුද්ධ කෙරෙයි. තොප විසින්) අඤ්ජස වටුම අයන සඞ්ඛ්‍යාත වූ මාර්ගය කවරක්හට ශුද්ධ කරනු ලැබේ ද?

40. මාවිසින් පුළුවුස්නා ලද ඔහු මෙසේ පැවැසූහ: ලොවැ අනුත්තර වූ සම්‍යක්සම්බුද්ධ වූ ලොකනායක වූ දීපඞ්කර නම් ජිතපඤ්චමාර වූ බුදුහු උපන්හ, ඔබට අඤ්ජස වටුම අයන සඞ්ඛ්‍යාත මාර්ගය ශුද්ධ කරනු ලැබේ' යයි.

41. 'බුද්ධ' යනු අසා එකෙණෙහි මට ප්‍රීති උපන. 'බුද්ධො බුද්ධො' යි කියමින් සොම්නස් වින්දෙමි.

42. එහි සිට සතුටු වූයෙම් ප්‍රීතියෙන් විස්මිත සිත් ඇතියෙම් මෙසේ සිතීමි: මේ දීපඞ්කර ජින්කෙතහි කුසල්බිජුවට රොපණය කරන්නෙමි. ක්ෂණසම්පත් නහමක් ඉක්මැ යේවයි.

43. ඉදින් බුදුනට මඟ ශුද්ධ කරවූ නම් මට එක් අවකාශයක් දෙව මම ද වටුම අයන සඞ්ඛ්‍යාත මාර්ගය ශුද්ධ කරන්නෙමි.

44. එකල්හි ඔහු මට මඟ ශුද්ධ කරනු සඳහා එක් පෙදෙසක් දුන්හු. එකල්හි මම් 'බුද්ධො බුද්ධො'යි සිතමින් මඟ ශුද්ධ කෙරෙමි.

45. අනිට්ඨිතෙ මමොකාසෙ දීපඞ්කරො මහාමුනි
චතූහි සතසහස්සෙහි ඡළභිඤ්ඤෙහි තාදිහි
ඛීණාසවෙහි විමලෙහි පටිපජ්ජි අඤ්ජසං ජිනො.

46. පච්චුග්ගමනා වත්තන්ති වජ්ජන්ති භෙරියො බහු
ආමොදිතා නරමරූ සාධුකාරං පවත්තයුං.

47. දෙවා මනුස්සෙ පස්සන්ති මනුස්සාපි ච දෙවතා
උභො'පි තෙ පඤ්ජලිකා අනුයන්ති තථාගතං.

48. දෙවා දිබ්බෙහි තුරියෙහි මනුස්සා මානුසෙහි[1] ච
උභො'පි තෙ වජ්ජයන්තා අනුයන්ති තථාගතං.

49. දිබ්බං මන්දාරවං පුප්ඵං පදුමං පාරිච්ඡත්තකං
දිසො දිසං ඔකිරන්ති ආකාසනභගතා මරූ.

50. චම්පකං සලලං නීපං නාගපුන්නාගකෙතකං
දිසොදිසං උක්ඛිපන්ති භූමිතලගතා නරා.

51. කෙසෙ මුඤ්චිත්වාහං තත්ථ වාකචීරඤ්ච චම්මකං
කලලෙ පත්ථරිත්වාන අවකුජ්ජො නිපජ්ජහං.

52. අක්කමිත්වාන මං බුද්ධො සහ සිස්සෙහි ගච්ඡතු
මා නං කලලෙ අක්කමිත්ථො හිතාය මෙ භවිස්සති.

53. පථවියං[2] නිපන්නස්ස එවං මෙ ආසි චෙතසො
ඉච්ඡමානො අහං අජ්ජ කිලෙසෙ ඣාපයෙ මමං

54. කිං මෙ අඤ්ඤාතවෙසෙන ධම්මං සච්ඡිකතෙනිධ
සබ්බඤ්ඤුතං පාපුණිත්වා බුද්ධො හෙස්සං සදෙවකෙ.

55. කිං මෙ එකෙන තිණ්ණෙන පුරිසෙන ථාමදස්සිනා
සබ්බඤ්ඤුතං පාපුණිත්වා සන්තාරෙස්සං සදෙවකෙ.

56. ඉමිනා මෙ අධිකාරෙන කතෙන පුරිසුත්තමෙ
සබ්බඤ්ඤුතං පාපුණිත්වා[3] තාරෙමි ජනතං බහුං

---

1. මානුසකෙහි - සීමු.
2. පඨවියං - මජසං, පුථුවියා - සු.
3. පාපුණාමි - මවි.

45. මාගේ මාර්ග කොට්ඨාශය කොට නො නිමි කල්හි මහාමුනි වූ පස්මරුන් දිනූ දීපඞ්කර සර්වඥයන් වහන්සේ ෂඩභිඥ වූ තාදී ගුණ ඇති පහවූ රාගාදි මල ඇති සාරලක්ෂයක් රහතුන් සමග මඟට පිළිපන් සේක.

46. සතුටු වූ දෙවමනුෂ්‍යයෝ පෙරගමන් කෙරෙති, බොහෝ බෙර වයති, සාධුකාර පවත්වති.

47. දෙවියෝ මිනිසුන් දකිති, මනුෂ්‍යයෝත් දෙවියන් දකිති, ඒ දෙව මිනිස් දෙපස මැ ඇඳිලි බැඳ තථාගතයන් පසුපස්හි යෙති.

48. දෙවියෝ දිව්‍යතූර්යයෙන් ද මනුෂ්‍යයෝ මානුෂක තූර්යයෙන් ද ඒ දෙපක්ෂයෙහි වූවෝ වාදනය කෙරෙමින් තථාගතයන් පසුපස්හි යෙති.

49. ආකාශ සඞ්ඛ්‍යාත නභස්හි නොහොත් අහස්හි ද දෙව්ලොව්හි ද වූ දෙවියෝ දිව මඳාරා මල් ද පියුම් ද පරසතු මල් ද ඒ ඒ දෙසින් විසුරුවත්.

50. පොළෝ තෙලෙහි වූ මනුෂ්‍යයෝ සපුමල් ද සරල (හොර) කුසුම් ද කොළොම්මල් ද නා- දෙඹ- වැටකේ මල් ද ඒ ඒ දෙසින් නඟත්.

51. මම එහි හිසකෙස් මුදා වැහැරි ද සම්කඩ ද කලල්මත වතුරුවා අධොමුඛ වැ හොත්මි.

52. බුදුහු මා ඇක්මගෙන අතැවැසියන් සමග වඩනාසේක්වා, නඟමක් කලල්හි ඇක්මෙත්වා, ඒ මට බොහෝ කලක් හිත පිණිස වන්නේ යැ.

53. පෘථිවියෙහි හොත් මට මෙබඳු වූ චිත්ත පරිවිතර්කයෙක් වී: මම අද කැමැති වූයෙම් නම් මාගේ රාගාදි කෙලෙසුන් දවන්නෙමි.

54. මෙ අත්බැව්හි අප්‍රකට වේශයෙන් දහම් පසක් කිරීමෙන් මට කවර ප්‍රයෝජන ද සර්වඥතාඥනයට පැමිණ දෙවියන් සහිත ලොවැ බුදු වන්නෙමි.

55. තමාගේ බල දක්නා වූ පිරිමිනියක් වැ එකලා වැ තරණය කිරී-මෙන් මට කවර ප්‍රයෝජන ද? සර්වඥතාඥනයට පැමිණ දෙවියන් සහිත ලොවැසියන් තරණය කරවන්නෙමි.

56. පුරුෂොත්තම වූ බුදුන් කෙරෙහි කරන ලද මාගේ මේ අධික සත්කාරයෙන් සර්වඥතාඥනයට පැමිණ බොහෝ ජන සමූහයා (සසරින්) තරවමි.

57. සංසාරසොතං ඡින්දිත්වා විද්ධංසෙත්වා තයො භවෙ
ධම්මනාවං සමාරුය්හ සන්තාරෙස්සං සදෙවකෙ.

58. මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති හෙතු සත්ථාරදස්සනං
පබ්බජ්ජා ගුණසම්පත්ති අධිකාරො ච ඡන්දතා
අට්ඨධම්මසමොධානා අභිනීහාරො සමිජ්ඣති.

59. දීපඞ්කරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො
උස්සීසකෙ මං ඨත්වාන ඉදං වචනමබ්‍රවි.

60. පස්සථ ඉමං තාපසං ජටිලං උග්ගතාපනං
අපරිමෙය්‍යිතො කප්පෙ බුද්ධො ලොකෙ භවිස්සති.

61. අහු[1] කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං*

62. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො*
තත්ථ පායාසමග්ගය්හ[2] නෙරඤ්ජරමුපෙහිති

63. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය[3] සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලං හි එහිති.

64. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො[4]
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

65. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

66. අනාසවා වීතරාගා[5] සන්තචිත්තා සමාහිතා
කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා.

67. ආනන්දො නාමුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං
ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා.

68. අනාසවා වීතරාගා[5] සන්තචිත්තා සමාහිතා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

---

1. අථ – සීමු.
* පාදද්වයමිදං සීහළක්ඛර මුද්දිත පොත්ථකෙ න දිස්සතෙ.
2. පායසමග්ගය්හ – සීමු, පයාසං පග්ගය්හ – ස්‍යා
3. පායසං අද – සීමු, පායාස- අදි – මජසං, ස්‍යා.
4. නරුත්තරො – සීමු, අනුත්තරං – ස්‍යා.
5. වීතමලා – සීමු.

57. සංසාර නමැති ශ්‍රොතස සිඳ පියා තුන් භවය නසා දහම් නැවට නැඟී දෙවියන් සහිත ලොකයා තරවන්නෙමි.

58. මිනිසත්බව යැ ලිඞ්ගසම්පත් යැ (අර්හත්වයට) හෙතුසම්පන්න බව යැ දිවමන් බුදුන් දැකීම යැ පැවිද්ද යැ අෂ්ටසමාපත්ති සඞ්ඛ්‍යාත ගුණසම්පත් යැ ජීවිතපරිත්‍යාග සඞ්ඛ්‍යාත අධිකාර යැ (බුදුකුරුදහම්හි කළ) කුශලච්ඡන්ද ඇති බව යැ යන අට දහමුන් එක්වීම හෙතු කොට ගෙන,

59. දක්ෂිණෙය හෙයින් දන් පිළිගන්නා වූ දීපඞ්කර සර්වඥයන් වහන්සේ මා හිස්දෙර වඩිට මෙවදන් වදළහ.

60. ජටාධර වූ උග්‍ර වූ තපස් ඇති මේ තවුස්හු බලවු. මෙයින් අප්‍රමෙය කල්පයෙහි ලොවැ බුදු වෙයි.

61. එකල්හි තථාගත වූ මේ තෙම කපිල නම් සිත්කලු වූ පුරයෙන් නික්ම ප්‍රධන්වීර්යය වඩා දුෂ්කරක්‍රියා කොට-

62. තථාගත තෙම අජපල් නම් රුක්මුල්හි හිඳ එහි දී කිරිපිඩු පිළි-ගෙන නිල්දලා ගංතෙරට එළැඹෙයි.

63. ඒ ජිනපක්ෂුමාර තෙම නිල්දලා හෝතෙර හිඳ කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තම මාර්ගයෙන් ඇසැතුබෝරුක වෙත එළැඹෙයි.

64. ඉක්බිති ඒ අනුත්තර වූ බෝසත් බෝමැඩ පැදකුණු කොට මහායසස් ඇතියේ ඇසැතුරුක්මුල්හි හිඳ බුදුවන්නේ යැ.

65. මොවුන්ගේ ජනික මව් තොමෝ මායා නම් වන්නී යැ ජනක පියා තෙමේ ශුද්ධොදන නම් වන්නේ යැ මේ තෙම ගෞතම නම් වන්නේ යැ.

66. අනාස්‍රව වූ විගතරාග ඇති සන්හුන් සිත් ඇති එකඟ වූ සිත් ඇති කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ.

67. ආනන්ද නම් උපස්ථායකයෙක් ඒ ජිනපක්ෂුමාරයනට උවටැන් කෙරෙයි, ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ.

68. ඔවුහු අනාස්‍රව වූවාහු වීතරාග වූවාහු සන්හුන් සිත් ඇත්තාහු සමාහිත වූවාහු වෙති. ඒ භගවත්හුගේ බොධිය 'ඇසැතු' යයි කියනු ලැබේ.

69. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තුපට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තුපට්ඨිකා.
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

70. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

71. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති[1] අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

72. යදිමස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

73. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

74. එවමෙව මයං සබ්බෙ යදිමුඤ්චාමිමං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

75. දීපඞ්කරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො
මම කම්මං පකිත්තෙත්වා දක්ඛිණං පදමුද්ධරි.

76. යෙ තත්ථාසුං ජිනපුත්තා පදක්ඛිණමකංසු මං
දෙවා මනුස්සා අසුරා ච අභිවාදෙත්වාන පක්කමුං.

77. දස්සනං මෙ අතික්කන්තෙ සසඞ්ඝෙ ලොකනායකෙ
සයනා වුට්ඨහිත්වාන පල්ලඞ්කමාභුජිං තදා.

78. සුඛෙන සුඛිතො හොමි පාමොජ්ජෙන පමොදිතො
පීතියා ච අභිස්සන්නො පල්ලඞ්කං ආභුජිං තදා.

79. පල්ලඞ්කෙන නිසීදිත්වා එවං චින්තෙසහං තදා
වසීභූතො අහං ඣානෙ අභිඤ්ඤාපාරමිං ගතො.

80. සහස්සියම්හි ලොකම්හි ඉසයො නත්ථි මෙ සමා
අසමො ඉද්ධිධම්මෙසු අලභිං ඊදිසං සුඛං.

81. පල්ලඞ්කාභුජනෙ මය්හං දසසහස්සාධිවාසිනො
මහානාදං පවත්තෙසුං ධුවං බුද්ධො භවිස්සසි.

---

1. උක්කුට්ඨී සද්ද – සීමු.

69. චිත්ත යැ හත්ථාළවක යැ යන මොහු අග උවටු වෙති, උත්තරා යැ නන්දමාතා යැ යන මොහු අග උවටු වෙත්.

70. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා මේ බුද්ධබීජාඞ්කුර-යෙකැ'යි දෙවමනුෂ්‍යයෝ සතුටු වූවාහු-

71. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝවැසියෝ කළ ඇඳිලි ඇත්තාහු නමස්කාර කෙරෙත්.

72. ඉදින් මේ ලොකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

73. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛ තීර්ථය වැරදී යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙද්ද.

74. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වම්හ.

75. පූජා පිළිගන්නා වූ දීපඞ්කර නම් බුදුහු මාගේ කර්මය ප්‍රකාශ කොට දකුණු පිය නැඟූහ.

76. එහි යම් බුද්ධපුත්‍ර කෙනෙක් වූවාහු ද ඔහු මා පැදකුණු කළාහු යැ දෙවියෝ ද මිනිස්සු ද අසුරයෝ ද මා අභිවාදන කොට නික්ම ගියාහු යැ.

77. සඞ්ඝයා සහිත වූ ලොකස්වාමීන් මාගේ දර්ශනය ඉක්ම වූ කල්හි ශයනයෙන් නැඟී සිට එකල්හි පලක් බැඳ හුන්මි.

78. එකල්හි කායික චෛතසික සුඛයෙන් සුඛිතයෙම් වෙමි, ප්‍රාමොද්‍යයෙන් ප්‍රමුදිතයෙමි, ප්‍රීතියෙන් පැතුරුණෙම් පලක් බැඳ හුන්මි.

79. එකල්හි මම පලගින් හිඳ මෙසේ සිතීමි: 'මම ධ්‍යානයෙහි වශී වූයෙමි, පඤ්චාභිඥයෙහි පරතෙරට ගියෙමි.

80. දශසහශ්‍රීලොකධාතුයෙහි මා හා සම වූ ඍෂිහු නැතැ'යි (පඤ්චවිධ) ඍද්ධිධර්මයන්හි අචල වූයෙම් මෙබඳු වූ සොම්නස් ලදිමි.

81. මාගේ පලග බැඳීමෙහි ලා දශසහශ්‍රී ලොකධාතු වැසි (මහාබ්‍රහ්ම)යෝ 'තෙපි ඒකාන්තයෙන් බුදු වව'යි මහානාද පැවැත්වූහ.

82. යා පුබ්බෙ බොධිසත්තානං පල්ලඞ්කවරමාභුජෙ
නිමිත්තානි පදිස්සන්ති තානි අජ්ජ පදිස්සරෙ,

83. සීතං ව්‍යපගතං හොති උණ්හඤ්ච උපසම්මති
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

84. දසසහස්සී ලොකධාතු නිස්සද්දා හොති නිරාකුලා
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

85. මහාවාතා න වායන්ති න සන්දන්ති සවන්තියො
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

86. ථලජා දකජා පුප්ඵා සබ්බෙ පුප්ඵන්ති තාවදෙ
තෙපජ්ජ පුප්ඵිතා සබ්බෙ ධුවං බුද්ධො භවිස්සසි.

87. ලතා වා යදි වා රුක්ඛා ඵලභාරා හොන්ති තාවදෙ
තෙපජ්ජ ඵලිතා සබ්බෙ ධුවං බුද්ධො භවිස්සසි.

88. ආකාසට්ඨා ච භුම්මට්ඨා රතනා ජොතන්ති තාවදෙ
තෙපජ්ජ රතනා ජොතන්ති ධුවං බුද්ධො භවිස්සසි.

89. මානුසකා ච දිබ්බා ච තුරියා වජ්ජන්ති තාවදෙ
තෙපජ්ජුභො අභිරවන්ති ධුවං බුද්ධො භවිස්සසි.

90. විචිත්තපුප්ඵා ගගනා අභිවස්සන්ති තාවදෙ
තෙපි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

91. මහාසමුද්දො ආභුජති දසසහස්සී පකම්පති
තෙපජ්ජුභො අභිරවන්ති ධුවං බුද්ධො භවිස්සසි.

82. පෙර බෝසතුන්ගේ උතුම් පලග බැඳුමෙහි යම් නිමිති කෙනෙක් පැනුණාහු ද අද ඒ නිමිතිහු දක්නා ලැබෙත්.

83. (පෙර බෝසතුන් කලැ) සිහිල් බව පහවැ ගියේ වන, උණුසුම ද සන්හිණ, දූන් ඒ නිමිත්හු දක්නා ලැබෙති. (එහෙයින් තෙපි) ඒකාන්තයෙන් බුදුවන්නවු යැ.

84. (පෙර බෝසතුන් කෙරෙහි) දසදහසක් සක්වළ නිශ්ශබ්ද වූවා නිරාකුල වී. ඒ පෙරනිමිත්හු අද දක්නා ලැබෙති. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

85. (පෙර බෝසතුන් කලැ) මහපවන්හු නො හැමූහ, නදීහු නො ගැළූහ. අද ඒ පෙරනිමිත්හු දක්නා ලැබෙති. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

86. ගොඩ උපදනාවූ ද දියෙහි උපදනා වූ ද හැම මල්හු එකෙණෙහි පිපුණාහ. දූනුදු එ හැම කුසුමයෝ පිපුණාහ. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

87. ලියහු ද රුක්හු ද එකෙණෙහි පලබර වූහ. දූනුදු එ හැම ලියරුක්හු හටගත් එල ඇති වූහ. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

88. අහස්ගත වූ ද භූමිගත වූ ද (මුතු මැණික් ආ) රුවන්හු එකෙණෙහි බැබැළූහ. දූනුදු ඒ රුවන්හු බබලති. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

89. මිනිසුන් අයත් වූ ද දෙවියන් අයත් වූ ද (ආතත–විතතාදි) තූර්යයෝ එකෙණෙහි වාදනය වූහ. දූනුදු ඒ උභය තූර්යයයෝ මැනැවින් නාද වෙති. (එහෙයින් තෙපි) නියතයෙන් බුදුවන්නවු යැ.

90. විසිතුරු පැහැති සුවඳ කුසුම්හු එකෙණෙහි අහසින් වටහ, දූනුදු ඒ පෙරනිමිත්හු දක්නා ලැබෙති. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

91. (පෙර බෝසතුන් කලැ) මහමුහුද හැකිළිණ, දසදහස් ලෝධා සැලිණ, දූනුදු ඒ මුහුදු ලෝකධාතු යන දෙක අතිශයින් නාද කෙරෙති. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

92. නිරයෙසු දසසහස්සී[1] අග්ගී නිබ්බන්ති තාවදෙ
තෙපජ්ජ නිබ්බුතා අග්ගී ධුවං බුද්ධො භවිස්සසි.

93. විමලො හොති සූරියො සබ්බා[2] දිස්සන්ති තාරකා
තෙ'පි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

94. අනොවට්ඨෙන උදකං මහියා උබ්භිජ්ජි තාවදෙ
තම්පජ්ජුබ්භිජ්ජතෙ මහියා ධුවං බුද්ධො භවිස්සසි.

95. තාරාගණා විරොචන්ති නක්ඛත්තා ගගනමණ්ඩලෙ
විසාඛා චන්දිමයුත්තා ධුවං බුද්ධො භවිස්සසි.

96. බිලාසයා දරීසයා නික්ඛමන්ති සකාසයා
තෙපජ්ජ ආසයා ඡුද්ධා ධුවං බුද්ධො භවිස්සසි.

97. න හොති අරති සත්තානං සන්තුට්ඨා හොන්ති තාවදෙ
තෙපජ්ජ සබ්බෙ සන්තුට්ඨා ධුවං බුද්ධො භවිස්සසි.

98. රොගා තදුපසම්මන්ති ජිඝච්ඡා ච විනස්සති
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

99. රාගො තද තනු හොති දොසො මොහො විනස්සති
තෙ' පජ්ජ විගතා සබ්බෙ ධුවං බුද්ධො භවිස්සසි.

100. භයං තද න භවති අජ්ජපෙතං පදිස්සති
තෙන ලිඞ්ගෙන ජානාම ධුවං බුද්ධො භවිස්සසි.

101. රජොනුද්ධංසති උද්ධං අජ්ජපෙතං පදිස්සති
තෙන ලිඞ්ගෙන ජානාම ධුවං බුද්ධො භවිස්සසි.

102. අනිට්ඨගන්ධො පක්කමති දිබ්බගන්ධො පවායති
සොපජ්ජ වායති ගන්ධො ධුවං බුද්ධො භවිස්සසි.

---

1. නිරයෙපි දසසහස්සෙ – මජසං, අසා.
නිරයෙසු දසසහස්සීසු – මචි.
2. සබ්බෙ – සීමු.

92. දස දහසක් ලොධාතු නිරවලැ එකෙණෙහි ගිනි නිවිණ, දුනුදු එගිනි නිවීගියේ වන, (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

93. හිරු නිර්මල විය. හැම නකත්තරු පෙනුණාහ. දුනුදු එ පෙර නිමිත්හු දක්නා ලැබෙත්. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

94. නො වට කල්හි මැ එකෙණෙහි මැ පොළොවින් දිය පැන නැඟිණි. දුනුදු එ දිය පොළොවින් පැන නැඟෙයි. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

95. තාරකා සමූහයෝ ද නකත් තරු ද සියලු ගගනමණ්ඩලය ද සඳු හා සමග යෙදුණු විසා නකත ද බබළති. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

96. බිලයෙහි හෝනා සත්හු ද ගුහායෙහි හෝනා සත්හු ද සවකීය ආසයස්ථානයෙන් නික්මුණාහ. දුනුදු ඔහු ආසයෙන් නික්මුණාහ. (එහෙයින් තෙපි) ඒකාන්තයෙන් බුදු වන්නවු යැ.

97. එකෙණෙහි සත්නට උකටලී නො වී යැ. (හැම සත්හු) සතුටු වූහ. දුනුදු එ සියල්ලෝ සතුටු වූවාහ. (එහෙයින් තෙපි,) නියතයෙන් බුදු වන්නවු යැ.

98. ඒ පෙර බෝසතුන් කල රෝගයෝ සන්හුන්හ, සාගිනි ද නැසිණ. දුනුදු ඒ පෙරනිමිත්හු දක්නා ලැබෙති. (එහෙයින් තෙපි) ඒකාන්තයෙන් බුදු වන්නවු යැ.

99. එකල්හි කාමරාගය තුනී (පරියුට්ඨාන රහිත) විය. ද්වෙෂය ද මොහය ද නැසිණ. දුනුදු එ සියල්ලෝ පහවගියාහ. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

100. ඒ පෙර බෝසතුන් දවස (සත්නට) බියෙක් නො වී. දුනුදු තෙල බිය රහිත බව දක්නා ලැබෙයි. ඇපි එ ලකුණෙන් දනුම්හ, (තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

101. (පෙර බෝසතුන් කල) රජස් උඩට නොනැඟිණ. දුනුදු තෙල නිමිති දක්නා ලැබෙයි. ඇපි එලකුණෙන් දනුම්හ, (තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

102. (පෙර බෝසතුන් කලැ) අනිටුගඳ පහවගියේ යැ. දිවසුවඳ හැමී යැ දුනුදු එ දිවසුවඳ හමයි. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන් නවු යැ.

103. සබ්බෙ දෙවා පදිස්සන්ති ඨපයිත්වා අරූපිනො
තෙ'පජ්ජ සබ්බෙ දිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

104. යාවතා නිරයා නාම සබ්බෙ දිස්සන්ති තාවදෙ
තෙ'පජ්ජ සබ්බෙ දිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

105. කුඩ්ඩා කවාටා සෙලා ච න හොන්ත්‍යාවරණා[1] තදා
ආකාසභූතා තෙ' පජ්ජ ධුවං බුද්ධො භවිස්සසි.

106. චුතී ච උපපත්ති ච ඛණෙ තස්මිං න විජ්ජති
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

107. දළ්හං පග්ගණ්හ විරියං මා නිවත්ති[2] අභික්කම
මයමෙපතං පජානාම ධුවං බුද්ධො භවිස්සසීති.

108. බුද්ධස්ස වචනං සුත්වා දසසහස්සීන චූභයං
තුට්ඨහට්ඨො[3] පමුදිතො එවං චින්තෙසහං තදා.

109. අද්වෙජ්ඣවචනා බුද්ධා අමොඝවචනා ජිනා
විතථං නත්ථි බුද්ධානං ධුවං බුද්ධො භවාමහං

110. යථා ඛිත්තං නභෙ ලෙඩ්ඩු ධුවං පතති භූමියං
තථෙ'ව බුද්ධසෙට්ඨානං වචනං ධුවසස්සතං
විතථං නත්ථි බුද්ධානං ධුවං බුද්ධො භවාමහං

111. යථා'පි සබ්බසත්තානං මරණං ධුවසස්සතං
තථෙ'ව බුද්ධසෙට්ඨානං වචනං ධුවසස්සතං
විතථං නත්ථි බුද්ධානං ධුවං බුද්ධො භවාමහං.

112. යථා රත්තික්ඛයෙ පත්තෙ සූරියස්සුග්ගමනං ධුවං
තථෙ'ව බුද්ධසෙට්ඨානං වචනං ධුවසස්සතං
විතථං නත්ථි බුද්ධානං ධුවං බුද්ධො භවාමහං.

---

1. හොන්තාවරණං – සීමු.
2. මා නිවත්ත – මජසං.
3. හට්ඨතුට්ඨො – සීමු.

103. (පෙර බෝසතුන් කලැ) අරුතල වැසි දෙවියන් තබා හැම දෙවියෝ පැණුනාහ. දනුදු එ හැම දෙවියෝ පැනෙති (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

104. යම් පමණ නිරයෝ නම් වෙත් ද එ හැම එකෙණෙහි පැනුණාහ දනුදු එ හැම නරකයෝ දක්නා ලැබෙති. (එහෙයින්) තෙපි නියතයෙන් බුදු වන්නවු යැ.

105. ඒ පෙර බෝසතුන් කල්හි පවුරු ද දෙර කවුළු ද පර්වත ද ආවරණ නො වීය. දනුදු ඔහු නිරාවරණ වෙති. (එහෙයින්) තෙපි නියත යෙන් බුදු වන්නවු යැ.

106. එකෙණෙහි මරණ ද ඉපැත්ම ද නො වී. දන් ඒ පෙර නිමිත්හු දක්නා ලැබෙති. (එහෙයින් තෙපි) නියතයෙන් බුදු වන්නවු යැ.

107. වීයර්‍ය දැඩි කොට ගන්ව, නහමක් නවත්ව, පෙරට යව, ඇපිදු තෙල කරුණු දනුම්හ. (තෙපි) නියතයෙන් බුදුවන්නවු යැ.

108. දිවකුරු බුදුන්ගේ ද දසදහසක් සක්වළ දෙවියන්ගේ ද යන දෙපක්ෂයෙහි වදන් අසා එකල්හි මම හටු පහටු වූයෙම් සතුටු සිත් ඇත්-තෙම් මෙසේ සිතීමි.

109. බුදුවරයෝ එකාන්ත වචන ඇත්තාහ. ජින වූ සර්වඥයෝ නො සිස් වචන ඇත්තාහ. බුදුවරයන්ගේ අතථ්‍ය බසෙක් නැති, මම් එකාන්ත යෙන් බුදු වෙමි.

110. යම්සේ අහස්හි දමන ලද කැටක් එකාන්තයෙන් බිම වැටේ ද එසෙයින් මැ බුද්ධශ්‍රෙෂ්ඨයන්ගේ වචනය එකාන්තයෙන් වනසුලු ද ශාශ්වත ද වෙයි. බුදුවරයන්ගේ අතථ්‍ය බසෙක් නැති. නියතයෙන් මම් බුදු වෙමි.

111. යම්සේ සියලු සත්නට මරණය එකාන්ත ශාශ්වත ද එසෙයින් මැ බුද්ධශ්‍රෙෂ්ඨයන්ගේ බස ද එකාන්ත ශාශ්වත වෙයි. බුදුවරයන්ගේ අතථ්‍ය බසෙක් නැති. නියතයෙන් මම් බුදු වෙමි.

112. යම්සේ රැය ගෙවීම පැමිණි කල්හි හිරු උදවීම එකාන්ත වේ ද එසෙයින් මැ බුදුවරයන්ගේ වචනය එකාන්ත ශාශ්වත වෙයි, බුදුවරයන් අතථ්‍ය බසෙක් නැති. නියතයෙන් මම් බුදු වෙමි.

113. යථා නික්ඛන්තසයනස්ස සීහස්ස නදනං ධුවං
තථෙව බුද්ධසෙට්ඨානං වචනං ධුවසස්සතං
විතථං නත්ථි බුද්ධානං ධුවං බුද්ධො භවාමහං.

114. යථා ආපන්නසත්තානං භාරමොරොපනං ධුවං
තථෙව බුද්ධසෙට්ඨානං වචනං ධුවසස්සතං
විතථං නත්ථි බුද්ධානං ධුවං බුද්ධො භවාමහං

115. හන්ද බුද්ධකරෙ ධම්මෙ විචිනාමි ඉතො චිතො
උද්ධං අධො දසදිසා යාවතා ධම්මධාතුයා,

116. විචිනන්තො තදා දක්ඛිං[1] පඨමං දානපාරමිං
පුබ්බකෙහි මහෙසීහි අනුචිණ්ණං මහාපථං

117. ඉමං ත්වං පඨමං තාව දළ්හං කත්වා සමාදිය
දානපාරමිතං ගච්ඡ යදි බොධිං පත්තුමිච්ඡසි.

118. යථා'පි කුම්භො සම්පුණ්ණො යස්ස කස්සචි අධොකතො
වමතෙ උදකං නිස්සෙසං න තත්ථ පරිරක්ඛති

119. තථෙව යාචකෙ දිස්වා හීනමුක්කට්ඨමජ්ඣිමෙ
දදාහි දානං නිස්සෙසං කුම්භො විය අධොකතො

120. න හෙ තෙ එත්තකායෙව බුද්ධධම්මා භවිස්සරෙ
අඤ්ඤෙ'පි විචිනිස්සාමි යෙ ධම්මා බොධිපාචනා

121. විචිනන්තො තදා දක්ඛිං[1] දුතියං සීලපාරමිං
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිතනිසෙවිතං.

122. ඉමං ත්වං දුතියං තාව දළ්හං කත්වා සමාදිය
සීලපාරමිතං ගච්ඡ යදි බොධිං පත්තුමිච්ඡසි.

123. යථාපි චමරී වාලං[2] කිස්මිඤ්චි[3] පතිලග්ගිතං
උපෙති මරණං තත්ථ න විකොපෙති වාලධිං.

124. තථෙව ත්වං චතුසු භූමිසු සීලානි පරිපූරය
පරිරක්ඛ සබ්බදා සීලං චමරී විය වාලධිං.

1. තදද්දක්ඛි – සිමු, මජසං 2. වාළං – සිමු.
3. කිස්මිඤ්චි – මජසං.

113. මෙසේ ශයනයෙන් නික්මුණු සිංහයාගේ නාද කිරීම ඒකාන්ත වේ ද එසෙයින් මැ බුද්ධශ්‍රේෂ්ඨයන්ගේ වචනය ඒකාන්ත ශාශ්වත වෙයි. බුදුවරයන් ගේ අන්‍යථා බසෙක් නැති. නියතයෙන් මම් බුදු වෙමි.

114. යම්සේ ආපන්නසත්ත්ව (ගැබිනි) යන්ගේ ප්‍රසූතිය ඒකාන්ත වේ ද එසෙයින් මැ බුද්ධශ්‍රේෂ්ඨයන්ගේ වචනය ඒකාන්ත ශාශ්වත වෙයි. බුදුවරයන්ගේ අන්‍යථා බසෙක් නැති. (එයින්) මම් නියතයෙන් බුදු වෙමි.

115. උඩ දෙව්ලොව යැ යට මිනිස්ලොව යැ දශදිශායෙහි යැ යන ධර්මධාතුව හිමි කොට ඔබිනොබ බුදුකුරු දහම් සොයම් නම් මැනැවි.

116. එකල්හි (බුදුකුරු දහම්) විමසනුයෙම් මහර්ෂි වූ පූර්ව බෝසතුන් විසින් ඇසුරු කළ (සම්බොධියට) මහාමාර්ග වූ පළමු වන දානපාරමිතාව දිටිමි.

117. ඉදින් තෙපි සම්බොධියට පැමිණෙන්නට රිසියවු නම් පළමු කොට මේ දානපාරමිතාව දැඩි කොට සමාදන් වැ දානපාරමිතාව පූරණය කරව. හෙවත් දානයාගේ පරතෙරට යව.

118. යම්සේ (දිය කිරි ඈ) යම් කිසිවකින් පරිපූර්ණ වූ කුම්භයෙක් යටිහුරු කරන ලද්දුයේ දිය නිරවශෙෂ කොට වගුරුවා ද, එහි නො රැඳේ ද,

119. එසෙයින් මැ හීනොත්කෘෂ්ටමධ්‍යම වූ යාචකයන් දැක යටිහුරු කළ කළයක් සෙයින් නිරවශෙෂ කොට දන් දෙව.

120. යම් හෙයෙකින් තෙල බුදුකුරු දහම්හු මෙතෙක් මැ නො වන්නාහු ද එහෙයින් යම් ධර්ම කෙනෙක් බොධිය මුහුකුරු වන්නාහු ද ඒ අනෙකුදු බුදුකුරු දහම් සොයන්නෙමි.

121. එකල්හි සොයන්නෙම් මහර්ෂි වූ පූර්ව බොධිසත්ත්වයන් විසින් භාවිත බහුලීකෘත වූ දෙවැනි ශීලපාරමිතාව දිටිමි.

122. ඉදින් තෙපි සම්බොධියට පැමිණෙන්නට රිසියවූ නම් දෙ වැනි වූ මේ ශීලපාරමිතාව දැඩි කොට සමාදන් වැ ශීලපාරමිතාව පූරණය කරව. හෙවත් ශීලයාගේ පරතෙරට යව.

123. යම්සේ සෙමෙරමුව තෙමේ වලක් කිසිවෙක්හි ලැගුණේ වාලධිය නො සිඳී ද එහි මැ මරණයට පැමිණේ ද–

124. එ සෙයින් මැ තෙපි (ප්‍රාතිමොක්ෂ සංවරාදි සිව් බිම්හි සිල් පුරව, සෙමෙරමුව වාලධිය සෙයින් හැම කල්හි ශීලය රක්ෂා කරව.

125. න හෙතෙ එත්තකායෙව බුද්ධධම්මා භවිස්සරෙ
අඤ්ඤෙ'පි විචිනිස්සාමි යෙ ධම්මා බොධිපාචනා.

126. විචිනන්තො තද දක්ඛිං තතියං නෙක්ඛම්මපාරමිං
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිතනිසෙවිතං.

127. ඉමං ත්වං තතියං තාව දළ්හං කත්වා සමාදිය
නෙක්ඛම්මපාරමිං[1] ගච්ඡ යදි බොධිං පත්තුමිච්ඡසි.

128. යථා අන්දුඝරෙ පුරිසො චිරවුත්ථො දුඛද්දිතො
න තත්ථ රාගං අභිජනෙති මුත්තිං යෙව ගවෙසති.

129. තථෙව ත්වං සබ්බභවෙ පස්ස අන්දුඝරෙ විය
නෙක්ඛම්මාභිමුඛො හොහි භවතො පරිමුත්තියා.

130. න හෙතෙ එත්තකායෙව, බුද්ධධම්මා භවිස්සරෙ
අඤ්ඤෙ'පි විචිනිස්සාමි යෙ ධම්මා බොධිපාචනා.

131. විචිනන්තො තද දක්ඛිං චතුත්ථං පඤ්ඤාපාරමිං
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිතනිසෙවිතං.

132. ඉමං ත්වං චතුත්ථං තාව දළ්හං කත්වා සමාදිය
පඤ්ඤාපාරමිතං[2] ගච්ඡ යදි බොධිං පත්තුමිච්ඡසි.

133. යථා'පි[3] භික්ඛු භික්ඛන්තො හීනමුක්කට්ඨමජ්ඣිමෙ
කුලානි න විවජ්ජෙන්තො එවං ලභති යාපනං.

134. තථෙව ත්වං සබ්බකාලං පරිපුච්ඡන්තො බුධං ජනං
පඤ්ඤාපාරමිතං[2] ගන්ත්වා සම්බොධිං පාපුණිස්සසි.

135. න හෙතෙ එත්තකායෙව බුද්ධධම්මා භවිස්සරෙ
අඤ්ඤෙපි විචිනිස්සාමි යෙ ධම්මා බොධිපාචනා.

136. විචිනන්තො තද දක්ඛිං පඤ්චමිං විරිය පාරමිං[4]
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිතනිසෙවිතං.

---

1. නෙක්ඛම්මපාරමිතං - සයා.මජසං
2. පඤ්ඤාය පාරමිං - මවි-
3. යථාහි - මවි.
4. විරිය පාරමිං - මජසං

125. යම් හෙයෙකින් තෙල බුදුකුරු දහම්හු මෙතෙක් මැ නො වන්-වන්නාහු ද එහෙයින් යම් ධර්ම කෙනෙක් බොධිය මුහුකුරු වන්නාහු ද ඒ අනෙකුදු බුදුකුරු දහම් සොයන්නෙමි.

126. එකල්හි සොයන්නෙම් මහර්ෂී වූ පෙර බෝසතුන් විසින් භාවිත බහුලීකෘත වූ තුන් වැනි නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව දිටිමි.

127. ඉදින් තෙපි සම්බොධියට පැමිණෙන්නට රිසියවු නම් තුන්වැනි වූ මේ නෛෂ්ක්‍රම්‍යපාරමිතාව දැඩි කොට සමාදන් වැ ශීලපාරමිතාව පූරණය කරව හෙවත් නෛෂ්ක්‍රම්‍යයාගේ පරතෙරට යව.

128. යම්සේ බන්ධනාගාරයෙහි බොහෝ කල් විසූ දුකින් පීඩිත වූ පුරුෂයෙක් එහි ඇලුම් නූපදවා ද මිදීම මැ සොයා ද-

129. එසෙයින් මැ තෙපි කාමාදි සියලු භවයන් බන්ධනාගාරයන් සෙයින් දක්ව, භවයෙන් මිදීම සඳහා නෛෂ්ක්‍රම්‍යයට අභිමුඛ වව.

130. යම් හෙයෙකින් තෙල බුදුකුරු දහම්හු මෙතෙක් මැ නොවන්නා-හු ද එහෙයින් යම් ධර්ම කෙනෙක් බොධිය මුහුකුරුවන්නාහු ද ඒ අනෙ-කුදු බුදුකුරු දහම් සොයන්නෙමි.

131. විමසනුයෙම් මහර්ෂී වූ පූර්ව බොධිසත්ත්වයන් විසින් භාවිත බහුලීකෘත වූ ප්‍රඥාපාරමිතාව දිටිමි.

132. ඉදින් තෙපි සම්බොධියට පැමිණෙන්නට රිසියවු නම් සතර වැනි වූ මේ ප්‍රඥාමිතාව දැඩිකොට සමාදන් වැ ප්‍රඥාපාරමිතාව පුරව.

133. යම්සේ මහණ පිඬුසිඟා යනුයේ හීනෝත්කෘෂ්ට මධ්‍යම වූ කුලයන් නො හරනේ මෙසේ යැපෙන පමණ අහර ලබා ද,

134. එසෙයින් මැ තෙපි හැම කල්හි පණ්ඩිත ජනයා පුළුවුස්නාහු ප්‍රඥ පාරමිතාවට පැමිණ සම්‍යක් සම්බොධියට පැමිණෙන්නවු යැ.

135. යම් හෙයෙකින් තෙල බුදුකුරු දහම්හු මෙතෙක් මැ නො වන්නාහු ද එහෙයින් යම් ධර්ම කෙනෙක් බොධිය මුහුකුරු වන්නාහු ද ඒ අනෙකුදු බුදුකුරු දහම් සොයන්නෙමි.

136. එකල්හි විමසනුයෙම් පෙර මහර්ෂී වූ බොධිසත්ත්වයන් විසින් ආදරයෙන් සෙවුනා ලද නිරතුරු සෙවුනා ලද පස් වැනි වූ වීර්‍ය්‍ය පාරමිතාව දිටිමි.

137. ඉමං ත්වං පඤ්චමං තාව දළ්හං කත්වා සමාදිය
විරිය පාරමිතං ගච්ඡ යදි බොධිං පත්තුමිච්ඡසි.

138. යථා'පි සීහො මිගරාජා නිසජ්ජට්ඨානචඞ්කමෙ
අලීනවිරියො හොති පග්ගහිතමනො තදා

139. තථෙව ත්වං[1] සබ්බභවෙ පග්ගණ්හ විරියං දළ්හං
විරියපාරමිතං ගන්ත්වා සම්බොධිං පාපුණිස්සසි.

140. න හෙතෙ එත්තකායෙව බුද්ධධම්මා භවිස්සරෙ
අඤ්ඤෙ'පි විචිනිස්සාමි යෙ ධම්මා බොධිපාචනා.

141. විචිනන්තො තදා දක්ඛිං ඡට්ඨමං ඛන්තිපාරමිං
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිතනිසෙවිතං.

142. ඉමං ත්වං ඡට්ඨමං තාව දළ්හං කත්වා සමාදිය
තත්ථ අද්වෙජ්ඣමානසො[2] සම්බොධිං පාපුණිස්සසි.

143. යථා'පි පථවී[3] නාම සුචිම්පි අසුචිම්පි ච
සබ්බං සහති නික්ඛෙපං න කරොති පටිඝං දයං[4]

144. තථෙ'ව ත්වම්පි සබ්බෙසං සම්මානාවමානක්ඛමො[5]
ඛන්තිපාරමිතං ගන්ත්වා සම්බොධිං පාපුණිස්සසි.

145. න හෙතෙ එත්තකායෙව බුද්ධධම්මා භවිස්සරෙ
අඤ්ඤෙපි විචිනිස්සාමි යෙ ධම්මා බොධිපාචනා.

146. විචිනන්තො තදා දක්ඛිං සත්තමං සච්චපාරමිං
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිතනිසෙවිතං.

147. ඉමං ත්වං සත්තමං තාව දළ්හං කත්වා සමාදිය
තත්ථ අද්වෙජ්ඣවචනො සම්බොධිං පාපුණිස්සසි.

---

1. ත්වම්පි - සිමු
2. අද්වෙජ්ඣමානසො - මජසං
3. පඨවි - මජසං
4. තයා - පු.
5. සම්මානනාවමානනක්ඛමො - මචි සබ්බභවෙ සම්මානනවිමානනක්ඛමො - පු.

137. ඉදින් තෙපි සම්බෝධියට පැමිණෙන්නට රිසියවු නම් පස් වැනි වූ මේ වීර්‍ය්‍යපාරමිතාව දැඩි කොට සමාදන් වැ වීර්‍ය්‍යපාරමිතාව සම්පූර්ණ කරව.

138. යම්සේ සිංහමෘගරාජතෙමේ හිඳීම්-සිටීම්-සක්මන්හි නො පසු-බස්නා වීර්‍ය්‍ය ඇත්තේ දැඩි කොට ගන්නා ලද සිත් ඇත්තේ වේ ද.

139. එසෙයින් මැ තෙපි (උපනුපන්) හැම භවයෙහි වීර්‍ය්‍යය දැඩි කොට ගන්ව, වීර්‍ය්‍ය පාරමිතාවට පැමිණ සම්‍යක් සම්බොධියට පැමිණෙන්නවු යැ.

140. යම් හෙයෙකින් මෙතෙල බුදුකුරුදහම්හු මෙතෙක් මැ නො වන්නාහු ද එහෙයින් යම් ධර්ම කෙනෙක් බොධිය මුහුකුරු වන්නාහු නම් ඒ අනෙකුදු බුදුකුරු දහම් සොයන්නෙමි.

141. එකල්හි විමසනුයෙම් මහර්ෂී වූ පූර්ව බොධිසත්ත්වයන් විසින් භාවිත බහුලීකෘත වූ ස වැනි ක්ෂාන්තිපාරමිතාව දිටිමි.

142. තෙපි මේ සවැනි ක්ෂාන්තිපාරමිතාව දැඩි කොට සමාදන් වැ ගෙන ඒ ක්ෂාන්තියෙහි එකාන්ත සිත් ඇතියහු සම්‍යක් සම්බොධියට පැමි-ණෙන්නවු යැ.

143. යම්සේ පෘථිවිය නම් බහාලන ලද සඳුන් ආදි පවිත්‍රය ද කුණපාදි අපවිත්‍රය ද යන සියල්ල ඉවසා ද (ඒ සුචි අසුචි නික්ෂේපයෙන්) කොප ස්නේහ නො කෙරේ ද.

144. එ සෙයින් මැ තෙපිදු සියල්ලන්ගේ බුහුමන් අවමන් ඉවසනුවහු ක්ෂාන්තිපාරමිතාවට පැමිණ සම්‍යක් සම්බොධියට පැමිණෙන්නවු යැ.

145. යම් හෙයෙකින් මෙතෙල බුදුකුරු දහම්හු මෙතෙක් මැ නො වන්නාහු ද එහෙයින් යම් ධර්ම කෙනෙක් බොධිය මුහුකුරු වන්නාහු නම් ඒ අනෙකුදු බුදුකුරු දහම් සොයන්නෙමි.

146. එකල්හි විමසනුයෙම් මහර්ෂී වූ පූර්ව බොධිසත්ත්වයන් විසින් භාවිත බහුලීකෘත වූ සත් වැනි සත්‍යපාරමිතාව දිටිමි.

147. තෙපි මේ සත් වැනි සත්‍යපාරමිතාව දැඩි කොට සමාදන් වැ ගෙන ඒ සත්‍යපාරමිතායෙහි අතථ්‍යවචන රහිත වූවහු සම්‍යක් සම්බොධියට පැමිණෙන්නවු යැ.

148. යථා'පි ඔසධී නාම තුලාභූතා සදෙවකෙ
සමයෙ උතුවස්සෙ[1] වා නෙවොක්කමති[2] වීථිතො.

149. තථේ'ව ත්වම්පි සච්චෙසු මා ඔක්කමි හි[3] වීථිතො
සච්චපාරමිතං ගන්ත්වා සම්බොධිං පාපුණිස්සසි.

150. න හෙතෙ එත්තකායෙව බුද්ධධම්මා භවිස්සරෙ
අඤ්ඤෙ'පි විචිනිස්සාමි යෙ ධම්මා බොධිපාචනා.

151. විචිනන්තො තදා දක්ඛිං අට්ඨමං අධිට්ඨානපාරමිං
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිතනිසෙවිතං.

152. ඉමං ත්වං අට්ඨමං තාව දළ්හං කත්වා සමාදිය
තත්ථ ත්වං අචලො හුත්වා සම්බොධිං පාපුණිස්සසි.

153. යථා'පි පබ්බතො සෙලො අචලො සුප්පතිට්ඨිතො
න කම්පති භුසවාතෙහි සකට්ඨානෙ'ව තිට්ඨති.

154. තථේ'ව ත්වම්පි අධිට්ඨානෙ සබ්බදා අචලො භව
අධිට්ඨානපාරමිං[4] ගන්ත්වා සම්බොධිං පාපුණිස්සසි.

155. න හෙතෙ එත්තකායෙව බුද්ධධම්මා භවිස්සරෙ
අඤ්ඤෙ'පි විචිනිස්සාමි යෙ ධම්මා බොධිපාචනා.

156. විචිනන්තො තදා දක්ඛිං නවමං මෙත්තාපාරමිං
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිතනිසෙවිතං.

157. ඉමං ත්වං නවමං තාව දළ්හං කත්වා සමාදිය
මෙත්තාය අසමො හොහි යදි බොධිං පත්තුමිච්ඡසි.

158. යථා'පි උදකං නාම කල්‍යාණෙ පාපකෙ ජනෙ
සමං ඵරති සීතෙන පවාහෙති රජොමලං.[5]

---

1. උතුවට්ටෙ - පු.
2. න වොක්කමති - සීමු, මජසං, ස්‍යා, න ඔක්කමති - අසා.
3. නාතික්කම හි - සීමු, මා වොක්කම හි - මජසං, මා වොක්කමී හි - මවි. මා වොක්කමසි - ස්‍යා
4. අධිට්ඨාන පාරමිතං - සීමු, මජසං.
5. රජං මලං - පු.

148. යම්සේ ඔසධීතාරකා නම් සදෙවක ලොකයාහට තුලා සදෘශ වූවා වැසි කල්හිදු හිමත් ගිමත් කල්හිදු ගමන වීථියෙන් ඉවත් වැ නො යේ ද නොහොත් සදෙවකලොකයාහට ප්‍රාණාරක්ෂායෙහි ප්‍රමාණ වූ සිඟුරු මිරිස් ආදිය එලදන සමයෙහි තත් තත් රොගොපශම විධියෙන් නො ඉක්මැ පවතී ද,

149. එසෙයින් තෙපිදු සත්‍යයෙහි වීථියෙන් නො ඉක්මෙව. සත්‍ය පාරමිතාවට පැමිණ සම්‍යක් සම්බොධියට පැමිණෙන්නවූ යැ.

150. යම් හෙයෙකින් තෙල බුදුකුරුදහම්හු මෙතෙක්මැ නොවන්නාහු ද එහෙයින් යම් ධර්ම කෙනෙක් බොධිය මුහුකුරු වන්නාහු නම් ඒ අනෙකුදු බුදුකුරුදහම් සොයන්නෙමි.

151. එකල්හි විමසනුයෙම් මහර්ෂී වූ පූර්ව බොධිසත්ත්වයන් විසින් භාවිත බහුලීකෘත වූ අටවැනි අධිෂ්ඨානපාරමිතාව දිටිමි.

152. තෙපි මේ අට වැනි පාරමිතාව දැඩි කොට සමාදන් වැ ගෙන ඒ අධිෂ්ඨානපාරමිතායෙහි නිශ්චල වැ සිට සම්‍යක් සම්බොධියට පැමිණෙන්න වූ යැ.

153. යම්සේ ශෛලපර්වතයෙක් අචල වූයේ එහෙයින් මැ මොනොවට පිහිටියේ සැඩ පවනින් නො සැලේ ද තමා සිටිතැන්හි මැ සිටී ද.

154. එසෙයින් මැ තෙපි අධිෂ්ඨානයෙහි හැම කල්හි නිශ්චල වව. අධිෂ්ඨානපාරමිතාවට පැමිණ සම්‍යක් සම්බොධියට පැමිණෙන්නවූ යැ.

155. යම් හෙයෙකින් තෙල බුදුකුරු දහම්හු මෙතෙක් මැ නොවන්නාහු ද එහෙයින් යම් ධර්ම කෙනෙක් බොධිය මුහුකුරුවන්නාහු නම් ඒ අනෙකුදු බුදුකුරු දහම් සොයන්නෙමි.

156. එකල්හි විමසනුයෙම් මහාර්ෂී වූ පූර්ව බොධිසත්ත්වයන් විසින් භාවිත බහුලීකෘත වූ නව වැනි මෛත්‍රීපාරමිතාව දිටිමි.

157. තෙපි මේ නව වැනි මෛත්‍රී පාරමිතාව දැඩි කොට සමාදන් වැ ගෙන ඉදින් සම්‍යක් සම්බොධියට පැමිණෙනු රිසියවූ නම් මෛත්‍රීභාවනා-යෙහි අසම වව.

158. යම්සේ ජලය නම් කල්‍යාණ වූ ද පාපක වූ ද ජනයන් සිහිල් ගුණයෙන් සම වැ ස්පර්ශ කෙරේ ද රජස්මල ආදිය පවිත්‍ර කෙරේ ද–

159. තථෙ'ව ත්වම්පි හිතාහිතෙ[1] සමං මෙත්තාය භාවය
මෙත්තාපාරමිතං ගන්ත්වා සම්බොධිං පාපුණිස්සසි.

160. න හොන්ති එත්තකායෙව බුද්ධධම්මා භවිස්සරෙ
අඤ්ඤෙ'පි විචිනිස්සාමි යෙ ධම්මා බොධිපාචනා.

161. විචිනන්තො තදා දක්ඛිං දසමං උපෙක්ඛාපාරමිං
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිතනිසෙවිතං.

162. ඉමං ත්වං දසමං තාව දළ්හං කත්වා සමාදිය
තුලාභූතො දළ්හො හුත්වා සම්බොධිං පාපුණිස්සසි.

163. යථා'පි පඨවී[2] නාම නික්ඛිත්තං අසුචිං සුචිං
උපෙක්ඛති උභොපෙතෙ කොපානුනයවජ්ජිතා.

164. තථෙ'ව ත්වම්පි සුඛදුක්ඛෙ තුලාභූතො සදා භව
උපෙක්ඛාපාරමිං ගන්ත්වා සම්බොධිං පාපුණිස්සසි.

165. එත්තකායෙ'ව තෙ ලොකෙ යෙ ධම්මා බොධිපාචනා
තතුද්ධං නත්ථි අඤ්ඤත්‍ර දළ්හං තත්ථ පතිට්ඨහ.

166. ඉමෙ ධම්මෙ සම්මසතො සභාවසරසලක්ඛණා.[3]
ධම්මතෙජෙන වසුධා දසසහස්සී පකම්පථ.

167. චලතී රවතී පඨවී[4] උච්ඡුයන්තංව පීළිතං[5]
තෙලයන්තෙ යථා චක්කං එවං කම්පති මෙදිනී.

168. යාවතා පරිසා[6] ආසි බුද්ධස්ස පරිවෙසනෙ
පවෙධමානා සා තත්ථ මුච්ඡිතා සෙති භූමියං.

169. ඝටානෙකසහස්සානි කුම්භීනඤ්ච සතා බහූ
සඤ්චුණ්ණා මථිතා තත්ථ අඤ්ඤමඤ්ඤං පඝට්ටිතා.[7]

170. උබ්බිග්ගා තසිතා භීතා භන්තා බ්‍යාධිතමානසා
මහාජනා සමාගම්ම දීපඞ්කරමුපාගමුං.

---

1. ත්වං හිතාහිතෙ – ස්‍යා – මජසං, ත්වං අහිතහිතෙ – සීමු, මව.
2. පඨවි – මජසං.
3. සභාව සරසලක්ඛණෙ – ස්‍යා, මජසං, මව.
4. චලතී රවතී පඨවි – මජසං, චලතී රවතී පුථුවි, – මව.
5. ගුළයන්තංව පීළිතං – පු.
6. සා තදා පරිසා – පු
7. අඤ්ඤමඤ්ඤපසට්ටිතා – අසා.

159. එසෙයින් මැ තෙපිදු හිතාහිතයන් කෙරෙහි මෙත්තාභාවනාව සම කොට වඩව. මෛත්‍රීපාරමිතාවට පැමිණ සම්‍යක් සම්බෝධියට පැමිණෙන්නවු යැ.

160. යම් හෙයෙකින් තෙල බුදුකුරුදහම්හු මෙතෙක් මැ නොවන්නාහු ද එහෙයින් යම් ධර්ම කෙනෙක් බොධිය මුහුකුරුවන්නාහු නම් ඒ අනෙකුදු බුදුකුරු දහම් සොයන්නෙමි.

161. එකල්හි විමසනුයෙම් මහර්ෂී වූ පූර්ව බොධිසත්ත්වයන් විසින් භාවිත බහුලීකෘත වූ දසවැනි උපෙක්ෂාපාරමිතාව දිටිමි.

162. තෙපි මෙ දස වැනි පාරමිතාව දැඩි කොට සමාදන් වැ ගෙන තුලා (තරාදිය) සදෘශ වූවහු දැඩි වැ සිට සම්‍යක් සම්බෝධියට පැමිණෙන් නවු යැ.

163. යම්සේ පෘථිවිය නම් බහාලනලද අපවිත්‍රය ද පවිත්‍රය ද යන මෙ දෙක කොප ය අනුනය යන දෙකින් තොර වැ උපෙක්ෂා කෙරේ ද–

164. එසෙයින් මැ තෙපිදු හැම කල්හි සුඛදුඃඛයෙහි තුලා සදෘශ වව. උපෙක්ෂාපාරමිතාවට පැමිණ සම්බොධියට පැමිණෙන්නවු යැ.

165. ලොකයෙහි යම් ධර්ම කෙනෙක් බොධිය මුහුකුරුවන්නාහු නම් ඔහු මෙතෙක් මැ යි. ඒ දශපාමීරන් හැර මත්තෙහි අන්‍ය බුද්ධකාරක-ධර්මයෙක් නැති. එහි දැඩිසේ සිටුව.

166. මෙ පාරමීධර්මයන් ස්වභාව සඞ්ඛ්‍යාත සරසලක්ෂණ හෙයින් සම්මර්ශනය කරන්නහුගේ දහම් තෙදින් දසදහසක් සක්වළ පෘථිවිය කම්පා වූ යැ.

167. මහපොළොව පෙළනලද උක්යතක් සෙයින් සැලිණ, ගුගුළා ය. මෙදිනි තොමෝ තෙලියතෙක සකක් සෙයින් කම්පා වූ ය.

168. දීපඞ්කර බුදුරදුන් (වළඳවන) දන්හල්හි යම් පමණ පිරිස් කෙනෙක් වූවාහු ද, ඔහු කම්පා වෙමින් මුසපත් වැ එ තැන්හි බිමැ වැතිරගත්හ.

169. නේසුවහස් ගණන් කළ ද බොහෝ සියගණන් සැළ ද එකිනෙක ගැටුණාහු ඇලැළ සුණුවිසුණු වැ ගියහ.

170. තැතිගත් සිතැති (එහෙයින්) තැවුණු බියපත් වූ භ්‍රාන්ත වූ පීඩිත සිත් ඇති මහාජනයෝ රැස්වැගෙන දීපඞ්කර බුදුන් කරා එළැඹියාහ.

171. කිං භවිස්සති ලොකස්ස කල්‍යාණමථ පාපකං
සබ්බො උපද්දුතො ලොකො තං විනොදෙහි චක්ඛුම.

172. තෙසං තද සඤ්ඤාපෙසි දීපඞ්කරො මහාමුනි
විස්සත්ථා හොථ මා භාථ[1] ඉමස්මිං පථවිකම්පනෙ.

173. යමහං අජ්ජ බ්‍යාකාසිං බුද්ධො ලොකෙ භවිස්සති
එසො සම්මසති ධම්මං පුබ්බකං ජිනසෙවිතං

174. තස්ස සම්මසතො ධම්මං බුද්ධභූමිං අසෙසතො
තෙනා'යං කම්පිතා පථවී[2] දසසහස්සී සදෙවකෙ.

175. බුද්ධස්ස වචනං සුත්වා මනො නිබ්බායි තාවදෙ
සබ්බෙ මං උපසඞ්කම්ම පුනාපි අභිවාදයුං[3]

176. සමාදියිත්වා බුද්ධගුණං දළ්හං කත්වාන මානසං
දීපඞ්කරං නමස්සිත්වා ආසනා උට්ඨහිං තද.

177. දිබ්බං මානුසකං පුප්ඵං දෙවා මානුසකා උභො
සමොකිරන්ති පුප්ඵෙහි වුට්ඨහන්තස්ස ආසනා.

178. වෙදයන්ති ච තෙ සොත්ථිං දෙවා මානුසකා. උභො
මහන්තං පත්ථිතං තුය්හං තං ලභස්සු යථිච්ඡිතං.

179. සබ්බීතියො විවජ්ජන්තු සොකො රොගො[4] විනස්සතු
මා තෙ භවත්වන්තරායො[5] ඵුස ඛිප්පං බොධිමුත්තමං

180. යථා'පි සමයෙ පත්තෙ පුප්ඵන්ති පුප්ඵිනො දුමා
තථෙව ත්වං බුද්ධවීර බුද්ධඤාණෙන පුප්ඵසි.

181. යථා යෙ කෙචි සම්බුද්ධා පූරයුං දසපාරමී
තථෙව ත්වං මහාවීර පූරය දසපාරමී.

1. භායථ- මජසං.
2. පථවී – මජසං, පුථුවී – සිමු
3. පුනපි මං අභිවන්දිසුං – සිමු, මචි, පුනාපි අභිවන්දිසුං – මජසං, සයා.
4. සබ්බරොගො – සිමු.
5. භවනත්වන්තරායා – මජසං

171. කිමැ (වහන්ස,) ලොවට කල්‍යාණයෙක් හෝ යළි පාපයෙක් හෝ වන්නේ ද, හැම ලෝවැසි තෙමෙ උපද්‍රැත විය. පසැස් වූ භාග්‍යවතුන් වහන්ස, ඒ දුරුකළ මැනව.

172. එකල්හි මහාමුනි වූ දීපඞ්කර සර්වඥයන් වහන්සේ මේ පෘථිවි කම්පනයෙහි (තෙපි) විශ්වස්ත වවූ, නහමක් බියපත් වව'යි ඒ ජනයනට මෙසේ හඟවාලූ සේක:

173. 'මේ තෙමේ මතු ලොවැ බුදු වේ' යයි මම් අද යමක්හට ප්‍රකාශ කෙළෙම් ද, ඒ සුමෙධ තවුස් පෙර බුදුවරයන් බෝසත් කලැ සෙවුනා ලද පැරුම් දම් සම්මර්ශන කෙරෙයි.

174. බුදුබවට කාරණ වූ පැරුම්දම් නිරවසෙස්නෙන් සිම්දුනා ඕහුට එකරුණෙන් දෙව්ලෝ සහිත දසදහසක් සක්වළැ මේ පෘථිවිය කම්පා වී යයි.

175. බුදුරදුන්ගේ බස් අසා එ කෙණෙහි (ඔවුන්ගේ) සිත නිවිණ. යළිදු ඔහු සියල්ලෝ මා වෙත පැමිණ මට අභිවාදන කළාහුය.

176. එකල්හි සිත තරකොට බුදුගුණ (-පැරුම්දම්) සමාදන් ව දිවකුරු බුදුරදුන් වැඳ හුනස්නෙන් නැඟී සිටියෙමි.

177. දෙවියෝ ද මනුෂ්‍යයෝ ද යන දෙපක්ෂය (මදුරාදි) දිවමල් ද මිනිස්ලොවැ මල් ද ගෙන ආසනයෙන් නැඟීසිටුනා මා මතුයෙහි මල් වගුරුවාලූහ.

178. ඒ දෙව්මිනිස් යන දෙ පක්ෂය "තොප විසින් මහත් වූ තනතුරක් පතන ලද, ඒ තනතුර රිසි සේ ලබව"යි සවස්තිභාවය ප්‍රකාශ කළාහු ය.

179. සියලු උවදුරු දුරු වැ සෙත් වේවා ශොක රොග නැසීයේවා තොපට අන්තරායෙක් නහම් වේවා, උතුම් වූ සම්‍යක්සම්බොධිය වහා අවබොධ කරව'යි.

180. යම්සේ ඒ ඒ ගස මල් ගන්නා කාලය පැමිණි කල්හි මල් හට ගන්නා වෘක්ෂයෝ විකසිත වෙත් ද, මහාවීරයන් වහන්ස, එසෙයින් තෙපි දු බුද්ධඥනයෙන් ප්‍රබොධ වෙව.

181. යම්සේ යම් කිසි බුදු කෙනෙක් දසපැරුම් පිරුවාහු ද, මහාවීරයන් වහන්ස, එසෙයින්ම තෙපිදු දසපැරුම් පුරව.

182. යථා යෙ කෙචි සම්බුද්ධා බොධිමණ්ඩම්හි බුජ්ඣරෙ
තථෙව ත්වං මහාවීර බුජ්ඣස්සු ජිනබොධියං.

183. යථා යෙ කෙචි සම්බුද්ධා ධම්මචක්කං පවත්තයුං
තථෙව ත්වං මහාවීර ධම්මචක්කං පවත්තය.

184. පුණ්ණමාසෙ යථා චන්දො පරිසුද්ධො විරොචති
තථෙව ත්වං පුණ්ණමනො විරොච දසසහස්සියං.

185. රාහුමුත්තො යථා සූරියො තාපෙන අභිරොචති[1]
තථෙව ලොකා මුච්චිත්වා විරොච සිරියා තුවං.

186. යථා යා කාචි නදියො ඔසරන්ති මහොදධිං
එවං සදෙවකා ලොකා ඔසරන්තු[2] තවන්තිකෙ.

187. තෙහි ථුතප්පසත්ථො[3] සො දසධම්මෙ සමාදිය
තෙ ධම්මෙ පරිපූරෙන්තො පවනං පාවිසී[4] තදති.

සුමෙධකථා නිට්ඨිතා.

---

1. අතිරොචති – මජසං
2. ඔසරනති – සීමු.
3. ථුතිප්පසත්ථො – සීමු.
4. පාවිසි – මජසං

182. යම්සේ යම් කිසි සම්බුදු කෙනෙක් බෝමඩ වැඩහිඳ (සර්වඥතාඥනය) අවබොධ කළාහු ද, මහාවීරයන් වහන්ස, එසෙයින් තෙපිදු බුද්ධබොධියෙන් නොහොත් සර්වඥ බොධිමූලයෙහි (සිව්සස්) අවබොධ කළ මැනව.

183. යම්සේ යම්කිසි සම්බුදු කෙනෙක් දම්සක් පැවැත්වූවාහු ද, මහාවීරයන් වහන්ස, එසෙයින් තෙපි දු දම්සක් පවත්වාලුව මැනැව.

184. යම්සේ පණුරසිපොහොයෙහි (උපද්‍රවාපගමයෙන්) පරිශුද්ධ වූ සඳු බබළාද එසෙයින් තෙපි දු පිරිපුන් මනදෙළ ඇතියහු දසදහසක් සක්වළැ බැබැළුණ මැනැව.

185. යම්සේ රාහු ග්‍රහයා කෙරෙන් මිදුණු හිරු තෙදින් දිලියේ ද එසෙයින්මැ තෙපි දු ලෝ-දහම් හා අලිප්ත වැ බුදුසිරින් බබළනු මැනැව.

186. යම්සේ යම් කිසි නදී කෙනෙක් (වෙන් නම් ඔහු) මහසයුර කරා ගලාබසිත් ද, එසෙයින් දෙවියන් සහිත ලෝවැසියෝ තොප සමීපයට එළැඹෙත්වා.

187. ඒ දෙවියන් විසින් සතුතප්‍රශංසා වූ ඒ සුමෙධ තවුස්හු දස පැරුම් දම් සමාදන් වැ ගෙන එකල්හි ඒ පැරුම්දම් පුරමින් ධම්මක පර්වතයෙහි මහවනයට පිවිසියාහ'යි.

**සුමෙධකථා නිමි.**

# 1. දීපඞ්කර බුද්ධවංසො

1. තදා තෙ භොජයිත්වාන සසඞ්ඝං ලොකනායකං
උපගච්ඡුං සරණං තස්ස[1] දීපඞ්කරස්ස සත්ථුනො.

2. සරණාගමනෙ කඤ්චි නිවෙසෙති[2] තථාගතො
කඤ්චි පඤ්චසු සීලෙසු සීලෙ දසවිධෙ පරං.

3. කස්සචි දෙති සාමඤ්ඤං චතුරො ඵලමුත්තමෙ
කස්සචි අසමෙ ධම්මෙ දෙති සො පටිසම්භිදා.

4. කස්සචි වරසමාපත්තියො අට්ඨ දෙති නරාසභො
තිස්සො කස්සචි විජ්ජායො ඡළභිඤ්ඤා පවෙච්ඡති.

5. තෙන යොගෙන ජනකායං ඔවදි සො මහාමුනි
තෙන විත්ථාරිකං ආසි ලොකනාථස්ස සාසනං

6. මහාහනූසභක්ඛන්ධො[3] දීපඞ්කරසනාමකො[4].
බහූ ජනෙ තාරයති පරිමොචෙති දුග්ගතිං

7. බොධනෙය්‍යං ජනං දිස්වා සතසහස්සෙපි යොජනෙ
ඛණෙන උපගන්ත්වාන බොධෙති තං මහාමුනි.

8. පඨමාභිසමයෙ බුද්ධො කොටිසතමබොධයි
දුතියාභිසමයෙ නාථො නවුතිකොටිමබොධයි.

9. යදා ච දෙවභවනම්හි බුද්ධො ධම්මමදෙසයි
නවුතිකොටිසහස්සානං තතියාභිසමයො අහු.

10. සන්නිපාතා තයො ආසුං දීපඞ්කරස්ස සත්ථුනො
කොටිසතසහස්සානං පඨමො ආසි සමාගමො.

---

1. තස්ස-පු
2. නිවෙසෙසි-මජසං, නිවාසෙසි-ඕමු.
3. මහාහනු උසභක්ඛන්ධො-මවි
4. දීපඞ්කරස්ස නාමකො-ම ජ සං

# 1. දීපඞ්කර බුද්ධවංශය

1. එකල්හි ඒ රඹගම් වැසියෝ සඞ්ඝයා සහිත වූ ලොකනායකයන් වහන්සේ වළඳවා ඒ දිවකුරු බුදුන් සරණ කොට ගියාහු ය.

2. තථාගතයන් වහන්සේ කිසිවක්හු සරණාගමනයෙහි ද, කිසිවක්හු පන්සිල්හි ද, සමහරුන් දශවිධ ශීලයෙහි ද, පිහිටුවූහ.

3. ඒ දිවකුරු බුදුහු කිසිවක්හට සතර ශ්‍රාමණ්‍ය සඞ්ඛ්‍යාත මාර්ගය ද, උතුම් වූ සතර ආර්‍ය්‍යඵලය ද දුන්හ, කිසිවක්හට අසම වූ සිව්පිළිසැඹියා දහම් දුන්හ.

4. නරශ්‍රෙෂ්ඨ වූ සර්වඥයන් වහන්සේ කිසිවක්හට උතුම්වූ අටසමවත් දුන්හ. කිසිවක්හට ත්‍රිවිද්‍යා ද ෂඩභිඥාවන් ද දුන්හ.

5. ඒ මහාමුනි වූ සර්වඥයන් වහන්සේ ඒ නයින් ජනසමූහයාට අවවාද කළහ. ඒ අවවාදයෙන් ලොකනාථයන් වහන්සේගේ ශාසනය පතළේ වී.

6. මහත් වූ (සිංහසදෘශ වූ පිරිපුන්) හනු ඇති වෘෂභසදෘශ වූ (සමවෘත්ත මනොඥ) ස්කන්ධ ඇති දීපඞ්කර නම් වූ සර්වඥයන් වහන්සේ (බුද්ධ වෛනෙය වූ) බොහෝ ජනයන් (සසරින්) තැරවූහ. දුගතයෙන් මුදාලූහ.

7. මහාමුනි වූ සර්වඥයන් වහන්සේ සියදහස්යොදුන්හි පවා සිටි සත්‍යාවබොධයට නිසි වූ ප්‍රජාව දැක ඇසිල්ලෙකින් සමීපයට එළැඹ ඒ ප්‍රජාවට සත්‍යාවබොධය කැරවූහ.

8. දීපඞ්කර බුදුරජාණන් වහන්සේ ප්‍රථමධර්මාභිසමයෙහි කෙළ-සියක් සත්නට සත්‍යාවබොධය කැරවූහ. ලොකස්වාමි වූ බුදුහු ද්විතීය ධර්මාභිසමයෙහි (නාරදකූටයෙහි දී) අනූකෙළක් සත්නට සත්‍යාවබොධය කැරවූහ.

9. තවද යම් කලෙක බුදුහු දෙවභවනයෙහි වැඩසිට දහම් දෙසූසේක් ද. (එකල්හි) අනූකෙළදහසක් සත්නට තුන්වැනි ධර්මාභිසමය වී.

10. දීපඞ්කර ශාස්තෲන් වහන්සේට තුන් ශ්‍රාවකසන්නිපාතයෙක් වී, කෙළසියදහසක් ශ්‍රාවකයන්ගේ ප්‍රථම සමාගමය වී.

11. පුන නාරදකූටම්හි පවිවෙකගතෙ ජිනෙ
ඛීණාසවා වීතමලා සමිංසු සතකොටියො.

12. යම්හි කාලෙ මහාවීරො සුදස්සනසිලුච්චයෙ
නවුතිකොටිසහස්සෙහි පවාරෙසි[1] මහාමුනි.

13. [අහං තෙන සමයෙන ජටිලො උග්ගතාපනො
අන්තලික්ඛම්හි චරණො පඤ්චාභිඤ්ඤාසු පාරගූ.*]

14. දසවීසසහස්සානං ධම්මාභිසමයො අහු
එකද්වින්නං අභිසමයා ගණනාතො අසඞ්ඛියා.

15. විත්ථාරිකං බාහුජඤ්ඤං ඉද්ධං ඵීතං අහු තදා
දීපඞ්කරස්ස භගවතො සාසනං සුවිසොධිතං.

16. චත්තාරිසතසහස්සානි ඡළභිඤ්ඤා මහිද්ධිකා
දීපඞ්කරං ලොකවිදුං පරිවාරෙන්ති සබ්බදා.

17. යෙ කෙචි තෙන සමයෙන ජහන්ති මානුසං භවං
අප්පත්තමානසා සෙඛා ගරහිතා ච[2] භවන්ති තෙ.

18. සුපුප්ඵිතං පාවචනං අරහන්තෙහි තාදිහි
ඛීණාසවෙහි විමලෙහි උපසොභති සබ්බදා[3]

19. නගරං රම්මවතී නාම සුදෙවො නාම ඛත්තියො
සුමෙධා නාම ජනිකා දීපඞ්කරස්ස සත්ථුනො.

20. දසවස්සසහස්සානි අගාරමජ්ඣ සො[4] වසී
හංසා කොඤ්චා මයූරා ච තයො පාසාදමුත්තමා.

21. තීණි සතසහස්සානි නාරියො සමලඞ්කතා
පදුමා නාම සා නාරී උසභක්ඛන්ධො නාම අත්‍රජො.

22. නිමිත්තෙ චතුරො දිස්වා හත්ථියානෙන නික්ඛමි
අනූනදසමාසානි පධානං පදහි ජිනො.

---

1. පරිවාරෙසි–සිමු.
2. ගරහිතා–ම ජ සං
3. උපසොභති සදෙවකෙ–පු.
4. අගාරං අජ්ඣසො–සිමු.–මජසං,
   අගාරං අජ්ඣාවසී ජිනො–ස්‍යා

* ''අයං ගාථා අත්ථසාලිනියා ධම්මසඞ්ගණි– අට්ඨකථා නිදානවණ්ණනාය දීපඞ්කර බුද්ධවංසෙ ලිඛිතා ඉමස්මිං පන බුද්ධවංසෙ නත්ථිභාවො යෙව පනස්සා යුත්තතරො. කස්මාති චෙ? හෙට්ඨා සුමෙධකථාසු කථිතා හි. (අට්ඨ කථා)

11. යලි ජිතපඤ්චමාර වූ සර්වඥයන් වහන්සේ නාරදකූටයෙහි විවේක සඳහා වැඩි කල්හි විගත වූ (රාගාදි) මල ඇති සියකෙළක් රහත්හු රැස්වූහ.

12. මහාවීර වූ සර්වඥයන් වහන්සේ යම් කලෙක්හි සුදර්ශනකූටයෙහි විසූ සේක් ද, (එකල්හි) මහාමුනි වූ බුදුහු අනූකෙළදහසක් (භික්ෂූන්) සමග පවාරණය කළ සේක.

13. [මම එ සමයෙහි දළමඬුලු ඇති උග්‍ර වූ තපස් ඇති අහස්හි හැසිරෙනසුලු පඤ්චාභිඥවන්හි තෙරපත් තවුස් වීමි.]

14. දස–විසිදහසුන්ගේ ද ධර්මාභිසමය විය. එක්–දෙ–(තුන්) දෙනකුන්ගේ අභිසමය ගණන් විසින් නො ගිණිය හැක්ක.

15. එකල්හි දීපඞ්කර භාග්‍යවතුන් වහන්සේ ගේ ශාසනය (එ බුදුන් විසින්) මොනොවට විශොධිත වූයේ මහත්ත්‍වයට පැමිණියේ බොහෝ දෙවමනුෂ්‍යයන් විසින් නෛර්‍ය්‍යාණිකත්වයෙන් දන්නා ලදුයේ (අධිශීල ශික්‍ෂාදියෙන්) සමෘද්ධ වූයේ (සමෘද්ධි සමාධි ආදියෙන්) වැඩුණේ ද වී.

16. ෂඩභිඥ වූ මහත් ඍද්ධි ඇති සාරලක්ෂයක් ක්ෂීණාස්‍රව භික්ෂූහු හැම කල්හි දීපඞ්කර බුදුන් පිරිවරා වෙසෙත්,

17. එසමයෙහි යම් කිසි කෙනෙක් නොපත් අර්හත්ත්‍වය ඇති වැ ශෛක්ෂ වූවාහු මිනිස් බව පියත් ද, ඔහු ගර්හිත වූවාහු මැ වෙත්.

18. (අභිඥ කුසුමයෙන්) සුපිපි ප්‍රවචනශාසනය ලෝදහම්හි තාදී වූ වූ ක්ෂීණාස්‍රව වූ විගත රාගාදි මල ඇති රහතුන් විසින් හැම කල්හි සොභිත වී.

19. දීපඞ්කර ශාස්තෘන් වහන්සේ ගේ ජාතනගරය රම්මවතී නම් විය, ක්ෂත්‍රිය වූ සුදෙව නම් රජ පිතෘ විය. මවු තොමෝ සුමෙධා නම් වූ.

20. ඒ බුදුහු දසදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. හංසා යැ කොඤ්චා යැ මයූරා යැ යි උත්තම වූ තුන් ප්‍රාසාදයෝ වූහ.

21. මොනොවට සැරසුණු තුන් ලක්ෂයක් පරිවාර ස්ත්‍රීහු වූහ, පදුමා නම් ප්‍රසිද්ධ ස්ත්‍රී අගබිසෝ වූ උසභක්ඛන්ධ නම් කුමාර පුත්‍ර වී.

22. ජින වූ දීපඞ්කර බුදුහු සතර පෙර නිමිති දැක ඇත් යානයෙන් අභිනිෂ්ක්‍රමණය කළහ. අනූන වූ දසමසක් මුළුල්ලෙහි ප්‍රධන්වීර්‍ය්‍ය කළහ.

23. පධානචාරං චරිත්වාන අබුජ්ඣි මානසං[1] මුනි
බ්‍රහ්මුනා යාචිතො සන්තො දීපඞ්කරො මහාමුනි.

24. වත්ති චක්කං[2] මහාවීරො නන්දාරාමෙ සිරීඝරෙ[3]
නිසින්නො සිරීසමූලම්හි අකා තිත්ථියමද්දනං

25. සුමඞ්ගලො ච තිස්සො ච අහෙසුං අග්ගසාවකා
සාගතො නාමුපට්ඨාකො දීපඞ්කරස්ස සත්ථුනො

26. නන්දා චෙව සුනන්දා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො පිප්ඵලීති පවුච්චති.

27. තපුස්ස භල්ලිකා[4] නාම අහෙසුං අග්ගුපට්ඨකා
සිරිමා සොණා උපට්ඨිකා දීපඞ්කරස්ස සත්ථුනො.

28. අසීති හත්ථමුබ්බෙධො දීපඞ්කරො මහාමුනි
*සොභති දීපරුක්ඛො'ව සාලරාජා'ව ඵුල්ලිතො

29. සතවස්සසහස්සානි[5] ආයු[6] තස්ස මහෙසිනො
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

30. ජොතයිත්වාන සද්ධම්මං සන්තාරෙත්වා මහාජනං[7]
ජලිත්වා අග්ගික්ඛන්ධො'ව නිබ්බුතො සො සසාවකො

31. සා ච ඉද්ධි සො ච යසො තානි ච පාදෙසු චක්කරතනානි
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරාති.

32. දීපඞ්කරො ජිනො සත්ථා නන්දාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ජිනථූපො ඡත්තිංසුබ්බෙධයොජනොති.

දීපඞ්කරබුද්ධවංසො පඨමො

1. මානසා-සයා
2. වත්තචක්කා-සයා
3. සිරිධරෙ-සීමු, වසී ජිනො-සයා
4. තපස්සුභල්ලිකා-සීමු
5. සතසහස්ස වස්සානි-සීමු-මජසං, මචි
6. ආයුං-සීමු.
7. සන්තාරෙත්වා සදෙවකං-පු

* ''පභානිද්ධාවති තස්ස සමන්තා දසයොජනෙ''-සයාමා පොත්ථකෙ ඉදම්පි ගාථද්ධං දිස්සති.

23–24. ඒ මුනිහු ප්‍රධන්වීර්‍යය කොට අභිත්ඵලය අවබොධ කළහ. මහාවීර වූ දීපඞ්කර මහාමුනිහු මහබ්‍රහ්ම විසින් අයැදනා ලද්දහු ලක්ෂ්මී වාස වූ නන්දාරාමයෙහි ධම්සක් පැවැත්වූහ. මහරි රුක්මුල්හි වැඩහිඳ තිත්ථික මර්දනය කළහ.

25. දීපඞ්කර ශාස්තෲන් වහන්සේට සුමඞ්ගල යැ තිස්ස යැ යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූහ. සාගත නම් තෙර උපස්ථායක වී.

26. නන්ද යැ සුනන්ද යැයි අග්‍රශ්‍රාවිකා දෙදෙනෙක් වූහ, ඒ භාග්‍යවත් හුගේ බොධිය පළොල් යයි කියනු ලැබේ.

27. දීපඞ්කර ශාස්තෲන් වහන්සේට තපුස්ස යැ භල්ලික යැ යන නම් ඇති අග්‍ර–උපස්ථායකයෝ වූහ. සිරිමා යැ සොණා යැ (යන උපාසි–කාවෝ) උපස්ථායිකා වූහ.

28. මහාමුනි වූ දීපඞ්කර සර්වඥයන් වහන්සේ අසූරියන් උස ඇති සේක් (නැඟූ) පහන්රුකක් සෙයින් ද පිපුණු සල්රුකක් සෙයින් ද හොබනා සේක.

29. ඒ මහර්ෂි සර්වඥයන් වහන්සේට හවුරුදු සියදහසක් ආයු විය. එතෙක් හවුරුදු වැඩ සිටී ඒ බුදුහු බොහෝ ජනසමූහයා (සසර කතරින්) එතෙර කැරැවූහ.

30. සද්ධර්මය බබුළුවා මහාජනයා තරණය කරවා ශ්‍රාවකයන් සහිත වූ ඒ සර්වඥයන් වහන්සේ ගිනිකඳක් සෙයින් දිලියෙමින් සිට පිරිනිවි සේක.

31. ඒ අනුභාවසම්පත් ද ඒ පරිවාරයශස් ද පා සඟුළුවන්හි වූ ඒ සක්රුවන් ලකුණු ද යන සියල්ල අතුරුදහන් වී. සියලු සංස්කාරධර්මයෝ තුච්ඡ වූවාහු නො වෙද්ද. (සියලු සඞ්ඛතයෝ අනිත්‍ය වූහ'යි සේ යි.)

32. පස්මරුන් දිනූ දීපඞ්කර ශාස්තෲන් වහන්සේ නන්දාරාමයෙහි පිරිනිවීසේක. එහි මැ උන්වහන්සේ ගේ සර්වඥධාතු ස්තූපය සතිස් යොදුන් උස්වූයේ වී යයි.

**පළමුවන දීපංකර බුද්ධවංශ නිමි.**

## 2. කොණ්ඩඤ්ඤ බුද්ධවංසො

1. දීපඞ්කරස්ස අපරෙන කොණ්ඩඤ්ඤො නාම නායකො
අනන්තතෙජො අමිතයසො අප්පමෙය්‍යො දුරාසදො

2. ධරණූපමො[1] ඛමනෙන සීලෙන සාගරූපමො
සමාධිනා මෙරුසමො[2] ඤාණෙන ගගනූපමො.

3. ඉන්ද්‍රියබලබොජ්ඣඞ්ග – මග්ගසච්චප්පකාසනං
පකාසෙසි සදා බුද්ධො හිතාය සබ්බපාණිනං.

4. ධම්මචක්කං පවත්තෙන්තෙ[3] කොණ්ඩඤ්ඤෙ ලොකනායකෙ
කොටිසතසහස්සානං පඨමාභිසමයො අහු.

5. තතො පරම්පි දෙසෙන්තෙ නරමරූනං සමාගමෙ
නවුතිකොටිසහස්සානං දුතියාභිසමයො අහු.

6. තිත්ථියෙ අභිමද්දන්තො යදා ධම්මමදෙසයි
අසීතිකොටිසහස්සානං ධම්මාභිසමයො[4] අහු.

7. සන්නිපාතා තයො ආසුං කොණ්ඩඤ්ඤස්ස මහෙසිනො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන තාදිනං.

8. කොටිසතසහස්සානං පඨමො ආසි සමාගමො
දුතියො කොටිසහස්සානං තතියො නවුතිකොටිනං.

9. අහං තෙන සමයෙන විජිතාවී නාම ඛත්තියො
සමුද්දං අන්තමන්තෙන[5] ඉස්සරියං[6] වත්තයාමහං.

10. කොටිසතසහස්සානං විමලානං මහෙසිනං
සහ ලොකග්ගනාථෙන පරමන්නෙන තප්පයිං.

---

1. ධරණූපමො සො– සීමු, සයා.
2. මෙරූපමො– මජසං, සයා
3. ධම්මචක්කප්පවත්තනෙ– මචි.
4. තතියාභිසමයො–මජසං, සයා
5. සමුද්ද අන්තමන්තෙන– සයා.
6. ඉස්සරං–සීමු.

## 2. කොණ්ඩඤ්ඤ බුද්ධවංශය

1. දීපඞ්කර සර්වඥයන් වහන්සේට මෑතභාගයෙහි අපරිමිත ලොක ධාතුයෙහි පතළ ශීලගුණතෙජස් ඇති අනන්ත වූ පරිවාර හා ගුණකීර්ති ඇති ගුණගණපරිමාණ විසින් අප්‍රමෙය වූ අනභිභවනීය වූ කොණ්ඩඤ්ඤ නම් සර්වඥයන් වහන්සේ පහළ වූ සේක.

2. ඒ බුදුහු ක්ෂාන්තියෙන් පෘථිවිය හා සම වූහ, ශීලසංවරයෙන් සාගරය හා සම වූහ. සමාධියෙන් මෙරුපර්වතය හා සමවූහ. (අනන්ත වූ) ඥනයෙන් ගගනූපම වූහ.

3. ඒ බුදුහු හැම කල්හි සියලු සත්නට හිත පිණිස ඉන්ද්‍රය බල බොධ්‍යඞ්ග මාර්ග සත්‍යප්‍රකාශක වූ (සත්තතිංස බොධිපක්ඛිය) ධර්මය ප්‍රකාශ කළහ.

4. කොණ්ඩඤ්ඤ නම් ලොකනායකයන් වහන්සේ දම්සක් පවත්වන කල්හි කෙළසියදහසක් සත්නට ධර්මාභිසමය වී,

5. එයින් අපරභාගයෙහි දු දෙව්මිනිසුන් ගේ (මහාමඞගල) සමාගමයෙහි අනූකෙළදහසක් සත්නට ද්විතීයධර්මාභිසමය විය.

6. යම් කලෙක (යමාමහපෙළහර පෑ) තීර්ථකයන් අභිමර්දනය කෙරෙමින් දහම් දෙසූ සේක් ද, (එකල්හි අසූකෙළදහසක් සත්නට (තුන්වැනි) ධර්මාභිසමය වී.

7. මහර්ෂි වූ කොණ්ඩඤ්ඤ සර්වඥයන් වහන්සේට විගතරාගාදි මල ඇති සන්හුන් සිත් ඇති ලාභාලාභාදියෙහි තාදී වූ ක්ෂීණාස්‍රවයන් සම්බන්ධි වූ ශ්‍රාවකසන්නිපාත තුනක් වූහ.

8. කෙළසියදහසක් රහතුන් ගේ ප්‍රථම සන්නිපාතය ද, කෙළදහසක්හු ගේ දෙවන සන්නිපාතය ද අනූකෙළක් රහතුන්ගේ තුන්වන සන්නිපාතය ද වී.

9. මම එසමයෙහි විජිතාවී නම් සක්විතිරජ වීමි. මම සක්වළගල හිමි කොට ඇති මහසයුර ඇතුළු කොට ආධිපත්‍යය පැවැත්වීමි.

10. ලොකාග්‍රනාථ වූ සර්වඥයන් වහන්සේ සමග මහර්ෂි වූ කෙළසියදහසක් රහතුන් වහන්සේ මධුර වූ ආහාරයෙන් සන්තර්පණය කෙළෙම්.

11. සො'පි මං බුද්ධො ව්‍යාකාසි කොණ්ඩඤ්ඤො ලොකනායකො
අපරිමෙය්‍යො ඉතො[1] කප්පෙ බුද්ධො ලොකෙ භවිස්සති.

12. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

13. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

14. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදාය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

15. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

16. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

17. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

18. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

19. චිත්තො ච හත්ථාළවකො අග්ගාහෙස්සන්තුපට්ඨකා
උත්තරා නන්දමාතා ච[2] අග්ගා හෙස්සන්තුපට්ඨිකා.
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

20. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

21. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

22. යදිමස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

1. අපරිමෙය්‍යතො- මජසං
2. නන්දමාතා ච උත්තරා-මජසං

11. ලොකනායක වූ ඒ කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ ද මෙයින් අපරිමෙය කල්පයෙහි (මේ තෙමේ) ලොවැ බුදු වන්නේ යයි මට විවරණ දුන් සේක.

12. එකල්හි තථාගත වූ මේ තෙම කපිල නම් මූ මනරම් නුවරින් නික්ම ප්‍රධන් වීර්‍ය්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට–

13. තථාගත වූ බෝසත් අජපල් නම් රුක්මුලැ හිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලා ගංතෙරට එළැඹෙන්නේ ය–

14. ඒ ජිතපඤ්ඤමාරයෝ නිල්දලා ගංතෙර හිඳ පායාසය වළඳා දෙවියන් සැරසූ උතුම් මඟින් බොධිමූලයට පැමිණෙන්නාහ.

15. ඉක්බිති අනුත්තර වූ බෝසත් බෝමැඩ පැදකුණු කොට මහායශස් ඇතියේ ඇසතු රුක්මුලැ හිඳ බුදුවන්නේ යැ.

16. මොවුන්ගේ ජනික මවු තොමෝ මායා නම් වන්නී ය, පිය තෙමේ සුද්ධොදන නම් වන්නේ ය. මේ තෙමේ ගෞතම නම් වන්නේ ය–

17. කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ, ආනන්ද නම් උපස්ථායක තෙමේ ඒ බුදුන්ට උපස්ථාන කරන්නේ ය–

18. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන අග්‍රශ්‍රාවිකාවෝ වන්නාහ, ඒ භාග්‍යවත්හු ගේ බොධිය අස්සත්ථ යයි කියනු ලැබෙ–

19. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අග්‍ර–උපස්ථායක වන්නාහ, උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අග්‍ර–උපස්ථායිකා වන්නාහ, ඒ ගෞතම යශස්වීන්ට හවුරුදු සියයක් ආයු වන්නේ යයි.

20. අසම වූ ඒ කොණ්ඩඤ්ඤ මහර්ෂීන්ගේ මෙ වදන් අසා දෙවමනුෂ්‍යයෝ මේ තෙමේ බුද්ධබීජාඞකුරයෙකැ’යි සතුටු වූවාහු.–

21. ඔල්වරසන් පැවැත්වූහ, අත්පොළසන් දුන්හ, සිනහසුනාහ. දසදහසක් සක්වළ දෙවියන් සහිත වූවාහු කළ ඇඳිලි ඇති ව නමස්කාර කළහ.

22. ඉදින් මේ ලොකනාථයන් වහන්සේගේ ශාසනය වරදමෝ නම්, අනාගතකාලයෙහි මොවුන් වහන්සේ හමු වන්නම්හ–

23. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

24. එවමෙව මයං සබ්බෙ යදි මුඤ්චාමිමං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං

25. තස්සාහං වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
තමෙව අත්ථං සාධෙන්තො මහාරජ්ජං ජිනෙ අදං
මහාරජ්ජං වජ්ජිත්වාන පබ්බජිං තස්ස සන්තිකෙ.

26. සුත්තන්තං විනයඤ්චා'පි නවඞ්ගං සත්ථුසාසනං
සබ්බං පරියාපුණිත්වාන සොභයිං ජිනසාසනං.

27. තත්ථප්පමත්තො විහරන්තො නිසජ්ජට්ඨානචඞ්කමෙ
අභිඤ්ඤාපාරමිං[1] ගන්ත්වා බ්‍රහ්මලොකමගච්ඡහං.

28. නගරං රම්මවතී නාම සුනන්දො නාම ඛත්තියො
සුජාතා නාම ජනිකා කොණ්ඩඤ්ඤස්ස මහෙසිනො.

29. දසවස්සසහස්සානි අගාරමජ්ඣ සො වසී
සුචි සුරුචි සුභො ච තයො පාසාදමුත්තමා[2]

30. තීණි සතසහස්සානි නාරියො සමලඞ්කතා
රුචිදෙවී නාම නාරී විජිතසෙනො නාම අත්‍රජො.

31. නිමිත්තෙ චතුරො දිස්වා රථයානෙන නික්ඛමි
අනූනදසමාසානි පධානං පදහී ජිනො.

32. බ්‍රහ්මුනා යාචිතො සන්තො කොණ්ඩඤ්ඤො දීපදුත්තමො[3]
වත්තී චක්කං මහාවීරො දෙවානං නගරුත්තමෙ.

33. භද්දො චෙව සුභද්දො ච අහෙසුං අග්ගසාවකා
අනුරුද්ධො නාමුපට්ඨාකො කොණ්ඩඤ්ඤස්ස මහෙසිනො.

1. අභිඤ්ඤාසු පාරමී–මචී.
2. පාසාදවරමුත්තමා–සීමු.
3. ද්විපදුත්තමො–මජයං

23. යම්සේ නදියක් තරණය කරන මනුෂ්‍යයෝ හමුයෙහි වූ තොට වැරදූ යට තොටෙහි ලා ගෙන මහානදිය තරණය කෙරෙත් ද–

24. එසෙයින් මැ ඇපි හැම දෙනමෝ මේ කොණ්ඩඤ්ඤ නම් බුදුන් හරණමෝ නම් අනාගතකාලයෙහි මොවුන් වහන්සේ හමු වන්නම්හ'යි.

25. මම ඒ බුදුන් ගේ බස් අසා අතිශයින් සිත පැහැදවීමි, එ මැ බුද්ධකාරකාභ්‍යය වූ දානපාරමිතාව සිද්ධ කරනුයෙම් (පුරනුයෙම්) සක්විති-රජය බුදුන් විෂයෙහි පිදුයෙමි. මහාරාජ්‍යය පරිත්‍යාග කොට ඔබ සමීප-යෙහි පැවිදි වීමි.

26. සූත්‍රාන්තපිටකය ද විනයපිටකය ද යළි සියලු නවාඞ්ග ශාස්තෘ-ශාසනය ද පුගුණ කොට (ලෞකික වූ ආගමාධිගමයෙන්) බුදුසසුන හොබැවීමි.

27. මම ඒ බුදුසස්නෙහි හිඳීම සිටීම සක්මනෙහි ස්මෘති–අවිප්‍රවාස-වැ වසනුයෙම පඤ්චාභිඥායෙහි පරතෙරට පැමිණ (පිළිසඳ විසින්) බඹ ලොවට ගියෙමි.

28. කොණ්ඩඤ්ඤ නම් මහර්ෂීන් ගේ නගරය රම්මවතී නම් විය. සුනන්ද නම් ක්ෂත්‍රිය තෙමේ පියා විය, මව් තොමෝ සුජාතා නම් වූ ය.

29. ඒ බුදුහු දසදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. (ඔබට) සුචි යැ සුරුචි යැ සුභ යැ යන උතුම් වූ තුන් ප්‍රාසාද කෙනෙක් වූහ.

30. මොනොවට සැරසුණු පරිවාරස්ත්‍රීහු තුන්ලක්ෂයක් වූහ, රුචිදෙවී නම අගබිසොවක් වූ ය, පුත්‍ර තෙමේ විජිතසෙන නම් වී,

31. සතර පෙරනිමිති දැක ඒ ජිතපඤ්චමාරයෝ රථයානයෙකින් අභිනිෂ්ක්‍රමණය කළහ, පිරිපුන් දසමසක් ප්‍රධන් වීර්‍ය්‍යය කළහ.

32. මහත් වූ වීර්‍ය්‍යය ඇති කොණ්ඩඤ්ඤ නම් සම්මාසම්බුදුහු මහබඹහු විසින් අයදනාලදහු දෙවියන්ගේ නගරවරයෙහි දී දම්සක් පැවැත්වූහ.

33. කොණ්ඩඤ්ඤ නම් බුදුනට භද්‍ර ද සුභද්‍ර ද යන අග්‍රශාවකයෝ වූහ. අනුරුද්ධ නම් (තෙර කෙනෙක්) උපස්ථායක වූහ.

34. තිස්සා ච උපතිස්සා ච අහෙසුං අග්ගසාවිකා
සාලකල්‍යාණිකො බොධි කොණ්ඩඤ්ඤස්ස මහෙසිනො.

35. සොණො ච උපසොණො ච අහෙසුං අග්ගුපට්ඨකා
නන්දා චෙව සිරිමා ච අහෙසුං අග්ගුපට්ඨිකා.

36. සො අට්ඨාසීති හත්ථානි අච්චුග්ගතො මහාමුනි
සොභති[1] උළුරාජාව සූරියො මජ්ඣන්තිකෙ[2] යථා.

37. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

38. ඛීණාසවෙහි විමලෙහි විචිත්තා ආසි මෙදිනී
යථාහි ගගනං උළූහි එවං සො උපසොභථ.

39. තෙපි නාගා අප්පමෙය්‍යා අසංඛොභා දුරාසදා
විජ්ජුපාතංව දස්සෙත්වා නිබ්බුතා තෙ මහායසා.

40. සා ච අතුලියා ජිනස්ස ඉද්ධිඤාණපරිභාවිතො ච සමාධි
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා'ති.

41. කොණ්ඩඤ්ඤප්පවරො බුද්ධො චන්දාරාමම්හි නිබ්බුතො
තත්ථෙව චෙතියො චිත්තො සත්තයොජනමුස්සිතො'ති.

**කොණ්ඩඤ්ඤබුද්ධවංසො දුතියො.**

1. සොභතෙ—මජසං.
2. මජ්ඣන්තිකෙ—මජස.

34. කොණ්ඩඤ්ඤ නම් බුදුනට තිස්සා ද උපතිස්සා ද යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. සල්කලණ නම් බොධිවෘක්ෂයෙක් වී යැ.

35. සොණ ද උපසොණ ද යන දෙදෙන අග්‍රොපස්ථායක වූහ. නන්ද ද සිරිමා ද යන දෙදෙන අග්‍ර උපස්ථායිකා වූහ.

36. අටඅසූරියනක් උස්වූ ඒ මහාමුනීහු චන්ද්‍රයා සෙයින් ද මධ්‍යාහ්නසමයෙහි සූර්‍ය්‍යයා සෙයින් ද හොබිති.

37. එකල්හි හවුරුදු ලක්ෂයක් ආයු පැවතෙයි. එතෙක් කල් වැඩසිටිමින් ඒ බුදුහු බොහෝ ජන සමූහයා (සසරසයුරින්) තරණය කළහ.

38. පෘථිවි තොමෝ පහවූ රාගාදි මල ඇති රහතුන් කරණකොට විචිත්‍ර වූ යැ. තාරකාවන්ගෙන් ගුවන්තලය යම්සේ හොබී නම් එසෙයින් උන් වහන්සේ ශොභමාන වූහ.

39. ගුණපමණ විසින් නො මිනිය හැකි ලෝදමින් නො කැළඹෙන ධෛර්‍ය්‍යමා විසින් අභිභවනය නො කට හැකි වූ මහායශස් ඇති ඒ ක්ෂීණාශ්‍රවයෝ ද විදුලිය හෙළිමක් මෙන් දක්වා පිරිනිවියාහ.

40. බුදුන්ගේ ඒ අතුල්‍ය වූ සෘද්ධිය ද ඥානයෙන් පරිභාවිත (වඩනාලද) වූ සමාධිය ද යන සියල්ල අතුරුදහන් විය. හැම සංස්කාරයෝ සිස් වූවාහු නො,

41. උත්තම වූ කොණ්ඩඤ්ඤ නම් බුදුහු චන්දරාමයෙහිදී පිරිනිවියහ. එහි මැ විසිතුරු සෑයෙක් සත් යොදුන් උස් කොට බඳවන ලද්දේ යි.

දෙවැනි වූ කොණ්ඩඤ්ඤ බුද්ධවංශ යි.

## 3. මඞ්ගල බුද්ධවංසො

1. කොණ්ඩඤ්ඤස්ස අපරෙන මඞ්ගලො නාම නායකො,
තමං ලොකෙ නිහන්ත්වාන, ධම්මුක්ක'මභිධාරයි.[1]

2. අතුලා'සි[2] පභා තස්ස, ජිනෙහ'ඤ්ඤෙහි උත්තරිං,
චන්ද සුරියප්පභං[3] හන්ත්වා දස සහස්සී විරොචති.[4]

3. සො'පි බුද්ධො පකාසෙසි, චතුරො සච්චවරුත්තමෙ[5]
තෙ තෙ සච්ච රසං පීත්වා, විනොදෙන්ති මහාතමං.

4. පත්වාන බොධි'මතුලං, පඨමෙ ධම්මදෙසනෙ,
කොටිසතසහස්සානං, පඨමා'භිසමයො[6] අහු.

5. සුරින්දදෙවභවනෙ බුද්ධො ධම්මමදෙසයි,[7]
නවකොටිසහස්සානං,[8] දුතියා'භිසමයො අහු.

6. යදා සුනන්දො චක්කවත්ති, සම්බුද්ධං උපසඞ්කමි,
තද අහනි සම්බුද්ධො, ධම්මභෙරිං වරුත්තමං.[9]

7. සුනන්දස්සා'නුචරා ජනතා, තද'සුං නවුතිකොටියො,
සබ්බෙ'පි තෙ නිරවසෙසා, අහෙසුං එහිභික්ඛුකා.

8. සන්නිපාතා තයො ආසුං, මඞ්ගලස්ස මහෙසිනො,
කොටිසත සහස්සානං, පඨමො ආසි සමාගමො.

9. දුතියො කොටිසහස්සානං, තතියො නවුතී කොටිනං,
ඛීණාසවානං විමලානං, තද ආසි සමාගමො.

---

1. ධම්මොක්කමභිධාරයී – බහුසු.
ධම්මොක්කං අභිධාරයි – සීමු.
2. අතුලාපි – සීමු.
3. චන්දසූරියපභං – මජසං.
4. විරොචයීති – සීමු.
5. චතුසච්ච වරුත්තමෙ – සීමු.
චත්තාරො සච්චවරුත්තමෙ – පු.
6. ධම්මාභිසමයො – මජසං.
7. ධම්මෙ අදෙසයි – මනුප, යද බුද්ධොපකාසයි –
8. තදකොටි සහස්සානං – මජසං මනුප,
9. වරුත්තමො මනුප.

# 3. මඞ්ගල බුද්ධවංශය

1. කොණ්ඩඤ්ඤ නම් සම්මාසම්බුදුනට මෑත භාගයෙහි මඞ්ගල නම් බුදුහු ලොව අවිදුඅඳුර නසා දහම් නැමති දඬුවැටපහන දැරූහ.

2. අන් බුදුවරුන් කෙරෙන් අධිකව ඒ මඞ්ගල බුදුන්ගේ අසදෘශ වූ ප්‍රභායෙක් විය. සඳහිරු කැලුම් නසා දසදහසක් සක්වළ බැබැළවී.

3. ඒ බුදුහු ද ඉතා උතුම් සතර සත්‍යයන් ප්‍රකාශ කළ සේක. දිව්‍යමනුෂ්‍යාදි ඒ ඒ සත්ත්වයෝ සත්‍යරසය පානය කොට අවිද්‍යාන්ධකාරය දුරු කෙරෙති.

4. අතුල වූ සම්බොධියට පැමිණ කළ ප්‍රථම ධර්මදෙශනායෙහි දී කෙළලක්ෂයක් සත්ත්වයනට ප්‍රථමාභිසමය වී යැ.

5. සර්වඥයන් වහන්සේ ශක්‍රභවනයෙහි දී දහම් දෙසූසේක. නවකෙළදහසක් ප්‍රාණීන්ට දෙවැනි වූ ධර්මාභිසමය වී යැ.

6. යම් කලෙක සුනන්ද නම් සක්විතිරජ සම්බුදුන් කරා එළැඹියේ ද එකල්හි සම්බුදු වූ භාග්‍යවතුන් වහන්සේ උතුම් වූ දහම්බෙරය පහළාහ.

7. එකල්හි සුනන්ද සක්විතිහට පරිවාරජනතාව අනූදහසක් විය. එ හැමදෙන නිරවශෙෂ වැ එහිභික්ෂූ වූහ.

8. මඞ්ගල සම්මාසම්බුදුනට ශ්‍රාවකසන්නිපාතයෝ තිදෙනෙක් වූහ. කෙළලක්ෂයක් ශ්‍රාවකයන්ගේ ප්‍රථම සන්නිපාතය විය.

9. ද්විතීය සන්නිපාතය කෙළදහසක් ශ්‍රාවකයන්ගේ ද තෘතීය සන්නිපාතය අනූකොටියක් ශ්‍රාවකයන්ගේ ද යි එකල්හි පහවූ රාගාදිමල ඇති රහතුන්ගේ සමාගමය වී යැ.

10. අහං තෙන සමයෙන සුරුචි නාම බ්‍රාහ්මණො,
අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදාන පාරගූ.

11. තමහං උපසඞ්කම්ම, සරණං ගන්ත්වාන සත්ථුනො,
සම්බුද්ධපමුඛං සඞ්ඝං ගන්ධමාලෙන පූජයිං
පූජෙත්වා ගන්ධමාලෙන ගවපානෙන තප්පයිං.

12. සො'පි මං බුද්ධො ව්‍යාකාසි මඞ්ගලො දිපදුත්තමො
අපරිමෙය්‍යො ඉතො[1] කප්පෙ අයං බුද්ධො භවිස්සති.

13. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.[2]

14. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

15. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

16. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

17. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

18. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

19. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො, අස්සත්ථො'ති පවුච්චති.

20. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස, ගොතමස්ස යසස්සිනො.

21. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

---

1. අපරිමෙය්‍යතො – මජසං
2. දුක්කරකාරියං – PTS

10. එසමයෙහි මම සුරුචි නම් බ්‍රාහ්මණ වැ මන්ත්‍ර හදාරවනුයෙම් මන්ත්‍ර ධරනුයෙම් ත්‍රිවේදයෙහි පාරප්‍රාප්ත වූයෙම් වීමි.

11. මම ඒ මඞ්ගල බුදුන් කරා එළැඹැ බුදුන් සරණ ගොස් බුදුපාමොක් මහසඟන ගඳින් මලින් පිදූයෙමි. ගඳින් මලින් පුද ගවපාන භොජනයෙන් සැතැපීමි.

12. ද්වීපදෝත්තම වූ ඒ මඞ්ගල බුදුහු ද මෙයින් අප්‍රමෙය වූ කල්පයෙහි මේ තෙම බුදු වන්නේ යයි මා ප්‍රකාශ කළහ.

13. එකල්හි තථාගත වූ මේ තෙම කපිල නම් වූ සිත්කලු පුරයෙන් නික්ම ප්‍රධන්වීය්‍යීය වඩා දුෂ්කරක්‍රියා කොට–

14. තථාගත තෙම අජපල් නම් රුක්මුල්හි හිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලා හෝතෙරට එළැඹෙයි.

15. ඒ ජිතපඤ්චමාර තෙම නිල්දලාහෝතෙර හිඳ කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තමමාර්ගයෙන් ඇසතු බෝරුක වෙත එළැඹෙයි.

16. ඉක්බිති ඒ අනුත්තර වූ බෝසත් බෝමැඩ පැදකුණු කොට මහායශස් ඇතියේ ඇසැතුරුක්මුල්හි හිඳ බුදුවන්නේ යැ.

17. මොවුන්ගේ ජනිකමව් තොමෝ මායා නම් වන්නී යැ ජනක පිය තෙමේ ශුද්ධොදන නම් වන්නේ යැ. මේ තෙමේ ගෞතම නම් වන්නේ යි.

18. කොලිත ද උපතිස්ස ද යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායකයෙක් ඒ ජිතපඤ්චමාරයනට උපස්ථාන කෙරෙයි.

19. ඛෙමා ද උප්පලවණ්ණා ද යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබේ.

20. චිත්ත යැ හත්ථාළවක යැ යන මොහු අග උවටු වෙති. උත්තරා යැ නන්දමාතා යැ යන මොහු අගඋවට වෙත්. යශස් ඇති ඒ ගෞතම බුදුනට හවුරුදු සියයෙක් ආයු වෙයි.

21. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා ‘මේ තෙම බුද්ධබීජාඞ්කුරයෙකැ’යි දෙව්මිනිස්සු සතුටු වූවාහු–

22. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති[1] හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

23. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

24. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති[2] මහානදිං.

25. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

26. තස්සා'පි වචනං සුත්වා භිය්යො චිත්තං පසාදයිං
උත්තරිං[2] වතමධිට්ඨාසිං දස පාරමි පූරියා.

27. තද පීති[3] මනුබ්‍රෑහන්තො සම්බොධිවර පත්තියා
බුද්ධෙ දත්වාන මං ගෙහං පබ්බජිං[4] තස්ස සන්තිකෙ.

28. සුත්තන්තං විනයඤ්චා'පි නවඞ්ගං සත්ථුසාසනං
සබ්බං පරියාපුණිත්වාන[5] සොභයිං[6] ජිනසාසනං.

29. තත්ථප්පමත්තො විහරන්තො බ්‍රහ්මං භාවෙත්ව[7] භාවනං
අභිඤ්ඤා පාරමිං ගන්ත්වා බ්‍රහ්මලොකමගච්ඡහං.[8]

30. නගරං උත්තරං නාම[9] උත්තරො නාම ඛත්තියො,
උත්තරා නාම ජනිකා මඞ්ගලස්ස මහෙසිනො.

31. නව වස්සසහස්සානි අගාර මජ්ඣ සො වසි
යසවා සුචිමා සිරිමා' තයො පාසාදමුත්තමා.

32. සමතිංස සහස්සානි' නාරියො සමලඞ්කතා
යසවතී නාම නාරී සීවලො නාම අත්‍රජො.

---

1. අප්පොතෙන්ති – මජසං.
2. උත්තරි – මනුප.
3. තදපි – මනුප.
4. පබ්බජි – මනුප.
5. පරියාපුණිත්වා – මජසං
6. සොභති – මනුප.
7. භාවෙත්වා – මනුප, මජසං.
8. බ්‍රහ්මලොක අගච්ඡිහං – මනුප.
9. උත්තරං නාම නගරං මජසං, මනුප.
10. වත්තමධිට්ඨාසිං – සයා.

22. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති. දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝවැසියෝ කළ ඇඳිලි ඇත්තාහු නමස්කාර කෙරෙත්.

23. ඉදින් මේ ලොකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගතකාලයෙහි මෙෑවුන් හමු වන්නම්හ.

24. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛතීර්ථය වැරදූ යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද—

25. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වම්හ යි.

26. මම ඒ බුදුන්ගේ බස් අසා අතිශයින් සිත පැහැදවීමි. දසපාරමීන් පූරන පිණිස මත්තෙහි ව්‍රතය (පාරමී) අධිෂ්ඨාන කෙළෙමි.

27. එකල්හි උතුම් වූ බුද්ධත්‍වයට පැමිණෙනු පිණිස ප්‍රීති වර්ධනය කෙරෙමින් මාගේ ගෘහය බුදුන් කෙරෙහි පුද උන් වහන්සේ වෙත පැවිදි වීමි.

28. සූත්‍රාන්තපිටකය ද විනයපිටකය ද යළි සියලු නවාඞ්ගශාස්තෘශාසනය ද ප්‍රගුණ කොට (ලෞකික වූ ආගමාධිගමයෙන) බුදුසඳුන හෙබැවීමි.

29. මම ඒ බුදුසසුන්හි අප්‍රමාද වැ වාසය කරන්නෙම් බ්‍රහ්මවිහාරභාවනා වඩා අභිඥාපාරයට ගොස් බඹලොවට ගියෙමි.

30. මඞ්ගල නම් මහර්ෂීන්ගේ නගරය උත්තර නම් විය උත්තර නම් ක්ෂත්‍රිය තෙමේ පියා විය, මව් තොමෝ උත්තරා නම් වූ යැ.

31. ඒ බුදුහු දසදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. (ඔබට) යසවත් යැ රුචිමත් යැ ශ්‍රීමත් යැ යි උතුම් වූ තුන් ප්‍රාසාද කෙනෙක් වූහ.

32. මොනොවට සැරසුණු පරිවාරස්ත්‍රීහු තිස් දහසක් වූහ. යසවතී නම් අගබිසෝවක් වූ යැ. පුත්‍ර තෙමේ සීවල නම් වී.

33. නිමිත්තෙ චතුරො දිස්වා අස්සයානෙන නික්ඛමි,
අනූනකං අට්ඨමාසං[1] පධානං පදහී ජිනො.

34. බ්‍රහ්මුනා යාචිතො සන්තො මඞ්ගලො ලොකනායකො[2]
වත්ති චක්කං මහාවීරො වනෙ සිරිවරුත්තමෙ.

35. සුදෙවො ධම්මසෙනො ච අහෙසුං අග්ගසාවකා,
පාලිතො නාමුපට්ඨාකො මඞ්ගලස්ස මහෙසිනො.

36. සීවලා[3] ච අසොකා ච අහෙසුං අග්ගසාවිකා,
බොධි තස්ස භගවතො නාගරුක්ඛොති වුච්චති.

37. නන්දො චෙව විසාඛො[4] ච අහෙසුං අග්ගු'පට්ඨකා,
අනුලා චෙව සුතනා ච අහෙසුං අග්ගු'පට්ඨිකා.

38. අට්ඨාසීති රතනානි අච්චුග්ගතො මහාමුනී,
තතො නිද්ධාවතී[5] රංසී අනෙකසතසහස්සියො.

39. නවුතිවස්සසහස්සානි[6] ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

40. යථා'පි සාගරෙ ඌමී න සක්කා තා ගණෙතුයෙ,
තථෙ'ව සාවකා තස්ස න සක්කා තෙ ගණෙතුයෙ.

41. යාව අට්ඨාසි[7] සම්බුද්ධො මඞ්ගලො ලොකනායකො,
න තස්ස සාසනෙ අත්ථි සංකිලෙස[8] මරණං තදා.

42. ධම්මුක්කං[9] ධාරයිත්වාන සන්තාරෙත්වා මහාජනං,
ජලිත්වා[10] ධූමකෙතුව නිබ්බුතො සො මහායසො.[11]

43. සඞ්ඛාරානං සභාවත්තං දස්සයිත්වා සදෙවකෙ,
ජලිත්වා අග්ගික්ඛන්ධො'ව සූරියො අත්ථංගතො යථා.

44. උය්‍යානෙ වෙස්සරෙ[12] නාම බුද්ධො නිබ්බායි මඞ්ගලො,
තත්ථෙ'ව තස්ස ජිනථූපො තිංසයොජනමුග්ගතො'ති.

මඞ්ගල බුද්ධවංසො තතියො.

1. අනූනකට්ඨමාසානි – මනුප.
අනූන අට්ඨමාසානි – මජසං, ස්‍යා.
2. මඞ්ගලො නාම නායකො – ම, මජසං.
3. සීලා – මනුප.
4. විසාඛා – මනුප.
5. නිධාවතී – මවි.
6. නවුතිවස්සසතසහස්සානි – මනුප.
7. යාවදට්ඨාසි – සීමු.
8. සකිලෙස – මජසං.
9. ධම්මොක්කං – මජසං, ස්‍යා, සීමු.
10. ජාලෙත්වා – සීමු.
11. සසාවකො – සීමු.
12. වස්සතරා – ම, යෙවතනා–වැමු.
යෙවතනො – මනුප.

33. සතර පෙරනිමිති දැක ඒ ජිතපක්‍ෂමාරයෝ අශ්වයානයෙකින් අභිනිෂ්ක්‍රමණය කළහ. පිරිපුන් අටමසක් ප්‍රධානවීර්‍ය්‍ය කළහ.

34. මහත් වූ වීර්‍ය්‍ය ඇති මඞ්ගල නම් සම්මාසම්බුදුහු මහබඹහු විසින් අයදනා ලදහු උතුම් වූ ශ්‍රීවනයෙහි දී දම්සක් පැවැත්වූහ.

35. මහර්ෂිවූ මඞ්ගල නම් බුදුන්ට සුදෙව යැ ධම්සෙන යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වූහ. පාලිත නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ.

36. සීවලා යැ අශොකා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වූහ. ඒ භාග්‍ය-වතුන් ගේ බොධිය නාගවෘක්ෂයෙකැ'යි කියනු ලැබේ.

37. නන්ද යැ විශාඛ යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වූහ. අනුලා යැ සුතනා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වූහ.

38. ඒ මහාමුනිහු අටඅසූරියනක් උස් වූහ. ඒ බුදුන් කෙරෙන් නොයෙක් සුවහස් ගණන් රශ්මීහු නික්මෙත්.

39. එකල්හි අනූදහසක් හවුරුදු ආයු පැනෙයි ඒ තාක් කල් සිටිමින් ඒ බුදුහු බොහෝ ජනසමූහය (සසරින්) තරණය කළහ.

40. යම්සේ සාගරයෙහි තරඞ්ගයෝ ගණනට නො හැක්කාහු ද එසෙයින් මැ උන්වහන්සේ ගේ ශ්‍රාවකයෝ ගණනට නො හැක්කාහ.

41. ලොකනායක වූ මඞ්ගල නම් සම්මා සම්බුදුහු යම්තාක් සිටියාහු ද එකල්හි ඔබගේ සස්නෙහි සංක්ලෙශමරණයෙක් නැති.

42. මහායශස් ඇති ඒ සම්මා සම්බුදුහු දහම් නැමැති ද්‍රවැටපහන ධරා මහදනා සසරින් තරණය කරවා දුම්කෙහෙල්ලක් සෙයින් දිලියී පිරිනිවියහ.

43. සංස්කාරයන්ගේ ස්වභාවය දෙවියන් සහිත ලෝවැසියාට දක්වා ගිනිකඳක් සෙයින් දිලියී අස්තඞ්ගතසූර්‍ය්‍යයා සෙයින්-

44. වෙස්සර නම් උයන්හි දී මඞ්ගල බුදුහු පිරිනිවියහ. එහි මැ (බදවනලැ) ඒ බුදුන්ගේ ස්තූපය තිස් යොදුනක් උස් වූයේ යි.

**තුන්වැනි වූ මඞ්ගල බුද්ධවංශ යි.**

## 4. සුමන බුද්ධවංසො

1. මඞ්ගලස්ස අපරෙන සුමනො නාම නායකො
සබ්බධම්මෙහි අසමො සබ්බසත්තාන' මුත්තමො.

2. සො'පි තද අමතභෙරිං[1] ආහනී[2] මෙඛලෙ දූරෙ,
ධම්මසඞ්ඛසමායුත්තං නවඞ්ග ජිනසාසනං.

3. නිජ්ජිනිත්වා[3] කිලෙසෙ සො[4] පත්වා සම්බොධි'මුත්තමං
මාපෙසි නගරං සත්ථා[5] සද්ධම්මපුරවරුත්තමං.[6]

4. නිරන්තරං අකුටිලං උජුං[7] විපුල විත්ථතං
මාපෙසි සො මහාවීථිං සතිපට්ඨානවරුත්තමං.

5. ඵලෙ චත්තාරි සාමඤ්ඤෙ චතස්සො පටිසම්භිද
ඡළභිඤ්ඤට්ඨ සමාපත්ති පසාරෙසි තත්ථ වීථියං.

6. යෙ අප්පමත්තා අඛිලා හිරි විරියෙහු'පාගතා
තෙ තෙ ඉමෙ ගුණවරෙ ආදියන්ති යථා සුඛං.

7. එවමෙතෙන යොගෙන උද්ධරන්තො මහාජනං
බොධෙසි පඨමං සත්ථා කොටිසතසහස්සියො.

8. යම්හි කාලෙ මහාවීරො ඔවදී[8] තිත්ථියෙ ගණෙ
කොටි සහස්සාභිසමිංසු[9] දුතියෙ ධම්මදෙසනෙ.

9. යද දෙවා මනුස්සා ච සමග්ගා එකමානසා
නිරොධ පඤ්හං පුච්ඡිංසු සංසයඤ්චා'පි මානසං.[10]

10. තදා'පි ධම්මදෙසනෙ[11] නිරොධ පරිදීපනෙ[12]
නවුති කොටි සහස්සානං තතියා'භිසමයො[13] අහු.

---

1. තදඅමතභෙරිං සො–මජසං
2. ආහනි– මජසං ආහරි ඊනුප,
3. නිජ්ජිනිත්වා -මනුප, විජිනිත්වා –සීමු,
ජිනිත්වාන – PTS.
4. කිලෙසෙහි –පු.
5. තත්ථ –සීමු.
6. ධම්මපුරවරුත්තමෙ –සීමු.
7. උව –ඊනුප, ම, PTS.
8. ඔවදති –සීමු.
9. කොටිසතසහස්සානං අභිසමිංසු – ඊනුප.
10. මානසො –මවි.
1 . ධම්මං දෙසෙන්තෙ –මවි.
12. පරිදීපනං –මවි.
13. ධම්මාභිසමයො –මවි

# 4. සුමන බුද්ධවංශය

1. මඞ්ගල නම් සම්මාසම්බුදුන්ට මැතභාගයෙහි (ශීලාදි) සියලු දහම්හි අසම වූ හැම සත්නට උතුම් වූ සුමන නම් බුදුහු (ලොව පහළ වූහ.)

2. එකල්හි ඒ සම්මාසම්බුදුහු ද මෙඛල නම් පුරයෙහි දී සිව්සස් දහම් නැමැති සක් හඬින් යුත් නවාඞ්ගශාස්තෘශාසන සඞ්ඛ්‍යාත අමා බෙරය පහළහ.

3. ඒ සුමන බුදුහු කෙලෙසුන් දිනා උතුම් වූ සම්බොධියට පැමිණ පුරවරයන් කෙරෙහි උත්තම වූ සද්ධර්ම සඞ්ඛ්‍යාත නිර්වාණ නගරය මැවූ සේක.

4. ඒ බුදුහු (කුශලජවනයාගේ සංවරණයට අනතුරු වැ උපදනාහෙයින්) නිරතුරු වූ කුටිලභාවකර දෙෂයන්ගේ විරහයෙන් අකුටිල වූ අකුටිල හෙයින් මැ ඍජු වූ අයම් විතරින් (ලෞකික ලොකොත්තර සතිපට්ඨාන වශයෙන්) දිගුපුළුල් වූ සතිපට්ඨාන සඞ්ඛ්‍යාත උතුම් වූ මහාවීථිය මැවූසේක.

5. ඒ සතිපට්ඨානවීථියෙහි සතර ශ්‍රාමණ්‍යඵල යැ සතර ප්‍රතිසංවිද්ධර්ම යැ ෂඩභිඥ යැ අෂ්ටසමාපත්ති යැ යන මේ දහම් නමැති රුවන් අවුණු විදෑහුසේක.

6. යම් කෙනෙක් අප්‍රමත්ත වූවාහු පඤ්ච චෙතොඛිල රහිත වූවාහු ලජ්ජා වීර්‍ය්‍ය දෙකින් යුක්ත වූවාහු වෙත් ද ඔවුහු යථොක්ත වූ ඒ උතුම් ගුණරුවන් සිත් සේ ලබන්නාහ.

7. මෙසේ ඒ ශාස්තෲන් වහන්සේ මේ ක්‍රමයෙන් මහාජනයා නඟාසිටු-වනසේක් පළමු කොට (ප්‍රථමාභිසමයෙහි) කෙළසියදහසක් සත්ත්වයන් ධර්මාවබොධය කරවූ සේක.

8. මහාවීර වූ සුමන බුදුහු යම් කලෙක තීර්ථකගණයාහට අවවාද කළසේක් ද ඒ දෙවන ධර්මදෙශනයෙහි කෙළදහසක් ප්‍රාණීහු ධර්මාභිසමය කළාහු යැ.

9. යම් කලෙක දෙවියෝ ද මනුෂ්‍යයෝ ද සමග්‍ර වැ එක්සිත් වූවාහු නිරොධ ප්‍රශ්නයත් සිත්හි උපන් සැකයත් විචාළාහු ද–

10. එකල්හිදු නිරොධය ප්‍රකාශ කරන්නා වූ දහම් දෙසුමෙහි නවකෙළදහසක් සත්නට ධර්මාභිසමය වී.

11. සන්නිපාතා තයො ආසුං සුමනස්ස මහෙසිනො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන තාදිනං.

12. වස්සං වුත්ථස්ස භගවතො අභිඝුට්ඨෙ[1] පවාරණෙ
කොටිසතසහස්සෙහි පවාරෙසි තථාගතො.

13. තතො පරං සන්නිපාතෙ විමලෙ කඤ්චනපබ්බතෙ
නවුතිකොටිසහස්සානං දුතියො ආසි සමාගමො.

14. යද සක්කො දෙවරාජා බුද්ධදස්සනු'පාගමි
අසීතිකොටිසහස්සානං තතියො ආසි සමාගමො.

15. අහං තෙන සමයෙන නාගරාජා මහිද්ධිකො
අතුලො නාම නාමෙන උස්සන්නකුසලසඤ්චයො.[2]

16. තදා'හං නාගභවනා නික්ඛමිත්වා සඤාතිභි
නාගානං දිබ්බතුරියෙහි සසඞ්ඝං ජිනමුපට්ඨහිං.

17. කොටිසතසහස්සානං අන්නපානෙන තප්පයිං[3]
පච්චෙකං[4] දුස්සයුගං දත්වා සරණං තං උපාගමිං.

18. සොපි මං බුද්ධො ව්‍යාකාසි සුමනො ලොකනායකො
අපරිමෙය්‍යිතො කප්පෙ අයං බුද්ධො භවිස්සති.

19. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

20. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජර මුපෙහිති.

21. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

22. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථ රුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

---

1. අභිසංඝුට්ඨෙ -සයා.
2. උස්සන්නකුසලපච්චයො -සීමු. උප්පන්නකුසල සඤ්චයො සයා,
3. තප්පයි -ධසු, වැමු.
4. සචෙචක- මුඅ, PTS.

11. මහර්ෂි වූ සුමන සර්වඥයන් වහන්සේට විගත රාගාදි මල ඇති සන්හුන් සිත් ඇති ලාභාලාභාදීන්හි තාදී වූ ක්ෂීණාශ්‍රවයන් සම්බන්ධි වූ ශ්‍රාවකසන්නිපාත දෙනක් වූහ.

12. වස් වැස නිම වූ භාග්‍යවතුන් විසින් පවාරණය ඇල්වූ කල්හි තථාගතයන් වහන්සේ කෙළසුවහසක් ශ්‍රාවකයන් හා සමග පවාරණය කළසේක.

13. එයින් මත්තෙහි භාගයෙහි නිර්මල වූ කාඤ්චනපර්වතයෙහි අනූකෙළ-දහසක් ශ්‍රාවකයන්ගේ දෙවැනි සමාගමය වී යැ.

14. යම් කලෙක සක්දෙව්රජ බුදුන් දක්මට පැමිණියේ ද එකල්හි අසූ කෙළදහසක් ශ්‍රාවකයන්ගේ තුන් වැනි සමාගමය වී යැ,

15. එසමයෙහි මම උත්සන්න වූ කුශල සඤ්චය ඇතියෙම් නමින් අතුල නම් වූ මහත් සෘද්ධි ඇති නාගරාජ වීමි.

16. එකල්හි සිය නෑයන් හා සමග නාග භවනයෙන් නික්ම නාගයන්-ගේ දිව්‍යතූර්යයෙන් යුතු වැ සඟුන් සහිත ජිනපඤ්ඤමාරයන්ට උපස්ථාන කෙළෙමි.

17. කෙළසුවහසක් භික්ෂූන් ආහාරපානයෙන් සැතැපීමි. වෙන වෙන වස්ත්‍රයුගළක් දුද උන් වහන්සේ සරණ කොට පැමිණියෙමි.

18. ඒ සුමන නම් සර්වඥයන් වහන්සේ ද මෙයින් අප්‍රමෙය වූ කල්ප-යෙහි මේ තෙමේ බුදු වන්නේ යයි මා ප්‍රකාශ කළසේක.

19. එකල්හි තථාගත වූ මේ තෙමේ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්යය වඩා දුෂ්කරක්‍රියා කොට–

20. තථාගත තෙම අජපල් නම් නුගරුක්මුල්හි හිද එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලා හෝතෙරට එළැඹෙයි.

21. ඒ ජිනපඤ්ඤමාර තෙම නිල්දලා හෝතෙර හිද කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තමමාර්ගයෙන් ඇසැතු බෝරුක වෙත එළැඹෙයි.

22. ඉක්බිති ඒ අනුත්තර වූ බෝසත් බෝමැඩ පැදකුණු කොට මහායශස් ඇතියේ ඇසැතු රුක්මුල්හි හිද බුදු වන්නේ යැ.

23. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

24. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමු'පට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

25. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

26. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු' පට්ඨිකා
ආයු වස්ස සතං තස්ස ගොතමස්ස යසස්සිනො.

27. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධ බීජඞ්කුරො අයං.

28. උක්කුට්ඨි සද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දස සහස්සී සදෙවකා.

29. යදි'මස්ස ලොක නාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

30. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

31. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

32. තස්සා'පි වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දසපාරමි පූරියා.

33. මෙඛලං නාම[1] නගරං සුදත්තො නාම ඛත්තියො
සිරිමා නාම ජනිකා සුමනස්ස මහෙසිනො.

34. නව වස්ස සහස්සානි අගාරමජ්ඣ සො වසි[2]
චන්දො සුචන්දො වටංසො ච තයො පාසාදමුත්තමා.

1. නගරං මෙඛලං නාම –මජසං.
2. අගාරං අජ්ඣ සො වසි –මජසං.

23. මොවුන්ගේ ජනික මව් තොමෝ මායා නම් වන්නී යැ ජනක පිය තෙමේ ශුද්ධෝදන නම් වන්නේ යැ, මේ තෙමේ ගෞතම නම් වන්නේ යි.

24. කොලිත ද උපතිස්ස ද යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායකයෙක් ඒ ජිනපඤ්චමාරයනට උපස්ථාන කෙරෙයි.

25. ඛේමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බෝධිය ඇසැතු යැ යි කියනුලැබේ.

26. චිත්ත යැ හත්ථාළවක යැ යන මොහු අග උවටු වෙති. උත්තරා යැ නන්දමාතා යැ යන මොහු අග උවට වෙත්. යශස් ඇති ඒ ගෞතම බුදුනට හවුරුදු සියයෙක් ආයු වෙයි.

27. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා 'මේ තෙම බුද්ධාඞ්කුරයෙකැ' යි දෙව්මිනිස්සු සතුටු වූවාහු.

28. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝවැස්සෝ කළ ඇඳිලි ඇත්තාහු නමස්කාර කෙරෙත්.

29. ඉදින් මේ ලොකනාථයන් ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

30. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරනාහු ප්‍රතිමුඛ තීර්ථය වැරැදූ යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද—

31. එසෙයින් මැ අපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ යි.

32. මම් ඒ බුදුනුදුගේ බස් අසා බෙහෙවින් සිත පැහැදූවීමි. දසපාරමීන් පුරන පිණිස මත්තෙහි ව්‍රතය අධිෂ්ඨාන කෙළෙම්.

33. සුමන මහර්ෂීන් ගේ නගරය මෙඛල නම් විය, සුදත්ත නම් ක්ෂත්‍රිය තෙම පියා විය, මව් තොමෝ සිරිමා නම් වූ යැ.

34. ඒ බුදුහු නවදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. (ඔබට) චන්ද්‍ර යැ සුචන්ද්‍ර යැ වටංස යැ යි උතුම් වූ තුන් ප්‍රාසාද කෙනෙක් වූහ.

35. තෙ සට්ඨිසහස්සානි[1] නාරියො සමලඞ්කතා,
වටංසිකා[2] නාම නාරී අනූපමො නාම අත්‍රජො.

36. නිමිත්තෙ චතුරො දිස්වා හත්ථියානෙන නික්ඛමි
අනූනදසමාසානි පධානං පදහී ජිනො.

37. බ්‍රහ්මුනා යාචිතො සන්තො සුමනො ලොකනායකො
වත්ති චක්කං මහාවීරො මෙඛලෙ පුරමුත්තමෙ.[3]

38. සරණො භාවිතත්තො ච අහෙසුං අග්ගසාවකා
උදෙනො නාමු'පට්ඨාකො සුමනස්ස මහෙසිනො.

39. සොණා ච උපසොණා ච අහෙසුං අග්ගසාවිකා
සො'පි බුද්ධො අමිතයසො නාගමූලෙ අබුජ්ඣථ.

40. වරුණො ච සරණො ච අහෙසුං අග්ගු'පට්ඨකා
චාලා ච උපචාලා ච අහෙසුං අග්ගුපට්ඨිකා.

41. උච්චත්තනෙන[4] සො බුද්ධො නවුතිහත්ථසමුග්ගතො
කඤ්චනග්ඝිය සංකාසො දස සහස්සී විරොචති.[5]

42. නවුති වස්ස සහස්සානි ආයුවිජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

43. තාරණීයෙ තාරයිත්වා බොධනීයෙ ච බොධයී
පරිනිබ්බායි සම්බුද්ධො උළුරාජා'ව අත්ථමි.[6]

44. තෙ'පි ඛීණාසවා භික්ඛූ සො ච බුද්ධො අසාදිසො
අතුලං පභං දස්සයිත්වා නිබ්බුතා තෙ මහායසා.

45. තඤ්ච ඤාණං අතුලියං තානි චා'තුලියානි රතනානි
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා.

46. සුමනො යසධරො බුද්ධො අඞ්ගාරාමම්හි නිබ්බුතො
තත්ථෙ'ව තස්ස ජිනථූපො චතුයොජන මුග්ගතො'ති.

**සුමන බුද්ධවංසො චතුත්ථො.**

1. තෙසට්ඨිසත සහස්සානි - මජසං
2. වටංසකී - සීමු, ස්‍යා, වටංසකා - මචි, චලංසිකී - PTS
3. පුරවරුත්තමෙ - සීමු, මචි, ස්‍යා.
4. උච්චතරෙන - සීමු.
5. විරොචථ - සීමු.
6. අවඨවි - සීමු.

35. මොනොවට සැරසුණු පරිවාර ස්ත්‍රීහු තෙසැටදහසක් වූහ. වටංසිකා නම් අගමෙහෙසියක් වූ යැ. පුත්‍ර තෙම අනුපම නම් වී.

36. ඒ ජිනපඞ්ගමාරයෝ සතර පෙරනිමිති දැක ඇත්යානයෙකින් අභිනිෂ්ක්‍රමණය කළහ. පිරිපුන් දසමසක් ප්‍රධන්වීර්‍ය්‍ය කළහ.

37. මහත් වූ වීර්‍ය්‍යය ඇති සුමන නම් සම්මාසම්බුදුහු මහබඹහු විසින් අයදනා ලදුහු උතුම් වූ මෙබල නම් පුරයෙහි දී දම්සක් පැවැත්වූහ.

38. සුමන මහර්ෂීනට සරණ යැ භාවිතාත්ම යැ යන දෙදෙන අග්‍ර ශ්‍රාවක වූහ. උදෙන නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ.

39. සොණා යැ උපසොණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වූහ. අප්‍රමාණ වූ යශස් ඇති ඒ බුදුහුද නාගවෘක්ෂමූලයෙහි බුද්ධත්‍වයට පැමිණියහ.

40. වරුණ යැ සරණ යැ යන දෙදෙන අග උවටු වූහ. චාලා යැ උපචාලා යැ යන දෙදෙන අග උවට වූහ.

41. උසින් ඒ බුදුහු අනූ රියනක් උස් වූවාහු රන් ඇගෑයක් සෙයින් දසදහසක් සක්වළ බැබැළූහ.

42. එකල්හි අනූදහසක් හවුරුදු ආයු පැනෙයි. උන් වහන්සේ ඒතාක් කල් වොරදමින් බොහෝ ජනසමූහයා (සසරින්) තැරැවූහ.

43. තරවනු තිසියන් තරණය කරවා බොධනීයයනට ධර්මාවබොධ කළහ. සම්බුදුහු අස්තයට ගිය චන්ද්‍රයා සෙයින් පිරිනිවියහ.

44. මහායශස් ඇති ඒ ක්ෂීණාශ්‍රව භික්ෂුහු ද අසදෘශ වූ ඒ බුදුහු ද අප්‍රමාණ වූ ප්‍රභා දක්වා පිරිනිවියහ.

45. ඒ ඥානය ද අතුල්‍ය වී යැ ඒ රත්නයෝ ද අතුල්‍ය වූහ. එහැම අතුරුදහන් වී. හැම සංස්කාරයෝ රික්තයෝ නු?

46. යශස්ධර වූ සුමන බුදුහු අඞ්ගාරාමයෙහි පිරිනිවියහ. එහි මැ උන් වහන්සේගේ ජිනථූපය සිව්යොදුනක් උස් කොට බඳනා ලද යයි.

**සතරවැනි සුමන බුදධවංශ යි.**

## 5. රෙවත බුද්ධවංසො

1. සුමනස්ස අපරෙන රෙවතො නාම නායකො
අනුපමො අසදිසො අතුලො උත්තමො ජිනො.

2. සො'පි ධම්මං පකාසෙසි බ්‍රහ්මුනා අභියාචිතො
ඛන්ධධාතුවවත්ථානං අප්පවත්තං භවා'භවෙ.

3. තස්සා'භිසමයා තීණි අහෙසුං ධම්මදෙසනෙ
ගණනාය න වත්තබ්බො පඨමා'භිසමයො අහු.

4. යදා අරින්දමං රාජං විනෙසි රෙවතො මුනි
තදා කොටිසහස්සානං[1] දුතියා'භිසමයො අහු.

5. සත්තා'හං පටිසල්ලානා වුට්ඨහිත්වා නරාසභො
කොටිසතං නරමරූනං[2] විනෙසි උත්තමෙ ඵලෙ.

6. සන්නිපාතා තයො ආසුං රෙවතස්ස මහෙසිනො
ඛීණාසවානං විමලානං සුවිමුත්තාන' තාදිනං.[3]

7. අතික්කන්තා ගණනපථං[4] පඨමං යෙ සමාගතා
කොටිසතසහස්සානං දුතියො ආසි සමාගමො.

8. යො'පි[5] පඤ්ඤාය අසමො තස්ස චක්කානුවත්තකො
සො තදා ව්‍යාධිතො ආසි පත්තො ජීවිතසංසයං.

9. තස්ස ගිලානපුච්ඡාය[6] යෙ තදා උපගතා මුනි
කොටිසතසහස්සා[7] අරහන්තා තතියො ආසි සමාගමො.

10. අහං තෙන සමයෙන අතිදෙවො නාම බ්‍රාහ්මණො
උපගන්ත්වා රෙවතං බුද්ධං සරණං තස්ස ගච්ඡහං.

11. තස්ස සීලං සමාධිඤ්ච පඤ්ඤාගුණමනුත්තමං[8]
ථොමයිත්වා යථාථාමං උත්තරීය'මදස'හං.

12. සො'පි මං බුද්ධො ව්‍යාකාසි රෙවතො ලොකනායකො
අපරිමෙය්‍යො ඉතො කප්පෙ අයං බුද්ධො[9] භවිස්සති.

---

1. කොටිසතසහස්සානං – සීමු.
2. නරවරා. –මජසං.
3. සුවිමුත්තානං තාදිනං –බසු, සීමු, PTS.
4. අතික්කන්තගණපථා –බය, මැමු, PTS.
5. යොසො –මජසං, මැමු, PTS.
6. ගිලානි –මවි.
7. කොටිසහස්සා –මජස, කොටිසතසහස්සානං – සයා
8. ගුණවරුත්තමං – සීමු.
9. සම්බුද්ධො – සීමු.

# 5. රේවත බුද්ධවංශය

1. සුමන නම් බුදුරදුන්ට මෑත භාගයෙහි ලොවට නායක වූ අනුපම වූ අසදෘශ වූ අතුල්‍ය වූ උත්තම වූ රේවත නම් ජිතපඤ්චමාර වූ සර්වඥ කෙනෙක් පහළ වූහ.

2. ඔබ ද මහ බඹුහු විසින් අයදනා ලදහු ස්කන්ධධාතූන් විභාග කරන (වෘද්ධි හානි ආදි) භවාභවයන් ප්‍රහාණය කරන දහම් ප්‍රකාශ කළහ.

3. උන් වහන්සේගේ දහම් දෙසුම්හි තුන් අභිසමය කෙනෙක් වූහ. ප්‍රථමාභිසමය ගණනින් නො කියයුතු වෙයි.

4. යම් කලෙක රේවත මුනිහු අරින්දම නම් රජ විනයනය කළාහු ද එකල්හි කෙළ දහසක් ප්‍රාණීන්ට ද්විතීයාභිසමය වී.

5. නරශ්‍රෙෂ්ඨ වූ බුදුහු සතියක් මුළුල්ලෙහි සමවත් සුවයෙන් වැඩ සිට ඉන් නැගී දෙව්මිනිසුන් කෙළසියක් අග්‍රඵලයෙහි විනයනය කළහ.

6. මහර්ෂි වූ රේවත නම් බුදුන්ට විගත වූ රාගාදි මල ඇති මොනොවට කෙලෙසුන් කෙරෙන් මිදුණු ලාභාලාභාදියෙහි තාදී වූ ක්ෂීණාස්‍රවයන් සම්බන්ධි වූ ශ්‍රාවකසන්නිපාත තුනෙක් වී.

7. යම් කෙනෙක් පළමු වට රැස්වූහු නම් ඔහු ගණනපථය ඉක්මගියාහ. කෙළ සුවදහසක් ශ්‍රාවකයන්ගේ ද්විතීය සමාගමය වී.

8. ඒ රේවත බුදුරදුන්ට අනුව දම්සක් පවත්වන්නා වූ ප්‍රඥයෙන් (ශ්‍රාවකාන්තරයන් හා) අසම වූ යම් වරුණ නම් අගසවු කෙනෙක් වූහු ද එකල්හි උන් වහන්සේ රොගී වූවාහු ජීවිත සංශයට පැමිණියාහූ වූහ.

9. එකල්හි උන් වහන්සේගේ ගිලන් බව පුළුවුස්නට යම් මුනි කෙනෙක් එළැඹියාහු ද ඒ කෙළසුවහස් රහතුන්ගේ තුන් වැනි සමාගමය වී.

10. එසමයෙහි මම් අතිදෙව නම් බ්‍රාහ්මණ වූයෙම් රේවත නම් බුදුන් කරා එළැඹ උන් වහන්සේ ගේ සරණයට ගියෙමි.

11. මම් උන් වහන්සේගේ නිරුත්තර වූ ශීලය ද සමාධිය ද ප්‍රඥගුණය ද යථාශක්තීන් ප්‍රෝමනය කොට උතුරුසළුව පිදීමි.

12. ලොකනායක වූ ඒ රේවත බුදුහු ද 'මේ තෙමේ මෙයින් අප්‍රමෙය කල්පයෙහි බුදු වන්නේ යයි මා ප්‍රකාශ කළසේක.

13. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

14. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

15. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

16. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

17. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

18. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමු’ පට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

19. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො’ති පවුච්චති.

20. චිත්තො ච හත්ථාලවකො අග්ගා හෙස්සන්තු’ පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු’ පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

21. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

22. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලි නමස්සන්ති දසසහස්සී සදෙවකා.

23. යදි’මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

24. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

25. එව’මෙව මයං සබ්බෙ යදි මුඤ්චාම’මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

13. එකල්හි තථාගත වූ මේ තෙම කපිල නම් වූ සිත්කලු පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට –

14. තථාගත තෙම අජපල් නම් රුක්මුල්හි හිඳ එහි දී කිරිපිඬු පිළිගෙන නිල්දලා හෝ තෙරට එළැඹෙයි.

15. ඒ ජිනපණ්ඩුමාර තෙම නිල්දලා හෝතෙර හිඳ කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තමමාර්ගයෙන් ඇසැතු බෝරුක වෙත එළැඹෙයි.

16. ඉක්බිති ඒ අනුත්තර වූ බෝසත් බෝමැඩ පැදකුණු කොට මහායශස් ඇතියේ ඇසැතු රුක්මුල්හි හිඳ බුදුවන්නේ යි.

17. මොවුන්ගේ ජනික මව් තොමෝ මායා නම් වන්නී යැ. පිය තෙමේ ශුද්ධෝදන නම. මේ තෙමේ ගෞතම නම් වන්නේ යි.

18. කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අගසවු වන්නාහ. ආනන්ද නම් උපස්ථායක තෙර කෙනෙක් ඒ ජිනපණ්ඩුමාර බුදුන්ට උපස්ථාන කරන්නාහ.

19. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබේ.

20. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අග උවටු වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අග උවට වන්නාහ. යශස්වී වූ ඒ ගෞතම බුදුන්ට හවුරුදු සියයෙක් ආයු වන්නේ යි.

21. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා දෙව්මිනිස්සු 'මේ බුද්ධ-බීජාඞ්කුරයෙකැ'යි සතුටු වූවාහු-

22. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති. දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝවැස්සෝ කළ ඇඳිලි ඇත්තාහු නමස්කාර කෙරෙත්.

23. ඉදින් මේ ලොකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගත-කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

24. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛතීර්ථය වැරැද යට තොටැහි ගෙන මහගඟ උත්තරණය කෙරෙත් ද,

25. එසෙයින් මැ ඇපි හැමදෙනමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

26. තස්සා'පි වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වත'මධිට්ඨාසිං දසපාරමිපූරියා.

27. තද'පි මං[1] බුද්ධධම්මං සරිත්වා අනුබ්‍රෑහයිං
ආහරිස්සාමි තං ධම්මං යං මය්හං[2] අභිපත්ථිතං.

28. නගරං සුධඤ්ඤවතී[3] නාම විපුලො නාම ඛත්තියො
විපුලා නාම ජනිකා රෙවතස්ස මහෙසිනො.

29. ඡබ්බස්සසහස්සානි[4] අගාරමජ්ඣ සො වසී
සුදස්සනො ච රතනග්ඝි[5] ආවෙළො[6] ච විභූසිතො
පුඤ්ඤකම්මාභිනිබ්බත්තා තයො පාසාද මුත්තමා.

30. තෙත්තිංස සහස්සානි[7] නාරියො සමලඞ්කතා
සුදස්සනා නාම දෙවී වරුණො නාම අත්‍රජො.

31. නිමිත්තෙ චතුරො දිස්වා රථයානෙන නික්ඛමි
අනූනසත්තමාසානි පධානං පදහී ජිනො.

32. බ්‍රහ්මුනා යාචිතො සන්තො රෙවතො ලොක නායකො
වත්ති චක්කං මහාවීරො වරුණා රාමෙ සිරීඝරෙ.[8]

33. වරුණො බ්‍රහ්මදෙවො ච අහෙසුං අග්ග සාවකා
සම්භවො නාමුපට්ඨාකො රෙවතස්ස මහෙසිනො.

34. භද්දා චෙව සුභද්දා ච අහෙසුං අග්ගසාවිකා
සො'පි බුද්ධො අසමසමො නාගමූලෙ අබුජ්ඣථ.

35. පදුමො කුඤ්ජරො චෙව අහෙසුං අග්ගු'පට්ඨකා
සිරිමා චෙව යසවතී අහෙසුං අග්ගු'පට්ඨිකා.

36. උච්චත්තනෙන[9] සො බුද්ධො අසීති හත්ථ මුග්ගතො
ඔභාසෙති දිසා සබ්බා ඉන්දකෙතුව උග්ගතො.

---

1. තං - මජසං
2. මයං - මනුප.
3. සුධම්මකං - සීමු, සුධඤ්ඤකං. PTS, සයා
4. ඡ ච වස්සසහස්සානි - මජසං
5. සුදස්සනෙ, රතනග්ඝි - මජසං
6. අවෙළො - සීමු.
7. තෙත්තිංස ච සහස්ස නි - මජසං.
8. සිරීඝරෙ - සීමු.
"වත්තවත්තො, මහාවීරො, වරුණාරාමෙ වසි ජිනො" - සයා.
9. උච්චත්තරෙන - සීමු.

26. මම ඒ බුදුනුදුගේ වදන් අසා අතිශයින් සිත පැහැදවීමි. දස-පාරමීන් පුරන පිණිස මත්තෙහි වූනාධිෂ්ඨාන කෙළෙමි.

27. එකල්හිදු මම 'යමක් මා විසින් ප්‍රාර්ථනා කරනලද නම් ඒ බුද්ධත්‍වය ගනිමැ'යි මේ බුද්ධකාරකධර්මය සිහි කොට වැඩීමි.

28. මහර්ෂි වූ රේවත බුදුන්ගේ නගරය සුධඤ්ඤවතී නම. විපුල නම් ක්ෂත්‍රිය තෙම පියා විය, මව් තොමෝ විපුලා නම් වූ යැ.

29. ඒ බුදුහු හවුරුදු සදහසක් මුළුල්ලෙහි ගිහිගෙයි විසූහ. සරසන ලද සුදර්‍ශන යැ රතනග්ඝි යැ ආවෙළ යැ යි පින්කමින් නිපන් උතුම් වූ ප්‍රාසාදත්‍රයෙක් වී.

30. මොනොවට සැරැසුණු තෙතිස්දහසක් පරිවාරස්ත්‍රීහු වූහ. අග මෙහෙසි තොමෝ සුදස්සනා නමු. පුත්‍ර තෙමේ වරුණ නම් වී.

31. ඒ ජිනපඤ්චමාරයෝ සතර පෙරනිමිති දැක රථයානයෙන් අභිනිෂ්ක්‍රමණය කළහ. අනූන සප්තමාසයක් ප්‍රධන්වීර්‍ය්‍ය කළහ.

32. මහත් වූ වීර්‍ය්‍යය, ඇති රේවත නම් ලොකනාථයන් වහන්සේ මහබඹහු විසින් අයදනා ලදහු ශ්‍රීනිවාස වූ වරුණාරාමයෙහි දී දම්සක් පැවැත්වූහ.

33. මහර්ෂි වූ රේවත බුදුන්ට වරුණ යැ බ්‍රහ්මදෙව යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වූහ. සම්භව නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ.

34. භද්‍රා යැ සුභද්‍රා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වූහ. අසමසම වූ ඒ බුදුහු ද නාගවෘක්ෂමූලයෙහි දී අධිගම කළහ.

35. පදුම යැ කුඤ්ජර යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වූහ. සිරිමා යැ යසවතී යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වූහ.

36. ඒ බුදුහු උසින් අසූ රියනක් නැඟී සිටියාහු ඉන්ද්‍රකෙතුවක් (දෙව්දුන්නක්) සෙයින් හැම දිශා බැබැළවූහ.

37. තස්ස සරීරෙ නිබ්බත්තා පභා මාලා අනුත්තරා
දිවා වා යදිවා රත්තිං සමන්තා ඵරති[1] යොජනං.[2]

38. සට්ඨිවස්සසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

39. දස්සයිත්වා බුද්ධබලං අමතං ලොකෙ පකාසයං
නිබ්බායි අනුපාදානො යථ'ග්ගු'පාදානසඞ්ඛයා.

40. සො ච කායො රතනනිභො සො ච ධම්මො අසාදිසො
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා.

41. රෙවතො යසධරො බුද්ධො නිබ්බුතො සො මහාමුනි[3]
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො'ති.

**රෙවත බුද්ධවංසො පඤ්චමො.**

1. ඵරි – සිමු.
2. තස්ස දෙහාභිනිබ්බත්තං පභාජාලමනුත්තරං
දිවා චෙව තද රත්තිං, නිච්චං ඵරති යොජනං''
ධාතුයො මම සබ්බාපි, විකිරන්තූති සො ජිනො,
අධිට්ඨාසි මහා වීරො, සබ්බ සත්තානුකම්පකො''
මහාසාරෙ පනුය්‍යානෙ, මහතො නගරස්ස යොජනෙ
පූජිතො නර සාරෙහි, පරිනිබ්බායි රෙවතො'' – බුඅ.
3. මහාපුරෙ – මජසං.

37. ඔබගේ සිරුරෙහි නිපන් නිරුත්තර වූ ප්‍රභාමාලාව රැයිදු දවාල්හිදු හාත්පසැ යොදුනක් මුළුල්ලෙහි පතළහ.

38. එකල්හි සැටදහසක් හවුරුදු ආයු පැනෙයි. ඒ බුදුහු ඒ තාක්කල් සිටුනාහු බොහෝ ජනසමූහයා සසරින් තැරවූහ.

39. බුද්ධබලය දක්වා ලොවැ අමෘතය ප්‍රකාශ කරන්නාහු උපධික්ෂයෙන් අග්නිය සෙයින් උපාදාන රහිත වූවාහු පිරිනිවියහ.

40. රුවන් සුදුසු ඒ බුදුසිරුර ද නිරුපම වූ එ දහම ද යන සියල්ල අතුරුදහන් වී. හැම සංස්කාරයෝ රික්තයෝ නූ?

41. මහාමුනි වූ යශස්ධර වූ ඒ රේවත නම් සම්මා සම්බුදුහු පිරිනිවියහ. ඒ ඒ ප්‍රදෙශයෙහි ධාතු පැතුරුණේ විය.

**පස්වැනි වූ රේවත බුද්ධවංශ යි.**

## 6. සොභිත බුද්ධවංසො

1. රෙවතස්ස අපරෙන සොභිතො නාම නායකො
සමාහිතො සන්තචිත්තො අසමො අප්පටිපුග්ගලො.

2. සො ජිනො සකගෙහම්හි මානසං විනිවට්ටයී[1]
පත්වාන කෙවලං බොධිං ධම්මචක්කං පවත්තයී[2].

3. යාව හෙට්ඨා අවීචිතො භවග්ගාචා'පි උද්ධතො[3]
එත්ථන්තරෙ එකපරිසා අහොසි ධම්මදෙසනෙ.

4. තාය පරිසාය සම්බුද්ධො ධම්මචක්කං පවත්තයී
ගණනාය න වත්තබ්බො පඨමා'භිසමයො අහු.

5. තතො පරම්පි දෙසෙන්තෙ[4] මරූනං ච[5] සමාගමෙ
නවුතිකොටිසහස්සානං දුතියා'භිසමයො අහු.

6. පුනා'පරං රාජපුත්තො ජයසෙනො නාම ඛත්තියො
ආරාමං රොපයිත්වාන බුද්ධෙ නියාදයී තදා.

7. තස්ස යාගං පකිත්තෙන්තො ධම්මං දෙසෙසි චක්ඛුමා
තද කොටිසහස්සානං තතියා'භිසමයො අහු.

8. සන්නිපාතා තයො ආසුං සොභිතස්ස මහෙසිනො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන'තාදිනං.

9. උග්ගතො නාම සො රාජා දානං දෙති නරුත්තමෙ
තම්හි දානෙ සමාගඤ්ඡුං අරහන්තා සතකොටියො.

10. පුනාපරං පුරගණො[6] දෙති දානං නරුත්තමෙ
තද නවුතිකොටීනං දුතියො ආසි සමාගමො.

---

1. විනිවත්තයි, PTS', මජසං, සයා
2. චක්කප්පවත්තයි - සිමු
3. යාව උඩං අවීචිතො භවග්ගාචාපිහෙට්ඨතො PTS.
4. දෙසෙන්තො – මචි,
5. නරමරූනං සිමු, සයා
6. පූගගණෙ – සයා.

## 6. සොභිත බුද්ධවංශය

1. රේවත නම් බුදුන්ට ඉක්බිති සමාහිත වූ සන්හුන්සිත් ඇති අසම වූ ප්‍රතිපුද්ගලයන් නැති සොභිත නම් බුදුහු ලොවැ පහළවූහ.

2. ඒ ජිතපඤ්චමාර වූ බුදුහු සිය භවනයෙහි දී (සතියක් තුළ පෘථග්ජන) සිත (බුද්ධත්‍වයට) පරිවර්තනය කළහ. සර්වඥතාඥනයට පැමිණ දම්සක් පැවැත්වූසේක.

3. ඒ ධර්මචක්‍රදෙශනායෙහි යටින් අවීචිය පටන් කොට උඩින් භවාග්‍රය දක්වා මෙදැතුරැ එක් පිරිසෙක් වී.

4. එපිරිස් මැද සම්බුදුහු දම්සක් පැවැත්වූහ. ගණනින් නො කියහැකි (සඞ්ඛ්‍යාපථාතික්‍රාන්ත) වූ ප්‍රථමධර්මාභිසමය වී.

5. එයින් මැතභාගයෙහි (තව්තිසාභවනයෙහි) දෙවියන්ගේ සමාගම-යෙහි අභිධර්මදෙශනාව කරන කල්හි (දෙසුම් කෙළවරැ) නවකෙළදහසක් දෙවියනට ද්විතීයධර්මාභිසමය වී.

6. නැවැත රාජපුත්‍ර වූ ජයසෙන නම් ක්ෂත්‍රිය තෙම (සුනන්දාරාම නම්) ආරාමයක් කරවා එකල්හි බුදුනට පිදී.

7. චක්ෂුර්මත් වූ බුදුහු එරජකුමරුගේ දනය කීර්තනය කෙරෙමින් දහම් දෙසූහ. එකල්හි කෙළදහසක් සත්නට තුන් වැනි ධර්මාභිසමය වී.

8. මහර්ෂි වූ සොභිත බුදුන්ට විගතමල වූ සන්හුන් සිත් ඇති තාදිගුණ ඇති ක්ෂීණාශ්‍රවයන්ගේ තුන් ශ්‍රාවකසන්නිපාතයෙක් වී.

9. උග්ගත නම් වූ ඒ රජ නරොත්තම වූ බුදුන් කෙරෙහි දන් දීන. එකල්හි ඒ දනයෙහි කෙළසියක් රහත්හු රැස්වූහ.

10. යළි පුරගණයා නරොත්තම වූ බුදුනට දන් දීන. එකල්හි අනූකෙළක් ප්‍රාණීන්ට ද්විතීය ධර්මාභිසමය වී.

11. දෙවලොකෙ වසිත්වාන යදා ඔරොහතී ජිනො
තදා අසීතිකොටීනං තතියො ආසි සමාගමො.

12. අහං තෙන සමයෙන සුජාතො නාම බ්‍රාහ්මණො
තදා සසාවකං බුද්ධං අන්නපානෙන තප්පයිං.

13. සො'පි මං බුද්ධො ව්‍යාකාසි[1] සොභිතො ලොකනායකො
අපරිමෙය්‍යිතො කප්පෙ අයං බුද්ධො භවිස්සති.

14. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

15. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

16. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආද සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

17. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

18. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති,
පිතා සුද්ධොදනො නාම, අයං හෙස්සති ගොතමො.

19. කොලිතො උපතිස්සො ච, අග්ගා හෙස්සන්ති සාවකා,
ආනන්දො නාමු' පට්ඨාකො, උපට්ඨිස්සති තං ජිනං.

20. ඛෙමා උප්පලවණ්ණා ච, අග්ගා හෙස්සන්ති සාවිකා,
බොධි තස්ස භගවතො, අස්සත්ථො'ති පවුච්චති.

21. චිත්තො ච හත්ථාළවකො, අග්ගා හෙස්සන්තු' පට්ඨකා,
උත්තරා නන්දමාතා ච, අග්ගා හෙස්සන්තු' පට්ඨිකා,
ආයු වස්සසතං තස්ස, ගොතමස්ස යසස්සිනො.

22. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

1. වියාකාසි - මවි.

11. යම් කාලෙක පස්මරුන් දිනූ බුදුහු දෙව්ලොව්හි වැස අවතීර්ණ වූහු ද එකල්හි අසූකෙළක් ප්‍රාණීන්ට තෘතීය ධර්මාභිසමය වී.

12. එසමයෙහි මම සුජාත නම් බ්‍රාහ්මණ වීමි. එකල්හි සඟුන් සහිත බුදුන් ආහාරපානයෙන් සැතැපීමි.

13. ලොකනායක වූ ඒ සොභිත නම් සම්මාසම්බුදුහු ද, 'මේ තෙමේ මෙයින් අප්‍රමෙය වූ කල්පයෙහි බුදු වන්නේ ය'යි මට විවරණ දුන්සේක.

14. එකල්හි තථාගත වූ මේ තෙමේ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට -

15. තථාගත තෙමේ අජපල් නම් නුගරුක්මුල්හි හිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලාහෝතෙරට එළැඹෙයි.

16. ඒ ජිතපඤ්චමාරයෝ නිල්දලා හෝතෙර හිඳ කිරිපිඩු වළඳා (දෙවියන්) පළියෙළ කළ උත්තම මාර්ගයෙන් ඇසැතුබෝරුක වෙත එළැඹෙයි.

17. ඉක්බිති ඒ මහායශස් ඇති අනුත්තර වූ බෝසත් බෝමැඩ පැදකුණු කොට ඇසැතු රුක්මුල්හි හිඳ බුදු වන්නේ යැ.

18. මොවුන්ගේ ජනික මව මායා නම් වන්නී යැ පිය තෙම ශුද්ධොදන නම් වන්නේ යැ. මේ තෙමේ ගෞතම නම් වන්නේ යි.

19. කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙනා අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායකයෙක් ඒ ජිතපඤ්චමාර බුදුන්ට උපස්ථාන කෙරෙයි.

20. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය 'ඇසැතු' යයි කියනුලැබේ.

21. චිත්ත යැ හත්ථාළවක යැ යන මොහු අගඋවටු වන්නාහ උත්තරා යැ නන්දමාතා යැ යන මොහු අග උවට වන්නාහ. යශස්වී වූ ඒ ගෞතම බුදුනට වර්ෂ සියයෙක් ආයු වෙයි.

22. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා 'මේ තෙම බුද්ධබීජාඞ්කුරයෙකැ'යි දෙව්මිනිස්සු සතුටු වූවාහු.

23. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දස සහස්සී සදෙවකා.

24. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

25. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

26. එව'මෙව මයං සබ්බෙ යදිමුඤ්චාමී' මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

27. තස්සා'පි වචනං සුත්වා හට්ඨො සංවිග්ගමානසො
තමෙවත්ථමනුප්පත්තියා උග්ගං ධිතිමකාසහං

28. සුධම්මං නාම නගරං සුධම්මො නාම ඛත්තියො
සුධම්මා නාම ජනිකා සොභිතස්ස මහෙසිනො.

29. නවවස්සසහස්සානි අගාරමජ්ඣසො වසි
කුමුඳ කලීරො[1] පදුමො තයො පාසාදමුත්තමා.

30. සත්තති සහස්සානි[2] නාරියො සමලඞ්කතා
මබීලා[3] නාම සා නාරී සීහො නාමා'සි අත්‍රජො.

31. නිමිත්තෙ චතුරො දිස්වා පාසාදෙනා'භිනික්ඛමි
සත්තා'හං පධානචාරං චරිත්වා පුරිසුත්තමො
බුජ්ඣමානො ච සො බුද්ධො නාගමූලෙ අබුජ්ඣථ.

32. බ්‍රහ්මුනා යාචිතො සන්තො සොභිතො ලොකනායකො
වත්ති චක්කං මහාවීරො සුධම්මුය්‍යානමුත්තමෙ.

33. අසමො ච සුනෙත්තො ච අහෙසුං අග්ගසාවකා
අනොමො[4] නාමු පට්ඨාකො සොභිතස්ස මහෙසිනො
නකුලා ච සුජාතා ච අහෙසුං අග්ගසාවිකා.

---

1. නාළිනො – මජසං
2. සත්තතිංස සහස්සානි – මජසං,
තිචත්තාරි සහස්සානි – ස්‍යා.
ඡසත්තති සහස්සානි – සීමු.
3. මණිලා – මජසං, මකිලා – ස්‍යා.

• ගාථද්වා'යං , මජසං, ස්‍යාම පොත්ථකෙසු, න විජ්ජති

4. චත්තචක්කො – ස්‍යා
5. අනුමො – සීමු

23. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත ලොකයා බද්දිලි වැ නමස්කාර කෙරෙයි.

24. ඉදින් ඇපි මේ ලොකනාථයන්ගේ සස්න වරද්දමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

25. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛතීර්ථය වැරැද්ද යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද-

26. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ'යි.

27. මම ඒ බුදුනුදුගේ බස් අසා තුටු වූයෙම් සංවේගයට පත් සිත් ඇතියෙම් එ මැ අර්ථයට පැමිණෙනු පිණිස දෘඪවීර්යය කෙළෙමි.

28. මහර්ෂි වූ සොභිත නම් බුදුන්ගේ නගරය සුධර්ම නම, පිය වූ ක්ෂත්‍රිය තෙම සුධර්ම නම, මව් තොමෝ සුධර්මා නමු.

29. ඒ සොභිත නම් බුදුහු නවදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. ඔබට කුමුද යැ කලීර යැ පදුම යැ යි උතුම් තුන් පහයෙක් වී.

30. මොනොවට සැරසුණු පරිවාරස්ත්‍රීහු සැත්තෑදහසක් වූහ. ඒ මඛිලා නම් ස්ත්‍රිය අගමෙහෙසි වූ. පුත්‍ර තෙම සීහ නම් වී.

31. පුරුෂොත්තම වූ සොභිත බෝසත් සතර පෙරනිමිති දැක පහයෙන් අභිනිෂ්ක්‍රමණය කෙළේ යැ. ප්‍රධානචාරය සතියෙකි. ඒ බුදුහු සත්‍යාවබොධ කරන්නාහු නාගවෘක්ෂමූලයෙහි බුදු වූහ.

32. මහත් වූ වීර්යය ඇති සොභිත නම් සම්මාසම්බුදුහු බඹහු විසින් අයදනාලදහු උතුම් වූ සුධර්ම නම් උයන්හි දී දම්සක් පැවැත්වූහ.

33. මහර්ෂි වූ සොභිත බුදුනට අසම යැ සුනෙත්ත යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වූහ. අනොම නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ. නකුලා යැ සුජාතා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වූහ.

34. රම්මා චෙව සුදත්තා ච අහෙසුං අග්ගුපට්ඨිකා
නකුලා චෙව චිත්තා ච අහෙසුං අග්ගුපට්ඨිකා.

35. අට්ඨපඤ්ඤාස රතනං අච්චුග්ගතො මහාමුනි
ඔභාසෙති දිසා සබ්බා සතරංසී'ව උග්ගතො.

36. යථා සුඵුල්ලං පවනං නානා ගන්ධෙහි ධූපිතං
තථේව තස්ස පාවචනං සීලගන්ධෙහි ධූපිතං.

37. යථාපි සාගරො නාම දස්සනෙන අතප්පියො
තථේ'ව තස්ස පාවචනං සවණෙන අතප්පියං.

38. නවුතිවස්සසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

39. ඔවාදං අනුසිට්ඨිඤ්ච දත්වාන සෙසකෙ ජනෙ,
හුතාසනොව තාපෙත්වා නිබ්බුතො සො ස සාවකො.

40. සො ච බුද්ධො අසමසමො තෙ'ච[1] සාවකා බලප්පත්තා
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා.

41. සොභිතො වරසම්බුද්ධො සීහාරාමම්හි නිබ්බුතො
ධාතු විත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො'ති.

සොභිත බුද්ධවංසො ඡට්ඨො.

---

1. තෙපි ච – සිමු තෙපි – මජසං.

34. රම්ම යැ සුදත්ත යැ යන දෙදෙන අගළුවටු වූහ. නකුලා යැ චිත්තා යැ යන දෙදෙන අගළුවට වූහ.

35. අටපනස්රියන් උස්වූ සෝභිත මහමුනිහු උද වූ දිවයුරු සෙයින් හැම දික් බැබැළවූහ.

36. යම්සේ සුපිපි මහවනය නොයෙක් සුවඳින් සුවඳ කරන ලද ද එසෙයින් මැ උන් වහන්සේගේ සස්න සිල්සුවඳින් සුවඳ කරනලද.

37. යම්සේ සාගරය නම් දශීනයෙන් අතෘප්තිජනක වේ ද, එසෙයින් මැ ඔබගේ සස්න ශ්‍රවණයෙන් අතෘප්තිජනක වී.

38. එකල්හි අනූදහසක් හවුරුද්දට ආයු විය. එතෙක් කල් වැඩසිටි ඒ බුදුහු බොහෝ ජනතාව සසරකතරින් එතෙර කරවූහ.

39. ඒ බුදුහු සෙසු ජනයන්ට අවවාද අනුශාසනා කොට ගින්නක් සෙයින් තෙද ගන්වා ශ්‍රාවකයන් සහිත වැ පිරිනිවියාහ.

40. අසමසම වූ ඒ බුදුහු ද බලප්‍රාප්ත වූ ඒ ශ්‍රාවකයෝ ද යන එ හැම අතුරුදහන් වූහ. හැම සංස්කාරයෝ තුච්ඡ වූවාහු නො ද?

41. සෝභිත නම් වූ උතුම් සම්බුද්ධයන් වහන්සේ සිංහාරාමයෙහි පිරිනිවිසේක. ඒ ඒ පෙදෙස්හි උන් වහන්සේගේ ධාතූහු විසුරුණහ.

**සවැනි සෝභිත බුද්ධවංශ යි.**

## 7. අනොමදස්සි බුද්ධවංසො

1. සොභිතස්ස අපරෙන සම්බුද්ධො දිපදුත්තමො
අනොමදස්සී අමිතයසො තෙජස්සී[1] දුරතික්කමො.

2. සො ඡෙත්වා බන්ධනං සබ්බං විද්ධංසෙත්වා තයො භවෙ
අනිවත්තිගමනං මග්ගං දෙසෙසි දෙවමානුසෙ.

3. සාගරො'ව අසඞ්ඛොභො[2] පබ්බතො'ව දූරාසදෙ
ආකාසො'ව අනන්තො සො සාලරාජාව ඵුල්ලිතො.

4. දස්සනෙන'පි තං බුද්ධං තොසිතා හොන්ති පාණිනො
ව්‍යාහරන්තං ගිරං සුත්වා අමතං පාපුණන්ති තෙ.

5. ධම්මාභිසමයො තස්ස ඉද්ධො ඵීතො තද අහු
කොටිසතානි අභිසමිංසු පඨමෙ ධම්මදෙසනෙ.

6. තතො පරම්හි සමයෙ[3] වස්සන්තෙ ධම්මවුට්ඨියො
අසීතිකොටියො අභිසමිංසු දුතියෙ ධම්මදෙසනෙ.

7. තතො පරම්පි වස්සන්තෙ තප්පයන්තෙ ච පාණිනං
අට්ඨසත්තතිකොටීනං තතියා'භිසමයො අහු.

8. සන්නිපාතා තයො ආසුං තස්සාපි ච මහෙසිනො
අභිඤ්ඤාබලප්පත්තානං පුප්ඵිතානං විමුත්තියා.

9. අට්ඨසතසහස්සානං සන්නිපාතො තද අහු
පහීනමදමොහානං සන්තචිත්තාන[4] තාදිනං.

10. සත්තසතසහස්සානං දුතියො ආසි සමාගමො
අනඞ්ගණානං විරජානං උපසන්තාන තාදිනං.

---

1. තෙජසී – සීමු, සයා.
2. අසඞ්ඛොබ්භො – මවි.
3. තතො පරං, අභිසමයෙ – මජසං, සයා.
තතො පරම්පි, අභිසමයෙ – සීමු.
4. සන්තචිත්තානං – ම.

## 7. අනොමදස්සී බුද්ධවංශය

1. සොභිත නම් බුදුන්ට මෑතභාගයෙහි අපමණ වූ යසපිරිවර ඇති ශීලසමාධිප්‍රඥාතෙජස් ඇති, කිසිවෙක්හු විසින් ඉක්මවිය නොහැකි ද්විපදෙත්තම වූ අනොමදස්සී නම් සම්බුද්ධයන් වහන්සේ ලොව පහළ වූ සේක.

2. ඒ බුදුහු සියලු සංයොජනයන් සිඳ තුන් භවය වනසා දෙව්මිනිසුන්ට නිවනට යන ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය දෙසූහ.

3. ඒ අනොමදස්සී බුදුහු මහසයුර සෙයින් නො කළඹාලියහැකි වූහ. පර්වතයක්හු සෙයින් නො ගැටියහැකි වූහ. ආකාශය සෙයින් අනන්තයහ. සුපිපි සල්රුකක් සෙයින් සොභමාන වූහ.

4. ප්‍රාණීහු ඒ බුදුන් දර්ශනයෙන් මැ සතුටු වෙති. ඔව්හු දෙශනා කරන දහම් අසා නිවණට පැමිණෙති.

5. එකල්හි ඔබගේ ධර්මාභිසමය සමෘද්ධ වූයේ බොහෝ ජනයාට හිත විසින් පරිපූර්ණ වී. ප්‍රථමධර්මදෙශනායෙහි කෙළසියක් සත්ත්‍වයෝ ධර්මාභිසමය කළහ.

6. එයින් මෑතභාගයෙහි දෙවැනි ධර්මදෙශනායෙහි (බුද්ධමහාමෙඝය) දහම්වැසි වස්නා කල්හි අසූකෙළක් සත්ත්‍වයෝ ධර්මාභිසමය කළහ.

7. එයින් මෑතභාගයෙහිදු (දහම්වැසිදහර) වස්නා කල්හි (දහම්-අමාවැස්සෙන්) සත්ත්‍වයන් පිනවන කල්හි අටසැත්තෑකෙළක් ප්‍රාණීන්ට තෘතීයධර්මාභිසමය වී.

8. මහර්ෂි වූ ඒ අනොමදස්සී බුදුන්ට ද ෂඩභිඥා බලයට පැමිණි අර්හත්ඵලවිමුක්තියෙන් සුපුෂ්පිත (ශොභාවට පැමිණි) වූ ශ්‍රාවකයන්ගේ සන්නිපාත තුනෙක් වී.

9. එකල්හි ප්‍රහීණ වූ මදමොහ ඇති ශාන්ත වූ සිත් ඇති තාදී ගුණ ඇති අට ලක්ෂයක් රහතුන්ගේ ප්‍රථම සන්නිපාතය වී.

10. කෙලෙස් අඞ්ගණ රහිත වූ විගත වූ කෙලෙස්රජස් ඇති උපශාන්ත වූ තාදීගුණ ඇති සත් ලක්ෂයක් රහතුන්ගේ දෙවැනි සන්නිපාතය වී.

11. ජනානං සතසහස්සානං තතියො ආසි සමාගමො
අභිඤ්ඤාබලප්පත්තානං[1] නිබ්බුතානං තපස්සිනං.

12. අහං තෙන සමයෙන යක්ඛො ආසිං මහිද්ධිකො
නෙකානං යක්ඛකොටීනං වසවත්තිම්හිස්සරො.[2]

13. තදා'පි තං බුද්ධවරං උපගන්ත්වා මහෙසිනං
අන්නපානෙන තප්පෙසිං සසඞ්ඝං ලොකනායකං.

14. සො'පි මං තදා ව්‍යාකාසි[3] විසුද්ධනයනො මුනි
අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ අයං බුද්ධො[4] භවිස්සති.

15. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

16. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

17. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදාය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති

18. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

19. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

20. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමු'පට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

21. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

---

1. බලපත්තානං – මචි.
2. වසවත්තිමහි – සීමු, මජසං. සතා
3. ව්‍යාකාසි. – සීමු.
4. සම්බුද්ධො – සීමු.

11. ෂඩභිඥබලයට පැමිණි ක්ලෙශපරිනිර්වාණයෙන් පිරිනිවි අංගසංඛ්‍යාත තපස් ඇති ස ලක්ෂයක් ක්ෂීණාශ්‍රවයන්ගේ තුන් වැනි ශ්‍රාවකසන්නිපාතය වී.

12. එසමයෙහි මම නොයෙක් කෙළගණන් යක්ෂයන් වසයෙහි පවත්වන මහෙශ්වර වූ මහත් සෘද්ධි ඇති යක්ෂසෙනාධිපති වීමි.

13. එකල්හි ද මහර්ෂි වූ ඒ උත්තම සම්බුද්ධයන් කරා එළැඹ සඟුන් සහිත ලොකනායකයන් වහන්සේ ආහාරපානයෙන් සන්තර්පණය කෙළෙමි.

14. එකල්හි ඒ විශුද්ධ වූ ඇස් ඇති බුදුහු 'මෙයින් අප්‍රමෙය වූ කල්පයෙහි මේ තෙමේ බුදු වන්නේ ය'යි මට විවරණ දුන්හ.

15. එකල්හි තථාගත වූ මේ තෙමේ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට –

16. තථාගත තෙම අජපල් නම් නුගරුක්මුල්හි හිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලාහෝතෙරට එළැඹෙයි.

17. ඒ ජිතපඤ්චමාර තෙම නිල්දලාහෝතෙර හිඳ කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තමමාර්ගයෙන් ඇසැතුබෝරුක වෙත එළැඹෙයි.

18. ඉක්බිති ඒ අනුත්තර වූ බෝසත් බෝමැඩ පැදකුණු කොට මහායසස් ඇතියේ ඇසැතු බෝරුක්මුල්හි හිඳ බුදු වන්නේ යැ.

19. මොවුන්ගේ ජනිකමව් තොමෝ මායා නම් වන්නී යැ. පිතෘ තෙම ශුද්ධොදන නම් වන්නේ යැ. මේ තෙම ගෞතම නම් වන්නේ යී.

20. කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායකයෙක් ඒ පස්මරුන් දිනූ බුදුන්ට උපස්ථාන කරන්නේ යී.

21. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබේ.

22. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා.
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

23. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

24. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

25. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

26. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං

27. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං

28. තස්සා'පි වචනං සුත්වා හට්ඨො සංවිග්ගමානසො
උත්තරිං වත මධිට්ඨාසිං දස පාරමිපූරියා.

29. නගරං චන්දවතී[1] නාම යසවා නාම ඛත්තියො
මාතා යසොධරා නාම අනොමදස්සිස්ස සත්ථුනො.

30. දස වස්සසහස්සානි අගාරමජ්ඣෙ සො වසී
සිරි උපසිරිසිරිවඩ්ඪා තයො පාසාද මුත්තමා.

31. තෙවීසතිසහස්සානි නාරියො සමලඞ්කතා
සිරිමා නාම නාරී ච උපවානො[2] නාම අත්‍රජො.

32. නිමිත්තෙ චතුරො දිස්වා සිවිකායා'භිනික්ඛමි
අනූනදසමාසානි පධානං පදහී ජිනො

33. බ්‍රහ්මුනා යාචිතො සන්තො අනොමදස්සී මහාමුනි
වත්තිචක්කං මහාවීරො උය්‍යානෙ සො සුදස්සනෙ.

---

1. බන්ධුමතී ධම්මපදඅග්ගසාවක 53.
2. උපවාරණො - මචි.

22. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අගඋවටු වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අගඋවට වන්නාහ. යසස් ඇති ඒ ගෞතම බුදුන්ට හවුරුදු සියයෙක් ආයු වෙයි.

23. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා 'මේ තෙම බුද්ධාඞ්කුරයෙකැ'යි දෙව්මිනිස්සු සතුටු වූවාහු-

24. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝවැස්සෝ බඳදිලි වැ නමස්කාර කෙරෙත්.

25. ඉදින් මේ ලොකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

26. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛතීර්ථය වැරැදූ යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද –

27. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ'යි.

28. මම ඒ බුදුනුදුගේ බස් අසා තුෂ්ට වූයෙම් සංවෙගයට පැමිණි සිතැත්තෙම් දසපාරමීන් පුරන පිණිස මත්තෙහි ව්‍රතය අධිෂ්ඨාන කෙළෙම්.

29. අනොමදස්සී බුදුන්ගේ නගරය චන්ද්‍රවතී නම් වී යැ. යසවත් නම් ක්ෂත්‍රිය තෙම පියා විය. මව් තොමෝ යශොධරා නමු.

30. උන් වහන්සේ දසදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. සිරි යැ උපසිරි යැ සිරිවඩ්ඪ යැ යි උතුම් ප්‍රාසාද තුනෙක් වී.

31. මොනොවට සරසනලද තෙවිසිදහසක් පරිවාරස්ත්‍රීහු වූහ. සිරිමා නම් අගමෙහෙසියක් වූ යැ. පුත්‍ර තෙම උපවාන නම් වී.

32. පස්මරුන් දිනූ බුදුහු සතර පෙරනිමිති දැක සිවිගෙයෙකින් මහබිනික්මන් කළහ. පුරා දසමසක් ප්‍රධන්වීර්‍ය කළහ.

33. ඒ මහත්වීර්‍ය ඇති අනොමදස්සී නම් බුදුහු මහබඹුනු විසින් අයදනාලදහු සුදර්ශන නම් උයන්හි දී දම්සක් පැවැත්වූහ.

34. නිසභො ච[1] අනොමො[2]ච අහෙසුං අග්ගසාවකා
වරුණො නාමු' පට්ඨාකො අනොමදස්සිස්ස සත්ථුනො.

35. සුන්දරී[3]ච සුමනා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො අජ්ජුනො'ති පවුච්චති.

36. නන්දිවඩ්ඪො සිරිවඩ්ඪො අහෙසුං අග්ගු'පට්ඨකා
උප්පලා චෙව පදුමා ච අහෙසුං අග්ගු'පට්ඨිකා.

37. අට්ඨපඤ්ඤාස රතනං අච්චුග්ගතො මහාමුනි
පභා නිද්ධාවති තස්ස සතරංසී'ව උග්ගතො.

38. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

39. සුපුප්ඵිතං පාවචනං අරහන්තෙහි තාදිහි
වීතරාගෙහි විමලෙහි සොභිත්ථ ජිනසාසනං.

40. සො ච සත්ථා අමිතයසො යුගානි තානි[4] අතුලියානි
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා.

41. අනොමදස්සී ජිනො සත්ථා ධම්මාරාමම්හි නිබ්බුතො
තත්ථෙ'ව තස්ස ජිනථූපො උබ්බෙධො පඤ්චවීසතී'ති.

**අනොමදස්සී බුද්ධවංසො**
**සත්තමො.**

1. නිපකො – මනුප,
2. අසොකො – සීමු.
3. සුන්දරා–ධම්මපදට්ඨකථා 53.
4. තීණි – සීමු.

34. අනොමදස්සී නම් බුදුන්ට නිසභ යැ අනොම යැ යන දෙදෙන අගසවු වූහ. වරුණ නම් තෙර කෙනෙක් අග උවටු වූහ.

35. සුන්දරී යැ සුමනා යැ යන අග්‍රශ්‍රාවිකා දෙනමක් වූහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය අර්ජුන (කුඹුක්) යයි කියනුලැබෙයි.

36. නන්දිවඩ්ඪ යැ සිරිවඩ්ඪ යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වූහ. උත්පලා යැ පද්මා යැ යි අග්‍රොපස්ථායිකා දෙදෙනෙක් වූහ.

37. ඒ සම්මාසම්බුදුහු අටපනස්රියන් උස වූවහ, උදවූ සූර්‍ය්‍යයා සෙයින් උන් වහන්සේගේ කැලුම් නික්ම යෙයි.

38. එකල්හි හවුරුදු ලක්ෂයක් ආයු පැනෙයි. ඒ අනොමදස්සී බුදුහු එතෙක් සිටුනාහු බොහෝ ජනසමූහයා තරණය කරවූහ.

39. පහවූ රාග ඇති විගත රාගාදි මල ඇති තාදීගුණ ඇති රහතුන් කරණ කොට ගෙන සුපුෂ්පිත ප්‍රවචන ඇති බුදුසස්න බැබැළී.

40. අප්‍රමාණ යසස් ඇති ඒ ශාස්තෘහු ද ඒ අතුල්‍ය වූ ශ්‍රාවකයුගලයෝ ද යන සියල්ල අතුරුදහන් විය හැම සංස්කාරයෝ සිස් වූවාහු නො?

41. පස්මරුන් දිනූ අනොමදස්සී බුදුහු ධර්මාරාමයෙහි පිරිනිවියහ. එහි මැ ඒ බුදුන්ගේ ස්තූපය පස්විසියොත්නෙක් උස් වූයේ යි.

සත් වැනි අනොමදස්සී බුද්ධවංශ යි.

# 8. පදුම බුද්ධවංසො

1. අනොම දස්සිස්ස අපරෙන සම්බුද්ධො දිපදුත්තමො
පදුමො නාම නාමෙන අසමො අප්පටිපුග්ගලො

2. තස්සා'පි අසමං සීලං සමාධි'පි අනන්තකො
අසඞ්ඛෙය්‍යං ඤාණවරං විමුත්ති ච අනූපමා.

3. තස්සා'පි අතුලතෙජස්ස ධම්මචක්කප්පවත්තනෙ
අභිසමයා තයො ආසුං මහාතමපවාහනා.

4. පඨමාභිසමයෙ බුද්ධො කොටිසතමබොධයි
දුතියාභිසමයෙ ධීරො නවුතිකොටිමබොධයි.

5. යදා ච පදුමො බුද්ධො ඔවදී සකම'ත්‍රජං
තදා අසීතිකොටීනං තතියා'භිසමයො අහු.

6. සන්නිපාතා තයො ආසුං පදුමස්ස මහෙසිනො,
කොටිසතසහස්සානං පඨමො ආසි සමාගමො.

7. කඨින[1]ත්ථාරසමයෙ උප්පන්නෙ කඨින'චීවරෙ
ධම්මසෙනාපත'ත්ථාය[2] භික්ඛු සිබ්බිංසු චීවරං.[3]

8. තදා තෙ විමලා භික්ඛු ඡළභිඤ්ඤා මහිද්ධිකා
තීණි සතසහස්සානි සමිංසු අපරාජිතා.

9. පුනාපරං සො නරාසභො[4] පවනෙ වාසං උපාගතො[5]
තදා සමාගමො ආසි ද්වින්නං සතසහස්සානං[6].

10. අහං තෙන සමයෙන සීහො ආසිං මිගාධිභූ[7]
පවිවෙකමනුබ්‍රූහන්තං පවනෙ අද්දසං ජිනං[8].

11. වන්දිත්වා සිරසා පාදෙ කත්වාන තං පදක්ඛිණං
තික්ඛත්තුං අභිනාදිත්වා. සත්තාහං ජිනමුපට්ඨහිං[9].

12. සත්තාහං වරසමාපත්තියා උට්ඨහිත්වා තථාගතො
මනසා චින්තයිත්වාන කොටිභික්ඛූ සමානයි.

---

1. කඨින - මජසං.
2. ධම්මසෙනාපතිත්ථාය – මජසං.
3. චීවරෙ – මචි.
4. නරඋසභො – සයා.
5. උපාගමි – මජසං, සයා. PTS.
6. සතසහස්සීනං – මජසං.
7. මිගාභිභූ – සයා.
8. විවෙකමනුබ්‍රූහන්තං පවනෙ වාසං උපාගතං – සීමු.
9. ජිනමුපට්ඨහං – මජසං, මචි

## 8. පදුම බුද්ධවංශය

1. ඒ අනොමදස්සී බුදුන්ට මෑතභාගයෙහි නමින් 'පදුම' නම් වූ අසම වූ අප්‍රතිපුද්ගල වූ ද්විපදෙත්තම සම්බුදු කෙනෙක් වූහ.

2. ඒ බුදුන්ගේ ද ශීලය අසම යැ සමාධිය ද අනන්ත යැ උතුම් වූ (අසාධාරණ) ඥානය ද අප්‍රමෙය යැ අර්හත්ඵලවිමුක්තිය ද අනුපම වේ.

3. අතුල්‍ය වූ තෙජස් ඇති ඒ පදුම බුදුන්ගේ ද දම්සක් පැවැත්මෙහි මහත් වූ මොහඳුරු වනසන අභිසමයයෝ තිදෙනෙක් වූහ.

4. ධීර වූ සම්බුදුහු ප්‍රථමාභිසමයයෙහි කෙළසියක් සත්නට සත්‍යාවබොධය කළහ. ද්විතීයාභිසමයයෙහි අනූකෙළක් සත්නට සත්‍යාවබොධය කළහ.

5. යම් කලෙක පදුම බුදුහු ස්වකීය පුතණුවන්ට ඔවා දුන්සේක් ද එකල්හි අසූකෙළක් සත්නට තෘතීයාභිසමය වී.

6. මහර්ෂි වූ පදුම බුදුන්ට තුන් ශ්‍රාවක සන්නිපාත කෙනෙක් වූහ. කෙළසුවහසක් ශ්‍රාවකයන්ගේ ප්‍රථම සමාගමය වී.

7. කෙළින්සිවුරු (කඨින) අතුරන සමයෙහි කෙළින්සිවුරක් උපන් කල්හි දම්සෙනෙවි සාල තෙරුන් පිණිස මහණහු සිවුරු මැසූහ.

8. එකල්හි ඒ විගත රාගාදී මල ඇති ෂඩභිඥ ඇති මහත් සෘද්ධි ඇති අපරාජිත වූ තුන් ලක්ෂයක් මහණහු රැස්වූහ.

9. යළි මෑතභාගයෙහි ඒ නරශ්‍රෙෂ්ඨ වූ බුදුහු මහවනයෙහි වාසයට පැමිණියහ. එකල්හි දෙලක්ෂයක් රහතුන්ගේ සමාගමය වී.

10. එසමයෙහි මම් මෘගාධිපති සිංහරාජයෙක් වූයෙමි. මහවෙනෙහි නිරොධසමාපත්තියට සමවන් බුදුන් දුටුයෙමි.

11. (උන් වහන්සේගේ) පාසඟළ මුදුනින් වැඳ ඒ බුදුන් පැදකුණු කොට තුන් යලක් සිංහනාද කොට සතියක් මුළුල්ලෙහි උවටැන් කෙළෙමි.

12. තථාගතයන් වහන්සේ සත්දින උතුම් සමවතින් නැඟී (මෙහි පැමිණෙත්වයි) සිතින් සිතා කොටියක් භික්ෂූන් රැස්කළහ.

13. තදපි සො මහාවීරො තෙසං මජ්ඣෙ වියාකරි
අපරිමෙය්‍යො ඉතො කප්පෙ අයං බුද්ධො භවිස්සති.

14. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

15. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

16. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

17. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

18. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

19. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

20. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

21. චිත්තො ච හත්ථාලවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්ස සතං තස්ස ගොතමස්ස යසස්සිනො.

22. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

23. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

24. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

25. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

26. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාම'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

13. එකල්හිදු ඒ මහත්වීර්‍ය්‍ය ඇති සම්බුදුහු ඒ භික්ෂූන් මධ්‍යයෙහි 'මේ තෙමේ මෙයින් අප්‍රමෙය වූ කල්පයෙහි බුදු වන්නේ යැ'යි ප්‍රකාශ කළසේක.

14. එකල්හි තථාගත වූ මේ තෙමේ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය්‍යය වඩා දුෂ්කරක්‍රියා කොට –

15. තථාගත තෙම අජපල් නම් නුගරුක්මුල්හි හිඳ එහි දී කිරිපිඬු පිළිගෙන නිල්දලාහෝතෙරට එළැඹෙයි.

16. ඒ පස්මරුන් දිනූ මහසත් නිල්දලාහෝතෙර හිඳ කිරිපිඬු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තමමාර්ගයෙන් ඇසැතුබෝරුක් වෙත එළැඹෙයි.

17. ඉක්බිති ඒ මහායසස් ඇති අනුත්තර වූ මහසත් බෝමැඩ පැදකුණු කොට ඇසැතුබෝරුක්මුල්හි හිඳ බුදු වන්නේ යැ.

18. මොවුන්ගේ ජනිකමව් තොමෝ මායා නම් වන්නී යැ' පිතෘ තෙම ශුද්ධොදන නම් වන්නේ යැ, මේ තෙම ගෞතම නම් වන්නේ යි.

19. කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායක තෙර කෙනෙක් ඒ බුදුන්ට උපස්ථාන කරන්නාහ.

20. ඛෙමා යැ උත්පලවර්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ බුදුන්ගේ බොධිය ඇසැතු යයි කියනුලැබෙයි.

21. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අගළුවටු වන්නාහ උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අගළුවට වන්නාහ. යසස් ඇති ඒ ගෞතම බුදුන්ට හවුරුදු සියයෙක් ආයු වෙයි.

22. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා 'මේ තෙම බුද්ධාඞ්කුරයෙකැ'යි දෙව්මිනිස්සු සතුටු වූවාහු –

23. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහ සෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝවැස්සෝ බඳිදිලි වැ නමස්කාර කෙරෙත්.

24. ඉදින් මේ ලොකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

25. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛතීර්ථය වැරැදූ යටැ තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද –

26. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ'යි.

27. තස්සා'පි වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දසපාරමී පූරියා.

28. චම්පකං නාම නගරං අසමො නාම ඛත්තියො
අසමා නාම ජනිකා පදුමස්ස මහෙසිනො.

29. දසවස්සසහස්සානි අගාරමජ්ඣෙ සො වසි
උත්තරවසුයසුත්තරා[1]. තයො පාසාදමුත්තමා.

30. තෙත්තිංස සතසහස්සානි නාරියො සමලඞ්කතා
උත්තරා නාම සා නාරි රම්මො නාමා'සි අත්‍රජො.

31. නිමිත්තෙ චතුරො දිස්වා රථයානෙන නික්ඛමි
අනූනඅට්ඨමාසානි[2] පධානං පදහී ජිනො.

32. බ්‍රහ්මුනා යාචිතො සන්තො පදුමො ලොකනායකො
වත්ති චක්කං මහාවීරො ධනඤ්ජයුය්‍යානමුත්තමෙ.

33. සාලො ච උපසාලො ච අහෙසුං අග්ගසාවකා
වරුණො නාමු'පට්ඨාකො පදුමස්ස මහෙසිනො.

34. රාධා චෙ'ව සුරාධා'ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො මහාසොණො'ති වුච්චති.

35. භිය්‍යො චෙව අසමො ච අහෙසුං අග්ගු'පට්ඨකා
රුචී ච නන්දරාමා ච අහෙසුං අග්ගුපට්ඨිකා.

36. අට්ඨපඤ්ඤාසරතනං අච්චුග්ගතො මහාමුනි
පභා නිද්ධාවති තස්ස අසමා සබ්බතො දිසා.

37. චන්දප්පභා සූරියප්පභා රතනග්ගි-මණිප්පභා[3]
සබ්බා'පි තා හතා හොන්ති පත්වා ජිනපභුත්තමං.

38. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

39. පරිපක්කමානසෙ සත්තෙ බොධයිත්වා අසෙසතො
සෙස'ඤ්ඤෙ[4] අනුසාසිත්වා නිබ්බුතො සො සසාවකො.

40. උරගොව තචං ජිණ්ණං වද්ධං[5] පත්තං'ව පාදපො
ජහිත්වා සබ්බසඞ්ඛාරෙ නිබ්බුතො සො යථා සිඛී.

41. පදුමො ජිනවරො සත්ථා ධම්මාරාමම්හි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො.

**පදුමබුද්ධවංසො අට්ඨමො.**

---

1. නන්දවසු යසුත්තරා – මජසං, නන්ද ච සුයසා උත්තරා – සීමු. නන්දෙ වසු යසුත්තරො – සයා.
2. අනූනකට්ඨමාසානි – මජසං. අනූනකංඅඩ්ඪමාසං සීමු. PTS.
3. රතනග්ගි – සීමු.
4. සෙසකෙ – සීමු, මජසං.
5. වුඩ්ඪං සීමු, PTS

27. මම ඒ බුදුනුදුගේ බස් අසා තුෂ්ට වූයෙමි සංවෙගයට පැමිණි සිතැත්තෙම් දසපාරමීන් පුරන පිණිස මත්තෙහි ව්‍රතය අධිෂ්ඨාන කෙළෙමි.

28. මහර්ෂි වූ පදුම බුදුන්ට චම්පක නම් නගරය විය අසම නම් ක්ෂත්‍රිය තෙම පිතෘ විය මව් තොමෝ අසමා නම් වූ.

29. උන් වහන්සේ දසදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. උත්තර යැ වසුත්තර යැ යසුත්තර යැ යි උතුම් තුන් පහයෙක් වී.

30. මොනොවට සරසනලද තෙවිසිදහසක් පරිවාරස්ත්‍රීහු වූහ. ඒ මෙහෙසි තොමෝ උත්තරා නම් වූ. පුත්‍ර තෙම රම්‍ය නම් වී.

31. පස්මරුන් දිනූ බුදුහු සතර පෙරනිමිති දැක රථයානයෙකින් මහබිනික්මන් කළහ. පුරා අට මසක් ප්‍රධන්වීර්‍ය්‍ය කළහ.

32. මහත්වීර්‍ය්‍ය ඇති පදුම නම් බුදුහු මහබඹහු විසින් අයදනාලදහු උතුම් වූ ධනඤ්ජය නම් උයන්හි දී දම්සක් පැවැත්වූහ.

33. පදුම බුදුන්ට සාල යැ උපසාල යැ යි අගසවු දෙදෙනෙක් වූහ. වරුණ නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ.

34. රාධා යැ සුරාධා යැ යි අග්‍රශ්‍රාවිකා දෙදෙනෙක් වූහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය 'මහාසොණ' යැ යි කියනු ලැබෙයි.

35. භිය්‍ය යැ අසම යැ යි අගඋවටුවෝ දෙදෙනෙක් වූහ. රුචි යැ නන්‍දරාමා යැ යි අගඋවට දෙනමක් වූහ.

36. ඒ පදුම බුදුහු අටපනස්රියන් උස් වූහ. උන් වහන්සේගේ ශරීර වූ කැලුම් හැම දෙස නික්මයෙයි.

37. සඳකැල්ම හිරුකැල්ම රුවන්ගිනි මිණිකැල්ම යන එහැම කැලුම්හු උතුම් වූ බුදුන්ගේ කැලුම් පැමිණ නටුවාහු වෙති.

38. එකල්හි හවුරුදු ලක්ෂයක් ආයු පැනෙයි, උන් වහන්සේ එතාක් සිටුනාහු බොහෝ ජනසමූහයා තරණය කරවූහ.

39. පැසුණු ඉඳුරන් ඇති සත්ත්වයන් නිඃශෙෂයෙන් අවබොධ කරවා සෙස්සනට අනුශාසනා කොට ශ්‍රාවකයන් සහිත උන්වහන්සේ පිරිනිවියහ.

40. සර්පයෙක් දිරූ සැව සෙයින් වෘක්ෂයෙක් පුරාණපත්‍රයක් සෙයින් හැම සංස්කාරයන් හැරපියා ඒ බුදුහු ගින්නක් සෙයින් පිරිනිවියහ.

41. ජිනවර වූ පදුම බුදුහු ධර්මාරාමයෙහි පිරිනිවියහ. ඒ ඒ පෙදෙස්හි ධාතුහු පතළහ.

අටවැනි වූ පදුම බුද්ධවංශ යි.

## 9. නාරද බුද්ධවංසො

1. පදුමස්ස අපරෙන සම්බුද්ධො දිපදුත්තමො
නාරදෙ නාම නාමෙන අසමො අප්පටිපුග්ගලො.

2. සො බුද්ධො චක්කවත්තිස්ස ජෙට්ඨො දයිතඔරසො
ආමුක්කමාලාභරණො[1] උය්‍යානං උපසඞ්කමි.

3. තත්ථා'සි[2] රුක්ඛො යසවිපුලො අභිරූපො බ්‍රහා සුචි
තමජ්ඣපත්වා උපනිසීදි මහාසොණස්ස හෙට්ඨතො,

4. තත්ථ ඤාණවරුප්පජ්ජි අනන්තං වජිරූපමං
තෙන විචිනි සඞ්ඛාරෙ උක්කුජ්ජම'වකුජ්ජකං.

5. තත්ථ සබ්බකිලෙසානි අසෙසමභිවාහයි
පාපුණි කෙවලං බොධිං බුද්ධඤාණෙ ච චුද්දස.

6. පාපුණිත්වාන සම්බොධිං ධම්මචක්කං පවත්තයි
කොටිසතසහස්සානං පඨමාභිසමයො අහු.

7. මහාදොණං නාගරාජං විනයන්තො මහාමුනි
පාටිහෙරං තදාකාසි දස්සයන්තො සදෙවකෙ.

8. තදා දෙවමනුස්සානං තම්හි ධම්මප්පකාසනෙ
නවුතිකොටිසහස්සානි තරිංසු සබ්බසංසයං.

9. යම්හි කාලෙ මහාවීරො ඔවදි සකමත්‍රජං
අසීතිකොටිසහස්සානං තතියා'භිසමයො අහු.

10. සන්නිපාතා තයො ආසුං නාරදස්ස මහෙසිනො
කොටිසතසහස්සානං පඨමො ආසි සමාගමො

11. යදා බුද්ධො බුද්ධගුණං සනිදානං පකාසයි
නවුතිකොටිසහස්සානි සමිංසු විමලා තදා.

---

1. ආමුත්තමාලාභරණො – සීමු. PTS
ආමුත්තමලාභරණො – ස්‍යා.

2. තත්‍රාසි – සීමු.
තත්ථාසි – මනුප.

## 9. නාරද බුද්ධවංශය

1. පදුම බුදුන්ට මෑතභාගයෙහි නමින් නාරද නම් වූ අසම වූ අප්‍රතිපුද්ගල වූ අග්‍රපෙද්ගතම සම්බුදු කෙනෙක් වූහ.

2. සක්විතිරජහට ජ්‍යෙෂ්ඨ ඖරසපුත්‍ර වූ ඒ බුදුහු පලන් මල්බරණ ඇත්තාහු උයනට එළැඹියහ.

3. එහි විපුල වූ යසස් ඇති මනහර වූ මහත් වූ පවිත්‍ර වූ වෘක්ෂයෙක් වී. එතැනට පැමිණ ඒ මහමුරුත*රුක්මුල්හි හුන්හ. .

4. එහි දී අප්‍රමෙය වූ වජ්‍රෝපම (සියුම්) වූ උතුම් නුවණ පහළ වී. එ නැණින් සංස්කාර ධර්මයන්ගේ උදයව්‍යය (විදර්ශනායෙන්) විමසූහ.

5. එහි දී හැම කෙලෙසුන් නිරවශෙෂ කොට ප්‍රහාණය කළහ, පරිපූර්ණඅර්හත්මාර්ගඥානය ලදහ, තුදුස් බුදුනුවණ ද ලදහ.

6. සම්බොධියට පැමිණ දම්සක් පැවැත්වූහ. කෙළලක්ෂයක් සත්නට ප්‍රථමාභිසමය වී.

7. එකල්හි මහමුනිහු මහාද්‍රෝණ නම් නාරජ දමනය කෙරෙමින් දෙවියන් සහිත ලොකයාට පැනෙමින් පෙළහර පෑහ.

8. එකල්හි එ ධම්දෙසුන්හි දෙව්මිනිසුන් අතුරින් අනූකෙළදහසක් ප්‍රාණීහු හැම සංශය ඉක්ම ගියහ.

9. මහත්වීර්‍ය ඇති බුදුහු යම් කලෙක සිය පුතණුවන්ට ඔවා දුන්හු ද, එකල්හි අසූකෙළ දහසක් සත්නට තෘතීයාභිසමය වී.

10. මහර්ෂි වූ නාරද බුදුන්ට තුන් ශ්‍රාවක සන්නිපාත කෙනෙක් වූහ. කොටිලක්ෂයක් ශ්‍රාවකයන්ගේ ප්‍රථම සමාගමය වී.

11. යම් කලෙක බුදුනු නිදන සහිත කොට බුදුගුණ ප්‍රකාශ කළසේක් ද එකල්හි අනූකෙළදහසක් රහත්හු රැස්වූහ.

---

* 'සුළුමුරුත'යි, සද්ධර්මරත්නාකරයෙහි එයි.

12. යද වෙරොචනො නාගො දනං දදති සත්ථුනො
තද සමිංසු ජිනපුත්තා අසීතිසතසහස්සියො[1].

13. අහං තෙන සමයෙන ජටිලො උග්ගතාපනො,
අන්තලික්ඛචරො ආසිං පඤ්චාභිඤ්ඤාසු පාරගූ.

14. තද'ප'හං[2] අසමසමං සසඞ්ඝං සපරිජ්ජනං
අන්නපානෙන තප්පෙත්වා චන්දනෙනා'භිපූජයිං.

15. සො'පි මං බුද්ධො[3] ව්‍යාකාසි, නාරදෙ ලොක නායකො
අපරිමෙය්‍යො ඉතො කප්පෙ අයං බුද්ධො භවිස්සති,

16. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

17. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

18. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

19. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

20. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

21, කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමු'පට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

22. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

23. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරානන්දමාතා ච අග්ගා හෙස්සන්තුපට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

---

1. අසීතිසතසහස්සිනො – ස්‍යා.
2. තදපාහං – මජසං, ස්‍යා, සීමු; මනුප.
3. සම්බුද්ධො – සීමු.

12. යම් කලෙක වෙරෝචන නම් නාග තෙම දන් දුන්නේ ද එකල්හි අසූ ලක්ෂයක් ශ්‍රාවකයෝ රැස්වූහ.

13. එකල්හි මම උග්‍රතපස් ඇති ජටිල වූයෙම් පඤ්චාභිඥාවන්හි පරතෙරට පැමිණියෙම් අහස්හි සරනුයෙම් වීමි.

14. එකල්හිදු මම සඟුන් සහිත වූ පරිජනයා (උපාසක ජනයා) සහිත වූ අසමසම වූ බුදුන් ආහාරපානයෙන් සනප්වා සඳුනෙන් පිදීමි.

15. ලොකනායක වූ ඒ නාරද බුදුහු ද 'මේ තෙම මෙයින් අප්‍රමෙය වූ කල්පයෙහි බුදු වන්නේ යැ' යි මට විවරණ දුන්සේක.

16. එකල්හි තථාගත වූ මේ තෙමේ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට—

17. තථාගත තෙම අජපල් නම් නුගරුක්මුල්හි හිඳ එහි දී කිරිපිඬු පිළිගෙන නිල්දලාහෝතෙරට එළැඹෙයි.

18. ඒ පස්මරුන් දිනූ බුදුහු නිල්දලා හෝතෙර හිඳ කිරිපිඬු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තමමාර්ගයෙන් ඇසැතුබෝරුක් වෙත එළැඹෙයි.

19. ඉක්බිති ඒ මහායසස් ඇති අනුත්තර වූ මහසත් බෝමැඩ පැදකුණු කොට ඇසැතුබෝරුක්මුල්හි හිඳ බුදු වන්නේ යි.

20. මොවුන්ගේ ජනිකමව් තොමෝ මායා නම් වන්නී යැ පිතෘ තෙම ශුද්ධෝදන නම් වන්නේ යැ, මේ තෙම ගෞතම නම් වන්නේ යි.

21. කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායක තෙර කෙනෙක් ඒ බුදුන්ට උපස්ථාන කරන්නාහ.

22. ඛෙමා යැ උත්පලවර්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ බුදුන් ගේ බොධිය 'ඇසැතු' යයි කියනු ලැබෙයි.

23. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අගළුවටු වන්නාහ, උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙනා අගළුවට වන්නාහ, යසස් ඇති ඒ ගෞතම බුදුන්ට හවුරුදුසියයෙක් ආයු වෙයි.

24. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

25. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

26. යදිමස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

27. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

28. එවමෙව මයං සබ්බෙ යදි මුඤ්චාමිමං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

29. තස්සාපි වචනං සුත්වා භිය්‍යො භාවෙත්වා[1] මානසං
අධිට්ඨහිං වතං උග්ගං දසපාරමිපූරියා.

30. නගරං ධඤ්ඤවතී නාම සුදෙවො නාම ඛත්තියො
අනොමා නාම ජනිකා නාරදස්ස මහෙසිනො.

31. නවවස්සසහස්සානි අගාරමජ්ඣෙ සො වසී
ජිතො විජිතො විජිතාභිරාමො[2] තයො පාසාද මුත්තමා.

32. තිචත්තාරීසසහස්සානි නාරියො සමලඞ්කතා
විජිතසෙනා.[3] නාම නාරී නන්දුත්තරො නාම අත්‍රජො.

33. නිමිත්තෙ චතුරො දිස්වා පදසා[4] ගමනෙන නික්ඛමි
සත්තාහංපධානචරියං[5]. අචරී ලොකනායකො.

---

1. හාසෙත්ව – සීමු. මජසං, ස්‍යා, හාසෙත්වා. PTS.
2. ජිතො විජිතාභිරාමො – මජසං, ස්‍යා.
ජිතා විජිතා භූරිමා – සීමු.
3. ජිතසෙනා – සීමු.
4. පාසාද – සීමු.
5. පධානචාරං – මජසං, ස්‍යා.

24. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා 'මේ තෙම බුද්ධාඞ්කුරයෙකැ යි දෙව්මිනිස්සු සතුටු වූවාහු-

25. ඔල්වරසන් පවත්වති, අපොළුති, සිනහසෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝවැස්සෝ බඳදිලි වැ නමස්කාර කෙරෙත්.

26. ඉදින් මේ ලොකනාථයන් ගේ සස්න වරදමෝ නම් අනාගත-කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

27. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛතීර්ථය වැරැද යටැ තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද-

28. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ'යි.

29. මම ඒ බුදුනුදුගේ බස් අසා මත්තෙහි සිත් වඩා දස පාරමීන් පූරන පිණිස උග්‍ර වූ ව්‍රතය අධිෂ්ඨාන කෙළෙමි.

30. මහර්ෂි වූ නාරද බුදුන්ගේ නගරය ධන්‍යවතී නම, සුදෙව නම් ක්ෂත්‍රිය තෙම පිතෘ වීය, මව් තොමෝ අනොමා නම් වූ.

31. උන් වහන්සේ නව දහසක් හවුරුදු ගිහිගෙයි විසූහ, ඔබට ජිත යැ විජිත යැ විජිතාභිරාම යැ යි උතුම් වූ තුන්පහයෙක් වී.

32. මොනොවට සරහනලද නෙසාලිස් දහසක් පිරිවර ස්ත්‍රීහු වූහ, මෙහෙසි තොමෝ විජිතසෙනා නමු, පුත්‍ර තෙම නන්දුත්තර නම් වී.

33. ලොකනායක වූ නාරද මුනිහු සතර පෙරනිමිති දැක පියගමනින් මහබිනික්මන් කළහ, සතියක් මුළුල්ලෙහි ප්‍රධන්වීර්‍ය කළහ.

34. බ්‍රහ්මුනා යාචිතො සන්තො නාරදො ලොකනායකො
වත්ති චක්කං මහාවීරො ධනඤ්ජයු'ය්‍යාන මුත්තමෙ.

35. භද්දසාලො ජිතමිත්තො අහෙසුං අග්ගසාවකා
වාසෙට්ඨො නාමු'පට්ඨාකො නාරදස්ස මහෙසිනො.

36. උත්තරා ඵග්ගුනී චෙ'ව අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො මහාසොණො'ති වුච්චති.

37. උග්ගරින්දො ච වසභො ච අහෙසුං අග්ගුපට්ඨකා
ඉන්දීවරී ච උනන්දී ච[1] අහෙසුං අග්ගු'පට්ඨිකා.

38. අට්ඨාසීතිරතනානි අච්චුග්ගතො මහාමුනි
කඤ්චනග්ඝියසංකාසො දසසහස්සී විරොචති[2].

39. තස්ස ව්‍යාමප්පභා කායා නිද්ධාවති දිසොදිසං
නිරන්තරං දිවාරත්තිං යොජනං ඵරතෙ තදා[3].

40. න කෙචි තෙන සමයෙන සමන්තා යොජනෙ ජනා
උක්කා පදීපෙ උජ්ජාලෙන්ති[4] බුද්ධරංසෙන ඔත්ථටා.

41. නවුතිවස්සසහස්සානි අයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

42. යථා උළූහි ගගනං විචිත්තං උපසොභති
තථෙ'ව සාසනං තස්ස අරහන්තෙහි සොභති.

43. සංසාරසොතං තරණාය සෙසකෙ පටිපන්නකෙ
ධම්මසෙතුං දළ්හං කත්වා නිබ්බුතො සො නරාසභො.

44. සො'පි බුද්ධො අසමසමො තෙ'පි ඛීණාසවා අතුලතෙජා
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා.

45. නාරදො ජිනවසභො නිබ්බුතො සුදස්සනෙ පුරෙ
තත්ථෙ'ව ජිනථූපවරො චතුයොජන'මුග්ගතො'ති.

**නාරද බුද්ධවංසො නවමො.**

1. ඉන්දවරී ච වණ්ඩී ච – මජසං. ඉන්දවරී ච ගණ්ඩී ච – සයා.
2. විරොචථ – සීමු.
3. දිසා – සීමු. සද – සයා, මජසං.
4. උජ්ජලෙන්ති – PTS.

34. මහත්වීර්‍ය ඇති ලොකනායක වූ නාරදමුනිඳුහු මහබඹහු විසින් අයැදනාලදහු උතුම් වූ ධනඤ්ජය නම් උයන්හි දම්සක් පැවැත්වූහ.

35. මහර්ෂි වූ නාරදමුනිඳුනට භද්දසාල යැ ජිතමිත්‍ර යැ යි අගසවු දෙනමක් වූහ. වාසෙට්ඨ නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ.

36. උත්තරා යැ ඵග්ගුනී යැ යි අග්‍රශ්‍රාවිකා දෙනමක් වූහ. ඒ භාග්‍ය-වතුන්ගේ බොධිය මහාසොණ (මහමුරුත) යයි කියනුලැබෙයි.

37. උග්ගරින්ද යැ වසභ යැ යි අගඋවටුවෝ දෙදෙනෙක් වූහ. ඉන්දිවරියැ උන්දී යැ යි අගඋවට දෙදෙනෙක් වූහ.

38. අට අසූරියන් උස්වූ සම්බුදුහු රන්අැගැයක් සෙයින් දසදහසක් සක්වළ බැබැළ වූහ.

39. එකල්හි උන් වහන්සේගේ සිරුරින් නික්මුණු ව්‍යාමප්‍රභාව දිශානුදිශාවන්හි යොදුනක් මුළුල්ලෙහි දිවාරය නිරතුරු පැතිරෙයි.

40. එසමයෙහි හාත්පසැ යොදුනෙක්හි බුදුරැසින් වතළ කිසි ජන කෙනෙක් පහන් නො දල්වත්.

41. එකල්හි අනූදහසක් හවුරුදු ආයු පැනෙයි. උන් වහන්සේ ඒතාක් කල් සිටුනාහු බොහෝ ජනසමූහයා (සසරකතරින්) තරණය කරවූහ.

42. යම්සේ ගුවන්තලය තාරකාවන් කරණකොට ගෙන හොබනේ ද, එසෙයින් මැ උන් වහන්සේගේ සස්න රහතුන් කරණ කොට ගෙන හොබී.

43. නරොත්තම වූ ඒ බුදුහු සෙසු ප්‍රතිපන්නයන් සංසාරශ්‍රොතස තරණය කරණ පිණිස දහම්හෙය දැඩි කොට පිරිනිවියහ.

44. අසමසම වූ ඒ බුදුහු ද අතුල්‍ය වූ තෙජස් ඇති ඒ ක්ෂීණාසුවයෝ ද යන එහැම අතුරුදහන් විය හැම සංඛරහු සිස්වූවාහු නො ද?

45. ජිනොත්තම වූ නාරදමුනිහු සුදර්ශන පුරයෙහි පිරිනිවියහ. එහි මැ උතුම් වූ ජිනස්තූපය සිව්යොත්නෙක් උස් වූයේ යි.

**නවවැනි නාරද බුද්ධවංශ යි.**

## 10. පදුමුත්තර බුද්ධවංසො

1. නාරදස්ස අපරෙන සම්බුද්ධො දිපදුත්තමො[1]
පදුමුත්තරො නාම ජිනො අක්ඛොභො[2] සාගරූපමො.

2. මණ්ඩකප්පො'ව සො ආසි යම්හි බුද්ධො[3] අජායථ.
උස්සන්නකුසලා ජනතා තම්හි කප්පෙ[4] අජායථ.

3. පදුමුත්තරස්ස භගවතො පඨමෙ ධම්මදෙසනෙ
කොටිසතසහස්සානං ධම්මාභිසමයො අහු.

4. තතො පරම්පි වස්සන්තෙ තප්පයන්තෙ ච පාණිනො
සත්තතිංසසතසහස්සානං දුතියා'භිසමයො අහු.

5. යම්හි කාලෙ මහාවීරො ආනන්දං උපසඞ්කමි
පිතුසන්තිකමුපාගන්ත්වා අහනි[5] අමතදුන්දුභිං.

6. ආහතෙ[6] අමතභෙරිම්හි[7] වස්සන්තෙ ධම්මවුට්ඨියා[8]
පඤ්ඤාසසතසහස්සානං තතියා'භිසමයො අහු.

7. ඔවාදකො විඤ්ඤාපකො තාරකො සබ්බපාණිනං
දෙසනාකුසලො බුද්ධො තාරෙසි ජනතං බහුං.

8. සන්නිපාතා තයො ආසුං පදුමුත්තරස්ස සත්ථුනො
කොටිසතසහස්සානං පඨමො ආසි සමාගමො.

9. යදා බුද්ධො අසමසමො වසි වෙභාරපබ්බතෙ
නවුතිකොටිසහස්සානං දුතියො ආසි සමාගමො.

10. පුන චාරිකං පක්කන්තෙ ගාමනිගමරට්ඨතො
අසීතිකොටිසහස්සානං තතියො ආසි සමාගමො.

11. අහං තෙන සමයෙන ජටිලො නාම රට්ඨිකො
සම්බුද්ධපමුඛං සඞ්ඝං සහත්තං දුස්සම'දාස'හං.

---

1. දිවිපදුත්තමො – සීමු.
2. අක්ඛොබ්භො – මචි. PTS.
3. බුද්ධා – සීමු.
4. කාලෙ – සීමු.
5. ආහනි – මජසං.
6. අහතෙ – සීමු.
7. ධම්මභෙරිම්හි – සීමු අමතදුන්දුභිං PTS.
8. වුට්ඨියා – සීමු.

## 10. පදුමුත්තර බුද්ධවංශය

1. නාරද නම් සම්මාසම්බුදුනට මෑතභාගයෙහි අකම්ප්‍ය වූ සාගරයට බඳු උපමා ඇති පියුමතුරා නම් ද්විපදෙත්තම සම්මාසම්බුදුහු (ලොව්, පහළ වූහ.)

2. යම් කපෙක පියුමතුරා සම්මාසම්බුදුහු උපන්සේක් ද, හේ මණ්ඩකල්පය බඳු වී යැ. එකප්හි උත්සන්න වූ කුසල් ඇති ජනසමූහය උපන.

3. පියුමතුරා බුදුන්ගේ ප්‍රථමධර්මදෙශනායෙහි කෙළලක්ෂයක් ප්‍රාණීන්ට ධර්මාභිසමය වීය.

4. එයින් මෑතභාගයෙහිදු ප්‍රාණීන් පිණවන වර්ෂාසෘතුහුගේ අන්‍යයෙහි සත්තිස් ලක්ෂයක් ප්‍රාණීන්ට ද්විතීයාභිසමය වී.

5. යම් කලෙක මහත්වීර්‍ය්‍ය ඇති බුදුහු ආනන්ද නම් වූ පියමහරජුන් කරා එළැඹීසේක් ද, එකල්හි පියරජුන් කරා පැමිණ අමා බෙර පහළහ.

6. අමාබෙර පහළ කල්හි දහම්වැසි වස්නා කල්හි පනස්ලක්ෂයක් ප්‍රාණීන්ට තෘතීයාභිසමය වී.

7. හැම සත්නට සරණශීලාදීන් අවවාද කරන සිව්සස් අවබොධ කරන චතුරොඝ තරණය කරවන දෙශනායෙහි නිපුණ වූ බුදුහු බොහෝ ජනසමූහයා සසරකතරින් තරණය කරවූසේක.

8. පියුමතුරා බුදුන්ට තුන් ශ්‍රාවකසන්නිපාත කෙනෙක් වූහ. කෙළලක්ෂයක් ශ්‍රාවකයනගේ ප්‍රථමසමාගමය වී.

9. යම් කලෙකැ අසමසම වූ බුදුහු වෙභාරපර්වතයෙහි වස්වුසූසේක් ද එකල්හි අනූදහසක් ශ්‍රාවකයන්ගේ ද්විතීය සමාගමය වී.

10. නැවත චාරිකායෙහි නික්මුණු කල්හි ගම්නියම්ගම්දනව්යෙන් නික්ම පැවිදි වූ අසූ කෙළදහසක් ශ්‍රාවකයනගේ තෘතීය සමාගමය වී.

11. එසමයෙහි මම ජටිල නම් මහරටි වූයෙම් බුදුපාමොක්සඟනට සිවුරු සහිත උතුම් දනක් දිනිමි.

12. සො'පි මං බුද්ධො[1] ව්‍යාකාසි සඞ්ඝමජ්ඣෙ නිසීදිය
සතසහස්සෙ ඉතො කප්පෙ අයං බුද්ධො භවිස්සති.

13. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

14. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසං පග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

15. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදාය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

16. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

17. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

18. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමු'පට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

19. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථොති පවුච්චති.

20. චිත්තො ච හත්ථාලවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

21. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

22. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

1. තද - සීමු.

12. ඒ පියුමතුරා සර්වඥයන් වහන්සේ ද සඟමැද වැඩහිඳ මේ තෙම මෙයින් ලක්ෂයක් වන කල්පයෙහි බුදු වන්නේ යැ'යි මට විවරණ දුන්සේක.

13. එකල්හි තථාගත වූ මේ තෙමේ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය්‍යය වඩා දුෂ්කරක්‍රියා කොට–

14. තථාගත තෙම අජපල් නම් නුගරුක්මුල්හි හිඳ එහි දී කිරිපිඬු පිළිගෙන නිල්දලාභෝතෙරට එළැඹෙයි.

15. ඒ පස්මරුන් දනූ බුදුහු නිල්දලාභෝතෙර හිඳ කිරිපිඬු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තමමාර්ගයෙන් ඇසැතුබෝරුක් වෙත එළැඹෙයි.

16. ඉක්බිති ඒ මහායසස් ඇති අනුත්තර වූ මහසත් බෝමැඩ පැදකුණු කොට ඇසැතුබෝරුක් මුල්හි හිඳ බුදු වන්නේ යි.

17. මොවුන්ගේ ජනිකමව් තොමෝ මායා නම් වන්නී යැ. පිතෘ තෙම ශුද්ධෝදන නම් වන්නේ යැ, මේ තෙම ගෞතම නම් වන්නේ යි.

18. කෝලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායක තෙර කෙනෙක් ඒ බුදුන්ට උපස්ථාන කරන්නාහ.

19. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ බුදුන්ගේ බොධිය 'ඇසැතු' යයි කියනුලැබෙයි.

20. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අග උවටු වන්නාහ, උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අගඋවටු වන්නාහ. යසස් ඇති ඒ ගෞතම බුදුන්ට හවුරුදුසියයෙක් ආයු වෙයි.

21. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා 'මේ තෙම බුද්ධාඞ්කුරයෙකැ' යි දෙව්මිනිස්සු සතුටු වූවාහු–

22. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝවැස්සෝ බඳදිලි වැ නමස්කාර කෙරෙත්.

23. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

24. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

25. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

26. තස්සා'පි වචනං සුත්වා උත්තරිං වතමධිට්ඨහිං
අකාසි'මුග්ගං දළ්හධිතිං දසපාරමිපූරියා.

27. ව්‍යාහතා[1] තිත්ථියා සබ්බෙ විමනා දුම්මනා තදා
න තෙසං කෙචි පරිචරන්ති රට්ඨතො නිච්ඡුභන්ති තෙ.

28. සබ්බෙ තත්ථ සමාගන්ත්වා උපගඤ්ඡුං[2] බුද්ධසන්තිකෙ
තුවං නාථො මහාවීර සරණං හොහි චක්ඛුම[3].

29. අනුකම්පකො කාරුණිකො හිතෙසී සබ්බපාණිනං
සම්පත්තෙ තිත්ථියෙ සබ්බෙ පඤ්චසීලෙ පතිට්ඨහි.

30. එවං නිරාකුලං ආසි සුඤ්ඤකං තිත්ථියෙහි තං
විචිත්තං අරහන්තෙහි වසීභූතෙහි තාදිහි.

31. නගරං හංසවතීනාම[4] ආනන්දො නාම ඛත්තියො
සුජාතා නාම ජනිකා පදුමුත්තරස්ස මහෙසිනො.

32. දස[5]වස්සසහස්සානි අගාරමජ්ඣසො වසි
නරවාහනො යසො වසවත්ති තයො පාසාදමුත්තමා.

33. තිචත්තාරීසසහස්සානි නාරියො සමලඞ්කතා
වසුදත්තා නාම නාරී උත්තරො නාම අත්‍රජො.

34. නිමිත්තෙ චතුරො දිස්වා පාසාදෙනා'භිනික්ඛමි
සත්තාහං පධානචාරං අචරී පුරිසුත්තමො.

---

1. ඛ්‍යාහතා - මජසං
2. උපගච්ඡුං - සීමු, PTS.
3. චක්ඛුමා - සීමු.
4. හෙමවතී - සීමු.
5. නවං - මනුප,

23. ඉදින් මේ ලෝකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

24. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛතීර්ථය වැරදූ යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද,

25. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ'යි.

26. මම ඒ බුදුනුදුගේ බස් අසා මත්තෙහි ව්‍රතය අධිෂ්ඨාන කෙළෙමි, දස පාරමීන් පූරන පිණිස උග්‍ර වූ දෑඪවීර්‍ය්‍යය කෙළෙමි.

27. එකල්හි හැම තීර්ථකයෝ නසනලද මානදප් ඇත්තාහු විරූපසිත් ඇත්තාහු නො සතුටු සිත් ඇති වූහ, ඔවුනට කිසි කෙනෙක් සත්කාරාදි පිරියම් නො කෙරෙති, ඔවුන් සිය රටින් නෙරත්.

28. ඔහු හැම දෙන රැස් වැ ඒ බුදුන් වෙත එළැඹියාහ. පසැස්ඇති මහාවීරයන් වහන්ස, නුඹ වහන්සේ ශාස්තෘ වූවහ, සරණ වුව මැනැවැ'යි. (සරණ ගියහ.)

29. හැම සත්නට අනුකම්පා ඇති කාරුණික වූ හිතෛෂී වූ සර්වඥයන් වහන්සේ පැමිණි හැම තීර්ථකයන් පන්සිල්හි පිහිටි වූහ.

30. මෙසේ ඒ බුදුන්ගේ සස්න තීර්ථකයන් විසින් අනාකුල වූයේ සිස් වූයේ විය, වශී බවට පැමිණි තාදීගුණ ඇති රහතුන් විසින් අතිශයින් විසිතුරු වී.

31. මහර්ෂි වූ පියුමතුරා බුදුන්ගේ නගරය හංසවතී නම, ආනන්ද නම් ක්ෂත්‍රිය තෙම පිතෘ වී යැ, මව් තොමෝ සුජාතා නම් වූ.

32. උන් වහන්සේ දසදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. ඔබට නරවාහන යැ යස යැ වසවත්ති යැ යි උතුම් තුන්පහයෙක් වී.

33. මොනවට සරහනලද පරිවාරස්ත්‍රීහු තෙසාළිස්දහසක් වූහ, මෙහෙසි තොමෝ වසුදත්තා නම් වූ, පුත්‍ර තෙම උත්තර නම් වී.

34. පුරුෂොත්තම වූ පියුමතුරා බුදුහු සතර පෙර නිමිති දැක ප්‍රාසදය හා සමග මහභිනික්මන් කළහ, සතියක් මුළුල්ලෙහි ප්‍රධන්වීර්‍ය්‍ය කළහු-

35. බ්‍රහ්මුනා යාචිතො සත්ථා පදුමුත්තරො විනායකො[1]
වත්ති චක්කං මහාවීරො මිථිලුය්‍යානමුත්තමෙ.

36. දෙවලො ච සුජාතො ච අහෙසුං අග්ගසාවකා
සුමනො නාමුපට්ඨාකො පදුමුත්තරස්ස සත්ථුනො[2].

37. අමිතා අසමා චෙව අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො සලලො'ති පවුච්චති.

38. විතිණ්ණො චෙව තිස්සො ච අහෙසුං අග්ගු'පට්ඨාකා
හත්ථා චෙව විචිත්තා ච අහෙසුං අග්ගු'පට්ඨිකා.

39. අට්ඨපඤ්ඤාසරතනං[3] අච්චුග්ගතො මහාමුනි
කඤ්චනග්ඝිය[4] සංකාසො වත්තිංසවරලක්ඛණො.

40. කුඩ්ඩා කවාටා භිත්ති ච රුක්ඛා නගසිලුච්චයා
න තස්සා'වරණං ආසි සමන්තා ද්වාදසයොජනෙ.

41. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

42. සන්තාරෙත්වා බහුජනං ඡින්දිත්වා සබ්බසංසයං
ජලිත්වා අග්ගික්ඛන්ධො'ව නිබ්බුතො සො සසාවකො.

43. පදුමුත්තරො ජිනො බුද්ධො නන්දාරාමම්හි නිබ්බුතො
තත්ථෙ'ව තස්ස[5] ථූපවරො ද්වාදසුබ්බෙධ යොජනො'ති.

**පදුමුත්තරබුද්ධවංසො දසමො.**

---

1. පදුමුත්තරනායකො – මනුප,
2. මහෙසිනො – මවි. PTS.
3. අට්ඨපණ්ණසං – මජසං
4. කඤ්චනග්ඝික – සීමු.
5. තත්ථෙවස්ස – මජසං.

35. මහත්වීර්‍ය්‍ය ඇති පදුමුත්තර සර්වඥයන් වහන්සේ මහබඹහු විසින් අයදනාලදහු උතුම් වූ මිථිලා නම් උයන්හි දී දම්සක් පැවැත්වූහ.

36. ශාස්තෘ වූ පියුමතුරා බුදුන්ට දෙවල යැ සුජාත යැ යි අගසවු දෙනමක් වූහ, සුමන නම් උපස්ථායක තෙර කෙනෙක් වූහු.

37. අමිතා යැ අසමා යැ යි අග්‍රශ්‍රාවිකා දෙනමක් වූහ, ඒ භාග්‍ය වතුන්ගේ බොධිය 'සලල' යයි කියනු ලැබෙයි.

38. විතිණ්ණ යැ තිස්ස යැ යන දෙදෙන අගඋවටු වූහ. හස්ථා යැ විචිත්‍රා යැ යන දෙදෙන අගඋවට වූහ.

39. අටපනස්රියන් උස් වූ මහමුනිහු උතුම් වූ දෙතිස්මහපුරිස්ලකුණු ඇතියාහු කසුන්ඇගෑයක් බඳු වූහ.

40. ඒ පියුමතුරා බුදුන්ට හාත්පසැ දෙළොස් යොදුන් තැන්හි කොඩවරඤවුරු යැ කවුළු යැ බිත්ති යැ රුක් යැ ගල්පවු යැ යන මොහු ආවරණ නැති.

41. එකල්හි සියදහසක් හවුරුදු ආයු වී, එතෙක් වැඩසිටි ඒ බුදුහු බොහෝ ජනසමූහයා සසරකතරින් තැරූ වූහ.

42. බොහෝ ජනයා සසරින් තරවා සියලු සැක සිඳ ගිනිකඳ සෙයින් දිලිහි ශ්‍රාවකයන් සහිත වූ ඒ පියුමතුරා බුදුහු පිරිනිවිසේක.

43. පස්මරුන් දිනූ පියුමතුරා බුදුහු නන්‍දාරාමයෙහි පිරිනිවියහ, එහි මැ උන් වහන්සේගේ උතුම් ස්තූපය දෙළොස්යොදුන් උස්කොට බඳවනලදි.

දස වැනි පදුමුත්තර බුද්ධවංශ යි.

# 11. සුමෙධ බුද්ධවංසො

1. පදුමුත්තරස්ස අපරෙන සුමෙධො නාම නායකො
දුරාසදො උග්ගතෙජො සබ්බලොකුත්තමො[1] මුනි.

2. පසන්නනෙත්තො සුමුඛො බ්‍රහා උජු පතාපවා
හිතෙසී සබ්බසත්තානං බහූ මොචෙසි බන්ධනා.

3. යදා බුද්ධො පාපුණිත්වා කෙවලං බොධිමුත්තමං
සුදස්සනම්හි නගරෙ ධම්මචක්කං පවත්තයි,

4. තස්සාභිසමයා තීණි අහෙසුං ධම්මදෙසනෙ
කොටිසතසහස්සානං පඨමා'භිසමයො අහු.

5. පුනාපරං කුම්භකණ්ණං යක්ඛං සො දමයී ජිනො
නවුති කොටිසහස්සානං දුතියාභිසමයො අහු.

6. පුනාපරං අමිතයසො චතුසච්චං පකාසයි
අසීති කොටිසහස්සානං තතියාභිසමයො අහු.

7. සන්නිපාතා තයො ආසුං සුමෙධස්ස මහෙසිනො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන'තාදිනං[2].

8. සුදස්සනං නගරවරං උපගඤ්ජි ජිනො යදා
තදා ඛීණාසවා භික්ඛූ සමිංසු සතකොටියො.

9. පුනාපරං දෙවකූටෙ භික්ඛූනං කඨිනත්ථතෙ
තදා නවුති කොටීනං දුතියො ආසි සමාගමො.

10. පුනාපරං දසබලො යදා චරති චාරිකං
තදා අසීතිකොටීනං තතියො ආසි සමාගමො.

11. අහං තෙන සමයෙන උත්තරො නාම මාණවො
අසීතිකොටියො මය්හං ඝරෙ සන්නිචිතං ධනං.

---

1. ලොකුත්තරො – සීමු.
2. චිත්තානතාදිනං – මනුප,

# 11. සුමෙධ බුද්ධවංශය

1. පියුමතුරා නම් බුදුන්ට මෑතභාගයෙහි ලොකනායක වූ නො ගැටියහැකි වූ උග්‍රතෙජස් ඇති මුළුලොවට උතුම් වූ සුමෙධ නම් බුදුහු (ලොව පහළ වූ සේක.)

2. පහන් නුවන් ඇති මනා මුව ඇති සිරුරු පමණින් මහත් වූ ඍජුගාත්‍ර ඇති බබළන සිරුරු ඇති හැම සත්නට හිතකර වූ උන් වහන්සේ බොහෝ සත්ත්වයන් සංසාරබන්ධනයෙන් මුදලූ සේක.

3. යම් කලෙකැ සුමෙධ බුදුහු උතුම් වූ පරිපූර්ණ සම්බොධියට පැමිණ සුදර්ශන නගරයෙහි දම්සක් පැවැත් වූ සේක් ද,

4. එකල්හි උන්වහන්සේ ගේ ධර්ම දෙශනායෙහි ධර්මාභිසමය තුනෙක් වී යැ. කෙළ සුවහසක් සත්නට ප්‍රථමාභිසමය වී.

5. යළි පස්මරුන් දිනූ ඒ සුමෙධ බුදුහු කුම්භකර්ණ නම් යක්ෂයා දමනය කළ සේක. (එකල්හි) අනූ කෙළ දහසක් සත්නට ද්විතීයාභි-සමය වී.

6. යළි අපමණ යසස් ඇති බුදුහු චතුස්සත්‍යය ප්‍රකාශ කළහ, (එකල්හි) අසූ කෙළ දහසක් සත්නට තුන් වැනි ධර්මාභිසමය වී.

7. මහර්ෂි වූ සුමෙධ සර්වඥයන් වහන්සේට විගතරාගාදි මල ඇති සන්හුන් සිත් ඇති තාදීගුණ ඇති රහතුන් ගේ සන්නිපාත තුනෙක් වී.

8. යම් කලෙකැ පස්මරුන් දිනූ බුදුහු සුදර්ශන නම් නගරවරය කරා එළැඹි සේක් ද, එකල්හි ක්ෂීණාස්‍රව භික්ෂූහු සියක් කොටියක් රැස්වූහ.

9. යළි දෙවකූටයෙහි භික්ෂූන්ට කෙළින් සිවුරු අතුළ කල්හි අනූ කෙළක් ශ්‍රාවකයන් ගේ ද්විතීය සමාගමය වී.

10. යළි යම් කලෙකැ දසබල බුදුහු චාරිකායෙහි වැඩිසේක් ද එකල්හි අසූ කොටියක් ශ්‍රාවකයන් ගේ තෘතීය සමාගමය වී.

11. එසමයෙහි මම් උත්තර නම් මාණවයෙක් වීමි, මාගේ ගෙහි අසූ කෙළක් ධනය රැස් කරන ලද වී.

12. කෙවලං සබ්බං ඤත්වාන සසඞ්ඛෙ ලොකනායකෙ[1]
සරණං තස්සු'පාගඤ්ඡිං පබ්බජ්ජඤ්චා'භිරොචයිං[2].

13. සො'පි මං බුද්ධො[3] ව්‍යාකාසි කරොන්තො අනුමොදනං
තිංසකප්පසහස්සම්හි අයං බුද්ධො භවිස්සති.

14. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

15. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථපායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

16. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

17. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

18. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

19. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

20. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

21. චිත්තො ච හත්ථාලවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

22. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

23. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

1. සසඞ්ඛං ලොකනායකං - PTS
2. අභිරොචයිං - PTS
3. තද - මවි.

12. සියලු ධනය නිරවශේෂයෙන් සඟුන් සහිත ලොකනායකයන් විෂයයෙහි පුද උන් වහන්සේගේ සරණයට පැමිණියෙමි, පැවිද්ද ද රුචි කෙළෙමි.

13. ඒ සුමෙධ බුදුහු ද අනුමොදනා කරන්නාහු 'මේ තෙම මෙයින් තිස්දහසක් වන කප්හි බුදු වන්නේ යැ' යි මට විවරණ දුන් සේක.

14. එකල්හි තථාගත වූ මේ තෙමේ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීය‍ර්‍යය වඩා දුෂ්කරක්‍රියා කොට -

15. තථාගත තෙම අජපල් නම් නුගරුක්මුල්හි හිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලාහෝතෙරට එළැඹෙයි.

16. පස්මරුන් දිනූ මුනිහු නිල්දලාහෝතෙර හිඳ කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තම මාර්ගයෙන් ඇසැතු බෝරුක් වෙත එළැඹෙයි.

17. ඉක්බිති මහායසස් ඇති අනුත්තර වූ මහසත් බෝ මැඩ පැදකුණු කොට ඇසැතු බෝ රුක මුල්හි හිඳ බුදු වන්නේ යි.

18. මොවුන්ගේ ජනික මව මායා නම් වන්නී යැ, පිය තෙමේ ශුද්ධෝදන නම් වන්නේ යැ, මේ තෙම ගෞතම නම් වන්නේ යි.

19. කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ; ආනන්ද නම් උපස්ථායක තෙර කෙනෙක් ඒ බුදුනට උපස්ථාන කරන්නාහ.

20. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබෙයි.

21. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වන්නාහ. යසස් ඇති ඒ ගෞතම බුදුන්ට හවුරුදු සියයෙක් ආයු වන්නේ යි.

22. අසම වූ මහර්ෂීන්ගේ මෙ බස් අසා 'මේ තෙම බුද්ධබීජාඞ්කුරයෙකැ' යි සතුටු වූ දෙව් මිනිස්සු-

23. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝ වැස්සෝ බඳිළි වැ නමස්කාර කෙරෙත්.

24. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

25. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

26. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

27. තස්සා'පි වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දසපාරමි පූරියා.

28. සුත්තන්තං විනයඤ්චාපි නවඞ්ගං සත්ථුසාසනං
සබ්බං පරියාපුණිත්වාන සොභයිං ජිනසාසනං.

29. තත්ථ'ප්පමත්තො විහරන්තො නිසජ්ජට්ඨානචඞ්කමෙ
අභිඤ්ඤාසු පාරමිං ගන්ත්වා බ්‍රහ්මලොකමගච්ඡ'හං.[1]

30. සුදස්සනං නාම නගරං සුදත්තො නාම ඛත්තියො
සුදත්තා නාම ජනිකා සුමෙධස්ස මහෙසිනො.

31. නවවස්සසහස්සානි අගාරමජ්ඣසො වසි
සුචන්දනක කොඤ්ච සිරිවඩ්ඪා[2] තයො පාසාද මුත්තමා.

32. ති සොළසසහස්සානි නාරියො සමලඞ්කතා
සුමනා නාම සා නාරී පුනබ්බසුමිත්තො[3] නාම අත්‍රජො.

33. නිමිත්තෙ චතුරො දිස්වා හත්ථියානෙන නික්ඛමි
අනූනකං අට්ඨමාසං[4] පධානං පදහී ජිනො.

34. බ්‍රහ්මුනා යාචිතො සන්තො සුමෙධො ලොකනායකො
වත්ති චක්කං මහාවීරො සුදස්සනුය්‍යානමුත්තමෙ.

35. සරණො සබ්බකාමො ච අහෙසුං අග්ගසාවකා
සාගරො නාමුපට්ඨාකො සුමෙධස්ස මහෙසිනො.

---

1. බ්‍රහ්මලොකමගච්ඡහං – සීමු.
2. සුචන්ද කඤ්චන සිරිවඩ්ඪා – මජසං.
සුගන්ධො කඤ්චනො සිරිවඩ්ඪො – ස්‍යා.
3. පුනබ්බසු – මජසං.
පුනබ්බො – ස්‍යා.
4. අඩ්ඪමාසං – මජසං, මනුප.

24. ඉදින් මේ ලොකනාථයන් ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

25. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛ තීර්ථය වැරැද, යටැ තොටැහි ගෙන මහානදිය තරණය කෙරෙත් ද,

26. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ පස්මරුන් දිනූ සම්බුදුන් හරමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමුවන්නම් හ.

27. ඒ බුදුනුදු ගේ බස් අසා බෙහෙවින් සිත පැහැදවීමි, දස පාරමීන් පුරන පිණිස මත්තෙහි ව්‍රතාධිෂ්ඨානය කෙළෙමි.

28. සූත්‍රාන්තය ද විනය ද යි නවාඞ්ගශාස්තෘ ශාසනය සියල්ල පිරිවහා සර්වඥශාසනය හෙබැ වීමි.

29. එහි මම හිඳුම් සිටුම් සක්මන්හි අප්‍රමත්ත වැ වාස කරන්නෙම් අභිඥවන්හි පරතෙරට ගොස් බඹලොවට ගියෙමි.

30. මහර්ෂි වූ සුමෙධ බුදුන් ගේ නගරය සුදර්ශන නම් වී යැ, සුදත්ත නම් ක්ෂත්‍රිය තෙම පියා වී යැ, මව් තොමෝ සුදත්ත නම් වූ.

31. ඒ සුමෙධ සම්මාසම්බුදුහු නව දහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. ඔබට සුචන්දනක යැ කොඤ්ච යැ සිරිවඩ්ඪ යැ යි උතුම් වූ තුන් පහයෙක් වී.

32. මොනොවට සරසන ලද අටසාළිස් දහසක් පරිවාරස්ත්‍රීහු වූහ. ඒ මෙහෙසි තොමෝ සුමනා නමු. පුත්‍ර තෙම පුනබ්බ සුමිත්ත නම් වී.

33. පස්මරුන් දිනූ බුදුහු සතර පෙර නිමිති දැක ඇත් යානයෙකින් මහබිනික්මන් කළහ, පූරා අට මසක් මුළුල්ලෙහි ප්‍රධන්වීර්‍ය්‍යය කළහ.

34. මහත් වීර්‍ය්‍ය ඇති සුමෙධ නම් ලොක නායකයන් වහන්සේ මහබඹහු විසින් අයදනා ලදහු උතුම් වූ සුදර්ශන උයන්හිදී දම්සක් පැවැත්වූහ.

35. මහර්ෂි වූ සුමෙධ බුදුන්ට සරණ යැ සබ්බකාම යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වූහ. සාගර නම් උපස්ථායක තෙර කෙනෙක් වූහ.

36. රාමා චෙව සුරාමා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො මහානීපොති[1] වුච්චති.

37. උරුවෙලො ච යසවො ච අහෙසුං අග්ගු'පට්ඨකා
යසොධරා සිරිමා ච අහෙසුං අග්ගුපට්ඨිකා.

38. අට්ඨාසීති රතනානි අච්චුග්ගතො මහාමුනි
ඔභාසෙසි[2] දිසා සබ්බා චන්දො තාරාගණෙ[3] යථා.

39. චක්කවත්තිමණී නාම යථා තපති යොජනං
තථෙ'ව තස්ස රතනං සමන්තා ඵරති යොජනං.

40. නවුතිවස්සසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

41. තෙවිජ්ජඡළභිඤ්ඤෙහි බලප්පත්තෙහි තාදිහි
සමාකුලමිදං ආසි අරහන්තෙහි සාධුහි[4].

42. තෙ'පි සබ්බෙ අමිතයසා විප්පමුත්තා නිරූපධී
ඤාණාලොකං දස්සයිත්වා නිබ්බුතා තෙ මහායසා.

43. සුමෙධො ජිනවරො බුද්ධො මෙධාරාමම්හි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො'ති.

සුමෙධ බුද්ධවංසො.

---

1. නිම්බොති - සීමු, නිම්බරුක්ඛොති - ස්‍යා.
2. පභාසෙති - මචි, ඔභාසෙති - ස්‍යා.
3. තාරගණෙ - මචි.
4. තාදිහි PTS.
සාසනං - ස්‍යා.

36. රාමා යැ සුරාමා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වූහ. ඒ භාග්‍යවතුන් ගේ බොධිය 'කොළොම්රුක' යයි කියනු ලැබේ.

37. උරුවෙල යැ යසව යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වූහ. යසොධරා යැ සිරිමා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වූහ.

38. අට අසූරියන් උස්වූ මහමුනිහු තරුගණ මැද පුන්සඳ සෙයින් හැම දික් බැබැළ වූහ.

39. යම් සේ සක්විති රජක්හු ගේ මිණිරුවන යොදුනක් තැන් බබළා ද, එසෙයින් මැ උන් වහන්සේ ගේ ආභාරත්නය හාත්පසැ යොදුනක් තැන් පැතිරෙයි.

40. එකල්හි අනූ දහසක් හවුරුදු ආයු පැනෙයි, එතෙක් වැඩසිටි උන් වහන්සේ බොහෝ ජන සමූහය සසර කතරින් තරණය කර වූහ.

41. ත්‍රිවිද්‍යා ඇති ෂඩභිඥ ඇති සෘද්ධිබල ප්‍රාප්ත වූ තාදී ගුණ ඇති රහතුන් ගෙන් මෙ සස්න (මිහිතලය හෝ) ගැවැසිගත්තේ යි.

42. අපමණ පිරිවර ඇති කෙලෙසුන් කෙරෙන් මිදුණු උපධි රහිත වූ මහායසස් ඇති එ හැම රහත්හු ද ඥනාලොකය දක්වා පිරිනිවියහ.

43. ජිනොත්තම වූ සුමෙධ නම් බුදුහු මෙධාරාමයෙහි පිරිනිවියහ, ධාතූහු ඒ ඒ ප්‍රදෙශයෙහි පතළාහ යි.

**එකොළොස් වැනි සුමෙධ බුද්ධවංශය යි.**

## 12. සුජාත බුද්ධවංසො

1. තත්ථෙ'ව මණ්ඩකප්පම්හි සුජාතො නාම නායකො
සීහහනූ'සභක්ඛන්ධො අප්පමෙය්‍යො දුරාසදො.

2. චන්දෝ'ව විමලො සුද්ධො සතරංසී'ව පතාපවා[1]
එවං සොභති සම්බුද්ධො ජලන්තො සිරියා සදා[2].

3. පාපුණිත්වාන සම්බුද්ධො කෙවලං බොධිමුත්තමං
සුමඞ්ගලම්හි නගරෙ ධම්මචක්කං පවත්තයි.

4. දෙසෙන්තෙ පවරං ධම්මං සුජාතෙ ලොකනායකෙ
අසීතිකොටී අභිසමිංසු පඨමෙ ධම්මදෙසනෙ.

5. යදා සුජාතො අමිතයසො දෙවෙ වස්සං උපාගමි
සත්තතිංසසහස්සානං දුතියාභිසමයො අහු.

6. යදා සුජාතො අසමසමො උපගඤ්ජි[3] පිතුසන්තිකං
සට්ඨිසතසහස්සානං තතියාභිසමයො අහු.

7. සන්නිපාතා තයො ආසුං සුජාතස්ස මහෙසිනො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන තාදිනං.

8. අභිඤ්ඤාබලපත්තානං අප්පත්තානං[4] භවාභවෙ
සට්ඨීසතසහස්සානි[5] පඨමං සන්නිපතිංසු තෙ.

9. පුනාපරං සන්නිපාතෙ තිදිවොරොහණෙ ජිනෙ
පඤ්ඤාසසතසහස්සානං දුතියො ආසි සමාගමො.

10. උපසඞ්කමන්තො නරවසභං[6] තස්ස යො අග්ගසාවකො
චතූහි සත සහස්සෙහි සම්බුද්ධං උපසඞ්කමි.

---

1. තාපවා – සිමු.
2. පභා – සිමු.
3. උපගච්ඡි – සිමු, මනුප.
4. අප්පමත්තානං – සිමු.
අප්පවත්තා, – පු.
5. සට්ඨීසත සහස්සානං – සිමු.
6. නරාසභං – මජසං, නරමුසභං – සයා.

## 12. සුජාත බුද්ධවංශය

1. එ මැ මණ්ඩ නම් කල්පයෙහි සිංහයකුට බඳු පරිපූර්ණ හනු ඇති වෘෂභයකුට බඳු සම වට කඳට ඇති ප්‍රමාණ නො කටහැකි වූ නො ගැටිය හැකි වූ සුජාත නම් ලොකනායකයන් වහන්සේ පහළ වූහ.

2.. විගත මල ඇති එහෙයින් මැ ශුද්ධ වූ චන්ද්‍රයා යම් සේ ද ප්‍රතාපවත් සූර්‍ය්‍යයා යම් සේ ද, එසෙයින් මැ හැම කල්හි සිරියෙන් බබළන සම්බුදුහු බබළති.

3. සම්බුදුහු උතුම් වූ පරිපූර්ණ සම්බොධියට පැමිණ සුමඞ්ගල නම් නගරයෙහි දී දම්සක් පැවැත් වූහ.

4. සුජාත නම් ලොකනායකයන් වහන්සේ උතුම් වූ දහම් දෙසන කල්හි ප්‍රථම ධර්මදෙශනායෙහි අසූ කෙළක් ප්‍රාණීහු ධර්මාවබොධය කළහ.

5. යම් කලෙකැ අප්‍රමාණ යසස් ඇති සුජාත නම් සම්බුදුහු දෙව්-ලොවැ වස් එළැඹි සේක් ද, එකල්හි සත්තිස් දහසක් සත්නට ද්විතීය ධර්මාභිසමය වී.

6. යම් කලෙකැ අසමසම වූ සුජාත නම් බුදුහු පියරජහු සමීපයට වැඩිසේක් ද, එකල්හි සැටලක්ෂයක් ප්‍රාණීන්ට තුන් වැනි ධර්මාව-බොධය වී.

7. මහර්ෂි වූ සුජාත සර්‍වඥයන් වහන්සේට විගතරාගාදිමල ඇති සන්හුන් සිත් ඇති තාදීගුණ ඇති රහතුන් ගේ සන්නිපාත තුනෙක් වී.

8. අභිඥාබලයට පැමිණි කුදු මහත් භවයට නො පැමිණියවුන් අතුරින් ඒ සැටලක්ෂයක් රහත්හු පළමු වැ රැස් වූහ.

9. යළි පස්මරුන් දිනූ බුදුන් ගේ දෙව්ලොවින් බස්නා සන්නිපාත-යෙහි පනස් ලක්ෂයක් රහතුන් ගේ ද්විතීය සමාගමය වී.

10. ඒ සුජාත නම් බුදුනට යම් අගසවු කෙනෙක් වූවාහු ද, සුදර්ශන නම් වූ උන් වහන්සේ නරශ්‍රෙෂ්ඨ බුදුන් කරා පැමිණෙන්නාහු සාර ලක්ෂයක් පිරිවර හා සමග පැමිණියාහ.

11. අහං තෙන සමයෙන චතුදීපම්හි ඉස්සරො
අන්තලික්ඛචරො ආසිං චක්කවත්ති මහබ්බලො.

12. ලොකෙ අච්ඡරියං දිස්වා අබ්භුතං ලොමහංසනං
උපගන්ත්වාන වන්දිං සො සුජාතං ලොකනායකං.

13. චතුදීපෙ මහාරජ්ජං රතනෙ සත්ත උත්තමෙ
බුද්ධෙ නිය්‍යාදයිත්වාන පබ්බජිං තස්ස සන්තිකෙ.

14. ආරාමිකා ජානපද[1] උට්ඨානං පටිපිණ්ඩිය[2]
උපනෙන්ති භික්ඛුසඞ්ඝස්ස පච්චයං සයනාසනං.

15. සො'පි මං බුද්ධො[3] ව්‍යාකාසි දසසහස්සිම්හි ඉස්සරො
තිංසකප්පසහස්සම්හි අයං බුද්ධො භවිස්සති.

16. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

17. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

18. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො.
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

19. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

20. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

21. කොලිතො උපතිස්සො ච, අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

22. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

23. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

1. ජනපදෙ – සීමු, සයා.
2. පටිපිණ්ඩියං – PTS.
3. තද – මචි.

11. එසමයෙහි මම කොදිව් සහිත සතර දිවයිනෙහි අධිපති වූ අහස්හි හැසිරෙන මහබල ඇති සක්විති රජ වීමි.

12. ඒ මම ලොකයෙහි අද්භූත වූ ලොමුදහගන්වන ආශ්චය්‍යීය දැක සුජාත ලොකනායකයන් වහන්සේ කරා එළැඹ වැන්දෙමි.

13. සිව්මහදිවයින්හි මහරජය උතුම් වූ සත් රුවන බුදුන් විෂය-යෙහි පුද උන් වහන්සේ වෙත පැවිදි වීමි.

14. ආරාමික වූ දනව්වැස්සෝ කරවූවර පුඩු කොට බික්සඟනට චීවරාදි ප්‍රත්‍යය හා සෙනසුන් එළවත්.

15. දස දහසක් සක්වළට ඉසුරු වූ ඒ සුජාත බුදුහු ද 'මේ තෙම මෙයින් තිස්දහස් වන කප්හි බුදු වන්නේ ය'යි මට විවරණ දුන් සේක.

16. එකල්හි තථාගතයෝ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීය්‍යීය වඩා දුෂ්කරක්‍රියා කොට–

17. තථාගතයෝ අජපල් නම් නුගරුක් මුල්හි හිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලාහෝතෙරට එළැඹෙන්නාහ.

18. ඒ පස්මරුන් දිනූ බුදුහු නිල්දලාහෝතෙර හිඳ කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තමමාර්ගයෙන් බොධි මූලය වෙත එළැ-ඹෙන්නාහ.

19. ඉක්බිති මහා යසස් ඇති අනුත්තර වූ මහසත් බෝමැඩ පැදකුණු කොට ඇසැතුරුක්මුල්හි දී බුදු වන්නෝ යැ.

20. මොවුන් ගේ ජනික මව් තොමෝ මායා නම් වන්නී යැ, පිය තෙම ශුද්ධොදන නම් වන්නේ යැ, මේ තෙම ගෞතම නම් වන්නේ යි.

21. කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ, ඒ බුදුනට ආනන්ද නම් උපස්ථායක තෙර කෙනෙක් උපස්ථාන කරන්නාහ.

22. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ, ඒ භාග්‍යවතුන් ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබෙයි.

23. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වන්නාහ, උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වන්නාහ, යසස් ඇති ඒ ගෞතම බුදුන්ට හවුරුදු සියයෙක් ආයු වෙයි.

24. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

25. උක්කුට්ඨිසද්දා වත්තන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා

26. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං.
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

27. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන. උත්තරන්ති මහානදිං.

28. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

29. තස්සා'පි වචනං සුත්වා භීයො හාසං ජනෙස'හං
අධිට්ඨහිං වතං උග්ගං දසපාරමීපූරියා.

30. සුත්තන්තං විනයඤ්චා'පි නවඞ්ගං සත්ථුසාසනං
සබ්බං පරියාපුණිත්වාන සොභයිං ජිනසාසනං.

31. තත්ථ'ප්පමත්තො විහරන්තො බ්‍රහ්මං භාවෙත්ව භාවනං
අභිඤ්ඤාපාරමිං ගන්ත්වා බ්‍රහ්මලොකමගච්ඡහං.

32. සුමඞ්ගලං නාම නගරං උග්ගතො නාම ඛත්තියො
මාතා පභාවතී නාම සුජාතස්ස මහෙසිනො.

33. නවවස්සසහස්සානි අගාරමජ්ඣසො වසි
සිරී උපසිරී නන්දෙ තයො පාසාදමුත්තමා.

34. තෙවීසතිසහස්සානි නාරියො සමලඞ්කතා
සිරිනන්දා නාම නාරී උපසෙනො නාම අත්‍රජො.

35. නිමිත්තෙ චතුරො දිස්වා අස්සයානෙන නික්ඛමි
අනූනනවමාසානි පධානං පදහී ජිනො.

---

* භිය්‍යොහාවෙත්වා මානසං
9 බුද්ධවංසො 26 ගා

24. අසම වූ මහර්ෂීන් ගේ මෙ වදන් අසා 'මේ තෙම බුද්ධ-බීජාඞ්කුරයෙකැ' යි සතුටු වූ දෙව් මිනිස්සු–

25. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති. දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝවැස්සෝ කළ ඇඳිලි ඇති වැ නමස්කාර කෙරෙත්.

26. ඉදින් මේ ලොකනාථයන් ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම් හ.

27. යම් සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛතීර්ථය වැරදූ යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද–

28. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ ජිනපකෂ්මාර සර්වඥයන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

29. මම් ඒ බුදුනුදුගේ බස් අසා බෙහෙවින් සන්‍තොෂය දනැවීමි. දසපාරමීන් පූරන පිණිස උග්‍ර වූ ව්‍රතය අධිෂ්ඨාන කෙළෙමි.

30. සූත්‍රාන්‍තය ද විනය ද යි නවාඞ්ග ශාස්ත්‍රෘශාසනය සියල්ල පිරිවහා බුදු සසුන් හෙබැ වීමි.

31. මම් එ සසුන්හි නො පමා වැ වාසය කරනුයෙම් බ්‍රහ්මවිහාරභාවනා වඩා අභිඥවන්ගේ පරතෙරට පැමිණ බඹලොවට ගියෙමි.

32. මහර්ෂි වූ සුජාත බුදුන්ගේ නගරය සුමඞ්ගල නම, පිය තෙමේ උග්ගත නම් ක්ෂත්‍රිය විය, මව්තොමෝ පභාවතී නමු.

33. ඒ සුජාත බුදුහු නවදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ, ඔබට ශ්‍රී යැ උපශ්‍රී යැ ශ්‍රී නන්‍දා යැ යි උතුම් තුන්පහයෙක් වී.

34. මොනොවට සරසනලද තෙවිසිදහසක් පරිවාරස්ත්‍රීහු වූහ, මෙහෙසිය සිරිනන්‍දා නමු, දූත්‍ර තෙම උපසෙන නම් වී.

35. පස්මරුන් දිනූ බුදුහු සතර පෙරනිමිති දුක අශ්වයානයෙකින් මහබිනික්මන් කළහ, පුරා නවමසක් ප්‍රධන්වීර්‍ය කළහ.

36. බ්‍රහ්මුනා යාචිතො සන්තො සුජාතො ලොකනායකො
වත්තෙසි චක්කං මහාවීරො සුමඞ්ගලු'ය්‍යානමුත්තමෙ.

37. සුදස්සනො ච දෙවො[1] ච අහෙසුං අග්ගසාවකා
නාරදො නාමුපට්ඨාකො සුජාතස්ස මහෙසිනො.

38. නාගා ච නාගසමාලා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො මහාවෙළූ'ති වුච්චති.

39. සො ච රුක්ඛො ජාතරුචිරො[2] අච්ඡිද්දො හොති පත්තකො[3]
උජුවංසො බ්‍රහා හොති දස්සනීයො මනොරමො.

40. එකක්ඛන්ධො පවඩ්ඪිත්වා[4] තතො සාඛා පභිජ්ජථ[5]
යථා සුබද්ධො මොරහත්ථො එවං සොභති සො දුමො.

41. න තස්ස කණ්ටකා[6] හොන්ති නා'පි ඡිද්දං මහා අහු
විත්ථිණ්ණසාඛො අවිරලො සන්දච්ඡායො මනොරමො.

42. සුදත්තො චෙව චිත්තො ච අහෙසුං අග්ගු'පට්ඨකා
සුභද්දා චෙව පදුමා ච අහෙසුං අග්ගු'පට්ඨිකා.

43. පඤ්ඤාස රතනො ආසි උච්චත්තනෙන[7] සො ජිනො
සබ්බාකාරවරූපෙතො සබ්බගුණමුපාගතො.

44. තස්සප්පභා අසමසමා නිද්ධාවති සමන්තතො
අප්පමාණො අතුලියො ච ඔපම්මෙහි අනූපමො

45. නවුතිවස්සසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

46. යථාපි සාගරෙ ඌමී ගගනෙ තාරකා යථා.
එවං තද පාවචනං අරහන්තෙහි චිත්තිතං[8]

47. සො ච බුද්ධො අසමසමො ගුණානි ච තානි අතුලියානි
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා.

48. සුජාතො ජිනවරො බුද්ධො සීලාරාමම්හි නිබ්බුතො
තත්ථෙ'ව තස්ස චෙතියො තීණි ගාවුත මුග්ගතො'ති.

සුජාත බුද්ධවංසො ද්වාදසමො.

---

1. සුදෙවො – සිමු.
2. සනරුචිරො – සිමු.
සනක්ඛන්ධො – ස්‍යා, මජසං.
3. ඡද්දං හොති පරිත්තකං – පු.
අච්ඡද්දො හොති පත්තිකො – මජසං.
4. පවඩ්ඪෙත්වා – සිමු, – PTS.
5. පභිජ්ජති – මරි. අභිජ්ජති – සිමු.
6. කණ්ඩකා – සිමු.
7. උච්චතරෙන – සිමු.
8. විචිත්තිතං – PTS.

36. මහත් වීර්‍ය්‍යය ඇති ලොකනායක වූ සුජාත බුදුහු මහබඹහු විසින් අයදනා ලදහු උතුම් වූ සුමඬගල උයන්හිදී ධම්සක් පැවැත්වූහ.

37. මහර්ෂි වූ සුජාත බුදුන්ට සුදර්ශන යැ දෙව යැයි අගසවු දෙනමක් වූහ, නාරද නම් උපසථායක තෙර කෙනෙක් වූහ.

38. නාගා යැ නාගසමාලා යැ යි අග්‍රශ්‍රාවිකා දෙනමක් වූහ, ඒ භාග්‍ය වතුන්ගේ බොධිය 'මහහුණ' යයි කියනු ලැබේ.

39. එරුක ද හටගත් රුසිරු ඇතියේ අල්පඡිද්‍ර ඇතියේ බොහෝ පත්‍ර ඇත්තේ වෙයි. ඍජු වූ හුණරුක අවටින් මහත් වූයේ දකුම්කලු වූයේ මනරම් වේ.

40. එක් කඳ වැ වැඩී එයින් ශාඛා බෙදිණ, එරුක මොනොවට බඳනාලද මයූරහස්‍තයෙන් (මොනරපිළින් කළ හිරවරණක්) සෙයින් හොබී.

41. එරුක්හි කටු නැති, සිදුර ද මහත් නොවී, විසුළ අතු ඇත්තේ අවිරල වූ ගන සෙවන ඇත්තේ මනරම් වී.

42. ඔබට සුදත්ත යැ චිත්ත යැ යන දෙදෙන අග උවටු වූහ, සුභද්‍රා යැ පද්මා යැ යන දෙදෙන අග උවට වූහ.

43. සියලු ආකාරවරයෙන් යුක්ත වූ හැම ගුණයෙන් සමන්විත වූ ඒ බුදුහු උසින් පනස් රියන් වූහු.

44. උන් වහන්සේගේ අසමසම වූ ප්‍රභාව හාත්පසින්ම නික්ම යෙයි. ඔබ ප්‍රමාණ රහිත වූවාහු අතුල්‍ය වූවාහු උපමායෙන් අනුපම වෙත්.

45. එකල්හි අනූදහසක් හවුරුදු ආයු වෙයි, එතෙක් සිටිමින් උන් වහන්සේ බොහෝ ජන සමූහයා සසරකතරින් තැරූ වූහ.

46. සයුරුහි තරඟවැළ යම්සේ ද අහස්හි තරුකැළ යම්සේ ද එසෙයින් එකල්හි ප්‍රවචනය රහතුන් විසින් විසිතුරු විය.

47. ඒ බුදුහු ද අසමසම වෙති, ඒ ගුණයෝද අතුල්‍ය වෙති, එ හැම අතුරුදහන් විය, හැම සංස්කාරයෝ සිස් වූවාහු නොද?

48. ජිනොත්තම වූ සුජාත බුදුහු ශීලාරාමයෙහි පිරිනිවියහ, එහි මැ උන් වහන්සේ ගේ සෑය තුන් යොත්නක් උස් වී යයි.

**දෙළොස් වැනි සුජාත බුද්ධවංශ යි.**

# 13. පියදස්සී බුද්ධවංසො

1. සුජාතස්ස අපරෙන සයම්භූ[1] ලොක නායකො
දුරාසදො අසමසමො පියදස්සී මහායසො.

2. සො'පි බුද්ධො අමිතයසො ආදිච්චො'ව විරොචති
නිහන්ත්වාන තමං සබ්බං[2] ධම්මචක්කං පවත්තයි.

3. තස්සා'පි අතුලතෙජස්ස අහෙසුං අභිසමයා තයො
කොටිසතසහස්සානං පඨමා'භිසමයො අහු.

4. සුදස්සනො දෙවරාජා මිච්ඡාදිට්ඨිම' රොචයි
තස්ස දිට්ඨිං විනොදෙන්තො සත්ථා ධම්මම' දෙසයි.

5. ජනසන්නිපාතො අතුලො මහාසන්නිපතී තදා
නවුතිකොටිසහස්සානං දුතියාභිසමයො අහු.

6. යදා දොණමුඛං හත්ථිං විනෙසි නරසාරථී
අසීතිකොටිසහස්සානං තතියා'භිසමයො අහු.

7. සන්නිපාතා තයො ආසුං තස්සා'පි පියදස්සිනො
කොටිසතසහස්සානං පඨමො ආසි සමාගමො.

8. තතො පරං නවුතිකොටී සමිංසු එකතො මුනී.
තතියෙ සන්නිපාතම්හි අසීතිකොටියො අහු.

9. අහං තෙන සමයෙන කස්සපො නාම බ්‍රාහ්මණො
අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදාන පාරගූ.

10. තස්ස ධම්මං සුණිත්වාන පසාදං ජනයිං අහං
කොටිසතසහස්සෙහි සඞ්ඝාරාමං අමාපයිං.

11. තස්ස දත්වාන ආරාමං හට්ඨො සංවිග්ගමානසො
සරණෙ පඤ්චසීලෙ ච[3] දළ්හං කත්වා සමාදියිං.[4]

12. සො'පි මං බුද්ධො ව්‍යාකාසි සඞ්ඝමජ්ඣෙ නිසීදිය
අට්ඨාරසෙ කප්පසතෙ අයං බුද්ධො භවිස්සති.

---

1. සම්බුද්ධො – සීමු.
2. සබ්බං තමං නිහන්ත්වාන – මජසං,
3. සරණං පඤ්චසීලඤ්ච – සීමු.
4. සමාදයි – මනුප.

## 13. ප්‍රියදර්ශී බුද්ධවංශය

1. සුජාත නම් බුදුන්ට මැතභාගයෙහි ස්වයම්භූ (පරොපදෙශ රහිත වැ සියල්ල දත්තා) වූ ලොකනායක වූ නො ගැටියහැකි වූ අසමසම වූ මහා යසස් ඇති ප්‍රියදර්ශී බුදුහු ලොව පහළ වූහ.

2. අප්‍රමාණ වූ යසස් ඇති ඒ බුදුහු ද සූර්‍ය්‍යයා සෙයින් බබ ති, ඔබ සියලු මොහඳුරු නසා දම්සක් පැවැත්වූහ.

3. අතුල්‍ය වූ තේජස් ඇති උන්වහන්සේට ද අභිසමය තුනෙක් වී කෙළ ලක්ෂයක් සත්නට ප්‍රථමාභිසමය වී.

4. සුදර්ශන නම් දෙවරජ මිථ්‍යාදෘෂ්ටිය රුචි කෙළේ යැ, බුදුහු ඔහු ගේ දෘෂ්ටිය දුරු කෙරෙමින් දහම් දෙසූහ.

5. යම් කලෙකැ අතුල වූ මහාජනසන්නිපාතයෙක් වී ද එකල්හි අනූ කෙළදහසක් සත්නට දෙ වැනි ධර්මාභිසමය වී.

6. යම් කලෙකැ පුරුෂදම්‍යසාරථීහු ද්‍රොණමුඛ නම් ඇත්රජ දමනය කළ සේක් ද, එකල්හි අසූ කෙළදහසක් සත්නට තුන්වැනි ධර්මාභිසමය වී.

7. ඒ පියදස්සී බුදුනට ශ්‍රාවක සන්නිපාත තුනෙක් වී, කෙළ ලක්ෂයක් ශ්‍රාවකයන්ගේ ප්‍රථම සමාගමය වී.

8. එයින් මතු අනූ කෙළක් මුනිහු එකට රැස්වූහ, තුන් වැනි සන්නිපාතයෙහි අසූ කෙළක් ශ්‍රාවකයෝ වූහ.

9. එසමයෙහි මම් වෙද හදරවනුයෙම් වෙද මන්ත්‍ර ධරනුයෙම් ත්‍රිවෙදයෙහි පාරයට ගිය කාශ්‍යප නම් බ්‍රාහ්මණ වීමි.

10. මම් ඒ බුදුන්ගේ දහම් අසා ප්‍රසාද දනවීමි, කෙළලක්ෂයක් කහවුණුයෙන් සඞ්ඝාරාමයක් නිර්මාණය කෙළෙමි.

11. සතුටු වූයෙම් සංවෙගයට පැමිණි සිත් ඇතියෙම් අරම උන්වහන්සේට පුද සරණ ද පන්සිල් ද දැඩි කොට සමාදන් වීමි.

12. ඒ සම්බුදුහු දු සඟ මැද වැඩ හිඳ 'මෙ තෙම මෙයින් අටලොස් කප්සියක්හු ගේ ඇවෑමෙහි බුදුවන්නේ යැ'යි මට විවරණ දුන්සේක.

13. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

14. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

15. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලං හි එහිති.

16. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

17. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

18. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමු'පට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

19. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

20. චිත්තො ච හත්ථාලවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

21. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

22. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

23. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

24. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨාතිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

25. එවමෙ'ව මයං සබ්බෙ යදි මුඤ්චාම්'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

13. එකල්හි තථාගතයන් වහන්සේ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට-

14. තථාගතයෝ අජපල් නම් නුගරුක් මුල්හි වැඩහිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලාහෝතෙරට එළැඹෙති.

15. ඒ පස්මරුන් දිනූ බුදුහු නිල්දලාහෝතෙර දී කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙළ කළ මගින් බෝමුල් කරා එළැඹෙති.

16. ඉක්බිති මහා යසස් ඇති අනුත්තර වූ බුදුහු බෝමැඩ පැදකුණු කොට ඇසැතුරුක්මුල්හි බුදු වන්නාහ.

17. මොවුන්ගේ ජනිකමව් තොමෝ මායා නම් වන්නී යැ පිය තෙම ශුද්ධෝදන නම් වන්නේ යැ, මේ තෙම ගෞතම නම් වන්නේ යි.

18. ඔබට කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ, ඒ ජිතපඤ්චමාරයනට ආනන්ද නම් උපස්ථායක තෙර කෙනෙක් උපස්ථාන කරන්නාහ.

19. ඛේමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ, ඒ භාග්‍යවතුන් ගේ බෝධිය ඇසැතු යයි කියනු ලැබෙයි.

20. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන් අග්‍රෝපස්ථායක වන්නාහ, උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අග්‍රෝපස්ථායිකා වන්නාහ, යසස් ඇති ඒ ගෞතම බුදුන්ට හවුරුදු සියයෙක් ආයු වෙයි.

21. අසම වූ මහර්ෂීන්ගේ මේ වදන් අසා 'මේ බුද්ධ බීජාඞ්කුරයෙකැ'යි සතුටු වූ දෙව්මිනිස්සු-

22. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙත්. දසදහසක් සක්වළ සදෙවක ලොකයා බඳිලි වැ නමස්කාර කෙරෙයි.

23. ඉදින් මේ ලෝකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

24. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛ තීර්ථය වැරැද යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙද් ද.

25. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

26. තස්සා'පි වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසි දසපාරමිපූරියා.

27. සුධඤ්ඤං නාම නගරං සුදත්තො නාම ඛත්තියො
සුචන්දා නාම[1] ජනිකා පියදස්සිස්ස සත්ථුනො.

28. නව වස්ස සහස්සානි අගාරමජ්ඣසො වසි.
සුනිම්මලවිමලගිරිබ්‍රහා[2] තයො පාසාදමුත්තමා.

29. තෙත්තිංසතිසහස්සානි නාරියො සමලඞ්කතා
විමලා නාම නාරී ච කඤ්චනාවෙලො[3] නාම අත්‍රජො.

30. නිමිත්තෙ චතුරො දිස්වා රථයානෙන නික්ඛමි
ඡමාසං පධානචාරං අචරී පුරිසුත්තමො.

31. බ්‍රහ්මුනා යාචිතො සන්තො පියදස්සී මහාමුනි
වත්ති චක්කං මහාවීරො උසභූය්‍යානෙ මනොරමෙ

32. පාලිතො සබ්බදස්සී[4] ච අහෙසුං අග්ගසාවකා
සොභිතො නාමුපට්ඨාකො පියදස්සිස්ස සත්ථුනො.

33. සුජාතා ධම්මදින්නා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො කකුධො'ති පවුච්චති.

34. සන්දකො[5] ධම්මකො[6] චෙව අහෙසුං අග්ගු'පට්ඨකා
විසාඛා[7] ධම්මදින්නා ච අහෙසුං අග්ගු'පට්ඨිකා.

35. සො'පි බුද්ධො අමිතයසො ද්වත්තිංසවරලක්ඛණො
අසීතිහත්ථමුබ්බෙධො සාලරාජා'ව දිස්සති.

36. අග්ගිචන්දසූරියානං නත්ථි තාදිසිකා පභා
යථා අහු[8] පභා තස්ස අසමස්ස මහෙසිනො.

37. තස්සා'පි දෙවදෙවස්ස ආයු තාවතකං අහු
නවුතිවස්සසහස්සානි ලොකෙ අට්ඨාසි චක්ඛුමා.

38. සො'පි බුද්ධො අසමසමො යුගානි'පි තානි අතුලියානි
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා

39. සො පියදස්සී මුනිවරො අස්සත්ථාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ජිනථූපො තීණි යොජන මුග්ගතො'ති.

**පියදස්සී බුද්ධවංසො තෙරසමො.**

---

1. චන්ද්නාමාසි – මජසං,
2. ගිරිගුහා – මජසං.
3. කඤ්චනවෙලො – සීමු.
4. පියදස්සි – සීමු. මනුප,
3. සන්තකො – සීමු.
සන්දකො – සයා.
6. ධම්මිකො – සීමු.
7. විසිඛො – සීමු.
8. ආසුං – මචි.

26. මම ඒ බුදුන්ගේ ද බස් අසා බෙහෙවින් සිත පැහැද වීමි, මත්තෙහි දසපාරමීන් පුරන පිණිස ව්‍රතාධිෂ්ඨාන කෙළෙමි.

27. පියදස්සී නම් ශාස්තෲන් වහන්සේට 'සුධඤ්ඤ' නම් නුවරෙක් වීයැ, 'සුදත්ත' නම් ක්ෂත්‍රිය තෙම පිතෘ වී යැ. මව් තොමෝ 'සුචන්‍දා' නම් වූ.

28. උන් වහන්සේ නවදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ, ඔබට සුනිම්මල යැ විමල යැ ගිරිබ්‍රහා යැ යි උතුම් තුන් පහයෙක් වී.

29. මොනොවට සරසන ලද තෙතිස් දහසක් පරිවාරස්ත්‍රීහු වූහ, 'විමලා' නම් අගමෙහෙසියක් වූ. කඤ්චනාවෙල නම් පුත්‍රයෙක් වී.

30. පුරුෂොත්තම තෙමේ සතර පෙර නිමිති දැක රථ යානයෙකින් මහබිනික්මන් කෙළේ යැ, සමසක් ප්‍රධන්වීර්‍ය්‍ය කෙළේ යි.

31. මහත් වීර්‍ය්‍ය ඇති පියදස්සී මහමුනිහු මහබඹහු විසින් අයදනාලදහු මනරම් වූ උසභ නම් උයන්හි දී දම්සක් පැවැත්වූහ.

32. ශාස්තෘ වූ පියදස්සී බුදුන්ට පාලිත යැ සබ්බදස්සී යැ යි අගසවු දෙනමක් වූහ, සොභිත නම් උපස්ථායක තෙර කෙනෙක් වූහ.

33. සුජාතා යැ ධම්මදින්නා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වූහ, ඒ භාග්‍යවතුන්ගේ බොධිය කකුධ (කුඹුක්) යයි කියනු ලැබෙයි.

34. සන්‍ධක යැ ධම්මක යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වූහ. විසාඛා යැ ධම්මදින්නා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වූහු.

35. අප්‍රමාණ යසස් ඇති දෙතිස් මහපුරිස් ලකුණු ඇති ඒ බුදුහු ද අසූ රියන් උස් වූවා සුපිපි සල්රුකක් සෙයින් පැනෙති.

36. ඒ අසම වූ මහර්ෂි වූ පියදස්සී බුදුන්ට යම්බඳු ප්‍රභාවක් වූ නම් එබඳු ප්‍රභාවක් අග්නි චන්ද්‍ර සූර්‍ය්‍ය යන මොවුන්ට නැති.

37. දෙවියනට දෙව් වූ ඒ පියදස්සී බුදුන්ට ද එතෙක් ආයු වීය, චක්ෂුස්මත්හු අනූදහසක් හවුරුදු ලොවැ වැඩ සිටියහ.

38. ඒ ප්‍රියදර්ශී බුදුහු ද අසමසම වූහ, ඒ ශ්‍රාවක යුග්මය ද අතුල්‍ය වී. එ හැම අතුරුදහන් වී, හැම සංස්කාරයෝ සිස් වූවාහු නො ද?

39. ඒ පියදස්සී නම් බුදුහු ඇසැතු අරම්හි පිරිනිවියහ, එහි මැ උන් වහන්සේගේ ස්තූපය තුන්යොත්නක් උස් කොට බඳවන ලදි.

තෙළෙස් වැනි ප්‍රියදර්ශී බුද්ධවංසය යි.

## 14. අත්ථදස්සී බුද්ධවංසො

1. තත්ථ'ව මණ්ඩකප්පම්හි අත්ථදස්සී නරාසභො[1]
මහා තමං නිහන්ත්වාන පත්තො සම්බොධිමුත්තමං.

2. බ්‍රහ්මුනා යාචිතො සන්තො ධම්මචක්කං පවත්තයී
අමතෙන තප්පයී ලොකං දසසහස්සී සදෙවකං.

3. තස්සා'පි ලොකනාථස්ස අහෙසුං අභිසමයා තයො
කොටිසතසහස්සානං පඨමාභිසමයො අහු.

4. යදා බුද්ධො අත්ථදස්සී චරති දෙවචාරිකං
කොටිසතසහස්සානං දුතියා'භිසමයො අහු.

5. පුනාපරං යදා බුද්ධො දෙසෙසි පිතුසන්තිකෙ
කොටිසතසහස්සානං තතියා'භිසමයො අහු.

6. සන්නිපාතා තයො ආසුං තස්සා'පි ච මහෙසිනො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන'තාදිනං.

7. අට්ඨනවුතිසහස්සානං පඨමො ආසි සමාගමො
අට්ඨාසීතිසහස්සානං දුතියො ආසි සමාගමො.

8. අට්ඨසත්තතිසහස්සානං තතියො ආසි සමාගමො
අනුපාදවිමුත්තානං විමලානං මහෙසිනං.

9. අහං තෙන සමයෙන ජටිලො උග්ගතාපනො
සුසීමො[2] නාම නාමෙන මහියා සෙට්ඨසම්මතො

10. දිබ්බං මන්දාරවං පුප්ඵං පදුමං පාරිච්ඡත්තකං
දෙවලොකා හරිත්වාන[3] සම්බුද්ධං අභිපූජයිං.

11. සොපි මං බුද්ධො[4] ව්‍යාකාසි අත්ථදස්සී මහාමුනි
අට්ඨාරසෙ කප්පසතෙ අයං බුද්ධො භවිස්සති.

---

1. මහායසො – මචි.
2. සුපිනො – මනුප, සුසිමො–PTS.
3. දෙවලොකතො ආ හරිත්වා.
4. තදා – බු.අ.

# 14. අත්ථදර්ශී බුද්ධවංශය

1. එ මැ මණ්ඩ නම් කල්පයෙහි නරශ්‍රෙෂ්ඨ වූ අත්ථදර්ශී නම් බුදුහු මහත් වූ මොහාන්ධකාරය නසා උතුම් සම්බොධියට පැමිණියාහු.

2. මහබඹහු විසින් අයදනාලදහු දම්සක් පැවැත්වූහ. දසදහසක් සක්වළ දෙවියන් සහිත ලොකයා අමායෙන් සැතැප්වූ සේක.

3. ඒ ලොකනාථයන් වහන්සේ ගේ ද ධර්මාවබොධත්‍රයෙක් වී. කෙළලක්ෂයක් සත්නට පළමු වැනි ධර්මාවබොධය වී.

4. යම් කලෙකැ අර්ථදර්ශී බුදුහු දෙව්ලොවැ චාරිකා කළසේක් ද, එකල්හි කෙළලක්ෂයක් සත්නට දෙවැනි ධර්මාවබොධය වී.

5. යළි යම් කලෙකැ බුදුහු පියරජ සමීපයෙහි දහම් දෙසූසේක් ද, එකල්හි කෙළලක්ෂයක් සත්නට තුන්වැනි ධර්මාභිසමය විය.

6. මහර්ෂි වූ ඒ අර්ථදර්ශී බුදුන්ට ද විගත රාගාදි මල ඇති සන්හුන් සිත් ඇති තාදීගුණ ඇති රහතුන්ගේ සන්නිපාත තුනෙක් වී.

7. අටානූදහසක් රහතුන්ගේ ප්‍රථම සමාගමය වී, අටාසූදහසක් ශ්‍රාවකයන්ගේ ද්විතීයසමාගමය වී.

8. අනුපාදවිමුක්තියෙන් කෙලෙසුන් කෙරෙන් මුත් පහවූ රාගාදි මල ඇති මහර්ෂි වූ අට සැත්තෑදහසක් ශ්‍රාවකයන්ගේ තුන් වැනි සමාගමය වී.

9. එසමයෙහි මම උග්‍ර වූ තපස් ඇති පෘථිවියෙහි ශ්‍රෙෂ්ඨ යයි සම්මත වූ නමින් සුසීම නම් වූ ජටිලයෙක් වීමි.

10. පරසතු මදාරා දිව්කුසුම් දෙව්ලොවින් ගෙනවුත් සම්බුදුන් පිදීමි.

11. මහාමුනි වූ ඒ අත්ථදර්ශී නම් බුදුහු ද 'මේ තෙම මෙයින් අටළොස්සියක් වන කප්හි බුදු වන්නේ යැ'යි මට විවරණ දුන්සේක.

12. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

13. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

14. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

15. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

16. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

17. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නා'මුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

18. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

19. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

20. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

21. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

22. යදිමස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

23. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨාතිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

24. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

12. එකල්හි තථාගතයෝ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන් වීර්‍ය්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට—

13. තථාගතයෝ අජපාල නම් නුගරුක්මුල්හි හිඳ එහි දී කිරිපිඬු පිළිගෙන නිල්දලාහෝතෙරට එළැඹෙන්නාහ.

14. පස්මරුන් දිනූ ඒ බුදුහු නිල්දලාහෝතෙර වැඩහිඳ කිරිපිඬු වළඳා (දෙවියන්) පිළියෙළ කළ මඟින් බෝමුල වෙත එළැඹෙන්නාහ.

15. ඉක්බිති මහායසස් ඇති අනුත්තර වූ මහසත් බෝමැඩ පැදකුණු කොට ඇසැතුරුක්මුල්හි බුදු වන්නේ යි.

16. මොවුන්ගේ ජනික මව මායා නම් වන්නී යැ, පිය තෙම ශුද්ධෝදන නම් වන්නේ යැ, මේ තෙම ගෞතම නම් වන්නේ යි.

17. ඔබට කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අගසවු වන්නාහ. ආනන්ද නම් උපස්ථායක තෙර කෙනෙක් ඒ ජිතපඤ්චමාර බුදුනට උපස්ථාන කරන්නාහ.

18. ඛෙමා යැ උප්පලවණ්ණායැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබේ.

19. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අග්‍රෝපස්ථායක වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ යසස් ඇති ගොයුම් සම්බුදුනට හවුරුදු සියයෙක් ආයු වෙයි.

20. අසම වූ මහර්ෂීන්ගේ මෙ වදන් අසා 'මේ තෙම බුද්ධබීජාංකුර-යෙකැ'යි සතුටු වූ දෙව්මිනිස්සු-

21. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දසදහසක් සක්වළ සදෙවක ලොකයා කළ ඇඳිලි ඇති වැ නමස්කාර කෙරේ.

22. ඉදින් මේ ලෝකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමුවන්නම්හ.

23. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛතීර්ථය වැරැද යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද–

24. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මෙ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

25. තස්සා'පි වචනං සුත්වා හට්ඨා සංවිග්ගමානසො
උත්තරිං වතමධිට්ඨාසිං දසපාරමිපූරියා.

26. සොභනං නාම නගරං සාගරො නාම ඛත්තියො
සුදස්සනා නාම ජනිකා අත්ථදස්සිස්ස සත්ථුනො.

27. දසවස්සසහස්සානි අගාරමජ්ඣසො වසි
අමරගිරිසුරගිරිගිරිවාහනා[1] තයො පාසාදමුත්තමා.

28. තෙත්තිංසතිසහස්සානි[2] නාරියො සමලඞ්කතා
විසාඛා නාම සා නාරී සෙලො[3] නාමා'සි අත්රජො.

29. නිමිත්තෙ චතුරො දිස්වා අස්සයානෙන නික්ඛමි
අනූනඅට්ඨමාසානි පධානං පදහී ජිනො.

30. බ්‍රහ්මුනා යාචිතො සන්තො අත්ථදස්සී මහායසො
වත්ති චක්කං මහාවීරො අනොමුය්‍යානෙ නරාසභො.

31. සන්තො ච උපසන්තො ච අහෙසුං අග්ගසාවකා
අභයො නාමු'පට්ඨාකො අත්ථදස්සිස්ස සත්ථුනො.

32. ධම්මා චෙ'ව සුධම්මා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො චම්පකො'ති පවුච්චති

33. නකුලො ච නිසභො ච අහෙසුං අග්ගු'පට්ඨකා.
මකිලා ච සුනන්දා ච අහෙසුං අග්ගු'පට්ඨිකා.

34. සො'පි බුද්ධො අසමසමො අසීති රතනුග්ගතො[4]
සොභති සාලරාජා'ව උළුරාජා'ව පූරිතො.

35. තස්ස පාකතිකා රංසී[5] අනෙකසතකොටියො
උද්ධං අධො දසදිසා ඵරන්ති යොජනං තද[6].

36. සො'පි බුද්ධො නරාසභො සබ්බසත්තු'ත්තමො මුනි
වස්සසතසහස්සානි ලොකෙ අට්ඨාසි චක්ඛුමා.

37. අතුලං දස්සෙත්වා ඔභාසං විරොචෙත්වා සදෙවකෙ
සො'පි අනිච්චතං පත්තො යථ'ග්ගු'පාදනසඞ්ඛයා.

38. අත්ථදස්සී ජිනවරො අනොමාරාමම්හි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො'ති.

අත්ථදස්සී බුද්ධවංසො චුද්දසමො.

---

1. අපරගිරිසුගිරිවාහනො – මජසං
2. තෙත්තිංසංච – සීමු.
3. සොනො – සීමු. සෙනො – PTS.
4. බුද්ධවංසෙ 26 ගා.
5. රස්මි – සීමු.
6. සද – මජසං,

25. ඒ අත්ථදර්ශී බුදුන්ගේ ද බස් අසා සතුටු වූයෙම් සංවේග පත් සිත් ඇතියෙම් දසපාරමීන් පුරන පිණිස මත්තෙහි වූතාධිෂ්ඨාන කෙළෙමි.

26. ශාස්තෘ වූ අත්ථදර්ශී නම් බුදුන්ට ශොභන නම් නුවරෙක් වී යැ. පිය තෙම සාගර නම් ක්ෂත්‍රිය විය. මව් තොමෝ සුදසසනානම් වූ.

27. ඒ අත්ථදර්ශී බුදුහු දසදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. (ඔබට) අමරගිරි යැ සුරගිරි යැ ගිරිවාහන යැ යි උතුම් තුන් පහා කෙනෙක් වූහ.

28. මොනොවට සරහනලද තෙතිස්දහසක් පරිවාරස්ත්‍රීහු වූහ. විශාඛා නම් ස්ත්‍රියක් අගමෙහෙසි වූ. පුත්‍ර තෙම සෙල නම් වී.

29. පස්මරුන් දිනූ බුදුහු සතර පෙර නිමිති දැක අශ්වයානයෙකින් මහබිනික්මන් කළහ. පුරා අටමසක් ප්‍රධන්වීර්‍ය්‍ය කළහ.

30. මහත්වීර්‍ය්‍ය ඇති නරශ්‍රෙෂ්ඨ වූ මහත් යසස් ඇති අත්ථදර්ශී බුදුහු මහබඹහු විසින් අයදනාලදහු අනොම නම් උයන්හි දී දම්සක් පැවැත් වූහ.

31. අර්ථදර්ශී සම්බුදුනට ශාන්ත යැ උපශාන්ත යැ යන දෙදෙන අගසවු වූහ. අභය නම් තෙර කෙනෙක් උපස්ථායක වූහු.

32. ධර්මා යැ සුධර්මා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වූහ. ඒ භාග්‍ය-වතුනට බොධිය 'සපු' යයි කියනු ලැබේ.

33. නකුල යැ නිසභ යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වූහ. මකිලා යැ සුනන්දා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වූහ,

34. අසමසම වූ අසූරියනක් උස් වූ ඒ බුදුහු ද සුපිපි සල්රුකක් සෙයින් ද පුන්සඳ සෙයින් ද බබළයි.

35. එකල්හි ඒ අර්ථදර්ශී බුදුන්ගේ නොයෙක් කෙළසියගණන් පියවිරැස් උඩ යට දසදිග්හි හාත්පස්හි යොදනක් තැන් පැතිරෙයි.

36. නරශ්‍රෙෂ්ඨ වූ හැම සත්නට උතුම් වූ මුනි වූ පසැස් ඇති ඒ අර්ථදර්ශී බුදුහු ද ලක්ෂයක් හවුරුදු ලොවැ වැඩ විසූහ.

37. අතුල්‍ය වූ අවභාස දක්වා සදෙවක ලොකයෙහි බැබැළී ඉන්ධනක්ෂයෙන් අග්නිය සෙයින් ඒ අර්ථදර්ශී බුදුහු ද අනිත්‍යතාවට පැමිණිසේක.

38. ජිනොත්තම වූ අර්ථදර්ශී බුදුහු අනොමාරාමයෙහි පිරිනිවියහ, ධාතුහු ඒ ඒ පෙදෙස්හි පතළාහ යි.

**තුදුස් වැනි අර්ථදර්ශී බුඞවංශ යි.**

# 15. ධම්මදස්සී බුද්ධවංසො

1. තත්‍ථෙ'ව මණ්ඩකප්පම්හි ධම්මදස්සී මහායසො
තම'න්ධකාරං විධමෙත්වා අතිරොචති සදෙවකෙ.

2. තස්සා'පි අතුලතෙජස්ස ධම්මචක්කප්පවත්තනෙ
කොටිසතසහස්සානං පඨමා'භි සමයො අහු.

3. යදා බුද්ධො ධම්මදස්සී විනෙසි සඤ්ජයං ඉසිං
තදා නවුතිකොටීනං දුතියා'භිසමයො අහු.

4. යදා සක්කො උපගඤ්ඡි සහපරිසො[1] විනායකං
තදා අසීති කොටීනං තතියා'භිසමයො අහු.

5. තස්සා'පි දෙවදෙවස්ස සන්නිපාතා තයො අහු[2]
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන'තාදිනං.

6. යදා බුද්ධො ධම්මදස්සී සරණෙ වස්සං උපාගමි
තදා කොටිසහස්සානං[3] පඨමො ආසි සමාගමො.

7. පුනා'පරං යදා බුද්ධො දෙවතො එති මානුසං[4]
තද'පි සතකොටීනං දුතියො ආසි සමාගමො.

8. පුනා'පරං යදා බුද්ධො පකාසෙසි ධුතෙ ගුණෙ
තදා අසීති කොටීනං තතියො ආසි සමාගමො.

9. අහං තෙන සමයෙන සක්කො ආසිං පුරින්දදො
දිබ්බෙන ගන්ධමාලෙන[5] තුරියෙන අභිපූජයිං.

10. සො'පි මං බුද්ධො ව්‍යාකාසි දෙවමජ්ඣෙ නිසීදිය
අට්ඨාරසෙ කප්පසතෙ අයං බුද්ධො භවිස්සති.

11. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

12. අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්‍ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

1. සපරිසො – සීමු, මජසං.
2. ආසුං – මවි, අහුං – මජසං.
3. කොටිසතසහස්සානං – සීමු, මජසං.
4. මානුසෙ – සීමු,
5. දිබ්බගන්ධෙනමාලෙන – මනුප,

# 15. ධම්දර්ශී බුද්ධවංශය

1. එ මැ මණ්ඩ නම් කප්හි මහත් වූ යසස් ඇති ධර්මදර්ශී නම් බුදුහු මොහඳුරු නසා සදෙවක ලොකයෙහි අධික වැ බැබැළුණාහ.

2. අපමණ තෙජස් ඇති ඒ ධර්මදර්ශී බුදුන්ගේ ද දම්සක් පැවැත්මෙහි දී කෙළලක්ෂයක් සත්නට ප්‍රථම ධර්මාවබොධය වී.

3. යම් කලෙකැ ධර්මදර්ශී බුදුහු සඤ්ජය නම් රුසිහු දමනය කළ සේක් ද, එකල්හි අනූ කෙළක් සත්නට දෙ වැනි අභිසමය වී.

4. යම් කලෙකැ සක්දෙව්රජ පිරිස් සහිත වැ බුදුන් කරා එළැඹියේ ද, එකල්හි අසූ කෙළක් සත්නට තුන් වැනි ධර්මාභිසමය වී.

5. දෙවියනට දෙවි වූ ඒ ධර්මදර්ශී බුදුනට ද පහවූ රාගාදි මල ඇති සන්හුන් සිත් ඇති තාදී ගුණ ඇති රහතුන්ගේ සන්නිපාත තුනෙක් වී.

6. යම් කලෙකැ ධම්මදස්සී බුදුහු සරණ නම් නගරයෙහි වස් එළැඹිසේක් ද, එකල්හි කෙළදහසක් ශ්‍රාවකයන්ගේ ප්‍රථමසමාගමය වී.

7. යළි යම් කලෙකැ ධර්මදර්ශී බුදුහු දෙව්ලොවින් මිනිස්ලොවට වැඩිසේක් ද, එකල්හි දූ කෙළසියක් ශ්‍රාවකයන්ගේ ද්විතීය සමාගමය වී.

8. යළි යම් කලෙකැ බුදුහු (සුදශීනාරාමයෙහි දී හාරිත නම් තෙරණුවන් අගසවු තැන්හි තබමින්) තෙළෙස් ධුතගුණයන් ප්‍රකාශ කළ සේක් ද එකල්හි අසූ කෙළක් ශ්‍රාවකයන්ගේ තෘතීය සමාගමය වී.

9. එසමයෙහි මම් පුරින්දද වූ සක්දෙව් රජ වීමි, දිව ගඳින් මලින් පසඟතුරුරැවින් බුදුන් පිදීමි.

10. ඒ ධර්මදර්ශී නම් බුදුහු ද දෙව්පිරිස් මැද වැඩහිද මේ තෙම මෙයින් අටළොස් වන කප්සියෙහි බුදු වන්නේ යැ'යි මට විවරණ දුන් සේක.

11. එකල්හි තථාගතයෝ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය්‍යය වඩා දුෂ්කරක්‍රියා කොට–

12. තථාගතයෝ අජපල් නම් රුක්මුල්හි හිඳ එහිදී කිරිපිඩු පිළිගෙන නිල්දළාහෝතෙරට පැමිණෙන්නාහ.

13. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

14. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

15. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

16. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමු'පට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

17. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

18. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

19. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

20. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

21. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

22. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

23. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

24. තස්සා'පි වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දසපාරමිපූරියා.

25. සරණං නාම නගරං සරණො නාම ඛත්තියො
සුනන්දා නාම ජනිකා ධම්මදස්සිස්ස සත්ථුනො.

13. පස්මරුන් දිනූ ඒ ධර්මදර්ශී බුදුහු තිල්දලාහෝතෙර දී කිරිපිඩු වළඳා දෙවියන් පිළියෙල කළ උතුම්මඟින් බෝමුල වෙත පැමිණෙන්නාහ.

14. ඉක්බිති මහත් යසස් ඇති අනුත්තර මහසත් බෝමැඩ පැදකුණු කොට ඇසැතු රුක්මුල්හි බුදුවන්නේ යි.

15. මොවුන්ගේ ජනික මව මායා නම් වන්නී' යැ, පිය තෙම සුද්ධොදන නම් වන්නේ' යැ, මේ තෙම ගෞතම නම් වන්නේ යි.

16. කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ, ආනන්ද නම් උපස්ථායක තෙර කෙනෙක් ඒ බුදුන්ට උපස්ථාන කරන්නාහ.

17. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබේ.

18. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වන්නාහ, උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වන්නාහ. යසස් ඇති ඒ ගෞතම බුදුන්ට හවුරුදු සියයෙක් ආයු වෙයි.

19. අසම වූ මහර්ෂීන්ගේ මෙ වදන් අසා 'මේ බුද්ධබීජාංකුරයෙකැ' යි සතුටු වූ දෙව්මිනිස්සු-

20. ඔල්වරසන් පවත්වති අපොළති, සිනහසෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත මිනිස්සු කළ ඇඳිලි ඇති වැ නමස්කාර කෙරෙත්.

21. ඉදින් ඇපි මේ ලොකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

22. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛ තීර්ථය වැරැද යැටැ තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද,

23. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ ජිනපක්ෂමාරයන් හරමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

24. ඒ ධර්මදර්ශී බුදුන්ගේ ද බස් අසා බෙහෙවින් සිත පැහැදවීමි, දසපාරමීන් පුරන පිණිස මත්තෙහි ව්‍රතාධිෂ්ඨානය කෙළෙමි.

25. ධර්මදර්ශී නම් ශාස්තෘන් වහන්සේගේ නගරය සරණ නම් විය, සරණ නම් ක්ෂත්‍රිය තෙම පිතෘ විය, මව තොමෝ සුනන්ද නමු.

26. අට්ඨ වස්සසහස්සානි අගාරමජ්ඣසො වසි
අරජො විරජො සුදස්සනො තයො පාසාදමුත්තමා.

27. තිචත්තාරීසසහස්සානි නාරියො සමලඞ්කතා
විචිකොළි නාම නාරී අත්‍රජො පුඤ්ඤවඩ්ඪනො

28. නිමිත්තෙ චතුරො දිස්වා පාසාදෙනා'භිනික්ඛමි
සත්තාහං පධානචාරං අචරී පුරිසුත්තමො.

29. බ්‍රහ්මුනා යාචිතො සන්තො ධම්මදස්සී නරාසභො
වත්තී චක්කං මහාවීරො මිගදායෙ නරුත්තමො.

30. පදුමො ඵුස්සදෙවො ච අහෙසුං අග්ගසාවකා
සුනෙත්තො නාමු'පට්ඨාකො ධම්මදස්සිස්ස සත්ථුනො.

31. ඛෙමා ච සච්චනාමා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො බිම්බිජාලො[1] ති වුච්චති.

32. සුභද්දො කටිස්සහො චෙව අහෙසුං අග්ගු'පට්ඨකා
සාලියා ච 'වලියා ච අහෙසුං අග්ගු'පට්ඨිකා.

33. සො'පි බුද්ධො අසමසමො අසීතිහත්ථමුග්ගතො
අතිරොචති තෙජෙන දස්සහස්සිම්හි ධාතුයා.

34. සුඵුල්ලො සාලරාජාව විජ්ජූ'ව ගගනෙ යථා
මජ්ඣන්තිකෙ ව සුරියො එවං සො උපසොභථ[2]

35. තස්සා'පි අතුලතෙජස්ස සමකං ආසි ජීවිතං
වස්සසතසහස්සානි ලොකෙ අට්ඨාසි චක්ඛුමා.

36. ඔභාසං දස්සයිත්වාන විමලං කත්වාන සාසනං
රවිචන්දො ව ගගනෙ නිබ්බුතො සො සසාවකො'ති.

37. ධම්මදස්සී මහාවීරො කෙසාරාමම්හි[3] නිබ්බුතො
තත්ථෙ'ව'ස්ස[4] ථූපවරො තියොජන සමුග්ගතොති.

ධම්මදස්සී බුද්ධවංසො පන්නරසමො.

1. බිම්බජාලො – සීමු.
2. උපසොභිත්ථ – PTS
3. සාලාරාමම්හි - මජසං..
4. සො – සීමු. PTS

26. උන් වහන්සේ අට දහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. ඔබට අරජයැ විරජ යැ සුදස්සන යැ යි උතුම් තුන් පහයෙක් වී.

27. මොනොවට සරහනලද තෙසාලිස් දහසක් පරිවාරස්ත්‍රීහු වූහ, විචිකොලී නම් අගමෙහෙසියක් වූ, පුත්‍ර තෙම පුඤ්ඤවර්ධන නම් වී.

28. පුරුෂොත්තම වූ ධර්මදර්ශී බුදුහු සතර පෙරනිමිති දැක ප්‍රාසාදය හා සමග මහබිනික්මන් කළහ, සතියක් ප්‍රධන්වීර්‍ය්‍ය කළහ.

29. මහත්වීර්‍ය්‍ය ඇති නරශ්‍රෙෂ්ඨ වූ නරොත්තම වූ ධර්මදර්ශී සර්‍වඥයන් වහන්සේ මහබඹහු විසින් අයදනාලදහු මුවළැවිහි දී දම්සක් පැවැත්වූහ.

30. ධර්මදර්ශී නම් ශාස්තෘන් වහන්සේට පදුම යැ ඵුස්සදෙව යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වූහ. සුනෙත්‍ර නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ.

31. ඛෙමා යැ සච්චනාමා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වූහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය 'රත්කරවරුකැ'යි කියනුලැබෙ,

32. සුභද්‍ර යැ කටිස්සහ යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වූහ, සාලියා යැ වලියා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වූහ.

33. අසමසම වූ ඒ බුදුහු ද අසූරියනක් උස් වූවාහු දසදහසක් සක්වළ තෙජසින් අධික වැ බැබැළූහ.

34. සුපිපි සල්රුකක් සෙයින් ද ගුවන්තෙලෙහි විදුලිය සෙයින් ද මධ්‍යාහ්නයෙහි සූර්‍ය්‍යයා සෙයින් ද උන් වහන්සේ ශොභමාන වූහ.

35. අතුල වූ තෙජස් ඇති ඒ ධර්මදර්ශී සර්‍වඥයන් වහන්සේගේ ද ජීවිතය සෙසුවන් හා සම විය, පසැස් ඇති බුදුහු හවුරුදු ලක්ෂයක් ලොවැ වැඩවිසූ සේක.

36. ඒ බුදුහු අවභාස දක්වා සස්න නිර්මල කොට ගුවන්තෙලෙහි සඳහිරු සෙයින් ශ්‍රාවකයන් සහිත වැ පිරිනිවියහ.

37. මහත්වීර්‍ය්‍ය ඇති ධර්මදර්ශී සර්‍වඥයන් වහන්සේ කෙසාරාමයෙහි පිරිනිවියහ, එහි මැ උන් වහන්සේ ගේ උත්තමස්තූපය තුන්යොත්නක් උස් කොට බඳවනලද්දේ යි.

**පසළොස් වැනි ධර්මදර්ශී බුඩවංශය යි.**

# 16. සිද්ධත්ථ බුද්ධවංසො

1. ධම්මදස්සිස්ස අපරෙන සිද්ධත්ථො ලොකනායකො[1]
නිහන්ත්වා තමං සබ්බං සූරියො අබ්භුග්ගතො යථා[2]

2. සො'පි පත්වාන සම්බොධිං[3] සන්තාරෙන්තො[4] සදෙවකං
අභිවස්සි ධම්මමෙඝෙන නිබ්බාපෙන්තො සදෙවකං.

3. තස්සා'පි අතුලතෙජස්ස අහෙසුං අභිසමයා තයො
කොටිසතසහස්සානං පඨමා'භිසමයො අහු.

4. පුනා'පරං භීමරථෙ[5] යදා අහනි දුන්දුභිං[6]
තදා නවුතිකොටීනං දුතියා'භි සමයො අහු.

5. යදා බුද්ධො ධම්මං දෙසෙසි වෙභාරෙ සො පුරුත්තමෙ
තදා නවුති කොටීනං තතියා'භිසමයො අහු.

6. සන්නිපාතා තයො ආසුං තස්මිම්'පි දිපදුත්තමෙ
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන'තාදිනං

7. කොටිසතානං නවුතීනං අසීතියා ච කොටීනං
එතෙ ආසුං තයො ඨානා විමලානං සමාගමෙ.

8. අහං තෙන සමයෙන මඞ්ගලො නාම තාපසො
උග්ගතෙජො දුප්පසහො අභිඤ්ඤාබලසමාහිතො.

9. ජම්බුතො ඵලමා'නෙත්වා[7] සිද්ධත්ථස්ස අදාස'හං
පටිග්ගහෙත්වා සම්බුද්ධො ඉදං වචන'මබ්‍රවි.

10. පස්සථ ඉමං තාපසං ජටිලං උග්ගතාපනං
චතුනවුතෙ ඉතො කප්පෙ අයං බුද්ධො භවිස්සති.

11. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

12. අජපාලරුක්ඛමූලම්හි නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

---

1. නාමනායකො – සීමු.
2. සුරියොවබ්භුග්ගතො තද – මවි.
3. සම්බුද්ධං – සීමු.
4. සන්තාරෙත්වා – මවි.
5. භීමරථයො – සීමු. PTS ස්‍යා.
6. යදිආහනිදුන්දුභිං – PTS
7. ඵලමාහත්වා – සීමු. PTS

# 16. සිද්ධාත්ථ බුද්ධවංශය

1. ධම්මදර්ශී නම් බුදුන්ට මැතභාගයෙහි සිද්ධාත්ථ නම් ලොකනායක-යන් වහන්සේ හැම අඳුරු නසා උදවූ සූර්‍ය්‍යයා සෙයින් ලොවැ පහළ වූසේක.

2. උන් වහන්සේ ද සම්බොධියට පැමිණ සදෙවකලොකයා සසර කතරින් තරවමින් සදෙවකලොකයා නිවමින් දහම්වැසි වැස් වූ සේක.

3. අතුල වූ තෙජස් ඇති උන් වහන්සේට ද අභිසමය තුනෙක් විය, කෙළ ලක්ෂයක් සත්නට ප්‍රථමාභිසමය වී.

4. යළි යම් කලෙකැ භීමරථ නම් නගරයෙහි දහම් අමා බෙර වැයූ-සේක් ද, එකල්හි අනූ කෙළක් සත්නට ද්විතීයාභිසමය වී.

5. යම් කලෙකැ ඒ සිද්ධාත්ථ නම් බුදුහු වෙහාර නම් පුරවරයෙහි (ඥාතිසමාගමයෙහි) දහම් දෙසූසේක් ද, එකල්හි අනූ කෙළක් සත්නට තෘතීයාභිසමය වී.

6. ද්විපදෙත්තම වූ ඒ සිද්ධාත්ථ බුදුන් කෙරෙහි ද විමල වූ සන්හුන්සිත් ඇති තාදීගුණ ඇති ක්ෂීණාශ්‍රවයන්ගේ සන්නිපාතත්‍රයෙක් වී.

7. කෙළසියක් ද අනූ කෙළක් ද අසූ කෙළක් ද යන තෙල තිදෙන රහතුන්ගේ සමාගමයෙහි සන්නිපාතස්ථානයෝ වූහ.

8. එසමයෙහි මම් උග්‍ර තෙජස් ඇති නො ගැටියහැකි අභිඥබලසමාධි ඇති මඞ්ගල නම් තවුස් වීමි.

9. මම් දඹරුකින් එල ගෙනවුත් සිද්ධාත්ථ බුදුන්ට දුනිමි, සම්බුදුහු පිළිගෙන මෙවදන් වදළහ.

10. ජටාධර වූ උග්‍රතපස් ඇති මෙ තවුස් බලව. මේ තෙම මෙයින් සිවු අනූ වන කප්හි බුදු වන්නේ ය.

11. එකල්හි තථාගතයෝ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්-වීර්‍ය්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට -

12. තථාගතයෝ අජපාල නම් නුගරුක් මුල්හි වැඩහිඳ එහි දී කිරිපිඬු පිළිගෙන නිල්දලාහෝතෙරට පැමිණෙන්නාහ.

13. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

14. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

15. ඉමස්ස ජනිකා මාතා, මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

16. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමු'පට්ඨාකො, උපට්ඨිස්සති තං ජිනං.

17. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

18. චිත්තො ච හත්ථාළවකො, අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

19. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො,
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

20. උක්කුට්ඨිසද්දා වත්තන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී, නමස්සන්ති දසසහස්සිදෙවතා.

21. යදිමස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

22. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථං ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

23. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

24. තස්සා'පි වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දසපාරමී පූරියා.

25. වෙභාරං නාම නගරං උදෙනො නාම ඛත්තියො
සුඵස්සා නාම ජනිකා සිද්ධත්ථස්ස මහෙසිනො.

13. ඒ පස්මරුන් දිනූ බෝසත්හු නිල්දලාභෝතෙර දී කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තමමාර්ගයෙන් බෝමුල වෙත පැමිණෙන්නාහ.

14. ඉක්බිති මහායසස් ඇති අනුත්තර මහසත් බෝමැඩ පැදකුණු කොට ඇසැතුරුක්මුල්හි දී බුදු වන්නේ යි.

15. මොවුන්ගේ ජනිකමව මායා නම් වන්නී යැ, පිය තෙම ශුද්ධෝදන නම් වන්නේ යැ. මේ තෙම ගෞතම නම් වන්නේ යි.

16. කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් තෙර කෙනෙක් ඒ බුදුන්ට උපස්ථාන කරන්නාහ.

17. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බෝධිය ඇසැතු යයි කියනු ලැබේ.

18. චිත්‍ර යැ හත්ථාළවක යැ යන දෙදෙන අග්‍රෝපස්ථායක වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අග්‍රෝපස්ථායිකා වන්නාහ. ඒ යසස් ඇති ගෞතම බුදුනට හවුරුදු සියයෙක් ආයු වෙයි.

19. අසම වූ මහර්ෂීන්ගේ මෙ වදන් අසා 'මේ බුද්ධබීජාඞ්කුරයෙකැ'යි සතුටු වූ දෙව්මිනිස්සු -

20. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත ලෝකයා බද්දිලි වැ නමස්කාර කෙරෙයි.

21. ඉදින් ඇපි මේ ලොකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

22. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛ තීර්ථය වැරැද්ද යටැ තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද -

23. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

24. උන් වහන්සේගේ ද බස් අසා බෙහෙවින් සිත පැහැදවීමි. දස-පාරමීන් පුරනු පිණිස මත්තෙහි ව්‍රතාධිෂ්ඨාන කෙළෙමි.

25. මහර්ෂි වූ සිද්ධාර්ථ බුදුන් ගේ නගරය වෙභාර නම. උදේන නම් ක්ෂත්‍රිය තෙම පියා විය, මව් තොමෝ සුඵස්සා නමු.

26. දසවස්සසහස්සානි අගාරමජ්ඣ සො වසි
කොකාසුප්පලකොකනද තයො පාසාදමුත්තමා.

27. තිසොළසසහස්සානි නාරියො සමලඞ්කතා
සුමනා නාම සා නාරී අනුපමො නාම අත්‍රජො.

28. නිමිත්තෙ චතුරො දිස්වා සිවිකායානෙන නික්ඛමි
අනූනදසමාසානි පධානං පදහී ජිනො.

29. බ්‍රහ්මුනා යාචිතො සන්තො සිද්ධත්ථො ලොකනායකො
වත්ති චක්කං මහාවීරො මිගදායෙ නරුත්තමො.[1]

30. සම්බලො ච සුමිත්තො ච අහෙසුං අග්ගසාවකා
රෙවතො නාමු'පට්ඨාකො සිද්ධත්ථස්ස මහෙසිනො.

31. සීවලා ච සුරාමා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො කණිකාරොති වුච්චති.

32. සුප්පියො ච සමුද්දො ච අහෙසුං අග්ගු'පට්ඨකා
රම්මා චෙව සුරම්මා ච අහෙසුං අග්ගු'පට්ඨිකා.

33. සො බුද්ධො සට්ඨි රතනං අහොසි නභමුග්ගතො,
කඤ්චනග්ඝිය[2] සංකාසො දසසහස්සී විරොචති.

34. සො'පි බුද්ධො අසම සමො අතුලො අප්පටිපුග්ගලො
වස්සසතසහස්සානි ලොකෙ අට්ඨාසි චක්ඛුමා.

35. විපුලං[3] පභං දස්සයිත්වා පුප්ඵාපෙත්වාන සාවකෙ
විලාසෙත්වා ච සමාපත්‍යා[4] නිබ්බුතො සො සාසවකො.

36. සිද්ධත්ථො මුනිවරො බුද්ධො අනොමාරාමම්හි නිබ්බුතො
තත්ථෙ'ව'ස්ස ථූපවරො චතුයොජනමුග්ගතො'ති.

**සිද්ධත්ථ බුද්ධවංසො සොළසමො.**

1. පුරුත්තමෙ – සිමු.
2. කඤ්චනග්ඝික – සිමු.
3. විමලං – සිමු.
4. සමාපත්තියා – සිමු. PTS

26. උන් වහන්සේ දසදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. (ඔබට) කොකාසය යැ උත්පල යැ කොකනද යැ යි උතුම් තුන් පහයෙක් වී.

27. ඔබට මොනොවට සරසන ලද අටසාළිස් දහසක් පරිවාරස්ත්‍රීහු වූහ. අගමෙහෙසි සුමනා නමු. පුත්‍ර තෙම අනුපම නමි.

28. පස්මරුන් දිනූ බුදුහු සතර පෙරනිමිති දැක රන්සිවිගෙයෙකින් මහබිනික්මන් කළහ. පිරිපුන් දසමසක් ප්‍රධන්වීර්‍ය්‍ය කළහ.

29. මහත්වීර්‍ය්‍ය ඇති පුරුෂොත්තම වූ සිද්ධාත්ථ නම් බුදුහු මහබඹහු විසින් අයදනාලදහු (ගයා නම් වූ) මිගදයෙහි දී දම්සක් පැවැත්වූසේක.

30. මහර්ෂි වූ සිද්ධාත්ථ නම් සර්‍වඥයන් වහන්සේට සම්බල යැ සුමිත්‍ර යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වූහ. රෙවත නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ.

31. සීවලා යැ සුරාමා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වූහ. ඒ භාග්‍ය-වතුන්ගේ බොධිය කිණිහිරි යයි කියනු ලැබේ.

32. සුප්‍රිය යැ සමුද්‍ර යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වූහ. රම්මා යැ සුරම්මා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වූහ.

33. ඒ බුදුහු සැටරියන් උස් වූහ. කසුන් ඇගැයක් සෙයින් දසදහසක් සක්වළ බැබැළ වූහ.

34. අසමසම වූ අතුල්‍ය වූ ප්‍රතිපුද්ගලයන් නැති පසැස් ඇති ඒ බුදුහු ද හවුරුදු ලක්ෂයක් ලොවැ වැඩසිටියහ.

35. ඒ බුදුහු උදාර වූ ආලොකය දක්වා (ධ්‍යානාභිඥ මාර්‍ග ඵලකුසුම-යෙන්) ශ්‍රාවකයන් විකසිත කරවා (ලොවිලොවුතුරා) සමවතින් ක්‍රීඩා කරවා ශ්‍රාවකයන් සහිත වැ පිරිනිවියාහ.

36. මුනිවර වූ සිද්ධාත්ථ බුදුහු අනොමාරාමයෙහි පිරිනිවියහ. එහි මැ උන් වහන්සේගේ ස්තූපය සිව්ගව්යාත්නක් උස් කොට බඳවනලදි.

**සොළොස් වැනි සිද්ධාත්ථ බුද්ධවංශය යි.**

## 17. තිස්ස බුද්ධවංසො

1. සිද්ධත්ථස්ස අපරෙන අසමො අප්පටිපුග්ගලො
අනන්තතෙජො[1] අමිතයසො තිස්සො ලොකග්ගනායකො.

2. තම'න්ධකාරං විධමෙත්වා ඔභාසෙත්වා සදෙවකං[2]
අනුකම්පකො මහා වීරො ලොකෙ උප්පජ්ජි චක්ඛුමා

3. තස්සා'පි අතුලා ඉද්ධි අතුලං සීලං සමාධි ච
සබ්බත්ථ පාරමිං ගන්ත්වා ධම්මචක්කං පවත්තයී.

4. සො බුද්ධො දසසහස්සිම්හි විඤ්ඤාපෙසි ගිරං සුචිං
කොටිසතානි අභිසමිංසු පඨමෙ ධම්මදෙසනෙ.

5. දුතියො නවුතිකොටීනං[3] තතියෙ සට්ඨිකොටියො[4]
බන්ධනාතො[5] පමොචෙසි[6] සම්පත්තෙ නරමරූ තදා.

6. සන්නිපාතා තයො ආසුං තිස්සස ලොකග්ගනායකෙ
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන තාදිනං.

7. ඛීණාසවසතසහස්සානං[7] පඨමො ආසි සමාගමො
නවුති සත සහස්සානං දුතියො ආසි සමාගමො.

8. අසීති සතසහස්සානං තතියො ආසි සමාගමො
ඛීණාසවානං විමලානං පුප්ඵිතානං විමුත්තියා.

9. අහං තෙන සමයෙන සුජාතො නාම ඛත්තියො
මහාභොගං ඡඩ්ඩයිත්වා පබ්බජිං ඉසිපබ්බජං.

10. මයි පබ්බජිතෙ සන්තෙ උප්පජ්ජි ලොකනායකො
බුද්ධො'ති සද්දං සුත්වාන පීති මෙ උපපජ්ජථ.

11. දිබ්බං මන්දාරවං පුප්ඵං පදුමං පාරිච්ඡත්තකං
උභො හත්ථෙහි පග්ගය්හ ධූනමානො උපාගමිං.

---

1. අනන්තසීලො – මචි. PTS
2. සදෙවකෙ – මචි.
3. දුතියෙ නවුතිකොටියො – සීමු.
4. තතියො සත්ත කොටියො – සීමු.
5. බන්ධනාසො – සීමු. 6. විමොචෙසි – PTS
7. ඛීණාසව සහස්සානං – සීමු.

# 17. තිස්ස බුද්ධවංශය

1-2. සිද්ධාත්ථ නම් බුදුන්ට මැත භාගයෙහි අසම වූ අප්‍රතිපුද්ගල වූ අනන්තතෙජස් ඇති අප්‍රමාණ යසස් ඇති ලොකාග්‍රනායක වූ අනුකම්පා ඇති මහත්වීර්‍ය්‍ය ඇති පසැස් ඇති තිස්ස නම් බුදුහු අවිද්‍යාන්ධකාරය නසා සදෙවක ලොකය බබුළුවා ලොවැ පහළ වූසේක.

3. ඒ තිස්ස නම් බුදුන්ගේ ද සෘද්ධිය අතුල්‍ය වූ යැ ශීලය ද සමාධිය ද අතුල්‍ය වී. (ඒ බුදුහු) සියලු දහම් විෂයෙහි පරතෙරට පැමිණ දම්සක් පැවැත් වූසේක.

4. ඒ බුදුහු දසදහසක් සක්වළැ පවිත්‍ර වූ සිව්සස්වදන් අවබොධ කරවූහ, ප්‍රථම ධර්මදෙශනායෙහි කෙළසියක් සත්හු ධර්මාවබොධය කළහ.

5. අනූකෙළක් සත්නට දෙ වැනි ධර්මාභිසමය වී, තෙ වැනි ධර්මදෙශනායෙහි සැටකෙළක් සත්හු ධර්මාවබොධය කළහ, එකල්හි පැමිණි දෙවිමිනිසුන් දශසංයොජනයෙන් මිදූසේක.

6. තිස්ස නම් බුදුරජාණන් වහන්සේට විගත රාගාදිමල ඇති සන්හුන්සිත් ඇති තාදීගුණ ඇති රහත් ශ්‍රාවකයන්ගේ සන්නිපාත තුනෙක් වී.

7. ලක්ෂයක් රහතුන්ගේ ප්‍රථම සන්නිපාතය වී යැ, අනූ ලක්ෂයක් රහතුන්ගේ ද්විතීය සන්නිපාතය වී.

8. අර්හත්ඵල විමුක්තියෙන් විකසිත වූ විගතරාගාදි මල ඇති අසූ ලක්ෂයක් රහතුන්ගේ තෘතීය සන්නිපාතය වී.

9. එසමයෙහි මම් සුජාත නම් ක්ෂත්‍රිය වූයෙම් මහත් වූ භොග හැර පියා සෘෂිප්‍රව්‍රජ්‍යාවට පැමිණියෙමි.

10. මා පැවිදි වූ කල්හි බුදුහු ලොවැ පහළ වූහ. 'බුද්ධ' යන හඬ අසා මට ප්‍රීති උපන.

11. දිවමදාරාමල් පරසතු කුසුම් දෙහොතින් ගෙන සැලෙනුයෙම් බුදුන් කරා එළැඹියෙමි.

12. චාතුවණ්ණපරිවුතං තිස්සං ලොකග්ගනායකං
තම'හං පුප්ඵං ගහෙත්වාන මත්ථකෙ ධාරයිං ජිනං.

13. සො'පි මං බුද්ධො[1] ව්‍යාකාසි ජනමජ්ඣෙ නිසීදිය
ද්වෙනවුතෙ ඉතො කප්පෙ අයං බුද්ධො භවිස්සති.

14. අහු කපිලව්හයා රම්මං නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

15. අජපාලරුක්ඛමූලම්හි නිසීදිත්වා තථාගතො
තත්ථපායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

16. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

17. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

18. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

19. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නා'මුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

20. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

21. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු' පට්ඨිකා
ආයුවස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

22. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

23. උක්කුට්ඨි සද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

---

1. කද – සිමු.

12. මම එකුසුම් ගෙන සිව්පිරිස් පිරිවැරූ ලොවට එක් මැ නායක වූ තිස්ස නම් බුදුන්ගේ මස්තකයෙහි ධැරීමි.

13. ඒ බුදුහු ද පිරිස්මැද වැඩහිඳ 'මේ තෙම මෙයින් දෙයානූ වන කප්හි බුදු වන්නේ යැ'යි මට විවරණ දුන්සේක.

14. එකල්හි තථාගතයෝ රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය්‍ය වඩා දුෂ්කර ක්‍රියා කොට -

15. තථාගතයෝ අජපාල නම් න්‍යග්‍රොධ මූලයෙහි වැඩහිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලාහෝතෙරට එළැඹෙන්නාහ.

16. ඒ පස්මරුන් දිනූ බුදුහු නිල්දලාහෝ තෙර දී කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙළ කළ උත්තම මාර්ගයෙන් බෝමුල් වෙත එන්නාහ.

17. ඉක්බිති මහායසස් ඇති අනුත්තර වූ බුදුහු බෝමැඩ පැදකුණු කොට ඇසැතුරුක් මුල්හි දී බුදු වන්නාහ.

18. මොවුන්ගේ ජනිකමව මායා නම් වන්නී යැ, පිය තෙම සුදෙවුන් නම් වන්නේ යැ, මේ තෙම ගොයුම් නම් වන්නේ යි.

19. ඔබට 'කොලිත' යැ 'උපතිස්ස' යැ යන දෙදෙන අගසවු වන්නාහ. 'අනඳ' නම් තෙර කෙනෙක් පස්මරුන් දිනූ එබුදුන්ට උවැටන් කරන්නාහ.

20. 'ඛෙමා' යැ උප්පලවණ්ණා' යැ යන දෙදෙන අගසැවි වන්නාහ. එබුදුන්ගේ බොධිය 'ඇසැතු' යයි කියනු ලැබෙ.

21. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අග උවටු වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අග උවට වන්නාහ. යසස් ඇති ඒ ගොයුම් ගොත් බුදුනට හවුරුදු සියයෙක් ආයු වෙයි.

22. අසම වූ මහර්ෂීන්ගේ මෙ තෙපුල් අසා 'මේ බුද්ධබීජාඞ්කුරයෙකැ'යි සතුටු වූ දෙවිමිනිස්සු–

23. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දසදහසක් සක්වළ දෙවියන් සහිත සත්ත්වයෝ ඇඳිලිබැඳ නමස්කාර කෙරෙති.

24. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

25. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

26. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි' මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

27. තස්සා'පි වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වත මධිට්ඨාසිං දසපාරමී පූරියා.

28. ඛෙමකං නාම නගරං ජනසන්ධො නාම ඛත්තියො
පදුමා නාම ජනිකා තිස්සස්ස ච මහෙසිනො.

29. සත්තවස්සසහස්සානි අගාරමජ්ඣෙ සො වසි
ගුහා සෙලනාරි නිසභා තයො පාසාද මුත්තමා

30. සමතිංස සහස්සානි නාරියො සමලඞ්කතා
සුභද්දා නාම සා නාරි ආනන්දො නාම අත්‍රජො.

31. නිමිත්තෙ චතුරො දිස්වා අස්සයානෙන නික්ඛමි
අනූනකං අට්ඨමාසං පධානං පදහී ජිනො.

32. බ්‍රහ්මුනා යාචිතො සන්තො තිස්සො ලොකග්ගනායකො
වත්ති චක්කං මහාවීරො යසවතීදයමුත්තමෙ.

33. බ්‍රහ්මදෙවො ච උදයො ච අහෙසුං අග්ගසාවකා
සමඞ්ගො[1] නාමුපට්ඨාකො තිස්සස්ස ච මහෙසිනො.

34. ඵුස්සා චෙව සුදත්තාච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො අසනො'ති පවුච්චති.

35. සම්බලො ච සිරී[2] චෙව අහෙසුං අග්ගුපට්ඨකා
කිසාගොතමී උපසෙනා අහෙසුං අග්ගුපට්ඨිකා.

1. සමඞ්ගො - මවි, සමගො - සයා, සුමඞ්ගලො
2. සිරිමා - මජසං. - සීමු.

24. ඉදින් ඇපි මේ ලෝකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

25. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛ තීර්ථය වැරැද යටැ තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද–

26. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

27. මම් ඒ බුදුනුදුගේ තෙපුල් අසා බෙහෙවින් සිත පැහැදවීම්, දසපාරමීන් පුරන පිණිස මත්තෙහි ව්‍රතාධිෂ්ඨාන කෙළෙමි.

28. මහර්ෂි වූ තිස්ස බුදුන්ගේ නගරය ඛෙමක නම. පිය වූ ක්ෂත්‍රිය තෙම 'ජනසන්ධ' නම, මව පදුමා නමු.

29. ඒ තිස්ස බුදුහු සත් දහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. ඔබට 'ගුහා' යැ 'සෙලනාරි' යැ 'නිසභා' යැ යි උතුම් තුන් පහයෙක් වී.

30. මොනොවට සරසනලද තිස්දහසක් පරිවාරස්ත්‍රීහු වූහ. සුභද්‍රා නම් ස්ත්‍රිය අගමෙහෙසි වූ. පුත්‍ර තෙම ආනන්ද නම් වී.

31. ජිතපඤ්චමාර බුදුහු සතර පෙරනිමිති දැක අශ්වයානයෙකින් මහබිනික්මන් කළහ. පුරා අටමසක් ප්‍රධන්වීයඹ් කළහ.

32. මහාවීර වූ තිස්ස නම් බුදුහු මහබඹහු විසින් අයදනාලදහු උතුම් වූ යසවත් නම් මුවළැවිහි දී දම්සක් පැවැත්වූසේක,

33. මහර්ෂි වූ තිස්ස බුදුනට බ්‍රහ්මදෙව යැ උදය යැ යන දෙදෙන අගසවු වූහ. සමඞ්ග නම් උපස්ථායක තෙර කෙනෙක් වූහ.

34. ඵුස්සා යැ සුදත්තා යැ යන දෙදෙන අගසැවි වූහ, එබුදුන්ගේ බොධිය 'පියාරුකා' යි කියනුලැබේ.

35. ඔබට සම්බල යැ සිරි යැ යන දෙදෙන අග උවටු වූහ. කිසාගොතමී යැ. උපසේනා යැ යන දෙදෙන අග උවට වූහ.

36. සො'පි බුද්ධො සට්ඨිරතනො අහු උච්චත්තනෙ[1] ජිනො
අනූපමො අසදිසො හිමවා විය දිස්සති.

37. තස්සා'පි අතුලතෙජස්ස ආයු ආසි අනුත්තරො
වස්සසතසහස්සානි ලොකෙ අට්ඨාසි චක්ඛුමා.

38. උත්තමං පවරං සෙට්ඨං අනුභොත්වා මහායසං
ජලිත්වා අග්ගික්ඛන්ධො'ව නිබ්බුතො සො සසාවකො.

39. වලාහකොව අනිලෙන සූරියෙන විය උස්සාවො
අන්ධකාරොව දීපෙන නිබ්බුතො සො සසාවකො.

40. තිස්සො ජිනවරො බුද්ධො නන්දාරාමම්හි නිබ්බුතො
තත්ථෙ'ව තස්ස ජිනථූපො තීණි යොජනමුස්සිතො'ති.

**තිස්ස බුද්ධවංසො සත්තරසමො.**

1. උච්චත්තරෙන - සීමු.

36. පස් මරුන් දිනූ එබුදුහු ද උස්බැවිහි සැටරියන් ඇති වූහ. ඔබ අනුපම අසදෘශ වූවාහු හිමගිරි සෙයින් පැනුණාහ.

37. අතුල වූ තෙජස් ඇති ඒ තිස්ස බුදුනට ද සුවහසෙක් හවුරුදු ආයු විය. පසැස් ඇති අනුත්තර බුදුහු එතෙක් කල් ලොවැ වැඩසිටියහ.

38. ඒ තිස්ස බුදුහු උත්තම වූ ප්‍රවර වූ ශ්‍රෙෂ්ඨ වූ මහායසස් අනුභව කොට ගිනිකඳක් සෙයින් දිලිහී ශ්‍රාවකයන් හා සමග පිරිනිවියාහ.

39. පවනින් වලා සෙයින් ද හිරුගෙන් පිනිබිඳු සෙයින් ද පහනින් අඳුර සෙයින් ද එබුදුහු සව්වන් හා සමග පිරිනිවියාහ.

40. ජිනවර වූ තිස්ස බුදුහු නන්දරාමයෙහි පිරිනිවියාහ, එහි මැ උන් වහන්සේගේ ජිනස්තූපය තුන් යොත්නක් උස් කොට බඳවන ලද්දේ යි.

සතළොස් වැනි තිස්ස බුද්ධවංශය යි.

## 18. ඵුස්ස බුද්ධවංසො

1. තත්ථෙ'ව මණ්ඩකප්පම්හි අහු සත්ථා අනුත්තරො
අනූපමො අසදිසො[1] ඵුස්සො ලොකග්ගනායකො.

2. සො'පි සබ්බං තමං හන්ත්වා විජටෙත්වා මහාජටං
සදෙවකං තප්පයන්තො අභිවස්සි අමතම්බුනා.

3. ධම්මචක්කං පවත්තෙන්තෙ ඵුස්සෙ නක්ඛත්තමඞ්ගලෙ
කොටිසතසහස්සානං පඨමා'භිසමයො අහු.

4. නවුතිසතසහස්සානං දුතියා'භිසමයො අහු
අසීතිසතසහස්සානං තතියා'භිසමයො අහු.

5. සන්නිපාතා තයො ආසුං ඵුස්සස්ස'පි මහෙසිනො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන'තාදිනං.

6. සට්ඨිසතසහස්සානං පඨමො ආසි සමාගමො
පඤ්ඤාසසතසහස්සානං දුතියො ආසි සමාගමො.

7. චත්තාරීසසතසහස්සානං තතියො ආසි සමාගමො
අනුපාද විමුත්තානං වොච්ඡින්නපටිසන්ධිනං.

8. අහං තෙන සමයෙන විජිතාවී නාම ඛත්තියො
ඡඩ්ඩයිත්වා[2] මහාරජ්ජං පබ්බජිං තස්ස සන්තිකෙ.

9. සො'පි මං බුද්ධො ව්‍යාකාසි ඵුස්සො ලොකග්ගනායකො
ඉතො ද්වෙ නවුති[3] කප්පෙ අයං බුද්ධො භවිස්සති.

10. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

11. අජපාලරුක්ඛමූලම්හි නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසං පග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

---

1. අසමසමො – සීමු. 2. ඡඩ්ඩයිත්වාන – සීමු.
3. ද්වානවුතෙ – මවි, ද්වෙනවුතෙ – සීමු.

## 18. ඵුස්ස බුද්ධවංශය

1. එ මැ මණ්ඩ නම් කල්පයෙහි අනුත්තර වූ අනුපම වූ අසදෘශ වූ ලොකාග්‍රනායක වූ ඵුස්ස නම් ශාස්තෘ කෙනෙක් පහළ වූහ.

2. ඒ ඵුස්ස නම් බුදුරජාණන් වහන්සේ ද සියලු අවිද්‍යාන්ධකාර නසා තෘෂ්ණාව හැරපියා සදෙවක ලොකයා අමෘත සඞ්ඛ්‍යාත දහම් කථා ජලයෙන් පිණවමින් දහම් වැසි වැස් වූහ.

3. නකත්මඟුල් දින ඵුස්ස බුදුන් දම්සක් පවත්වන කල්හි කෙළ ලක්ෂයක් සත්නට පළමු වන ධර්මාභිසමය වී.

4. අනූලක්ෂයක් සත්නට දෙ වැනි ධර්මාභිසමය විය, අසූලක්ෂයක් සත්නට තුන්වැනි ධර්මාභිසමය වී.

5. මහර්ෂි වූ ඵුස්ස බුදුනට ද විමල වූ ශාන්ත සිත් ඇති තාදීගුණ ඇති ක්ෂීණාස්‍රව ශ්‍රාවකයන්ගේ සන්නිපාත තුනෙක් වී.

6. සැට ලක්ෂයක් ශ්‍රාවකයන්ගේ ප්‍රථම සමාගමය විය, පනස්ලක්ෂයක් ශ්‍රාවකයන්ගේ ද්විතියසන්නිපාතය වී.

7. උපාද රහිත වැ කෙලෙසුන් කෙරෙන් මිදුණු සිඳහළ ප්‍රතිසන්ධි ඇති සතලිස් ලක්ෂයක් ශ්‍රාවකයන්ගේ තෘතීය සන්නිපාතය වී.

8. එසමයෙහි මම් විජිතාවී නම් ක්ෂත්‍රිය වූයෙම් මහරජය හැරපියා ඒ ඵුස්ස බුදුන් වෙත පැවිදි වීමි.

9. ලොකාග්‍රනායක වූ ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේ ද 'මේ තෙම මෙයින් දෙයානූ වන කප්හි බුදු වන්නේ යැ' යි මට විවරණ දුන්සේක.

10. එකල්හි තථාගතයෝ රම්‍ය වූ කපිලවාස්තු නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට–

11. තථාගතයෝ අජපල් නම් නුගරුක්මුල්හි හිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දැලාහෝතෙරට එළැඹෙන්නාහ.

12. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදාය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලම්හි එහිති.

13. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

14. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

15. කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමු'පට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

16. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

17. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

18. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

19. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති[1] හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

20. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

21. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ[1] ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

22. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

23. තස්සා'පි වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වත මධිට්ඨාසිං දසපාරමිපූරියා.

24. සුත්තන්තං විනයඤ්චා'පි නවඞ්ගං සත්ථුසාසනං
සබ්බං පරියාපුණිත්වාන සොභයිං ජිනසාසනං.

1. තිත්ථං – මුද.

12. ඒ ජින තෙම ගිල්දලංහෝතෙර දී කිරිපිඩු වළඳා (දෙවියන්) පිළියෙල කළ උතුම් මඟින් බෝමුල වෙත පැමිණෙන්නේය.

13. ඉක්බිති මහායසස් ඇති අනුත්තර වූ මහසත් බෝමැඩ පැදකුණු කොට ඇසැතුරුක්මුල්හි දී බුදු වන්නේය.

14. මොවුන්ගේ ජනිකමව මායා නම් වන්නී යැ, පිය තෙම ශුද්ධොදන නම් වන්නේ යැ, මේ තෙම ගෞතම නම් වන්නේ යි.

14. (ඔබට) ඉකොලිත යැ උපතිස්ස යැ යන දෙදෙන අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායක තෙර කෙනෙක් එ බුදුන්ට උවැටන් කරන්නාහ.

16. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බෝධිය 'ඇසැතු' යයි කියනු ලැබේ.

17. චිත්ත යැ හත්ථාළවක යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වන්නාහ, යසස්වී වූ ඒ ගෞතම බුදුනට හවුරුදු සියයෙක් ආයු වෙයි.

18. අසම වූ මහර්ෂීන්ගේ මෙ තෙපුල් අසා 'මේ තෙම බුද්ධබීජා-ඞකුරයෙකැ'යි සතුටු වූ දෙව්මිනිස්සු–

19. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනාසෙති, දසදහසක් සක්වළ සදෙවකලොකයා බඳුදිලි වැ නමස්කාර කෙරෙයි.

20. ඉදින් අපි මේ ලෝකනාථයන්ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

21. යම්සේ මිනිස්සු ගංහෝ තරණය කරන්නාහු ප්‍රතිමුඛතීර්ථය වැරැද යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද–

22. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මෙබුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

23. එ බුදුන්ගේ ද බස් අසා බෙහෙවින් සිත පැහැදවීමි. දසපාරමීන් පුරන පිණිස මත්තෙහි ව්‍රතාධිෂ්ඨානය කෙළෙමි.

24. සූත්‍රාන්තපිටකය ද විනය ද නවාඞ්ගශාස්තෘශාසනය ද යන සියල්ල පිරිවහා බුදු සස්න හෙබැ වීමි.

25. තත්ථප්පමත්තො විහරන්තො බ්‍රහ්මං භාවෙත්වා[1] භාවනං
අභිඤ්ඤාසු පාරමිං ගන්ත්වා බ්‍රහ්මලොක'මගච්ඡ'හං.

26. කාසිකං නාම නගරං ජයසෙනො නාම ඛත්තියො
සිරිමා නාම ජනිකා ඵුස්සස්සාපි මහෙසිනො.

27. නවවස්සසහස්සානි අගාරමජ්ඣාවසො වසී
ගරුළපක්ඛහංසසුවණ්ණභාරා[2] තයො පාසාදමුත්තමා.

28. තිංසසහස්සානි[3] නාරියො සමලඞ්කතා
කිසාගොතමී නාම නාරි අනූපමො[4] නාම අත්‍රජො.

29. නිමිත්තෙ චතුරො දිස්වා හත්ථියානෙන නික්ඛමි
ඡමාසං පධානචාරං අචරි පුරිසුත්තමො.

30. බ්‍රහ්මුනා යාචිතො සන්තො ඵුස්සො ලොකග්ගනායකො
වත්ති චක්කං මහාවීරො මිගදායෙ නරුත්තමො.

31. සුරක්ඛිතො[5] ධම්මසෙනො ච අහෙසුං අග්ගසාවකා
සභියො නාමු'පට්ඨාකො ඵුස්සස්ස ච මහෙසිනො.

32. චාලා ච උපචාලා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො ආමණ්ඩො'ති පවුච්චති.

33. ධනඤ්ජයො විසාඛො ච අහෙසුං අග්ගු'පට්ඨකා
පදුමා චෙ'ව නාගා ච අහෙසුං අග්ගුපට්ඨිකා.

34. අට්ඨපඤ්ඤාසරතනං සො'පි අච්චුග්ගතො මුනි
සොභති සතරංසීව උළුරාජාව පූරිතො[6].

35. නවුතිවස්සසහස්සානි ආයු විජ්ජති තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

36. ඔවදිත්වා බහූ සත්තෙ සන්තාරෙත්වා මහාජනෙ
සො'පි සත්ථා අතුලයසො නිබ්බුතො'සො සසාවකො[7].

37. ඵුස්සො ජිනවරො සත්ථා සෙතාරාමම්හි[8] නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො'ති.

**ඵුස්ස බුද්ධවංසො අට්ඨාරසමො.**

---

1. භාවෙත්වා – PTS,
2. ගරුළපක්ඛහංසසුවණ්ණභාරා – මජ්සං, ගරුළ හංස සුවණ්ණතාරා – ස්‍යා.
3. තෙවීසතිසහස්සානි – සිමු.
4. ආනන්දෙ – සිමු.
5. සුචිතො – සිමු.,
6. උළුරාජාව පූජිතො – මචි.
7. නිබ්බුතොවසසාකො – මචි.
8. සොතාරාමම්හි–සිමු, සෙනාරාමම්හි–ස්‍යා–මජ්සං

25. මම එසසුන්හි අප්‍රමාද වැ වාසය කරනුයෙමි. බ්‍රහ්මවිහාරභාවනා කොට අභිඥාවන්හි පාරප්‍රාප්ත වැ බඹලොවට ගියෙමි.

26. මහර්ෂි වූ ඵුස්ස බුදුන්ට ද නගරය කසී නම් විය, ජයසෙන නම් ක්ෂත්‍රිය තෙම පිතෘ විය, මව්තොමෝ සිරිමා නමූ.

27. ඒ ඵුස්ස බුදුහු නවදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. ඔබට ගරුඩපක්ෂ යැ හංස යැ සුවර්ණභාර යැයි උතුම් තුන්පහයෙක් වී.

28. මොනොවට සරසනලද තිස්දහසක් පිරිවර අඟනෝ වූහ. කිසාගොතමී නම් අගමෙහෙසියක් වූ යැ. අනුපම නම් පුත්‍රයෙක් වී.

29. පුරුෂොත්තම ඵුස්ස බුදුහු සතර පෙරනිමිති දැක ඇත්යානයෙකින් මහබිනික්මන් කළහ. සමසක් ප්‍රධන්වීර්‍ය කළහ,

30. මහන්වීර්‍ය ඇති පුරුෂශ්‍රේෂ්ඨ වූ ලොකාග්‍රනායක වූ ඵුස්ස බුදුහු මහබඹහු විසින් අයදනා ලදහු ඉසිපතන නම් මුවළැව්හි දී දම්සක් පැවැත්වූසේක,

31. මහර්ෂි වූ ඵුස්ස බුදුන්ට සුරක්ෂිත යැ ධර්මසෙන යැ යන දෙදෙන අගසවු වූහ, සභිය නම් උපස්ථායක තෙර කෙනෙක් වූහ,

32, චාලා යැ උපචාලා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වූහ, ඒ භාග්‍යවතුන්ගේ බොධිය 'ඇඹලරුකැ'යි කියනු ලැබේ.

33. ධනඤ්ජය යැ විශාඛ යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වූහ, පද්මා යැ නාගා යැ යන දෙදෙන අග්‍රොපස්ථායිකා වූහ,

34, ඒ ඵුස්ස මුනිහු ද අටපනස්රියන් උස්වූ සේක් දිවයුරු සෙයින් ද පුන්සඳ සෙයින් ද ශොභමාන වූහ,

35. එකල්හි අනූදහසක් හවුරුදු ආයු පැනෙයි, උන්වහන්සේ එතෙක් වැඩසිටිමින් බොහෝ ජනසමූහයා සසරකතරින් තැරවූ සේක.

36, අතුල්‍ය වූ යසස් ඇති ඒ ඵුස්ස බුදුහු ද බොහෝ සත්නට ඔවා දී මහජනයා සසර කතරින් තරවා ශ්‍රාවකයන් සහිත වැ පිරිනිවියාහ.

37. ජිනොත්තම වූ ඵුස්ස බුදුහු සෙතාරාමයෙහි පිරිනිවියාහ. ඒ ඒ ප්‍රදේශයන්හි ධාතු පතළේ යි.

**අටළොස් වැනි ඵුස්ස බුද්ධවංශය යි.**

## 19. විපස්සී බුද්ධවංසො

1. ඵුස්සස්ස ච අපරෙන සම්බුද්ධො දිපදුත්තමො
විපස්සී නාම නාමෙන ලොකෙ උප්පජ්ජි චක්ඛුමා[1].

2. අවිජ්ජං සබ්බං පදලෙත්වා පත්තො සම්බොධිමුත්තමං
ධම්මචක්කං පවත්තෙතුං පක්කාමි බන්ධුමතිං පුරං.

3. ධම්මචක්කං පවත්තෙත්වා උභො බොධෙසි නායකො
ගණනාය න වත්තබ්බො පඨමා'භිසමයො අහු

4. පුනාපරං අමිතයසො තත්ථ සච්චං පකාසයි
චතුරාසීති සහස්සානං දුතියා'භිසමයො අහු.

5. චතුරාසීති සහස්සානි සම්බුද්ධං අනුපබ්බජුං
තෙසමාරාමපත්තානං ධම්මං දෙසෙසි චක්ඛුමා.

6. සබ්බාකාරෙන භාසතො සුත්වා උපනිසාදිනො[2]
තෙ'පි ධම්මං වරං ගන්ත්වා තතියා'භිසමයො අහු.

7. සන්නිපාතා තයො ආසුං විපස්සිස්ස මහෙසිනො
ඛීණාසවානං විමලානං සන්තචිත්තානතාදිනං.

8. අට්ඨසට්ඨීසතසහස්සානං[3] පඨමො ආසි සමාගමො
භික්ඛුසතසහස්සානං දුතියො ආසි සමාගමො.

9. අසීතිභික්ඛුසහස්සානං තතියො ආසි සමාගමො
තත්ථ භික්ඛුගණමජ්ඣෙ සම්බුද්ධො අතිරොචති.

10. අහං තෙන සමයෙන නාගරාජා මහිද්ධිකො
අතුලො නාම නාමෙන පුඤ්ඤවන්තො ජුතින්ධරො.

11. නෙකානං නාගකොටීනං පරිවාරෙත්වාන'හං තදා
වජ්ජෙන්තො' දිබ්බතුරියෙහි ලොකජෙට්ඨං උපාගමිං.

---

1. නායකො – සීමු.
2. භාසතෙ සුත්වා උපනිස්ස ජිතෙ – සීමු.
3. අට්ඨසට්ඨීසහස්සානං – සීමු.–

## 19. විපස්සී බුද්ධවංශය

1. ඵුස්ස බුදුන්ට මෑත භාගයෙහි නමින් විපස්සී නම් වූ පසැස් ඇති ද්විපදෝත්තම වූ සම්බුද්ධරජාණන් වහන්සේ ලොවැ පහළවූසේක.

2. හැම අවිද්‍යා අඳුරු බිඳ උතුම් වූ සම්බොධියට පැමිණියාහු දම්සක් පවත්වන්නට බන්ධුමතී පුරයට වැඩිසේක.

3. දම්සක් පවත්වා (මල්බෑ ඛණ්ඩ රාජපුත්‍ර යෑ, තිස්ස පුරෝහිත පුත්‍ර යෑ යන) දෙදෙනාට සත්‍යාවබොධය කරවූහ. ගණනින් නො කියහෙන සත්ත්ව කෙනෙක් පළමු වැනි ධර්මාවබොධය කළහ.

4. යළි අප්‍රමාණ යශස් ඇති විදර්ශී බුදුහු ඒ ක්ෂෙම නම් මුවළැවෙහි දී සිව්සස් පැවැසූහ. සුවාසූ දහසක් සත්නට ද්විතීයාභිසමය වී.

5. සුවාසූ දහසක් සත්හු බුදුනට පසුවැ ලා පැවිදි වූහ, පසැස් ඇති බුදුහු අරමට පැමිණ ඔවුනට දහම් දෙසූසේක.

6. සර්වාකාරයෙන් කරුණු එළවමින් වදරන විපස්සී බුදුන්ගේ දහම් අසා ඒ සුවාසූ දහසක් මහණහු ද උතුම් දහම් දැන (මෙසේ ඔවුන්ගේ) තුන් වැනි ධර්මාවබොධය වී.

7. මහර්ෂි වූ විපස්සී සර්වඥයන් වහන්සේට විමල වූ ශාන්ත සිත් ඇති තාදීගුණ ඇති රහතුන්ගේ ශ්‍රාවක සන්නිපාත තුනෙක් වී.

8. අටසැටලක්ෂයක් රහතුන්ගේ ප්‍රථම සන්නිපාතය වී යෑ, ලක්ෂයක් රහත්මහණුන්ගේ ද්විතීය සන්නිපාතය වී.

9. අසූ දහසක් ක්ෂීණාශ්‍රව භික්ෂූන්ගේ තෘතීය සන්නිපාතය වී යෑ, එහි මහණගණ මැද සම්බුදුහු අතිශයින් දිලියුණාහ.

10. එසමයෙහි මම නමින් අතුල නම් වූ පින් ඇති පැහැපත් මහ ඉදුහ ඇති නාරජ වූයෙමි.

11. එකල්හි මම නොයෙක් කෙළගණන් නයින් පිරිවරා දිව්‍යසඟ-වයමින් බුදුන් කරා එළැඹියෙමි.

12. උපසඞ්කමිත්වා සම්බුද්ධං විපස්සිං ලොකනායකං
මණිමුත්තරතනඛචිතං සබ්බාභරණභූසිතං
නිය්‍යාතෙත්වා ධම්මරාජස්ස සුවණ්ණපීඨ' මදාසහං.

13. සො'පි මං බුද්ධො ව්‍යාකාසි සඞ්ඝමජ්ඣෙ නිසීදිය
එකනවුතෙ ඉතො කප්පෙ අයං බුද්ධො භවිස්සති.

14. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

15. අජපාලරුක්ඛමූලම්හි නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජර'මුපෙහිති.

16. නෙරඤ්ජරානදීතීරෙ පායාසං අසති ජිනො,
පටියත්තවරමග්ගෙන බොධිමූල'මුපෙහිති.

17. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩමනුත්තරං
අස්සත්ථමූලෙ සම්බොධිං බුජ්ඣිස්සති මහායසො.

18. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

19. අනාසවා වීතරාගා[1] සන්තචිත්තා සමාහිතා
කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නා'මුපට්ඨාකො[2] උපට්ඨිස්සති තං ජිනං.

20. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථොති පවුච්චති.

21. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

22. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

1. වීතමලා - සිමු.
2. ආනන්දො නාම නාමෙන - මචි.

12. මම ලොකස්වාමී වූ විදර්ශී සම්බුදුන් කරා එළැඹ දහම්රජ වූ බුදුන් පවරා මිණිමුතු ඈ රුවනින් නිමවන ලද පබළු ඈ සැරැහුමෙන් සරහන ලද රන් පුටුවක් පිදීමි.

13. ඒ විදර්ශී සර්වඥයන් වහන්සේ ද සඟ මැද වැඩහිද මෙ තෙමේ මෙයින් එක් අනූවන කල්පයෙහි බුදු වන්නේ යයි විවරණ දුන් සේක.

14. ඒ තථාගත වූ බෝසත් සිත්කලු වූ කිඹුල්වත් නම් නුවරින් නික්ම ප්‍රධන්වීර්‍ය්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට–

15. තථාගත වූ බෝසත් අජපල් නම් නුගරුක්මුල වැඩහිද එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලා හෝතෙරට පැමිණෙන්නේ ය.

16. ජිතමාර වූ බෝසත්හු නිල්දලා හෝ තෙර හිද කිරිපිඩු වළදා (දෙවියන්) පිළියෙළ කළ උතුම් මඟින් බෝමුල වෙත පැමිණෙන්නාහ.

17. ඉක්බිති මහායශස් ඇති අනුත්තර වූ මහසත්හු බෝමැඩ පැද-කුණු කොට ඇසැතුරුක්මුල්හි හිද සම්‍යක් සම්බෝධිය අවබෝධ කරන්නාහ.

18. මොවුන් ගේ ජනිකාමව මායා නම් වන්නීය. ජනකපිය තෙමේ ශුද්ධොදන නම් වන්නේ ය. මෙ තෙමෙ ගෞතම නම් වන්නේ යි.

19. අනාස්‍රව වූ විගතරාග ඇති ශාන්ත වූ සිත් ඇති ඵලසමාපත්ති-යෙන් සමාහිත වූ කොලිත යැ උපතිස්ස යැ යන දෙදෙනා අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායකයෙක් ඒ බුදුන්ට උපස්ථාන කරන්නේ ය.

20. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවත්හු ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබෙ.

21. චිත්ත යැ හත්‍ථාළවක යැ යන දෙදෙන අග්‍රොපස්ථායක වන්නාහ. උත්තරා යැ නන්දමාතා යි අග්‍රොපස්ථායිකා දෙදෙනෙක් වන්නාහ. ඒ යශස්වී වූ ගෞතම බුදුනට හවුරුදු සියයෙක් ආයු වෙයි.

22. අසම වූ මහර්ෂි වූ බුදුන් ගේ මෙ වදන් අසා 'මේ තෙමේ බුද්ධ-බීජාංකුරයෙකැ'යි සතුටු වූ දෙව මනුෂ්‍යයෝ–

23. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

24. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

25. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

26. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

27. තස්සා'හං වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දස පාරමී පූරියා.

28. නගරං බන්ධුමතී නාම බන්ධුමා නාම ඛත්තියො
මාතා බන්ධුමතී නාම විපස්සිස්ස මහෙසිනො.

29. අට්ඨවස්සසහස්සානි අගාරමජ්ඣ සො වසී
නන්දො සුනන්දො සිරිමා තයො පාසාදමුත්තමා.

30. තිවත්තාරීස සහස්සානි නාරියො සමලඞ්කතා
සුතනා නාම සා නාරී සමවත්තක්ඛන්ධො නාම අත්‍රජො.

31. නිමිත්තෙ චතුරො දිස්වා රථයානෙන නික්ඛමී
අනූනඅට්ඨමාසානි පධානං පදහී ජිනො.

32. බ්‍රහ්මුනා යාචිතො සන්තො විපස්සී ලොකනායකො
වත්ති චක්කං මහාවීරො මිගදායෙ නරුත්තමො.

33. ඛණ්ඩො[1] ච තිස්සනාමො ච අහෙසුං අග්ගසාවකා
අසොකො නාමු'පට්ඨාකො විපස්සිස්ස මහෙසිනො.

34. චන්දා ච චන්දමිත්තා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො පාටලී'ති පවුච්චති.

---

1. ඛන්ධො - සිමු.

23. ඔල්වරසන් පැවැත්වූහ. අත්පොළසන් දුන්හ. සිනහසුණහ. දස-දහසක් සක්වළැ දෙවියන් සහිත ලොකවාසීහු බඳුදිලි වැ නමස්කාර කළහ.

24. ඉදින් ඇපි මෙ ලෝහිමියන් ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම් හ.

25. යම්සේ නදිය තරණය කරන මිනිස්සු හමුයෙහි වූ ප්‍රතිමුඛ තීර්ථය වැරැදූ යට තොටැහි ලා ගෙන මහගඟ තරණය කෙරෙත් ද,

26. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මේ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමුවන්නම්හ.

27. මම ඒ විදර්ශී බුදුන්ගේ බස් අසා බෙහෙවින් සිත පැහැදුවීමි. දස-පැරුම් මත්තෙහි වෘතාධිෂ්ඨානය කෙළෙමි.

28. මහර්ෂි වූ විදර්ශී බුදුන් ගේ නගරය බන්ධුමතී නම් විය. බන්ධු-මත් නම් ක්ෂත්‍රිය තෙමේ පියා විය. මවු තොමෝ බන්ධුමතී නම් වූය.

29. ඒ බුදුහු අටදහසක් හවුරුදු ගිහිගෙයි වුසූහ. නන්ද යැ, සුනන්ද යැ, සිරිමත් යැයි උතුම් වූ තුන් පහයෙක් විය.

30. මොනොවට සැරැසුණු තෙසාළිස් දහසක් පරිවාරස්ත්‍රීහු වූහ. සුතනා නම් ප්‍රසිද්ධ ස්ත්‍රිය අගමෙහෙසුන් බිසෝ වූය. සමවත්තක්ඛන්ධ නම් පුතණු කෙනෙක් වූහ.

31. සතර පෙරනිමිති දැක රථයානයෙකින් මහබිනික්මන් කළහ. ඒ ජිනපක්‍ෂවමාරයෝ පිරිපුන් අටමසක් ප්‍රධන්වීර්‍ය කළහ.

32. මහාවීර වූ නරෝත්තම වූ විදර්ශී ලොකස්වාමීහු මහබඹහු විසින් අයදනා ලද්දහු මිගදාය නම් උයන්හි දී දම්සක් පැවැත්වූහ.

33. විදර්ශී බුදුන්ට ඛණ්ඩ යැ තිස්ස යැ යන නම් ඇති අග්‍රශ්‍රාවක-යෝ දෙදෙනෙක් වූහ. අසොක නම් උපස්ථායක භික්ෂු කෙනෙක් වූහ.

34. චන්‍ද්‍රා යැ චන්‍ද්‍රමිත්තා යැයි අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. ඒ බුදුන් ගේ බොධිය පළොල් යැයි කියනු ලැබේ.

35. පුනබ්බසුමිත්තො නාගො ච අහෙසුං අග්ගු'පට්ඨකා
සිරිමා උත්තරා චෙව අහෙසුං අග්ගු'පට්ඨිකා.

36. අසීති හත්ථුමුබ්බෙධො[1] විපස්සී ලොකනායකො
පභා නිද්ධාවති තස්ස සමන්තා සත්ත යොජනෙ.

37. අසීති වස්සසහස්සානි ආයු බුද්ධස්ස තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

38. බහූ දෙවෙ මනුස්සෙ ච බන්ධනා පරිමොචයි
මග්ගා'මග්ගඤ්ච ආචික්ඛි අවසෙසපුථුජ්ජනෙ.

39. ආලොකං දස්සයිත්වාන දෙසෙත්වා[2] අමතං පදං
ජලිත්වා අග්ගික්ඛන්ධො'ව නිබ්බුතො සො සසාවකො.

40. ඉද්ධිවරං පුඤ්ඤවරං ලක්ඛණං ච කුසුමිතං
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා.

41. විපස්සිජිනවරො බුද්ධො[3] සුමිත්තාරාමම්හි නිබ්බුතො
තත්ථෙ'ව තස්ස ථූපවරො සත්තයොජන මුස්සිතො'ති-

**විපස්සී බුද්ධවංසො එකූනවීසතිමො.**

1. අසීතිහත්ථුබ්බෙධො - මව.
2. දෙසිත්වා - සිමු.
3. ධීරො - සිමු.

35. පුනබ්බසුමිත්ත යැ නාග යැ යන අග්‍රොපස්ථායකයෝ දෙදෙනෙක් වූහ. සිරිමා යැ උත්තරා යැ යන අග්‍රොපස්ථායිකා දෙදෙනෙක් වූහ.

36. විදර්ශී ලොකස්වාමීහු අසූරියන් උස් වූහ. ඔබගේ ශරීරකාන්තිය හාත්පස සත්යොදුනෙක්හි පැතිර සිටුනේ යි.

37. එකල්හි ඒ බුදුන්ගේ ආයුෂ හවුරුදු අසූදහසෙක් විය, එතෙක් කල් වැඩසිටි ඒ බුදුහු බොහෝ ජනසමූහයා (සසර සයුරෙන්) තැර වූහ.

38. බොහෝ දෙවියන් ද මිනිසුන් ද සංසාරබන්ධනයෙන් මිදූ වූහ. සෙසු පුහුදුවනට (ශාශ්වතොච්ඡෙද විරහිත මධ්‍යමප්‍රතිපද සඞ්ඛ්‍යාත අමෘතාධිගමයට) මාර්ගය ද (කායකිළමථාදි) අමාර්ගය ද වදළහ.

39. ශ්‍රාවකයන් සහිත වූ ඒ බුදුහු මාර්ගඥනාලොකය දක්වා අමෘතපදය දෙශනා කොට ගිනිකඳසෙයින් දිලියෙමින් වැඩසිට පිරිනිවි සේක.

40. උත්තමසෘද්ධිය ද උත්තම පුණ්‍යය ද චක්‍රලක්ෂණාදීන් මණ්ඩිත වූ බුදු සිරුර ද යන සියල්ල අන්තර්හිත විය. හැම සංස්කාරයෝ තුච්ඡ වූවාහු නු?

41. ජිනවර වූ විදර්ශී බුදුහු සුමිත්තාරාමයෙහි දී පිරිනිවියහ. එහි මැ ඔබ ගේ ස්තූපවරය සත්යොදුන් කොට බඳනා ලද්දේ යි.

**එකුන්විසි වැනි විදර්ශී බුද්ධවංශ යි.**

## 20. සිඛී බුද්ධවංසො

1. විපස්සිස්ස අපරෙන සම්බුද්ධො ද්විපදුත්තමො
සිඛිව්හයො[1] ආසි ජිනො අසමො අප්පටිපුග්ගලො.

2. මාරසෙනං පමද්දිත්වා[2] පත්තො සම්බොධිමුත්තමං
ධම්මචක්කං පවත්තෙසි අනුකම්පාය පාණිනං.

3. ධම්මචක්කං පවත්තෙන්තෙ සිඛිම්හි මුනිපුඞ්ගවෙ[3]
කොටිසතසහස්සානං පඨමාභිසමයො අහු.

4. අපරම්පි ධම්මං දෙසෙන්තෙ ගණසෙට්ඨෙ නරුත්තමෙ
නවුතිකොටිසහස්සානං දුතියාභිසමයො අහු.

5. යමකං පාටිහීරඤ්ච දස්සයන්තෙ සදෙවකෙ
අසීතිකොටිසහස්සානං තතියාභිසමයො අහු.

6. සන්නිපාතා තයො ආසුං සිඛිස්සපි මහෙසිනො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන තාදිනං.

7. භික්ඛුසතසහස්සානං පඨමො ආසි සමාගමො
අසීති භික්ඛුසහස්සානං දුතියො ආසි සමාගමො.

8. සත්තති භික්ඛුසහස්සානං තතියො ආසි සමාගමො
අනුපලිත්තො පදුමංව තොයම්හි සම්පවඩ්ඪිතං.

9. අහං තෙන සමයෙන අරින්දමො නාම ඛත්තියො
සම්බුද්ධපමුඛං සඞ්ඝං අන්නපානෙන තප්පයිං.

10. බහුං දුස්සවරං දත්වා දුස්සකොටිං අනප්පකං
අලඞ්කතං හත්ථියානං සම්බුද්ධස්ස අදාසහං.

11. හත්ථියානං නිම්මිනිත්වා කප්පියං උපනාමයිං
පූරයිං මානසං මය්හං නිච්චං දළ්හමුපට්ඨිතං.

---

1. සිඛීස්වහයො නාම - සිමු.
2. පභින්දිත්වා - මචි.
3. ජිනපුඞ්ගවෙ - මචි. මජසං සයා.

## 20. සිඛී බුද්ධවංශය

1. විදර්ශී නම් බුදුන්ට මැතභාගයෙහි ද්විපදෝත්තම වූ පස්මරුන් දිනූ අසම වූ අප්‍රතිපුද්ගල වූ සිඛී නම් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ ලොවැ පහළ වූ සේක.

2. මරසේනාහ මැඩපියා උතුම්වූ සම්බොධියට පැමිණි සේක් සත්ත්වයන්ට අනුකම්පා පිණිස දම්සක් පැවැත්වූ සේක.

3. මුනිශ්‍රේෂ්ඨ වූ සිඛී බුදුරජාණන් වහන්සේ දම්සක් පවත්වන කල්හි කෙළ ලක්ෂයක් සත්නට පළමුවන ධර්මාභිසමය වී.

4. නැවත ද ගණශ්‍රේෂ්ඨ වූ නරෝත්තම වූ බුදුරදුන් දහම් දෙසන කල්හි අනූකෙළදහසක් සත්නට දෙවෙනි ධර්මාභිසමය වී.

5. සදෙවක ලොකයා විෂයෙහි යමාමහ පෙළහර දක්වන බුදුන් දහම් දෙසන කල්හි අසූකෙළදහසක් සත්නට තුන්වැනි ධර්මාභිසමය වී.

6. මහර්ෂී වූ සිඛී බුදුරදුන්ට ද විගත වූ කෙලෙස්මල ඇති සන්හුන් සිත් ඇති තාදීගුණ ඇති ක්ෂීණාස්‍රවයන් සම්බන්ධි වූ තුන් ශ්‍රාවකසන්නිපාත කෙනෙක් වූහ.

7. භික්ෂූන් සියදහසක් සම්බන්ධී වූ ප්‍රථම ශ්‍රාවක සන්නිපාතය විය. භික්ෂූන් අසූදහසක් සම්බන්ධි වූ ද්විතීය ශ්‍රාවක සන්නිපාතය වී.

8. භික්ෂූන් සැත්තෑදහසක් සම්බන්ධි වූ තෘතීය ශ්‍රාවකසන්නිපාතය වී (දියෙහි ඉපද) දියෙහි වැඩුණු දිය හා අලිප්ත වූ පියුමක් සෙයින් (ඒ භික්ෂු සන්නිපාතය ද) ලොකධර්මයන් හා අලිප්ත වූයේ වී.

9. එ සමයෙහි මම අරින්දම නම් ක්ෂත්‍රිය වූයෙම් බුදුපාමොක් සඟන ආහාරපානයෙන් සන්තර්පණය කෙළෙම්.

10. මම් බොහෝ වූ උතුම් වස්ත්‍ර ද, අනල්ප වූ වස්ත්‍ර කොටි ද දී, බුදුරදුන්ට (රන්දූල් ආදීන්) සරසන ලද හස්තියානයක් දිනිමි.

11. හස්තියානය ප්‍රමාණ කොට (ඇතු උසට) කප්පියභාණ්ඩ පූජා කෙළෙමි. නිරතුරු දැඩිව එළැඹ සිටි මා ගේ මනස පිරිමි.

12. සො'පි මං බුද්ධො ව්‍යාකාසි සිඛීලොකග්ගනායකො
එකතිංසෙ ඉතො කප්පෙ අයං බුද්ධො භවිස්සති.

13. අහූකපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කර කාරිකං.

14. අජපාලරුක්ඛමූලම්හි නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

15. නෙරඤ්ජරාය තීරම්හි පායාසං[5] ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූල'මුපෙහිති.

16. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

17. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති.
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

18. අනාසවා වීතරාගා සන්තචිත්තා සමාහිතා
කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමු'පට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

19. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

20. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

21. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

22. උක්කුට්ඨි සද්දං පවත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

12. ලොකාග්‍රනායක වූ ඒ සිඛී බුදුහු ද මේ තෙමේ මෙයින් එක් තිස්වන කල්පයෙහි බුදු වන්නේ ය'යි මට විවරණ දුන්හ.

13. එකල්හි තථාගත වූ බෝසත්හු රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්යය වඩා දුෂ්කර ක්‍රියා කොට-

14. එ තථාගතයෝ අජපල් නම් නුගරුක් මුල වැඩහිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නේරංජරා ගංතෙරට පැමිණෙන්නාහ.

15. එ ජිතමාර වූ බෝසත්හු නේරංජරා ගංගෙර හිඳ කිරිපිඩු වළඳා දෙවියන් සැරසූ උතුම් මඟින් බෝමුල කරා පැමිණෙන්නාහ.

16. ඉක්බිති අනුත්තර වූ මහසත්හු බෝමැඩ පැදකුණු කොට, මහායශස් ඇත්තාහු ඇසැතුරුක් මුල්හි වැඩහිඳ සත්‍යාවබොධය කරන්නාහ.

17. මොවුන් ගේ ජනිකාවූ තොමෝ මායා නම් වන්නී ය. පියතෙමේ සුද්ධෝදන නම් වන්නේ ය. මේ තෙමේ ගොතම නම් වන්නේ යි.

18. අනාස්‍රව වූ වීතරාග වූ ශාන්ත සිත් ඇති අර්හත්ඵල සමාධියෙන් සමාහිත වූ කොලිත යැ උපතිස්ස යැ යන මොහු අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායකයෙක් ඒ බුදුන්ට උපස්ථාන කරන්නේ යි.

19. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවත්හු ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබේ.

20. චිත්ත යැ හත්ථාලවක යැ යන මොහු අග්‍රෝපස්ථායක වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන මොහු අග්‍රෝපස්ථායිකා වන්නාහ. යසස්වී වූ ඒ ගෞතම බුදුන්ට ආයු සියක් හවුරුදු වෙයි.

21. අසම වූ මහර්ෂීන් ගේ මෙ වදන් අසා දෙව මනුෂ්‍යයෝ මේ තෙමේ බුද්ධබීජාඞ්කුරයෙකැයි සතුටු වූවාහු-

22. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දෙවියන් සහිත වූ දසදහස් ලෝධා වැසියෝ බඳුදිලි ව නමස්කාර කෙරෙත්.

23. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

24. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

25. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

26. තස්සා'හං වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වත මධිට්ඨාසිං දසපාරමිපූරියා.

27. නගරං අරුණවතී නාම අරුණවා නාම[1] ඛත්තියො
පභාවතී නාම ජනිකා සිඛිස්ස ච මහෙසිනො.

28. සත්තවස්සසහස්සානි අගාරමජ්ඣසො වසී
සුචන්දො ගිරිවසභො තයො පාසාදමුත්තමං.

29. චතුවීසති සහස්සානි නාරියො සමලඞ්කතා
සබ්බකාමා නාම නාරි අතුලො නාම අත්‍රජො.

30. නිමිත්තෙ චතුරො දිස්වා හත්ථියානෙන නික්ඛමි
අට්ඨමාසං පධානචාරං අචරී පුරිසුත්තමො.

31. බ්‍රහ්මුනා යාචිතො සන්තො සිඛී ලොකග්ගනායකො
වත්ති චක්කං මහාවීරො මිගාචිරෙ නරුත්තමො[2].

32. අභිභූ සම්භවො නාම අහෙසුං අග්ගසාවකා
ඛෙමඞ්කරො නාමු'පට්ඨාකො සිඛිස්ස'පි මහෙසිනො.

33. මඛිලා[3] ච පදුමා චෙව අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො පුණ්ඩරීකොති වුච්චති.

34. සිරිවඩ්ඪො ච නන්දො[4] ච අහෙසුං අග්ගු'පට්ඨකා
චිත්තා චෙ'ව සුගුත්තා ච අහෙසුං අග්ගු'පට්ඨිකා.

1. අරුණො නාම - සීමු, මජසං, සයා.
2. මිගදායෙ - සීමු.
3. අඛිලා සීමු.
4. චන්දෙ - සීමු.

23. ඉදින් ඇපි මේ ලෝහිමියන් ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

24. යම්සේ ගඟ තරණය කරන මිනිස්සු හමුයෙහි වූ තොට වැරදී යට තොටෙහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද,

25. එසෙයින් මැ ඇපි සියලු දෙනමෝ මේ බුදුන් හරමෝ නම්, අනාගත කාලයෙහි මොවුන් හමුවන්නම්හ.

26. මම ඔබ ගේ බස් අසා වැඩිතරම් කොට සිත පැහැදවීමි. දසපැරුම් පුරනු සඳහා මත්තෙහි වූතාධිෂ්ඨානය කෙළෙමි.

27. මහර්ෂි වූ සිඛී බුදුන් ගේ නගරය අරුණවතී නම් විය. අරුණවත් නම් ක්ෂත්‍රිය තෙමේ පිතෘ විය. මව් තොමෝ ප්‍රභාවතී නම් වූ.

28. ඒ බුදුහු සත්දහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. සුචන්ද යැ ගිරි යැ වසභ යැ යන උතුම් වූ තුන් පහයෙක් වී.

29. ඔබට මොනොවට සැරසුණු පරිවාරස්ත්‍රීහු සූවිසිදහසක් වූහ. අගමෙහෙසුන් බිසව සබ්බකාමා නම් වූ. පුත්‍ර තෙමේ අතුල නම් වී.

30. සතර පෙරනිමිති දුක ඒ පුරුෂොත්තම වූ සිඛී මහසත්හු හස්තියානයෙකින් මහාභිනිෂ්ක්‍රමණය කළහ. අටමසෙක් ප්‍රධන්වීර්‍ය කළහ.

31. මහාවීර වූ නරොත්තම වූ සිඛී නම් ලොකාග්‍රනායකයන් වහන්සේ මහබඹහු විසින් අයදනා ලද්දහු මිගාචීර නම් උයන්හි දම්සක් පැවැත්වූහ.

32. අභිභූ යැ සම්භව යැ යන නම් ඇති අග්‍රශ්‍රාවකයෝ දෙදෙනෙක් වූහ. ඒ සිඛී නම් මහර්ෂීන් වහන්සේට ඛෙමඞ්කර නම් උපස්ථායකයෙක් වී.

33. මඛිලා යැ පදුමා යැ යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. ඒ භාග්‍යවත්හු ගේ බොධිය හෙළඹ රුකැයි කියනු ලැබෙ.

34. සිරිවඩ්ඪ යැ නන්ද යැ යන අග්‍රොපස්ථායකයෝ දෙදෙනෙක් වූහ. චිත්තා යැ සුගුත්තා යැ යන අග්‍රොපස්ථායිකා දෙදෙනෙක් වූහ.

35. උච්චත්තනෙන සො බුද්ධො සත්තති හත්ථමුග්ගතො
කඤ්චනග්ඝිය[1] සංකාසො ද්වත්තිංසවරලක්ඛණො.

36. තස්ස[2] බ්‍යාමප්පභා කායා දිවාරත්තිං නිරන්තරං
දිසො දිසං නිච්ඡරන්ති තීණියොජනසො පභා.

37. සත්තතිවස්සසහස්සානි ආයු තස්ස මහෙසිනො
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

38. ධම්මමෙඝං පවස්සෙත්වා තෙමයිත්වා සදෙවකෙ
ඛෙමන්තං[3] පාපයිත්වාන නිබ්බුතො සො සසාවකො.

39. අනුව්‍යඤ්ජනසම්පන්නං ද්වත්තිංසවරලක්ඛණං
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා.

40. සිඛී මුනිවරො බුද්ධො දුස්සාරාමම්හි නිබ්බුතො
තත්ථෙ'ව තස්ස ථූපවරො තීණියොජනමුග්ගතො.

සිඛී බුද්ධවංසො වීසතිමො.

1. කඤ්චනග්ඝික - සීමු.
2. තස්සාපි - මජසං, සීමු, ස්‍යා.
3. ඛෙමන්තං - සීමු.

35. කසුන් ඇඟැයක් බඳු වූ දෙතිස් වරමහාපුරුෂ ලක්ෂණයෙන් යුක්ත වූ ඒ සිඛී නම් බුදුහු උසින් සැත්තැරියන් වූහ.

36. ඒ බුදුන් ගේ කයින් ව්‍යාමප්‍රභාව රෑ දවල් නිරතුරු විය, රශ්මීහු තුන් යොදුන් පමණින් දිශානුදිශායෙහි නික්මෙත්.

37. ඒ මහර්ෂි වූ බුදුන්ට සැත්තෑදහසක් හවුරුදු ආයු විය, එපමණ කල් වැඩ සිටිමින් ඒ බුදුහු බොහෝ ජනසමූහයා (සසරින්) තැරූ වූහ.

38. දහම් මහමේ වස්වා දෙවියන් සහිත ලෝ වැසියන් තෙමා ක්ෂෙම වූ නිවනට පමුණුවා ශ්‍රාවකයන් සහිත වූ ඒ බුදුහු පිරිනිවි සේක.

39. අසූ අනුව්‍යඤ්ජනයෙන් සමෘද්ධ වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණය හැම අතුරුදහන් වී. හැම සංස්කාරයෝ තුච්ඡ වූවාහු නු?

40. මුනිවර වූ සිඛී බුදුරජාණන් වහන්සේ දුස්සාරාමයෙහි පිරිනිවි සේක, එහි මැ ඔබ ගේ ස්තූපවරය තුන් යොදුන් උස්ව පිහිටියේ යි.

**විසිවැනි සිඛී බුද්ධවංශ යි.**

## 21. වෙස්සභූ බුද්ධවංසො

1. තත්ථෙව මණ්ඩකප්පම්හි අසමො අප්පටිපුග්ගලො
වෙස්සභූ නාම නාමෙන ලොකෙ උප්පජ්ජි නායකො.

2. ආදිත්තං ව[1] රාගග්ගිං තණ්හානං විජිතං තදා
නාගො'ව බන්ධනං ඡෙත්වා පත්තො සම්බොධිමුත්තමං.

3. ධම්මචක්කං පවත්තෙන්තෙ[2] වෙස්සභූ ලොකනායකෙ
අසීතිකොටිසහස්සානං පඨමා'භිසමයො අහු.

4. පක්කන්තෙ චාරිකං රට්ඨෙ ලොකජෙට්ඨෙ[3] නරාසභෙ
සත්තති කොටිසහස්සානං දුතියා'භිසමයො අහු.

5. මහාදිට්ඨිං විනොදෙන්තො පාටිහීරං කරොති සො
සමාගතා නරමරූ දසසහස්සී සදෙවකෙ.

6. මහා අච්ඡරියං දිස්වා අබ්භුතං ලොමහංසනං
දෙවා චෙ'ව මනුස්සා ච බුජ්ඣරෙ සට්ඨිකොටියො.

7. සන්නිපාතා තයො ආසුං වෙස්සභුස්ස මහෙසිනො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන'තාදිනං.

8. අසීතිභික්ඛුසහස්සානං පඨමො ආසි සමාගමො
සත්තතිභික්ඛුසහස්සානං දුතියො ආසි සමාගමො.

9. සට්ඨි භික්ඛුසහස්සානං තතියො ආසි සමාගමො
ජරාදි භයා'තීතානං[4] ඔරසානං මහෙසිනො.

10. අහං තෙන සමයෙන සුදස්සනො නාම ඛත්තියො
නිමන්තෙත්වා මහාවීරං දානං දත්වා මහාරහං
අන්නපානෙන වත්ථෙන සසඞ්ඝං ජිනමපූජයිං.

1. ආදිත්තං වත – මජසං, අසිත්තමව – සීමු,- ආදිත්තං ඉද – සයා
2. ධම්මචක්කප්පවත්තනෙ – සීමු.
3. ලොකසෙට්ඨෙ – මවි.
4. ජරාදිභයභීතානං – සීමු. මජසං.

## 21. වෙසසභූ බුද්ධවංශය

1. ඒ මණ්ඩකල්පයෙහි මැ අසම වූ අප්‍රතිපුද්ගල වූ නාමයෙන් වෙස්සභූ නම් වූ බුදුරජාණන් වහන්සේ ලොවැ පහළ වූ සේක.

2. එකල්හි රාගගින්නෙන් (මෙ හැම තුන් ලොව) ආදීප්ත වී යයි ද, තෘෂ්ණාවන් ගේ විජිතයෙකැයි ද දැන කිඳිලියබැඳුම් සිඳ ඇත්රජක්හු සෙයින් (කෙලෙස් බැඳුම් සිඳ) උතුම් වූ සම්බොධියට පැමිණි සේක.

3. වෙස්සභූ ලොකනායකයන් වහන්සේ දම්සක් පවත්වන කල්හි අසූකෙළදහසක් සත්නට ප්‍රථම ධර්මාවබොධය වී.

4. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ සර්වඥයන් වහන්සේ ජනපද-චාරිකායෙහි නික්මැ ගිය කල්හි සැත්තෑකෙළදහසක් සත්නට දෙවැනි ධර්මාභිසමය වී.

5. ඒ බුදුහු මහත් වූ දෘෂ්ටිජාලය දුරු කෙරෙමින් යමාමහපෙළහර කළහ. එකල්හි දශසහස්‍රසදෙවලොකයෙහි දෙව්මිනිස්සු රැස්වූහ.

6. අද්භූත වූ ලොමුදහන මහත් වූ ආශ්චර්‍ය්‍යය දැක සැටකෙළක් දෙවියෝ ද මනුෂ්‍යයෝ ද ධර්මාවබොධය කළහ.

7. වෙස්සභූ මහර්ෂීන් වහන්සේට විගත වූ රාගාදිමල ඇති ශාන්ත වූ සිත් ඇති තාදිගුණ ඇති ක්ෂීණාස්‍රවයන් සම්බන්ධ වූ තුන් ශ්‍රාවකසන්නිපාත කෙනෙක් වූහ.

8. අසූදහසක් භික්ෂූන්ගේ ප්‍රථමශ්‍රාවකසන්නිපාතය විය. සැත්තෑ-දහසක් භික්ෂූන්ගේ ද්විතීය ශ්‍රාවකසන්නිපාතය වී.

9. ජරාදි සසරබිය ඉක්ම වූ මහර්ෂීන්ගේ පුත්‍ර වූ සැටදහසක් භික්ෂූන්ගේ තෘතීය ශ්‍රාවකසන්නිපාතය වී.

10. එසමයෙහි මම සුදර්ශන නම් ක්ෂත්‍රිය වූයෙම් මහාවීර වූ බුදුන් පවරා මහාර්හ වූ දනක් දී ආහාරපානයෙන් ද වස්ත්‍රයෙන් ද සඞ්ඝයා සහිත වූ බුදුන් පිදීමි.

11. තස්ස බුද්ධස්ස අසමස්ස චක්කං වත්තිත'මුත්තමං
සුත්වාන පණීතං ධම්මං පබ්බජ්ජ'මභිරොචයිං.

12. මහාදානං පවත්තෙත්වා රත්තිං දිවමතන්දිතො
පබ්බජ්ජං ගුණසම්පන්නං පබ්බජිං ජිනසන්තිකෙ.

13. ආචාරගුණසම්පන්නො වත්තසීලසමාහිතො
සබ්බඤ්ඤුතං ගවෙසන්තො රමාමි ජිනසාසනෙ

14. සද්ධාපීතිමු'පාගන්ත්වා පාදෙ වන්දමි සත්ථරි[1]
පීති උප්පජ්ජති මය්හං බොධියායෙ'ව කාරණා.

15. අනිවත්තිමානසං[2] ඤත්වා සම්බුද්ධො එතද'බ්‍රවි
එකත්තිංසෙ ඉතො කප්පෙ අයං බුද්ධො භවිස්සති.

16. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

17. අජපාලරුක්ඛමූලම්හි නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසං පග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

18. නෙරඤ්ජරාය තීරම්හි පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලමුපෙහිති.

19. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

20. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

21. අනාසවා වීතරාගා සන්තචිත්තා සමාහිතා
කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා.
ආනන්දො නාමු'පට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං

---

1. සද්ධාපීතිං උපගන්ත්වා බුද්ධං වන්දමි සත්ථරං – මජසං.
සද්ධාපීතිං උපාගන්ත්වා බුද්ධං වන්දමි සත්ථාරං – සීමු.
සද්ධාපීතිං උප්පාදෙත්වා බුද්ධං වන්දමි සත්ථරං – ස්‍යා.
2. අනිවත්තමානසං – සීමු., මජසං.

11. අසම වූ ඒ බුදුන් විසින් උතුම් වූ දම්සක් පවත්වනලද. ප්‍රණීත වූ ඒ දහම් අසා පැවිද්ද රුචි කෙළෙමි.

12. රැදෙවෙහි අනලස් වූයෙම මහදන් පවත්වා පැවිද්ද ගුණසම්පන්න යැ යි දැන බුදුන් සමීපයෙහි පැවිදි වීමි.

13. ආචාරයෙන් හා ගුණයෙන් යුක්ත වූයෙම වතින් හා ශීලයෙන් යුක්ත වූයෙම සර්වඥතාඥානය සොයමින් බුදුසසුන්හි සිත් අලවා විසීමි.

14. ශ්‍රද්ධාවට ද ප්‍රීතියට ද පැමිණ ශාස්තෲන් වහන්සේගේ පාසඟුළුවන් වැන්දෙමි. සම්‍යක්සම්බෝධිය මැ හෙතු කොට ගෙන මට ප්‍රීතිය උපන.

15. සම්මාසම්බුදුහු (මා) නො පසුබස්නා සිත් ඇත්තහු දැන 'මෙ තෙම මෙයින් එක්තිස් වන කපැ බුදු වන්නේ ය'යි මෙවැන් වදළහ.

16. එකල්හි තථාගත වූ බෝසත්හු රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට –

17. ඒ තථාගතයෝ අජපල් නම් නුගරුක්මුල වැඩහිඳ එහි දී කිරිපිඬු පිළිගෙන නිල්දළාහෝතෙරට පැමිණෙන්නාහ.

18. ඒ ජිතමාර වූ බෝසත්හු නිල්දළාගංතෙර හිඳ කිරිපිඬු වළඳා දෙවියන් සැරසූ උතුම් මඟින් බෝමුල කරා පැමිණෙන්නාහ.

19. ඉක්බිති අනුත්තර වූ මහසත්හු මහායශස් ඇත්තාහු ඇසැතුරුක්මුල්හි වැඩහිඳ සත්‍යාවබොධය කරන්නාහ.

20. මොවුන්ගේ ජනිකමව තොමෝ මායා නම් වන්නී යැ පිය තෙමේ සුද්ධොදන නම් වන්නේ යැ මේ තෙමෙ ගොතම නම් වන්නේ යි.

21. අනාස්‍රව වූ වීතරාග වූ ශාන්ත සිත් ඇති අර්හත්ඵලසමාධියෙන් සමාහිත වූ කොලිත යැ උපතිස්ස යැ යන මොහු අග්‍රශ්‍රාවක වන්නාහ. ඒ බුදුන්ට ආනන්ද නම් උපස්ථායකයෙක් උපස්ථාන කරන්නේ යි.

22. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සො'ති පවුච්චති.

23. චිත්තා ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

24. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

25. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

26. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

27. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං

28. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං

29. තස්සා'හං වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දසපාරමිපූරියා.

30. අනුපමං[1] නාම නගරං සුප්පතීතො නාම ඛත්තියො
මාතා යසවතී නාම වෙස්සභුස්ස මහෙසිනො.

31. ඡබ්බස්සසහස්සානි අගාරමජ්ඣ සො වසි
රුචිසුරුචිරතිවඩ්ඪනො[2] තයො පාසාදමුත්තමා.

32. අනූනතිංසසහස්සානි නාරියො සමලඞ්කතා
සුචිත්තා නාම සා නාරී සුප්පබුද්ධො නාම අත්‍රජො.

1. අනොමං – සීමු, මජසං.
2. රුචිසුරුචිවඩ්ඪමානා – සීමු, රුචිසුරුචිවඩ්ඪකා – සභා.

22. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබෙයි.

23. චිත්ත යැ හත්ථාළවක යැ යන මොහු අග්‍රොපස්ථායක වන්නාහ, උත්තරා යැ නන්දමාතා යැ යන මොහු අග්‍රොපස්ථායිකා වන්නාහ. යශස්වී වූ ඒ ගෞතමබුදුන්ට ආයු සියක්හවුරුදු වෙයි.

24. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා දෙවමනුෂ්‍යයෝ මේ තෙමේ බුද්ධවීරාඞ්කුරයෙකැ'යි සතුටු වූවාහු.

25. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනාසෙති, දෙවියන් සහිත වූ දසදහසක් සක්වළවැසියෝ බඳිදිලි වැ නමස්කාර කෙරෙත්.

26. ඉදින් ඇපි මේ ලෝහිමියන්ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

27. යම්සේ ගඟ තරණය කරන මිනිස්සු හමුයෙහි වූ තොට වැරැද යටැ තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද,

28. එසෙයින් මැ ඇපි සියල්ලමෝ ඉදින් මෙ බුදුන් හරමෝ නම් අනාගතකාලයෙහි මොවුන් හමු වන්නම්හ.

29. මම් ඔබගේ බස් අසා වැඩි තරම් කොට සිත පැහැදවීම් දසපැරුම් පුරනු සඳහා මත්තෙහි වෘතාධිෂ්ඨානය කෙළෙම්.

30. මහර්ෂි වූ වෙස්සභූ බුදුන්ගේ නගරය අනුපම නම් විය. සුප්පතීත නම් ක්ෂත්‍රිය තෙමේ පියා විය. මව් තොමෝ යසවතී නම් වූ දෙවිය යි.

31. ඒ බුදුහු සදහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. ඔබට රුචි යැ සුරුචි යැ රතිවඞ්ඪන යැ යන උතුම් වූ තුන් පහයෙක් වී.

32. මොනොවට සැරසුණු නො අඩු වූ තිස්දහසක් පරිවාරස්ත්‍රීහු වූහ. සුචිත්තා නම් ප්‍රසිද්ධ වූ ස්ත්‍රිය අගමෙහෙසි වූ යැ පුත්‍ර තෙමේ සුප්පබුද්ධ නම් වී.

33. නිමිත්තෙ චතුරො දිස්වා සිවිකායා'භිනික්ඛමි
ඡ මාසං පධානචාරං අචරී පුරිසුත්තමො.

34. බ්‍රහ්මුනා යාචිතො සන්තො වෙස්සභූලොකනායකො
වත්ති චක්කං මහාවීරො අරුණාරාමෙ නරුත්තමො.

35. සොණො ච උත්තරො චෙව අහෙසුං අග්ගසාවකා
උපසන්තො නාමු'පට්ඨාකො වෙස්සභුස්ස මහෙසිනො.

36. දමා[1] චෙව සමාලා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො සාලො ඉති පවුච්චති[2]

37. සොත්ථිකො චෙව රම්මො ච අහෙසුං අග්ගු'පට්ඨකා
ගොතමී ච සිරිමා ච[3] අහෙසුං අග්ගු'පට්ඨිකා.

38. සට්ඨිරතනමුබ්බෙධො හෙමයූපසමූපමො
කායා නිච්ඡරතී රංසි[4] රත්තිං සිඛීව පබ්බතෙ.

39. සට්ඨිවස්සසහස්සානි ආයු විජ්ජති තාවදෙ[5]
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

40. ධම්මං විත්ථාරිකං කත්වා විභජිත්වා මහාජනං
ධම්මනාවං ඨපෙත්වාන නිබ්බුතො සො සසාවකො.

41. දස්සනීයං සබ්බජනං විහාරඤ්චිරියාපථං
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා

42. වෙස්සභූ ජිනවරො සත්ථා ඛෙමාරාමම්හි[6] නිබ්බුතො
ධාතු විත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතොති.

වෙස්සභූ බුද්ධවංසො එකවීසතිමො.

1. රාමා – මජසං
2. මහා සාලොති වුච්චති – සීමු, මජසං.
3. කාලිගොතමී–මවි. ගොතමී සිරිමාචෙව – මජසං.
4. රස්මි – මජසං.
5. ආයු තස්ස, මහෙසිනො – මවි.
6. ඛෙමෙ මිගදයෙ – මවි.

33. සතර පෙරනිමිති දැක සිවිකායෙකින් මහබිනික්මන් කළහ. ඒ පුරුෂොත්තමයෝ සමසක් මුළුල්ලෙහි ප්‍රධන්වීර්‍ය්‍ය කළහ.

34. මහාවීර වූ නරොත්තම වූ වෙස්සභූ ලොකනායකයන් වහන්සේ මහබඹහු විසින් අයදනා ලද්දහු අරුණාරාමයෙහි වැඩහිඳ දම්සක් පැවැත්වූහ.

35. ඒ වෙස්සභූ සර්‍වඥයන් වහන්සේට සොණ යැ උත්තර යැ යි අගසවු දෙදෙනෙක් වූහ. උපසන්ත නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ.

36. දමා යැ සමාලා යැ යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. ඒ භාග්‍යවතුන් වහන්සේගේ බොධිය ‘සල්රුකැ’යි කියනුලැබේ.

37. සොත්ථික යැ රම්ම යැ යි අග්‍රොපස්ථායකයෝ දෙදෙනෙක් වූහ. ගොතමී යැ සිරිමා යැ යි අග්‍රොපස්ථායිකා දෙදෙනෙක් වූහ.

38. රත්වැඹක් බඳු වූ ඒ බුදුහු සැටරියන් උස් වූහ. රාත්‍රියෙහි කඳු-මුදුනෙක ගින්නක් සෙයින් (ඔබගේ) සිරිරින් රැස් නික්මිණි.

39. එකල්හි සැටදහසක් හවුරුදු ආයු විය. එතෙක්කල් වැඩසිටිමින් ඒ බුදුහු බොහෝ ජනසමූහයා සසරින් තැරැවූහ.

40. දහම් පතුරුවා මහාජනයා (උද්ඝටිතාදි විසින් ශ්‍රොතාපන්නාදි විසින්) විභාග කොට (අෂ්ටාඞ්ගමාර්ග සඞ්ඛ්‍යාත) දහම්නැව පිහිටුවා ශ්‍රාවකයන් සහිත වූ ඒ බුදුහු පිරිනිවිසේක.

41. දර්‍ශනීය ඒ සියලු ශ්‍රාවකයන් සහිත ඒ බුදුහු ද විහරණය ද ඊර්‍ය්‍යාපථය ද යන සියල්ල අතුරුදහන් වී. හැම සංස්කාරයෝ තුච්ඡ වූවාහු නු?

42. ජිනවර වූ වෙස්සභූ ශාස්තෘන් වහන්සේ ඛෙමාරාමයෙහි පිරිනිවි සේක. ඔබගේ ධාතුහු ඒ ඒ පෙදෙස්හි පැතුරුණාහ’යි.

**එක්විසිවැනි වෙස්සභූ බුද්ධවංශ යි.**

## 22. කකුසන්ධ බුද්ධවංසො

1. වෙස්සභුස්ස අපරෙන සම්බුද්ධො දිපදුත්තමො
කකුසන්ධො[1] නාම නාමෙන අප්පමෙය්‍යො දුරාසදො

2. උග්ඝාටෙත්වා සබ්බභවං චරියාපාරමිං ගතො
සීහො'ව පඤ්ජරං භෙත්වා පත්තො සම්බොධිමුත්තමං.

3. ධම්මචක්කං පවත්තෙන්තෙ කකුසන්ධෙ ලොකනායකෙ
චත්තාළීස[2] කොටිසහස්සානං පඨමා'භිසමයො අහු.

4. අන්තලික්ඛම්හි ආකාසෙ යමකං කත්වා විකුබ්බනං
තිංසකොටිසහස්සානං බොධෙසි දෙවමානුසෙ.

5. නරදෙවස්ස යක්ඛස්ස චතුසච්චප්පකාසනෙ.
ධම්මා'භිසමයො තස්ස ගණනාතො අසඞ්ඛියො.

6. කකුසන්ධස්ස[3] භගවතො එකො ආසි සමාගමො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන තාදිනං

7. චත්තාළීසසහස්සානං තද[4] ආසි සමාගමො
දන්තභූමිමනුප්පත්තානං ආසවාරිගණක්ඛයා[5]

8. අහං තෙන සමයෙන ඛෙමො නාමාසිං ඛත්තියො[6]
තථාගතෙ ජිනපුත්තෙ ච දානං දත්වා අනප්පකං.

9. පත්තඤ්ච චීවරං දත්වා අඤ්ජනං මධුලට්ඨිකං
ඉමෙතං පත්ථිතං සබ්බං පටියාදෙමි[7] වරං වරං

10. සො'පි මං මුනි ව්‍යාකාසි කකුසන්ධො ලොකනායකො[8]
ඉමම්හි භද්දකෙ කප්පෙ[9] අයං බුද්ධො භවිස්සති.

---

1. කුක්කුසන්ධො – ස්‍යා.
2. චත්තාරිසං – සිමු.
3. කුක්කුසන්ධස්ස – ස්‍යා.
4. දුතියො – සිමු,
5. ආසවාදිගණක්ඛයා – සිමු. PTS.
6. ඛෙමො නාම ඛත්තියො – මවි.
7. පටියාදෙත්වා – සිමු.
8. විනායකො – සිමු.
9. ඉමම්හි භද්දකප්පම්හි – මවි.

## 22. කකුසඳ බුද්ධවංශය

1. වෙස්සභූ බුදුන්ට මෑතභාගයෙහි ද්විපදෙත්තම වූ අප්‍රමෙයගුණ ඇති ළං විය නො හැකි නාමයෙන් කකුසඳ නම් වූ සම්බුද්ධයන් වහන්සේ –

2. සියලු පාරමිතාවන්ගේ කෙළවරට පැමිණියාහු සියලු (නවවිධ) භවය නසා මැදිරිය බිඳ සිංහරාජයකු සෙයින් භවපඤ්ජරය නසා උතුම් වූ සම්බොධියට පැමිණියහ.

3. කකුසඳ ලොකනායකයන් වහන්සේ දම්සක් පවත්වන කල්හි සතලිස්කෙළදහසක් සත්නට පළමු වන ධර්මාභිසමය වී.

4. අන්තරීක්ෂ ආකාශයෙහි යමාමහපෙළහර කොට තිස්කෙළදහසක් දෙවිමිනිසුනට ධර්මාවබොධය කරවී.

5. නරදෙව නම් යක්ෂයාහට සිව්සස්දහම් දෙසීමෙහි දී උන් වහන්සේ ගේ (තුන් වැනි) ධර්මාභිසමය ගණනින් අසඞ්ඛෙය වී.

6. කකුසඳ භාග්‍යවතුන් වහන්සේට විගතමල වූ සන්හුන්සිත් ඇති තාදීගුණ ඇති ක්ෂීණාස්‍රවයන්ගේ එක් මැ ශ්‍රාවකසන්නිපාතයෙක් වී.

7. එකල්හි ආස්‍රව නමැති සතුරුගණයා ක්ෂය කිරීමෙන් නිවනට පැමිණි සතලිස්දහසක් රහතුන්ගේ සමාගමය වී.

8. මම එසමයෙහි ඛෙම නම් වූ ක්ෂත්‍රිය වීමි. තථාගතයන් කෙරෙහි ද බුද්ධපුත්‍රයන් කෙරෙහි ද අනල්ප වූ දන් දී –

9. පාසිවුරු දී අඳුන් යැ වැල්මීකඩ යැ යන උතුම් උතුම් වූ මේ රිසියුණු සියල්ල පිළියෙළ කොට දිනිමි.

10. ලොකනායක වූ ඒ කකුසඳ බුදුහු ද 'මේ තෙම මේ භද්‍රකල්පයෙහි බුදු වන්නේ යැ'යි මට විවරණ දුන්හ.

11. අහු කපිලවහයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

12. අජපාලරුක්ඛමූලම්හි නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

13. නෙරඤ්ජරා නදීතීරෙ පායාසං ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූල' මුපෙහිති.

14. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථමූලෙ සම්බොධිං බුජ්ඣිස්සති මහායසො.

15. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

16. අනාසවා වීතරාගා සන්තචිත්තා සමාහිතා
කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා.
ආනන්දො නාමුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං

17. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
බොධි තස්ස භගවතො අස්සත්ථො'ති පවුච්චති.

18. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

19. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

20. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

21. යදිමස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං.

22. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

11. එකල්හි තථාගත වූ බෝසත්හු රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන් වීර්‍ය්‍ය වඩා දුෂ්කරක්‍රියා කොට –

12. ඒ තථාගතයෝ අජපල් නම් නුගරුකමුල වැඩහිඳ එහි දී කිරිපිඬු පිළිගෙන නිල්දලාගංතෙරට පැමිණෙන්නාහ.

13. ඒ ජිනපණ්ඩමාර වූ බෝසත්හු නිල්දලාගංතෙර හිඳ කිරිපිඬු වළඳා දෙවියන් සැරැසූ උතුම් මඟින් බෝමුල කරා පැමිණෙන්නාහ.

14. ඉක්බිති අනුත්තර වූ මහසත්හු බෝමැඩ පැදකුණු කොට මහායශස් ඇත්තාහු ඇසතුරුක්මුල්හි වැඩහිඳ සත්‍යාවබොධය කරන්නාහ.

15. මොවුන්ගේ ජනික මවු තොමෝ මායා නම් වන්නී යැ. පිය තෙමේ සුද්ධෝදන නම් වන්නේ යැ. මේ තෙමේ ගෞතම නම් වන්නේ යි.

16. අනාස්‍රව වූ වීතරාග වූ ශාන්තසිත් ඇති අර්හත්ඵලසමාධියෙන් සමාහිත වූ කොලිත යැ උපතිස්ස යැ යන මොහු අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායකයෙක් ඒ බුදුන්ට උපස්ථාන කරන්නේ යි.

17. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවතුන්ගේ බොධිය ඇසැතු යයි කියනු ලැබේ.

18. චිත්ත යැ හත්ථාළවක යැ යන මොහු අග්‍රොපස්ථායක වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන මොහු අග්‍රොපස්ථායිකා වන්නාහ. යශස්වී වූ ඒ ගෞතම බුදුන්ට ආයු සියක්හවුරුදු වෙයි.

19. අසම වූ මහර්ෂීන්ගේ මෙවදන් අසා දෙවමනුෂ්‍යයෝ 'මේ තෙම බුද්ධබීජාඞ්කුරයෙකැ'යි සතුටු වූවාහු –

20. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති, දෙවියන් සහිත වූ දසදහස්ලෝධාහි වැසියෝ බඳිලි වැ නමස්කාර කෙරෙත්.

21. ඉදින් ඇපි මේ ලෝහිමියන්ගේ සස්න වරදමෝ නම් අනාගත-කාලයෙහි මොවුන් හමු වන්නම්හ.

22. යම්සේ ගඟ තරණය කරන මිනිස්සු හමුයෙහි වූ තොට වැරැද යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද –

23. එම'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං

24. තස්සා'හං වචනං සුත්වා භියෙයා චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දස පාරමී පූරියා.

25. නගරං ඛෙමවතී නාම ඛෙමො නාමාස'හං තද
සබ්බඤ්ඤුතං ගවෙසන්තො පබ්බජිං තස්ස සන්තිකෙ.

26. බ්‍රාහ්මණො අග්ගිදත්තො ච ආසි බුද්ධස්ස සො පිතා
විසාඛා නාම ජනිකා කකුසන්ධස්ස මහෙසිනො.

27. වසතී[1] තත්ථ ඛෙමපුරෙ සම්බුද්ධස්ස මහාකුලං
නරානං පවරං සෙට්ඨං ජාතිමන්තං මහායසං.

28. චතුවස්සසහස්සානි අගාරමජ්ඣසො වසී
රුචි සුරුචි රතිවඩ්ඪනො තයො පාසාද මුත්තමා.

29. සමතිංසසහස්සානි නාරියො සමලඞ්කතා
විරොචමානා නාම නාරී උත්තරො නාම අත්‍රජො

30. නිමිත්තෙ චතුරො දිස්වා රථයානෙන නික්ඛමි'
අනූනකං අට්ඨමාසං පධානං පදහී ජිනො.

31. බ්‍රහ්මුනා යාචිතො සන්තො කකුසන්ධො ලොකනායකො
වත්ති චක්කං මහාවීරො මිගදායෙ නරුත්තමො.

32. විධුරො සඤ්ජීවනාමො ච අහෙසුං අග්ගසාවකා
බුද්ධිජො[2] නාමු'පට්ඨාකො කකුසන්ධස්ස සත්ථුනො.

33. සාමා ච චම්පා නාමා ච[3] අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො සිරීසො'ති පවුච්චති.

34. අච්චුතො ච සුමනො ච අහෙසුං අග්ගු'පට්ඨකා
නන්දා චෙව සුනන්දා ච අහෙසුං අග්ගු'පට්ඨිකා

1. වසී – සීමු.
2. භද්දිජො – සීමු.
3. සාමා ච චම්පනාමාච – සීමු.

23. එසෙයින් මැ ඇපි සියල්ලමෝ මේ බුදුන් හරමෝ නම් අනාගත කාලයෙහි මොංවුන් හමු වන්නම්හ.

24. මම ඔබගේ බස් අසා වැඩිතරම කොට සිත පැහැදවීමි. දසපැරුම් පුරනු සඳහා මත්තෙහි වුතාධිෂ්ඨානය කෙළෙමි.

25. ඒ කකුසඳබුදුන්ගේ නගරය ඛෙමවතී නම් විය. එකල්හි මම ඛෙම නම් වූයෙමි. සර්වඥතාඥනය සොයන්නෙමි ඒ කකුසඳබුදුන් වෙත පැවිදි වීමි.

26. මහර්ෂි වූ කකුසඳ නම් බුදුන්ට ඒ අග්ගිදත්ත නම් බ්‍රාහ්මණ පියා විය. මවු තොමෝ විශාඛා නම් වූ.

27. මිනිසුන් කෙරෙහි උතුම් වූ ශ්‍රේෂ්ඨ වූ උත්තමජාතී ඇති මහත් වූ යශස් ඇති ඒ බුදුන්ගේ මහාඥතිකුලය ඒ ඛෙම පුරයෙහි විසී.

28. ඒ බුදුහු සාරදහසක් හවුරුදු ගිහිගෙයි වාසය කළහ. ඔබට රුචි යැ සුරුචි යැ රතිවර්ධන යැ යි උතුම් වූ තුන් පහයෙක් වී.

29. ඒ බෝසත්හට මොනොවට සැරසුණු පරිවාරස්ත්‍රීහු තිස්දහසක් වූහ. විරොචමානා නම් බිරිඳක් වූ යැ. පුත්‍ර තෙමේ උත්තර නම් වී.

30. ඒ ජිතමාර තෙමේ සතර පෙරනිමිති දැක රියයානයෙකින් මහබිනික්මන් කෙළේ යැ. නො අඩු අටමසක් මුළුල්ලෙහි ප්‍රධන්වීයක් කෙළේයි.

31. මහාවීර වූ නරොත්තම වූ කකුසඳ ලොකනායකයන්වහන්සේ මහබඹහු විසින් අයදනාලදහු මිගදය නම් උයන්හි දී දම්සක් පැවැත්වූහ.

32. කකුසඳ ශාස්තෘන් වහන්සේට විධුර යැ සඤ්ජීව යැ යන නම් ඇති අගසවුදෙදෙනෙක් වූහ. බුද්ධිජ නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ.

33. සාමා යැ චම්පා යැ යන නම් ඇති අගසැවි දෙදෙනෙක් වූහ. ඒ භාග්‍යවත්හුගේ බොධිය මහරි නමැයි කියනු ලැබේ.

34. ඔබට අච්චුත යැ සුමන යැ යි අග්‍රොපස්ථායකයෝ දෙදෙනෙක් වූහ. නන්දා යැ සුනන්දා යැ යි අග්‍රොපස්ථායිකා දෙදෙනෙක් වූහ.

35. චත්තාළීස රතනානි අච්චුග්ගතො මහාමුනි
කනකප්පභානිච්ඡරති[1] සමන්තා දස යොජනං.[2]

36. චත්තාළීසවස්සසහස්සානි ආයු තස්ස මහෙසිනො
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං

37. ධම්මො'ළුම්පං පසාරෙත්වා[3] නරනාරීනං සදෙවකෙ
නදිත්වා සීහනාදංව[4] නිබ්බුතො සො සසාවකො.

38. අට්ඨඞ්ගවචනසම්පන්නො අච්ඡිද්දානි නිරන්තරං
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා

39. කකුසන්ධො ජිනවරො ඛෙමාරාමම්හි නිබ්බුතො
තත්ථෙ'ව තස්ස ථූපවරො ගාවුතනභමුග්ගතො.

**කකුසන්ධ බුද්ධවංසො ද්වාවීසතිමො.**

1. නිච්ඡරන්ති – සී.
2. ද්වාදසයොජනං – සීමු.
3. පසාරිත්වා – මචී.
4. සීහනාදංච – සීමු.

35. ඒ මහාමුනිහු සතලිස්රියන් උස්වූහ. හාත්පස දසයොදුන් තැන (සිරුරින්) රන්වන්පැහැ නික්මිණ.

36. ඒ මහර්ෂී වූ බුදුන්ට සතලිස්දහසක් හවුරුදු ආයු විය. එතෙක් කල් වැඩසිටිමින් ඒ බුදුහු බොහෝ ජනසමූහයා සසරින් තැරවූහ.

37. ඒ බුදුහු දෙවියන් සහිත ලොවැ ස්ත්‍රීපුරුෂයනට දහම් නමැති අවුණු විදහා සිංහනාද මෙන් අභයනාද කොට ශ්‍රාවකයන් සහිත වැ පිරිනිවිසේක.

38, ඒ බුදුහු අෂ්ටාඞ්ගසමුපෙත ස්වර ඇතියහ, නිරතුරු අච්ඡිද්‍ර (සිදුරු නැති) වූ ශීලාදිය හෝ ශ්‍රාවකයුගලාදිය උන්වහන්සේට විය, ඒ සියල්ල අතුරුදහන් වී, හැම සංස්කාරයෝ තුච්ඡ වූවාහු නො ද?

39. ජිනවර වූ කකුසඳ බුදුහු ඛෙමාරාමයෙහි පිරිනිවිසේක, ඔබගේ ස්තූපවරය එහි මැ ගව්වක් උස් කොට බඳවනලද්දේ වී යයි.

දෙවිසිවන කකුසඳ බුද්ධවංශ යි.

## 23. කොණාගමන බුද්ධවංසො

1. කකුසන්ධස්ස අපරෙන සම්බුද්ධො දිපදුත්තමො
කොණාගමනො නාම ජිනො ලොකජෙට්ඨො නරාසභො

2. දසධම්මෙ පූරයිත්වාන[1] කන්තාරං සමතික්කමි
පවාහිය මලං සබ්බං පත්තො සම්බොධිමුත්තමං

3. ධම්මචක්කං පවත්තෙන්තෙ කොණාගමනනායකෙ[2]
තිංසකොටිසහස්සානං පඨමා’භිසමයො අහු

4. පාටිහීරං කරොන්තෙ ච පරවාදප්පමද්දනෙ
වීසතිකොටිසහස්සානං දුතියා’භිසමයො අහු

5. තතො විකුබ්බනං කත්වා ජිනො දෙවපුරං ගතො
වසති තත්ථ සම්බුද්ධො සිලායං පණ්ඩුකම්බලෙ

6. පකරණෙ සත්ත දෙසෙන්තො වස්සං වසති සො මුනි
දසකොටිසහස්සානං තතියා’භිසමයො අහු

7. තස්සා’පි දෙවදෙවස්ස එකො ආසි සමාගමො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන’තාදිනං

8. තිංසභික්ඛුසහස්සානං තද ආසි සමාගමො
ඔඝානම’තික්කන්තානං[3] භිජ්ජිතානඤ්ච[4] මච්චුනං

9. අහං තෙන සමයෙන පබ්බතො නාම ඛත්තියො
මිත්තාමච්චෙහි සම්පන්නො බලවාහනමනප්පකං[5]

10. සම්බුද්ධදස්සනං ගන්ත්වා සුත්වා ධම්මමනුත්තරං
නිමන්තෙත්වා සජිනං සඞ්ඝං දානං දත්වා යදිච්ඡකං[6]

11. පත්තුණ්ණං චීනපට්ටඤ්ච කොසෙය්‍යං කම්බල’මපි ච
සොවණ්ණපාදුකඤ්චෙ’ව අදාසිං සත්ථුසාවකෙ

1. පූරයිත්වා – මචි
2. කොණාගමනෙනාම නායකෙ – සීමු.
3. අතික්කන්තචතුරොඝනං – PTS,
4. භඤ්ජිතානං – මජසං.
5. අනන්තබලවාහනො – සීමු.
6. යතිච්ඡකං – සීමු.

# 23. කොණාගමන බුද්ධවංශය

1. කකුසඳ බුදුන්ට මෑත භාගයෙහි සම්බුද්ධ වූ ද්විපදෝත්තම වූ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රේෂ්ඨ වූ කොණාගමන නම් වූ බුදුහු-

2. දසපෙරුම්දම් පුරා සසර කතර ඉක්ම වූහ. හැම කෙලෙස් මල සොධා හැර උතුම් වූ සම්‍යක් සම්බොධියට පැමිණිය හ.

3. කොණාගමන බුදුරජාණන් වහන්සේ දම්සක් පවත්වන කල්හි තිස් කෙළ දහසක් සත්නට පළමු වන ධර්මාභිසමය වී.

4. ඒ පරවාදමර්දනය කරන බුදුන් යමාමහ පෙළහර කරන කල්හි විසි කෙළදහසක් සත්නට දෙවන ධර්මාභිසමය වී.

5. ඉක්බිති බුදුහු විකුර්වණ සෘද්ධි පවත්වා දිව්‍යභවයනට වැඩිසේක් එහි පඬු ඇඹුල් සලයෙහි විසූ සේක.

6. ඒ බුදුහු සප්තප්‍රකරණයන් දෙශනා කෙරෙමින් වස් විසූහ. (එහි දී) දස කෙළදහසක් සත්නට තුන් වැනි ධර්මාභිසමය වී.

7. ඒ දෙවාතිදෙව වූ බුදුන්ට ද විගතමල වූ ශාන්ත සිත් ඇති තාදී-ගුණ ඇති ක්ෂීණාස්‍රවයන් ගේ එක් මැ ශ්‍රාවක සන්නිපාතයෙක් වී.

8. එකල්හි චතුරොඝයන් ඉක්ම වූ පස්මරුන් බිඳහළ තිස්දහසක් භික්ෂූන් ගේ සමාගමය වී.

9. මම එසමයෙහි මිත්‍රාමාත්‍යයන් ගෙන් යුක්ත වූ පබ්බත නම් ක්ෂත්‍රිය වීමි. මට අනල්ප වූ බලවාහන විය.

10. බුදුන් දක්නට ගොස් අනුත්තර වූ දහම් අසා බුදුන් සහිත වූ සඞ්ඝයා පවරා කැමැති සේ දන් දී-

11. බුදුන්ට ද ශ්‍රාවකයන්ට ද පත්තුණ්ණ දෙශයෙහි වස්ත්‍ර ද චීනපට ද කොසෙය්‍ය වස්ත්‍ර ද කම්බල ද රන්මිරිවැඩි ද දින්මි,

12. සො'පි මං මුනි ව්‍යාකාසි සඞ්ඝමජ්ඣෙ නිසීදිය
ඉමම්හි භද්දකෙ කප්පෙ අයං බුද්ධො භවිස්සති

13. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං[1]

14. අජපාලරුක්ඛමූලම්හි නිසීදිත්වා තථාගතො
තත්‍ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති

15. නෙරඤ්ජරාය තීරම්හි පායාසං[2] ආදය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලමුපෙහි'ති

16. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො[3]
අස්සත්‍ථමූලෙ සම්බොධිං බුජ්ඣිස්සති මහායසො

17. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො

18. අනාසවා වීතරාගා සන්තචිත්තා සමාහිතා
කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා
ආනන්දො නාමුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං

19. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
අනාසවා වීතරාගා[4] සන්තචිත්තා සමාහිතා
බොධි තස්ස භගවතො අස්සත්‍ථො'ති පවුච්චති.

20. චිත්තො ච හත්‍ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තු'පට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො

21. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං

22. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා

1. කාරියං – සීමු.
2. පායසං – සීමු.
3. අනුත්තරං – සීමු.
4. වීතමලා – සීමු.

12. ඒ බුදුහු ද සභ මැද වැඩ හිඳ 'මේ තෙම මේ භද්‍ර කල්පයෙහි බුදු වන්නේ යැ' යි මට විවරණ දුන් සේක.

13. එකල්හි තථාගත වූ බෝසත්හු රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීයාීය වඩා දුෂ්කරක්‍රියා කොට–

14. ඒ තථාගතයෝ අජපල් නම් නුගරුක් මුල වැඩ හිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලා ගංතෙරට පැමිණෙන්නා හ.

15. ඒ ජිතපඤ්චමාර වූ බෝසත්හු නිල්දලා ගංතෙර හිඳ කිරිපිඩුවළඳා දෙවියන් සැරසූ මඟින් බෝමුල කරා පැමිණෙන්නාහ.

16. ඉක්බිති අනුත්තර වූ මහසත්හු බෝ මැඩ පැදකුණු කොට මහායශස් ඇත්තාහු ඇසතුරුක් මුල්හි වැඩ හිඳ සත්‍යාවබොධය කරන්නා හ.

17. මොවුන් ගේ ජනිකාමවූ තොමෝ මායා නම් වන්නී යැ. පිය තෙමේ සුද්ධොදන නම් වන්නේ යැ. මේ තෙමේ ගෞතම නම් වන්නේ යි.

18. අනාස්‍රව වූ වීතරාග වූ ශාන්ත සිත් ඇති අර්හත් ඵල සමාධියෙන් සමාහිත වූ කොලිත යැ උපතිස්ස යැ යන මොහු අග්‍ර ශ්‍රාවක වන්නාහ. ආනන්ද නම් උපස්ථායකයෙක් ඒ බුදුන්ට උපස්ථාන කරන්නේ යි.

19. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවත්හු ගේ බොධිය 'ඇසතු' යයි කියනු ලැබෙ.

20. චිත්ත යැ හත්ථාළවක යැ යන මොහු අග්‍රොපස්ථායක වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන මොහු අග්‍රොපස්ථායිකා වන්නාහ. යශස් වී වූ ඒ ගෞතම බුදුන්ට සියක් හවුරුද්දෙක් ආයු වෙයි.

21. අසම වූ මහර්ෂීන් ගේ මෙ වදන් අසා දෙවමනුෂ්‍යයෝ 'මේ තෙමේ බුද්ධබීජාඞ්කුරයෙකැ' යි සතුටු වූවා හු-

22. ඔල්වරසන් පවත්වති, අපොළති. සිනහසෙති. දෙවියන් සහිත වූ දසදහස් ලෝධා වැසියෝ බඳඳිලි වැ නමස්කාර කෙරෙත්.

23. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං

24. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං

25. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං

26. තස්සා'හං වචනං සුත්වා භිය්‍යො චිත්තං පසාදයිං
උත්තරිං වතමධිට්ඨාසිං දසපාරමිපූරියා

27. සබ්බඤ්ඤුතං ගවෙසන්තො දානං දත්වා නරුත්තමෙ
ඔහායාහං[1] මහාරජ්ජං පබ්බජිං තස්ස සන්තිකෙ

28. නගරං සොභවතී නාම සොභො නාමා'සි ඛත්තියො
වසති තත්ථ නගරෙ සම්බුද්ධස්ස මහාකුලං

29, බ්‍රාහ්මණො යඤ්ඤදත්තො ච ආසි බුද්ධස්ස සො පිතා
උත්තරා නාම ජනිකා කොණාගමනස්ස සත්ථුනො

30. තීණි වස්සසහස්සානි අගාරමජ්ඣෙ සො වසි
තුසිතසන්තුසිත සන්තුට්ඨා තයො පාසාදමුත්තමා

31. අනූනසොළසසහස්සානි නාරියො සමලඞ්කතා
රුචිගත්තා නාම නාරී සත්ථවාහො[2] නාම අත්‍රජො

32. නිමිත්තෙ චතුරො දිස්වා හත්ථියානෙන නික්ඛමි
ඡමාසං පධානචාරං අචරි පුරිසුත්තමො.

33. බ්‍රහ්මුනා යාචිතො සන්තො කොණාගමනො නාම නායකො.
වත්ති චක්කං මහාවීරො මිගදායෙ නරුත්තමො

34. භීය්‍යසො[3] උත්තරො නාම අහෙසුං අග්ගසාවකා
සොත්ථිජො[4] නාමුපට්ඨාකො කොණාගමනස්ස සත්ථුනො

35. සමුද්දා ච උත්තරා චෙති[5] අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො උදුම්බරො'ති පවුච්චති

1. ඔභායිමං – සීමු.
2. සත්තධාවො – මනුප.
3. භියොසො – මනුප.
4. සොට්ඨජො – සීමු. PTS.
5. උත්තරාචෙව – සීමු.

23. ඉදින් ඇපි මේ ලෝකිමියන් ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම් හ.

24. යම් සේ ගඟ තරණය කරන මිනිස්සු හමුයෙහි වූ තොට වැරදූ යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද-

25. එසෙයින් මැ ඇපි සියලු දෙනමෝ මේ බුදුන් හරමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම් හ.

26. මම ඔබ ගේ බස් අසා වැඩි තරම් කොට සිත පැහැදවීම් දස පැරුම් පුරනු සඳහා මත්තෙහි වුතාධිෂ්ඨානය කෙළෙමි.

27. මම සර්වඥතාඥානය සොයන්නෙම් නරෝත්තම වූ බුදුන් කෙරෙහි දනක් දී මහරජය හැරපියා ඒ කෝණාගමන බුදුන් වෙත පැවිදි වීමි.

28. ඒ කෝණාගමන බුදුන් ගේ නගරය සොභවතී නම් විය එහි සොභ නම් රජ කෙනෙක් වූහ. සම්බුදුන් ගේ මහත් වූ ඥාතිකුලය එනුවර විසී.

29. ප්‍රසිද්ධ වූ යඤ්ඤදත්ත නම් බමුණු බුදුන් ගේ පියා විය. කෝණාගමන ශාස්තෘන් වහන්සේ ගේ මවු තොමෝ උත්තරා නම් වූ යැ.

30. ඒ බුදුහු තුන් දහසක් හවුරුදු ගිහිගෙයි විසූහ. ඔබට තුෂිත යැ සන්තුෂිත යැ සන්තුෂ්ට යැයි උතුම් තුන් පහයෙක් වී.

31. මොනොවට සැරසුණු නො අඩු සොළොස් දහසක් පරිවාර ස්ත්‍රීහු වූහ. රුචිගත්තා නම් බිරිඳක් වූ යැ. සත්‍ථවාහ නම් පුත්‍රයෙක් වී.

32. පුරුෂෝත්තම වූ ඒ මහසත් සතර පෙරනිමිති දැක ඇත්-යානයෙකින් මහබිනික්මන් කෙළේ යැ. සමසක් මුළුල්ලෙහි ප්‍රධන්වීයා කෙළේ යි.

33. මහාවීර වූ නරෝත්තම කෝණාගමන බුදුහු මහබඹහු විසින් අයදනා ලදහු මුව ළැවිහි දම්සක් පැවැත් වූහ.

34. කෝණාගමන නම් ශාස්තෘන් වහන්සේට භියාසස යැ උත්තර යැ යන නම් ඇති අගසවු දෙදෙනෙක් වූහ. සොත්ථිජ නම් උපස්ථායක තෙර කෙනෙක් වූහ.

35. සමුද්ද යැ උත්තරා යැ යි අගසැවි දෙදෙනෙක් වූහ. ඒ බුදුන් ගේ බොධිය 'දිඹුල්' යයි කියනු ලැබේ.

36. උග්ගො ච සොමදෙවො ච අහෙසුං අග්ගුපට්ඨාකා
සීවලා චෙව සාමා ච අහෙසුං අග්ගුපට්ඨිකා

37. උච්චත්තනෙන සො බුද්ධො තිංසහත්ථසමුග්ගතො
උක්කාමුඛෙ යථා කම්බු එවං රංසීහි මණ්ඩිතො

38. තිංසවස්සසහස්සානි ආයු විජ්ජති[1] තාවදෙ
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

39. ධම්මචෙතිං සමුස්සිත්වා[2] ධම්මදුස්සවිභූසිතං
ධම්මපුප්ඵගුලං කත්වා නිබ්බුතො සො සසාවකො

40 මහාවිලාසො තස්ස ජනො සිරිධම්මප්පකාසනො
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා

41. කොණාගමනො සම්බුද්ධො පබ්බතාරාමහි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො'ති

**කොණාගමන බුද්ධවංසො තෙවීසතිමො.**

1. බුද්ධස්ස - සිමු.
2. සමුස්සෙත්වා - මචි.

36. උග්‍ර යැ සොමදෙව යැ යි අග්‍රොපස්ථායක යෝ දෙදෙනෙක් වූහ. සීවලා යැ සාමා යැ යි අග්‍රොපස්ථායිකා දෙදෙනෙක් වූහ.

37. ඒ කොණාගමන බුදුහු උසින් තිස්රියන් උස්වූවාහු කඹුරු උදුනෙහි රන්නික්ක් යම් සේ ද එසෙයින් රසින් සමලඞ්කෘත වූහ.

38. එකල්හි (සත්නට) තිස් දහසක් හවුරුදු ආයු විය. ඒ බුදුහු එතෙක් වැඩ සිටිමින් බොහෝ ජන සමූහයා සසර කතරින් තැරැ වූහ.

39. සිව්සස් දහම් නැමැති පතාකායෙන් සැරැසුණු සත්තිස් බොධි පාක්ෂික ධර්ම නැමැති සෑය පිහිටුවා දහම් නමැති මල් ඉල කොට ශ්‍රාවකයන් සහිත වූ ඒ බුදුහු පිරිනිවිය හ.

40. ඒ කොණාගමන බුදුරදුන් ගේ මහත් වූ සෘද්ධිවිලාසයට පැමිණි ශ්‍රාවකජන තෙමේ ද ලොවුතුරු දහම් පැවැසූ ඒ බුදුහු ද යන සියල්ල අතුරු දහන් වී හැම සංස්කාර ධර්මයෝ තුච්ඡ වූවාහු නො ද?

41. කොණාගමන සම්බුදුරජාණන් වහන්සේ පර්වතාරාමයෙහි පිරිනිවි සේක. ඒ බුදුන් ගේ ධාතු ඒ ඒ පෙදෙස්හි විසිරුණේ වී යයි.

තෙවිසිවන කොණාගමන බුද්ධවංශ යි.

## 24. කස්සප බුද්ධවංසො

1. කොණාගමනස්ස අපරෙන සම්බුද්ධො දිපදුත්තමො
කස්සපො නාම නාමෙන ධම්මරාජා පභඞ්කරො.

2. සඤ්ඡඩ්ඩිතං, කුලමූලං බහුං ච පානභොජනං[1]
දත්වාන යාචකෙ දනං පූරයිත්වාන මානසං.
උසභො'ව ආලකං හෙත්වා පත්තො සම්බොධිමුත්තමං.

3. ධම්මචක්කං පවත්තෙන්තෙ කස්සපෙ ලොකනායකෙ.
වීසතිකොටිසහස්සානං පඨමා'භිසමයො අහු.

4. චතුමාසං යද බුද්ධො ලොකෙ චරති චාරිකං
දසකොටිසහස්සානං දුතියා'භිසමයො අහු.

5. යමකං විකුබ්බනං කත්වා ඤාණධාතුං පකිත්තයි[3]
පඤ්චකොටිසහස්සානං, තතියා'භි සමයො අහු.

6. සුධම්මදෙවපුරෙ රම්මෙ තත්ථ ධම්මං පකාසයි
තීණි කොටිසහස්සානි[4] දෙවානං බොධයී ජිනො.

7. නරදෙවස්ස යක්ඛස්ස අපරෙ ධම්මදෙසනෙ
එතෙසානං අභිසමයො[5] ගණනාතො අසඞ්ඛියො.[6]

8. තස්සා'පි දෙවදෙවස්ස එකො ආසි සමාගමො
ඛීණාසවානං විමලානං සන්තචිත්තාන තාදිනං.

9. වීසති භික්ඛුසහස්සානං තද ආසි සමාගමො
අතික්කන්තරාගවන්තානං[7] හිරිසීලෙන තාදිනං.

10. අහං තද මාණවකො[8] ජොතිපාලොති විස්සුතො
අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදන'පාරගූ.

---

1. සංජින්දිතං – මනුප.
2. බහුන්නපාන භොජනං – මජසං, බව්හන්න-පාන භොජනං – මවි. බහුනංපාන භොජනං – PTS.
3. පකාසයී – මවි.
4. සහස්සානං – සීමු., මජසං.
5. අභිසමයා – සීමු.. මවි.
6. අසඞ්ඛියා – සීමු., මවි.
7. ඉතික්කන්ත භවන්තානං – සයා., මජසං. අතික්කන්ත භවකංතානං – සීමු., අතික්කන්ත භගවන්තානං – PTS.
8. අහං තෙන සමයෙන – මවි.

## 24. කාශ්‍යප බුද්ධවංශය

1. කොණාගමන බුදුන්ට මෑත භාගයෙහි චතුස්සත්‍යාවබොධය කළ ද්විපදෙත්තම වූ ප්‍රභාකර වූ නාමයෙන් කාශ්‍යප නම් ධර්මරාජයන් වහන්සේ–

2. හැරපියන ලද කුලගෙය ද බොහෝ ආහාරපාන ද යාචකයන්ට දන් දී සිත් පුරා ගොවුද සිඳ වෘෂභයකු සෙයින් (ගෘහබන්ධන සිඳ) උතුම් වූ සම්බොධියට පැමිණියහ.

3. කාශ්‍යප ලොකනායකයන් වහන්සේ දම්සක් පවත්වන කල්හි විසි කෙළදහසක් සත්නට පළමුවන ධර්මාභිසමය වී.

4. යම් කලෙකැ බුදුහු සිව්මසක් මුළුල්ලෙහි ලොවැ චාරිකායෙහි හැසුරුණු සේක් ද එකල්හි දස කෙළදහසක් සත්නට දෙවැනි අභිසමය වී.

5. යම් කලෙක යමක ප්‍රාතිහාර්‍ය්‍ය කොට සර්වඥතාඥනයා ගේ ස්වභාවය පැවැසූ සේක් ද එකල්හි පස් කෙළදහසක් සත්නට තුන්වැනි ධර්මාභිසමය වී.

6. රම්‍ය වූ තාවතිංසභවනයෙහි සුධර්මා නම් දිව්‍යසභායෙහි වැඩහිඳ අභිධර්මය ප්‍රකාශ කළ සේක් ද එකල්හි බුදුහු තුන්කෙළ දහසක් දෙවියනට ධර්මාවබොධය කර වූහ.

7. නරදෙව නම් යක්හට අන්‍ය වූ ධර්ම දෙශනායෙක්හි තෙල දෙවි මිනිසුන් ගේ අභිසමය ගණනින් අසඞ්ඛ්‍ය වී.

8. ඒ දෙවාතිදෙව වූ කාශ්‍යප සර්වඥයන් වහන්සේට ද විගත රාගාදිමල ඇති ශාන්ත සිත් ඇති තාදීගුණ ඇති ක්ෂීණාස්‍රවයන්ගේ එක් සමාගමයෙක් වී.

9. එකල්හි ඉක්ම වූ රාගසහිතයන් ඇති හිරියෙන් හා සීලයෙන් හා සමාන වූ විසිදහසක් භික්ෂූන් ගේ සන්නිපාතය වී.

10. මම් එසමයෙහි 'ජොතිපාල' යයි ප්‍රසිද්ධ වූ වෙද හදරන වෙද මන්ත්‍ර ධරන්නා වූ ත්‍රිවෙදයන් ගේ පරතෙරට පැමිණි–

11. ලක්ඛණෙ ඉතිහාසෙ ච සද්ධම්මෙ පාරමිං ගතො
භූමන්තලික්ඛෙ[1] කුසලො කතවිජ්ජො අනාවයො[2]

12. කස්සපස්ස භගවතො ඝටීකාරො නාමු'පට්ඨාකො
සගාරවො සප්පතිස්සො නිබ්බුතො තතියෙ ඵලෙ.

13. ආදාය මං ඝටීකාරො උපගඤ්ඡි කස්සපං ජිනං
තස්ස ධම්මං සුණිත්වාන පබ්බජිං තස්ස සන්තිකෙ.

13. ආරද්ධවිරියො හුත්වා වත්තා'වත්තෙසු කොවිදො
න කවා'පි[3] පරිහායාමි පූරෙමි ජිනසාසනං.

15. යාවතා බුද්ධභණිතං නවඞ්ගං ජිනසාසනං
සබ්බං පරියාපුණිත්වාන සොභයිං ජිනසාසනං.

16. මම අච්ඡරියං දිස්වා සො'පි බුද්ධො වියාකරි
ඉමම්හි භද්දකෙ කප්පෙ අයං බුද්ධො භවිස්සති.

17. අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

18. අජපාලරුක්ඛමූලම්හි නිසීදිත්වා තථාගතො
තත්ථ පායාසමග්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

19. නෙරඤ්ජරාය තීරම්හි පායාසං පරිභුඤ්ජිය
පටියත්තවරමග්ගෙන බොධිමණ්ඩමුපෙහිති.

20. තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං නරුත්තරො[4]
අපරාජිතට්ඨානම්හි බොධිපල්ලඞ්කමුත්තමෙ
පල්ලඞ්කෙන නිසීදිත්වා බුජ්ඣිස්සති මහායසො.

21. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

22. අනාසවා වීතරාගා[5] සන්තචිත්තා සමාහිතා,
කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා,
ආනන්දො නාමුපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං.

---

1. භුම්මන්තලික්ඛෙ - සයා., මවි.
2. අනාමයො - මවි.
3. ක්වචි - සයා., මවි.; මජසං.
4. නරුත්තමො - සිමු.
5. වීතමලා - සිමු.

11. ලක්ෂණශාස්ත්‍රයෙහි ද ඉතිහාසයෙහිද ස්වකීය බ්‍රාහ්මණ ධර්මයෙහි ද පරතෙරට පැමිණි භූමි පරීක්ෂායෙහි හා ජ්‍යොතිශ්ශාස්ත්‍රයෙහි දක්ෂ වූ අභ්‍යාස කළ විද්‍යා ඇති අනූනවිද්‍යා ඇති මාණවක වීමි.

12. කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට ගෞරව සහිත වූ යටත් පැවැතුම් ඇති තුන්වැනි (අනාගාමි) ඵලය නිමිති කොට ක්ලෙශපරිනිර්වාණය කළ ඝටීකාර නම් උපස්ථායකයෙක් වී.

13. ඒ ඝටීකාර තෙම මා ගෙන කාශ්‍යප බුදුන් කරා එළැඹියේ යැ, ඔබ ගේ දහම් අසා ඔබ සමීපයෙහි පැවිදි වීමි.

14. පටන් ගන්නා ලද වෙර ඇති වැ වතාවත්හි දක්ෂ වූයෙමි ශීලසමාධ්‍යාදි කිසි තැනෙක්හි නො පිරිහිණිමි බුදු සසුන පිරීමි.

15. නවාඞ්ග ශාස්තෲශාසන සඞ්ඛ්‍යාත වූ යම් පමණ බුද්ධභාෂිතයෙක් වෙයි ද එ හැම පුහුණු කොට බුදුසසුන හෙබැ වීමි.

16. ඒ කාශ්‍යප බුදුහු ද මාගේ ආශ්චර්‍ය්‍යය දැක 'මේ තෙම මේ භද්‍රකල්පයෙහි බුදු වන්නේ යැ' යි විවරණ දුන් සේක.

17. එකල්හි තථාගත වූ බෝසත්හු රම්‍ය වූ කපිල නම් පුරයෙන් නික්ම ප්‍රධන්වීර්‍ය්‍යය වඩා දුෂ්කරක්‍රියා කොට–

18. ඒ තථාගතයෝ අජපල් නම් නුගරුක් මුල වැඩ හිඳ එහි දී කිරිපිඩු පිළිගෙන නිල්දලා ගංතෙරට පැමිණෙන්නා හ.

19. ඒ ජිතමාර වූ බෝසත්හු නිල්දලා ගංතෙර හිඳ කිරිපිඩු වළඳා දෙවියන් සැරසූ උතුම් මඟින් බෝමුල කරා පැමිණෙන්නා හ.

20. ඉක්බිති අනුත්තර වූ මහසත්හු බෝමැඩ පැදකුණු කොට මහායශස් ඇත්තාහු ඇසතු රුක්මුල්හි වැඩහිඳ සත්‍යාවබොධය කරන්නාහ.

21. මොවුන් ගේ ජනික මවු තොමෝ මායා නම් වන්නී යැ. පිය තෙමේ සුද්ධොදන නම් වන්නේ යැ. මේ තෙම ගොතම නම් වන්නේ යි.

22. අනාස්‍රව වූ වීතරාග වූ සන්හුන් සිත් ඇති අර්හත්ඵලසමාධියෙන් සමාහිත වූ කොලිත යැ උපතිස්ස යැ යන මොහු අග්‍රශ්‍රාවක වන්නාහ. ආනන්‍ද නම් උපස්ථායක තෙර කෙනෙක් ඒ බුදුන්ට උපස්ථාන කරන්නාහ.

23. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා
අනාසවා වීතරාගා සන්තචිත්තා සමාහිතා
බොධි තස්ස භගවතො අස්සත්ථොති පවුච්චති.

24. චිත්තො ච හත්ථාළවකො අග්ගා හෙස්සන්තු'පට්ඨකා
උත්තරා නන්දමාතා ච අග්ගා හෙස්සන්තුපට්ඨිකා
ආයු වස්සසතං තස්ස ගොතමස්ස යසස්සිනො.

25. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ බුද්ධබීජඞ්කුරො අයං.

26. උක්කුට්ඨිසද්දං වත්තෙන්ති අප්ඵොටෙන්ති හසන්ති ච
කතඤ්ජලී නමස්සන්ති දසසහස්සී සදෙවකා.

27. යදි'මස්ස ලොකනාථස්ස විරජ්ඣිස්සාම සාසනං,
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං

28. යථා මනුස්සා නදිං තරන්තා පටිතිත්ථං විරජ්ඣිය
හෙට්ඨා තිත්ථෙ ගහෙත්වාන උත්තරන්ති මහානදිං.

29. එව'මෙව මයං සබ්බෙ යදි මුඤ්චාමි'මං ජිනං
අනාගතම්හි අද්ධානෙ හෙස්සාම සම්මුඛා ඉමං

30. තස්සා'පි වචනං සුත්වා භිය්‍යො[1] චිත්තං පසාදයිං
උත්තරිං[2] වතමධිට්ඨාසිං දසපාරමීපූරියා.

31. එවං අහං සංසරිත්වා පරිවජ්ජෙන්තො අනාචාරං[3]
දුක්කරඤ්ච කතං මය්හං බොධියා'යෙව කාරණා.

32. නගරං බාරාණසී නාම කිකීනාමා'සි ඛත්තියො
වසති තත්ථ නගරෙ සම්බුද්ධස්ස මහාකුලං.

33. බ්‍රාහ්මණො බ්‍රහ්මදත්තො ච ආසි බුද්ධස්ස සො පිතා
ධනවතී නාම ජනිකා[4] කස්සපස්ස මහෙසිනො.

34. දුවෙ වස්සසහස්සානි අගාරමජ්ඣ සො වසි
හංසො යසො සිරිනන්දො තයො පාසාදමුත්තමා.

---

1. භීයො – මවි., මනුප.
2. උත්තරි – මජසං.
3. අනාවරං – මජසං.
4. මාතා ධනවතී නාම - මවි., මනුප.

23. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන දෙදෙන අග්‍රශ්‍රාවිකා වන්නාහ. ඒ භාග්‍යවත්හු ගේ බොධිය 'ඇසැතු' යයි කියනු ලැබේ.

24. චිත්ත යැ හත්ථාළවක යැ යන මොහු අග්‍රොපස්ථායක වන්නාහ. උත්තරා යැ නන්දමාතා යැ යන මොහු අග්‍රොපස්ථායිකා වන්නාහ. යශස්වී වූ ඒ ගෞතම බුදුන්ට සියක් හවුරුදු ආයු වන්නේ යි.

25. අසම වූ මහර්ෂීන් ගේ මෙ වදන් අසා දෙව් මනුෂ්‍යයෝ 'මේ තෙම බුද්ධබීජාඞ්කුරයෙකැ' යි සතුටු වූවාහු,

26. ඔල්වරසන් පවත්වති, අපොළති, සිනහසෙති. දෙවියන් සහිත වූ දසදහස් ලෝධා වැසියෝ බඳිදිලි වැ නමස්කාර කෙරෙත්.

27. ඉදින් ඇපි මේ ලෝහිමියන් ගේ සස්න වරදමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම් හ.

28. යම්සේ ගඟ තරණය කරන මිනිස්සු හමුයෙහි වූ තොට වැරැදූ යට තොටැහි ගෙන මහගඟ තරණය කෙරෙත් ද –

29. එසෙයින් මැ ඇපි සියලු දෙනමෝ මෙ බුදුන් හරමෝ නම් අනාගත කාලයෙහි මොවුන් හමු වන්නම් හ.

30. මම ඔබගේ බස් අසා වැඩි තරම් කොට සිත පැහැදවීම් දසපැරුම් පුරනු සඳහා මත්තෙහි වූතාධිෂ්ඨාන කෙළෙමි.

31. මෙසේ මම නො කටයුතු දුරුකෙරෙමින් සසර සැරිසරා (ඇවිද්දෙමි.) මා විසින් සම්‍යක් සම්බොධිය මැ හෙතු කොට ගෙන දුෂ්කරක්‍රියා ද කරනලද.

32. ඒ බුදුන්ගේ නුවර බරණැස් නමැ. එහි කිකී නම් ක්ෂත්‍රියරජෙක් විය. ඒනුවර කාශ්‍යප සම්‍යක්සම්බුද්ධයන්ගේ මහාඥාතිකුලය වාසය කෙළේ යි.

33. මහර්ෂි වූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේට ප්‍රසිද්ධ වූ බ්‍රහ්මදත්ත නම් බමුණු තෙමේ පියා විය. ධනවතී නම් බැමිණිය මාතෘ වූවා යැ.

34. ඒ බුදුහු දෙවාදහසක් ගිහිගෙයි විසූහ. හංස යැ යස යැ සිරිනන්ද යැ යන උතුම් වූ තුන් පහයෙක් වී.

35. තිසොළසසහස්සානි නාරියො සමලඞ්කතා
සුනන්දා නාම සා නාරී විජිතසෙනො නාම අත්‍රජො.

36. නිමිත්තෙ චතුරො දිස්වා පාසාදෙනා'භිනික්ඛමි
සත්තා'හං පධානචාරං අචරී පුරිසුත්තමො.

37. බ්‍රහ්මුනා යාචිතො සන්තො කස්සපො ලොකනායකො
වත්තී චක්කං මහාවීරො මිගදායෙ නරුත්තමො.

38. තිස්සො ච භාරද්වාජො ච අහෙසුං අග්ගසාවකා
සබ්බමිත්තො උපට්ඨාකො කස්සපස්ස මහෙසිනො.

39. අනුලා ච උරුවෙලා ච අහෙසුං අග්ගසාවිකා
බොධි තස්ස භගවතො නිග්‍රොධො'ති පවුච්චති.

40. සුමඞ්ගලො ඝටීකාරො ච අහෙසුං අග්ගු'පට්ඨකා
විජිතසෙනා ච භද්දා ච අහෙසුං අග්ගු'පට්ඨිකා.

41. උච්චත්තනෙන සො බුද්ධො වීසතිරතනමුග්ගතො
විජ්ජුලට්ඨීව ආකාසෙ චන්දො'ව ගහපූරිතො.

42. වීසතිවස්සසහස්සානි ආයු තස්ස මහෙසිනො
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

43. ධම්මතළාකං මාපෙත්වා සීලං දත්වා විලෙපනං
ධම්මදුස්සං නිවාසෙත්වා ධම්මමාලං විභජ්ජිය[1]

44. ධම්මවිමලමාදාසං ඨපයිත්වා මහාජනෙ
කෙචි නිබ්බානං පත්ථෙන්තා පස්සන්තු මෙ අලඞ්කාරං.

45. සීලකඤ්චුකං දත්වාන ඣානකවචවම්මිතං[2]
ධම්මචම්මං පාරුපිත්වා දත්වා සන්නාහ'මුත්තමං.

46. සතිඵලකං දත්වාන තිඛිණං ඤාණකුන්තිමං
ධම්මඛග්ගවරං දත්වා සීලං[3] සංසග්ගමද්දනං

1. විරාජිය – සිමු.
2. ඣාන කවච ධම්මිකං – සිමු.
3. සීල – සිමු.

35. මොනොවට සැරහුණු අටසාලිස් දහසක් පරිවාරස්ත්‍රීහු වූහ. සුනන්දා නම් ප්‍රසිද්ධ ස්ත්‍රිය බිරිඳ වූ යැ, පුත්‍ර තෙමේ විජිතසේන නම් වී.

36. ඒ පුරුෂොත්තමයෝ සතර පෙරනිමිති දැක ප්‍රාසාදයෙන් මහබිනික්මන් කළහ. සතියක් මුළුල්ලෙහි ප්‍රධන්වීර්‍ය්‍ය කළහ.

37. මහාවීර වූ නරොත්තම වූ කාශ්‍යප ලොකනායකයන් වහන්සේ මහබඹහු විසින් අයදනාලදහු මිගදයෙහි වැඩහිඳ දම්සක් පැවැත්වූහ.

38. මහර්ෂි වූ කාශ්‍යපබුදුන්ට තිස්‍ස යැ භාරද්වාජ යැයි අගසවු දෙදෙනෙක් වූහ. සබ්බමිත්ත නම් තෙර කෙනෙක් උපස්ථායක වූහ.

39. අනුලා යැ උරුවෙලා යැ යන අගසැවි දෙදෙනෙක් වූහ. ඒ බුදුන්ගේ බොධිය 'නුගරුකැ'යි කියනුලැබේ.

40. සුමඞ්ගල යැ ඝටීකාර යැ යන අග්‍රොපස්ථායක දෙදෙනෙක් වූහ. විජිතසෙනා යැ භද්‍ද යැ යන මොහු අග්‍රොපස්ථායිකා වූහු.

41. ඒ බුදුහු උසින් විසිරියන් උස්වූහ. අහස්හි විදුලියක් සෙයින් ද ග්‍රහතාරකාවන් පිරිවැරූ සඳු මෙන් ද බැබැළුණාහ.

42. ඒ මහර්ෂීන්ට විසිවාදහසක් ආයු විය. ඒ බුදුහු එතෙක් කල් වැඩසිටිමින් බොහෝ ජනතාව සසරින් තැරැවූහ.

43. දහම් නමැති විල් මවා සිල් මැ විලෙවුන් දී (හිරිඔතප්) දහම් මැ සළු හඳවා (සත්තිස්බොධිපාක්ෂික) දහම් මැ මල්දම් රචනා කොට–

44. 'නිවන් පතන කිසි කෙනෙක් මා විසින් දක්වනලද අලඞ්කාරය දකිත්ව'යි මහජනයාට දහම්මුවා කැටපත පිහිටුවා–

45. සිල් නැමැති කස්ස (සැට්ටය) පෙරෙවා ධ්‍යාන නැමැති කවචය බැඳ සමෘතිසමායග්ඥාන සඞ්ඛ්‍යාත චර්මය පෙරෙවැ උතුම් වූ (චතුරඞ්ග සමන්‍වාගත වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත) සන්නාහය කොට–

46. සිහි නමැති ඵලකායුධය ද තියුණු වූ විදර්ශනාඥාන නමැති කුන්තායුධය ද දී ක්ලෙසස සඞ්ඝ මර්දනය කරන ලොකොත්තරශීලය වූ මාර්ගප්‍රඥා සඞ්ඛ්‍යාත උත්තමඛඞ්ගය දී -

47. තෙවිජ්ජ[1] භූසනං දත්වා ආවෙළං චතුරො ඵලෙ
ඡළභිඤ්ඤාභරණං දත්වා ධම්මපුප්ඵපිළන්ධනං.

48. සද්ධම්මපණ්ඩරච්ඡත්තං[2] දත්වා පාපනිවාරණං
මාපයිත්වා'භයං[3] පුප්ඵං නිබ්බුතො සො සසාවකො,

49. එසො හි සම්මා සම්බුද්ධො අප්පමෙය්‍යො දුරාසදො
එසො හි ධම්මරතනො ස්වාක්ඛාතො එහිපස්සිකො.

50. එසො හි සඞ්ඝරතනො සුප්පටිපන්නො අනුත්තරො
සබ්බං සමන්තරහිතං නනු රිත්තා සබ්බසඞ්ඛාරා.

51. සො කස්සපො ජිනවරො සත්ථා සෙතව්‍යාරාමම්හි නිබ්බුතො
තත්ථෙ'ව තස්ස ජිනථූපො යොජනුබ්බෙධමුග්ගතො'ති.

කස්සප බුද්ධවංසො චතුවීසතිමො.

1. තෙ විජ්ජා – සීමු.
2. සද්ධම්මපණ්ඩරංජතනං – සීමු.
3. මාපෙත්වාඅභයං – සීමු.

47. ත්‍රිවිද්‍යාමය අලඞ්කාරණ දී සතර ඵලයන් වටංසක කොට ෂඩ්අභිඥ නමැති ආභරණ දී නවඵලාවුතුරු දහම් නමැති මල් පළඳනා කොට.

48. පච් වළහන සදහම් නමැති සේසත් දී අභයපුරයට යන සුලු අෂ්ඨාඞ්ගමාගී පුෂ්ප මවා ඒ කාශ්‍යප බුදුහු ශ්‍රාවකයන් සහිත වැ පිරිනිවියාහ.

49. පමණ නො කටහැකි වූ නො ගැටිය හැකි වූ සම්‍යක්සම්බුදුහු තුලුහු මැ යැ සව්‍යාඛ්‍යාත වූ 'එව බලව'යි කීමට නිසි වූ දහම්රුවන් එ මැ වෙයි.

50. අනුත්තර වූ සුපිළිපන් වූ සඟරුවන එ මැ වෙයි. එ හැම අතුරුදහන්වී. හැම සංස්කාරයෝ තුච්ඡ නො ද?

51. ජිනොත්තම වූ ඒ කාශ්‍යප බුදුහු සෙතව්‍යාරාමයෙහි පිරිනිවියහ, එහි මැ එබුදුන්ගේ ජිනථූපය යොදුනක් උස් කොට බඳවන ලද යයි.

**සූවිසි වන කාශ්‍යප බුද්ධවංශ යි.**

# ගොතම බුද්ධවංසො

1. අහමෙ'තරහි සම්බුද්ධො[1] ගොතමො සක්‍යවඩ්ඪනො[2]
පධානං පදහිත්වාන පත්තො සම්බොධිමු'ත්තමං.

2. බ්‍රහ්මුනා යාචිතො සන්තො ධම්මචක්කං පවත්තයිං
අට්ඨාරසන්නං කොටීනං පඨමා'භිසමයො අහු.

3. තතො පරඤ්ච දෙසෙන්තෙ නරමරූනං[3] සමාගමෙ
ගණනාය න වත්තබ්බො දුතියා'භිසමයො අහු.

4. ඉධෙවා'හං එතරහි ඔවදිං මම[4] අත්‍රජං
ගණනාය න වත්තබ්බො තතියා'භිසමයො අහු.

5. එකො'ව[5] සන්නිපාතො මෙ සාවකානං මහෙසිනං
අඩ්ඪතෙළසසතානං භික්ඛූනාසි සමාගමො.

6. විරොචමානො විමලො භික්ඛුසඞ්ඝස්ස මජ්ඣගො
දදාමි පත්ථිතං සබ්බං මණී'ව සබ්බකාමදො.

7. ඵලමා'කඞ්ඛමානානං භවච්ඡන්දජහෙසිනං
චතුසච්චං පකාසෙමි[6] අනුකම්පාය පාණිනං

8. දසවීසසහස්සානං ධම්මාභිසමයො අහු
එකද්වින්නං අභිසමයො ගණනාතො අසඞ්ඛියො.

9. විත්ථාරිකං බාහුජඤ්ඤං[7] ඉද්ධං ඵීතං සුඵුල්ලිතං
ඉධ මය්හං සක්‍යමුනිනො සාසනං සුවිසොධිතං

10. අනාසවා වීතරාගා සන්තචිත්තා සමාහිතා
භික්ඛූ'නෙකසතා සබ්බෙ පරිවාරෙන්ති මං සදා

11. ඉදානි යෙ එතරහි ජහන්ති-මානුසං භවං
අප්පත්තමානසා සෙඛා තෙ භික්ඛූ විඤ්ඤුගරහිතා

---

1. අහං එතරහි බුද්ධො – සීමු.
2. සක්‍යවද්ධනො – මවි., සක්‍යපුඞ්ගවො – පු.
3. නරදෙව – සීමු., ස්‍යා., මජසං.
4. ඔවදිස්සාමි – මවි.
5. එකොසි – මවි.
6. පකාසෙසිං – සීමු.
7. බහුජඤ්ඤං – සීමු.

# ගෞතම බුද්ධවංශය

1. මෙ දවස ශාක්‍යකුල වඩනා ගෞතම නම් සම්බුදු වූ මම ප්‍රධන්වීර්‍ය කොට උතුම් වූ සම්බොධියට පැමිණියෙමි.

2. මහබඹුනු විසින් අයදනාලදූයෙම් දම්සක් පැවැත් වීමි. අටළොස් කෙළක් සත්නට ප්‍රථම ධර්මාවබොධය වී.

3. ඉන් මැතභාගයෙහිදු දිව්‍යමනුෂ්‍යසමාගමයෙහි (මඞ්ගලසූත්‍රය) දෙශනා කරන කල්හි ගණනින් නො කියයුතු දෙව්මිනිස් කෙනෙකුන්ට දෙවැනි ධර්මාවබොධය වී.

4. මෙ දවස මම මෙහි මැ මාගේ පුත්‍ර (රාහුල) හට අවවාද කෙළෙම් ද, එකල්හි ගණනින් නො කියයුතු සත්ත්ව කෙනකුන්ට තුන්වැනි ධර්මාභිසමය වී.

5. මට එක් මැ ශ්‍රාවකසන්නිපාතයෙක් වී, මහර්ෂි වූ අඩතෙළෙස්සියක් ශ්‍රාවකභික්ෂූන්ගේ සමාගමය වී.

6. බුද්ධශ්‍රීන් දීප්ත වූ විගතරාගාදිමල ඇති මම භික්ෂුසඞ්ඝයාමධ්‍යයට පැමිණියෙම් සියලු කැමැති සැපත් එළවා සිතුමිණිරුවනක් සෙයින් පැතූ හැම ලොව්ලොවුතුරා සුවවෙසෙස් දෙමි.

7. ස්‍රොතාපත්තා දි චතුර්විධ ඵලය කැමැති වන්නා වූ භවතෘෂ්ණා හරනා කැමැති සත්නට අනුකම්පායෙන් සිව්සස් ප්‍රකාශ කෙරෙමි.

8. තිස්දහසක් සත්නට ධර්මාභිසමය විය. එක් දෙදෙනකුන් ආදීන්ගේ වශයෙන් අභිසමය ගණනින් අසඞ්ඛ්‍ය වී.

9. මෙකල්හි ශාක්‍යමුනි වූ මාවිසින් මොනොවට පවිත්‍ර කළ සස්න (දෙව්මිනිසුන් කෙරෙහි) පැතුරුණේ බොහෝදෙනා කෙරෙහි ප්‍රසිද්ධ වූයේ සමෘද්ධ වූයේ පරිපූර්ණ වූයේ හටගත් මහඵල කුසුම් ඇත්තේ වී.

10. සියල්ලෝ අනාශ්‍රව වූ පහවූ රාග ඇති ශාන්ත සිත් ඇති සමාධියට පැමිණි නොයෙක් සියගණන් භික්ෂූහු හැම කල්හි මා පිරිවරා සිටිති.

11. දන් මෙකල්හි රහත්ඵලයට නො පැමිණි සිත් ඇති ශෛක්ෂ වූ යම් කෙනෙක් මනුෂ්‍ය භවය හරනාහු ද, ඒ භික්ෂූහු නුවණැතියන් විසින් ගරහන ලද්දහ.

12. අරියඤ්ජසං පොමයන්තා සදා ධම්මරතා ජනා
බුජ්ඣිස්සන්ති සත්තිමන්තො සංසාරසරිතා නරා.

13. නගරං කපිලවත්ථු මෙ රාජා සුද්ධොදනො පිතා
මය්හං ජනෙත්තිකා මාතා මායා දෙවී'ති වුච්චති.

14. එකුනතිංස වස්සානි අගාරමජ්ඣගං වසිං
රම්මො සුරම්මො සුභකො[1] තයො පාසාද මුත්තමා.

15. චත්තාරීස සහස්සානි නාරියො සමලඞ්කතා
භද්දකච්චානා[2] නාම නාරී රාහුලො නාම අත්‍රජො.

16. නිමිත්තෙ චතුරො දිස්වා අස්සයානෙන නික්ඛමිං
ඡබ්බස්සං පධානචාරං අචරිං දුක්කරං අහං.

17. බාරාණසියං ඉසිපතනෙ ජිනචක්කං පවත්තිතං[3]
අහං ගොතම සම්බුද්ධො සරණො[4] සබ්බපාණිනං.

18. කොලිතො උපතිස්සො ච ද්වෙ භික්ඛු අග්ගසාවකා
ආනන්දො නාමු'පට්ඨාකො සන්තිකාවචරො මම.

19. ඛෙමා උප්පලවණ්ණා ච භික්ඛුනී අග්ග සාවිකා
චිත්තො ච හත්ථාළවකො අග්ගුපට්ඨාකු'පාසකා.

20. උත්තරා නන්දමාතා ච අග්ගුපට්ඨිකු'පාසිකා
අහං අස්සත්ථමූලම්හි පත්තො සම්බොධි මුත්තමං.

21. බ්‍යාමප්පභා සදා මය්හං සොළසහත්ථමුග්ගතා[5]
අප්පං වස්සසතං ආයු ඉදානෙ'තරහි විජ්ජති
තාවතා තිට්ඨමානො'හං තාරෙමි ජනතං බහුං.

---

1. සුචන්දකො කොකනුදො කො භුවො - ස්‍යා.
2. යසොධරා - මචි. ස්‍යා.
3. චක්කං පවත්තිතං මයා - සීමු.
4. සරණං - සීමු., මජසං., ස්‍යා.
5. මුග්ගතො - සීමු.

12. හැම කල්හි දහම්හි ඇලුණු ජනයෝ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්‍ගය පසස්නාහු සිවුසස් ප්‍රතිවෙධ කෙරෙති. ස්මෘතිමත් වූ ඒ මනුෂ්‍යයෝ සසර-සයුර තරණය කෙරෙත්,

13. මාගේ නගරය කපිලවාස්තු නමැ, පිය තෙමේ සුදොවුන්රජ යැ. මාගේ ජනිකා වූ මවු තොමෝ මායා දෙවී නමැ'යි කියනු ලැබේ.

14. මම එකුන්තිස්වසක් ගිහිගෙයි වාසය කෙළෙමි. රම්‍ය යැ සුරම්‍ය යැ සුභ යැ යන උතුම් වූ තුන්පහයෙක් වී.

15. මොනවට සැරැහුණු සතලිස්දහසක් පරිවාරස්ත්‍රීහු වූහ. භද්‍ද-කච්චනා නම් ස්ත්‍රිය අගමෙහෙසුන් වී. පුත්‍ර තෙමේ රාහුල නම් වී.

16. සතර පෙර නිමිති දැක අශ්ව යානයෙකින් අභිනිෂ්ක්‍රමණය කෙළෙමි. මම් සවසක් දුෂ්කර වූ ප්‍රධන්වීර්‍ය්‍ය කෙළෙමි.

17. මවිසින් බරණැසැ ඉසිපතන්හි දී දම්සක් පවත්වන ලද්දේ යැ. ගෞතම බුද්ධ නම් වූ මම හැම සත්නට සරණ වෙමි..

18. කොලිත යැ උපතිස්ස යැ යන භික්ෂූහු දෙදෙන අගසව් වෙති. මාගේ සන්තිකා වචර වූ උපස්ථායක තෙමේ ආනන්ද නම් වෙයි.

19. ඛෙමා යැ උප්පලවණ්ණා යැ යන භික්ෂුණීහු අගසැව් වෙති. චිත්ත යැ හත්ථාළවක යැ යන මොහු අග්‍රොපස්ථායක වෙති.

20. උත්තරා යැ නන්දමාතා යැ යන අගඋවටු උවැසියෝ වෙත්. මම ඇසැතුබෝමුල්හි හිඳ උතුම් වූ සම්‍යක් සම්බොධියට පැමිණියෙමි.

21. හැම කල්හි මාගේ ව්‍යාමප්‍රභාව සොළොස්රියන් උස්වැ නැඟිණ. දැන් මෙකල්හි අල්ප වූ වර්ෂ සියයෙක් ආයු පවත්නේ යි. එතෙක් කල් සිටිනා වූ මම බොහෝ ජනතාව තරවමි.

22. ඨපයිත්වාන ධම්මුක්කං[1] පච්ඡිමං ජනබොධනං
අහ'ම්පි[2] න චිරස්සෙව සද්ධිං සාවකසඞ්ඝතො
ඉධෙ'ව පරිනිබ්බිස්සං අග්ගී'වාහාරසඞ්ඛයා.

23. තානි ච අතුලතෙජානි ඉමානි ච දසබලානි ඉද්ධියො[3]
අයං ච ගුණධුරවරදෙහො[4] ද්වත්තිංස ලක්ඛණවිචිත්තො[5].

24. දසදිසා පභාසෙත්වා සතරංසී'ව ජපැභා
සබ්බා සමන්තරහෙස්සන්ති නනු රිත්තා සබ්බසඞ්ඛාරා'ති.

ගොතම බුද්ධවංසො පඤ්චවීසතිමො.

---

1. ධම්මොක්කං – සීමු.
2. අහම්පි – සීමු.
3. ඉමානි ච දසබලානි ච – සීමු., ඉමානි ච යසබලානි ඉද්ධියො–සයා. , ඉමානි ච දසබලානි-බලානි – මජසං.
4. අයංචගුණවරදෙහො–සීමු., අහංගුණධාරණෙ දෙහො – සයා., අය භුව ගුණධාරණො දෙහො – මජංස.
5. ද්වත්තිංසවරලක්ඛණවිචිත්තො–මජසං.,සයා ද්වත්තිංසවර ලක්ඛණචිතො – සීමු.

22. පශ්චිමජනතාව ප්‍රබොධ කරන දහම් නමැති දඬුවැටපහන තබා මම ද ශ්‍රාවක සඞ්ඝයා සමග නොබෝ කලකින් මැ ඉන්ධන ක්ෂයෙන් ගින්නක් සෙයින් මෙහි මැ පිරිනිවෙන්නෙමි.

23. ඒ අතුල්‍ය වූ තෙජස්හු ද මෙ දශවිධ කායබලයෝ ද සෘද්ධීහු ද දෙතිස් මහපුරිස් ලකුණින් ගැවැසිගත් මේ උතුම් වූ ගුණධර දෙහය ද යන -

24. හිරුහු දසදිගුන් සෙයින් සවනක්රසින් (ලොව) හෙළි කොට උක්තප්‍රකාර වූ සියල්ලෝ අතුරුදහන් වන්නාහ. හැම සංස්කාරයෝ තුච්ඡ වූවාහු නු? යි.

**පස්විසිවැනි ගෞතම බුද්ධවංශය යි.**

## බුද්ධපකිණ්ණක කණ්ඩො

1. අපරිමෙය්‍යො ඉතො කප්පෙ චතුරො ආසුං විනායකා
තණ්හඞ්කරො මෙධඞ්කරො අථො'පි සරණඞ්කරො
දීපඞ්කරො ච සම්බුද්ධො එකකප්පම්හි තෙ ජිනා.

2. දීපඞ්කරස්ස අපරෙන කොණ්ඩඤ්ඤො නාම නායකො
එකො'ව එක කප්පම්හි තාරෙසි ජනතං බහුං.

3. දීපඞ්කරස්ස භගවතො කොණ්ඩඤ්ඤස්ස ච සත්ථුනො
එතෙසං අන්තරා කප්පා ගණනාතො අසඞ්ඛියා.

4. කොණ්ඩඤ්ඤස්ස අපරෙන මඞ්ගලො නාම නායකො
තෙසම්පි අන්තරා කප්පා ගණනාතො අසඞ්ඛියා.

5. මඞ්ගලො ච සුමනො ච රෙවතො සොභිතො මුනි
තෙපි බුද්ධා එක කප්පෙ චක්ඛුමන්තො පභඞ්කරා.

6. සොභිතස්ස අපරෙන අනොමදස්සී මහායසො
තෙසම්පි අන්තරා කප්පා ගණනාතො අසඞ්ඛියා.

7. අනොමදස්සී පදුමො නාරදො චා'පි නායකො
තෙ' පි බුද්ධා එකකප්පෙ තමන්තකාරකා මුනී.

8. නාරදස්ස අපරෙන පදුමුත්තරො නාම නායකො
එකකප්පම්හි උප්පන්නො තාරෙසි ජනතං බහුං.

9. නාරදස්ස භගවතො පදුමුත්තරස්ස සත්ථුනො
තෙසම්පි අන්තරා කප්පා ගණනාතො අසඞ්ඛියා.

10. කප්පසතසහස්සම්හි එකො ආසි මහාමුනි
පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො.

11. තිංසකප්පසහස්සම්හි දුවෙ ආසුං විනායකා
සුමෙධො ච සුජාතො ච ඔරතො පදුමුත්තරා[1]

1. ධරසො පදුමුත්තරො – – සීමු. ධරතො පදුමුත්තරො – සයා.

# බුද්ධ ප්‍රකීර්ණක කාණ්ඩය

1. මෙයින් පෙර අප්‍රමෙය කල්පයෙහි තණ්හඞ්කර යැ මෙධඞ්කර යැ යළි සරණඞ්කර යැ දීපඞ්කර යැ යන ඒ පස්මරුන් දිනූ සතර බුදුවරයෝ වූහ.

2. දීපඞ්කරබුදුන්ට මෑත භාගයෙහි කොණ්ඩඤ්ඤ නම් වූ එක් මැ ලොකනායකයන් වහන්සේ එක් කපෙකැ බොහෝ ජනසමූහයා සසරින් එතෙර කරවූ සේක.

3. දීපඞ්කර භාග්‍යවතුන් වහන්සේට ද කොණ්ඩඤ්ඤ ශාස්තෘන් වහන්සේට ද යන මේ බුදුවරයන්ට අතුරු කල්පයෝ ගණනින් අසඞ්ඛ්‍ය වූහ.

4. කොණ්ඩඤ්ඤ බුදුන්ට මැත භාගයෙහි මඞ්ගල නම් ලොකනායක-යන් වහන්සේ ලොවැ පහළ වූහ. ඒ බුදුවරයන්ට ද අනන්තරකල්පයෝ ගණනින් අසඞ්ඛ්‍ය වූහ.

5. මඞ්ගල යැ සුමන යැ රෙවත යැ සොභිත යැ යන චක්ෂුර්මත් වූ ප්‍රභාකර වූ ඒ බුදුවරයෝ ද එක් කපෙකැ පහළ වූහ.

6. සොභිත නම් බුදුන්ට මෑත භාගයෙහි මහායශස්ක වූ අනොමදස්සී නම් බුදුහු ලොවැ පහළ වූහ. ඒ බුදුවරයනට ද අනන්තරකල්පයෝ ගණ-නින් අසඞ්ඛ්‍ය වූහ.

7. අනවමදර්ශී යැ පදුම යැ නාරද යැ යන ලොකනායක වූ කෙලෙස් අඳුරු දුරු කළ ඒ තුන් බුද්ධමුනිහු ද එක් කපෙකැ පහළ වූහ.

8. නාරද බුදුන්ට මෑත භාගයෙහි පදුමුත්තර නම් ලොකනායකයන් වහන්සේ එක් කපෙකැ උපන්සේක් බොහෝ ජනතාව සසරින් තැරවූහ.

9. නාරද භාග්‍යවතුන් වහන්සේට ද පදුමුත්තර ශාස්තෘන් වහන්සේට ද යන ඒ බුදුවරයන්ට අනන්තරකල්පයෝ ගණනින් අසඞ්ඛ්‍ය වූහ.

10. මෙයින් ලක්ෂයක් වන කල්පයෙහි ආගන්තුකසත්කාරයන් පිළිගන්නා වූ මහාමුනි වූ පදුමුත්තර නම් එක් සර්වඥ කෙනෙක් පහළ වූහ.

11. මෙයින් පෙර තිස්දහස් වන කල්පයෙහි පියුමතුරා බුදුන්ට මෑත භාගයෙහි සුමෙධ යැ. සුජාත යැ යන බුදුවරයෝ දෙදෙනෙක් පහළ වූහ.

12. අට්ඨාරසෙ කප්පසතෙ තයො ආසුං විනායකා
පියදස්සී අත්ථදස්සී ධම්මදස්සී ච නායකා
ඔරතො[1] ච සුජාතස්ස සම්බුද්ධා ද්විපදුත්තමා.

13. චතුනවුතෙ ඉතො කප්පෙ එකො ආසි මහාමුනි
සිද්ධත්ථො සො ලොකවිදූ සල්ලකත්තො අනුත්තරො.

14. ද්වෙනවුතෙ ඉතො කප්පෙ දුවෙ ආසුං විනායකා
තිස්සො ඵුස්සො ච සම්බුද්ධා අසමා අප්පටිපුග්ගලා.

15. එකනවුතෙ ඉතො කප්පෙ විපස්සී නාම නායකො
සො'පි බුද්ධො කාරුණිකො සත්තෙ මොචෙසි බන්ධනා.

16. එකතිංසෙ ඉතො කප්පෙ දුවෙ ආසුං විනායකා
සිඛී ච වෙස්සභූ චෙ'ව අසමා අප්පටිපුග්ගලා.

17. ඉමම්හි භද්දකෙ කප්පෙ තයො ආසුං විනායකා
කකුසන්ධො[2] කොණාගමනො කස්සපො චා'පි නායකො
අහ'මෙතරහි සම්බුද්ධො මෙත්තෙය්‍යො චා'පි හෙස්සති.

18. එතෙ'පි පඤ්ච සම්බුද්ධා[3] ධීරා ලොකානුකම්පකා
එතෙසං ධම්මරාජූනං අඤ්ඤෙසං නෙකකොටිනං
ආචික්ඛිත්වාන තං මග්ගං නිබ්බුතා තෙ සසාවකා'ති.

බුද්ධපකිණ්ණකකණ්ඩො නිට්ඨිතො.

1. ධරසො – සීමු.
2. කුක්කුසන්ධො – සයා.
3. එතෙපිමෙ පඤ්ච බුද්ධා – මජසං., සයා. එතෙපි පඤ්ච බුද්ධා – සීමු.

12. සුජාත බුදුන්ට මැතභාගයෙහි අටළොස් වන කප්සියෙහි පියදස්සී යැ අත්ථදස්සී යැ ධම්මදස්සී බුදුහු යැ යන සම්බුද්ධ වූ ද්විපදෝත්තම වූ තුන් විනායකයන් වහන්සේ ලොවැ පහළවූහ.

13. මෙයින් සිවුඅනූ වන කප්හි (කෙලෙස් ගඩ පැළීමෙහි) ශල්‍ය-කර්තෘ වූ අනුත්තර වූ ලොකවිදූ වූ ඒ එක් මැ සිද්ධාත්ථ නම් බුදුහු ලොවැ පහළවූහ.

14. මෙයින් දෙයානුවන කප්හි විනේදනන් විනයනය කරන තිස්ස යැ ඵුස්ස යැ යන අසම වූ අප්‍රතිපුද්ගල වූ සම්බුදුවරු දෙදෙනෙක් වූහ.

15. මෙයින් එකානූවන කප්හි විපස්සී නම් ලොකනායකයන් වහන්සේ ලොවැ පහළවූහ. කාරුණික වූ ඒ බුදුහු ද සත්ත්වයන් සංසාර බන්ධනයෙන් මුදලූ සේක.

16. මෙයින් එක්තිස් වන කප්හි විනායක වූ සිඛී යැ වෙස්සභූ යැ යන අසම වූ අප්‍රතිපුද්ගල වූ බුදුවරු දෙදෙනෙක් ලොවැ පහළ වූහ.

17. මේ මහාභද්‍රකල්පයෙහි කකුසන්ධ යැ කොණාගමන යැ කාශ්‍යප ලොකනායකයන් වහන්සේ යැ යි තුන් බුදු කෙනෙක් වූහ. මම මෙකල්හි සම්බුද්ධයෙමි. අනාගතයෙහි මෛත්‍රෙය නම් බුදු කෙනෙක් ද ලොවැ පහළ වන්නාහ.

18. මෙල පස්බුදුවරු ද ධීරයහ, ලොවට අනුකම්පා ඇතියහ, උන් වහන්සේ මේ ධර්මරාජයන්ගේ ද අන්‍ය වූ නොයෙක් කෙළගණන් බුදුවරයන්ගේ ද ඒ නියඹාණමාර්ගය ප්‍රකාශ කොට ශ්‍රාවකයන් සහිත වැ පිරිනිවියාහ යි.

බුද්ධප්‍රකීර්ණක කාණ්ඩය නිමියේ යි.

## ධාතුභාජනීය කථා

1. මහාගොතමො ජිනවරො කුසිනාරාය[1] නිබ්බුතො
ධාතු විත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො.

2. එකො අජාතසත්තුස්ස එකො වෙසාලියාපුරෙ
එකො කපිලවත්ථුම්හි එකො ච අල්ලකප්පකෙ.

3. එකො ච රාමගාමම්හි එකො ච වෙඨදීපකෙ
එකො පාවෙය්‍යකෙ මල්ලෙ එකො ච කොසිනාරකෙ

4. කුම්භස්ස ථූපං කාරෙසි බ්‍රාහ්මණො දොණසව්හයො
අඞ්ගාරථූපං කාරෙසුං මොරියා තුට්ඨමානසා

5. අට්ඨසාරීරිකා ථූපා නවමො කුම්භචෙතියො
අඞ්ගාර ථූපො දසමො තදායෙව පතිට්ඨිතො.

6. එකා දාඨා තිදසපුරෙ එකා නාගපුරෙ අහු
එකා ගන්ධාර විසයෙ එකා කාලිඞ්ගරාජිනො

7. චත්තාලීස සමාදන්තා කෙසා ලොමා ච සබ්බසො
දෙවා හරිංසු එකෙකං චක්කවාළ පරම්පරා.

8. මධුරායං භගවතො පත්තා දණ්ඩඤ්ච චීවරං
නිවාසනං කුසඝරෙ පච්චත්ථරණං කපිලව්හයෙ.

9. පාටලිපුත්තනගරෙ කරකං කායබන්ධනං
චම්පායමුදකසාටිකා උණ්ණලොමඤ්ච කොසලෙ.

---

1. කුසිනාරාමම්හි – සිමු., කුසිරාරම්හි – මජසං
උණ්හීසං තසෙසා දඨා – අක්ඛකා චෙව ධාතුයො
ශ. අසම්භින්නා ඉමා සත්ත– සෙසා භින්නා ච ධාතුයෙ
මහන්තා මුග්ග මත්තා ච – මජ්ඣිමා භින්න තණ්ඩුලා
ඛුද්දකා සාස පමත්තා – නානා වන්නා ච ධාතුයො

## ධාතුභාජනීය කථා

1. (ශීලාදිගුණයෙන්) මහත් වූ ගෞතම නම් සර්වඥයන් වහන්සේ කුසිනාරා නගරයෙහි පිරිනිවියහ. (උන් වහන්සේගේ) ධාතූන් වහන්සේ ඒ ඒ පෙදෙස්හි පතළාහ.

2. එක් කොටසෙක් අජාතශත්‍රැගේ රාජධානියෙහි ද, එක් කොටසෙක් විසල්පුරයෙහි ද, එක් කොටසෙක් කිඹුල්වත්හි ද, එක් කොටසෙක් අල්ලකප්ප නම් රටෙහි ද–

3. එක් කොටසෙක් රාමගම්හි ද, එක් කොටසෙක් වෙඨද්වීපයෙහි ද, එක් කොටසෙක් පාවානුවරවැසි මල්ලයන් කෙරෙහි ද, එක් කොටසෙක් කුසිනාරා නුවරවැසි මල්ලයන් කෙරෙහි ද වී.

4. ද්‍රොණ නම් බමුණු තෙම කුම්භස්තූපයක් කරවී. මෞර්‍ය්‍යයෝ තුටුසිත් ඇතිවැ අඞ්ගාරචෛත්‍යයක් කරවූහ.

5. ශාරීරිකස්තූප අටෙකි. නවවැනි කුම්භස්තූපය ද දසවැනි අඞ්ගාරචෛත්‍යය ද එකල්හි මැ පිහිටියේ යැ.

6. එක් දළදවක් තිදස්පුරයෙහි ද එක් දළදවක් නාගපුරයෙහි ද එක් දළදවක් ගන්ධාරදෙශයෙහි ද එක් දළදවක් කලිඟුරජුගේ විජිතයෙහි ද වූ යැ.

7. සමසතලිස් දන්තයෝ ද කෙස් ද ලොම් ද දෙවියෝ සක්වළ පරපුරින් සර්වප්‍රකාරයෙන් එකෙක විසින් ගෙන ගියහ.

8. භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රධාතු ද කොතුරුදඬු ද සිවුර ද මධුරායෙහි වෙයි, හඳනාසිවුර කුසඝර නම් තැන්හි වෙයි, පසතුරුණ කිඹුල්වත් පුරයෙහි වෙයි.

9. ඩබරාව ද කාබහන ද පැළලූප්නුවර වෙයි, දියසළුව චම්පා-නගරයෙහි ද උණුලොම්ද කොසොල්දනව්යෙහි ද වේ.

10. කාසාවඤ්ච බ්‍රහ්මලොකෙ වෙඨනං තිදසෙ පුරෙ
පාසාණකෙ පදං සෙට්ඨං යඤ්චාපි අච්චුතිප්පදං
නිසීදනං අවන්ති පුරෙ රට්ඨෙ අත්ථරණං තද

11. අරණී ච මිථිලායං විදෙහෙ පරිස්සාවනං
වාසි සූචිඝරඤ්චා'පි ඉන්දපත්ථෙ පුරෙ තද.

12. පරික්ඛාරං අවසෙසං ජනපදෙ අපරන්තකෙ
පරිභුත්තඤ්ච මුනිනා අකංසු මනුජා තද.

13. ධාතු විත්ථාරිකං ආසි ගොතමස්ස මහෙසිනො
පාණීනං අනුකම්පාය ආහු පොරාණිකා තද.

**ධාතුභාජනීයකථා නිට්ඨිතා.**

**බුද්ධවංසො නිට්ඨිතො.**

---

මහන්තා සුවණ්ණ වණ්ණා ච – මුත්තා වණ්ණාව මජ්ඣිමා
ඛුද්දකා මකුලවණ්ණාව – සොළස දෙණ මත්තිකා

මහන්තා පඤ්ච නාළියො – නාළියො පඤ්ච මජ්ඣිමා
ඛුද්දකා ජනාලි චෙව – එතා සබ්බා'පි ධාතුයො

උණ්හීසං සීහළෙ දීපෙ – බ්‍රහ්ම ලොකෙ ච වාමකං
සීහළෙ දක්ඛිණක්ඛකං ච – සබ්බා පෙතා පතිට්ඨිතා'ති

1 වජිරායං–PTS    2 මකුටපුරෙ-සීමු

3 කාසාවා, බ්‍රහ්මලොකෙ, ච – මජසං, කාසාවකං බ්‍රහ්මලොකෙ – සතා

ඉමා ගාථායො මරම්ම පොත්ථකෙ දිස්සන්ති.
සීහළ පොත්ථකෙ නත්ථි.

10. එකල්හි කසාවත බඹලෙව්හි ද හිස්වෙළුම තිදස් පුරයෙහි ද නිසදුන්සිවුර අවන්තිපුරයෙහි ද අතුරුණ කුරුරටෙහි ද පිහිටියේ ය.

11. අරණිය (ගිනිගානාදණ්ඩ) මිථිලායෙහි ද පෙරහන විදෙහයෙහි ද වාසි හා හිදිගුළු හා ඉඳිපත්නුවරෙහි ද පිහිටියේ යැ.

12. එකල්හි මිනිස්සු බුදුන් විසින් වළඳනාලද සෙසු පිරිකර අපරාන්තජනපදයෙහි පිහිටුවාලූහ.

13. මෙසෙයින් සත්නට අනුකම්පා පිණිස මහර්ෂි වූ ගෞතම-සර්වඥයන් වහන්සේගේ ධාතූන්ගේ පැතිරීම වී යයි එකල පෞරාණිකා-චාර්‍ය්‍යයෝ කීවාහු ය.

ධාතුභාජනීය කථා නිමි.

බුද්ධවංශය නිමියේ යි.

# චරියාපිටක පාළි

# චරියාපිටකපාළි

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස**

## 1. දානපාරමිතා

### අකිත්ති චරියං

1. කප්පෙ ච සතසහස්සෙ චතුරො ච අසඞ්ඛියෙ[1]
එත්ථන්තරෙ යං චරිතං සබ්බං තං බොධිපාචනං.

2. අතීතකප්පෙ චරිතං ඨපයිත්වා භවාභවෙ
ඉමම්හි කප්පෙ චරිතං පවක්ඛිස්සං සුණොහි මෙ.

3. යදා අහං බ්‍රහාරඤ්ඤෙ සුඤ්ඤෙ විපින කානනෙ[2]
අජ්ඣොගහෙත්වා[3] විහරාමි අකිත්ති නාම තාපසො.

4. තදා මං තපතෙජෙන සන්තත්තො තිදිවාධිභූ[4]
ධාරෙන්තො බ්‍රාහ්මණවණ්ණං භික්ඛාය මං උපාගමි.

5. පවනා ආභතං[5] පණ්ණං අතෙලඤ්ච අලොණිකං
මම ද්වාරෙ ඨිතං දිස්වා සකටාහෙන ආකිරිං.

6. තස්ස දත්වානහං පණ්ණං නික්කුජ්ජිත්වාන භාජනං
පුනෙසනං ජහිත්වාන පාවිසිං පණ්ණසාලකං.

7. දුතියම්පි තතියම්පි උපගඤ්ඡි මමන්තිකං
අකම්පිතො අනොලග්ගො එවමෙවමදාසහං.

8. න මෙ තප්පච්චයා අත්ථි සරීරස්මිං විවණ්ණියං
පීතිසුඛෙන රතියා වීතිනාමෙමි තං දිවං.

---

1. අසඞ්ඛියා - සීමු
2. විජන - සී., විවන - ස්‍යා
3. අජ්ඣොගාහෙත්වා මජසං. PTS.
4. තිදිවාභිභූ, මු - මජසං., ප.
5. ආභටං - ස්‍යා. PTS.

# චරියාපිටක පාලි

## ඒ භගවත් අර්හත් සම්‍යක් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා

## 1. දානපාරමිතාව

### අකීර්ති චර්‍යාව

1. සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයක් තුළ (අප මහ බෝසතුන්ගේ) යම් චරියාවක් වූ නම් ඒ සියල්ල සම්‍යක් සම්බොධිය හෙවත් සර්වඥතාඥානය මුහුකුරු වනු විය.

2. ඉකුත්වූ (සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂ සඞ්ඛ්‍යාත) කල්පයෙහි කුදු මහත් භවයෙහි පුරුදු කරන ලද දානාදි ප්‍රතිපත්තිය හැර පියා මේ භද්‍රකල්පයෙහි චරිතය කියමි. (ශාරීපුත්‍රය) මාගේ වචනය අසව,

3. යම් කලෙක මම අකිත්ති නම් තවුස් ව ඉපිද ජනසඤ්චාර රහිත වූ කරගසින් ගහන වූ මහවනයෙහි පිවිස වාසය කෙළෙම් ද,

4. එකල මාගේ තවුස් තෙදින් තැවුණු සක්දෙව් රජතෙම බමුණු වෙස් ධරමින් පිඬු පිණිස මා වෙත එළඹ සිටියේ ය.

5. පවනින් අඹළ තෙල් ලුණු නැති (ඊසූ) කරකොළ මාගේ දෙර සිටියහු දැක භාජනයෙන් ගෙන (තමහට ඉතිරි නොකොට) ඔහට දිනිමි.

6. මම සක්දෙව් රජහට කරකොළ දී භාජනය යටිකුරු කොට තබා නැවත (එදවස) අහර නොසොයා පන්සලට පිවිසියෙමි.

7. දෙවන තෙවන දවස්හි දු හේ මා වෙත එළැඹියේ ය. මම මසුරු බැවින් නො සැලුණෙම් ලොභයෙන් නොලැගුණෙම් එසෙයින් මැ දිනිමි.

8. ඒ දානහෙතුයෙන් මාගේ ශරීරයෙහි විරූප බවෙක් නැති. දන්දීමෙන් ඇති වූ ප්‍රීති සුඛයෙන් හා අභිරතියෙන් ඒ තුන් දවස ඉක්මවීමි.

9. යදි මාසම්පි ද්වෙ මාසං දක්ඛිණෙය්‍යං වරං ලභෙ
අකම්පිතො අනොලීනො දදෙය්‍යං දානමුත්තමං.

10. න තස්ස දානං දදමානො යසං ලාභඤ්ච පත්ථයිං
සබ්බඤ්ඤුතං පත්ථයානො තානි කම්මානි ආචරින්ති.

**අකිත්ති චරියං පඨමං.**

## 2. සඞ්ඛ චරියං

11. පුනාපරං යදා හොමි බ්‍රාහ්මණො සඞ්ඛසව්හයො
මහාසමුද්දං තරිතුකාමො උපගච්ඡාමි පට්ටනං.[1]

12. තත්ථද්දසාමි පටිපථෙ සයම්භුං අපරාජිතං
කන්තාරද්ධාන[1] පටිපන්නං තත්තාය කඨිනභූමියා.

13. තමහං පටිපථෙ දිස්වා ඉමමත්ථං විචින්තයිං
ඉදං[2] ඛෙත්තං අනුප්පත්තං පුඤ්ඤකාමස්ස ජන්තුනො.

14. යථාපි[3] කස්සකො පුරිසො ඛෙත්තං දිස්වා මහාගමං.[4]
තත්ථ බීජං න රොපෙති න සො ධඤ්ඤෙන අත්ථිකො.

15. එවමෙවාහං පුඤ්ඤකාමො දිස්වා ඛෙත්තං[5] වරුත්තමං
යදි තත්ථ කාරං න කරොමි නාහං පුඤ්ඤෙන අත්ථිකො.

16. යථා අමච්චො මුද්දිකාමො රඤ්ඤො අන්තෙපුරෙ ජනෙ
න දෙති තෙසං ධනධඤ්ඤං මුද්දිතො පරිහායති.

17. එවමෙවාහං පුඤ්ඤකාමො විපුලං දිස්වාන දක්ඛිණං
යදි තස්ස දානං න දදමි පරිහායිස්සාමි පුඤ්ඤතො

18. එවාහං චින්තයිත්වාන ඔරොහිත්වා උපාහනා
තස්ස පාදානි වන්දිත්වා අදාසිං ඡත්තුපාහනං

19. තෙනෙවාහං සතගුණතො සුඛුමාලො සුඛෙධිතො
අපිච දානං පරිපූරෙන්තො එවං තස්ස අදාසහන්ති

**සඞ්ඛචරියං දුතියං.**

---

1. කන්තාරද්ධානං – මජසං. කන්තාරමද්ධානං – ස්‍යා
2. ඉමං – ස්‍යා.
3. යථා – මජසං.
4. මහාරාමං – ස්‍යා.
5. ඛෙත්තං – ස්‍යා.

9. ඉදින් යම් හෙයෙකින් (ගුණයෙන්) උතුම් වූ දක්ෂිණාර්හ කෙනකුන් ලබම් නම් මසකුදු දෙමසකුදු නො සැලෙනුයෙම් නො පසුබස්නෙම් උතුම් වූ දානය දෙමි.

10. එ සක්දෙව් රජුට දන් දෙනුයෙම් යස පිරිවර සම්පත් හෝ (චක්‍රවර්ති සම්පත් ආදි වූ) ලාභයක් හෝ නො පැතිමි. වැළි, බුදුබව පතනුයෙම් ඒ දානමය පින්කම් කෙළෙමි යි.

**පළමුවන අකීර්ති චර්‍යාව යි.**

## 2. සඞ්ඛ චර්‍යාව

11. තවද අභිකුදු චරිතයක් කියමි. (එදා අසව) යම් කලෙක (මම) සඞ්ඛ නම් බ්‍රාහ්මණ වීම් ද එකල (සුවර්ණභූමිය කරා යන්නට) මහමුහුදෙන් එතරවනු කැමැත්තෙම් පටුන බලා ගියෙමි.

12. එ පෙරමඟ ගිමින් තැවුණු රළු බිම්හි වූ කතර අදන්මගට පිළිපන් සවයම්භූ වූ අපරාජිත වූ පසේ බුදු කෙනකුන් වහන්සේ දිටිමි.

13. මම එසේ පෙරමඟ එන එ පසේබුදුන් දැක, මෙකරුණ සිතූ වෙමි. පින් කැමතියාහට පින් කෙතක් ලැබුණේ යි කියා යි.

14. යම් සේ ගොවිපුරුෂයෙක් මහත් වූ අස්වනු ලැබෙන විපුල වූ ඵලදායක කෙතක් දැක එහි බිජුවට නො වපුරා නම් ඒ ගොවියා ධාන්‍ය කැමැතියෙක් නො වේ ද.

15. එ පරිද්දෙන් ම පින් කැමැති වූ මම පින් කෙත් අතුරින් අතිශයින් උතුම් වූ (ආර්‍ය්‍යශ්‍රාවකයන්ගෙන්) අග්‍ර වූ පසේබුදු කෙනකුන් වන පින්කෙතක් දැක උන් වහන්සේට පූජාසත්කාර නො කෙරෙම් නම් මම පින් කැමැතියෙම් නො වෙමි.

16. යම්සේ රාජමුද්‍රාධිකාර පදවිධර අමාත්‍යයෙක් හෝ සෙනාපතියෙක් හෝ ඇතොවුරෙහි ද ඉන් පිටත බලකායාදීන් කෙරෙහි ද රාජානුශාසනය පරිද්දෙන් නො පිළිපදී ද ඔවුනට ධන ධාන්‍ය නොදේ ද හෙතෙම එම මුද්‍රාධිකාර ධුරයෙන් පිරිහේ.

17. එපරිද්දෙන් මම ද පින් කැමැතියෙම් උදාර වූ දක්ෂිණාර්හයකු දැක ඉදින් ඔබට දන් නොදෙම් නම් පුණ්‍යඵලයෙන් ද පිරිහෙමි.

18. මම මෙසේ සිතා (දුරදීම) වහන්සඟළ මුදගෙන ඒ පසේබුදුන් වහන්සේ ගේ පා වැද (උන්වහන්සේට) පත් කුඩය සහ වහන්සඟළ ද දිනිමි.

19. සඞ්ඛ බ්‍රාහ්මණ වූ මම (ඒ පසේබුදුන්ට වඩා එකල) සියුමැලි ව සුවසේ වැඩී සිටියෙමි. එසේ වුව ද මාගේ දානපාරමිතාව පුරනුයෙම් මෙසේ උන්වහන්සේට ඡත්‍රොපාහනය දිනිමියි.

**දෙවන සඞ්ඛ බ්‍රාහ්මණචර්‍යා යි.**

## 3. කුරුධම්මචරියං

20. පුනාපරං යද හොමි ඉන්‍දපත්‍ථෙ[1] පුරුත්තමෙ
රාජා ධනඤ්ජයො නාම කුසලෙ[2] දස හුපාගතො.

21. කාලිඞ්ග[3] රට්ඨවිසයා බ්‍රාහ්මණා උපගඤ්ඡු මං
ආයාචුං මං හත්‍ථිනාගං ධඤ්ඤං මඞ්ගලසම්මතං.

22. අවුට්ඨිකො ජනපදො දුබ්භික්ඛො ඡාතකො මහා
දදාහි පවරං නාගං නීලං අඤ්ජනසව්හයං.

23. න මෙ යාචකමනුප්පත්තෙ පටික්ඛෙපො අනුච්ඡවො
මා මෙ භිජ්ජි සමාදානං දස්සාමි විපුලං ගජං.

24. නාගං ගහෙත්‍වා සොණ්ඩාය භිඞ්කාරෙ රතනාමයෙ
ජලං හත්‍ථෙ ආකිරිත්‍වා බ්‍රාහ්මණානං අදං ගජං

25. තස්ස නාගෙ පදින්නම්හි අමච්චා එතදබ්‍රවුං
කිංනු තුය්හං වරං නාගං යාචකානං පදස්සසි.

26. ධඤ්ඤං මඞ්ගලසම්පන්නං සඞ්ගාමවිජයුත්තමං
තස්මිං නාගෙ පදින්නම්හි කිං තෙ රජ්ජං[4] කරිස්සති.

27. රජ්ජම්පි මෙ දදෙ සබ්බං සරීරං දජ්ජමත්තනො
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා නාගං අදාසහන්ති[5]

කුරුධම්මචරියං තතියං.

## 4. මහාසුදස්සනචරියං

28. කුසාවතිම්හි නගරෙ යද ආසිං මහීපති
මහාසුදස්සනො නාම චක්කවත්ති මහබ්බලො.

29. තත්‍ථාහං[6] දිවසෙ තික්ඛත්තුං ඝොසාපෙමි තහිං තහිං
කො කිං ඉච්ඡති පත්‍ථෙති කස්ස කිං දීයතු ධනං.

---

1. ඉන්‍දපත්තෙ - සිමු.
2. කුසලෙහි - සයා
3. කලිඞ්ග - මජසං
4. කුරුරාජ - මජසං
5. තදහං - පු

## 3. කුරුධම්ම චරියාව

20. තවද අනෙකුදු චරියාවක් කියමි. යම් කලෙක (මම කුරුරට) උතුම් වූ ඉඳිපත් නුවර දානාදි වූ දස පින් කිරිය වතින් හෙවත් දශ කුශල කර්මපථයෙන් යුක්ත වූ ධනඤ්ජය නම් රජ වූයෙම් ද.

21, 22. එකල බමුණෝ (අට දෙනෙක්) කලිඟු රටින් මා වෙත පැමිණියාහු ය. ධන්‍ය ලක්ෂණ සම්පන්න වූ මඞ්ගල සම්මත හස්තිරාජයා මාගෙන් ඉල්ලූහ. කලිඟු ජනපදය වැසි නැත්තේ ය, දුර්භික්ෂ ඇත්තේ ය, සාදුක් ඇත්තේ ය. එ හෙයින් උතුම් වූ නීලවර්ණ වූ අඤ්ජන හස්තිරාජයා අපට දුන මැනවයි අයැද සිටියහ.

23. යාචක ජනයා මා කරා පැමිණ යමක් ඉල්ලූ කල ඒ ප්‍රතික්ෂෙප කිරීම මට නො නිසි වෙයි. මාගේ පාරමිතාසමාදානය නො බිඳේව යි මහත් වූ මේ මඞ්ගල හස්තිරාජයා දෙමි.

24. ඇත්රජු සොඬින් ගෙන රන් මුවා කෙණ්ඩියෙන් අතපැන් එව ඇත් රජු බමුණන්ට දිනිමි.

25, 26. ඒ හස්ති රාජයා දුන් කල්හි ඇමැතියෝ මෙසේ කීහු. ධන්‍ය වූ මඞ්ගල ලක්ෂණ සම්පන්න වූ සඞ්ග්‍රාම විජයෙහි ප්‍රධාන වූ තොපගේ උතුම් ඇත්රජු කවර හෙයින් දුන්නහු ද, ඒ ඇතු දුන් කල්හි තොපගේ රාජ්‍යය කුමක් කරන්නේ ද.

27. මා ගේ මේ සිය ශරීරය ද දෙමි, සියලු ශරීරය ද දෙමි. සර්වඥතාඥනය මට ප්‍රියවෙයි. එ බැවින් මම හස්තිරාජයා දිනිමි යි.

**තෙවන කුරුධර්ම චරිත යි.**

## 4. මහාසුදස්සන චරියාව

28. යම් කලෙක (මම) කුසාවතී නුවර මහත් වූ බල ඇති මහාසුදර්ශන නම් සක්විති රජ වූ යෙම් ද,

29. ඒ නුවරදී මම ඒ ඒ තැන්හි දවසට තුන් වරක් බෙර පියවි කර වීමි. එකල්හි (බ්‍රාහ්මණාදීන්අතුරෙන්) කවරෙක් කුමක් කැමැති වේ ද, කුමක් පතා ද, කවරක්හට කවර ධනයක් මා විසින් දෙනු ලැබේ ද,

30. කො ජාතකො කො තසිතො කො මාලං කො විලෙපනං
නානාරත්තානි වත්ථානි කො නග්ගො පරිදහිස්සති.

31. කො පථෙ ඡත්තමාදෙති කො පාහනා මුදූ සුභා
ඉති සායඤ්ච පාතො ච ඝොසාපෙමි තහිං තහිං.

32. න තං දසසු ඨානෙසු න පි[1] ඨානසතෙසු වා
අනෙකසතඨානෙසු පටියත්තං යාචකෙ ධනං.

33. දිවා වා යදි වා රත්තිං යදි එති වණිබ්බකො
ලද්ධා යදිච්ඡකං භොගං පූරහත්ථොව ගච්ඡති.

34. එවරූපං මහාදානං අදාසිං යාවජීවිකං
නපාහං දෙස්සං ධනං දම්මි නපි නත්ථි නිචයො මයි.

35. යථා'පි ආතුරො නාම රොගතො පරිමුත්තියා
ධනෙන වෙජ්ජං තප්පෙත්වා රොගතො පරිමුච්චති.

36. තථෙවාහං ජානමානො පරිපූරෙතුමසෙසතො
ඌනමනං පූරයිතුං දෙමි දානං වණිබ්බකෙ
නිරාලයො අපච්චාසො සම්බොධිමනුපත්තියාති.

මහාසුදස්සනචරියං චතුත්ථං.

## 5. මහාගොවින්ද චරියං

37. පුනාපරං යදා හොමි සත්ත රාජපුරොහිතො
පූජිතො නරදෙවෙහි මහාගොවින්දබ්‍රාහ්මණො.

38. තදාහං සත්තරජ්ජෙසු යං මෙ ආසි උපායනං
තෙන දෙමි මහාදානං අක්ඛොභං[2] සාගරූපමං.

39. න මෙ දෙස්සං ධනං ධඤ්ඤං නපි නත්ථි නිචයො මයි
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා දෙමි වරං ධනන්ති.

මහාගොවින්ද චරියං පඤ්චමං.

1. නපි - සයා.
2. අක්ඛොභං සිමු - මජසං
අචජං - පු

30. කවරෙක් සා දුක් ඇත්තේ ද කවරෙක් පවස් ඇත්තේ ද, කවරෙක් මල්දම් කැමැත්තේ ද, නග්න වූ කවරෙක් නානා වර්ණයෙන් රඳනා ලද වස්ත්‍රයන් හඳිනු කැමැති වේ ද.

31. කවර මගියෙක් මගදී (වැසි සුළං අව්වෙන් වැළකීම පිණිස) ඡත්‍රයක් රිසි වේ ද, කවරෙක් හොබනා වූ මොලොක් වූ පාවහන් රිසි වේ දැයි උදය දවල් සවස ඒ ඒ තැන මෙසේ ඝෝෂණය කරවිමි.

32. (එසේ) ඒ දානය දස තැනක සියක් තැනක හෝ නො වෙයි. වැළිදු නොයෙක් සිය ගණන් තන්හි යාචකයන් උදෙසා ධනය පිළියෙළ කරන ලදුයේ යි.

33. ඉදින් දහවල වේවයි රාත්‍රියෙහි වේවයි යාචක ජනයා පැමිණේ නම් කැමති පරිද්දෙන් වස්තුව ලැබ ගෙන (පිරුණු) අත් ඇතිව මැ යෙයි.

34. දිවි ඇති තාක් ම මෙබඳු මහදන් දිනිමි. මට අප්‍රිය වූ අමනාප වූ වස්තුවක් මම නො දෙමි. මා සමීපයෙහි වස්තු රැස්කිරීමෙක් නැත්තේ ද නො වේ.

35. යම්සේ රෝගී වූ පුරුෂයෙක් එම රෝදුකින් මිදෙනු පිණිස ධනයෙන් වෙදහු සතුටු කොට වියි වූ පරිද්දෙන් (පිළිපැදීමෙන්) රොගයෙන් මිදේ ද,

36. එ පරිද්දෙන් ම මම ඒ දන්නෙම නිරවශෙෂ වශයෙන් (සත්‍වයන්ගේ අදහස්) සපුරන පිණිස අඩුසිත පිරිමට යාචකජනයාට දන් දෙමි. එ ද අපේක්ෂා රහිතව කිසිවකුදු නො පතමින් හුදෙක් සර්වඥතාඥනය අවබෝධ කරගැනීමට දෙමි.

සතරවන මහා සුදර්ශන චරියා යි.

## 5. මහාගොවින්ද චරියාව

37. තවද අනික් චරියාවක් කියමි: යම් කලෙක මම සත් රජුන්ට පුරෝහිත වූ සියලු රජුන් විසින් පුදනු ලැබූ මහාගොවින්ද නම් බ්‍රාහ්මණ වූයෙම් ද,

38. එකල සත්රජයෙහි (රජුන්) මට එළවන ලද යම් පඩුරෙක් වී ද, එයින් මම (කිසිවකු විසින) ඇළලිය නො හැකි සාගරය වැනි වූ මහා දානයක් දිනිමි.

39. මට ධන ධාන්‍යය ද අප්‍රිය නො වෙයි. මා ගේ වස්තු රැස් කිරීමෙක් නැත්තේ ද නො වෙයි. සර්වඥතාඥනය (එ ධනධාන්‍යයට) වඩා මට ප්‍රිය වෙයි. එහෙයින් උතුම් වූ ධනය දෙමි.

පස්වන මහාගොවින්ද චරියා යි.

## 6. නිමිරාජ චරියං

40. පුනාපරං යදා හොමි මිථිලායං පුරුත්තමෙ
නිමි නාම මහාරාජා පණ්ඩිතො කුසලත්ථිකො.

41. තදාහං මාපයිත්වාන චතුස්සාලං[1] චතුම්මුඛං
තත්ථ දානං පවත්තෙසිං මිගපක්ඛිනරාදිනං.

42. අච්ඡාදනඤ්ච සයනඤ්ච අන්නං පානඤ්ච භොජනං
අබ්බොච්ඡින්නං කරිත්වාන මහාදානං පවත්තයිං.

43. යථාපි සෙවකො සාමිං ධනහෙතුමුපාගතො
කායෙන වාචා මනසා ආරාධනීයමෙසති.

44. තථෙවාහං සබ්බභවෙ පරියෙසිස්සාමි බොධිජං
දානෙන සත්තෙ තප්පෙත්වා ඉච්ඡාමි බොධිමුත්තමන්ති.

නිමිරාජචරියං ඡට්ඨමං.

## 7. චන්දකුමාර චරියං

45. පුනාපරං යදා හොමි එකරාජස්ස අත්‍රජො
නගරෙ පුප්ඵවතියා කුමාරො චන්දසව්හයො.

46. තදාහං යජනා මුත්තො නික්ඛන්තො යඤ්ඤවාටතො[2]
සංවෙගං ජනයිත්වාන මහාදානං පවත්තයිං

47. නාහං පිවාමි ඛාදාමි නපි භුඤ්ජාමි භොජනං
දක්ඛිණෙය්‍යෙ අදත්වාන[3] අපි ඡප්පඤ්ච රත්තියො.

48. යථාපි වාණිජො නාම කත්වාන භණ්ඩසඤ්චයං
යත්ථ ලාභො මහා හොති තත්ථ තං හරති භණ්ඩකං.

49. තථෙව සකභුත්තාපි[4] පරෙ දින්නං මහප්ඵලං
තස්මා පරස්ස දාතබ්බං සතභාගො භවිස්සති.

50. එතමත්ථවසං ඤත්වා දෙමි දානං භවාභවෙ
න පටික්කමාමි දානතො සම්බොධිමනුපත්තියාති.

චන්දකුමාරචරියං සත්තමං.

1. චතුසාලං – සයා
2. යඤ්ඤවාටතො – සයා., යඤ්ඤපාතතො – සීමු.
3. දක්ඛිණෙය්‍යං – කම්බො
4. සකපරිභුත්තාපි – පු.

## 6. නිමිරාජ චරියාව

40. තවද අනික් චරියාවක් කියමි: යම් කලෙක මම මිථිලා නම් උතුම් නගරයෙහි පණ්ඩිත වූ පින් කැමති වූ නිමි නම් මහරජ වූයෙමි ද,

41. එකල මම සතර දිශාවට දොර ඇති චතුශ්ශාලාවක් කරවා මෘග පක්ෂි මනුෂ්‍යාදීන්ට ද එහි මහදන් පැවැත් වීමි.

42. හඳනා පොරෝනා වතුදු යහනුදු ආහාරපානදු සෙසු නොයෙක් බොදුනුදු නිරතුරු කොට තබා මහදන් පැවැත්වීමි.

43. යම්සේ සේවක පුරුෂයෙක් ධනහෙතුයෙන් ස්වාමියාගේ සමීපයට පැමිණියේ කයින් වචනයෙන් සිතින් සතුටු කළ යුතු උපාය සොයා ද,

44. එපරිද්දෙන් මම ද උපනුපන් සියලු භවයෙහි ධනයෙන් සියලු සත්ත්වයන් සතප්පා සර්වඥතාඥනය (සියලු උත්සාහයෙන්) සොයන්නෙමි. ඒ උතුම් සම්‍යක් සම්බෝධිය විශෙෂයෙන් ප්‍රාර්ථනා කෙළෙමි යි.

සවන නිමිරාජ චරියා යි.

## 7. චන්‍ද්‍රකුමාර චරියාව

45. තවද අනෙක් චරියාවක් කියමි: යම් කලෙක (මම) පුෂ්පවතී නුවර ඒකරාජ නම් කසී රජහුගේ ඖරස පුත්‍ර වූ චන්ද්‍ර නම් කුමාර වූයෙමි ද,

46. එකල මම (ඛණ්ඩහාලයා කළ) යාග විධානයෙන් මිදුණෙම් යාගාවාටයෙන් නික්ම ගියෙමි අතිශයින් සංවේග උපදවා (වෙස්සන්තර රජුගේ දානය වැනි වූ) මහ දන් පැවැත්වීමි.

47. මම දක්ෂිණාර්හයන්හට ස පස්රයක් පමණකුදු පවා නො දී නො පීමි. නො කැයෙමි. නො බිදීමි.

48. යම් සේ වෙළඳෙක් (මඳ මිළයෙන් විකිණිගෙන) බඩු රැස් කොට යම් තැනෙක ලාභ මහත් වේ ද එතැන්හි ඒ බඩු ගෙන යේ ද,

49. එසේම ස්වකීය පරිභොගයට වඩා අනෙක් ප්‍රතිග්‍රාහක කෙනකුන්ට දෙන ලද්ද මහත් ඵලවිපාක ඇත්තේ ය. එහෙයින් (තමන් අනුභව නො කොට) අනුන්ට දියයුතු ය. මත්තෙහි විපාකවාර සිය කොටසින් වන්නේ ය.

50. මේ කාරණය දැනගෙන කුදු මහත් භවයෙහි දන් දිනිමි. බුද්ධත්වයට පැමිණීම පිණිස දාන පාරමිතායෙන් මඳකුදු නො නැවැත්තෙමි යි.

සත්වන චන්ද්‍රකුමාර චරියා යි.

## 8. සිවිරාජ චරියං

51. අරිට්ඨසව්හයෙ නගරෙ සිවි නාමාසි[1] ඛත්තියො
නිසජ්ජ පාසාදවරෙ එවං චින්තෙසහං තදා

52. යං කිඤ්චි මානුසං දානං අදින්නං මෙ න විජ්ජති
යොපි යාචෙය්‍ය මං චක්ඛුං දදෙය්‍යං අවිකම්පිතො.

53. මම සඞ්කප්පමඤ්ඤාය සක්කො දෙවානමිස්සරො
නිසින්නො දෙවපරිසාය ඉදං වචනමබ්‍රවි.

54. නිසජ්ජ පාසාදවරෙ සිවිරාජා මහිද්ධිකො
චින්තෙන්තො විවිධං දානං අදෙය්‍යං සො න පස්සති,

55. තථං නු විතථං නෙතං හන්ද වීමංසයාමි[2] තං
මුහුත්තං ආගමෙය්‍යාථ යාව ජානාමි තං මනං.

56. පවෙධමානො පලිතසිරො වලිතගත්තො ජරාතුරො
අන්ධවණ්ණොව හුත්වාන රාජානං උපසඞ්කමි.

57. සො තදා පග්ගහෙත්වාන වාමං දක්ඛිණබාහු ච
සිරස්මිං අඤ්ජලිං කත්වා ඉදං වචනමබ්‍රවි.

58. යාචාමි තං මහාරාජ ධම්මිකරට්ඨවඩ්ඪන
තව දානරතා කිත්ති උග්ගතා දෙවමානුසෙ.

59. උභොපි නෙත්තා නයනා අන්ධා උපහතා මම
එකං මෙ නයනං දෙහි ත්වම්පි එකෙන යාපය.

60. තස්සාහං වචනං සුත්වා හට්ඨො සංවිග්ගමානසො
කතඤ්ජලී වෙදජාතො ඉදං වචනමබ්‍රවිං.

61. ඉදානාහං චින්තයිත්වා[3] පාසාදතො ඉධාගතො
ත්වං මම චිත්තමඤ්ඤාය නෙත්තං යාචිතුමාගතො.

---

1. නාමාසි - කත්ථචි
2. වීමංසිස්සාමි - කත්ථචි
3. චින්තයිත්වාන - මජසං, ස්‍යා

## 8. සිවිරාජ චරියාව

51. (යම් කලෙක මම) අරිට්ඨ නම් නුවර (ගෝත්‍රයෙන්) සිවි නම් වූ ක්ෂත්‍රිය රජ වූයෙම් ද, එකල මම උතුම් ප්‍රාසාදයෙහි හිඳ මෙසේ සිතුයෙමි:

52. ම විසින් නො දෙන ලද යම් කිසි මානුසක දානවස්තුවෙක් නැත. යමෙක් මාගෙන් ඇස ඉල්ලා නම් නො සැලුණු සිත් ඇතිව එය දෙන්නෙම් යි,

53. මා ගේ අදහස දැනගෙන දෙවියන්ට අධිපති වූ සක්දෙව් රජ දෙව් පිරිස්හි හුන්නේ මෙ වදන් කී:

54. මහත් රාජර්ද්ධි ඇති ඒ සිවිරජ තෙම උතුම් පහයෙහි හිඳ තමා දුන් විවිධ (බාහිර) දානය සිතන්නේ නො දිය හැකි ආධ්‍යාත්මික වස්තුවකුදු නො දකී.

55. එබැවින් තෙල දානාධ්‍යාසය සත්‍යයෙක් දෝ හෝ අසත්‍යයෙක් දෝ හොයි ඒ සිවිරජුහු විමසමි යි ඔහුගේ සිත යම් තාක් දැන ගනිම් ද ඒ තාක් මොහොතක් බලව.

56. පැසුණු හිස ඇත්තේ රැළි වැටුණු ශරීර ඇත්තේ, මෙකී ජරායෙන් පීඩිතවූයේ වෙවුළමින් අඳ වෙස් ඇති වැ රජු කරා එළඹියේ ය.

57. එ කල ඒ බමුණු වෙස් ගත් සක් දෙව් රජ වමත ද දකුණත ද ඔසවා හිස මතුයෙහි ඇඳිලි කොට ගෙන මෙවදන් කී:

58. ධාර්මික වූ රට වඩන්නා වූ මහරජාණෙනි, තොප අයැද සිටිමි. තොපගේ දානාභිරතියෙන් ඇති වූ කීර්තිය දෙව් මිනිසුන් කෙරෙහි උස් වැ පැන නැඟිණ.

59. මා ගේ නෙත්‍ර සඞ්ඛ්‍යාත වූ දෙනුවන අන්ධව ගියේ ය, නැසිණ. එහෙයින් මට එක් ඇසක් දෙනු මැනව. තෙපිදු එක් ඇසෙකින් යැපෙනු මැනවැයි කීයේ ය.

60. මම ඔහු ගේ වචනය අසා සතුටු වූයෙම්, සංවේගයට පැමිණි සිත් ඇතියෙම්, කරන ලද ඇඳිලි ඇති වැ උපන් සොම්නස් ඇති වැ මෙවදන් කීමි.

61. මම දන් (ආධ්‍යාත්මික වස්තු පරිත්‍යාග කෙරෙමැයි) සිතා පහයෙන් නික්ම මෙහි ආයෙමි. තෙපි මා ගේ සිත දැනගෙන මෙන් ඇසක් ඉල්ලන්ට ආවහු ද?

62. අහො මෙ මානසං සිද්ධං සබ්බාසා පරිපූරිතා
අදින්නපුබ්බං දානවරං අජ්ජ දස්සාමි යාචකෙ.

63. එහි සීවක උට්ඨෙහි මා දන්ධයි මා පවෙධයි
උභොපි නයනෙ දෙහි උප්පාටෙත්වා වණිබ්බකෙ.

64. තතො සො චොදිතො මය්හං සීවකො වචනඞ්කරො
උද්ධරිත්වාන පාදාසි තාලමිඤ්ජංව යාචකෙ.

65. දදමානස්ස දෙන්තස්ස දින්නදානස්ස මෙ සතො
චිත්තස්ස අඤ්ඤථා නත්ථි බොධියායෙව කාරණා

66. න මෙ දෙස්සා උභො චක්ඛු අත්තා න මෙ න දෙස්සියො[1]
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා චක්ඛුං අදාසහන්ති.[2]

සිවිරාජචරියං අට්ඨමං.

## 9. වෙස්සන්තරචරියං

67. යා මෙ අහොසි ජනිකා ඵුසතී නාම[3] ඛත්තියා
සා අතීතාසු ජාතිසු සක්කස්ස මහෙසී පියා.[4]

68. තස්සා ආයුක්ඛයං දිස්වා දෙවින්දො එතදබ්‍රවි
දදාමි තෙ දසවරෙ වරං[5] භද්දෙ යදිච්ඡසි.

69. එවං වුත්තා ච සා දෙවී සක්කං පුනිදමබ්‍රවි
කිං නු මෙ අපරාධත්ථි කිං නු දෙස්සා අහං තව
රම්මා චාවෙසි මං ඨානා වාතොව ධරණීරුහං.

70. එවං වුත්තො ච සො සක්කො පුන තස්සිදමබ්‍රවි[6]
න චෙව තෙ කතං පාපං න ච මෙ ත්වමසි අප්පියා

1. අත්තානං මෙ න දෙස්සියා - පු
අත්තාපි මෙ න දෙස්සියො - පු
2. අද අහං - පු.
3. ඵුස්සති ස්‍යා - මජ්සං,
4. සක්කස්ස මහෙසිසි සා - ස්‍යා
සක්කස්ස ච මහෙසියා - සීමු
5. වරං - සිං
6. තස්සෙසදං-PTS, ස්‍යා

62. (අහෝ) විස්මයෙක (ඇස් දෙමැයි) මා සිත තුළ උපන් දානාධ්‍යාශය නිපන. මා මනදෙළ පිරිණි. නුදුන් විරූ උතුම දානය අද යාචකයාට දෙමි.

63. මෙහි එව සීවකය, (නො පසුබට වෙව) වීයඞ් කරව, මාගේ මේ ඇස් දීමෙහි ලා සහාය වෙව, පමා නො වෙව, කම්පා නො වෙව, දෑසම උපුටා යාචකයාට දෙව.

64. ඉක්බිති මා විසින් මෙසේ මෙහෙයන ලද කීකරු වූ සීවක වෙද තෙම (මා) ඇස තල් ලොදක් සේ උදුරාගෙන යාචකයාට දුන්නේ ය.

65. සම්‍යක් සම්බෝධිය ම කරුණු කොට ඇස් දෙන්නට වෙදහු ලවා ඇස් උපුටන්නා වූ ද, එම උපුටා පියන ලද ඇස් ශක්‍ර බ්‍රාහ්මණයා අත තබන්නා වූ ද, දෙන ලද ඇස් ඇත්තා වූ ද, මාගේ දානාධ්‍යාශය පිළිබඳ වෙනසෙක් නැති.

66. (මා) දෙ ඇස මට අප්‍රිය නො වෙයි. මා විසින් ආත්මය තෙමේ ද්වේෂ කටයුතු ද නො වෙයි. නොහොත් මාගේ ආත්මය මට අප්‍රිය නො වේ. මට බුදු බව ප්‍රිය වේ එ බැවින් ඇස් දුනිමි යි.

**අටවැනි සිවිරාජ චරියා යි.**

## 9. වෙස්සන්තර චරියාව

67. ඵුසතී නම් වූ යම් කැත්දුවක් වෙස්සන්තර වූ මට මවු වූ ද ඕ තොමෝ අතීත ජාතියෙහි සක්දෙව් රජහට ප්‍රිය මෙහෙසි වූ ය.

68. සක් දෙව් රජතෙම ඒ ඵුසතී දේවියගේ (දිව්‍යගතික වූ) ආයුඃක්ෂය (මරණය) දැක, "සොඳුර, ඵුසතී දේවිය තිට වර දසයක් දෙමි. යමක් තිට කැමැත්තේ ද එය ගනුව"

69. යළි මෙසේ කියනු ලැබූ ඒ දේවී තොමෝ ශක්‍ර දෙවෙන්ද්‍රයාහට මේ වචනය කියූ. "කිමැ මා කළ අපරාධයෙක් ඇත් ද කිමැ ඔබ විසින් මම අප්‍රිය කරනු ලබම් ද ගසක් උදුරා දමන මහ පවනක් මෙන් සිත්කලු වූ මෙම දෙව්ලොවින් මා ච්‍යුත කරවුදැ"යි.

70. මෙසේ කියනු ලැබූ සක්දෙව්රජ ද යළි ඒ මෙහෙසියට මෙවදන් කී; තී විසින් පව් නොකරන ලද ම ය-තෝ මට අප්‍රිය නො ද වෙයි.

71. එත්තකං යෙව තෙ ආයු[1] චවනකාලො භවිස්සති
පටිග්ගණ්හ මයා දින්නෙ වරෙ දස වරුත්තමෙ.

72. සක්කෙන සා දින්නවරා තුට්ඨහට්ඨා පමොදිතා
මමං අබ්භන්තරං කත්වා ඵුසති දසවරෙ වරී.

73. තතො චුතා සා ඵුසති ඛත්තියෙ උපපජ්ජථ
ජෙතුත්තරම්හි නගරෙ සඤ්ජයෙන සමාගමි.

74. තදහං ඵුසතියා කුච්ඡිං ඔක්කන්තො පියමාතුයා
මම තෙජෙන මෙ මාතා සදා දානරතා අහු.

75. අධනෙ ආතුරෙ ජිණ්ණෙ යාචකෙ අද්ධිකෙ ජනෙ[2]
සමණෙ බ්‍රාහ්මණෙ[3] ඛීණෙ දෙති දානං අකිඤ්චනෙ.

76. දසමාසෙ ධාරයිත්වාන කරොන්තෙ[4] පුරපදක්ඛිණං
වෙස්සානං වීථියා මජ්ඣෙ ජනෙසි ඵුසතී මමං.

77. න මය්හං මත්තිකං[5] නාමං නපි පෙත්තිකසම්භවං
ජාතොම්හි වෙස්සවීථියා තස්මා වෙස්සන්තරො අහු.

78. යදාහං දාරකො හොමි ජාතියා අට්ඨවස්සිකො
තදා නිසජ්ජ පාසාදෙ දානං දාතුං විචින්තයිං.

79. හදයං දදෙය්‍යං චක්ඛුං මංසම්පි රුධිරම්පි ච
දදෙය්‍යං කායං සාවෙත්වා යදි කොචි යාචයෙ මමං.

80. සභාවං චින්තයන්තස්ස අකම්පිතමසණ්ඨිතං
අකම්පි තත්ථ පථවී සිනෙරුවනවටංසකා,

81. අන්වද්ධමාසෙ පණ්ණරසෙ පුණ්ණමාසෙ උපොසථෙ
පච්චයං නාගමාරුය්හ දානං දාතුං උපාගමිං.

1. ආයුං – කත්ථචි
2. පථිකෙ – කත්ථචි
3. සමණෙ බ්‍රාහ්මණෙ – කත්ථචි – ප
4. කරොන්තී – කත්ථචි
5. මෙත්තිකං නාමං – සීමු

71. තිගේ ආයුෂ මෙපමණෙක් ම ය– ච්‍යුතවන කාලය වන්නේ ය. මා දෙන ලද අතිශයින් උතුම් වූ දශවරය ගනුව.

72. සක්දෙව් රජු විසින් දෙන ලද වර ඇති ඒ ඵුසතී දෙවී තොමෝ තුටුපහටු වූවා ප්‍රමුදිත ව මා ඇතුළත් කොට දශවරය ඉල්ලූ ය.

73. ඒ ඵුසතී තොමෝ තව්තිසා දෙව ලොවින් ච්‍යුත ව අවුත් රාජවංශයෙහි ඉපිද ජෙතුත්තර රාජධානියෙහි සඤ්ජය නම් කුමාරයා සමඟ එක් වූ ය.

74. යම් කලෙක මම ප්‍රිය මාතෘ වූ ඵුසතී දෙවියගේ කුස තුළ පිළිසඳ ගතිම් ද, එකල මාගේ දනාධ්‍යාසබලයෙන් මාගේ මව දන් දීමෙහි හැම කල්හි ඇලුණී වුව.

75. ඕතොමෝ නිර්ධන වූ ආතුර වූ ජරායෙන් ජීර්ණ වූ යාචක වූ මාර්ගික වූ ජනයා විෂයෙහි ද මහණ බමුණන් විෂයෙහි ද ධනහීනයන් විෂයෙහි ද අයැති නැතියන් විෂයෙහි ද දන් දෙයි.

76. (සඤ්ජයරජු දෙවිය ගෙන) නුවර පැදකුණු කරන කල්හි ඵුසතී දේවී තොමෝ දසමසක් මුළුල්ලෙහි ධරා වෙළෙඳුන්ගේ වීථිමැද මා ප්‍රසව කළා.

77. මාගේ නම මවගෙන් ආයේ නො වෙයි. පියාගෙන් ආයේ ද නො වෙයි. මම වෛශ්‍යවීථියෙහි උපන්මි. එහෙයින් මම වෙස්සන්තර නම් වීමි.

78. යම් කලෙක මම උපතින් අටහැවිරිදි ළදරු වූයෙම් ද එකල්හි පහයෙහි හිඳගෙන දන් දෙන්නට සිතුවෙමි.

79. ඉදින් කිසිවෙක් මාගෙන් ඉල්ලා නම් හදවත ද ඇස ද ඇඟ-මස ද ලේ ද දෙන්නෙමි· දස්බව අස්වා ශරීරය ද දෙන්නෙමි.

80. නො සැලුණු නො හැකුළුණු යථාස්වභාව වූ දනාධ්‍යාසය සිතන කල්හි සිනේරුමහාවනයන් මුඳුන්මල් කොට ඇති පෘථිවි තොමෝ කම්පා වූ ය.

81. අඩමසක් පාසා දන්හලට යන්නෙම් මස පිරීමෙන් හා සඳපිරීමෙන් ද යුක්ත වූ පණුරසී පොහොයෙහි පච්චය නම් මඟුලැතු පිට නැඟී දන් දෙන්නට (දන්හල් කරා) එළඹියෙමි.

82. කාලිඞ්ගරට්ඨවිසයා බ්‍රාහ්මණා උපගඤ්ඡු මං
ආයාචුං මං හත්ථිනාගං ධඤ්ඤං මඞ්ගලසම්මතං.

83. අවුට්ඨිකො ජනපදො දුබ්භික්ඛො ඡාතකො මහා
දදාහි පවරං නාගං සබ්බසෙතං ගජුත්තමං.

84. දදාමි න වික්කම්පාමි යං මං යාචන්ති බ්‍රාහ්මණා
සන්තං නප්පතිගුහාමි[1] දානෙ මෙ රමතී[2] මනො.

85. න මෙ යාචකමනුප්පත්තෙ පටික්ඛෙපො අනුච්ඡවො
මා මෙ භිජ්ජි සමාදානං දස්සාමි විපුලං ගජං.

86. නාගං ගහෙත්වා සොණ්ඩාය භිඞ්කාරෙ[3] රතනාමයෙ
ජලං හත්ථෙ ආකිරිත්වා බ්‍රාහ්මණානං අදං ගජං.

87. පුනාපරං දදන්තස්ස සබ්බසෙතං ගජුත්තමං
තදාපි පථවී කම්පි සිනෙරුවනවටංසකා.

88. තස්ස නාගස්ස දානෙන සිවයො කුද්ධා සමාගතා
පබ්බාජෙසුං සකා රට්ඨා "වඞ්කං ගච්ඡතු පබ්බතං."

89. තෙසං නිච්ඡුභ[4] මානානං අකම්පිතමසණ්ඨිතං
මහාදානං පවත්තෙතුං එකං වරමයාචිසං[5].

90. යාචිතා සිවයො සබ්බෙ එකං වරමදංසු මෙ
සාවයිත්වා කණ්ණභෙරිං මහාදානං දදාමහං,

91. අථෙත්ථ වත්තතී සද්දො තුමුලො භෙරවො මහා
දානෙන මං[6] නීහරන්ති පුන දානං දදාතයං[7].

92. හත්ථිං[8] අස්සෙ රථෙ දත්වා දාසිදාසං ගවං ධනං
මහාදානං දදිත්වාන නගරා නික්ඛමිං තදා,

---

1. නප්පටිගුයාමි–සයා
2. රමතෙ–මජසං–ප
3. භිඞ්ගාරෙ–මජසං– සයා
4. නිච්ඡුභ – PTS
5. එකවර මයාචිහං – සයා
6. දානෙන–මජසං, සිමු
7. දදාමහං – සිමු
8. හත්ථිං – මජසං

82. කලිඟුරට නම් දෙසින් බමුණෝ අටදෙනෙක් මා කරා පැමිණියහ. ඔහු ධන්‍ය පුණ්‍ය ලක්ෂණ සම්පන්න වූ මඞ්ගල සම්මත වූ පච්චය නම් හස්තිරාජයා මාගෙන් ඉල්ලූහ.

83. (මහරජාණෙනි) කළිඟුජනපදය වැසි නැත්තේ ය. දුර්භික්ෂ වූයේ ය. මහත් සාදුක් ඇත්තේ ය. එහෙයින් සර්වාඞ්ගයෙන් ධවල වූ ඇතුන් කෙරෙහි ශ්‍රෙෂ්ඨ වූ උතුම් ඇත්රජු දෙනු මැනව.

84. බමුණෝ මාගෙන් යමක් ඉල්ලත් නම් එහි කම්පිත නො වෙමි. එය දෙමි. ඇති වස්තුව සඟවාගෙන නො සිටිමි, මා සිත දානයෙහි ඇලෙයි.

85. යාචක ජනයා මාවෙත පැමිණි කල්හි ප්‍රතික්ෂෙප කරලීම මට තරම් නො වෙයි. මාගේ දානපාරමිතා සමාදානය නො බිඳේවා, ගුණ විපුල වූ හස්තිරාජයා දෙන්නෙමැයි-

86. (සියලු හස්ත්‍යලඞ්කාරයෙන් සරසන ලද) හස්තිරාජයා සොඬින් ගෙන රුවන් කෙණ්ඩියෙහි වූ සුවඳජලය අතැ එව බමුණන්ට හස්තිරාජයා දුනිමි.

87. සර්‍වධවල වූ හස්තිරාජයා දෙන්නා වූ මට නැවත වරක් සිනේරුවනාවතංස කොට ඇති මහපොළොව කම්පිත විය.

88. ඒ මඟුලැත්රජු පරිත්‍යාග කිරීම හෙතුකොට ගෙන කොප වූ සිවි රටවැස්සෝ රැස්වූවාහු. (වෙස්සන්තරරජ) වඞ්කපර්වතයට යේවයි සිය රටින් (මා) නෙරපූහ.

89. ඒ සිවි රැටියන් විසින් මා නෙරපන කල්හි කම්පාවක් හැකිළීමක් නැති ව මහාදානය පවත්වනු පිණිස එක්වරයක් ඉල්ලීමි.

90. මවිසින් යාච්ඤා කරන ලද සියලු සිවිරටවාසීහු මට එක්වරයක් දුන්හ. එවිට මම කන්බෙරය (තම්මැට) සෝෂණය කරවා (සප්තශතක) මහාදානය දිනිමි.

91. ඉක්බිති මෙ දන්හලෙහි බිය එළවන මහත් ශබ්දයෙක් වෙයි. දන්දීම හෙතුවින් මා නෙරපත්. (එහෙත්) මම නැවතත් දන් දෙමියි.

92. එකල්හි ඇතුන් අසුන් ද රථයන් ද දාසිදාසුන් ද දෙනුන් ද (මුතු මැණික් ආදි) ධනය ද පරිත්‍යාග කොට මහදන් දී නුවරින් නික්ම ගියෙමි.

93. නික්ඛමිත්වාන නගරා නිවත්තිත්වා විලොකිතෙ
තදාපි පඨවී කම්පි සිනෙරුවනවටංසකා.

94. චතුවාහිං රථං දත්වා ඨත්වා චාතුම්මහාපථෙ[1]
එකාකියො අදුතියො මද්දිදෙවිං ඉදමබ්‍රවිං:

95. "ත්වං මද්දි කණ්හං ගණ්හාහි, ලහුකා එසා කනිට්ඨිකා[2]
අහං ජාලිං ගහෙස්සාමි ගරුකො භාතිකො හි සො.

96. පදුමං පුණ්ඩරීකං'ව මද්දිකණ්හාජිනග්ගහී
අහං සුවණ්ණබිම්බං'ව ජාලිං ඛත්තියමග්ගහිං,

97. අභිජාතා සුඛුමාලා ඛත්තියා චතුරො ජනා
විසමං සමං අක්කමන්තා වඞ්කං ගච්ඡාම පබ්බතං.

98. යෙ කෙචි මනුජා එන්ති[3] අනුමග්ගෙ පටිප්පථෙ
මග්ගං තෙ පටි පුච්ඡාම කුහිං වඞ්කන්තපබ්බතො[4]

99. තෙ තත්ථ අම්හෙ පස්සිත්වා කරුණං ගිරමුදීරයුං
දුක්ඛන්තෙ පටිවෙදෙන්ති දූරෙ වඞ්කන්තපබ්බතො.

100. යදි පස්සන්ති පවනෙ දාරකා ඵලිනෙ[5] දුමෙ
තෙසං ඵලානං හෙතුම්හි උපරොදන්ති දාරකා.

101. රොදන්තෙ දාරකෙ දිස්වා උබ්බිග්ගා[6] විපුලා දුමා
සයමෙවොනමිත්වාන උපගච්ඡන්ති දාරකෙ.

102. ඉදං අච්ඡරියං දිස්වා අබ්භුතං ලොමහංසනං
සාධුකාරං පවත්තෙසි මද්දී සබ්බඞ්ගසොභනා.

103. අච්ඡෙරං වත ලොකස්මිං අබ්භුතං ලොමහංසනං
වෙස්සන්තරස්ස තෙජෙන සයමෙවොනතා දුමා.

104. සඞ්ඛිපිංසු පථං යක්ඛා අනුකම්පාය දාරකෙ
නික්ඛන්තදිවසෙ යෙව[7] චෙතරට්ඨමුපාගමුං.

1. චතුමහා, චාතුමහා-කත්ථචි
2. කණිට්ඨිකා - සීමු
3. යන්ති PTS
4. වඞ්කන්ත - මජසං
5. ඵලිනෙ - මජසං
6. උබ්බිද්ධා - මජසං
උබ්බිග්ගා - ස්‍යා
7. දිවසෙනෙව මජසං, ස්‍යා

93. නුවරින් නික්ම පෙරළා බලත් ම එකල්හිදු සිනේරුවනොත්තංස කොට ඇති පෘථිවි තොමෝ කම්පිත වූ ය.

94. ආජානීය අසුන් සතර දෙනකුන් විසින් උසුලන රථය දන් දී හුදෙකලා ව දෙවැනි කෙනකුන් ද නැති ව සතරමං සන්ධියෙහි සිට මද්‍රීදේවියට මෙවදන් කීමි.

95. (සොඳුර) මද්‍රීදෙවිනි, තෙපි කෘෂ්ණජිනාවන් වඩා ගනුව. බාල වූ ඕ සැහැල්ලු ය, මම ජාලිය කුමරුවන් වඩාගනිමි. වැඩිමහලු සොහොයුරු හේ බර ය.

96. මද්‍රීදේවී තොමෝ කෘෂ්ණජිනා කුමරිය පෙහෙළ පියුමක් මෙන් වඩා ගත්තා ය. මම ජාලියකුමරු රන්රුවක් මෙන් වඩා ගත්තෙමි.

97. මෙසේ ජාතිසම්පන්න වූ සියුමැලි වූ රජදරු වූ අපි සතරදෙන විෂම වූ ද සම වූ ද (උස් පහත්) භූමි ප්‍රදෙශයන් ඉක්මවමින් වඞ්කගිරියට ගියම්හ.

98. යම් කිසි මිනිස් කෙනෙක් පසු මගැ හෝ පෙර මගැ හෝ එත් ද ඔවුන් අතින් වඞ්කගිරිය කොහි දැයි මාර්ගය විචාළම්හ.

99. ඒ මිනිස්සු එහි දී අප දැක දුක්පත් වැ බස් පැවසූහ. වඞ්කගිරිය (මෙහි සිට) ඉතා දුර ය යි ඔහු දුක පළ කළහ.

100. ඉදින් ඒ දරුවෝ දෙදෙන මහවෙනෙහි වූ ඵලහරිත මහරුක් දකිත් ද ඔහු ඵල හෙතුයෙන් හඬත්.

101. එසේ හඬන දරුවන් දැක සංවෙගයට පත් මහාවෘක්ෂයෝ තුමූ ම නැමී දරුවන්ට සමීප වෙත්.

102. සියලු අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගෙන් හොබනා වූ මද්‍රීදේවී තොමෝ අද්භූත වූ රොමොද්ගමනය වන්නා වූ මේ ආශ්චර්‍ය්‍යය දැක සාධුකාර පැවැත්වූ ය.

103. වෙසතුරු රජහුගේ පින්තෙදින් මහාවෘක්ෂයෝ තුමූ ම නැමීගියහ, මෙය ලොකයෙහි ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයැ, අද්භූතයැ, ද වේ. ලොමුදැහගන්වයි.

104. දරුවන් කෙරෙහි අනුකම්පාවෙන් දෙවියෝ මාර්ගය හකුළුවාලූහ. නික්මුණු දවස්හි ම සැහැරටට පැමිණියහ.

105. සට්ඨිරාජසහස්සානි තදාවසන්ති මාතුලෙ[1]
සබ්බෙ පඤ්ජලිකා හුත්වා රොදමානා උපාගමුං.

106. තත්ථ වත්තෙත්වා සල්ලාපං චෙතෙහි චෙතපුත්තෙහි
තෙ තතො නික්ඛමිත්වාන වඞ්කං අගමුං පබ්බතං.

107. ආමන්තයිත්වා දෙවින්දො විස්සකම්මං[2] මහිද්ධිකං
අස්සමං සුකතං රම්මං පණ්ණසාලං සුමාපය.

108. සක්කස්ස වචනං සුත්වා විස්සකම්මො මහිද්ධිකො
අස්සමං සුකතං රම්මං පණ්ණසාලං සුමාපයි",

109. අජ්ඣොගහෙත්වා පවනං අප්පසද්දං නිරාකුලං
චතුරො ජනා මයං තත්ථ වසාම පබ්බතන්තරෙ.

110. අහඤ්ච මද්දිදෙවී ච ජාලී කණ්හාජිනා චුභො
අඤ්ඤමඤ්ඤං සොකනුදා වසාම අස්සමෙ තදා.

111. දාරකෙ අනුරක්ඛන්තො අසුඤ්ඤො[3] හොමි අස්සමෙ
මද්දී ඵලං ආහරති[4] පොසෙති සා තයො ජනෙ.

112. පවනෙ වසමානස්ස අද්ධිකො මං උපාගමි
ආයාචි පුත්තකෙ මය්හං ජාලිං කණ්හාජිනඤ්චුභො.

113. යාචකං උපගතං දිස්වා හාසො මෙ උපපජ්ජථ
උභො පුත්තෙ ගහෙත්වාන අදාසිං බ්‍රාහ්මණෙ තදා.

114. සකෙ පුත්තෙ චජන්තස්ස ජූජකෙ[5] බ්‍රාහ්මණෙ යදා
තදාපි පථවී කම්පි සිනෙරුවනවටංසකා.

115. පුනදෙව සක්කො ඔරුය්හ හුත්වා බ්‍රාහ්මණසන්නිභො
ආයාචිමං මද්දිදෙවිං සීලවන්තිං[6] පතිබ්බතං

1. මාතුලා – සයා
2. විස්සුකම්ම – සයා
3. අසුඤ්ඤෙ – පු
4. ආහරිත්වා – මජසං
5. යාචකෙ – PTS
6. සීලවතිං – සයා

105. එකල මයිල් රජහු වෙත සැටදහසක් රජදරුවෝ වෙසෙත්. ඒ සියලු රජදරුවෝ දෙඅත් මුදුනෙහි තබා හඬමින් වෙස්සන්තර රජු කරා එළඹුණාහ.

106. ඒ රාජසමාගමයෙහි දී චේතරජුන් හා චේතකුමරුන් සමඟ පිළිසඳර කොට ඔහු එයින් නික්ම වඞ්කගිරියට ගියාහ.

107. එවිට සක්දෙවිරජ මහර්ද්ධි ඇති විශ්වකර්ම දිව්‍යපුත්‍රයා අමතා මනාසේ සකස් කළ අසපුවක් ද සිත්කලු වූ පන්සලක් ද මවාලව යි අණ කෙළේ යි.

108. මහර්ද්ධි ඇති විශ්වකර්ම තෙම සක්දෙව් රජහුගේ වචනය අසා මනාකොට සකස් කළ අසපුවක් ද සිත්කලු පන්සලක් ද මැවී.

109. නිශ්ශබ්ද වූ නිරාකුල වූ මහවනයට පිවිස අපි සතරදෙනමෝ එහි ගල් අතර වාස කළම්හ.

110. එකල ජාලිය කෘෂ්ණජිනා යන දෙදරුවන් ද මද්‍රීදේවිය ද මම ද ඔවුනොවුන් නිසා ශොකය දුරු කෙරෙමින් ඒ ආශ්‍රමයෙහි වාස කළම්හ.

111. මම අසපුයෙහි දෙදරුවන් රක්මින් එය නො සිස් කෙරෙමින් වෙසෙමි. මද්‍රීදේවි එලාඵල ගෙන එයි. ඕ තොමෝ අප තිදෙන පෝෂණය කෙරෙයි.

112. (මෙසේ) මහාවනයෙහි වාස කරන කල මගියෙක් මා වෙත එළඹියේ ය. හේ ජාලිය කෘෂ්ණජිනා යන මාගේ දරුවන් දෙදෙන ඉල්ලා සිටියේ ය.

113. පැමිණි යාචකයා දැක මට සොම්නස් උපන. එකල්හි දෙදරුවන් ගෙන බමුණට දුනිමි.

114. යම් කලෙක ජූජක බමුණුට තම පුතුන් දිනිම් ද එකල්හි මා දෙනුවහට මහාමේරුපර්වතවනයන් මුදුන් මල් කොට ඇති මහා ධරණී තොමෝ කම්පිත වූ ය.

115. නැවත ද ශක්‍රදෙවේන්ද්‍ර තෙමේ දෙව්ලොවින් බැස බමුණකු වැනි වෙස් ඇති ව සිල්වත් වූ පතිවත් දහමින් යුත් මද්‍රීදේවිය මාගෙන් ඉල්ලීය.

116. මද්දිං හත්ථෙ ගහෙත්වාන උදකඤ්ජලි පූරිය[1]
පසන්නමනසඞ්කප්පො තස්ස මද්දිමදාසහං.

117. මද්දියා දීයමානාය ගගනෙ දෙවා පමොදිතා
තදාපි පථවී කම්පි සිනෙරුවනවටංසකා.

118. ජාලිං කණ්හාජිනං ධීතං මද්දිදෙවිං පතිබ්බතං
චජමානො න චින්තෙසිං බොධියායෙව කාරණා.

119. න මෙ දෙස්සා උභො පුත්තා මද්දි දෙවි න දෙස්සියා
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා පියෙ අදාසහං

120. පුනාපරං බ්‍රහාරඤ්ඤෙ මාතාපිතුසමාගමෙ
කරුණං පරිදෙවන්තෙ' සල්ලපන්තෙ සුඛං දුඛ.[2]

121. හිරොත්තප්පෙන ගරුනා[3] උභින්නං උපසඞ්කමිං
තදාපි පථවී කම්පි සිනෙරුවනවටංසකා.

122. පුනාපරං බ්‍රහාරඤ්ඤා නික්ඛමිත්වා සඤ්ඤාතිභි
පවිසාමි[4] පුරං රම්මං ජෙතුත්තර[5] පුරුත්තමං.

123. රතනානි සත්ත වස්සිංසු මහාමෙඝො පවස්සථ
තදාපි පථවී කම්පි සිනෙරුවනවටංසකා.

124. අචෙතනා'යං පථවී අවිඤ්ඤාය සුඛං දුඛං
සාපි දානබලා මය්හං සත්තක්ඛත්තුං පකම්පථාති.

වෙස්සන්තරචරියං නවමං.

1. උදකඤ්ජලිං පූරය – කම්බො
2. දුක්ඛං – PTS සීමු සයා
3. ගරුනං – සයා
4. පවිස්සාමි – සයා
5. ජෙතුත්තරං – සීමු PTS

116. මද්‍රිදේවිය අත්හි ගෙන දියෙන් (බමුණුගේ) ඇදිළි පූරවා ප්‍රසන්න වූ චිත්ත සංකල්පනා ඇති ව ඔහුට මද්‍රීදේවිය මම දුනිමි.

117. මද්‍රිදේවිය දෙනු ලබන කල්හි ගුවන් තෙලෙහි සිටි දෙවියෝ ද සතුටු වූහ. එකල්හි ද මහාමේරුපර්වතවනගහන මුදුන්මල් කොට ඇති මහා මෙදිනී තොමෝ කම්පිත වූය.

118. ජාලිය පුත්‍රයා ද කෘෂ්ණජිනා පුත්‍රිකාව ද මද්‍රීදේවිය ද පරිත්‍යාග කරන්නා වූ මම සර්වඥතාප්‍රතිලාභය ම කාරණ කොට තැවුල් වශයෙන් නො සිතුයෙමි,

119. පුත්‍රයෝ දෙදෙන මට අප්‍රිය නො වෙත්. මද්‍රීදේවිය ද අප්‍රිය නො වේ. සර්වඥතා ඥානය මට ප්‍රියවෙයි. එහෙයින් ප්‍රිය වූ අඹුදරුවන් දුන්මි.

120. නැවත ද මහාවනයෙහි දී මවුපියන්ගේ සමාගමයෙහි දුක්පත් වැ හඬන කල්හි, සුඛදුඃඛ සල්ලාප කරන කල්හි.

121. බලවත් හිරිඔතප් දෙකින් යුක්ත ව මවුපියන් කරා එළැඹියෙමි. එකල්හි ද මහාමේරුපර්වතවනගහන ශෙඛර කොට ඇති වසුධාඞ්ගනා තොමෝ කම්පා වූ ය.

122. යළි ස්වකීය වූ ඥතීන් හා සමඟ මහාවනයෙන් නික්ම නගර ශ්‍රෙෂ්ඨ වූ උතුම් ජයතුරා නුවරට පිවිසියෙමි.

123. එකල්හි ද සත්රුවන් වැසි වට. මහමේ වට, මහාමේරු පර්වත වන ගහන මෞලි කොට ඇති වසුධාඞ්ගනා තොමෝ කම්පා වූ ය.

124. චෙතනා රහිත සුවදුක් නොදත් මේ මහාපෘථිවි තොමෝ මාගේ දනබලයෙන් සත්වරක් කම්පා වූ ය.

**නවවන වෙස්සන්තර චරියා යි.**

## 10. සසපණ්ඩිත චරියං

125. පුනාපරං යදා හොමි සසකො පවනචාරිකො[1]
තිණපණ්ණසාකඵලභක්ඛො පරහෙඨනවිවජ්ජිතො.

126. මක්කටො ච සිගාලො ච[2] උද්දපොතො චහං තදා
වසාම එකසාමන්තා සායං පාතො පදිස්සරෙ[3].

127. අහං තෙ අනුසාසාමි කිරියෙ කල්‍යාණපාපකෙ
පාපානි පරිවජ්ජෙථ කල්‍යාණෙ අභිනිවිස්සථ.

128. උපොසථම්හි දිවසෙ චන්දං දිස්වා න පූරිතං
එතෙසං තත්ථ ආචික්ඛිං[4] දිවසො අජ්ජුපොසථො.

129. දානානි පටියාදෙථ දක්ඛිණෙය්‍යස්ස දාතවෙ
දත්වා දානං දක්ඛිණෙය්‍යෙ උපවස්සථුපොසථන්ති.

130. තෙ[5] මෙ සාධූති වත්වාන යථාසත්ති යථාබලං
දානානි පටියාදෙත්වා දක්ඛිණෙය්‍යං ගවෙසිසුං[6].

131. අහං නිසජ්ජ චින්තෙසිං දානං දක්ඛිණානුච්ඡවං
යදිහං ලභෙ දක්ඛිණෙය්‍යං කිං මෙ දානං භවිස්සති.

132. න මෙ අත්ථි තිලා මුග්ගා මාසා වා තණ්ඩුලා ඝතං
අහං තිණෙන යාපෙමි නසක්කා තිණං දාතවෙ.

133. යදි කොචි එති[7] දක්ඛිණෙය්‍යො භික්ඛාය මම සන්තිකෙ
දජ්ජාහං සකමත්තානං න සො තුච්ඡො ගමිස්සති.

134. මම සඞ්කප්පමඤ්ඤාය සක්කො බ්‍රාහ්මණවණ්ණිනා[8]
ආසයං මෙ උපාගච්ඡි දානං වීමංසනාය මෙ.

135. තමහං දිස්වාන සන්තුට්ඨො ඉදං වචනමබ්‍රවිං
සාධු ඛොසි අනුප්පත්තො ඝාස හෙතු මමන්තිකෙ.

---

1. චාරකො – මජසං
2. සිඞ්ගාලො – මජසං
3. පාතොවාදිස්සරෙ – සීමු
4. ආචික්ඛි – මජසං සීමු
5. තංමෙ – මජසං.
6. ගවෙසියුං – සීමු. ගවෙසෙය්‍යුං – මජසං.
7. යදි එති – PTS
8. වණ්ණිනො – සීමු.

## 10. සසපණ්ඩිත චරියාව

125. නැවත අනෙකුදු චරියාවක් කියමි. යම් කලෙක මම් තණපත් පළා පලවැළ බුදින, මහවෙනෙහි හැසිරෙන අහිංසක වූ සා වැ උපනිම් ද,

126. එකල්හි වඳුරෙක සිවලෙක මස්කාවෙක මම යැ යන අපි නුදුරු පෙදෙසෙකැ වුසූම්හ. උදය සවස එක්තැන් වැ දක්නා ලැබෙම්හ.

127. මම් ඔවුනට "පවින් දුරුවවු, කුසල් දහම්හි යෙදී පවතුව" යයි කුශලාකුශලකර්මයෙහි අනුශාසනා කෙරෙමි.

128 – 129. පොහෝදවස්හි (පුරතුදුස්වක්රය මඳක්) නුපුන්සඳ දැක ඔවුනට එහිදී 'අද පොහෝ දිනය වෙයි. දක්ෂිණාර්හ කෙනකුන්ට දෙන්නට දන් පිළියෙළ කරවු. දක්ෂිණාර්හ කෙනකුන් කෙරෙහි දනක් දී පෙහෙවස් වසවු' යයි කී යමි.

130. ඔහු මට 'මැනැවැ' යි කියා ශක්ති පරිදි බල පරිදි දන් පිළියෙළ කොට දක්ෂිණාර්හයකු සෙවූහ.

131. මම් හිඳගෙන දක්ෂිණාවට හෝ දක්ෂිණාර්හයනට හෝ නිසි දෙයධර්මයක් සිතිමි. 'ඉදින් මම් දක්ෂිණාර්හ කෙනකුන් ලබම් නම් දියයුතු කවර වස්තුවක් මට ඇද්දැ'යි.

132. තල මුං මෑ සහල් ගිතෙල් හෝ මට නැත. මම් තණපතින් යැපෙමි. තණපත් (දක්ෂිණාර්හයනට දෙන්නට) නො හැක්ක.

133. ඉදින් පිඩු පිණිස මා වෙතට කිසිවෙක් ආ නම් මම ඔහුට සිය සිරුර දෙන්නෙමි. (එකල්හි) හෙතෙම නො සිස් වැ යන්නේ යි.

134. මා ගේ ඒ අදහස දැන සක්දෙව් රජ බමුණුවෙස් ගත් අත් බැවින් මාගේ දානාධ්‍යාශය විමසන පිණිස මා වසන වන ළැහැබ කරා එළඹියේ ය.

135. බමුණුවෙස් ගත් ඔහු දැක සතුටු වූයෙම් 'ආහාර හෙතුයෙන් මා සමීපයට ආයෙහි මැනවැ' යන මෙවදන් කීයෙමි.

136. අදින්නපුබ්බං[1] දානවරං අජ්ජ දස්සාමි තෙ අහං
තුවං සීලගුණූපෙතො අයුත්තතෙත පරහෙඨනං.

137. එහි අග්ගිං පදීපෙහි නානා කට්ඨෙ සමානිය
අහං පචිස්සමත්තානං පක්කං ත්වං භක්ඛයිස්සසි

138. සාධූති සො හට්ඨමනො නානා කට්ඨෙ සමානයි
මහන්තං අකාසි චිතකං කත්වා නඞ්ගාර්[2] ගබ්භකං

139. අග්ගිං තත්ථ පදීපෙසි යථාසො ඛිප්පං මහා භවෙ
ඵොටෙත්වා රජගතෙ ගත්තෙ එකමන්තං උපාවිසිං

140. යද මහා කට්ඨපුඤ්ජො ආදිත්තො‘ ධම ධමායති[3]
තදුප්පතිත්වා පපතිං[4] මජ්ඣෙ ජාලසිඛන්තරෙ

141. යථා සීතොදකං නාම පවිට්ඨං යස්ස කස්සචි
සමෙති දරථපරිළාහං අස්සාදං දෙති පීති ච[5]

142. තථෙව ජලිතං අග්ගිං පවිට්ඨස්ස මමං[6] තදා
සබ්බං සමෙති දරථං යථා සීතොදකං විය

143. ඡවි චම්මං මංසංනහරුං[7] අට්ඨිං හදය බන්ධනං
කෙවලං සකලං කායං බ්‍රාහ්මණස්ස අදාසහන්ති

සසපණ්ඩිත චරියං දසමං.

අකිත්ති බ්‍රාහ්මණො සඞ්ඛො කුරුරාජා ධනඤ්ජයො
මහා සුදස්සනො රාජා මහාගොවින්ද බ්‍රාහ්මණො

නිමි චන්ද කුමාරො ච සිවි වෙස්සන්තරො සසො
අහමෙව තදා ආසිං යො තෙ දානවරෙ අදා.

එතෙ දානපරික්ඛාරා එතෙ දානස්ස පාරමී
ජීවිතං[8] යාචකෙ දත්වා ඉමං පාරමී[9] පූරයිං

භික්ඛායුපගතං දිස්වා සකත්තානං පරිච්චජිං
දානෙන මෙ සමො නත්ථි එසා මෙ දානපාරමීති

දානපාරමිතා නිට්ඨිතා.

1. පුබ්බ – මජ්සං·
2. අඞ්ගාර – මජ්සං
3. ධූම ධූමායති – සී.මු. ධූමමායති – මජ්සං
4. පසති – සිං. මජ්සං
5. පීතිඤ්ච – මජ්සං
6. මම – මජ්සං
7. නහාරු – මජ්සං.
8. ජීවිත–මජ්ඣසං
9. පාරමිං–යජ්සං

136. මම අද තොපට නුදුන්විරූ දනක් දෙමි. තෙපි ශීලගුණයෙන් යුක්ත වූවහු යැ (එහෙයින්) තොප විසින් මෙරමා පෙළනු නො නිසි වෙයි.

137. මෙහි එව. නොයෙක් දර රැස් කොට ගිනි දල්වව. (එහි පැන) මම මාගේ සිරුර පලහන්නෙමි. පැසුණු එය තෙපි බුදින්නවු යැ.

138. සක්දෙව්රජ 'යෙහෙකැ' යි සතුටුසිත් ඇතියේ නොයෙක් දර රැස් කළේ යැ. අඟුරු ගැබ් කොට මහත් වූ සෑයක් කෙළේ ය.

139. එහි ඒ ගිනිකඳ යම්සේ වහා මහත් වන්නේ ද එපරිද්දෙන් දල්වී යැ (මෙ) ධූලි වැකුණු මා ගේ ගාත්‍රයන් (තෙවරක්) සලාපියා එකත්පස් වැ හුනිමි.

140. යම් කලෙකැ ඒ මහත් වූ දරරැස හාත්පසින් ඇවිළගත්තේ 'ධම ධම' යන අනුකරණ කෙරේ ද එකල්හි දල්සිළු අතුරෙහි වූ (අඟුරුරැස) මැද පැන වැටිණිමි.

141. යම්සේ ගිම්කලැ සිහිල්දිය නම් යම් කිසිවක්හු විසින් පිවිසියේ (ඔහුගේ) පීඩා පරිදහ සන්සිඳුවා ද අස්වැසිලි හා ප්‍රීතිය හා උපදවා ද–

142. එසේ මැ එකල්හි දල්වුණු ගින්නට පිවිසි මාගේ සියලු ශරීරපීඩා සිහිල්දිය සෙයින් සන්සිඳුවයි.

143. සිවි යැ සම් යැ මස්පිඬු යැ නහර යැ ඇට යැ හදමස් යැ යන මේ ඇති හුදු සියලු සිරුර (සක්දෙව්) බමුණුට මම දිනිමි'යි.

**දස වැනි සසපණ්ඩිත චරියා යි.**

**උද්දනය:**

යම් කලෙකැ යමෙක් අකිත්ති බ්‍රාහ්මණ වැ සඞ්ඛ බ්‍රාහ්මණ වැ කුරුරජ වැ ධනඤ්ජය රජ වැ මහාසුදර්ශන රජ වැ මහාගොවින්ද බමුණු වැ නිමි රජ වැ චන්ද්‍රකුමාර වැ සිවිරජ වැ වෙස්සන්තර රජ වැ ශශපණ්ඩිත වැ ඉපැද ඒ උතුම් දනයන් දුන්නේ නම් එකල්හි ඒ මම මැ වීමි.

තෙල පරිත්‍යාගයෝ (මා ගේ) දනපරිෂ්කාරයෝ වෙති. තුලුහු දනපාරමිතා වෙති. (මාගේ) ජීවිතය යදියනට දී මේ දන පාරමිතාව පිරීමි.

භික්ෂා පිණිස පැමිණි යාචකයා දක තම සිරුර පරිත්‍යාග කෙළෙමි. දීමෙන් මා හා සමයෙක් නැති. මේ මාගේ දනපරමාත්ථ පාරමිතාව යි.

**පළමු වැනි අකිත්තිවර්ගය යි.**

**දනපාරමිතා නිමි.**

# 2. සීලපාරමිතා

## 1. මාතුපොසක චරියං

144. යදා අහොසි[1] පවනෙ කුඤ්ජරො මාතුපොසකො
න තදා අත්ථි මහියා ගුණෙන මම සාදිසො.

145. පවනෙ දිස්වා වනචරො රඤ්ඤො මං පටිවෙදයි
තවානුච්ඡවො මහාරාජ ගජො වසති කානනෙ.

146. න තස්ස පරිඛාය'ත්ථො[2] නපි ආළකකාසුයා[3]
සමං ගහිතෙ සොණ්ඩාය සයමෙව ඉධෙහිති[4].

147. තස්ස තං වචනං සුත්වා රාජාපි තුට්ඨමානසො
පෙසෙසි හත්ථිදමකං ඡෙකාචරියං සුසික්ඛිතං.

148. ගන්ත්වාන[5] සො හත්ථිදමකො අද්දස පදුමස්සරෙ
භිසමුළාලං උද්ධරන්තං යාපනත්ථාය මාතුයා.

149. විඤ්ඤාය මෙ සීලගුණං ලක්ඛණං උපධාරයි
එහි පුත්තාති පත්වාන මම සොණ්ඩාය අග්ගහි.

150. යම්මෙ තදා පාකතිකං සරීරානුගතං බලං
අජ්ජ නාගසහස්සානං බලෙන සමසාදිසං.

151. යදිහං තෙසං පකුප්පෙය්‍යං උපෙතානං[6] ගහනාය මං
පටිබලො භවෙ තෙසං යාව රජ්ජම්පි මානුසං

152. අපි චාහං සීල[7] රක්ඛාය සීලපාරමි පූරියා[8]
න කරොමි චිත්තෙ අඤ්ඤථත්තං පක්ඛිපන්තං මමාළකෙ

153. යදි තෙ මං තත්ථ කොට්ටෙය්‍යුං ඵරසූහි තොමරෙහි ච
නෙව තෙසං පකුප්පෙය්‍යං සීලඛණ්ඩභයා මමාති

මාතුපොසකචරියං පඨමං[9].

---

1. අහොසිං–මජසං
2. පරික්ඛා–මජසං
3. නපියාළ්හක–සීමු
නපිළාලක–PTS–නපිආළක–මජසං
4. ඉතෙයෙහිති–මජසං
5. ගන්ත්වා–සීමු.
6. උපෙතං–කත්ථචි
7. සීලංරක්ඛාය–සීමු
8. පූරියා–නා–මජසං,
පූරයිං–සිං
9. සීලවනාගචරියං පඨමං–සිං

# 2. ශීල පාරමිතාව

## 1. මාතුපොසක චරියාව

144. යම් කලෙකැ මම් මහවෙනෙහි මාතුපොසක වූ හස්තිරාජ වීම් ද එකලැ පොළෝතෙලෙහි සිල්ගුණයෙන් මා හා සම වූ කිසිවෙක් නැති.

145. මහාවනයෙහි දී වනචරපුරුෂයෙක් මා දැක රජුට මෙසේ සැල කෙළේ යැ. 'මහරජ තොපට නිසි ඇත්රජෙක් මහවෙනෙහි වෙසේ යැ'යි.

146. 'ඔහු ගැනීමෙහි ලා අගලින් අර්ථයෙක් නැත. ඇතුන් බඳනා වැඹිනුදු බොරුවළිනුදු ප්‍රයෝජන නො ද ඇති. සොඬින් ගත්කල්හි තෙමේ මැ මෙහි එන්නේ යැ'යි රජුට දූන්වී.

147. ඔහු ගේ එබස් අසා තුටුසිත් ඇති රජ තෙමේ ද ඇතුන් දමනය කරන මොනවට හික්මුණු නිපුණ ඇදුරකු යැවී යැ.

148. එ ඇත්ඇදුරු ද (එහි) ගොස් මවගේ යාපනය පිණිස පියුම්-විල්හි නෙළුඹල හා නෙළුඹුදලි උදුරන ඇත්රජු දිටී.

149. හෙතෙම මා ගේ ශීලගුණය දැන සිරුරුලකුණු විමසී යැ. ඉක්බිති 'එව පුතැ'යි කියා මා ගේ සොඬ ගත්තේ යැ.

150. එකල්හි මට යම් පියවිසිරුරුබලයෙක් වී ද, ඒ අද ඇතුන් දහසක්හුගේ බලය හා සුදුසු වෙයි.

151. ඉදින් මා ගැනීම වෙතට පැමිණි ඔවුනට මම් කිපියෙම් නම් ඔවුන්ගේ මානුෂරාජ්‍යය පවා වැනැසීමට පොහොසත් වීමි.

152. එතෙකුදුවත් මම් (තමා කෙරෙහි වූ) සිල් රක්නා පිණිස ශීලපාරමිතාව පුරනු පිණිස, මා වැඹෙහි බැද තබන්නහු දැක ද සිත්හි වෙනසක් නො කෙළෙමි.

153. ඉදින් එහි දී ඔහු පොරොවින් ද තෝමරයෙන් ද මා කොටන්නාහු නම් මා ගේ සිල් බිඳුනා බියෙන් ඔවුනට නො මැ කිපෙන්නෙමි.

**පළමු වැනි මාතුපොසක චරියා යි.**

## 2. භූරිදත්ත චරියං

154. පුනාපරං යදා හොමි භූරිදත්තො මහිද්ධිකො
විරූපක්ඛෙන මහාරඤ්ඤා දෙවලොකමගච්ඡහං.

155. තත්ථ පස්සිත්වාහං දෙවෙ එකන්තං සුඛ සමප්පිතෙ
තං සග්ගං ගමනත්ථාය සීලබ්බතං සමාදියිං.

156. සරීරකිච්චං කත්වාන භුත්වා යාපනමත්තකං
චතුරො අඞ්ගෙ අධිට්ඨාය සෙමි වම්මික මුද්ධනි.

157. ඡවියා චම්මෙන මංසෙන නහාරුඅට්ඨිකෙහි වා
යස්ස එතෙන කරණීයං දින්නං එව හරාතු[1] සො.

158. සංසිතො අකතඤ්ඤුනා ආලම්බනො[2] මමග්ගහි
පෙළාය පක්ඛිපිත්වාන[3] කීළෙති මං තහිං තහිං.

159. පෙළාය පක්ඛිපන්තෙපි සම්මද්දන්තෙපි පාණිනා
ආලම්බනෙ[4] න කුප්පාමි සීලඛණ්ඩභයා මම.

160. සකජීවිත පරිච්චාගො තිණතො ලහුකො මම
සීලවීතික්කමො මය්හං පඨවිඋප්පතනං[5] විය.

161. නිරන්තරං ජාතිසතං චජෙය්‍යං මම ජීවිතං
නෙව සීලං පභින්දෙය්‍යං චතුදීපානහෙතුපි.

162. අපි චාහං සීල[6] රක්ඛාය සීලපාරමිපූරියා
න කරොමි චිත්තෙ අඤ්ඤථත්තං පක්ඛිපන්තම්පි පෙළකෙ.

භූරිදත්ත චරියං දුතියං.

---

1. හරතු-සීමු
2. ආලම්පායනො-මජසං
ආලම්පනො-PTS
3. පක්ඛිපෙත්වාන-මජසං
4. ආලම්පනෙ-මජසං
5. උප්පතනා-සිං-උප්පත්තනා-මජසං
6. සීලං රක්ඛාය-සී.මු

## 2. භූරිදත්ත චරියාව

154. නැවත අනෙක් චරියාවක් කියමි: යම් කලෙක මම මහත් සෘද්ධි ඇති භූරිදත්ත නම් නාගරාජ වැ උපනිම් ද එකල්හි (මම) විරූපාක්ෂ නම් මහරජු හා සමග (තව්තිසා) දෙව්ලොවට ගියෙමි.

155. එහි දී අත්‍යන්තසුඛයෙන් සමර්පිත වූ දෙවියන් දැක දෙව්ලොවට යනු පිණිස ශීල සඞ්ඛ්‍යාත වූ ව්‍රතචර්‍ය්‍යාව සමාදන් වීමි.

156. (මුවදෙවුම් ආදී) සිරුරුකිස කොට යැපෙන පමණ අහරක් වළඳා සතර අඟක් ඉටාගෙන තුඹසක් මතුයෙහි ශයනය කෙළෙමි.

157. (එ සතර අඟ නම්:) 'යමක්හට සිවියෙන් සමින් මසින් නහරින් හා ඇටයෙන් වේවයි මෙයින් කටයුත්තෙක් ඇත්නම් ඒ දෙන ලද මැ යි හෙතෙම එය ගෙන යේව'යි.

158. අකෘතඥ වූ නෙසාදයා (වැද්ද) විසින් ලකුණු කියනලද ආලම්බන තෙමේ මා අල්වා ගත්තේ ය. හෙතෙම මා පැසෙක්හි බහා ඒ ඒ තැන කෙළවයි.

159. පැසෙහි බහාලන කල ද අතින් මඩනා කල ද 'මාගේ ශීලය බිඳෙයි' යන බියෙන් ආලම්බනයා කෙරෙහි නො කිපී ගියෙමි.

160. සවකීය ජීවිතපරිත්‍යාගය තෘණශලාකාවක් පරිත්‍යාගයට ද වඩා ලඝු කොට මට වැටහෙයි. ශීල ව්‍යතික්‍රමය වූ කලී පොළොව පෙරළීමක් මෙන් මට වැටහීගියේ යැ.

161. නිරතුරු ජාතිසියයක් මුළුල්ලෙහි මා ගේ ජීවිතය පරිත්‍යාග කරනෙමි. සතර දිවයින හෙයිනුදු සිල් නො මැ බිඳිනෙමි.

162. තවද සිල් රක්නා පිණිස සිල් පැරුම් පුරනු පිණිස හැනහැන මා පෙළායෙහි බහාලන ආලම්බනයා කෙරෙහි ද මා සිත තුළ වෙනසක් නො කෙළෙමි.

දෙ වැනි භූරිදත්තචරියා යි.

## 3. චම්පෙය්‍යනාග චරියං

167. පුනාපරං යදා හොමි චම්පෙය්‍යකො මහිද්ධිකො
තදාපි ධම්මිකො ආසිං[1] සීලබ්බතසමප්පිතො.

168. තදාපි මං ධම්මචාරිං උපවුත්ථං උපොසථං
අහිතුණ්ඩිකො[2] ගහෙත්වාන රාජද්වාරම්හි කීළති.

169. යං[3] සො වණ්ණං චින්තයති නීලං පීතඤ්ච[4] ලොහිතං
තස්ස චිත්තානුවත්තන්තො හොමි චින්තිත සන්නිභො.

170. ථලං කරෙය්‍යං[5] උදකං උදකම්පි ථලං කරෙ
යදිහං තස්ස පකුප්පෙය්‍යං ඛණෙන ඡාරිකං කරෙ.

171. යදි චිත්තවසී හෙස්සං පරිහායිස්සාමි සීලතො
සීලෙන පරිහීණස්ස උත්තමත්ථො න සිජ්ඣති.

172. කාමං භිජ්ජතු යං කායො ඉධෙව විකිරීයතු
නෙව සීලං පභින්දෙය්‍යං විකිරන්තෙ භුසං වියාති.

චම්පෙය්‍ය නාගචරියං තතියං.

## 4. චූලබොධි චරියං

173. පුනාපරං යදා හොමි චූලබොධි[6] සුසීලවා
භවං දිස්වාන භයතො නෙක්ඛම්මං අභිනික්ඛමිං.[7]

174. යාමෙ දුතියිකා ආසි බ්‍රාහ්මණී කනකසන්නිභා
සාපි වට්ටෙ අනපෙක්ඛා නෙක්ඛම්මං අභිනික්ඛමි.

175. නිරාලයා ඡින්නබන්ධූ අනපෙක්ඛා කුලෙ ගණෙ
චරන්තා ගාමනිගමං බාරාණසිමුපාගමුං.

176. තත්ථ වසාම නිපකා අසංසට්ඨා කුලෙ ගණෙ
නිරාකුලෙ අප්පසද්දෙ රාජුය්‍යානෙ වසාමුභො.

---

1. ආසි–සිං–PTS
2. අහිගුණ්ඩිකො සිං
3. යං යං –මජසං
4. නීලපීතංච–PTS–නීලංච පීතං මජසං
නීලඤ්ච පීතංලොහිත–සී.මු.
5. කරෙය්‍ය මුදකං—මජසං
6. චූළ–මජසං
7. අභිනික්ඛමි–සීමු

## 3. චම්පෙය්‍යනාග චරියාව

167. තවද අනෙක් චරියාවක් කියමි: යම් කලෙක මම මහත් සෘද්ධි ඇති චම්පෙය්‍ය නම් දිව්‍යනාගරාජ වැ උපනිම් ද එකල්හිදු ශීලව්‍රත සමාදානයෙන් යුක්ත වූ ධාර්මිකයෙම් වීමි.

168. එකල්හි දු ධාර්මික වැ පෙහෙවස් සමාදන් වැ සිටි මා අහිතුණ්ඩිකයෙක් අල්ලාගෙන රජගෙදෙර ක්‍රීඩා කරවයි.

169. එ අහිතුණ්ඩික තෙමේ නිල්වන් හෝ රන්වන් හෝ ලේවන් හෝ යම් පැහැයක් සිතා ද, ඔහු ගේ සිතට අනුව පවත්නෙමි. සිතූ ආකාර ඇත්තෙම් වෙමි.

170. මම් පොළොව ජලය කෙරෙමි: ජලය ද පොළොව කෙරෙමි. ඉදින් ඔහුට කිපුණෙම් නම් ඇසිල්ලෙකින් ඔහු හළු කොට පියමි.

171. ඉදින් මම් සිතට වසඟ වීම් නම් ශීලයෙන් පිරිහී යන්නෙමි. ශීලයෙන් පිරිහුණහට උත්තමාර්ථය සිද්ධ නො වේ.

172. මේ ශරීරය එකාන්තයෙන් බිඳීයේවා! මෙහි මැ විසිරයේවා! බොල්මිටක් සෙයින් මාගේ සිරුර විසිර යන කල්හි දු ශීලය නො බිඳින්නෙමි.

**තුන් වැනි චම්පෙය්‍යනාග චරියා යි.**

## 4. චූළබොධි චරියාව

173. තවද අනෙක් චරියාවක් කියමි: යම් කලෙක මම් ශීලසම්පන්න වූ චුල්ලබොධි නම් පරිව්‍රාජක වීම් ද, එකලැ සියලු භවය භය වශයෙන් දැක නෛෂ්ක්‍රම්‍යය තත්ප්‍රතිපක්ෂ හෙයින් දැක පැවිදි වීමි.

174. මට රන් බඳු සිවිපැහැ ඇති යම් බමුණු බිරිඳක් වූ නම් ඕ තොමෝ ද සසරෙහි අපෙක්ෂා රහිත වැ අභිනිෂ්ක්‍රමණ කළා යැ.

175. ඇපි නිරාලය වැ සිඳුනාලද තෘෂ්ණාබන්ධන ඇති වැ කුලයෙහි ගණයෙහි අපෙක්ෂා නැති වැ ගම්නියම්ගම්හි හැසිරෙමින් බරණැස කරා පැමිණියම්හ.

176. එහි නුවණැති ඇපි දෙදෙන කුලයෙහි ගණයෙහි නො ඇලුණමෝ (ජනසඤ්චාර රහිත බැවින්) නිරාකුල වූ නිශ්ශබ්ද වූ රාජොද්‍යානයෙහි වුසුම්හ.

177. උය්‍යානං දස්සනං ගන්ත්වා රාජා අද්දස බ්‍රාහ්මණිං
උපගම්ම මමං පුච්ඡි තුය්හෙසා කස්ස භාරියා[1].

178. එවං වුත්තෙ අහං තස්ස ඉදං වචනමබ්‍රවිං
න මය්හං භරියා එසා සහධම්මා[2] එකසාසනී

179. තස්සා[3] සාරත්තාධිගතො[4] ගාහාපෙත්වාන චෙටකෙ[5]
නිප්පීළයන්තො බලසා අන්තෙපුරං පවෙසයි.

180. ඔදපත්තකියා[6] මය්හං සහජා එකසාසනී
ආකඩ්ඪිත්වා නයන්තියා[7] කොපො මෙ උපපජ්ජථ

181. සහ කොපෙ සමුප්පන්නෙ සීලබ්බතමනුස්සරිං
තත්ථෙව කොපං නිග්ගණ්හිං නාදාසිං වඩ්ඪිතූපරි[8]

182. යදිහං[9] බ්‍රාහ්මණිං කොචි කොට්ටෙය්‍ය තිණ්හසත්තියා
නෙව සීලං පභින්දෙය්‍යං බොධියායෙව කාරණා

183. නමෙ සා බ්‍රාහ්මණී දෙස්සා නපි මෙ බලං න විජ්ජති
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා සීලානුරක්ඛිසන්ති

චූළබොධිචරියං චතුත්ථං.

## 5. මහිසරාජ චරියං

184. පුනාපරං යදා හොමි මහිසො[10] පවනචාරිකො[11]
පවඩ්ඪකායො බලවා මහන්තො භීමදස්සනො.

185. පබ්භාරෙ ගිරිදුග්ගෙ ච රුක්ඛමූලෙ දකාසයෙ
හොතෙත්ථ ඨානං මහිසානං[12] කොචි කොචි තහිං තහිං

186. විචරන්තො බ්‍රහාරඤ්ඤෙ ඨානං අද්දස භද්දකං
තං ඨානං උපගන්ත්වාන තිට්ඨාමි ච සයාමි ච.

1. භාරියාති–මජසං,
2. සහජා–මජසං
3. තිස්සා–මජසං
4. සාරත්තගධිතො–සිමු
5. චෙතකෙ–මජසං
6. ඔදපත්තිකියා–PTS
7. නීයන්තියා–PTS
8. වඩ්ඪිතුප්පරි–මජසං
වුඩ්ඪිතුපරි–PTS
9. යදිදං–මජසං
10. මහිංසො–මජසං
11. චාරකො–සිං
12. මහිංසානං–මජසං

177. බරණැස්රජ උයන දක්මට ගොස් බැමිණිය දිටී. (හේ) මා කරා පැමිණ 'මෝ තොමෝ තොපට කවරැ යැ, කවරක්හුගේ භාර්‍ය්‍යාවකැ'යි (මා) විචාළේ යැ.

178. මෙසේ කී කල්හි මම ඔහුට මෙවදන් කීමි: මෝ තොමෝ මා ගේ භාර්‍ය්‍යා නො වෙයි. සහධාර්මික වූ සමානශික්ෂා ඇත්තකැ'යි කියෙමි.

179. ඇය පිළිබඳ වැ බලවත් රාගයෙන් බැඳුණේ දසුන් (රාජ-පුරුෂයන්) ලවා ගන්වා ගෙන බලාත්කාරයෙන් පෙළමින් ඇතොවුරට ඇතුළු කරවී.

180. (ප්‍රව්‍රජ්‍යා ජාති වශයෙන්) මාගේ සහජාව වූ සමාන ශික්ෂා ඇති (උදකපාත්‍ර සාක්ෂි කොට ගත් බැවින්) ඔදපත්තිකී වූ භාර්‍ය්‍යාව ඇදගෙන යන කල්හි මට කොප උපන.

181. කොපය උපන් කල්හි ඒ හා සමග ශීලව්‍රතය සිහි කෙළෙමි. එහි මැ ඒ කොපය නිග්‍රහ කෙළෙමි. මත්තෙහි වැඩෙන්නට නුදුන්මි.

182. ඉදින් කිසිවෙක් එ බැමිණිය තියුණු සැතින් කොටා නම් සම්‍යක්-සම්බොධිය මැ කරුණු කොට සිල් නො මැ බිඳෙන්නෙමි.

183. එ බැමිණි මට අප්‍රිය නො වෙයි, මට බල නැත්තේ නො ද වෙයි, මට සර්‍වඥතාඥනය ප්‍රිය වෙයි, එහෙයින් ශීලය රක්ෂා කෙළෙමි'යි.

සතර වැනි චූළබොධිචරියා යි

## 5. මහිසරාජ චරියාව

184. තවද අනික් චර්‍ය්‍යාවක් කියමි. යම් කලෙක මම වෙසෙසින් වැඩුණු කය ඇති ශක්ති ඇති මහත් වූ සිරුරු ඇති බිහිසුණු දකුම් ඇති මහවෙනෙහි හැසිරෙනසුලු මීහි වැ උපනිම් ද– (එකල්හි)

185–186. තෙල මහවෙනෙහි ප්‍රාග්භාරයෙහි ද ගිරිදුර්ගයෙහි ද වෘක්ෂ-මූලයෙහි ද ජලාශය සමීපයෙහි ද කිසි ප්‍රදෙසෙක් මීහිවුන්ට සිටුනාතැන් වෙ ද ඒ ඒ තැන්හි සරනුයෙම් සොඳුරු තැනක් දිටිමි. එතැනට එළඹැ සිටුනෙම් ද හෝනෙම් ද වෙමි.

187. අථෙත්ථ කපිමාගන්ත්වා පාපො අනරියො ලහු
ඛන්ධෙ නලාටෙ භමුකෙ මුත්තෙති ඔහනෙති මං.

188. සකිම්පි දිවසං දුතියං තතියං චතුත්ථම්පි ච
දූසෙති මං සබ්බකාලං තෙන හොමි උපද්දුතො.

189. මමං උපද්දුතං දිස්වා යක්ඛො මං ඉදමබ්‍රවි
නාසෙහෙතං[1] ඡවං පාපං සිඞ්ගෙහි ච ඛුරෙහි ච.

190. එවං වුත්තෙ තදා යක්ඛෙ අහං තං ඉදමබ්‍රවිං
කිං ත්වං මක්ඛෙසි කුණපෙන පාපෙන අනරියෙන මං[2].

191. යදිහං තස්ස කුප්පෙය්‍යං තතො හීනතරො භවෙ
සීලඤ්ච මෙ පභිජ්ජෙය්‍ය විඤ්ඤූ ච ගරහෙය්‍යු මං.

192. හීළිතා ජීවිතා වාපි පරිසුද්ධෙන මතං වරං
ක්‍යාහං ජීවිතහෙතූපි කාහාමි පරහෙඨනං.

193. මමෙ වාය[3] මඤ්ඤමානො අඤ්ඤෙපෙවං කරිස්සති
තෙව තස්ස වධිස්සන්ති සා මෙ මුත්ති භවිස්සති.

194. හීනමජ්ඣිමඋක්කට්ඨෙ සහන්තො අවමානිතං
එවං ලභති සප්පඤ්ඤො මනසා යථාපත්ථිතං.

මහිස[4] රාජචරියං පඤ්චමං

## 6. රුරුමිගරාජ චරියං

195. පුනාපරං යදා හොමි සුතත්ත කනකසන්නිභො
මිගරාජා රුරුනාම පරමසීල සමාහිතො.

196. රම්මෙ පදෙසෙ රමණීයෙ විවිත්තෙ අමනුස්සකෙ
තත්ථ වාසං උපගඤ්ජිං ගඞ්ගාකූලෙ මනොරමෙ.

x ඌහදකි ඉතිභවිතබ්බං
1. නාසහෙතං—සීමු
2. අනරියෙන—මජසං
3. මං—එවායං—PTS
4. මහිංස—මජසං

187. එකල්හි ලාමක වූ හීන ආචාර ඇති ලොල වූ වඳුරෙක් එහි පැමිණ (මාගේ) කඳටෙහි ද නළලෙහි ද බැමෙහි ද සුලුදිය කෙරෙයි වසුරු කෙරෙයි –

188. එක් දවසකුදු දෙවැනි දවස්හි දු තෙවැනි දවස්හි දු සිවුවැනි දවස්හි දු හැම කල්හිදු එ මා දූෂණය කෙරෙයි. එ වඳුරු විසින් උපද්‍රැතයෙම් වෙමි.

189. එ රුක්හි (අධිපති වැ වෙසෙන) දෙවි (ඔහු විසින්) පෙළනලද මා දැක මට මෙවදන් කී: හීන වූ ලාමක වූ තෙල වඳුරු හඟිනුදු ඇන කුරයෙනුදු මැඩ නසව'යි කී.

190. එසඳ එ දෙවියා එසේ කී කල්හි මම් ඔහුට මෙ වදන් කීමි: කුමක් හෙයින් තෙපි (කුණප සදෘශ හෙයින්) කුණප වූ ලාමක වූ අනාර්‍ය්‍ය වූවහු සමග මා තවරා ද'යි.

191. ඉදින් මම් ඔහුට කිපෙම් නම් ඔහුට ද වඩා හීනතරයෙම් වෙමි. මා ගේ සිලුදු බිඳෙන්නේ යැ. නුවණැති දෙවිමිනිස්හු ද මට ගරහන්නාහ'යි.

192. (නුවණැතියන් විසින්) ගර්හිත වූ ජීවිතයට ද වඩා පවිත්‍ර වූ ශීලයෙන් යුක්ත වැ මරණය මැ උතුම්, කිම මම් ජීවිතය නිමිති කොට ද මෙරමා වෙහෙසනු කරන්නෙම් ද?

193. මේ තෙම මා මෙන් හඟිනේ අන් මිහිවුන්ට ද මෙසේ කරන්නේ යැ එහිලා ඔහු මැ (හඟින් ඇන මොහු) නසන්නාහ, ඒ නැසීම මට මිදීම වන්නේ යි.

194. හීන මධ්‍යම උත්කෘෂ්ටයන් නිමිති කොට ඔවුන් විසින් කළ අවමානය ඉවසනුයේ සත්‍ප්‍රාඥ තෙමේ මෙසේ සිතින් ප්‍රාර්ථනා කළ පරිදි (සර්‍වඥතාඥනය) ප්‍රතිවෙධ කෙරේ යයි.

**පස් වැනි මහිසරාජචරියා යි.**

## 6. රුරුමිගරාජ චරියාව

195. නැවත ද අනෙක් චර්‍ය්‍යාවක් කියමි. යම් කලෙකැ මම මොනොවට තැවූ රන් බඳු පැහැ ඇති විශුද්ධ වූ සිල් හා එකඟ වූ සිත් ඇති රුරු නම් මෘගරාජ වීම් ද,

196. එකල්හි පුෂ්පඵලාදීන් රමණීය වූ ජනවාස රහිත වූ මිනිසුන්ගේ හැසිරීම් නැති රම්‍ය ප්‍රදෙශයෙක්හි වූ, එහි සිත්කලු ගං ඉවුරෙකැ වාසයට පැමිණියෙමි.

197. අථො උපරිගංගාය ධනිකෙහි පරිපීළිතො
පුරිසො ගංගාය පපති[1] ජීවාමි වා මරාමි වා.

198. රත්තින්දිවං සො ගඞ්ගාය වුය්හමානො මහොදකෙ
රවන්තො කරුණං රවං[2] මජ්ඣෙ ගඞ්ගාය ගච්ඡති.

199. තස්සාහං සද්දං සුත්වාන කරුණං පරිදෙවතො
ගඞ්ගාය තීරෙ ඨත්වාන අපුච්ඡිං කොසි ත්වං නරො.

200. සො මෙ පුට්ඨො ච ව්‍යාකාසි අත්තනො කාරණං තදා
ධනිකෙහි භීතො තසිතො පක්ඛන්තොහං මහානදිං.

201. තස්ස කත්වාන කාරුඤ්ඤං චජිත්වා මම ජීවිතං
පවිසිත්වා නීහරිං තස්ස අන්ධකාරම්හි රත්තියා.

202. අස්සත්ථ[3] කාලමඤ්ඤාය තස්සාහං ඉදමබ්‍රවිං
එකං තං වරං යාචාමි මා මං කස්සචි පාවද.

203. නගරං ගන්ත්වාන ආචික්ඛි පුච්ඡිතො ධනහෙතුකො
රාජානං සො ගහෙත්වාන උපගඤ්ඡි මමන්තිකං.

204. යාවතා කාරණං සබ්බං රඤ්ඤො ආරොචිතං මයා
රාජා සුත්වාන වචනං උසුං[4] තස්ස පකප්පයි
ඉධෙව ඝාතයිස්සාමි මිත්තදුබ්භිං[5] අනාරියං.

205. තමහං අනුරක්ඛන්තො නිම්මිනිං මම අත්තනො
තිට්ඨතෙසො මහාරාජ කාමඞ්කාරො[6] භවාමි තෙ.

206. අනුරක්ඛිං මම සීලං නාරක්ඛිං මම ජීවිතං
සීලවා හි තදා ආසිං බොධියා එව කාරණා.

රුරුමිගරාජ චරියං ඡට්ඨමං.

1. පතති-මජසං-නා-PTS
2. රවං-මජසං-PTS
3. අස්සත්ථ-සීමු
4. උස්සුං-මජසං-PTS
5. දුභිං-සීමු-දුබ්භි-නා
6. කාමකාරො-සී.මු

197. එකල්හි උඩුහොයැ ධනහිමියන් විසින් (ණය නො දෙනුයෙන්) පෙළනලද පුරුෂයෙක් (මෙයින්) රැකෙම්වා හෝ මියෙම්වා හො'යි ගඟෙහි පැන්නේ යැ.

198. හෙතෙම රෑදවල් ගඟැ මහවතුරෙහි ඉල්පෙනුයේ බැගෑහඩින් හඬමින් ගඟමැද යෙයි.

199. මම බැගෑපත් වැ හඬන්නා වූ ඔහුගේ හඬ අසා ගංඉවුරෙහි සිට තෝ කවර මිනිසෙක්හි දැ යි විචාළෙමි.

200. එකල්හි හෙ ද මා විසින් පුළුවුස්නාලද්දේ 'මම ණයහිමි ධනිකයන් කෙරෙන් බියපත් වූයෙම් තැති ගත්තෙම් මහානදියට පැනපිමි'යි තමාගේ ක්‍රියාව ප්‍රකාශ කෙළේ යැ.

201. ඔහුට කරුණා උපදවා මාගේ දිවි පුද රැය අඳුරෙහි ගඟට පිවිස ඔහු (පිට හිඳුවා එයින්) බැහැර කෙළෙමි.

202. (විඩා හැරපියා) අස්වැසුණුකල් දැන මම ඔහුට මෙ වදන් කීමි: තොප අතින් එක්වරයක් ඉල්වමි. 'නහමක් මා කිසිවක්හට කියව'යි.

203. හෙ නුවරට ගොස් (රන්මුවකු) පුළුවුස්නාලදුයේ ධනය නිමිති කොට ඇතියේ (රජුට මා) දැන්විය. හෙතෙම රජු ගෙන මා වෙත එළැඹියේ යැ.

204. (මා විසින් ඔහුට කළ) යම් පමණ උපකාරයෙක් වී ද. එහැම මා විසින් රජුට දන්වන ලද. රජ එබස් අසා මිත්‍රද්‍රොහි වූ අනායඪ වූ මොහු මෙතැන්හි මැ නසාපියමි'යි ඒ පුරුෂයාහට හීය දුන්නෙහි සැදී යැ.

205. මම ඔහු රක්නෙම 'මහරජ තෙල පුරුෂයා සිටීවා. මම තොපට රිසිදෑ කරනුයෙම වෙමි'යි මාගේ ආත්මයෙන් ඔහු පරිවර්තන කෙළෙමි. (මරණයෙන් මුදවාලීමි)

206. මාගේ ශීලය මැ රැකපිමි. මාගේ දිවි නො රැක්කෙමි. එකල්හි සම්‍යක්සම්බොධිය මැ කරුණු කොට මම සිල්වත් වීමි.

**සවැනි රුරුමිගරාජ චරියා යි.**

## 7. මාතඞ්ග චරියං

207. පුනාපරං යදා හොමි ජටිලො උග්ගතාපනො
මාතඞ්ගො නාම නාමෙන සීලවා සුසමාහිතො.

208. අහඤ්ච බ්‍රාහ්මණො එකො ගඞ්ගාකූලෙ වසාමුභො
අහං වසාමි උපරි හෙට්ඨා වසති බ්‍රාහ්මණො.

209. විචරන්තො අනුකූලම්හි උද්ධං මෙ අස්සමද්දස
තත්ථ මං පරිභාසෙත්වා[1] අභිසපි මුද්ධඵාලනං.

210. යදිහං තස්ස පකුප්පෙය්‍යං යදි සීලං න ගොපයෙ
ඔලොකෙත්වාන 'හං තස්ස කරෙය්‍යං ඡාරිකං විය.

211. යං සො තදා මං අභිසපි කුපිතො දුට්ඨමානසො
තස්සෙව මත්ථකෙ නිපති යොගෙන තං පමොචයිං.

212. අනුරක්ඛිං මම සීලං නාරක්ඛිං මම ජීවිතං
සීලවා හි තදා ආසිං බොධියා යෙව කාරණාති.

මාතඞ්ගචරියං සත්තමං.

## 8. ධම්මදෙවපුත්ත චරියං

213. පුනාපරං යදා හොමි මහෙසක්කො[2] මහිද්ධිකො
ධම්මො නාම මහායක්ඛො සබ්බලොකානුකම්පකො.

214. දස කුසලකම්මපථෙ සමාදපෙන්තො මහාජනං
චරාමි ගාමනිගමං සමිත්තො සපරිජ්ජනො.

215. පාපො කදරියො යක්ඛො දීපෙන්තො දස පාපකෙ
සොපෙත්ථ[3] මහියා චරති සමිත්තො සපරිජ්ජනො.

216. ධම්මවාදී අධම්මො ච උභො පච්චනිකා මයං
ධුරෙ ධුරං ඝට්ටයන්තා සමිම්හා පටිපථෙ උභො.

---

1. පරිභාසිත්වා–සීමු
2. මහායක්ඛො–සී–PTS
3. සොචෙත්ථ–සීමු

## 7. මාතඞ්ග චරියාව

207. තවද අන් චරියාවක් කියමි: යම් කලෙක මම ජටාධර වූ උග්‍ර වූ තපස් ඇති ශීල සම්පන්න වූ සමාහිත වූ සිත් ඇති නමින් මාතඞ්ග නම් තාපස වැ උපනිම් ද,

208. (එකල ජාතිමන්ත නම්) බමුණු ද මමද (පැවිදි වැ) අපි දෙදෙන ගං ඉවුරෙකැ වාසය කළම්හ. මම උඩුගඟ වසමි, එ බමුණු යටිගඟ වෙසෙයි.

209. හෙතෙම ගංතෙර හැසිරෙනුයේ උඩුගඟැ පිහිටි මා ගේ අසපුව දිටී. එහි දී මට පරිභව බැණ මා මුදුන් පැළේවා'යි ශාප කෙළේ යැ.

210. ඉදින් මම ජටිලයාහට කිපියෙම් නම්, ඉදින් මම සිල් නො රැකියෙම් නම් මම ඔහු දෙස බලා ඔහු හළු මෙන් කරන්නට සමර්ථයෙමි.

211. කුපිත වූ දූෂිත සිත් ඇති ඒ ජටිල තෙම මට යම් ශාපයක් කෙළේ ද, ඒ ශාපය ඔහු මත්තෙහි මැ වැටිණ. ඒ ශාපය උපායෙන් මුදලිමි.

212. මා ගේ ශීලපාරමිතාව මැ ආරක්ෂා කෙළෙමි. ජීවිතය ආරක්ෂා නො කෙළෙමි. සර්වඥතාඥනය මැ සඳහා එකල්හි සිල්වත් වූයෙමි යි.

**සත් වැනි මාතඞ්ග චරියා යි.**

## 8. ධම්මදෙවපුත්ත චරියාව

213. තවද අන් චරියාවක් කියමි: යම් කලෙකැ මම මහායශස්ක වූ මහත්සෘද්ධි ඇති සියලු ලොවට අනුකම්පා කරන ධර්ම නම් දිව්‍ය පුත්‍ර වැ උපනිම් ද,

214. එකල්හි මම මහාජනයා දශකුශල කර්මපථයෙහි සමාදන් කරවමින් මිත්‍රයන් සහිත වූයෙම් පරිවාරජනයා සහිත වූයෙම් ගම්නියම්-ගම්හි හැසිරෙමි.

215. පාපිෂ්ඨ වූ තද මසුරු වූ දිව්‍ය පුත්‍රයෙක් ද දශඅකුශලධර්මයන් ප්‍රකාශ කෙරෙමින් මිත්‍රයන් සහිත වූයේ පරිවාර ජනයා සහිත වැ පෘථිවිය ආසන්නයෙහි හැසිරෙයි.

216. ධර්මවාදී වූ මම ද අධර්මවාදී වූ දිව්‍යපුත්‍ර ද යන අපි දෙදෙන ඔවුනොවුන්ට ඉදුරා විරුද්ධ වූවමෝ එක් දවසක් ප්‍රතිපථයෙහි තමා රියහිසින් මෙරමා රියහිස ගටමින් හමු වූම්හ.

217. කලහො වත්තති භෙස්මා කල්‍යාණපාපකස්ස ච
මග්ගා ඔක්කමනත්ථාය[1] මහායුද්ධො උපට්ඨිතො.

218. යදිහං තස්ස පකුප්පෙය්‍යං යදි භින්දෙ තපොගුණං
සහ පරිජනං තස්ස රජභූතං කරෙය්‍යහං.

219. අපිචා'හං සීලරක්ඛාය නිබ්බාපෙත්වාන මානසං
සහ ජනෙනොක්කමිත්වා පථං පාපස්ස ‘දාසහං

220. සහ පථතො ඔක්කන්තෙන කත්වා චිත්තස්ස නිබ්බුතිං
විවරං අදාසි පථවී පාපයක්ඛස්ස තාවදෙති.

ධම්ම[2]දෙවපුත්ත චරියං අට්ඨමං.

## 9. අලීනසත්ත චරියං

221. පඤ්චාලරට්ඨෙ නගරවරෙ[3] කපිල්ලායං[4] පුරුත්තමෙ
රාජා ජයද්දිසො නාම සීලගුණමුපාගතො.

222. තස්ස රඤ්ඤො අහං පුත්තො සුතධම්මො සුසීලවා
අලීනසත්තො ගුණවා අනුරත්තපරිජනො[5] සදා.

223. පිතා මෙ මිගවං ගන්ත්වා පොරිසාදං උපාගමි
සො මෙ පිතුමග්ගහෙසි භක්ඛොසි මම මා චලි.

224. තස්ස තං වචනං සුත්වා භීතො තසිතවෙධිතො
ඌරුක්ඛම්භො අහු තස්ස දිස්වාන පොරිසාදකං

225. මිගවං ගහෙත්වා මුඤ්චස්සු කත්වා ආගමනං පුන
බ්‍රාහ්මණස්ස ධනං දත්වා පිතා ආමන්තයී මමං

226. රජ්ජං පුත්ත, පටිපජ්ජ මා පමජ්ජි පුරං ඉදං
කතං මෙ පොරිසාදෙන මම ආගමනං පුන.

1. උක්කමනත්ථාය–සයා
2. ධම්මා ධම්ම දෙව පුත්ත–සී.මු
3. නගරෙ–PTS
4. කපිලායං–සී.මු කප්පිලාය—PTS-කප්පිලායං–සයා
5. අනුරක්ඛ පරිජනො PTS-සයා

217. එවිට ඒ ධාර්මික අධාර්මික දෙදෙනා ගේ මඟින් ඉවත්වීම නිමිති කොට භය ජනක වූ කලහයෙක් විය. මහාසඞ්ග්‍රාමයෙක් එළඹ සිටියේ යැ.

218. ඉදින් මම ඒ අධාර්මිකදෙවතාවාට කිපුණෙම් නම් (එයින් මාගේ) තපොගුණ බිඳී යන්නේ යැ. ඉදින් මම කිපියෙම් නම් පරිවාර සහිත වූ ඔහු ධූලි කරන්නට පොහොසත්මි.

219. වැළිදු මම ශීලසංරක්ෂණය පිණිස සිත සන්හිඳුවාගෙන මාගේ පරිවාරජනයා හා සමග ඉවත් වැ ඒ පාපී වූ දෙවතාවාට මාඟය දිනිමි.

220. යථොක්ත නයින් සිත සන්හිඳුවා ගෙන මාර්ගයෙන් ඉවත්වනු හා සමග එකෙණෙහි පාපී වූ දෙවියාට පෘථිවි තොමෝ විවර දුන.

අටවැනි ධම්මදෙවපුත්ත චරියා යි.

## 9. අලීනසත්ත චරියාව

221. පඤ්චාල රටැ පිහිටි, දඹදිව අගනුවර වූ කම්පිල්ල නම් නගර වරයෙහි ආචාරශීලයෙන් හා රාජගුණයෙන් ද යුක්ත වූ ජයද්දිස නම් රජෙක් වී.

222. මම එරජහට බහුශ්‍රුත වූ සිල්වත් වූ ගුණසම්පන්න වූ හැම කල්හි අනුරක්ත වූ පරිවාර ජනයා ඇති අලීනසත්ත නම් පුත්‍ර වැ උපන්මි.

223. (එක් දවසක්) මා ගේ පියරජ මුවදඩ ගොස් පොරිසාදයා වෙත එළැඹියේ යැ. ඒ පොරිසාද තෙම 'තෝ මට ගොදුරු වූයෙහි, නහමක් සැලෙව යි මපියාණන් (අත) අල්ලාගත්තේ යැ.

224. ඒ පෝරිසාදයා ගේ වචනය අසා බියපත් වූයේ ත්‍රස්ත වැ කම්පා වූයේ යැ, පෝරිසාදයා දක රජහුගේ ඌරුස්තම්භය විය.

225. (රජ) මේ මුවමස ගෙන මා මුදහරුව යි කී. පෙරළා ඊමට ප්‍රතිඥා දී අවුත් ඒ නන්ද බමුණුට ධනය දී (ඉක්බිති) පිය රජ තෙම මා කැඳවී.

226. පුත, රජය පිළිගනුව, මේ පුරය රක්නෙහි, නහමක් පමා වෙව, නැවත මා ගේ ඊමට මවිසින් පොරිසාදයාහට ප්‍රතිඥා දෙනලද.

227. මාතු පිතු ච වන්දිත්වා නිස්සජ්ජිත්වාන අත්තානං[1]
නික්ඛිපිත්වා ධනුං[2] ඛග්ගං පොරිසාද මුපාගමිං.

228. සසත්ථහත්ථූපගතං කදාචි සො තසිස්සති
තෙන භිජ්ජිස්සති සීලං පරිත්තාසං කතෙ[3] මයි.

229. සීල ඛණ්ඩභයා, මය්හං තස්ස දෙස්සං න බ්‍යාහරිං
මෙත්තචිත්තො හිතවාදී ඉදං වචනමබ්‍රවිං.

230. උජ්ජාලෙහි මහාඅග්ගිං පපතිස්සාමි රුක්ඛතො
සම්පක්ක කාලමඤ්ඤාය භක්ඛය ත්වං[4] පිතාමහ,

231. ඉති සීලවතං හෙතු නාරක්ඛිං මම ජීවිතං
පබ්බාජෙසිං චහං[5] තස්ස සදා පාණාතිපාතිකන්ති.

අලීනසත්ත චරියං නවමං.

## 10. සඞ්ඛපාල චරියං

232. පුනාපරං යදා හොමි සඞ්ඛපාලො මහිද්ධිකො
දාඨාවුධො ඝොරවිසො ද්විජිව්හො උරගාධිභූ[6].

233. චතුප්පථෙ මහාමග්ගෙ නානා ජනසමාකුලෙ
චතුරො අඞ්ගෙ අධිට්ඨාය තත්ථ වාසමකප්පයිං.

234. ඡවියා චම්මෙන මංසෙන නහාරු අට්ඨිකෙහි වා
යස්ස එතෙන කරණීයං දින්නං යෙව හරාතු සො.

235. අද්දසංසු භොජපුත්තා ඛරා ලුද්දා අකාරුණා
උපගඤ්ඡුං මමං තත්ථ දණ්ඩමුග්ගරපාණිනො.

236. නාසාය විනිවිජ්ඣිත්වා නඞ්ගුට්ඨෙ පිට්ඨිකණ්ටකෙ
කාජෙ ආරොපයිත්වාන භොජපුත්තා හරිංසු මං.

1. නිම්මිනිත්වාන අත්තනා–සී.මු, ප
2. ධනු–PTS
3. ගතෙ–සී.මු
4. භක්ඛය මං–සී.මු
5. පබ්බාජෙසිමහං සී.මු
පබ්බාජෙසිංචාහං PTS
6. උරගාභිභූ සී.මු

227. මම මාපියන් වැද පියා සඳහා ආත්මය පරිත්‍යාග කොට දුන්න හා කඩුව බහා තබා පොරිසාදයා වෙත එළැඹියෙමි.

228. ආයුධ ගත් අත් ඇති වැ පැමිණි මා දක හේ ත්‍රස්ත වී නම් මා ඔහු නැතිගැන්වූ කල්හි ඒ හෙතුවින් මාගේ ශීලය බිඳෙන්නේ යැ.

229. 'මාගේ ශීලය බිඳෙයි' යන බියෙන් ඔහුට අප්‍රිය වූ බසක් නො කීමි. මෙත්සිත් ඇතියෙම් හිතවාදී වැ මෙවදන් කීමි.

230. මහපියාණෙනි, මහගිනි දල්වාලව. මම රුකට නැඟී පතින්-නෙමි. තෙපි පැලැහුණු කල් දන මා (මස්) කව.

231. මෙසෙයින් ශීලව්‍රත හෙතුයෙන් මාගේ දිවි නො රැක්කෙමි මම හැම කල්හි ප්‍රාණවධ කරන ඔහු පැවිදි කරවීමි.

**නව වැනි අලීනසත්ත චරියා යි.**

## 10. සඞ්ඛපාල චරියාව

232. තවද අනෙකක් කියමි. යම් කලෙක මම නාගර්ද්ධි ඇති, දළ මැ අවි කොට ඇති උග්‍ර වූ විෂ ඇති දෙදිව් ඇති නාගයන්ට අධිපති වූ සඞ්ඛපාල නම් නාරජ වීම් ද.

233. ඔබිනොබ යන මහාජනයා විසින් ගැවැසිගත් මාවතෙකැ සතර මංසන්ධියක් සමීපයෙහි වූ (තුඹසක් මතුයෙහි) සතර අඞ්ගයන් ඉටා එහි වාස කෙළෙමි.

234. 'සිවියෙන් හෝ සමින් හෝ මසින් හෝ ඇටනහරින් හෝ යමක්හට මෙයින් කටයුතු වී නම් (ඔහුට) එ දෙනලද මැ යැ, හෙතෙම ගෙන යේව'යි.

235. රළුවූ දරුණු වූ නිෂ්කාරුණික වූ වැදිපුත්තු (සොළොස් දෙනෙක්) මා දුටුවාහු යැ (ඔහු) දඬුමුගුරු ගත් අත් ඇත්තාහු මා කරා එළැඹියාහු යැ.

236. ඒ භොජපුත්‍රයෝ (මාගේ) නැහැයෙහි ද නඟුටු පෙදෙසෙහි ද පිටකටු සමීපයෙහි ද (හුලින්) විද කඳෙහි නඟා මා ගෙන ගියාහු යැ.

237. සසාගරන්තං පඨවිං සපබ්බතං
ඉච්ඡමානො චහං[1] තත්ථ නාසාවාතෙන[2] ඣාපයෙ.

238. සූලෙහි විජ්ඣියන්තෙපි කොට්ටියන්තෙපි සත්තිහි
භොජපුත්තෙ න කුප්පාමි එසා මෙ සීලපාරමීති.

සඞ්ඛපාල චරියං දසමං.

හත්ථි නාගො භූරිදත්තො චම්පෙය්‍යො බොධි මාහිසො
රුරුමාතඞ්ගො ධම්මො ච අත්‍රජො ච ජයද්දිසො.

එතෙ සබ්බෙ සීලබලා පරික්ඛාරා පදෙසිකා
ජීවිතං පරිරක්ඛිත්වා සීලානි අනුරක්ඛිස්සං.

සඞ්ඛපාලස්ස මෙ සතො සබ්බකාලම්පි ජීවිතං
යස්ස කස්සචි නීයන්තං තස්මා සා සීලපාරමීති.

සීල පාරමීනිද්දෙසො නිට්ඨිතො.

1. මහං සී.මු

2. නාස වාතෙන-PTS

237. එකල්හි මම රිසි වූයෙම් නම්, සයුරු කෙළවර කොට ඇති වන සහිත වූ ගල් සහිත වූ පොළොව නාසාවාතයෙන් දවන්නෙමි.

238. හුලින් විදුනා කල්හි දූ අඩයටියෙන් කොටනා කල්හි දූ ඒ වැදිපුත්නට නො කිපියෙමි. මෙල මාගේ ශීලපාරමිතාව යි.

දස වැනි සඞ්ඛපාලචරියා යි.

උද්දාන:

ශීලව නම් හස්තිරාජ යැ භූරිදත්ත නාගරාජ යැ චම්පෙය්‍ය නාගරාජ යැ චූළබොධි පරිව්‍රාජක යැ මහිසරාජ යැ රුරු මෘගරාජ යැ මාතඞ්ග පණ්ඩිත යැ ජයද්දිසපුත්‍ර වූ අලීනසත්ත කුමාර යැ යන–

මෙ හැම චරියාවෝ ශීලය ම බල කොට ඇත්තාහ. (පරමාර්ථපාරමී සඞ්ඛ්‍යාත) ශීලයට පරිෂ්කාර වූවාහු යැ (ශීලපරමාර්ථපාරමිතා අසම්පූර්ණ හෙයින්) සප්‍රදෙශ වූවාහු යැ (එහි දී) ජීවිතය රක්ෂා කෙරෙමින් ශීලය හාත්පසින් රක්ෂා කෙළෙමි.

සඞ්ඛපාලනාගරාජ වූ මා විසින් හැම කල්හි මැ යම් කිසිවක්හට ජීවිතය පරිත්‍යාග කරනලද, එහෙයින් ඕ තොමෝ (මාගේ) ශීලපරමාර්ථපාරමී නම් වූ යැ.

දෙ වැනි හස්තිනාගවර්ගය යි.

ශීලපාරමිතා නිමි.

# 3. නෙක්ඛම්ම පාරමිතා

## 1. යුධඤ්ජය චරියං

239. යදා අහං අමිතයසො රාජපුත්තො යුධඤ්ජයො
උස්සාවබින්දුං සූරියාතපෙ පතිතං දිස්වාන සංවිජිං[1].

240. තඤ්ඤෙවාධිපතිං කත්වා සංවෙගමනුබ්‍රූහයිං
මාතුපිතූ[2] ච වන්දිත්වා පබ්බජ්ජමනුයාචහං.

241. යාචන්තිමං පඤ්ජලිකා සනෙගමා සරට්ඨකා
අජ්ජෙව පුත්ත පටිපජ්ජ ඉද්ධං ඵීතං මහාමහිං.

242. සරාජකෙ සහොරොධෙ සනෙගමෙ සරට්ඨකෙ
කරුණං පරිදෙවන්තෙ අනපෙක්ඛො හි පබ්බජිං[3].

243. කෙවලං පථවිං රජ්ජං ඤාති පරිජන[4] යසං
චජමානො න චින්තෙසිං බොධියායෙව කාරණා.

244. මාතා පිතා න මෙ දෙස්සා නපි[5] දෙස්සං මහායසං
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා රජ්ජං පරිච්චජින්ති.

යුධඤ්ජය චරියං පඨමං.

## 2. සොමනස්ස චරියං

245. පුනාපරං යදා හොමි ඉන්දපත්තෙ පුරුත්තමෙ
කාමිතො දයිතො පුත්තො සොමනස්සොති විස්සුතො.

246. සීලවා ගුණසම්පන්නො කල්‍යාණපටිභාණවා
වුද්ධාපචායී හිරිමා සඞ්ගහෙසු ච කොවිදෙ.

247. තස්ස රඤ්ඤො පතිකරො අහොසි කුහකතාපසො
ආරාමං මාලාවච්ඡඤ්ච රොපයිත්වාන ජීවති

1. සංවිජි–PTS
2. මාතා පිතු–PTS
3. අනපෙක්ඛො පරිච්චජිං–සී.මු
4. පරිජ්ජනං–PTS
5. නපි මෙ දෙස්සං–සී.මු

# 3. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව

## 1. යුධඤ්ජය චරියාව

239. යම් කලෙක මම අපරිමිත වූ (භොගපරිවාර) යසස් ඇති යුධඤ්-ජය නම් රාජපුත්‍ර වූයෙම් ද හිරුරස් වැටෙන කල්හි නැඟීගිය පිනිබිඳු දැක (අනිත්‍යතාමනසිකාර විසින්) සංවෙගයට පැමිණියෙමි.

240. එ පිනිබිඳුවලැ අනිත්‍යතාව මැ පෙරදැරි කොට සංවෙගය නැවත නැවත වැඩීමි. මම් මවු ද පියා ද වැඳ පැවිද්දට (අවසර) ඉල්වීමි.

241. නියම්ගම්වැසියන් සහිත වූ රටැසියන් සහිත වූ රාජපුරුෂයෝ බද්දිලි වූවාහු ('නහමක් පැවිදි වෙව'යි) මා අයදිති. (මවුපිය දෙදෙන වැළිත්) පුත, සමෘද්ධ වූ ධනධාන්‍යයෙන් පිරුණු මහපොළොව අද මැ පිළිගනුව.

242. රජු සහිත වූ ඇතොවුරු සහිත වූ නියම්ගම් වැසියන් සහිත වූ රටවැසියන් සහිත වූ මහාජනයා බැගැපත් වැ පරිදෙවනා කරන කල්හි අපෙක්ෂා රහිත වැ පැවිදි වීමි.

243. සියලු පෘථිවියෙහි රාජ්‍යය ද ඥාතිපරිවාර ජනයා ද ඓශ්වර්‍ය්‍යය ද හරනෙම් සම්‍යක්සම්බොධිය මැ කරුණු කොට නො සිතූයෙමි.

244. මව්පිය දෙදෙන මට දෙව්ෂ්‍ය නො වෙති. මහත්ඓශ්වර්‍ය්‍යය ද දෙව්ෂ්‍ය නො වෙයි සර්වඥතාඥානය මට ප්‍රිය වෙයි. එහෙයින් රාජ්‍යය හැරපීමි.

**පළමුවැනි යුධඤ්ජය චරියා යි.**

## 2. සොමනස්ස චරියාව

245. නැවත අනෙකක් කියමි: යම් කලෙක මම ඉන්ද්‍රප්‍රස්ථ නම් උතුම් පුරයෙහි (මවුපියන් විසින්) පතන ලද ප්‍රිය කරනලද 'සොමනස්ස' යයි ප්‍රසිද්ධ වූ රාජපුත්‍ර වූයෙම් ද, (එකල්හි මම)

246. සිල්වත් වූයෙමි. (ශ්‍රද්ධාදි) ගුණයෙන් යුක්ත වූයෙමි සුන්දර වූ ප්‍රඥා ඇතියෙමි ජාතිවෘද්ධ ශීලවෘද්ධයන් පුදනසුලු වූයෙමි (පාපජිගුච්ඡන ලක්ෂණ) ලජ්ජා ඇතියෙමි සතර සඞ්ග්‍රහවස්තුයෙහි දක්ෂ වූයෙම වෙමි.

247. එ කුරුරජුට වල්ලභ වූ කුහක තාපසයෙක් විය. (හෙතෙම) පුෂ්පාරාම ඵලාරාම ද මල්ගොමු ද රොපණය කොට ජිවත් වෙයි.

248. තමහං දිස්වාන කුහකං ථුසරාසිංව අතණ්ඩුලං[1]
දුමංව අන්තොසුසිරං කදලිංව අසාරකං.

249. නත්ථිමස්ස සතං ධම්මො සාමඤ්ඤාපගතො අයං
හිරිසුක්කධම්මජහිතො ජීවිතවුත්තිකාරණා.

250. කුපිතො අහොසි පච්චන්තො අටවීහි පරන්තිහි
තං නිසෙධෙතුං ගච්ඡන්තො අනුසාසි පිතා මමං.

251. මා පමජ්ජි තුවං තාත ජටිලං උග්ගතාපනං
යදිච්ඡකං පවත්තෙහි සබ්බකාමදදො හි සො.

252. තමහං ගන්ත්වානු' පට්ඨානං ඉදං වචනමබ්‍රවිං
කච්චි තෙ ගහපති කුසලං කිං වා තෙ ආහරීයතු.

253. තෙන සො කුපිතො ආසි කුහකො මානනිස්සිතො
ඝාතාපෙමි තුවං අජ්ජ රට්ඨා පබ්බාජයාමි වා.

254. නිසෙධයිත්වා පච්චන්තං රාජා කුහකමබ්‍රවි
කච්චි තෙ භන්තෙ ඛමනීයං සම්මානො තෙ පවත්තිතො

තස්ස ආචික්ඛති පාපො කුමාරො යථා නාසියො.

255. තස්ස තං වචනං සුත්වා ආණාපෙසි මහීපති
සීසං තත්ථෙව ඡින්දිත්වා කත්වාන චතුඛණ්ඩිකං
රථියා රථියං දස්සෙථ සා ගති ජටිලහීළිතො.[2]

256. තත්ථ කාරණිකා ගන්ත්වා චණ්ඩා ලුද්දා අකාරුණා
මාතු අඞ්කෙ නිසින්නස්ස ආකඩ්ඪිත්වා නයන්ති මං.

257. තෙසාහං එවමවචං බන්ධතං ගාළ්හබන්ධනං
"රඤ්ඤො දස්සෙථ මං ඛිප්පං රාජකිරියානි අත්ථිමෙ".

---

1. රාසිංව තණ්ඩුලං–සී.මු
2. හීළිතා–සී.මු (PTS)

248. මම සහල් නැති බොල්රැසක් වැනි වූ ඇතුළත සිදුරු ඇති රූකක් වැනි වූ හර නැති කෙසෙල්ගසක් වැනි වූ ඒ කුහකයා දැක–

249. මොහුට ධ්‍යානාදි වූ සත්පුරුෂයන්ගේ ධර්මයෙක් නැත. මේ තෙම ශීලාදි ශ්‍රමණභාවයෙන් පහවූයෙක. හරනලද හිරි සඞ්ඛ්‍යාත කුශල ධර්ම ඇතියෙක (හුදෙක්) දිවිවැටුම් හෙතුයෙන් (තාපසලිඞ්ගයෙන්) හැසිරෙයි.

250. දෙශසීමාන්තරවාසී වූ වනවැසියන් විසින් ප්‍රත්‍යන්තය කොප කරන ලද්දේ විය. ඒ (ප්‍රත්‍යන්තකොපය) සන්හිඳුවනු පිණිස යන පිය රජ තෙමේ මට (මෙසේ) අනුශාසනා කළේ යැ.

251. ''පුත, තෙපි උග්‍ර වූ තපස් ඇති ජටිලයාහට නහමක් ප්‍රමාද වෙව. ඔහුගේ සිතට අනුකූල වැ පවතුව. හෙතෙම (අපට) සියලු කැමැතිදෑ දෙනුසුලු වූයේ මැ යැ.''

252. මම එ තවුසා වෙත උවැටනට ගොස් 'ගෘහපතිය, කිම තොපට ආරොග්‍ය ද? කුමක් හෝ තොපට ගෙනායුතු දැ යි මෙ වදන් කීමි.

253. මානනිශ්‍රිත වූ ඒ කුහක තෙම ඒ ගෘහපතිවාදයෙන් කිපියේ විය. 'තා අද (රජු ආ කල්හි මැ) නස්වමි, රටින් හෝ නෙරවමි' යි කී.

254. රජ තෙම පසල්දනවු සන්හිඳුවා (පැමිණ) කුහකයාහට 'වහන්ස, කිම තොපට සහනය කොට හැකි ද? තොපට (කුමරහු විසින්) සම්මාන පවත්වනලද දැ?'යි කී. පවිටු තවුස් තෙම කුමර යම්සේ නැසියයුතු ද එසෙයින් රජහට කී යැ.

255. පෘථිවීශ්වර තෙම ඔහුගේ එ තෙපුල් අසා 'එහි (දුටුතැන) මැ (කුමරහුගේ) හිස් සිඳ සතරකඩක් කොට ඒ ජටිලයනට නිසා කළ හෙයින් විපාක යයි වීථියෙන් වීථියෙහි දක්වාලව'යි ඇණවී.

256. එ රජුගේ ආඥයෙහි ලා චණ්ඩ වූ රෞද්‍ර වූ අකාරුණික වූ වධකයෝ ගොස් මවගේ ඇකයෙහි හුන් මට අනදර කොට ඇද මා (වධක ස්ථානයට) ගෙන යති.

257. දැඩි බැඳුමින් බඳනා ඔවුනට මම මෙසේ කීමි. 'වහා මා රජහට දක්වව, මට රාජකාර්‍ය්‍යයෝ ඇතැ' යි.

258. ගත මං රඤ්ඤො දස්සයිංසු පාපස්ස පාපසෙවිනො
දිස්වාන තං සඤ්ඤපෙසිං[1] මමඤ්ච වසමානයිං.

259. සො මං තත්ථ ඛමාපෙසි මහාරජ්ජමදාසි මෙ
සොහං තමං දළයිත්වා පබ්බජිං අනගාරියං.

260. න මෙ දෙස්සං මහාරජ්ජං කාමභොගො න දෙස්සියො
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා රජ්ජං පරිච්චජිං.

සොමනස්ස චරියං දුතියං.

## 3. අයොඝර චරියං

261. පුනාපරං යදා හොමි කාසිරාජස්ස අත්‍රජො
අයොඝරම්හි සංවඩ්ඪො නාමෙනාසි අයොඝරො.

262. දුක්ඛෙන ජීවිතො ලද්ධො සම්පීළෙ පතිපොසිතො
අජ්ජෙව පුත්ත පටිපජ්ජ කෙවලං වසුධං ඉමං.

263. සරට්ඨකං සනිගමං සජනං වන්දිත්වා ඛත්තියං
අඤ්ජලිම්පග්ගහෙත්වාන ඉදං වචනමබ්‍රවිං.

264. යෙ කෙචි මහියා සත්තා හීනමුක්කට්ඨමජ්ඣිමා
නිරාරක්ඛා සකෙ ගෙහෙ වඩ්ඪන්ති සහ ඤාතිභි.[2]

265. ඉදං ලොකෙ උත්තරියං සම්පීළෙ මම පොසනං
අයොඝරම්හි සංවඩ්ඪො අප්පභෙ'චන්දසූරියෙ.

266. පූතිකුණපසම්පුණ්ණා[3] මුච්චිත්වා මාතු කුච්ඡිතො
තතො ඝොරතරෙ දුක්ඛෙ පුන පක්ඛිත්තො අයොඝරෙ

267. යදිහං තාදිසං පත්වා දුක්ඛං පරමදාරුණං
රජ්ජෙසු යදි රඤ්ජාමි[4] පාපානං උත්තමො සියා[5]

---

1. සඤ්ඤාපෙසිං-සීමු-PTS
2. ඤාතිභි-PTS කත්ථචි
3. සම්පුණ්ණො-සීමු
4. රජ්ජාමි-ප
5. සියං-PTS, කත්ථචි

258. ඔහු පවිටු වූ, පවිටු තවුසා සෙවුනා වූ රජුට මා දක්වාලූහ. ඔහු දැක (ඔහුගේ කූටතාපස භාවය) හඟවාලීමි. එ රජු මාගේ වසඟයට ද පැමිණවීමි.

259. එහි දී එ රජ මා ක්ෂමා කරවිය. මට මහත් වූ රාජ්‍යය දින. ඒ මම මොහඳුර බිඳහැර අනගාරිය වූ තවුස් පැවිද්දෙන් පැවිදි වීමි.

260. මට මහාරාජ්‍යය අප්‍රිය නො වෙයි. පඤ්චකාම පරිභෝගය අප්‍රිය නො වෙයි. මට සර්වඥතාඥානය ප්‍රිය වෙයි. එහෙයින් රාජ්‍යය පරිත්‍යාග කෙළෙමි යි.

දෙ වැනි සොමනස්ස චරියා යි.

## 3. අයොඝර චරියාව

261. නැවත අනෙකුදු චරියාවක් කියමි. යම් කලෙක මම කාසි රජුට පුත්‍ර වූයෙම් ද, එකල්හි (මහත් වූ) අයොමය ගෘහයෙක්හි වැඩුණෙම් නමින් 'අයොඝර' නම් වීමි.

262–263. සම්බාධයෙහි වඩන ලදුයෙම් දුකසේ දිවි ලද්දේ ය. පුත්‍රය, අද මැ රට සහිත වූ නියම්ගම් සහිත වූ ජනයා සහිත වූ මේ සියලු පෘථිවිය පිළිගනුව. මම පියරජු වැඳ ඇඳිලි බැඳ ගෙන මෙ වදන් කීමි:

264. පෘථිවියෙහි හීනොත්කෘෂ්ටමධ්‍යම වූ යම් සත්ත්ව කෙනෙක් වෙත් ද ඔහු ඥතීන් සමග අරක් නැති ව, වැඩෙත්.

265. සම්බාධයෙහි මාගේ මේ වැඩීම මෙලොවැ අසදෘශකාරණයෙක් විය. සඳ හිරු දෙදෙනා ගේ ආලොක රහිත වූ අයොමය ගෘහයෙහි වැඩීණිමි.

266. පූතිකුණපයෙන් පිරුණු මවුකුසින් මිදී නැවත එ මවුකුසැ විසීමට වඩා ඉතා දරුණු දුක් ඇති අයොමයගෘහයෙහි බහාලන ලදුයෙමි.

267. ඉදින් මම එබඳු වූ අතිශයින් දරුණු දුකට පැමිණ රාජ්‍යයෙහි ඇලෙම් නම් ලාමක පුරුෂයන් අතුරෙහි උතුම් වෙමී.

271. උක්කණ්ඨිතොම්හි කායෙන රජ්ජෙනම්හි අනත්ථිකො
නිබ්බුතිං පරියෙසිස්සං යත්‍ථ මච්චු න මද්දියෙ

272. එවාහං චින්තයිත්වාන විරවන්තං මහාජනං
නාගොව බන්ධනං ඡෙත්වා පාවිසිං[1] කානනං වනං

273. මාතා පිතා න මෙ දෙස්සා නපි මෙ දෙස්සං මහායසං
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා රජ්ජං පරිච්චජින්ති

අයොඝර චරියං තතියං.

## 4. භිස චරියං

274. පුනා පරං යද හොමි කාසීනං පුරවරුත්තමෙ
භගිනී භාතරො සත්ත නිබ්බත්තා සොත්ථියෙ කුලෙ

275. එතෙසං පුබ්බජො ආසිං හිරි සුක්කමුපාගතො
භවං දිස්වාන භයතො නෙක්ඛම්මාභිරතො අහං

276. මාතා පිතුහි පහිතා[2] සහායා එකමානසා
කාමෙහි මං නිමන්තෙන්ති කුලවංසං ධරෙහිති

277. යං තෙසං වචනං වුත්තං ගිහී ධම්මෙ සුඛාවහං
තං මෙ අහොසි කඨිනං තත්තඵාලසමං[3] විය

278. තෙ මං තද උක්ඛිපන්තං පුච්ඡිංසු පත්ථිතං මම
කිං ත්වං පත්ථයසි? සම්ම! යදිකාමෙ න භුඤ්ජසි

279. තෙසාහං එවමවචං අත්ථකාමො[4] හිතෙසිනං
නාහං පත්ථෙමි ගිහීභාවං නෙක්ඛම්මාභිරතො අහං

280. තෙ මය්හං වචනං සුත්වා පිතු මාතු ච සාවයුං[5]
මාතා පිතා එවමාහු සබ්බෙපි[6] පබ්බජාම භො

281. උභො මාතා පිතා මය්හං භගිනී ච[7] සත්ත භාතරො
අමිතං ධනං ඡඩ්ඩයිත්වා පාවිසිම්හා[8] මහාවනන්ති

භිස චරියං චතුත්ථං.

1. පාවිසි–PTS,
2. පහිතො–සීමු
3. තත්තපාල–සීමු–සත්තත්ත–මජසං
4. අත්ථකාම හිතෙසිනං –සීමු
5. සාවෙය්‍යුං–නා–සාවෙසුං–මජසං
6. සබ්බෙව–සීමු–ප,
7. භගිනි–සීමු
8. පාවිසි -නා–PTS,

271. මේ ශරීරය හෙතු කොට ගෙහ උකටලී වෙමි. රාජ්‍යයෙනුදු ප්‍රයොජන නැත්තෙම් වෙමි. යම් තැනෙකැ සිටි මා මාර පෙමේ නො මඩනේ ද එ නිවන සොයන්නෙමි.

272. මම් මෙසේ සිතා (මවුපියන් ප්‍රමුඛ) මහජනයා හඬන කල්හි බැඳුම් සිඳ ඇත් රජක්හු සෙයින් මහවනයට පිවිසියෙමි.

273. මවුපිය දෙදෙන මට අප්‍රිය නො වෙති. මහත් වූ යශස් මට නො ද අප්‍රිය වෙයි. මට සර්වඥතාඥනය ප්‍රිය වෙයි. එහෙයින් රාජ්‍යය හළිමි.

තුන්වැනි අයොඝර චරියාව යි.

## 4. භිස චරියාව

274. නැවත අනෙකුදු චරියාවක් කියමි. යම් කලෙක මම් කසීරට (බරණැස් නම්) අගනුවර (මහාකඤ්චන නම කුමාර) වීම් ද එකල්හි නැඟණි යැ සත් සොහොයුරු යැ යන ඇපි (මන්ත්‍ර හදරන) සොත්‍රීය නම් කුලයෙහි උපන්නමෝ වූමහ.

275. මොවුනතුරින් මම් දෙටු වූයෙම් ශුක්ල සඞ්ඛ්‍යාත වූ පව් ගරහන හිරියට පැමිණියෙම් භවය භය හෙයින් දැක නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනෙමි.

276. මව්පියන් විසින් මෙහෙයන ලද (පෙර මා හා) එක් අදහස් ඇති යහළුවෝ 'කුලවංශය ධරව' යි කාමයෙන් මා නිමන්ත්‍රණය කළහ.

277. ඔවුන් විසින් ගිහි බැව්හි සුව එළවන යම් වදනෙක් කියන ලද ද ඒ මට රත් කළ සිවැලක් බඳු වී.

278. එකල්හි ඔහු 'යහළුව, ඉදින් කාමයන් පරිභොග නො කරවු නම් තෙපි කුමක් ප්‍රාර්ථනා කරවු දැ'යි මාගේ ප්‍රාර්ථනාව (කාමයන්) ප්‍රතික්ෂෙප කරන මා විචාළහ.

279. මට හිත කැමැති ඔවුනට තමහට වැඩ කැමැති මම් මෙසේ කීමි. 'මම ගිහි බව නො පතමි. මම් නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණෙමි'යි.

280. ඔහු ම බස් අසා මවුපියනට ද ඇස්වූහ. මවුපිය දෙදෙන මෙසේ කීහ. භවත්නි, 'ඇපි සියල්ලමෝ පැවිදි වම්හ' යි.

281. මාගේ මා පිය දෙදෙන යැ නැඟණියෝ යැ සත් සොහොවුරෝ යැ යන ඇපි අප්‍රමාණ වූ ධනය හැරපියා මහ වනයට පිවිසියම්හ යි.

සතරවැනි භිසචරියාවයි.

## 5. සොණපණ්ඩිත චරියං

282. පුනාපරං යදා හොමි නගරෙ බ්‍රහ්මවඩ්ඪනෙ
තත්ථ කුලවරෙ සෙට්ඨෙ මහාසාලෙ අජායහං[1]

283. තදාපි ලොකං දිස්වාන අන්ධභූතං[2] තමොත්ථතං[3]
චිත්තං භවතො පතිකුටති තුත්තවෙගහතං විය

284. දිස්වාන විවිධං පාපං එවං චින්තෙසහං තදා
කදාහං ගෙහා නික්ඛම්ම පවිසිස්සාමි කානනං

285. තදාපි මං නිමන්තිංසු[4] කාමභොගෙහි ඤාතයො
තෙසම්පි ඡන්දමාචික්ඛිං මා නිමන්තෙථ තෙහි මං[5]

286. යො මෙ කණිට්ඨකො භාතා නන්දො නාමාසි පණ්ඩිතො
සොපි මං අනුසික්ඛන්තො පබ්බජ්ජං සමරොචයි

287. අහං සොණො ච නන්දො ච උභො මාතාපිතා මම
තදාපි භොගෙ ඡඩ්ඩෙත්වා පාවිසිම්හා[6] මහාවනන්ති.

සොණපණ්ඩිත චරියං පඤ්චමං.

නෙක්ඛම්මපාරමිතා නිට්ඨිතා.

1. අජායිහං–මජසං
2. අන්ධිභූතං–මජසං
3. තමොත්ථටං–සීමු ප
4. නිමන්තෙසුං–සීමු
5. තෙනිමං–මු–තෙහි මමං–මජසං
6. පාවිසිම්හ–මු

## 5. සොණපණ්ඩිත චරියාව

282. නැවත අනෙක් චරියාවක් කියමි. යම් කලෙක මම 'බ්‍රහ්ම-වඩ්ඪන' නම් නගරයෙහි උපනිම් ද එකල්හි මම එහි ශ්‍රෙෂ්ඨ වූ අග්‍ර වූ මහාසාර කුලයෙකැ උපනිමි.

283. එකල්හි දු (පැනැස නැතියෙන්) අඳ වූ අවිදු අඳුරු වතළ ලොව දැක තෝමරයෙන් පෙළන ලද සෙයින් සිත භවයෙන් හැකිළෙයි.

284. එකල්හි මම් නොයෙක් පව්කම් දැක මෙසේ සිතිමි. 'කිකලෙකැ මම් ගිහිගෙන් නික්මැ වල්වදිම් දැ' යි.

285. එකල්හි දු (මාගේ) නෑයෝ කාමභෝගයෙන් මා නිමන්ත්‍රණය කළහ. 'ඒ කාමයෙන් නහමක් මා නිමන්ත්‍රණය කරව' යි ඔවුනට දු (මාගේ) ඡන්දය කීමි.

286. මට පණ්ඩිත වූ 'නන්ද' නම් යම් කනිටු බෑයෙක් වී නම් හෙ ද මා අනුව හික්මෙමින් පැවිද්ද රිසි වී.

287. මම ද සොණ ද නන්ද ද මාගේ මාපිය දෙදෙන ද යන ඇපි එකල්හි දු භොගයන් හැරපියා මහවනයට පිවිසියම්හ' යි.

**පස්වැනි සොණපණ්ඩිත චරියා යි.**

**නෛෂ්ක්‍රම්‍ය පාරමිතා නිමි.**

# අධිට්ඨාන පාරමිතා

## 6. තෙමිය පණ්ඩිත චරියං

288. පුනා පරං යද හොමි කාසිරාජස්ස අත්‍රජො
මූගපක්ඛොති නාමෙන තෙමියොති වදන්ති මං.

289. සොළසිත්ථිසහස්සානං න විජ්ජති පුමො තද[1]
අහොරත්තානං අච්චයෙන නිබ්බත්තො අහමෙකකො.

290. කිච්ඡා ලද්ධං පියං පුත්තං අභිජාතං ජුතින්ධරං
සෙතච්ඡත්තං ධාරයිත්වාන සයනෙ පොසෙති මං පිතා.

291. නිද්දායමානො සයනවරෙ පබුජ්ඣිත්වානහං තද
අද්දසං පණ්ඩරං ඡත්තං යෙනාහං නිරයං ගතො.

292. සහදිට්ඨස්ස මෙ ඡත්තං තාසො උප්පජ්ජි හෙරවො
විනිච්ඡයං සමාපන්නො කදාහං[2] ඉමං මුඤ්චිස්සං[3].

293. පුබ්බසාලොහිතා මය්හං දෙවතා අත්ථකාමිනී
සා මං දිස්වාන දුක්ඛිතං තීසු ඨානෙසු යොජයී.

294. මාපණ්ඩිච්චං[4] විහාය බාලමතො හව සබ්බපාණිනං[5]
සබ්බො ජනො ඔචිනායතු[6] එවං තව අත්ථො[7] හවිස්සති.

295. එවං වුත්තාය හං තස්සා ඉදං වචනමබ්‍රවිං[8]
කරොමි තෙ තං වචනං යං ත්වං[9] හණසි දෙවතෙ
අත්ථකාමාසි මෙ අම්ම! හිතකාමාසි දෙවතෙ!.

296. තස්සාහං වචනං සුත්වා සාගරෙව ථලං ලභිං
හට්ඨො සංවිග්ගමානසො තයො අඞ්ගෙ අධිට්ඨහිං.

---

1. සද–සීමු–
2. කථාහං–සී–මු–ප
3. මුච්චිස්සං–මජසං
4. මා පණ්ඩිච්චයං–සීමු–ප
5. බහුමතං සප්පාණිං–කථවි
6. ඔජිනායතු–සීමු–
7. එවං අත්ථො – කථවි
8. මබ්‍රැවි – නා – කථවි
9. යං මං – කථවි

# 4. අධිෂ්ඨාන පාරමිතාව

## 6. තෙමිය පණ්ඩිත චරියාව

288. නැවත අනෙකුදු චරියාවක් කියමි. යම් කලෙක මම කසී-රජහට දූත්‍ර වීම් ද එකල්හි මට නමින් 'තෙමිය' යයි ද (ව්‍රත හෙයින්) 'මූගපක්ඛ' යයි ද (මව්පිය ආදීහු) කියති.

289. එකල්හි (ඇතොවුර) සොළොස් දහසක් ස්ත්‍රීනට පුත්‍රයෙක් නො ලැබෙයි. නොයෙක් දවරය (බොහෝ කල්) ඇවෑමෙන් එක් මැ මම උපනිමි.

290. (බොහෝ කල් පතාසිට) දුකසේ ලත් ජාතිසම්පන්න වූ කාය-ද්‍යුතියෙන් හා ඥනද්‍යුතියෙන් හා සමන්විත වූ ප්‍රිය දූත්‍රවූ මා ම-පිය වූ කසීරජ සේසත් නඟා සිරියහන් හි හොවා පොෂණය කෙරෙයි.

291. එකල්හි මේ උතුම් වූ සිරියහන්හි නිද පිබිද එයින් පෙර තෙවැනි අත්බැවැ මම යම් සේසතක් කරණ කොට ගෙන නිරයට ගියෙම් ද, ඒ සේසත දිටිමි.

292. ඒ සේසත දුටු මට දක්නා හා මැ බිය එළවන ත්‍රාසයෙක් උපන. කි සෙයින් මම මෙ රජය හැරපියම් දැ' යි විචාරණයට පැමිණියෙමි.

293. මට පෙර අත්බැවෙක සහලේ (මෑණි) වූ වැඩ කැමැති සේසතැ වෙසෙන දෙව් දුවක් වූ ද, ඕ තොමෝ (චෛතසික දුකින්) දුප්පත් වූ මා දැක තුන් කරුණෙක්හි යෙද වූ යැ.

294. පණ්ඩිත බව නහමක් පාළ කරව. සියලු සත්ත්‍වයන් විසින් 'බාලයෙකැ'යි දන්නා ලදුයෙහි වෙව, (ඇතුළත පිටත) සියලු ජන තෙමේ (මූ බැහැර ලවයි) අවඥ කෙරේවා, මෙසේ කල්හි තොපට වැඩෙක් වන්නේ ය.

295. මෙසේ කී එ දෙවදුවට මම මෙ වදන් කීමි, දෙවිය, තෝ යම් බසක් කියෙහි නම්, තීගේ එ වචනය කෙරෙමි. මෑණියනි, දෙවිය (තෙපි) මට වැඩ කැමැතියව, සුව කැමතියව.

296. මම ඇගේ බස් අසා සාගරයෙහි ගැලෙන්නක්හු ගොඩබිමක් සෙයින් ප්‍රතිෂ්ඨාලද්මි. සතුටු වූයෙම් සංවෙගයට පැමිණි සිත් ඇතියෙම් තුන් අඟ ඉටා ගතිමි.

297. මූගො අහොසිං බධිරො පක්ඛො ගති විවජ්ජිතො
එතෙ අඞ්ගෙ අධිට්ඨාය වස්සානං සොළසං[1] වසිං.

298. තතො මෙ හත්ථපාදෙ ච ජිව්හං[2] සොතඤ්ච මද්දිය
අනූනතං මෙ පස්සිත්වා කාලකණ්ණීති නින්දිසුං[3]

299. තතො ජානපදා[4] සබ්බෙ සෙනාපති පුරොහිතා
සබ්බෙ එකමනා හුත්වා ඡඩ්ඩනං අනුමොදිසුං[5].

300. සොහං තෙසං මතිං සුත්වා හට්ඨො සංවිග්ගමානසො
යස්සත්ථාය තපොචිණ්ණො සොමෙ අත්ථො සමිජ්ඣථ.

301. නහාපෙත්වා[6] අනුලිම්පිත්වා වෙඨෙත්වා රාජවෙඨනං
ඡත්තෙන අභිසිඤ්චිත්වා[7] කාරෙසුං පුර[8] පදක්ඛිණං.

302. සත්තාහං ධාරයිත්වාන උග්ගතෙ රවිමණ්ඩලෙ
රථෙන මං නීහරිත්වා සාරථී වනමුපාගමී.

303. එකොකාසෙ රථං කත්වා සජ්ජස්සං[9] හත්ථමුඤ්චිතො[10]
සාරථී ඛණතී කාසුං නිඛාතුං පඨවියා[11] මමං[12]

304. අධිට්ඨිතමධිට්ඨානං තජ්ජෙන්තො[13] විවිධකාරණා
නාභින්දිං[14] වතමධිට්ඨානං බොධියායෙව කාරණා.

305. මාතා පිතා න මෙ දෙස්සා අත්තා මෙ න ච[15] දෙස්සියො
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා වතමධිට්ඨහිං.

306. එතෙ අඞ්ගෙ අධිට්ඨාය වස්සානි සොළසිං[16] වසිං[17]
අධිට්ඨානෙන සමො නත්ථි එසා මෙ අධිට්ඨානපාරමීති.

තෙමිය[18] චරියං පඨමං.

අධිට්ඨානපාරමිතා නිට්ඨිතා.

1. වස්සානි සොළසං-කත්ථචි
වස්සානි සොළසිං-සීමු-
2. ජිව්හා-මජසං
3. නිද්දිසුං-මු-නා- නිද්දිංසු-මජසං
4. ජානපණ-සීමු
5. අනුමොදිසු-මජසං
6. නාහපෙත්වා-මජසං
7. අභිසිචෙත්ව-කත්ථචි
8. පුරං-මජසං
9. සජ්ජිස්සං-මජසං
10. මුච්චිතො-මජසං
11. පඨවියං-සීමු-
12. මම-මජසං
13. තජ්ජෙන්තො-සීමු-
ගජ්ජන්තො-කත්ථචි
14. නභින්දිවතමධිට්ඨානං-නා-
නභින්දිත මධිට්ඨානං-ම-
15. අත්තානමෙව-නා-කත්ථචි
16. සොළසං-කත්ථචි
17. ඉමං ගාථද්ධං මරම්මපොත්ථකෙසු නත්ථි
18. තෙමිය පණ්ඩිත චරියං-සීමු-

297. (නොගොළු වැ) ගොළු වීමි. (නො බිහිරි වැ) බිහිරි වීමි. (නො පිළු වැ) හළ ගමන් ඇති පිළු වීමි. මෙසේ තුන් අඟ ඉටාගෙන සොළොස් හවුරුද්දක් විසීමි.

298. ඉක්බිති මාගේ අත්පා ද දිව ද කන ද මැඩ (විමසා) මාගේ අවිකල බව දැක මේ තෙම කාලකණ්ණියෙකැ යි නිගා කළහ.

299. අනතුරු වැ සියලු දනව් වැසියෝ ද සෙනෙවි පෙරෙවි ජනයෝ ද යන සියල්ලෝ එක්සිත් වැ මා බැහැර කිරීම අනුමෝදන් වූහ.

300. එ මම් ඔවුන් ගේ අදිප්‍රාය අසා සතුටු වූයෙම් සංවෙගයට පැමිණි සිත් ඇති වීමි. යම් කරුණක් සඳහා (මූගභාවාදි ව්‍රත සඞ්ඛ්‍යාත) තපස පිරුයෙම් ද මාගේ එ අභිය සමෘද්ධ වී.

301. ගඳ දියෙන් මා නහවා විලෙවුන් ගල්වා රජවොටුනු හිස පළඳවා රාජාභිෂෙකයෙන් අභිෂෙක කොට සේසතින් යුක්ත කොට නුවර පැදකුණු කරවූහ.

302. සතියක් මුළුල්ලෙහි සේසත් දරා රිවිමඬුලු උදවූ ඇසිල්ලෙහි රියැදුරු තෙමේ රියෙකින් මා බැහැර කොට මහවනයට එළැඹියේ ය.

303. යෙදූ අසුන් ඇති රිය එක්පසෙකැ නවතා අතින් (මා) මුදා ලූ රියැදුරු තෙම පොළොවෙහි (මා) වළලන්නට වළක් කනී.

304. විවිධ වූ කාරණයෙන් තර්ජනය කරනු ලබනුයෙම් සම්‍යක් සම්බොධිය මැ කරුණු කොට ඉටාගත් අධිෂ්ඨාන සඞ්ඛ්‍යාත ව්‍රතාධිෂ්ඨානය නො බින්දෙමි.

305. මට මවුපිය දෙදෙන දෙව්‍ෂ්‍ය නො වෙති. මට ආත්මය අප්‍රිය වූයේ නො ද වෙයි. යම් හෙයකින් මට සර්වඥතාඥනය ප්‍රිය වී ද එහෙයින් ව්‍රතාධිෂ්ඨානය කෙළෙමි.

306. මෙසේ මූගභාවාදි අඞ්ගයන් ඉටාගෙන සොළොස් වසක් විසීමි. අධිෂ්ඨානයෙන් මා හා සම වූයෙක් නැති. මෙසේ මාගේ අධිෂ්ඨාන පාරමිතාව යි.

**සවැනි වූ තෙමිය පණ්ඩිත චරියා යි.**

**අධිෂ්ඨාන පාරමිතා නිමි.**

# 5. සච්ච පාරමිතා

## 7. කපිරාජ චරියං

307. යදා අහං කපි ආසිං නදීකූලෙ දරීසයෙ
පීළිතො සුංසුමාරෙන[1] ගමනං නලභාමිහං[2]

308. යම්හොකාසෙ අහං ඨත්වා ඕරා[3] පාරං පතාමහං
තත්ථච්ඡි සත්තු[4] වධකො කුම්භීලො ලුද්ද[5] දස්සනො.

309. සො මං අසංසි[6] එහීති අහමෙමීති[7] තං වදිං[8]
තස්ස මත්ථකමක්කම්ම පරකූලෙ පතිට්ඨහිං.

310. න තස්ස අලිකං භණිතං යථා වාචං අකාසහං
සච්චෙන මෙ සමො නත්ථි එසා මෙ සච්ච පාරමීති.

කපිරාජ චරියං සත්තමං.

## 8. සච්ච තාපස චරියං

311. පුනා පරං යදා හොමි තාපසො සච්චසව්හයො
සච්චෙන ලොකං පාලෙසිං[9] සමග්ගං ජනමකාසහන්ති.

සච්ච පණ්ඩිත චරියං අට්ඨමං.

## 9. වට්ටපොතක චරියං.

312. පුනාපරං යදා හොමි මගධෙ වට්ට පොතකො
අජාතපක්ඛො තරුණො මංසපෙසි කුලාවකෙ.

313. මුඛතුණ්ඩකෙ[10] නාහරිත්වා මාතා පොසයතී මමං
තස්සා ඵස්සෙන ජීවාමි නත්ථි මෙ කායිකං බලං.

---

1. සුසුමාරෙන–මජසං
2. ලභා මහං–සීමු
3. ඔරා–මජසං
4. සත්තු–නා–
5. රුද්ද–නා–කත්රවි
6. ආසිංසි–සීමු–
7. අහංපෙමීති–මජසං
8. වදි–නා–කත්රවි
9. පාලෙමි–සීමු
10. තුණ්ඩෙනාහරිත්වා–සුමු–එප

# 5. සත්‍ය පාරමිතා

## 7. කපිරාජ චරියාව

307. යම් කලෙකැ මම් කපිරාජ වැ උපනිම් ද එකල්හි ගංතෙරෙකැ පිහිටි ගල්ගුහායෙකැ වාසය කෙළෙම් කිඹුලකු විසින් පීඩිත වූයෙම් මම ඔබිනොබ ගමන නො ලද්මි.

308. මම් යම් පෙදෙසෙක් (ගඟ මැද පිටිපහණෙක්) හි සිට මෙ තෙරින් එතෙරට පනිම්ද ඒ පිටිගල්හි සතුරු වූ වධක වූ රෞද්‍ර දර්ශන ඇති කිඹුලෙක් හුන්නේ ය.

309. හෙතෙම 'එව'යි මට කී යැ. මම් 'එමි' යි ඔහුට කීයෙමි. (මම්) ඔහුගේ හිස ඇක්ම එතෙර ඉවුරෙහි පිහිටියෙමි.

310. ඔහට (මවිසින්) බොරු නොකියන ලද. මම් වචනය පරිදි කෙළෙමි. සබවසින් මා හා සමයෙක් නැති. මේ මාගේ සත්‍යපාරමිතා යි.

සත්වැනි කපිරාජචරියාව යි.

## 8. සත්‍යතාපස චරියාව

311. තවද අනෙක් චරියාවක් කියමි. යම් කලෙක මම් සත්‍ය නම් වූ තාපස වීම් ද එකල්හි මම් සත්‍යයෙන් ලොවැ පාලනය කෙළෙමි. ජනයා සමගි කෙළෙමි.

අටවැනි සත්‍යතාපස චරියාව යි.

## 9. වට්ටපොතක චරියාව

312. නැවත අනෙක් චරියාවක් කියමි. යම් කලෙකැ මම් මගධ රටැ නූපන් පියාපත් ඇති තරුණ මාංශපෙශියක් වූ වටුපොව් වැ කසල්ලෙහි විසීම් ද (එකල්හි)

313. මව මුවතුඩින් අහර ගෙනවුත් මා පොෂණය කෙරෙයි. ඇගේ පහසින් (උණුසුම් වැ) දිවි රක්මි. මට කායිකබලයෙක් නැති.

314. සංවච්ඡරෙ ගිම්හසමයෙ දවඩාහො[1] පදිප්පති
උපගච්ඡති අම්හාකං පාවකො කණ්හවත්තනී.

315. ධූම ධූමං ජනිඤ්ඤෙවං[2] සද්දායන්තො මහාසිඛී
අනුපුබ්බෙන ඣාපෙන්තො අග්ගි මම මුපාගමි.

316. අග්ගිවෙගභයා භීතා තසිතා මාතා පිතා මම
කුලාවකෙ මං ඡඩ්ඩෙත්වා අත්තානං පරිමොචයුං.

317. පාදෙ පක්ඛෙ පජහාමි නත්ථි මෙ කායිකං බලං
සො, හං අගතිකො තත්ථ එවං චින්තෙසහං තදා.

318. යෙසාහං උපධාවෙය්‍යං භීතො තසිතවෙධිතො
තෙමං ඔහාය පක්කන්තා කථං මෙ අජ්ජ කාතවෙ.

319. අත්ථි ලොකෙ සීලගුණො සච්චං සොචෙය්‍යනුද්දයා
තෙන සච්චෙන කාහාමි සච්චකිරියමුත්තමං.

320. ආවජ්ජෙත්වා ධම්ම බලං සරිත්වා පුබ්බකෙ ජිනෙ
සච්චබලමවස්සාය සච්ච කිරිය මකාසහං.

321. සන්ති පක්ඛා අපත්තනා සන්ති පාද අවඤ්චනා[3]
මාතා පිතා ච නික්ඛන්තා ජාතවෙද පටික්කම.

322. සහ සච්චෙ කතෙ මය්හං මහා පජ්ජලිතො සිඛී
වජ්ජෙසි සොළස කරීසානි උදකම්පත්වා[4] යථා සිඛී
සච්චෙන මෙ සමො නත්ථි එසා මෙ සච්චපාරමීති.

වට්ටපොතක[5] චරියං නවමං.

## 10. මච්ඡරාජ චරියං

323. පුනාපරං යදා හොමි මච්ඡරාජා මහාසරෙ
උණ්හෙ සූරියසන්තාපෙ සරෙ උදකං ඛීයථ[6].

324. තතො කාකා ච ගිජ්ඣා ච බකා[7] කුළල සෙනකා
භක්ඛයන්ති දිවා රත්තිං මච්ඡෙ උපනිසීදිය.

---

1. වනදහො–මජසං–දවඩාහො–නා
2. ධූම ධූමං ඉති එවං–මජසං
3. අවඤ්ජනා–සීමු–කත්ථචි
4. උදකම්පත්තෙතා–නා
5. වට්ටකරාජ චරියං–ප
6. ඛීයථ–මජසං·ඛීයෙථ–සීමු–
7. කංකා–මජසං

314. හවුරුදු පතා ගිම් කල්හි ලැව්ගිනි ඇවිළෙයි. (අශුද්ධයන් ශුද්ධ කරන බැවින්) පාවක නම් වූ (ගිය මඟ හළු කරන බැවින්) කණ්හවත්තනී නම් වූ ගින්න අප කරා එළැඹෙයි.

315. මෙසෙයින් මහසිළු ඇති ගින්න 'ධම ධම' අනුකරණ උපදවා හඬ නඟමින් අනුක්‍රමයෙන් දවමින් මා කරා එළැඹියේ යැ.

316. මාගේ මවුපිය දෙදෙන වේගයෙන් එන ගින්නට බියෙන් බිය-පත් වැ තැතිගත්තාහු කැදැල්ලෙහි මා හැරපියා තමා මුදා ගත්හ.

317. මම් පාද පක්ෂයන් ගමනට හළිමි (සැදීමි) මට කායිකබලයෙක් නැති. එකල ඒ මම් ගමනබල නැතියෙම් එහිදී මෙසේ සිතීමි.

318. මම (මරණින්) බියපත් වූයෙම් තැති ගන්නා ලදුයෙම් වෙවුළ-නුයෙම් යම් කෙනකුන් කරා දිව ගියෙම් නම් ඒ මාපිය දෙදෙන මා හැර පියා පැන ගියහ. අද මා කෙසේ කළ යුතුද!

319. ලොකයෙහි ශීලගුණය ඇත. සත්‍යය ඇත. ශුචි භාවය ඇත. දයාව ඇති. ඒ සත්‍යයෙන් උතුම් වූ සත්‍යක්‍රියාව කරන්නෙමි.

320. මම් අතීතයෙහි වූ බුදුවරුන් සිහි කොට (ශීලාදි) ධර්මබලය ආවර්ජනා කොට සත්‍යබලය අරබයා සත්‍යක්‍රියා කෙළෙමි.

321. මට පියාඹනු නොහැකි පියාපත් ඇත. පියනඟනු නොහැකි පාද ඇති මවුපිය දෙදෙන ද පලාගියහ. අග්නිය නවතුව.

322. මා සත්‍යක්‍රියා කළ කල්හි (සත්‍යක්‍රියාව) සමග මහත් වූ ඇවිළගත් ගින්න ජලයට පැමිණ සෙයින් සොළොස්කිරියක් පමණ තැන් හැරපිය. සත්‍යයෙන් මා හා සමයෙක් නැති. මේ මා ගේ සත්‍යපාරමිතාව යි.

**නවවැනි වට්ටපොතක චරියා යි.**

## 10. මත්ස්‍යරාජ චරියාව

323. නැවත අන් චරියාවක් කියමි. යම් කලෙකැ (කොසොල් රට) මහවිලෙක්හි මස්රජ වැ උපනිම් ද, එකල්හි ගිම් කලැ හිරු රැසින් එ විල්හි දිය සිඳීගියේ යැ.

324. එකල්හි කවුඩුවෝ ද ගිජුලිහිණිහු ද කොක්කු ද කබරුස්සන් හා උකුස්සෝ ද දවරු දෙක්හි කලල් මතුයෙහි හිඳ මසුන් කති.

325. එවං චින්තයහං තත්ථ සහ ඤාතීහි පීළිතො
කෙන නු ඛො උපායෙන ඤාති දුක්ඛා පමොචයෙ.

326. විචින්තයිත්වා ධම්මත්ථං සච්චං අද්දස පස්සයං
සච්චෙ ඨත්වා පමොචෙසිං ඤාතීනං තං අතික්ඛයං.

327. අනුස්සරිත්වා සද්ධම්මං[1] පරමත්ථං විචින්තයං
අකාසිං සච්චකිරියං යං ලොකෙ ධුවසස්සතං.

328. යතො සරාමි අත්තානං යතො පත්තොස්මි විඤ්ඤුතං
නාභිජානාමි සඤ්චිච්ච එකපාණං විහිංසිතං[2]
එතෙන සච්චවජ්ජෙන පජ්ජුන්නො අභිවස්සතු.

329. අභිත්ථනය පජ්ජුන්න නිධිං කාකස්ස නාසය
කාකං සොකාය රන්ධෙහි[3] මච්ඡෙ සොකා පමොචය.

330. සහකතෙ සච්චවරෙ පජ්ජුන්නො[4] වාභිගජ්ජිය
ථලං නින්නඤ්ච පූරෙන්තො ඛණෙන අභිවස්සථ.

331. එවරූපං සච්චවරං කත්වා විරියමුත්තමං
වස්සාපෙසිං මහාමෙඝං[5] සච්චතෙජබලස්සිතො
සච්චෙන මෙ සමො නත්ථි එසා මෙ සච්චපාරමීති.

මච්ඡරාජ චරියං දසමං.

## 11. කණ්හදීපායන චරියං

332. පුනාපරං යදා හොමි කණ්හදීපායනො ඉසි
පරොපඤ්ඤාසවස්සානි අනභිරතො චරිං[6] අහං.

333. න කොචි එතං ජානාති අනභිරතිමනං මම
අහං[7] කස්සචි නාචික්ඛිං අරති මෙ චරති[8] මානසෙ.

334. සබ්රහ්මචාරී මණ්ඩබ්‍යො[9] සහායො මෙ මහාඉසි
පුබ්බකම්මසමායුත්තො සූලමාරොපණං ලභි.

1. සතං ධම්මං—මජසං
2. එකංපාණං පිහිංසිතං—නා—මජසං
එකපාණම්පි හිංසිතං—සීමු—
3. රන්ධෙහි—මජසං
4. චභිගජ්ජිය—නා—අභිගජ්ජිය—කත්ථචි
5. වස්සාපෙසිමහං මෙඝං—මජසං
6. චරියං—කත්ථචි—චරිං—නා—
7. අහම්පි—කත්ථචි—නා—
8. අරතිංමෙරතිමානසං—කත්ථචි—
අරතිං මෙරති මානසෙ—නා—
9. මණ්ඩබ්බො—කත්ථචි

325. එ විල්හි නැයන් සමග පීඩිත වූ මම මෙසේ සිතීමි. කවර උපායෙකින් ඥතීන් දුකින් මුදලම්දෝ හො'යි.

326. ධර්මයෙන් අනපෙත වූ අර්ථය හෙවත් සත්‍යය සලකා (නැයනට) වහල් වූ සත්‍යක්‍රියාව දිටිමි. සත්‍යයෙහි පිහිටා නැයන්ගේ ඒ මහාවිනාශය මුදලීමි.

327. සාධූන්ගේ ධර්මය සිහි කොට පරමාර්ථ වූ සත්‍යය සිතමින් ලොවැ යම් අවිහිංසාවක් වේ ද එය ධ්‍රැව යැ ශාස්වත යැ යි සිතමින් සත්‍ය-ක්‍රියා කෙළෙමි.

328. යම් තැනක පටන් ස්වකීය ආත්මභාවය සිහි කෙරෙම් ද යම් තැනෙක පටන් නුවණැති බවට පැමිණියෙම් ද (එතැන් පටන්) දූන දූන කිසි එක් සත්ත්වයකුදු හිංසාකරනු ලැබුවහු නො දනිමි. මේ සත්‍ය වචනය හෙතු කොට ගෙන මෙඝය වැසි වසීවා.

329. මෙඝය (වැසිවලා දෙවිය) විදුලි නඟා වැසි වස්වව. කවුඩාගේ මත්ස්‍ය නිධානය නසව. කවුඩු කැල ශොකයට රඳව මසුන් ශොකයෙන් මුදලව.

330. උතුම් වූ සත්‍යක්‍රියාව කළ කල්හි ඒ සත්‍යක්‍රියාව සමග මෙඝය ගර්ජනා කොට වළගොඩ පුරමින් ඇසිල්ලෙකින් වැස්සේ යැ.

331. මෙබඳු වූ උතුම් සත්‍යක්‍රියාව කොට උතුම් වීර්යය කොට සත්‍යානුභාව බලය ඇසුරු කෙළෙම් මහවැසි වස්වාපීමි. සත්‍යයෙන් මට සම වූයෙක් නැති. මේ මාගේ සත්‍යපාරමිතාව යි.

**දසවැනි වූ මච්ඡරාජචරියා යි.**

## 11. කණ්හදීපායන චරියාව

332. නැවත අනෙකක් කියමි. යම් කලෙක මම කණ්හදීපායන නම් ඍෂි වීම් ද එකල්හි මම සාධික වූ පනස්හවුරුද්දක් මුළුල්ලෙහි අධිකුශල ධර්මයෙහි නො ඇලුණෙම් බඹසරවස් විසීමි.

333. තෙල මාගේ අනභිරති චිත්තය කිසි එකෙකුදු නො දනි. යම් හෙයකින් මම මාගේ සිත්හි අනභිරතිය ඇතැයි කිසිවක්හට නො කීම් ද එහෙයිනි.

334. මා ගේ යහළු වූ සමාන බඹසරවස් ඇති මණ්ඩව්‍ය නම් වූ මහා ඍෂි තෙම පූර්ව කර්මයෙකින් යුක්ත වූයේ හුලැ හිඳුවනු ලැබී.

335. තමහං උපට්ඨහිත්වාන ආරොග්‍ය මනුපාපයිං[1]
ආපුච්ඡිත්වාන ආගඤ්ඡිං[2] යං මය්හං සකමස්සමං.

336. සහායො බ්‍රාහ්මණො මය්හං භරියං[3] ආදාය පුත්තකං
තයො ජනා සමාගන්ත්වා[4] ආගඤ්ඡුං පාහුනාගතං.

337. සම්මොදමානො තෙහි[5] සහ නිසින්නො සකමස්සමෙ
දාරකො වට්ටමනුක්ඛිපං ආසිවිසමකොපයි.

338. තතො සො වට්ටගතං මග්ගං අන්වෙ[6] සන්තො කුමාරකො
ආසිවිසස්ස හත්ථෙන උත්තමඞ්ගං පරාමසි.

339. තස්ස ආමසනෙ කුද්ධො සප්පො විස බලස්සිතො
කුපිතො පරමකොපෙන අඩංසි[7] දාරකං ඛණෙ.

340. සහ දට්ඨො ආසිවිසෙන[8] දාරකො පපති භූමියං
තෙනාහං දුක්ඛිතො ආසිං මම වාහසි තං දුක්ඛං.

341. ත්‍යාහං අස්සාස යිත්වාන දුක්ඛිතෙ සොකසල්ලිතෙ
පඨමං අකාසිං[9] කිරියං අග්ගං සච්චං වරුත්තමං.

342. සත්තාහමෙවාහං පසන්නචිත්තො පුඤ්ඤත්ථිකො අචරිං බ්‍රහ්මචරියං
අථාපරං යං චරිතං මමයිදං වස්සානි පඤ්ඤාස සමාධිකානි.[10]

343. අකාමකො වාහි[11] අහං චරාමි එතෙන සච්චෙන සුවත්ථි හොතු
හතං විසං ජීවතු යඤ්ඤදත්තො.

344. සහසච්චෙ කතෙ මය්හං විසවෙගෙන වෙධිතො
අබුජ්ඣිත්වාන වුට්ඨාසි ආරොගො චාසි මාණවො
සච්චෙන මෙ සමො නත්ථි එසා මෙ සච්චපාරමීති.

කණ්හදීපායන චරියං එකාදසමං.

1. මනුපාපයි-නා-කත්ථචි
2. ආගඤ්ජි-නා-කත්ථචි
3. භාරියං-කත්ථචි-අරියං-මජසං
හරියමාදය-නා-
4. සමා-මජසං
5. තෙති-නා-
6. අන්තෙ සන්තො-නා-
7. අදසිං - නා-කත්ථචි
8. අතිවිසෙන - නා-කත්ථචි
9. අකාසී-මජසං
10. සමාධිකාකි-නා-
11. අකාම කෙවාහං-මජසං

335. මම ඕහුට උපස්ථාන කොට (හෙවත්) ඔහු කරා එළැඹ නිරොග බවට පැමිණවීමි. ඔහු පිළිබිස මාගේ යම් අසපුවෙක් වී ද ඒ ස්වකීය අසපුව කරා පැමිණියෙමි.

336. මාගේ යහළු වූ ඒ බමුණු තෙම භාර්යාව හා පුත්‍රයා හා රැගෙන තුන් දෙන එක් වැ ආගන්තුක වැ පැමිණයා වූ මා කරා එළැඹියාහු යැ.

337. ඔවුන් සමග සතුටු වෙමින් සිය අසපුවෙහි හුන්නෙමි. දරු තෙමේ පන්දු කෙළිමින් සර්පයකු කොප කෙළේ යැ.

338. ඉක්බිති ඒ කුමර තෙමේ පන්දුව ගිය මග සොයනුයේ අතින් සර්පයාගේ හිස ස්පර්ශ කෙළේ යැ.

339. ඔහුගේ ස්පර්ශයෙහි ලා විෂබල ඇසුරු කළ සර්ප තෙමේ අධික වූ කොපයෙන් කිපියේ දරුවා ඒ කෙණෙහි දෂ්ට කෙළේ යැ.

340. සර්පයා විසින් දෂ්ට කරන ලදුයේ දෂ්ට කළ කාලය හා සමග දරු තෙමේ බිම වැටිණි. ඒ කරුණෙන් මම් දුකට පැමිණියෙමි. ඒ දුක (මාගේ ශරීරයෙහි වූවක් මෙන්) මට පැමිණියේ යැ.

341. මම් දුකට පැමිණි ශොකශල්‍යයෙන් විදුනාලද ඔවුන් අස්වසා පළමු කොට ශ්‍රෙෂ්ඨ වූ ඉතා උතුම් වූ සත්‍යක්‍රියාව කෙළෙම්.

342. මම් පහන්සිත් ඇතියෙමි පිනින් අර්ථ ඇතියෙම සත් දවසක් මුළුල්ලෙහි මැ බඹසර හසළෙමි. එයින් මතු මාගේ මේ යම් බඹසර සැරීමෙක් අධිකයක් සහිත පනස් හවුරුද්දක් මුළුල්ලෙහි වී ද (මෙතෙක් කල්)

343. මම් නො කැමැති වැ මැ බඹසර හැසිරෙමි. මේ සත්‍යයෙන් (දරුවාට) සුව වේවා. යඤ්ඤදත්ත තෙමේ නැසුණු විෂ ඇති වැ ජීවත් වේවා.

344. මා විසින් සත්‍යක්‍රියාව කළ කල්හි ඒ සත්‍යක්‍රියාව සමග විෂවෙගයෙන් කම්පිත වූයේ (විසංඥ භාවයෙන්) පිබිදී නැඟිසිටියේ ය. කුමාර තෙමේ ද අරොග විය. සත්‍යක්‍රියාවෙන් මාහා සමවූයෙක් නැති. තෙල මාගේ සත්‍යපාරමිතා යි.

**එකොළොස් වැනි කණ්හදීපායන චරියා යි.**

## 12. සුතසොම චරියං

345. පුනාපරං යදා හොමි සුතසොමො මහීපති
ගහිතො පොරිසාදෙන බ්‍රාහ්මණෙ සඞ්ගරං[1] සරිං.

346. ඛත්තියානං එකසතං ආවුණිත්වා කරත්තලෙ[2]
එතෙ සම්පමිලාපෙත්වා යඤ්ඤත්ථෙ උපනයී[3] මමං.

347. අපුච්ඡි[4] මං පොරිසාදො කිං ත්වං ඉච්ඡසි නිස්සජං[5]
යථාමති තෙ කාහාමි යදි මෙ ත්වං පුනෙහිසි.

348. තස්ස පටිස්සුණිත්වාන[6] පණ්හෙ ආගමනං මම
උපාගන්ත්වා පුරං රම්මං රජ්ජං නිය්‍යාදයිං තදා.

349. අනුස්සරිත්වා සද්ධම්මං[7] පුබ්බකං ජිනසෙවිතං
බ්‍රාහ්මණස්ස ධනං දත්වා පොරිසාදං උපාගමිං.

350. නත්ථි මෙ සංසයො තත්ථ ඝාතයිස්සති[8] වා නවා
සච්චවාචානුරක්ඛන්තො ජීවිතං චජිතු මුපාගමිං
සච්චෙන මෙ සමො නත්ථි එසා මෙ සච්ච පාරමීති

සුතසොම චරියං ද්වාදසමං.

**සච්ච පාරමිතා නිට්ඨිතා.**

---

1. සඞ්කාරං–නා–කත්ථචි
2. කරංතලෙ–කත්ථචි–කරත්තලෙ–මජසං
3. උපනාමයී–කත්ථචි
4. ආපුච්ඡිං–සිමු
5. නිස්සජ්ජ–මජසං
6. පටිසුණිත්වා–මජසං
7. සතං ධම්මං–මජසං–නා–කත්ථචි
8. සාතයිස්සාමි – නා

## 12. සුතසොම චරියාව

**345.** නැවත අනෙකක් කියමි: යම් කලෙක මම සුතසොම නම් මිහිපල් වූයෙම් ද එකල්හි පොරිසාදයා විසින් ගන්නා ලදුයෙම් නන්‍ද බ්‍රාහ්මණ කෙරෙහි (තමා හා) කළ ප්‍රතිඥාව සිහි කෙළෙමි.

**346.** එක්සියයක් කැත් රජුන්ගේ අතුල්තලයන් අවුණා තුලුන් (අහර සිඳීමෙන්) මලානික කොට මා යාග කිරීම සඳහා පැමිණ වී යැ.

**347.** පොරිසාද තෙම 'කිමෙක් ද තෙපි (මා අතින්) මිදීම කැමැත්තවු ද'යි මා විචාළේ යැ ඉදින් තෙපි මා වෙත වටාලා එන්නවූ නම් තොප ගේ කැමැත්ත පරිදි කරන්නෙමි' යි කී.

**348.** උදැසන මැ මාගේ පැමිණීම ඔහුට පිළින කොට සිත්කලු වූ ඉඳිපත්නුවරට පැමිණි එකල්හි තුන්සියක් යොදුන් රාජ්‍යය (මව්පියන්ට) පාවාදිනිමි.

**349.** පුරාතන වූ බුද්ධාදීන් විසින් සෙවුනා ලද සත්‍යවචන සඞ්ඛ්‍යාත සද්ධර්මය සිහි කොට නන්‍ද බ්‍රාහ්මණයාහට ධනය දී පොරිසාදයා කරා පැමිණියෙමි.

**350.** ඒ පොරිසාදයා වෙත එළැඹීමෙහි ලා කිම මේ තෙම මා නසන්නේ දෝ හෝ, නො නසන්මන් දෝහො'යි සැකයෙක් නැති. සබ-වස රක්නෙම් දිවි පුද පොරිසාදයා වෙත එළැඹියෙමි. සත්‍යවචනයෙන් ම හා සම වූයෙක් නැති. මේ මාගේ සත්‍යපරමාර්ථ පාරමිතා යි.

දෙළොස්වැනි සුතසොම චරියා යි.

**සත්‍යපාරමිතා නිමි.**

# 6. මෙත්තා පාරමිතා

## 13. සුවණ්ණසාම චරියං

351. සාමො යදා වනෙ ආසිං සක්කෙන අභිනිම්මිතො
පවනෙ සීහබ්‍යග්ඝෙහි ච මෙත්තාය මුපනාමයිං.

352. සීහබ්‍යග්ඝෙහි දීපිහි අච්ඡෙහි මහි[1]සෙහි ච
පසදමිගවරාහෙහි පරිවාරෙත්වා වනෙ වසිං.

353. න මං කොචි උත්තසති, නපිහං භායාමි කස්සචි,
මෙත්තාබලෙනුපත්ථද්ධො රමාමි පවනෙ තදා.

සුවණ්ණ සාම චරියං තෙරසමං.

## 14. එකරාජ චරියං

354. පුනාපරං යදා හොමි එකරාජාති විස්සුතො
පරමං සීලං අධිට්ඨාය[2] පසාසාමි මහාමහිං.

355. දසකුසලකම්මපථෙ වත්තාමි අනවසෙසතො
චතූහි සඞ්ගහවත්ථූහි සඞ්ගණ්හාමි[3] මහාජනං.

356. එවං මෙ අප්පමත්තස්ස ඉධලොකෙ පරත්ථ ච
දබ්බසෙනො උපාගන්ත්වා අච්ඡින්දන්තො පුරං මමං.[4]

357. රාජූපජීවෙ නිගමෙ සබලට්ඨෙ සරට්ඨකෙ[5]
සබ්බං හත්ථගතං කත්වා කාසුයං නිඛණී මමං.

358. අමච්චමණ්ඩලං රජ්ජං ඵීතං අන්තෙපුරං මම
අච්ඡින්දිත්වාන ගහිතං පියං පුත්තංව පස්සහං
මෙත්තාය මෙ සමො නත්ථි එසා මෙ මෙත්තාපාරමීති.

එකරාජචරියං චුද්දසමං.

මෙත්තා පාරමිතා නිට්ඨිතා.

---

1. මහිංසෙහි ච-මජසං
2. පරමංසීල මධිට්ඨාය-නා-
පරමසීලං අධිට්ඨාය-සුමු-
3. සංගහාමි-මජසං
4. පුරං මම-සමු-
5. සරලට්ඨකෙ-නා-

# 6. මෛත්‍රී පාරමිතාව

## 13. සුවණ්ණසාම චරියාව

351. යම් කලෙක මම් මහවෙනෙහි ශක්‍රයා විසින් (උපදෙස් දීමෙන්) උපදවන ලද සාම කුමාර වූයෙම් ද එකල්හි මහවෙනෙහි සිංහ ව්‍යාඝ්‍රයනුදු මෙත් වැඩීමෙන් පැතිර වීමි. (සිහ වගහු පවා මෙත්සිත් ලැබූහ'යි සේයි.)

352. සිහවගුන් විසිනුදු දිවියන් විසිනුදු වලසුන් විසිනුදු මීහිවුන් විසිනුදු පසදමුවන් හූරන් විසිනුදු පිරිවරා වෙනෙහි විසීමි.

353. කිසි සත්‍වයෙක් මා නො තැතිගන්වයි. (මම) කිසිවක්හට බිය නො වෙමි. එකල්හි මෙත් බලයෙන් වහල්ලදූයෙම් මහවෙනෙහි සිත්අලවා වාසය කෙළෙමි.

තෙළෙස්වැනි සුවණ්ණසාම චරියා යි.

## 14. එකරාජ චරියාව

354. නැවත අන් චරියාවක් කියමි. යම් කලෙක මම් එකරාජ යයි ප්‍රසිද්ධ වූයෙම් ද එකල්හි උතුම් වූ දශකුශල කර්මපථශීලය සමාදන වශයෙන් ඉටාගෙන මහපොළොව අනුශාසනා කෙළෙමි.

355. දශකුශලකර්මපථයෙහි නිරවශෙෂ කොට සමාදන් වැ පවතිමි. සිව්සඟරාවතින් මහාජනයා සඞ්ග්‍රහ කරමි.

356. මෙසේ මෙලොව ද පරලොව ද මා අප්‍රමාද වැ වසන කල්හි දබ්බසෙන නම් කොසොල් රජ (සිවුරඟසෙන් රැගෙන මාගේ රාජ්‍යයට) පැමිණ මා ගේ බරණැස් නුවර අසිදගන්නේ-

357. බලසෙනඟ සහිත වූ රටවැසියා සහිත වූ ඇමැති ආදි රාජූපජීවීන් ද නියම්ගම් වැසියන් ද යන සියල්ල අත්පත් කොට ගෙන මාවළෙක වළලැවී.

358. මා ගේ ඇමැතිමඬුලු ද සමෘද්ධ වූ රාජ්‍යය ද ඇතොවුරු ද අසිඳ ගත්නාලදූවහු මම් ප්‍රියපුත්‍රයකු සෙයින් දිටිමි. මෙත් වැඩීමෙන් මා හා සම වූයෙක් නැති. මේ මාගේ මෛත්‍රීපාරමිතාව යි.

තුදුස්වැනි එකරාජ චරියා යි.

මෛත්‍රී පාරමිතා නිමි.

# 7. උපෙක්ඛා පාරමිතා

## 15. මහාලොමහංස චරියං

359. සුසානෙ සෙය්‍යං කප්පෙමි ඡවට්ඨිකං උපනිධාය හං[1]
ගොමණ්ඩලා[2] උපාගන්ත්වා[3] රූපං දස්සෙන්ති නප්පකං[4]

360. අපරෙ ගන්ධඤ්ච මාලඤ්ච[5] භොජනං විවිධං බහුං
උපායනාන්‍යූපනෙන්ති හට්ඨා සංවිග්ගමානසා.

361. යෙ මෙ දුක්ඛං උපදහන්ති යෙ ච දෙන්ති සුඛං මම
සබ්බෙසං සමකො හොමි දයාකොපො[6] නවිජ්ජති.

362. සුඛදුක්ඛතුලාභූතො යසෙසු අයසෙසු ච
සබ්බත්ථ සමකො හොමි එසා මෙ උපෙක්ඛා පාරමීති.

මහාලොමහංස චරියං පණ්ණරසමං.

උපෙක්ඛා පාරමිතා නිට්ඨිතා.

### උද්දාන ගාථා:

363. යුධඤ්ජයො සොමනස්සො අයොඝර භිසෙන ච
සොණනන්දො[7] මූගපක්ඛො කපිරාජා[8] සච්චසව්හයො.

364. වට්ටකො මච්ඡරාජා ච කණ්හදීපායනො ඉසි
සුතසොමො පුන ආසිං සාමො ච එකරාජහු
උපෙක්ඛා පාරමී ආසි ඉති වුත්තං මහෙසිනා.

365. එවං බහුවිධං දුක්ඛං සම්පත්ති ච[9] බහුවිධා[10]
භවා භවෙ අනුභවිත්වා පත්තො සම්බොධිමුත්තමං.

366. දත්වා දතබ්බකං දනං සීලං පූරෙත්වා අසෙසතො
නෙක්ඛම්මෙ[11] පාරමිං ගන්ත්වා පත්තො සම්බොධිමුත්තමං.

---

1. උපනිධා–මජසං ජවට්ඨිං උපධායහං–
2. ගාමණ්ඩලා–මජසං
3. උපගන්ත්වා–නා–මජසං
4. දස්සෙන්ත නප්පකං–ප
5. ගන්ධමාල භුච–මජසං
6. දයකොපො–නා
7. සොණදණ්ඩො–නා–
8. කපිරාජ–නා–
9. සම්පත්තිංච–මජසං
10. බහුවිධං–මජසං–තත්ථවි
11. නෙක්ඛම්ම–මජසං

# 7. උපෙක්ඛා පාරමිතාව

## 15. මහාලොමහංස චරියාව

359. (ලොමහංස වැ උපන්) මම මිනීඇටයක් කන්වයින් කොට සොහොනෙකැ ශයනය කෙළෙමි. එකල්හි ගම්දරුවෝ මා වෙත පැමිණ නන්වදෑරුම් විප්‍රකාර දක්වූහ.

360. ඔවුන් කෙරෙහි ඇතැම් කෙනෙක් සතුටු වූවාහු සංවෙගයට පැමිණි සිත් ඇත්තාහු ගඳමල් ද විවිධ වූ බොහෝ වූ භොජන ද යන පඬුරු එළවත්.

361. යම් කෙනෙක් මට දුක් උපදවත් ද යම් කෙනෙක් මට සුව උපදවත් ද එ හැම දෙනකුන්ට සම වූයෙමි වෙමි. (උපකාරකයනට) දයාවෙක් හෝ (අපකාරකයනට)කොපයෙක් හෝ නැති.

362. සුවදුක් දෙක්හි දු යශස්හි දු අයශස්හි දු මැදහත් වූයෙමි සියලු අටලෝදහම්හි සම වූයෙමි වෙමි. මේ මාගේ උපෙක්ෂා පාරමිතා යි.

පසළොස්වැනි මහාලොමහංස චරියා යි.

උපෙක්ෂා පාරමිතා නිමි.

උද්දනය :

363. සුධඤ්ජය කුමාර වීමි. සොමනස්ස නම් කුමාර වීමි. භිසාප-දෙශයෙන් දක්වූ මහාකඤ්චන චරියාව සමග අයොඝර රාජකුමාර ද වීමි. සොණ පණ්ඩිත වීමි. මූගපක්ඛ නම් තෙමියකුමාර වීමි. කපිරාජ වැ උපන්මි. සච්ච නම් තාපස වීමි.

364. වට්ටකපොතක වීමි. මත්ස්‍යරාජ වීමි. කණ්හදීපායන නම් ඍෂි වීමි. නැවැත සුතසොම රජ වීමි. සාමකුමාර වැ ද එකරාජ වැ ද උපන්මි. ලොමහංස චරියාවෙහි මා ගේ උපෙක්ෂාපාරමිතාව විය. මෙසේ මහර්ෂි වූ මා විසින් බොධිචර්‍ය්‍යායෙහි හැසිරෙන ලද.

365. මෙසේ කුදුමහත් භවයෙහි. බහුප්‍රකාර වූ දුක් ද බහු ප්‍රකාර වූ සම්පත් ද විඳ උතුම් සම්බොධියට පැමිණියෙමි.

366. (දනපාරමිතාදි භෙද ඇති) දියයුතු දන් දී නිරවශෙෂ කොට (කායිකසංවරාදි භෙද ඇති) සිල් පුරා (ත්‍රිවිධ වූ මැ) මහාභිනිෂ්ක්‍රමණයෙහි පරතෙරට පැමිණ උතුම් වූ සම්බොධියට පැමිණියෙමි.

367. පණ්ඩිතෙ පරිපුච්ඡිත්වා විරියං කත්වාන මුත්තමං[1]
ඛන්තියා පාරමිං ගන්ත්වා පත්තො සම්බොධි මුත්තමං.

368. කත්වා දළ්හමධිට්ඨානං සච්චවාචානුරක්ඛිය[2]
මෙත්තාය පාරමිං ගන්ත්වා පත්තො සම්බොධිමුත්තමං.

369. ලාභාලාභෙ යසෙ අයසෙ සම්මානනාවමානනෙ
සබ්බත්ථ සමකො හුත්වා පත්තො සම්බොධි මුත්තමං.

370. කොසජ්ජං භයතො දිස්වා විරියාරම්භඤ්ච ඛෙමතො
ආරද්ධවිරියා හොථ එසා බුද්ධානුසාසනී[3]

371. විවාදං භයතො දිස්වා අවිවාදඤ්ච ඛෙමතො
සමග්ගා සඛිලා හොථ එසා බුද්ධානුසාසනී[4]

යුධඤ්ජයවග්ගො තතියො.

ඉත්ථං සුදං භගවා අත්තනො පුබ්බචරියං සම්භාවයමානො
බුද්ධාපදනියං නාම ධම්මපරියායං අභාසිත්ථාති.

චරියාපිටකපාළි සමත්තා[5]

---

1. උත්තමං-සිමු-
2. රක්ඛියා-නා-
3. බුද්ධාන සාසනී-අට්ඨ-සිමු-
4. බුද්ධානසාසනී-අට්ඨ-සිමු-
5. චරියා පිටකං නිට්ඨිතං-කත්ථචි

367. පණ්ඩිතයන් පිළිවිසැ (ප්‍රඥාපාරමිතාව පුරා) උතුම් වූ ප්‍රධන් වීර්‍ය්‍ය කොට ක්ෂාන්තියෙහි පරම කොටියට පැමිණ උතුම් වූ සම්‍යක්-සම්බොධියට පැමිණියෙමි.

368. කුශලසමාදනාදියට දෘඪ අධිෂ්ඨාන කොට (ජීවිතාන්තරායෙහි පවා) සත්‍යවචනය ආරක්ෂා කොට මෛත්‍රියෙහි පරමොත්කර්‍ෂයට පැමිණ උතුම් වූ සම්බොධියට පැමිණියෙමි.

369. ලාභාලාභයෙහි දු යශස් අයශස්හි දු සම්මානන අවමානනයෙහි දු සියලු තැන්හි සමසිත් ඇති වැ උතුම් වූ සම්බොධියට පැමිණියෙමි.

370. කුසීත බව භය විසින් දක වීර්‍ය්‍යාරම්භය නිර්භය විසින් ද දක (අධිශීලශික්ෂාදි) සම්භාගයෙහි ආරබ්ධවීර්‍ය්‍ය ඇති වවු. මේ බුදුවරුන්ගේ අනුශාසනා යි.

371. විවාදය භය විසින් ද අවිවාදය නිර්භය විසින් ද දක (කායචිත්ත දෙකින්) සමග වූවාහු (ඔවුනොවුන් කෙරෙහි මෘදු වූ සිත් ඇත්තාහු වවු) මේ බුදුවරුන්ගේ අනුශාසනායි.

372. (ස්මෘතිවිප්‍රවාස සඞ්ඛ්‍යාත) ප්‍රමාදය භය විසින් ද අප්‍රමාදය නිර්භය විසින් ද දක අෂ්ටාඞ්ගික වූ ආර්‍ය්‍යමාර්‍ගය වඩවු. මේ බුදුවරුන්ගේ අනුශාසනා යි.

**තුන් වැනි යුධඤ්ජයවර්‍ග යි.**

මෙසේ බුදුහු තමන් වහන්සේ ගේ පූර්‍වජාතීන්හි ප්‍රතිපත්ති දුෂ්කර-ක්‍රියාව අතැඹුලක් සෙයින් ප්‍රකාශ කරන සේක් බුද්ධාපදානිය නම් වූ ධර්මදෙශනාව වදළසේක.

**චරියාපිටකපෙළ නිමි.**

## සුත්තන්තපිටකෙ-ඛුද්දකනිකායෙ

# බුද්ධවංස පාළි

### ගාථාදිපාද-සූචි


අ

| | පිට්ඨඞ්කා |
|---|---|
| අක්කමිත්වාන මං බුද්ධො | 28 |
| අග්ගිචන්දං සූරියානං | 150 |
| අජපාලරුක්ඛමූලස්මිං | 30, 62, 68, 194, 202 |
| අච්චුතො ච සුමනො ච | 212 |
| අජ්ඣායකො මන්තධරො | 20 |
| අඤ්ජලිං පග්ගහෙත්වාන | 12 |
| අට්ඨඞ්ගවචනසම්පන්නො | 214 |
| අට්ඨදොසසමාකිණ්ණං | 24 |
| අට්ඨනවුති සහස්සානං | 152 |
| අට්ඨපඤ්ඤාස රතනං | 98, 112 |
| අට්ඨසතසහස්සානං | 100 |
| අට්ඨසත්තති සහස්සානං | 152 |
| අට්ඨසාරීරිකා ථූපා | 244 |
| අට්ඨාරසෙ කප්පසතෙ | 242 |
| අට්ඨාසීති රතනානි | 74, 120, 136 |
| අතික්කන්තා ගණනපථං | 84 |
| අතීතබුද්ධානං ජිනානං දෙසිතං | 18 |
| අතුලං දස්සෙත්වා ඔභාසං | 156 |
| අතුලාසි පභා තස්ස | 68 |
| අත්ථදස්සී ජිනවරො | 156 |
| අත්ථි හෙහිති සො මග්ගො | 20 |
| අදංසු තෙ මමොකාසං | 26 |
| අද්වෙජ්ඣවචනා බුද්ධා | 38 |
| අනාසවා වීතරාගා | 30, 194, 232, 234 |
| අනිට්ඨිතෙ මමොකාසෙ | 28 |
| අනිට්ඨගන්ධො පක්කමති | 36 |
| අනිවත්ති මානසං කත්වා | 202 |
| අනුකම්පකො කාරුණිකො | 126 |

අ

| | පිට්ඨඞ්කා |
|---|---|
| අනූලා ච උරුවෙලා ච | 230 |
| අනුව්‍යඤ්ජනසම්පන්නා | 198 |
| අනූනතිංස සහස්සානි | 204 |
| අනූන සොළසසහස්සානි | 220 |
| අනූපමං නාම නගරං | 204 |
| අනොමදස්සී ජිනො සත්ථා | 106 |
| අනොමදස්සිස්ස අපරෙන | 108 |
| අනොමදස්සී පදුමො | 240 |
| අනොවට්ඨෙන උදකං | 36 |
| අන්තලික්ඛම්හි ආකාසෙ | 208 |
| අපරම්පි ධම්මං දෙසෙන්ත | 142 |
| අපරිමෙය්‍යො ඉතො කප්පෙ | 240 |
| අබ්භුතො වත නො අජ්ජ | 8 |
| අභිඤ්ඤාබලපත්තානං | 138 |
| අභිවාදනං ථොමනඤ්ච | 10 |
| අමිතා අසමා චෙව | 128 |
| අරණී ච මිථිලායං | 246 |
| අරියඤ්ජසං ථොමයන්තා | 236 |
| අවිජ්ජං සබ්බං පදාලෙත්වා | 184 |
| අසමො ච සුනෙත්තො ච | 96 |
| අසීති භික්ඛුසහස්සානං | 184 |
| අසීති සතසහස්සානං | 170 |
| අසීති හත්ථමුබ්බෙධො | 58 |
| අහමෙතරහි සම්බුද්ධො | 234 |
| අහං තදා මාණවකො | 224 |
| අහං තෙන සමයෙන | 26, 56, 60, 68, 78, 192, 290 |
| අහු කපිලව්හයා රම්මා | 30, 62, 68, 194, 202 |
| අහො අච්ඡරියං ලොකෙ | 8, 16 |

ආ

පිට්ඨඞ්කා

ආකාසට්ඨා ච භුම්මට්ඨා 8, 34
ආචාරගුණසම්පන්නා 202
ආදාය මං ඝටීකාරො 226
ආදිත්තම්පි ච රාගග්ගි 200
ආනන්දො නාමුපට්ඨාකො 30
ආපත්ති අනාපත්තියා 14
ආභස්සරං සුභකිණ්හං 6
ආරද්ධවිරියො හුත්වා 226
ආරාමිකා ජනපද 140
ආලොකං දස්සයිත්වාන 190
ආහතෙ අමතභෙරිම්හි 122

ඉ

ඉදං සුත්වාන වචනං 32,62,68,194
ඉදානි යෙ එතරහි 234
ඉද්ධිවරං පුඤ්ඤවරං 190
ඉද්ධි ච ආදෙසනානුසාසනී 4
ඉධෙව පරිනිබ්බිස්සං 238
ඉධෙවාහං එතරහි 234
ඉන්ද්‍රියබල බොජ්ඣඞ්ගා 60
ඉමම්හි භද්දකෙ කප්පෙ 242
ඉමස්ස ජනිකා මාතා 30, 62, 194, 202
ඉමං ත්වං දුතියං තාව 40
ඉමං ත්වං පඨමං තාව 40
ඉමිනා මෙ අධිකාරෙන 28
ඉමෙ ධම්මෙ සම්මසන්තො 48

උ

උක්කාසිතඤ්ච ඛිපිතං 12
උක්කුට්ඨිසද්දං වත්තෙන්ති 32, 62, 194
උග්ගතො නාම සො රාජා 92
උග්ගරින්දො ච වසභො ච 120
උග්ගො ච සොමදෙවො ච 222

උ

පිට්ඨඞ්කා

උච්චත්තනෙන සො බුද්ධො 82, 88, 198, 222, 230
උත්තමං පවරං සෙට්ඨං 174
උත්තරා නන්දමාතා ච 236
උත්තරා ච ඵග්ගුනී චෙව 120
උපසඞ්කන්තො නරවසභං 138
උපසඞ්කමිත්වා පස්සන්ති 12
උපසඞ්කමිත්වා සම්බුද්ධං 186
උප්පජ්ජන්තෙ ච ඣායන්තෙ 26
උබ්බිග්ගා තසිතා භීතා 48
උය්‍යානෙ වෙස්සරෙ නාම 74
උරගොව තචං ජිණ්ණං 112
උරුවෙලො ච යසවො 136

එ

එකක්ඛන්ධො පවට්ටිත්ව 144
එකතිංසෙ ඉතො කප්පෙ 242
එකනවුතෙ ඉතො කප්පෙ 242
එකා දුයා තිදසපුරෙ 244
එකූනතිංස වස්සානි 236
එකො අජාතසත්තුස්ස 244
එකො ච රාමගාමම්හි 244
එකො ච සන්නිපාතො මෙ 234
එත්තකායෙව තෙ ලොකෙ 48
එතෙසං චිත්තමඤ්ඤාය 14
එථ සබ්බෙ සමාගන්ත්වා 12
එවමෙතෙන යොගෙන 76
එවමෙව මයං සබ්බෙ 32, 62, 196
එවමෙවාහං ඉමං කායං 24
එවමෙව සිද්ධිපත්තස්ස 26
එවං අහං සංසරිත්වා 228
එවං කිලෙසපරිරුද්ධො 22
එවං කිලෙසමලධොවං 22
එවං කිලෙසව්‍යාධීහි 22

### එ

| | පිටුඅංකය |
|---|---|
| එවං නිරාකුලං ආසි | 126 |
| එවං සබ්බගුණොපෙතං | 10 |
| එවාහං චින්තයිත්වාන | 24 |
| එසො හි සම්මාසම්බුද්ධො | 232 |
| එසො හි සඞ්ඝරතනො | 232 |

### ඔ

| | |
|---|---|
| ඔක්කන්ති මෙ සමොනත්ථි | 16 |
| ඔභාසං දස්සයිත්වාන | 162 |
| ඔභාසිතා ච පඨවී සදෙවකා | 4 |
| ඔවදිත්වා බහූ සත්තෙ | 182 |
| ඔවාදකො විඤ්ඤාපකො | 122 |
| ඔවාදං අනුසිට්ඨිං ච | 98 |

### ක

| | |
|---|---|
| කකුසන්ධස්ස අපරෙන | 216 |
| කකුසන්ධස්ස භගවතො | 208 |
| කකුසන්ධො ජිනවරො | 214 |
| කථිනත්ථාරසමයෙ | 108 |
| කප්පසතසහස්සම්හි | 240 |
| කප්පෙ ච සතසහස්සෙ ච | 20 |
| කස්සචි දෙති සාමඤ්ඤං | 54 |
| කස්සචී වරසමාපත්තියො | 54 |
| කස්සපස්ස භගවතො | 226 |
| කාලො'යං තෙ මහාවීර | 14 |
| කාසාවඤ්ච බ්‍රහ්මලොකෙ | 240 |
| කාසිකං නාම නගරං | 182 |
| කිමෙම අඤ්ඤාතකවෙසෙන | 28 |
| කිමෙම එකෙන තිණ්ණෙන | 28 |
| කිං එතං අච්ඡරියං ලොකෙ | 14 |
| කිං භවිස්සති ලොකස්ස | 50 |
| කී දිසො තෙ මහාවීර | 16 |
| කුඩ්ඩා කවාටා භිත්තී ච | 128 |
| කුඩ්ඩා කවාටා සෙලා ච | 48 |

### ක

| | පිටුඅංකය |
|---|---|
| කෙවලං සබ්බං ඤත්වාන | 132 |
| කෙසෙ මුඤ්චිත්වාහං තත්ථ | 28 |
| කොටිසතසහස්සානං | 60, 78 |
| කොණාගමනස්ස අපරෙන | 224 |
| කොණාගමනො සම්බුද්ධො | 222 |
| කොණ්ඩඤ්ඤස්ස අපරෙන | 68,240 |
| කොණ්ඩඤ්ඤො පවරො බුද්ධො | 66 |
| කොලිතො උපතිස්සො ච | 62, 68 |

### ඛ

| | |
|---|---|
| ඛණ්ඩො ච තිස්සනාමො ච | 188 |
| ඛීණාසවසතසහස්සානං | 170 |
| ඛීණාසවෙහි විමලෙහි | 12,66 |
| ඛෙමකං නාම නගරං | 172 |
| ඛෙමා උප්පලවණ්ණා ච | 62, 194 |
| ඛෙමා ච සච්චනාමා ච | 162 |

### ග

| | |
|---|---|
| ගජ්ජිතා කාලමෙසො ච | 14 |
| ගායන්ති සෙලෙන්ති ච වාදයන්ති | 10 |

### ඝ

| | |
|---|---|
| ඝටානෙකසහස්සානි | 48 |

### ච

| | |
|---|---|
| චක්කවත්ති මණි නාම | 136 |
| චඞ්කමං තත්ථ මාපෙසිං | 24 |
| චඞ්කමෙ චඞ්කමන්තොව | 16 |
| චතුදීපෙ මහාරජ්ජං | 140 |
| චතුනවුතෙ ඉතො කප්පෙ | 242 |
| චතුමාසං යදා බුද්ධො | 224 |
| චතුවීසති සහස්සානි | 196 |
| චත්තාරීසසහස්සානි | 56, 236 |
| චත්තාරො අසඞ්ඛ්‍යායා | 14 |
| චත්තාලීස සමා දන්තා | 214 |

ච

පිටඞ්කා

චන්දප්පභා සුරියප්පභා 112
චන්දෙ ච චන්දිමන්තා ච 183
චන්දෙ ච විමලො සුද්ධො 138
චම්පකං නාම නගරං 112
චම්පකා සළලා නීපා 28
චලති රවති පඨවී 48
චාතුවණ්ණ පරිවුතං 172
චාලා ච උපචාලා ච 182
චිත්තො ච හත්ථාළවකො 32, 194
චුති ච උපපත්ති ච 38

ඡ

ඡන්නං සතසහස්සානං 102

ජ

ජනසන්නිපාතො අතුලො 146
ජම්බුතො ඵලමානෙත්වා 164
ජලන්තං දීපරුක්ඛංව 10, 12
ජාතිධම්මො ජරාධම්මො 20
ජොතයිත්වාන සද්ධම්මං 58

ත

තක්කු ඤාණං අකිරිය 82
තතො පදක්ඛිණං කත්වා 30, 62, 68
තතොපරක්කු- දෙසෙන්තා 60, 92, 234
තතො'පරම්හි සමයෙ 100
තතො පරම්පි වස්සන්තෙ 100, 122
තතොපරං නවුතිකොටි 146
තතොපරං සන්නිපාතෙ 78
තතො විකුබ්බනං කත්වා 216
තත්ථ ඤාණවරුප්පජ්ජි 114
තත්ථ ඨත්වා විචින්තෙසිං 26
තත්ථ පධානං පදහිං 24

ත

පිටඞ්කා

තත්ථප්පමත්තා-විහරන්තා 64, 72, 134
තත්ථ සබ්බකිලෙසානි 114
තත්ථාසිරුක්ඛො යසවිපුලො 114
තත්ථෙව-මණ්ඩකප්පම්හි 138, 152, 153, 200
තථෙව ත්වම්පි අධිට්ඨානෙ 46
තථෙව ත්වම්පි සච්චෙසු 46
තථෙව ත්වම්පි සුඛදුක්ඛෙ 48
තථෙව ත්වම්පි හිතාහිතෙ 48
තථෙව ත්වං චතූසු භූමිසු 40
තථෙව ත්වං සබ්බකාලං 42
තථෙව ත්වං සබ්බභවෙ 42, 44
තථෙව යාචකෙ දිස්වා 40
තථෙවිමං පූතිකායං 22
තද තෙ භොජයිත්වාන 54
තද තෙ විමලා භික්ඛූ 108
තද දෙවමනුස්සානං 114
තදපහං අසමසමං 116
තදපි ධම්මදෙසනෙ 76
තදපි මං බුද්ධධම්මං 88
තදපි සො මහාවීරො 110
තද පීතිමනුබ්‍රෑහන්තා 72
තදහං නාගභවනං 78
තපුස්සභල්ලිකානං 58
තමන්ධකාරං විධමෙත්වා 170
තමහං උපසඞ්කම්ම 68
තඤ්ඤිං වචනමනෙ ධීරො 6
තස්ස ගිලානපුච්ඡාය 87
තස්ස දත්වාන ආරාමං 146
තස්ස ධම්මං සුණිත්වාන 146
තස්ස පුත්තො ව්‍යාකාසිං 18
තස්ස බුද්ධස්ස අසමස්ස 202
තස්ස බ්‍යාමප්පභා කායා 120, 198
තස්ස යාගං පකිත්තෙන්තො 92

ත

පිට්ඨඞ්කා

තස්ස සම්මසතො ධම්මං 50
තස්ස සරීරෙ නිබ්බත්තා 90
තස්ස සීලං සමාධිඤ්ච 84
තස්සාපි අතුලතෙජස්ස 108, 164
තස්සාපි අතුලං සීලං 108
තස්සාපි අතුලා ඉද්ධි 170
තස්සාපි දෙව-
දෙවස්ස 150, 158, 216, 224
තස්සාපි ලොකනාථස්ස 152
තස්සාපි වචනං සුත්වා 88, 112
තස්සාභිසමයා තීණි 84
තස්සාහං වචනං සුත්වා 62, 68
තාය පරිසාය සම්බුද්ධො 92
තාරණීයෙ තාරයිත්වා 82
තාරාගණා විරොචන්ති 36
තාවතා තිට්ඨමානොහං 238
තාවතිංසා ච යාමා ච 6
තිචත්තාරීස සහස්සානි 118, 126
තිත්ථියෙ අභිමද්දන්තො 60
තිසොළස සහස්සානි 134
තිස්සා ච උපතිස්සා ච 66
තිස්සො ච භාරද්වාජො ච 230
තිස්සො ජිනවරො බුද්ධො 176
තිංසකප්පසහස්සම්හි 240
තීණි දසසහස්සානි 182
තීණි සතසහස්සානි 56, 64
තුට්ඨහට්ඨො පමුදිතො 26
තුලා සඞ්ඝාටානුවගතා 6
තුවං සත්ථා ච කෙතු ච 6
තුසිතා කායා චවිත්වාන 16
තෙත්තිංස සතසහස්සානි 150
තෙත්තිංස සහස්සානි 104
තෙන යොගෙන ජනකායං 54
තෙපි ඛීණාසවා භික්ඛූ 82

ත

පිට්ඨඞ්කා

තෙ මෙ පුට්ඨා බ්‍යාකංසු 26
තෙපි සබ්බෙ අමිතයසා 136
තෙවිජ්ජඡළභිඤ්ඤෙහි 136
තෙවිජ්ජදසනං දත්වා 232
තෙවීසති සහස්සානි 104
තෙ සට්ඨි සහස්සානි 82
තෙසං තදා සඤ්ඤතෙහි 50
තෙහි පුත්තපසුතො සො 52
තෙහි භික්ඛූහි පරිවුතො 12

ථ

ථලජා දකජා පුප්ඵා 43

ද

දස දිසා පභාසෙත්වා 238
දස ධම්මෙ පූරයිත්වාන 216
දස නාගබලා කායෙ 10
දස පාරමී තයා ධීර 18
දස වස්සසහස්සානි 56, 64, 112, 156
දසවීස සහස්සානං 56, 234
දසසහස්සී අතික්කම්ම 4
දසසහස්සී ලොකධාතු 4, 8, 34
දසහි සද්දෙහි අවිවිත්තං 20
දසන්නං මෙ අතික්කන්තෙ 32
දස්සනෙනපි තං බුද්ධං 100
දස්සයිත්වා ඉද්ධිබලං 90
දළ්හං පග්ගණ්හ වීරියං 38
දානං සීලං ච නෙක්ඛම්මං 16
දමා චෙව සමාලා ච 206
දිබ්බචක්ඛූනං යො අග්ගො 14
දිබ්බං මන්දාරවං පුප්ඵං 6, 28, 170
දිබ්බං මානුසකං පුප්ඵං 50
දීපඞ්කරස්ස අපරෙන 60, 240

## ද

| | පිට්ඨඞ්කා |
|---|---|
| දීපඞ්කරස්ස භගවතො | 240 |
| දීපඞ්කරො ජිනො සත්ථා | 58 |
| දීපඞ්කරො ලොකවිදූ | 30, 32 |
| දුතියො කොටිසහස්සානං | 68 |
| දුතියො නවුතිකොටීනං | 170 |
| දුවෙ වස්සසහස්සානි | 228 |
| දෙවතා දෙවකඤ්ඤා ච | 8 |
| දෙවලොකෙ වසිත්වාන | 94 |
| දෙවලො ච සුජාතො ච | 128 |
| දෙවා මනුස්සා පස්සන්ති | 28 |
| දෙසෙන්තො පරමං ධම්මං | 138 |
| ද්වෙ නවුතෙ ඉතො කප්පෙ | 242 |

## ධ

| | |
|---|---|
| ධනඤ්ජයො විසාඛො ච | 182 |
| ධම්මචක්කං ධාරයිත්වාන | 74 |
| ධම්මචක්කං පවත්තෙන්තො | 60, 178, 192, 200 |
| ධම්මචෙතිං සමුච්චිත්වා | 222 |
| ධම්මතළාකං මාපෙත්වා | 230 |
| ධම්මදස්සිස්ස අපරෙන | 164 |
| ධම්මදස්සී මහාවීරො | 162 |
| ධම්මමෙසං පවත්තෙත්වා | 198 |
| ධම්මවිමලමාදාසං | 230 |
| ධම්මං විත්ථාරිකං කත්වා | 206 |
| ධම්මො චෙව සුධම්මො ච | 156 |
| ධම්මාපණං පසාරෙත්වා | 214 |
| ධම්මාභිසමයො තස්ස | 100 |
| ධරණූපමො ඛමනෙන | 60 |
| ධාතුවිත්ථාරිකං ආසි | 216 |

## න

| | පිට්ඨඞ්කා |
|---|---|
| නකුලො ච නිසභො ච | 156 |
| න කෙචි තෙන සමයෙන | 120 |
| නගරං අරුණවතී නාම | 186 |
| නගරං උත්තරං නාම | 72 |
| නගරං කපිලවත්ථු මෙ | 236 |
| නගරං ඛෙමවතී නාම | 212 |
| නගරං චන්දවතී නාම | 104 |
| නගරං ධඤ්ඤවතී නාම | 118 |
| නගරං බන්ධුමතී නාම | 188 |
| නගරං බාරාණසී නාම | 228 |
| නගරං රම්මවතී නාම | 56, 64 |
| නගරං හංසවතී නාම | 126 |
| නගරං සබ්බඞ්ගසම්පන්නං | 20 |
| නගරං සොභවතී නාම | 220 |
| නගරෙ අමරවතියා | 20 |
| න තස්ස කණ්ටකා හොන්ති | 144 |
| නන්දො චෙව සුනන්දො ච | 58 |
| නන්දිවඩ්ඪො සිරිවඩ්ඪො | 104 |
| නන්දො චෙව විසාඛො ච | 74 |
| නරදෙවස්ස යක්ඛස්ස | 208 |
| නවවස්සසහස්සානි | 72, 80, 134 |
| නවුතිවස්සසහස්සානං | 178 |
| නවුතිවස්සසහස්සානි | 74, 82 |
| න හෙතෙ එත්තකායෙව | 40, 42 |
| න හෙතෙ ජානන්ති- සදෙවමානුසා | 2 |
| න හොති අරති සත්තානං | 36 |
| නාගො ච නාගසමාලො ච | 144 |
| නාරදස්ස අපරෙන | 122, 240 |
| නාරදස්ස භගවතො | 240 |
| නාරදො ජිනවසභො | 120 |
| නිජ්ජිනිත්වා කිලෙසෙ සො | 76 |
| නිමිත්තෙ චතුරො- දිස්වා | 56, 64 70, 196 |
| නිරන්තරං අකුටිලං | 76 |
| නිරයෙසු දසසහස්සී | 38 |

### න

පිට්ඨඞ්කා

නිස්සභො ච අනොමො ච 104
නෙකානං නාගකොටීනං 181
නෙරඤ්ජරාය තීරම්හි 30, 62
68, 194, 202

### ප

පකරණෙ සත්ත දෙසෙන්තො 216
පක්කන්ත චාරිකං රට්ඨෙ 200
පච්චන්තදෙසවිසයෙ 26
පච්ඡිමගමනා වත්තන්ති 28
පඤ්චන්නං භික්ඛුසතානං 10
පඤ්චභික්ඛු සතා සබ්බෙ 12
පඨමාභිසමයෙ බුද්ධො 54, 108
පඨවියං නිපන්නස්ස 28
පත්තඤ්ච චීවරං දත්වා 208
පත්තුන්නං චීනපට්ටඤ්ච 296
පත්වාන බොධිමතුලං 68
පදුමස්ස අපරෙන 114
පදුමුත්තරස්ස අපරෙන 130
පදුමුත්තරස්ස භගවතො 122
පදුමුත්තරො ජිනො බුද්ධො 128
පදුමො චෙව කුඤ්ජරො ච 88
පදුමො ජිනවරො සත්ථා 112
පදුමො ඵුස්සදෙවො ච 162
පධානචාරං චරිත්වාන 58
පරික්ඛාරං අවසෙසං 246
පරිපක්කමානසෙ සත්තෙ 112
පල්ලඞ්කාභුජනෙනං මය්හං 32
පල්ලඞ්කෙන නිසීදිත්වා 32
පසන්නනෙත්තො සුමුඛො 130
පස්සථ ඉමං තාපසං 30
පස්සන්ති තං දෙවසඞ්ඝා 6, 8
පාටලිපුත්ත නගරෙ 244

### ප

පිට්ඨඞ්කා

පාටිහීරං කරොන්තො ච 216
පාපුණිත්වාන සම්බුද්ධො 138
පාපුණිත්වාන සම්බොධිං 114
පාලිතො සබ්බදස්සී ච 150
පීතිපාමොජ්ජ ජනනං 18
පුණ්ණමාසෙ යථා චන්දො 52
පුන චාරිකං පක්කන්තො 122
පුන නාරදකූටම්හි 56
පුනබ්බසුමිත්තො නාගො ච 190
පුනාපරං අමිතයසො 130, 184
පුනාපරං කුම්භකණ්ණං 130
පුනාපරං දසබලො 130
පුනාපරං දෙවකූටෙ 130
පුනාපරං පුරගණො 92
පුනාපරං යද බුද්ධො 152, 158
පුනාපරං රාජපුත්තො 92
පුනාපරං සන්නිපාතෙ 138
පුනාපරං සො නරාසභො 108
පුනාපරං හිමරථෙ 164

### ඵ

ඵලමාකඞ්ඛමානානං 234
ඵල චත්තාරි සාමඤ්ඤෙ 76
ඵුස්සස්ස ච අපරෙන 184
ඵුස්සා චෙව සුදත්තා ච 174
ඵුස්සො ජිනවරො සත්ථා 182

### බ

බහුං දුස්සවරං දත්වා 192
බහූ දෙවෙ මනුස්සෙ ච 190
බාරාණසියං ඉසිපතනෙ 236
බිලාසයා දරීසයා 36
බුද්ධස්ස වචනං සුත්වා 38, 50
බුද්ධොති තෙසං සුත්වාන 8

බ

පිටුඅඞ්කා

බුද්ධොති මම සුත්වාන 26
බොධනෙය්‍යං ජනං දිස්වා 54
බ්‍යාමප්පභා සදා මය්හං 236
බ්‍රහ්මදෙවො ච උදයො ච 174
බ්‍රහ්මා ච ලොකාධිපතී සහම්පතී 2
බ්‍රහ්මුනා යාචිතොසන්තො 64, 72, 82, 196
බ්‍රාහ්මණො ච අග්ගිදත්තො ච 212
බ්‍රාහ්මණො බ්‍රහ්මදත්තො ච 228

භ

භගවා ච තම්හි සමයෙ 16
භද්දසාලො ජිතමිත්තො 120
භද්දෙ චෙව සුභද්දෙ ච 64, 88
භයං තදා න භවති 36
භික්ඛුසතසහස්සානං 192
භිය්‍යසො උත්තරො නාම 220
භියොය්‍යා චෙව අසමො ච 112
භුම්මා මහාරාජිකා තාවතිංසා 4

ම

මඛිලා ච පදුමා චෙති 196
මඞ්ගලස්ස අපරෙන 76
මඞ්ගලො ච සුමනො ච 240
මණිමුත්තා වාලුකාකිණ්ණා 6
මණ්ඩකප්පො ච සො ආසි 122
මදනිම්මදනං සොකනුදං 18
මධුරායං භගවතො පත්තා 244
මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති 30
මම අච්ඡරියං දිස්වා 226
මයි පබ්බජිතෙ සන්තෙ 170
මහා අච්ඡරියං දිස්වා 200
මහා කස්සපොපි ච ථෙරො 14

ම

පිටුඅඞ්කා

මහාගොතමො ජිනවරො 244
මහාදානං පවත්තෙත්වා 202
මහාදිට්ඨිං විනොදෙන්තො 200
මහාදොණං නාගරාජං 114
මහාවාතා න වායන්ති 34
මහාවිලාසො තස්ස ජනො 222
මහාසමුද්දෙ ආභුජති 34
මහාහනුසභක්ඛන්ධො 54
මානුසකා ච දිබ්බා ච 34
මාරසෙනං පමද්දිත්වා 192
මුඤ්චන්ති පුප්ඵං පන පඤ්චවණ්ණිකං 6
මෙඛලං නාම නගරං 60, 80

ය

යථා අන්දුඝරෙ පුරිසො 42
යථා අරිහි පරිරුද්ධො 22
යථා ආපන්නසත්තානං 40
යථා උච්චාරට්ඨානම්හි 22
යථා උළුහි ගගණං 120
යථා යා කාචි නදියො 52
යථා ඛිත්තං නභෙ ලෙඩ්ඩු 38
යථා ගූථගතො පුරිසො 22
යථා තුය්හං මහාවීර 10
යථා නික්ඛන්තසයනස්ස 40
යථාපි උණ්හෙ විජ්ජන්තෙ 22
යථාපි උදකං නාම 46
යථාපි ඔසධී නාම 46
යථාපි කුණපං පුරිසො 22
යථාපි කුම්භො සම්පුණ්ණො 40
යථාපි ජජ්ජරං නාවං 24
යථාපි චමරී වාලං 40
යථාපි දුක්ඛෙ විජ්ජන්තෙ 20
යථාපි පථවී නාම 44, 48

ය

පිටඞ්කා

යථාපි පබ්බතො සෙලො 46
යථාපි පාපෙ විජ්ජන්තෙ 22
යථාපි පුරිසො චොරෙහි 24
යථාපි බ්‍යාධිතො පුරිසො 23
යථාපි භික්ඛු භික්ඛන්තො 42
යථාපි සබ්බසත්තානං 38
යථාපි සමයෙ පත්තෙ 50
යථාපි සාගරෙ ඌමි 74
යථාපි සාගරො නාම 98
යථාපි සීහො මිගරාජා 44
යථා මනුස්සා නදිං තරන්තා 32, 62, 196
යථා යෙ කෙචි සම්බුද්ධා 50, 52
යථා රත්තික්ඛයෙ පත්තෙ 38
යථා සුදුල්ලං පවනං 96
යදා අරින්දමං රාජං 84
යදා ච දෙවභවනම්හි 54
යදා ච පදුමො බුද්ධො 108
යදා දෙවා මනුස්සා ච 76
යදා දොණමුඛං හත්ථිං 146
යදා බුද්ධො අත්ථදස්සී 106, 152
යදා බුද්ධො ධම්මදස්සී 158
යදා බුද්ධො ධම්මං දෙසෙසි 164
යදා බුද්ධො පාපුණිත්වා 130
යදා බුද්ධො බුද්ධගුණං 114
යදා වෙරොචනො නාගො 116
යදා සක්කො උපගඤ්ඡි 58
යදා සක්කො දෙවරාජා 78
යදා සුජාතො අමිතයසො 138
යදා සුජාතො අසමසමො 138
යදා සුනන්දො චක්කවත්තී 68
යදාහං තුසිතෙ කායෙ 14

ය

පිටඞ්කා

යදාහං මාතුකුච්ඡිතො 16
යදි බුද්ධස්ස සොධෙථ 26
යදිමස්ස ලොකනාථස්ස 32, 62, 196
යනූනිමං පූතිකායං 23
යමකං පාටිහීරඤ්ච 192
යමකං විකුබ්බිනං කත්වා 224
යමහං අජ්ජ බ්‍යාකාසිං 50
යම්හි කාලෙ මහාවීරො 56, 76, 114, 122
යා පුබ්බෙ බොධිසත්තානං 34
යාව අට්ඨාසි සම්බුද්ධො 74
යාවතා නිරයා නාම 38
යාවතා පරිසා ආසි 48
යාවතා බුද්ධභණිතං 226
යෙ අප්පමත්තා අඛිලා 76
යෙ කෙචි තෙන සමයෙන 56
යෙ තත්ථාහු ජිනපුත්තා 32
යොපි පඤ්ඤාය අසමො 84

ර

රජො නුද්ධංසති උද්ධං 36
රම්මො චෙව සුදත්තො ච 98
රහොගතො නිසීදිත්වා 20
රාගො තදා තනු හොති 36
රාධා චෙව සුරාධා ච 112
රාමා චෙව සුරාමා ච 134
රාහු මුත්තො යථා සුරියො 52
රූපෙ සීල සමාධිම්හි 13
රෙවතස්ස අපරෙන 92
රෙවතො යසධරො බුද්ධො 90
රොගා තදුපසම්මන්ති 36

## ල

පිට්ඨඞ්කා

ලක්ඛණෙ ඉතිහාසෙ ච 226
ලතා වා යදි වා රුක්ඛා 34
ලොකප්පසාදකං නාම 12
ලොකෙ අච්ඡරියං දිස්වා 140

## ව

වත්ති චක්කං මහාවීරො 58
වන්දිත්වා සිරසා පාදෙ 108
වරුණො ච සරණො ච 82
වරුණො බ්‍රහ්මදෙවො ච 88
වලාහකොව අනිලෙන 176
වසති තත්ථ ඛෙමපුරෙ 212
වස්සසතසහස්සානි 66, 106, 112
වස්සං වුත්ථස්ස භගවතො 78
වාපිතං රොපිතං ධඤ්ඤං 24
විචිත්තපුප්ඵා ගගනා 34
විචිනන්තො තද දක්ඛිං 40,42
විතිණ්ණා චෙව තිස්සො ච 128
විත්ථාරිතං බාහුජඤ්ඤං 56, 234
විධුරො සඤ්ජීව නාමො ච 212
විපස්සිස්ස අපරෙන 192
විපස්සී ජිනවරො බුද්ධො 190
විපුලාභං දස්සයිත්වාන 168
විමලො හොති සුරියො 38
විරොචමානො විමලො 234
වීසති වස්සසහස්සානි 230
වෙදජාතං ජනං දිස්වා 26
වෙදයන්ති ච තෙ සොත්ථිං 50
වෙභාරං නාම නගරං 166
වෙස්සභූ ජිනවරො සත්ථා 206
වෙස්සභුස්ස අපරෙන 208
ව්‍යාහතා තිත්ථියා සබ්බෙ 126

## ස

පිට්ඨඞ්කා

සකං සකං හි භවනෙ 8
සඞ්ඛා ච පණවා චෙව 8
සඞ්ඛාරානං සභාවත්තං 74
සඞ්ගීතියො පවත්තෙන්ති 8
සඤ්ඡඩ්ඪිතං කුලමූලං 220
සට්ඨිභික්ඛු සහස්සානං 204
සට්ඨිවස්ස සහස්සානි 90
සට්ඨි සතසහස්සානි 187
සතවස්ස සහස්සානි 58, 198
සතිප්ලකං දත්වාන 230
සත්තති භික්ඛුසහස්සානං 192
සත්ත ච වස්සසහස්සානි 196
සත්තාහං පටිසල්ලානා 84
සත්තාහං වරසමාපත්තියා 108
සත්තුත්තමො අනධිවරො විනායකො 4
සදෙව ගන්ධබ්බමනුස්සරක්ඛසා 4, 6
සද්ධම්ම පණ්ඩරච්ඡත්තං 232
සන්තාරෙත්වා බහුජ්ජනං 128
සන්තො ච උපතිස්සො ච 156
සඤ්ඤකො ධම්මකො චෙව 150
සන්නිපාතා තයො ආසුං 54, 60, 78, 84, 192, 196
සබ්බඤ්ඤුතං ගවෙසන්තො 220
සබ්බාකාරෙන භාසතො 184
සබ්බීතියො විවජ්ජන්තු 50
සබ්බෙ තත්ථ සමාගන්ත්වා 126
සබ්බෙ දෙවා පදිස්සන්ති 38
සමතිංස සහස්සානි 72, 172
සමාදියිත්වා බුද්ධගුණං 50
සමුද්ද ච උත්තරා චෙව 220
සම්බලො ච සිරී චෙව 174
සම්බලො ච සුමිත්තො ච 168

## ස

පිටුඅංකා

සම්පන්නවිජ්ජාචරණස්ස තාදිනො 2
සරණාගමනෙ කඤ්චි 54
සරණො භාවිතත්තො ච 82
සරණො සබ්බකාමො ච 134
සරණං නාම නගරං 160
සහස්සියම්හි ලොකස්මිං 32
සංසාරසොතං ඡින්දිත්වා 30
සංසාර සොතං තරණාය 120
සාගරො ච අසඞ්ඛොභො 100
සා ච අතුලියා ජිනස්ස 66
සා ච ඉද්ධි සො ච යසො 58
සාටකං පජහිං තත්ථ 24
සාධූති තෙ පටිස්සුත්වා 12
සාමා ච චම්පා නාමා ච 212
සාරිපුත්තො මහාපඤ්ඤො 10, 12 16
සාලා ච උපසාලා ච 112
සිඛී මුනිවරො බුද්ධො 189
සිද්ධත්ථස්ස අපරෙන 170
සිද්ධත්ථො මුනිවරො බුද්ධො 168
සිරිවඩ්ඪා ච නන්දා ච 196
සීතං ව්‍යපගතං හොති 34
සීලකඤ්චුකං දත්වාන 230
සීවලා ච අසොකා ච 74
සීවලා ච සුරාමා ච 168
සුඛුමනිපුණත්ථපටිවිද්ධො 14
සුඛෙන සුඛිතො හොමි 32
සුජාතස්ස අපරෙන 146
සුජාතා ධම්මදින්නා ච 150
සුජාතො ජිනවරො බුද්ධො 144
සුත්තන්තං විනයඤ්චාපි 64, 68, 134, 142, 180
සුදත්තො චෙව චිත්තො ච 144

## ස

පිටුඅංකා

සුදස්සනං නගරවරං 130
සුදස්සනං නාම නගරං 134
සුදස්සනො ච දෙවො ච 144
සුදස්සනො දෙවරාජා 146
සුදෙවො ධම්මසෙනො ච 74
සුධඤ්ඤං නාම නගරං 150
සුධම්මං නාම නගරං 96
සුධම්මදෙවපුරෙ රම්මෙ 224
සුනන්දස්සානුචරා ජනතා 68
සුන්දරී ච සුමනා ච 106
සුපිපජීතං පාවචනං 56, 106
සුඵුල්ලං සාලරාජං ච 10
සුඵුල්ලො සාලරාජා ච 162
සුප්පියා ච සමුද්දා ච 168
සුභද්දො කටිස්සහො චෙව 162
සුමඞ්ගලො සටීකාරො ච 230
සුමඞ්ගලො ච තිස්සො ච 58
සුමඞ්ගලං නාම නගරං 142
සුමනස්ස අපරෙන 84
සුමිනො යසධරො බුද්ධො 82
සුමෙධො ජිනවරො බුද්ධො 136
සුරක්ඛිතො ධම්මසෙනො ච 182
සුරින්ද දෙවභවනෙ 68
සො අට්ඨාසීතිහත්ථානි 66
සො කස්සපො ජිනවරො 232
සො ච බුද්ධො අසමසමො 98, 144
සො ච රුක්ඛො ජාතරුචිරො 144
සො ච සත්ථා අමිතයසො 106
සො ඡෙත්වා බන්ධනං සබ්බං 100
සො ජිනො සකගෙහම්හි 92
සොණො ච උපසොණො ච 82
සොණො ච උත්තරො චෙව 204
සොණො ච උපසොණො ච 66

### ස

පිට්ඨඞ්කා

සොත්ථිකො චෙව රම්මො ච 206
සොපි තදා අමතභෙරිං 76
සොපි පත්වාන සම්බොධිං 174
සොපි ධම්මං පකාසෙසි 84
සොපි බුද්ධො අමිතයසො 146
සොපි මං බුද්ධො ව්‍යාකාසි 62, 68, 78, 194
සොපි මං මුනි ව්‍යාකාසි 208
සො පියදස්සී මුනිවරො 150
සොපි සබ්බං තමං හන්ත්වා 178
සො බුද්ධො චක්කවත්තිස්ස 114
සො බුද්ධො දසසහස්සිම්හි 170
සොභනං නාම නගරං 156
සොභිතස්ස අපරෙන 100, 240
සොභිතො ච සම්බුද්ධො 98
සො යාචිතො දෙවවරෙන චක්ඛුමා 4
සො වස්සසහස්සානි 126

### හ

හත්ථියානං නිම්මිනිත්වා 192
හන්ද බුද්ධකරෙ ධම්මෙ 40
හන්දහං දස්සයිස්සාමි 2
හිමවන්තස්ස අවිදූරෙ 24
හිඞ්කාරං සාධුකාරඤ්ච 8

# බුද්ධවංස පාළි

## සඤ්ඤානාමානුක්කමනිකා


| | පිට්ඨඞ්කා |
|---|---|
| **අ** | |
| අකණිට්ඨ | 6 |
| අජපාල | 30 |
| අතිදෙව | 84 |
| අතුල | 78, 199 |
| අත්ථදස්සී | 152 |
| අනුපම | 82, 168 |
| අනුරුද්ධ | 10, 64 |
| අනුලා | 74, 230 |
| අනොම | 96, 106 |
| අනොමදස්සී | 100, 108 |
| අභය | 156 |
| අභිභූ | 196 |
| අමර | 20 |
| අමිතා | 128 |
| අරින්දම | 192 |
| අරුණවත්තු | 196 |
| අසම | 96, 112 |
| අසමා | 112 |
| අසොක | 188 |
| අසොකා | 74 |
| **ආ** | |
| ආනන්ද | 30, 126, 174, 236 |
| ආභස්සර | 6 |
| **උ** | |
| උග්ග | 222 |
| උග්ගත | 142 |
| උත්තර | 72, 126, 130, 220 |
| උත්තරා | 32, 72, 112, 190, 220, 236 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **උ** | |
| උදය | 174 |
| උදෙන | 82, 166 |
| උපවාලා | 82, 182 |
| උපතිස්සා | 66, 236 |
| උපවාන | 104 |
| උපසන්ත | 156 |
| උපසාල | 112 |
| උපසෙන | 142 |
| උපසෙනා | 174 |
| උපසොණ | 66, 82 |
| උපාලි | 10 |
| උප්පලවණ්ණා | 30, 236 |
| උප්පලා | 106 |
| උරුවෙල | 136 |
| උරුවෙලා | 230 |
| **ක** | |
| කඤ්චනාවෙල | 150 |
| කටිස්සභ | 162 |
| කපිල | 30 |
| කස්සප | 224 |
| කිකී | 228 |
| කිසාගොතමී | 174 |
| කුඤ්ජර | 88 |
| කුම්භකණ්ණ | 130 |
| කොණාගමන | 216 |
| කොණ්ඩඤ්ඤ | 60, 68 |
| කොලිත | 124, 236 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ඛ** | |
| ඛණ්ඩ | 188 |
| ඛෙමඞ්කර | 196 |
| ඛෙමා | 30, 162, 236 |
| **ග** | |
| ගිජ්ඣකූට | 10 |
| ගොතම | 32, 234 |
| **ඝ** | |
| ඝටීකාර | 226, 230 |
| **ච** | |
| චන්දමිත්තා | 188 |
| චන්දවතී | 104 |
| චන්ද | 188 |
| චම්පක | 112 |
| චාලා | 82, 182 |
| චිත්ත | 32, 144, 236 |
| චිත්තා | 98, 196 |
| **ජ** | |
| ජටිල | 116, 122 |
| ජනසන්ධ | 174 |
| ජයසෙන | 182 |
| ජොතිපාල | 224 |
| **ත** | |
| තපස්සු | 58 |
| තිස්ස | 56, 128, 170, 188, 230 |
| තිස්සා | 66 |
| තුසිත | 6, 16 |
| **ද** | |
| දීපඞ්කර | 26, 54, 60 |
| දෙව | 144 |
| දෙවල | 128 |
| දොණ | 244 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ධ** | |
| ධනඤ්ජය | 112, 182 |
| ධනවතී | 228 |
| ධම්මක | 24, 150 |
| ධම්මදස්සී | 158 |
| ධම්මදින්නා | 150 |
| ධම්මසෙන | 74, 182 |
| ධම්මා | 156 |
| **න** | |
| නකුල | 156 |
| නකුලා | 96, 98 |
| නන්ද | 74, 196 |
| නන්ද | 58, 66 |
| නන්දාරාම | 58, 112 |
| නන්දිවඩ්ඪ | 106 |
| නාග | 190 |
| නාගසමාලා | 144 |
| නාගා | 144, 182 |
| නාරද | 114, 122, 144 |
| නිසභ | 106, 156 |
| **ප** | |
| පදුම | 108, 114, 162 |
| පදුමා | 56, 88, 106, 144, 174, 182, 196 |
| පදුමුත්තර | 122 |
| පබ්බත | 216 |
| පභාවතී | 142, 196 |
| පාලිත | 74, 150 |
| පියදස්සී | 146 |
| පුඤ්ඤවඩ්ඪන | 162 |
| පුණ්ණ | 10 |
| පුනබ්බසුමිත්ත | 190 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ඵ** | |
| ඵුස්ස | 178 |
| ඵුස්සදේව | 162 |
| ඵුස්සා | 174 |
| **බ** | |
| බන්ධුමතී | 188 |
| බන්ධුමා | 188 |
| බ්‍රහ්මදත්ත | 228 |
| බ්‍රහ්මදේව | 88, 174 |
| **භ** | |
| භද්ද | 64, 88 |
| භද්දකච්චානා | 236 |
| භද්දා | 230 |
| භල්ලික | 58 |
| භාරද්වාජ | 230 |
| භාවිතත්ත | 82 |
| භිය්‍ය | 112 |
| **ම** | |
| මකිලා | 156 |
| මඛිලා | 96, 196 |
| මඞ්ගල | 68, 76 |
| මහාකස්සප | 10 |
| මායා | 30 |
| මෙඛල | 80, 82 |
| මොග්ගල්ලාන | 10 |
| **ය** | |
| යඤ්ඤදත්ත | 202 |
| යසව | 104, 136 |
| යසවතී | 72, 88 |
| යසොධරා | 104,139 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ර** | |
| රම්මා | 108 |
| රාධා | 112 |
| රාමා | 136 |
| රාහුල | 236 |
| රුචි | 112 |
| රුචිගත්තා | 220 |
| රුචිදේවී | 64 |
| රේවත | 84,92,168 |
| **ව** | |
| වටංසිකා | 82 |
| වරුණා | 82,88,106,112 |
| වලියා | 162 |
| වසවත්ති | 6 |
| වසීලා | 222 |
| වසුදත්තා | 126 |
| විචිකොලී | 162 |
| විචිත්තා | 123 |
| විජිතසෙන | 230 |
| විජිතසේනා | 64 |
| විජිතාවී | 178 |
| විතිණ්ණ | 128 |
| විපස්සී | 184 |
| විපුල | 88 |
| විපුලා | 88 |
| විමලා | 150 |
| විසාඛ | 74,182 |
| විසාඛා | 150,156 |
| වෙසැර | 74 |
| **ස** | |
| සච්ච | 162 |
| සත්ථවාහ | 220 |
| සත්ත | 156 |
| සන්ධික | 150 |
| සබ්බකාම | 134 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ස** | |
| සබ්බකාමා | 196 |
| සබ්බමිත්ත | 230 |
| සබ්බදස්සී | 150 |
| සභිය | 182 |
| සමඞ්ග | 174 |
| සමවත්තක්ඛන්ධ | 188 |
| සමුද්ද | 168 |
| සමුද්ද | 220 |
| සම්බල | 168,174 |
| සම්භව | 88,196 |
| සරණ | 82,134,160 |
| සාගත | 58 |
| සාගර | 134,156 |
| සාමා | 222 |
| සාරිපුත්ත | 10,16 |
| සාල | 112 |
| සාලිය | 162 |
| සිඛී | 192 |
| සිද්ධත්ථ | 164 |
| සිරි | 74,174 |
| සිරිනන්ද | 142 |
| සිරිමා | 58,66,80,88,104,136,182 |
| සිරිවඩ්ඪ | 106,196 |
| සීවලා | 74,168 |
| සීවලී | 70 |
| සීහ | 96 |
| සුගුත්ත | 196 |
| සුචන්ද | 150 |
| සුජාත | 128,138,170 |
| සුජාතා | 64,94,96,126,150 |
| සුතනා | 74,188 |
| සුදත්ත | 80,98,134,144,150 |
| සුදත්තා | 134,174 |
| සුදස්සන | 144,200 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ස** | |
| සුදස්සනා | 88,104,156 |
| සුදේව | 56,74 |
| සුද්ධෝදන | 30 |
| සුධඤ්ඤවතී | 88 |
| සුධම්ම | 96 |
| සුධම්මා | 96,156 |
| සුනන්ද | 64,68 |
| සුනන්දා | 58,156,160,230 |
| සුනෙත්ත | 96,162 |
| සුන්දරී | 106 |
| සුප්පිය | 168 |
| සුඵස්සා | 166 |
| සුභකිණ්ණ | 6 |
| සුභද්ද | 64,88,162 |
| සුමඞ්ගල | 58,230 |
| සුමන | 76,84,128 |
| සුමනා | 106,134,168 |
| සුමිත්ත | 134,168 |
| සුමේධ | 20,130 |
| සුමේධා | 56 |
| සුරක්ඛිත | 182 |
| සුරම්මා | 168 |
| සුරාධා | 112 |
| සුරාමා | 136,168 |
| සුරුචි | 70 |
| සෙල | 156 |
| සොණා | 58,66,82 |
| සොත්ථිජ | 220 |
| සොභ | 220 |
| සොභිත | 92,100,150 |
| සොමදේව | 222 |
| **හ** | |
| හත්ථා | 128 |
| හත්ථාළවක | 32,236 |
| හිමවන්ත | 24 |

# චරියාපිටකෙ

## ගාථාදිපාද – සූචි


අ

අකාමකො වාහි අහං වරාමි 318
අග්ගිවෙගභයා භීතා 314
අචෙතනායං පථවී 272
අච්ඡාදනඤ්ච සයනඤ්ච 258
අච්ඡෙරං වත ලොකස්මිං 268
අජ්ඣොගහෙත්වා පවනං 270
අතීතකප්පෙ චරිතං 250
අත්ථි ලොකෙ සීලගුණො 314
අථෙත්ථ කපිමාගන්ත්වා 286
අථෙත්ථ වත්තති සද්දො 266
අථො උපරිගඞ්ගාය 288
අදින්නපුබ්බං දානවරං 276
අද්දසංසු භොජපුත්තා 294
අධනෙ ආතුරෙ ජිණ්ණෙ 264
අධිට්ඨිතමධිට්ඨානං 310
අනුරක්ඛිං මම සීලං 288, 290
අනුස්සරිත්වා සද්ධම්මං 316, 320
අන්වද්ධමාසෙ පණ්ණරසෙ 264
අපරෙ ගන්ධඤ්ච මාලඤ්ච 324
අපිචාහං සීලරක්ඛාය 278,280,292
අපුච්ඡි මං පොරිසාදො 320
අභිජාතා සුඛුමාලා 268
අභිත්ථනය පජ්ජුන්න 316
අරිට්ඨසව්හයෙ නගරෙ 260
අවුට්ඨිකො ජනපදෙ 254, 266
අස්සත්ථ කාලමඤ්ඤාය 288
අහඤ්ච බ්‍රාහ්මණො එකො 290
අහඤ්ච මද්දිදෙවී ච 270
අහං තෙ අනුසාසාමි 274
අහං නිසජ්ජ චින්තෙසිං 274
අහං සොණො ච නන්දො ච 306
අහා මෙ මානසං සිද්ධං 262

ආ

ආමන්තයිත්වා දෙවින්දො 270
ආවජ්ජෙත්වා ධම්මබලං 314

ඉ

ඉති සීලවතං හෙතු 294
ඉදං අච්ඡරියං දිස්වා 268
ඉදං ලොකෙ උත්තරියං 302
ඉදානාහං චින්තයිත්වා 260

උ

උක්කණ්ඨිතොම්හි කායෙන 304
උජ්ජාලෙහි මහාඅග්ගිං 294
උපොසථම්හි දිවසෙ 274
උභොපි නෙත්තා නායනා 260
උභො මාතා පිතා මය්හං 304
උය්‍යානදස්සනං ගන්ත්වා 284

එ

එකොකාසෙ රථං කත්වා 310
එතමත්ථවසං ඤත්වා 258
එතෙ අඞ්ගෙ අධිට්ඨාය 310
එතෙසං පුබ්බජො ආසිං 304
එත්තකංයෙව තෙ ආයු 264
එවමෙවාහං පුඤ්ඤකාමො 252
එවරූපං මහාදානං 256
එවරූපං සච්චවරං 316
එවං චින්තෙසහං තත්ථ 316
එවං මෙ අප්පමත්තස්ස 322
එවං වුත්තා ච සා දෙවී 262
එවං වුත්තායහං තස්සා 308
එවං වුත්තෙ අහං තස්ස 284

එ

එවං වුත්තෙ තදා යක්ඛො 286
එවං වුත්තො ච සො සක්කො 262
එවාහං චින්තයිත්වාන 252, 304
එහි අග්ගිං පදීපෙහි 276
එහි සීවක උට්ඨෙහි 262

ඔ

ඔදපත්තකියා මය්හං 284

ක

කප්පෙ ච සතසහස්සෙ 250
කලහො වත්තති භෙස්මා 292
කාමං භිජ්ජතුයං කායො 282
කාලිඞ්ගරට්ඨ විසයා 254, 266
කිච්ඡා ලද්ධං පියං පුත්තං 308
කුපිතො අහොසි පච්චත්තො 300
කුසාවතිම්හි නගරෙ 254
කෙවලං පථවිං රජ්ජං 298
කො ජාතකො කො තසිතො 256
කො පරෙ ජත්තමාදෙති 256

ඛ

ඛත්තියානං එකසතං 320

ග

ගන්ත්වාන සො හත්ථිදමකො 278

ච

චතුප්පථෙ මහාමග්ගෙ 294
චතුවාහිං රථං දත්වා 268

ඡ

ඡවි චම්මං මංසං නහාරුං 276
ඡවියා චම්මෙන මංසෙන 280, 294

ජා

ජාලිං කණ්හාජිනං ධීතං 272

ත

තඤ්ඤෙවාධිපතිං කත්වා 298
තතො කාකා ච ගිජ්ඣා ච 314
තතො චුතො සා ඵුසතී 264
තතො ජානපදා සබ්බෙ 310
තතො මෙ හත්ථපාදෙ ච 310
තතො සො චොදිතො මය්හං 262
තතො සො වට්ටිගතං මග්ගං 318
තත්ථ කාරණිකා ගන්ත්වා 300
තත්ථද්දසාමි පටිපථෙ 252
තත්ථ පක්ඛිත්වා දෙවෙ 280
තත්ථ වත්තෙත්වා සල්ලාපං 270
තත්ථ වසාම නිපකා 282
තත්ථාහං දිවසෙ තික්ඛත්තුං 254
තථන්තු චිතථෙන්තං 260
තථෙව ජලිතං අග්ගිං 276
තථෙව සකභත්තාපි 258
තථෙවාහං ජානමානො 256
තථෙවාහං සබ්බභවෙ 258
තදපි මං ධම්මචාරිං 282
තදපි මං නිමන්තිංසු 306
තදපි ලොකං දිස්වාන 306
තදා මං තපතෙජෙන 250
තදහං ඵුසතියා කුච්ඡිං 264
තදහං මාපයිත්වාන 258
තදහං යජනා මුත්තො 258
තදහං සත්තරජ්ජෙසු 256
තමහං අනුරක්ඛන්තො 288
තමහං උපට්ඨහිත්වාන 318
තමහං ගන්ත්වානුපට්ඨානං 300
තමහං දිස්වන කුහකං 300
තමහං දිස්වාන සන්තුට්ඨො 274
තමහං පටිපථෙ දිස්වා 252
තස්ස ආමසනෙ කුද්ධො 318
තස්ස කත්වාන කාරුඤ්ඤං 288
තස්ස තං වචනං සුත්වා 278, 292, 300

ත

තස්ස දත්වානහං පණ්ණං 250
තස්ස නාගස්ස දන්තෙන 266
තස්ස නාගෙ පදින්නම්හි 254
තස්ස පතිස්සුණිත්වාන 320
තස්ස රඤ්ඤො අහං පුත්තො 292
තස්ස රඤ්ඤො පතිකරො 298
තස්සා ආයුක්ඛයං දිස්වා 262
තස්සා සාරත්තාධිගතො 284
තස්සාහං වචනං සුත්වා 260, 308
තස්සාහං සද්දං සුත්වාන 288
තෙ තත්ථ අම්හෙ පස්සිත්වා 268
තෙන සො කුපිතො ආසි 300
තෙනෙවාහං සතගුණතො 252
තෙ මය්හං වචනං සුත්වා 304
තෙ මං තද උක්ඛිපන්තං 304
තෙ මං රඤ්ඤො දස්සයිංසු 302
තෙ මෙ සාධූති වත්වාන 274
තෙසං තිචතුභමානානං 266
තෙසාහං එවමවචං 300, 304
ත්‍යාහං අස්සාසයිත්වාන 318
ත්වං මද්දි කණ්හං ගණ්හාහි 268

ථ

ථලං කරෙය්‍යං උදකං 282

ද

දදමානස්ස දෙන්තස්ස 262
දදමි න විකම්පාමි 266
දසකුසලකම්මපථෙ 290, 322
දසමාසෙ ධාරයිත්වාන 264
දන්තානි පටියාදෙථ 274
දූරකෙ අනුරක්ඛන්තො 270
දිවා වා යදි වා රත්තිං 256
දිස්වාන විවිධං පාපං 306
දුක්ඛෙන ජීවිතො ලද්ධො 302
දුතියම්පි තතියම්පි 250

ධ

ධඤ්ඤං මඞ්ගලසම්පන්නං 254
ධම්මවාදී අධම්මො ච 290
ධම්මධම්මං ජනින්දෙවං 314

න

න කොචි එතං ජානාති 316
නගරං ගන්ත්වාන ආචික්ඛි 288
න තස්ස අලිකං භණිතං 312
න තස්ස දනං දදමානො 252
න තස්ස පරිබායන්තො 278
න තං දසසු ඨානෙසු 256
නත්ථිමස්ස සතං ධම්මො 300
නත්ථිමෙ සංසයො තත්ථ 320
න මය්හං මත්තිකං නාමං 264
න මං කොචි උත්තසති 322
න මෙ අත්ථි තිලා මුග්ගා 274
න මෙ තප්පච්චයා අත්ථි 250
න මෙ දෙස්සං ධනං ධඤ්ඤං 266
න මෙ දෙස්සං මහාරජ්ජං 302
න මෙ දෙස්සා උභො චක්ඛු 262
න මෙ දෙස්සා උභො දුත්තා 272
න මෙ යාචකමනුප්පත්තෙ 254, 272
න මෙ සා බ්‍රාහ්මණී දෙස්සා 284
නහාපෙත්වා අනුලිම්පිත්වා 310
නාගං ගහෙත්වා සොණ්ඩාය 254, 266
නාසාය විත්තිවිජ්ඣිත්වා 394
නාහං පිවාමි ඛාදමි 258
නික්ඛමිත්වාන නගරා 268
නිද්දායමානො සයනවරෙ 308
නිරන්තරං ජාතිසතං 280
නිරාලයං ජිනන්තබන්ධු 282
නිසජ්ජ පාසාදවරෙ 260
නිසෙධයිත්වා පච්චන්තං 300

**ප**

පඤ්චාලරට්ඨෙ නගරවරෙ 292
පදුමං පුණ්ඩරීකඤ්ච 268
පබ්භාරෙ ගිරිදුග්ගෙ ච 284
පවනා ආභතං පණ්ණං 250
පවනෙ දිස්වා වනචරො 278
පවනෙ වසමානස්ස 270
පවෙධමානො පලිතසිරො 260
පාදෙ පක්ඛ පජහාමි 314
පාපො කදරියො යක්ඛො 290
පිතා මම මිගවං ගන්ත්වා 292
පුනදෙව සක්කො ඔරුය්හ 270
පුනාපරං දදන්තස්ස 266
පුනාපරං බ්‍රහාරඤ්ඤෙ 272
පුනාපරං යදාහොමි 252, 254, 256, 258, 274, 280, 282, 284 286, 290, 294, 298, 302 306, 308, 312, 314, 316 320, 322
පුබ්බසාලොහිතා මය්හං 308
පූතිකුණප සම්පුණ්ණා 302
පෙළාය පක්ඛිපන්තෙපි 280

**ම**

මක්කටො ච සිගාලො ච 274
මද්දියා දීයමානාය 272
මද්දිං හත්ථෙ ගහෙත්වාන 272
මම සංකප්පමඤ්ඤාය 274
මමං උපද්දුතං දිස්වා 286
මමෙවායං මඤ්ඤමානො 286
මාතාපිතා න මෙ දෙස්සා 298, 304
මාතාපිතූහි පහිතෙ 304
මාතු පිතු ච වන්දිත්වා 294
මා පණ්ඩිච්චං විභාය 308
මා පමජ්ජි තුවං තාත 300, 310
මිගවං ගහෙත්වා මුඤ්චස්සු 292

**ම**

මුඛතුණ්ඩකෙනාහරිත්වා 312
මූගො අහොසිං බධිරො 310

**ය**

යතො සරාමි අත්තානං 316
යථා අමවෙවා මුද්දිකාමො 252
යථාපි ආතුරො නාම 256
යථාපි කස්සකො පුරිසො 252
යථාපි වාණිජො නාම 258
යථාපි සෙවකො සාමිං 258
යථා සීතොදකං නාම 276
යදා අහං අමිතයසො 292
යදා අහං බ්‍රහාරඤ්ඤෙ 250
යදා අහොසි පවනෙ 278
යදා මහාකට්ඨපුඤ්ජො 276
යදාහං කපි ආසිං 312
යදාහං දාරකො හොමි 264
යදි කොචි එති දක්ඛිණෙය්‍යො 274
යදි චිත්තවසී හෙස්සං 282
යදි තෙ මං තත්ථ කොට්ටෙය්‍යුං 278
යදි පස්සන්ති පවනෙ 268
යදි මාසම්පි ද්වෙමාසං 252
යදිහං තස්ස කුප්පෙය්‍යං 286
යදිහං තස්ස පකුප්පෙය්‍යං 290, 292
යදිහං තාදිසං පත්වා 302
යදිහං තෙසං පකුප්පෙය්‍යං 278
යදිහං බ්‍රාහ්මණං කොචි 284
යම්හාකාසෙ අහං ඨත්වා 312
යං කිඤ්චි මානුසං දානං 260
යං තෙසං වචනං වුත්තං 304
යං මෙ තදා පාකතිකං 278
යං සො තදා මං අභිසපි 290
යං සො වණ්ණං චින්තයති 282
යාචකං උපගතං දිස්වා 270

ය

යාවන්තීමං පඤ්ජලිකා 298
යාවාමි තං මහාරාජ 260
යාචිතා සිවයො සබ්බෙ 266
යා මෙ අහොසි ජනිකා 262
යා මෙ දුතියිකා ආසි 282
යාවතා කාරණං සබ්බං 288
යෙ කෙචි මනුජා එන්ති 268
යෙ කෙචි මහියා සත්තා 302
යෙ මෙ දුක්ඛං උපදහන්ති 324
යෙ සාහං උපධාවෙය්‍යං 314
යො මෙ කණ්ඨකො හාතා 206

ර

රජ්ජම්පි මෙ දදෙ සබ්බං 254
රජ්ජං පුත්ත පටිපජ්ජ 292
රතනානි සත්ත වස්සිංසු 272
රත්තින්දිවං සො ගඞ්ගාය 288
රම්මෙ පදෙසෙ රමණීයෙ 286
රාජූපජීවෙ නිගමෙ 322
රොදන්තෙ දරකෙ දිස්වා 268

ව

විචරන්තා අනුකූලම්හි 290
විචරන්තා බ්‍රහාරඤ්ඤෙ 284
විචින්තයිත්වා ධම්මත්ථං 316
විඤ්ඤාය මෙ සීලගුණං 278

ස

සකජීවිත පරිච්චාගො 280
සක්කස්ස වචනං සුත්වා 270
සක්කෙන සා දින්නවරා 264
සකෙ පුත්තෙ චජන්තස්ස 270
සකිම්පි දිවසං දුතියං 286
සඞ්ඛිපිංසු පථං යක්ඛා 268
සට්ඨි රාජසහස්සානි 270
සත්තාහමෙවාහංපසන්නචිත්තො 318
සත්තාහං ධාරයිත්වාන 310
සන්ති පක්ඛා අපත්තනා 314
සබ්‍රහ්මචාරී මණ්ඩබ්‍යා 316
සභාවං චින්තයන්තස්ස 264
සම්මොදමානො තෙහි සහ 318
සරට්ඨකං සනිගමං 302
සරාජකෙ සහොරොධෙ 298
සරීරකිච්චං කත්වාන 280
සසත්ථහත්ථූපගතං 204
සසාගරන්තං පථවිං 296
සහකළීතෙ සච්චවරෙ 316
සහ කොපෙ සමුප්පන්නෙ 214
සහ දට්ඨො ආසිවිසෙන 318
සහ දිට්ඨස්ස මෙ ඡත්තං 308
සහ පත්තො ඔක්කන්තෙ 292
සහ සච්චෙ කතං මය්හං 314
සහ සච්චෙ කතෙ මය්හං 318
සහායො බ්‍රාහ්මණො මය්හං 318
සංවච්ඡරෙ ගිම්හසමයෙ 314
සංසිතො අකතඤ්ඤූනා 280
සාධූති සො හට්ඨමනො 276
සාමො යදා වනෙ ආසිං 322
සීලඛණ්ඩභයා මය්හං 294
සීලවා ගුණසම්පන්නො 298
සීහබ්‍යග්ඝෙහි දීපීහි 322
සුඛදුක්ඛෙ තුලාභූතො 324
සුසානෙ සෙය්‍යං කප්පෙමි 324
සූලෙහි විජ්ඣියන්තොපි 296
සො තදා පග්ගහෙත්වාන 260
සො මං අසංසි එහීති 312
සො මං තත්ථ ඛමාපෙසි 302
සො මෙ පුට්ඨො ච ව්‍යාකාසි 288
සොහං තෙසං මතිං සුත්වා 310
සොළසිත්ථි සහස්සානං 308

හ

හත්ථි අස්ස රථෙ දත්වා 266
හදයං දදෙය්‍යං චක්ඛුං 264
හිරොත්තප්පෙන ගරුනා 272
හීනමජ්ඣිමඋක්කට්ඨෙ 286

# චරියාපිටකෙ

## සඤ්ඤානාමානුක්කමනිකා


පිට්ඨඞ්කා

අ

අකිත්ති 250
අයොඝර 302
අරිට්ඨ 230
අලීනසත්ත 292
ආලම්බන 280

ඉ

ඉන්දපත්ත 254, 294, 298

ඒ

ඒකරාජ 258, 322

ක

කණ්හදීපායන 316
කණ්හාජින 268. 270, 272
කම්පිල්ල 292
කසී 304
කාලිඞ්ග 254, 266
කාසිරාජ. 302: 308
කුරුරාජ 276
කුසාවතී 254

ච

චන්ද 258
චම්පෙය්‍යක 282
චුල්ලබොධි 282
චෙතපුත්ත 270

ජ

ජයද්දිස 292
ජාලි 268,270,272
ජූජක 270
ජෙතුත්තර 264,272

ත

තෙමිය 308

පිට්ඨඞ්කා

ද

දබ්බසෙන 322

ධ

ධනඤ්ජය 254
ධම්ම 290

න

නන්ද 306
නිමි 258
පච්චය 264

ප

පඤ්චාල 292
පුප්ඵවතී 258
පොරිසාද 292,320

ඵ

ඵුසතී 262

බ

බාරාණසී 282
බ්‍රහ්මවඩ්ඪන 306

භ

භිස 304
භූරිදත්ත 280
භොජපුත්ත 294

ම

මගධ 312
මණ්ඩබ්‍ය 316
මද්දිදෙවී 268, 270, 272
මහාගොවින්ද 256
මහා ලොමහංස 324
මාතඞ්ග 298
මිථිලා 258
මූගපක්ඛ 308

ය

යුධඤ්ජය 298

ර

රුරු 286

ව

වඞ්ක 268, 270

විරූපක්ඛ 280

විස්සකම්ම 270

වෙස්සන්තර 264

ස

සක්ක 262,270,274,322

සඞ්ඛ 252

සඞ්ඛපාල 294

සච්ච 312

සඤ්ජය 264

සාම 322

සිනෙරු 266, 272

සිවි 260,266

සීවක 262

සුතසොම 320

සොණ 306

සොත්ථීය 304

සොමනස්ස 298

# බුද්ධවංස පාළි

## විසෙසපදනුක්කමනිකා


**අ**

| | පිට්ඨඞ්කා |
|---|---|
| අඤ්ජස | 22, 26 |
| අත්ථමී | 82 |
| අ[illegible]ජ්ඣවචනා | 38 |
| අධිකාර | 28, 30 |
| අනධිවර | 2, 4 |
| අනාවයො | 226 |
| අනිලඤ්ජසෙ | 8 |
| අනිවත්තිගමනං | 100 |
| අනුචිණ්ණං | 40 |
| අනුසරෙ | 42 |
| අප්පත්තමානසා | 234 |
| අප්පරජක්ඛජාතිකා | 2 |
| අභිඤ්ඤාබල | 24 |
| අභිනීහාරො | 16, 30 |
| අභිසඞ්ඛතො | 32 |
| අමතදුන්දුභිං | 122 |
| අමතභෙරිං | 76 |
| අසීති | 186 |
| අහු | 62, 226 |
| ආදෙසනානුසාසනී | 4 |
| ආමුත්ත | 114 |
| ආහුතීනං | 30, 32 |

**ඉ**

| | |
|---|---|
| ඉන්දකෙතු | 88 |
| ඉසි | 14 |

**උ**

| | |
|---|---|
| උක්කුට්ඨිසද්දං | 32, 62, 210 |
| උට්ඨානං | 140 |
| උතුවස්සෙ | 46 |
| උපනිසාදිනො | 184 |

**එ**

| | පිට්ඨඞ්කා |
|---|---|
| එහිති | 30, 62, 116 |

**ඔ**

| | |
|---|---|
| ඔසධී | 46 |

**ක**

| | |
|---|---|
| කඨිනචීවරෙ | 108 |
| කඨිනත්ථතෙ | 130 |
| කෙවලං බොධිං | 114, 138 |
| කොරණ්ඩසමසාදිසො | 12 |

**ග**

| | |
|---|---|
| ගගනමණ්ඩලෙ | 36 |
| ගණ්තුයෙ | 74 |
| ගවපානෙන | 70 |
| ගිරං | 100 |

**ඡ**

| | |
|---|---|
| ඡළභිඤ්ඤෙහි | 28 |

**ජ**

| | |
|---|---|
| ජිඝච්ඡා | 36 |
| ජිනචක්කං | 236 |
| ජිනබොධියං | 82 |
| ජුතින්ධරස්ස | 2 |

**ඤ**

| | |
|---|---|
| ඤාණධාතුං | 224 |

**ත**

| | |
|---|---|
| තාදිහි | 28 |
| තිපාටිහීරෙ | 4 |
| තිවිධග්ගි | 22 |

ද

පිට්ඨඞකා

දකජා 34
දයිතඹරසො 114
දරීසයා 36
දසපාරාපූරියා 80, 112
දුබ්ඛිදීතො 42
දුරාසද 60, 100 130, 146, 208

ධ

ධම්මචෙතිං 222
ධම්මදෙසනෙ 68, 76, 84
ධම්මධාතුයා 40
ධම්මභෙරිං 68
ධම්මුක්කං 68, 74
ධුවසෑවං 24
ධුවං 32, 34, 36
ධුවකෙතු 74

න

නරමරූ 28, 62, 170
නරවසභං 138
නවඞගං ජිනසාසනං 226
නවඞගං සත්ථුසාසනං 64
නිවජ්ජුහන්ති 126

ප

පකරණෙ සත්ත 216
පතිට්ඨහ 48
පරිවෙසනෙ 48
පලුග්ගං 24
පවනං 52
පාටිහීරං 12, 200
පාවචනං 56, 98, 106, 144

බ

බිලාසයා 36
බුද්ධකරෙ ධම්මෙ 40
බුද්ධධම්මා 40, 42, 44, 46, 48

බ

පිට්ඨඞකා

බුද්ධරංසෙන 120
බොධිපාචනා 42, 44, 46, 48
බ්‍රහා 114, 130, 144
බ්‍රහමං 142, 182

භ

භද්දකෙ කප්පෙ 208, 218, 226
භාථ 50
භුසවාතෙහි 46

ම

මණ්ඩකප්ප 122, 138, 152
මධුලට්ඨිකං 208
මානසං 58
මානුසකං 50
මානුසෙහි 28
මොරහත්ථො 144

ව

වටුමායනං 26
වසීභූත 26, 32
විථතං 38
වියාකරි 110

ස

සඞ්ඛාට 6
සතරංසි 6, 106, 138
සම්ංසු 56, 108, 114, 130, 146
සම්පන්නවිජ්ජාචරණස්ස 2
සල්ලකත්තො 242
සංකිලෙසමරණං 74
සිඛී 112, 206
සෙරී 22
සෙලෙන්ති 10

හ

හත්ථුහං 2
හිංකාරං 8
හුතාසනො 98
හෙසන්ති 30
හෙහිති 20

# චරියාපිටක පාළි

## විසෙසපදානුක්කමනිකා


අ

පිට්ඨඞ්කා

අකිඤ්චනෙ 264
අතික්ඛුයං 316
අනගාරියං 302
අනරියො 286
අනුච්ඡවො 254
අනොලීනො 252
අපච්ඡාසො 256
අපරාජිතං 252
අපස්සයං 316
අබ්භොච්ඡින්නා 258
අලිකං 312
ආරාධනියං 258
ආසයං 274
ආළම්බකකාසුයා 278

උ

උත්තමඞ්ගං 318
උපායනං 256
උබ්බිග්ගා 268
උරගාධිභූ 294
උපරුක්ඛමෙහා 292

එ

එකාසාසනී 234

ඔ

ඔචිනායතු 308
ඔදපත්තකියා 284
ඔහනෙති 286

ක

පිට්ඨඞ්කා

කඨිනං 304
කණ්ණභෙරිං 266
කණ්හවත්තනී 314
කදලිං ව අසාරකං 300
කරුණං 272, 288, 298
කම්මකාරො 288
කාරං 252
කාසුං 310, 322
කාහාමි 286
කුසලං 300
කුසාවතිම්හි 314

ග

ගිහීධම්මෙ 304

ඝ

ඝාසහෙතු 274

ච

චතුවාහිං 268
චතුස්සාලං 258
චෙටකෙ 284

ඡ

ඡවං 286
ඡාතකො 254, 256, 266

ජ

ජටිලහීළිතො 300
ජාතවෙද 314
ජාලසිඛන්තරෙ 276
ජුතින්ධරං 308

ත

පිට්ඨඞ්කා

තට්ඨං 260
තස්ස 294
තාලමිඤ්ජංව 262
තුත්ත 306

ථ

ථුසරාසිංව අතණ්ඩුලං 300

ද

දකාසයා 284
දක්ඛිණානුවට්ටං 274
දයිතො 298
දරථපරිළාහං 276
දරීසයෙ 312
දවඩාහො 314
දට්ඨාවුධො 294
දුමං අන්තව සුසිරං 300
දෙස්සා 262, 272, 284, 298, 304, 310

ධ

ධඤ්ඤං 254, 256, 266
ධම්මිකරට්ඨවාසිනො 260
ධරණීරුහං 262
ධමධමං 314

න

නිවුහමානානං 266
නිප්පීළයන්තා 284

ප

පක්ඛා 310
පජ්ජුන්නා 316
පණ්ණ 320
පතිකරො 298
පබ්භාරෙ 284
පරන්තිහි 300
පරිත්තාසං කතෙ මයි 294

ප

පිට්ඨඞ්කා

පවනෙ 268, 270, 278, 322
පසදමිග 322
පාවකො 314
පාවද 288
පාහුනාගතං 318
පිතු මාතු ච 304
පුබ්බසාලොහිතා 308
පෙළායං 280

බ

බලසා 284
බොධිජං 258
බොධිපාවනං 250
බොධියා 262, 272, 284, 288, 290, 298, 310
බ්‍රහාරඤ්ඤෙ 272, 284

භ

භවාභවෙ 250, 258
භිඞ්කාරෙ 244, 266
භෙස්මා 292

ම

මාතු පිතු ච වන්දිත්වා 304
මාලාවට්ටං 298
මහාසිඛී 314
මුන්ති 286
මුද්දිකාමො 252
මුග්ගා 310

ය

යජනා 258
යඤ්ඤවාටතො 258

ර

රජගතෙ 276
රථියා රථියං 300
රාජවෙට්ඨනං 310
රාජුපජීවෙ 322

**ව**

| | පිට්ඨඞ්කා |
|---|---|
| වණිබ්බකෙ | 262 |
| විත්ථතං | 250 |
| විපිනකානනෙ | 260 |
| විවණ්ණියං | 250 |
| වෙදජාතො | 260 |
| වෙධිතො | 318 |

**ස**

| | |
|---|---|
| සකටාහෙන | 250 |
| සඞ්ඝරං | 320 |
| සච්චවජ්ජෙන | 316 |
| සජ්ජස්සං | 310 |
| සතභාගො | 258 |
| සතං ධම්මො | 300 |
| සබ්බඤ්ඤුතං | 252, 262, 284, 298, 302, 304 |

**ස**

| | පිට්ඨඞ්කා |
|---|---|
| සබ්‍රහ්මචාරි | 316 |
| සම්මිහා | 290 |
| සම්පීළෙ | 302 |
| සයම්භුං | 252 |
| සහධම්මො | 284 |
| සාමඤ්ඤුපගතො | 300 |
| සාරත්ථාධිගතෙ | 284 |
| සිඛී | 314 |
| සිනෙරුවටවටංසකා | 264, 266, 268, 270, 272 |
| සීලබ්බතසමප්පිතො | 282 |
| සොළසිං | 310 |

**හ**

| | |
|---|---|
| හත්ථමුක්ඛිතො | 310 |
| හත්ථිදමකං | 278 |
| හීළිතො | 286 |